# දහම් පාසල

## 10 ශ්‍රේණිය



# දහම් පාසල

## 10 ශ්‍රේණිය

ශ්‍රී ලංකා ජනරජයේ පරිත්‍යාගයක් වූ මෙම පොත නිසි ලෙස පරිහරණය කර සහෝදර සිසුවෙකුට පිරිනැමීම සඳහා වසර අවසානයේදී ආපසු භාරදීම ඔබේ යුතුකම වන්නේය.

සම්පාදනය හා ප්‍රකාශනය
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

# පොත සකස්කරන අවස්ථාවේදී සිටි උපදේශක මණ්ඩලය

(1) ගෞරව ශාස්ත්‍රවේදී පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේ.

(2) රාජකීය පණ්ඩිත පූජ්‍ය අතුරලියේ ඉන්දරතන නායක ස්වාමීන් වහන්සේ.

(3) ශාස්ත්‍රපති පූජ්‍ය ගන්තුනේ අස්සජි ස්වාමීන් වහන්සේ.

(4) ශාස්ත්‍රපති පූජ්‍ය ඇස්වත්තේ රේවත ස්වාමීන් වහන්සේ.

(5) ගෞරව ශාස්ත්‍රවේදී පූජ්‍ය කිතලගම හේමසාර ස්වාමීන් වහන්සේ.

(6) ශාස්ත්‍රපති පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන් වහන්සේ.

(7) ශාස්ත්‍රපති බී. එම්. එස්. මහලේකම මහතා.

(8) ශාස්ත්‍රපති ගුණසේන මහතන්ත්‍රිගේ මහතා.

(9) හිටපු බෞද්ධ කටයුතු කොමසාරිස් එස්. කාරියවසම් මහතා.

# ගුරු භවතුන්ට ඇමතීමක්

දහවන ශ්‍රේණියේ දහම් පාසල් සිසුන් සඳහා වූ මෙම පාඨ ග්‍රන්ථය නිසිලෙස හැදෑරීමට ඔවුන්ට මග පෙන්වීමේ භාග්‍යය ඔබට ලැබී ඇත. මෙම ශ්‍රේණියේ ඉගෙනුම ලබන්නේ දිනපතා පාසලේ 10 වසරට අයත් නව යොවුන් වියේ පසුවන ශිෂ්‍ය ශිෂ්‍යාවන් බව ඔබ දන්නෙහිය. ඉගෙනුම සඳහා ඔවුන්ට මග පෙන්වීමේදී ඔවුන්ගේ වයස, බුද්ධි මට්ටම, රුචි අරුචිකම් ආදිය පිළිබඳව ද සැලකිලිමත් විය යුතු බව අමුතුවෙන් කිවයුතු නොවේ.

පාඨ ග්‍රන්ථය ඉගැන්වීමෙන් පමණක් දහම පාසල් අධ්‍යාපනයේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි බව ඔබ ද පිළිගනු ඇත. එසේ වුව ද සතියකට වරක් හමුවන දරුවාට වඩාත් ප්‍රියජනක ලෙස පොත ඉගැන්වීම පමණක් කළ ද ඔබෙන් ඉටුවන්නේ වැදගත් මෙහෙයකි. එම මෙහෙය වඩාත් ඵලදායි වීමට නම් පාඨ ග්‍රන්ථය සකස් වී ඇති ආකාරය ගැනත් ඒ ඒ විෂය ඒකකයන්හි හා පාඩම්වල අරමුණු ගැනත් අවධානය යොමු කිරීම අවශ්‍යය.

මෙම පොත විෂය ඒකක 8ක් යටතේ සැකසී ඇත. බුද්ධ චරිතය, චරිත කථා, බෞද්ධ චින්තනය, බෞද්ධ පරිසරය හා සිරිත් විරිත්, ගාථා හා සූත්‍ර ධර්ම, අභිධර්මය, භාවනා සහ පාලි යනු එම ඒකක යි. මේවායින් බුද්ධ චරිත පාඩම්වල පොදු අරමුණ වන්නේ දහම් පාසල් දරුවා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හඳුනාගත් බුද්ධ චරිතයෙන් ආදර්ශ ගන්නා සැදැහැති අයෙකු බවට පත් කිරීමයි. චරිත කථා ඉගෙන ගන්නා දරුවා එම චරිත හඳුනාගෙන එබඳු ශ්‍රේෂ්ඨ උතුමන්ට ගරු කරන එම චරිත ආදර්ශයට ගන්නා අයෙකු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බෞද්ධ චින්තනය කොටසින් බලාපොරොත්තු වන්නේ බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම් පිළිබඳ නිරවුල් දැනීමක් ලබා ගැනීමට සැලසීමත් බුදුදහමේ ශ්‍රේෂ්ඨත්වය වටහාගත්, ආධ්‍යාත්මික හා සමාජගත පාරිශුද්ධිය සඳහා බෞද්ධ ඉගැන්වීම් අනුව ක්‍රියාකරන පුද්ගලයෙකු බවට පත් කිරීමත්ය.

දහම් පාසල් දරුවා ශාසන ඉතිහාසය ගැනත් බෞද්ධ සංස්කෘතික උරුම හා සම්ප්‍රදාය ගැනත් දැනීමක් ඇති එම සම්ප්‍රදාය හා උරුම

ආරක්ෂා කර ගැනීමට හැකීමෙන් ක්‍රියා කරන අයකු විය යුතුය. බෞද්ධ පරිසරය හා සිරිත් විරිත් නැමති ඒකකය ඇතුලත් කර තිබෙන්නේ එම අරමුණු ඇතිවය. ධම්මපදය බෞද්ධයාගේ අත්පොත බඳුය. ජීවන දර්ශනය ගොඩනගා ගැනීමට අවශ්‍ය මහඟු උපදෙස් එහි අන්තර්ගත වෙයි. ඒ බව වටහා ගත් විට ධම්මපදය කෙරෙහි ශිෂ්‍යා උනන්දුව වැඩිවෙයි. ඔහුගේ ආදර්ශ පාඨ වන්නේ ධම්මපද ගාථාවන්ය. එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ධම්මපද ගාථා ඇතුළත් කර ඇත. බෞද්ධ දරුවා විශේෂයෙන් ගිහි ජීවිතයට අදාළ සූත්‍ර හා ඒවායේ අන්තර්ගතය පිළිබඳවත් දැනුමක් ලැබිය යුතු අතර ඒවායේ ඇතුළත් ඉගැන්වීම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නෙකු ද විය යුතුය. සූත්‍ර ධර්ම පාඨ ග්‍රන්ථයෙහි ඇතුළත් වන්නේ එබැවිනි.

අභිධර්ම පිටකයේ ඉගැන්වෙන කරුණුවල විශේෂත්වය හා විශිෂ්ටත්වය පිළිබඳවත් බෞද්ධ භාවනාක්‍රම හා ඒවායේ ප්‍රායෝගික වටිනාකම පිළිබඳවත් දැනීමක් හා හැකීමක් දහම් පාසල් දරුවා තුළ ඇති කිරීමේ අරමුණින් අභිධර්මය හා භාවනා පිළිබඳ පාඩම් ඇතුළත් කර තිබේ. ථෙරවාදී සම්ප්‍රදාය විසින් රැකගෙන ආ පිටක ග්‍රන්ථ පාලි භාෂාවෙන් රචනා වී ඇති නිසාත්, ශාසනික වත් පිළිවෙත්වල දී සාම්ප්‍රදායිකව පාලි භාෂාව භාවිතවන නිසාත් ඒ පිළිබඳ සාමාන්‍ය දැනීමක් හෝ තිබීම ප්‍රයෝජනවත්ය. පාලි පාඩම් ඇතුළත් කර තිබෙන්නේ එම අරමුණ ඉටුකර ගැනීම පිණිසය.

අභිධර්මය භාවනා හා පාලි පාඩම් පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණු ඒ ඒ ඒකක ආරම්භයේදී දැක්වෙයි. සෑම ඒකකයක් ම ඉගැන්වීමේදී ඒවායේ පොදු අරමුණට අනුකූලව ඒ ඒ පාඩම සඳහා විශේෂ අරමුණු ඔබ විසින් තීරණය කර ගත යුතු වෙයි. ඒ ඒ පාඩම අවසාන වනවිට ශිෂ්‍යයාට ලැබිය යුතු දැනුම කුමක් ද ඔහු තුළ ඇති වියයුතු හැකීම් ආකල්ප මොනවා ද වර්ධනය වියයුතු කුසලතා මොනවාදැයි පන්තියට යෑමට පෙර තීරණය කර ගැනීම අවශ්‍යය.

පාඨ ග්‍රන්ථයේ එන පාඩම් ඒ අනුපිළිවෙළටම ඉගැන්වීම අවශ්‍ය නොවේ. සති දෙකක් ඇතුළත සෑම ඒකකයකින්ම එක් පාඩමක්වත් ඉගැන්විය හැකි සේ කාලසටහන පිළියෙළ කර ගැනීම මැනවි. ඔබේ

කාර්යය වඩාත් සාර්ථක කර ගැනීම පිණිස අනෙක් ශ්‍රේණි සඳහා වූ පාඨ ග්‍රන්ථයන්හි ගුරු භවතුන්ගේ අවධානයට යොමුකර ඇති කරුණු ගැන ද සැළකිලිමත් වීම මැනවි. ඔබ පෞද්ගලික ලාභාපේක්ෂාවෙන් තොරව කරන සේවාව ගැන ඔබට සතුටු විය හැක්කේ එය වඩාත් ඵලාදායී ලෙස සැලසුම් කර ගැනීමෙනි.

ගන්තුනේ අස්සජි හිමි.

# පටුන

## 1 කොටස

පිටුව


(I) බුද්ධ චරිතය

(1) සිදුහත් බෝසත් සිරිත ..... 1

(2) බුදුසිරිතේ මුල් විසිවස ..... 5

(3) බුද්ධ චරිතයේ අවසාන විසිපස් වසර ..... 11

(4) බුදුරජාණන් වහන්සේගේ ජීව-හිතවාදී ආකල්පය ..... 18

(5) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය ..... 23

(6) බුද්ධ චරිතයෙන් පිළිබිඹුවන මිනිස් ගුණ ..... 28

(7) බුද්ධ චරිතයෙන් ගත හැකි ආදර්ශ ..... 32

(8) බුද්ධ චරිතයෙන් පිළිබිඹුවන නායකත්ව ලක්ෂණ ..... 36

(9) බුදුරජාණන් වහන්සේ පිළිබඳ සමකාලීන ඇගයීම් ..... 40

(10) බුදුරජාණන් වහන්සේ පිළිබඳ නූතන ඇගයීම් ..... 44

(II) බෞද්ධ චරිත කථා

(11) සීවලී මහ රහතන් වහන්සේ ..... 50

(12) සුනාපරන්ත පුණ්ණ රහතන් වහන්සේ ..... 54

(13) ධම්මදින්නා තෙරණින් වහන්සේ ..... 58

(14) බුද්ධකාලීන උපාසකවරු ..... 61

(15) බුද්ධකාලීන උපාසිකාවෝ ..... 69

පිටුව

(16) මෑත ඉතිහාසයේ යුග කාරක තෙරවරු ........................ 76
(17) බුදු සසුන බැබලවූ සිංහල රජවරු දෙදෙනෙක් .............. 83
(18) විසිවන සියවසේ විසූ ශ්‍රී ලාංකික ගිහි බෞද්ධ පඬිවරු දෙදෙනෙක් .............................. 89
(19) ලක්දිව බෞද්ධ ප්‍රබෝධයට උරදුන් විදේශීය කාන්තාවෝ .............................. 94

(III) බෞද්ධ චින්තනය

(20) පටිච්ච සමුප්පාදය .............................. 97
(21) බෞද්ධ කර්ම සංකල්පයේ විශේෂත්වය .............................. 103
(22) කර්ම සංකල්පය හා සදාචාර වර්ධනය .............................. 107
(23) පුනර්භවය තහවුරුවන සාධක .............................. 111
(24) සත්වයා පිළිබඳ බෞද්ධ විග්‍රහය .............................. 115
(25) සවිසත සනසන සිව් බඹ විහරණ .............................. 119
(26) නිදහස පිළිබඳ බෞද්ධ චින්තනය .............................. 124
(27) සහජීවනය පිළිබඳ බෞද්ධ ආකල්පය .............................. 128
(28) දේශපාලනික හා ආර්ථික දියුණුවට මඟ පෙන්වන බෞද්ධ ඉගැන්වීම් .............................. 132
(29) ගෘහස්ථ හා සාමාජික දියුණුවට බුදුදහමේ උපදෙස් .............................. 139
(30) බුදු දහම පිළිබඳ වැරදි විචාර .............................. 145

(IV) බෞද්ධ පරිසරය හා සිරිත් විරිත්

(31) ථෙරවාදී බුදුදහමේ චිරස්ථිතිය පිණිස අනුගමනය කෙරුණු ක්‍රියාමාර්ග .............................. 150
(32) දඹදිව වන්දනීය ස්ථාන සතර .............................. 158

(33) අපි යමු සොළොස්තැන් වට වන්දනාවේ .................... 166
(34) බෞද්ධ උත්සව .................... 179
(35) ගමයි පන්සලයි අතර යටගියාවේ සබැඳියාව .................... 185
(36) ගමයි පන්සලයි අතර වර්තමාන සම්බන්ධතාව .................... 191

(V) බෞද්ධ වත් පිළිවෙත්
(37) නිවසක පින්කම් හා බැඳුණු වත් පිළිවෙත් .................... 196
(38) දවස ගෙවුන හැටි (බෞද්ධ නිවසක දිනචර්යාව) .................... 202
(39) වන්දනා ගමන් හා එහි අරමුණු .................... 208
(40) පොහෝදින වත් පිළිවෙත් .................... 213

(VI) බෞද්ධ කලා ශිල්ප
(41) සෞන්දර්ය සංකල්පය හා බුදුදහම .................... 219
(42) බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය .................... 223
(43) බෞද්ධ චිත්‍ර කලාව .................... 228
(44) සඳකඩ පහණ හා එය ආශ්‍රිත නිර්මාණ .................... 234

(VII) බුදුදහම ප්‍රචලිත වී ඇති විදේශීය රටවල්
(45) පෙරදිග ථෙරවාදී බෞද්ධ රටවල් .................... 238
(46) අපරදිග රටවල ථෙරවාදී බුදුසමය .................... 245

(VIII) ගාථා හා සූත්‍ර
(47) ධම්මපදයෙන් බිඳක් .................... 251
(48) වසලකරන ධර්ම (වසල සූත්‍රය) .................... 255

## II කොටස

පිටුව

### පාලි

(1) පඨමො පාඨො ........ 265

(2) දුතියො පාඨො ........ 267

(3) තතියො පාඨො ........ 273

(4) චතුත්ථො පාඨො ........ 277

(5) පඤ්චමො පාඨො ........ 282

(6) ඡට්ඨො පාඨො ........ 286

(7) සත්තමො පාඨො ........ 291

(8) අට්ඨමො පාඨො ........ 295

(9) නවමො පාඨො ........ 299

(10) දසමො පාඨො ........ 304

### අභිධර්මය

(1) සිතේ ගති I

අන්‍යසමාන චෛතසික ........ 307

(2) සිතේ ගති II

අකුසල චෛතසික ........ 310

(3) සිතේ ගති III

ශෝභන චෛතසික ........ 315

(4) සිත් වැල්

චක්ඛුද්වාරික චිත්තවීථියක් ........ 317

(5) පුනර්භවය ........ 322

(6) නිවන I

මම සිහිල් වූවෙමි, නිවුනෙමි ........ 326

(7) නිවන II, III

මම සිහිල් වූවෙමි නිවුනෙමි ........ 330

පිටුව

(8) නිවන IV
මම සිහිල් වූවෙමි නිවුනෙමි ........................................ 333
(9) නිබ්බාන ධාතු දෙක ........................................ 336
(10) සතර පරමාර්ථ ධර්ම
ලෝකය හා ඉන් මිදීම ........................................ 338

භාවනා

ආනාපානසති භාවනාව

(1) අපි සිහියෙන් ගණන් කරමු ........................................ 344
(2) දඹ ගසක් යට සිදු වූ අසිරිය ........................................ 349

1 පාඩම

# සිදුහත් බෝසත් සිරිත

ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූයේ ක්‍රි. පූ. 623 දී ය. හිමාලය පාමුල කිඹුල්වත් නුවර රාජධානියෙහි විසූ සුද්ධෝදන රජතුමාටත්, මහාමායා දේවියටත් පුත් ව උන්වහන්සේ වෙසක් පුර පසළොස්වක් පොහෝ දිනක ලුම්බිනි උයනේදී උපත ලැබූහ. අනාවැකි ප්‍රකාශ කළ උගත් බමුණෝ මේ පින්වත් කුමාරයා මතු දිනෙක සක්විති රජකම හෝ බුදුබව ලබන බව ප්‍රකාශ කළ අතර, එතුමන්ට සිද්ධාර්ථ යන නම තැබූහ.

සිදුහත් කුමාරයා උපන් සත් දවසින් මහාමායා දේවිය කලුරිය කළෙන් මහා ප්‍රජාපතී ගෝතමී නැමති සුළු මවගේ රැකවරණය යටතේ කුමරු වැඩිණ. තම පුතු සක්විති රජකු වනු දක්නට කැමති වූ සුද්ධෝදන රජතුමා සිය පුතුට උපරිම අන්දමින් ලෞකික සැප විඳීමට හැකි වන පරිදි කටයුතු සූදානම් කළේය. කුමර වියේදී මැනවින් සිප් සතර උගත් සිදුහත් කුමරු තරුණ යසෝදරා කුමරිය ආවාහ කර ගත්තේය.

තරුණ වියේදී විඳි සැප සම්පත් පිළිබඳව බුදුරජාණන් වහන්සේ වරක් මෙසේ පැවසූහ.

මහණෙනි, මම කිසි දිනෙක නොසියුම් සඳුන් නොගැවෙමි. මගේ හිස් වෙළුම, කංචුකය හා හඳනා සළු ද යන සියල්ල කසී සළු විය. රෑ දාවල් දෙක්හි සීතලෙන්, උෂ්ණයෙන්, දූවිල්ලෙන් පින්නෙන් ආරක්ෂා වීම සඳහා මගේ හිසට ඉහළින් සේසත් නඟා තිබිණි.

මා වෙනුවෙන් මාලිගා තුනක් සාදා තිබිණි. එකක් හේමන්ත කාලය සඳහාය. තවෙකක් ග්‍රීෂ්ම කාලය සඳහාය. අනෙක වර්ෂා කාලය සඳහාය. මම වැසි සාර මස තුළ ගී ගයන වයන කාන්තාවන් පිරිවරා ගෙන ඒ සඳහා වූ මාලිගයේ විසීමි. මාලිගයෙන් පහළට නොබැස්සෙමි. අනෙක් ගෙවල්වල දැසි දසුන්ට දෙන ලද්දේ කාඩි සමඟ නිවුඩු හාලේ බත්ය. මගේ පියාගේ මාලිගයේ දැසි දසුන්ට ලැබුණේ රස මසවුලෙන් යුත් ඇල් හාලේ බත්ය.

මෙබඳු සුඛෝපභෝගී ජීවිතයක් ගත කළත් බුද්ධිමත් සිදුහත් බෝසත් කුමාරයාණන්ට ජරාවට පත්වන, ව්‍යාධියට පත්වන, මරණයට පත්වන, මිනිසුන් දක්නට ලැබිණි. මිනිස් ජීවිතයේ මේ ස්වභාවය ගැන කලකිරුණු එතුමෝ ජාති, ජරා, ව්‍යාධි හා මරණ යන මේ ස්වභාවයන්ට ගොදුරුව දුක් විඳින සත්වයන් දුකින් මුදවා ගැනීමේ මඟක් සෙවීමට සිතූහ.

විසි නව වැනි වියෙහි සිටි බෝධිසත්වයෝ එක් ඇසළ පොහෝ දිනයෙක සියලු ලෝ වැස්සන් කෙරෙහි දයාවෙන් සිය ආදරණීය බිරිඳ වූ යසෝදරාවත්, රහල් පුත් කුමරාත් රජ සැපත් අත්හැර මහබිනික්මන් කළහ. අනෝමා ගංතෙරදී තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූ එතුමෝ ප්‍රථම වරට රජගහනුවර වීථියේ පිඬු සිඟා වැඩියහ. එතුමන් දැක පැහැදුනු බිම්බිසාර රජතුමා මගධ රාජ්‍යයේ රජ සැප විඳීමට එතුමාට ආරාධනය කළේය. තමන් විසින් ආරම්භ කළ සත්‍යය සෙවීමේ අරමුණ ඉවත නොදමන බව පැවසූ සිද්ධාර්ථ බෝධි සත්වයෝ ජාති, ජරා, ව්‍යාධි, මරණ දුක් නැති කරන මාර්ගය දන්නා ගුරුවරුන් සොයා පිටත් ව ගියහ.

එසේ ගිය බෝසත්තුමාට විශාල සිසු පිරිසක් ඇති ආලාරකාලාම තවුසා හමු විය. ඔහු දත් ශාස්ත්‍රය වහා උගත් සිද්ධාර්ථ තාපසයෝ එයින් තමාට පලක් නැති බව දැන එතැනින් ද පිටත්ව උද්දකරාමපුත්ත තවුසාණන් වෙත ගියහ. ඔහුගේ දහමද නිවන් ලැබීම පිණිස හේතු නොවන බව අවබෝධ කර ගත් සිද්ධාර්ථ තවුසාණෝ එතැනින් ද ගොස් මගධ රට උරුවෙල් දනව්වේ නේරංජරා ගඟබඩ වන ලැහැබක උග්‍ර තපස් රැකී ම ආරම්භ කළහ. මේ කාලය තුළදී උන්වහන්සේට තවත් තවුසෝ පස් දෙනෙක් උපකාර කළහ. ආහාර ගැනීම අඩු කිරීමෙන් දුෂ්කරක්‍රියා කළ බෝසතාණන්ගේ ශරීරය ඉතා ම දුර්වල විය.

මේ දුෂ්කරක්‍රියාව පිළිබඳව බුදුරජාණන් වහන්සේ පසු අවස්ථාවක දී භික්ෂූන් වහන්සේට වදාළේ මෙසේය.,

"මහණෙනි, මුං යූෂ හෝ කොල්ලු යූෂ හෝ කඩල යූෂ හෝ මෑ යූෂ හෝ පතක් පමණ ආහාර වශයෙන් ගත් මගේ ශරීරය ඉතා ම කෙට්ටු බවට පත්විය. මගේ අත් පා කළුවැල් පුරුක් මෙන් සිහින් බවට පත්විය. මගේ කොඳු ඇට කුරුඳු වැලක් මෙන් උස් මිටි බවෙන් යුක්ත විය. දිරා ගිය

ශාලාවක පරාල මතු වී පෙනෙන්නා මෙන් මගේ ඉල ඇට මතු වී පෙනෙන්නට විය. ඉතා ගැඹුරු දියවලක දිය තරු ඉතා ගැඹුරේ පෙනෙන්නා වාගේ මේ අල්පාහාරය නිසා මගේ ඇස් කුහරවල ඇස් තරු ඉතා ගැඹුරට ගිලී පෙණුනේය. ළා කාලයේ කැඩූ තිත්ත ලබු ගෙඩියක් අව්වෙන් වේලී හැකිලෙන්නා වාගේ මගේ හිසේ හම හැකිළෙන්නට විය. මගේ බඩ අත ගෑ විට අසු වූණේ මගේ පිටකටුවයි. පිට අත ගෑ විට අසු වූණේ පිටකටුව සමඟ බඩේ හමයි. ඒ අල්ප ආහාරය නිසා මගේ බඩේ හම පිටකටුවේ ම ඇලුණි. මහණෙනි, ඒ වගේ ම මම මලමුත්‍ර පිට කිරීමට ගිය විට ඒ මත ම මූණින් ඇද වැටුණෙමි. මා මගේ අවයවයන් පිරිමදින විට කුණු වූ මුල් ඇති ලෝම මගේ ශරීරයෙන් හැලෙන්නට පටන් ගත්තේය."

මෙසේ දුෂ්කරක්‍රියා කරන බෝසත්තුමා වෙත දිනක් මාරයා පෙනී සිට "ඔබ දැන් ඉතා ම කෙට්ටුයි. අවලස්සනයි. මරණය ඔබ ළඟමයි. ජීවත්වීමට බලන්න. ජීවත් වුනොත් පින්කර ගත හැකියි. මෙබඳු දුෂ්කරක්‍රියා කිරීමෙන් පළක් තිබේ ද" ආදී වශයෙන් කියමින් බෝසත්තුමාගේ උත්සාහය නැවැත්වීමට පෙළඹවීමක් කළේය. එවිට බෝසත්තුමාණෝ "පව්කාර මාරය, මම නුඹ හඳුනමි. නුඹ මෙහි ආවේ කුමකටදැයි මම දනිමි. නුඹ ඔය කියන පිංචලින් මට පලක් නැත. නුඹේ මාර සේනාවත් මම හඳුනමි. බියගුල්ලෙකුට නම් ඔබේ මාර සේනාව පැරදවිය නොහැකියි. නොපසුබස්නා සූර පුරුෂයෙකුට පැරදවිය හැකියි. ජීවිතය කෙරෙහි මගේ ආශාවක් නැත. පැරදිලා ජීවත් වෙනවාට වඩා සටන් බිමෙහි මරණය මට උතුම්යයි" පැවසූහ. එවිට මාරයා නොපෙනී ගියේය.

මේ අතර නිවන් අවබෝධය සඳහා බෝසත්තුමාට වෙනත් මාර්ගයක් සිහි විය. එනම් කුඩා කල වප්මඟුල් දිනයේදී සුද්ධෝදන රජුගේ කමතේදී කළ ආනාපාන සති භාවනාවයි. නිවන් මග පසක් කිරීමට එය උචිත බව එතුමාට වැටහිණි. භාවනා වැඩීමට නම් යැපෙන්නට තරම් ආහාර ගත යුතු බව ද එතුමාණන්ට කල්පනා විය. එබැවින් අන්ත දුෂ්කරක්‍රියාව අත්හැර ශරීරය පවත්වා ගැනීමට සෑහෙන තරම් ආහාර ගැනීමට බෝසතාණෝ ආරම්භ කළහ. සිදුහත් තාපසතුමන් දුෂ්කරක්‍රියාව අත් හළේ යයි කළකිරී පස්වග තවුසෝ එතුමන් හැර ගියහ.

බෝසතාණෝ මැදුම් පිළිවෙත අනුගමනය කරමින් භාවනා කිරීමෙන් වැඩි දිනක් යන්නට මත්තෙන් සිත දියුණු කර ගත්හ. අභිනිෂ්ක්‍රමණය කොට සය වසක් ගෙවී වෙසක් පුර පසළොස්වක් දිනට උදා විය. එදින උදෑසන සේනානිගම නුග රුක මුල වැඩ සිටි උන්වහන්සේට සුජාතා සිටු දුව කිරිබත් තලියක් පුදා මගේ අදහස් ඉටු වූවා සේම ඔබ වහන්සේගේ අදහසත් ඉටු වේවා යි ප්‍රාර්ථනා කළාය. අසල නේරංජරා නදියෙන් ස්නානය කළ බෝසතාණන් වහන්සේ කිරිබත් වළඳා ළඟ පිහිටි ගයාවේ බෝරුක මුලට වැඩම කළහ.

බෝධිමූලයේ බද්ධ පර්යංකයෙන් වැඩ හිඳගත් බෝසතාණන් වහන්සේ මාගේ ශරීරයේ මස් ලේ වියළී ගියත් බුද්ධත්වය නොලබා මෙතැනින් නොනැගිටිමි'යි අධිෂ්ඨාන කරගත් සේක.

ඉක්බිති භාවනාවට සිත නතු කළ උන්වහන්සේ ප්‍රථමධ්‍යානයේ සිට චතුර්ථධ්‍යානය දක්වා සිත දියුණු කළ සේක. අනතුරුව උන්වහන්සේට පුබ්බේනිවාසානුස්සති ඥාණය හෙවත් පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ පහළ විය. තවදුරටත් සිත දියුණු කළ උන්වහන්සේට චුතූපපාත ඥාණය හෙවත් සත්වයන්ගේ චුතිය හා උත්පත්තිය දක්නා නුවණ පහළ විය. අනතුරුව උන්වහන්සේට පහළ වූයේ කෙලෙස් සහමුලින් නැති කිරීමේ නුවණ හෙවත් ආසවක්ඛය ඥාණයයි. මෙසේ ත්‍රිවිද්‍යා පහළවීමත් සමඟම දුක, දුක ඉපදීමේ හේතුව, දුක් නැති කිරීම, දුක් නැති කිරීමේ මාර්ගය යන චතුරාර්ය සත්‍යය ඇති සැටියෙන් අවබෝධ විය. ජාතිය, ජරාව, ව්‍යාධිය හා මරණය නැති කිරීමේ මාර්ගය සොයා ගැනීම සඳහා මහාභිනිෂ්ක්‍රමණය කළ සිද්ධාර්ථ ගෞතම බෝධිසත්වයෝ තිස්පස් වැති වියෙහිදී තමන් සෙවූ මාර්ගය ස්වකීය ඥාන ශක්තියෙන් ම අවබෝධ කොට ගෙන ලොව්තුරා බුද්ධරාජ්‍යයට පත්වූ සේක.

අභ්‍යාසය :

සිද්ධාර්ථ බෝධිසත්ව චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ හැකිතාක් දක්වා එම ආදර්ශ මතු කර ගැනීමට තුඩු දුන් බෝසත් සිරිතේ සිද්ධිය ද කෙටියෙන් සඳහන් කරන්න.

# 2 පාඩම

## බුදුසිරිතේ මුල් විසිවස

තමන් වහන්සේට පන්තිස්වන විය සපුරමින් පැමිණි වෙසක් පුර පසළොස්වක් පොහෝ දිනයේදී සිද්ධාර්ථ ගෞතම බෝධිසත්වයන් වහන්සේ දඹදිව ගයාවේ ශ්‍රී මහා බෝධි මූලයේදී සම්මා සම්බෝධිය ලද සේක. බුද්ධත්වය ලැබීමෙන් පසු ඒ භාග්‍යවතුන් වහන්සේ නිවන් සුවයෙන් හා ධර්මය මෙනෙහි කරමින් සත් සතියක්ම බෝධිමූලය අවට ප්‍රදේශයේ වැඩ සිටි සේක.

ඉක්බිති උන්වහන්සේට අවශ්‍ය වූයේ මීට පෙර කිසිවකු විසින් නොඅසන ලද තමන් වහන්සේ විසින් ස්වෝත්සාහයෙන් ම සොයා ගන්නා ලද ශ්‍රී සද්ධර්මය ලෝවැස්සන්ට කියා දීමටය. ඒ ගැඹුරු ධර්මය කෙලෙස් බර ලෝවැස්සන්ට තේරුම් ගත හැකි දැයි උන්වහන්සේට කල්පනා විය. අනතුරුව මහා කරුණාවෙන් ලොව බලා වදාරන උන්වහන්සේට ඒ ගැඹුරු දහම තේරුම් ගත හැකි නුවණැත්තන් සිටින බව ද පෙනී ගියේය. පළමුවෙන්ම ධර්මය දේශනා කළ යුත්තේ කාටද යනුවෙන් සිතා බැලූ උන්වහන්සේගේ සිහියට නැගුණේ සත්‍යගවේෂී සමයේ දී තමන්ගේ ඇසුරට හමුවූ බුද්ධිමතුන්ය. තමන්ට උවටැන් කරමින් තමන් වහන්සේ දුෂ්කර ක්‍රියාව නවත්වා ආහාර වැළඳීම ආරම්භ කළ විට, තමන් වෙතින් ඉවත්ව ගිය පස්වග තවුසන් ඒ වන විට බරණැස ඉසිපතනයේ වෙසෙන බව භාග්‍යවතුන් වහන්සේට දැනගන්නට ලැබිණ. ප්‍රථම ධර්ම දේශනාව ඒ පිරිසට පැවැත්වීමට උන්වහන්සේ ඉටාගත්හ.

බුද්ධත්වය ලබා දෙමසක් සපිරෙන ඇසළ පුර පසළොස්වක් පොහෝ දිනයේදී භාග්‍යවතුන් වහන්සේ ඉසිපතනයට ළඟා වූයේ මේ සඳහාය. පස්වග තවුසෝ බුදුරජාණන් වහන්සේ පිළිගත්හ. මුලදී විශ්වාස නොකළත් කරුණු පැහැදිලි කිරීමෙන් පසු ව සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ බුද්ධත්වය ලබා ඇති බව පිළිගත් පස්වග තවුසෝ උන්වහන්සේගෙන් දහම් ඇසීමට සූදානම් වූහ.

මහණෙනි, පැවිද්දන් විසින් අත්හළ යුතු වූ අන්ත දෙකකි. එනම් අත්තකිලමථානුයෝගය හා කාමසුඛල්ලිකානුයෝගයයි. ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේ දහම්සක පෙරළීම ආරම්භ කළහ. ඒ ධම්මචක්ක පවත්තන සූත්‍රය නැමැති ධර්මය ප්‍රථමවරට ඇසීමෙන් කොණ්ඩඤ්ඤ තවුසාණන්ට දහම් ඇස හෙවත්සෝවාන් ඵලය ලැබිණි. බුදුරජාණන් වහන්සේ එහිම රැඳී දහම් අවවාද කළෙන් දින කීපයකදී ඉතිරි තවුසෝ සිව්දෙන ද සෝවාන් බව පසක් කර ගත්හ. දහම් ඇසූ පස්වග තවුසෝ බුදුරදුන් වෙත ඒහිභික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිද්ද ලැබූහ. අනතුරුව දේශනා කළ අනත්ත ලක්ඛණ සූත්‍රය ඇසීමෙන් පස්වග භික්ෂූහු සියලු කෙලෙස් නසා අර්හත් පදවිය ලැබූහ. බුදුරජාණන් වහන්සේ ඒ වර්ෂා කාලය ඉසිපතනයෙහිම ගත කළහ. මේ කාලය තුළදී බරණැස් සිටුහුගේ පුත් යසකුල පුත්‍රයාත් ඔහුගේ යහලුවන් පනස්හතර දෙනෙකුත් බුදුරදුන් වෙත පැමිණ දහම් අසා පැවිදි වී රහත් බව ලැබූහ. ප්‍රථම වස් කාලය අවසන් වන විට බුදුරජාණන් වහන්සේ ඇතුළු ලොව රහතන් වහන්සේ එක්සැට නමක් වූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් දූත මෙහෙවරෙහි යොදවා තමන්ගේ දහම් පණිවිඩය රට පුරා පතුරවා ලෝවැස්සන්ට නිවන් මඟ සාදා දීමට කල්පනා කළහ. මහණෙනි, බොහෝ දෙනාගේ හිත සුව පිණිස, යහපත පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ගේ දියුණුව පිණිස ගම් නියම්ගම්හි හැසිරෙන්න. දෙදෙනෙක් එක මග නොයන්න. සියලු ආකාරයෙන් කල්‍යාණ වූ ධර්මය දේශනා කරන්න. යනුවෙන් පවසා ඒ සැටනම විවිධ දිශාවනට යවා භාග්‍යවතුන් වහන්සේ ද දහම් දෙසනු පිණිස උරුවෙල් දනව්වට වැඩි සේක.

අතරමඟ දී හමු වූ භද්දවග්ගිය කුමාරවරු තිස් දෙනෙක් ද බුදුරදුන්ගෙන් දහම් අසා පැවිදිව රහත් බව ලැබූහ. ඒ ශ්‍රාවක පිරිස ද ධර්මප්‍රචාරයෙහි යොදවනු ලැබූහ.

උරුවෙල් දනව්වේදී නේරංජරා ගඟ අසබඩ විසූ උරුවේල කාශ්‍යප, නදී කාශ්‍යප හා ගයා කාශ්‍යප යන තුන් බෑ ජටිලයෝ ද තමන්ගේ දහසක් ශ්‍රාවකයන් සමඟ බුදුරජාණන් වහන්සේගේ දහම් අසා පැවිදි ව රහත් බව ලැබූහ. බුද්ධත්වයෙන් ප්‍රථම වර්ෂය තුළදීම බුදුරජාණන් වහන්සේ පළමුවරට

ලක්දිව මහියංගනයට වැඩි සේක. එහි දී දහම් ඇසූ සමන් දෙවියෝ සෝවාන් බව ලැබූහ. ආපසු උරුවේලාවට ම වැඩි බුදුරජාණන් වහන්සේ, අනතුරුව සත්‍යය සොයා යන සමයේදී මගධ රට බිම්බිසාර රජතුමා කළ ඉල්ලීම ඉටු කිරීම සඳහා ජටිල භික්ෂූන් වහන්සේ එක් දහස් තුන්නමක් පිරිවරා ගෙන රජගහනුවරට වැඩම කළ සේක. බණ අසා පැහැදී සෝවාන් බව ලැබූ බිම්බිසාර රජතුමා තමන්ගේ වේළුවන උද්‍යානය බුද්ධප්‍රමුඛ මහා සංඝයාට පූජා කළේය. ඒ බුදුසසුනේ ප්‍රථම ආරාම පූජාවයි.

මේ කාලයේදී ම වාගේ ධර්ම ප්‍රචාරයෙහි ගිය අස්සජි මහ රහතන් වහන්සේගේ මාර්ගෝපදේශකත්වය යටතේ උපතිස්ස කෝලිත යන පරිබ්‍රාජකයන් දෙදෙන බුදුරජාණන් වහන්සේ වෙත ගොස් පැවිදිව රහත් බව ලැබූහ. බුදුරජාණන් වහන්සේ වෙතින් අග්‍රශ්‍රාවක තනතුරු ලබා සැරියුත් මුගලන් යන දෙනමින් ප්‍රසිද්ධ වූවෝ මේ දෙදෙනා වහන්සේය.

සුදොවුන් රජතුමාගේ ඇරයුම පරිදිත්, කාළුදායි තෙරුන්ගේ මෙහෙයුම පරිදිත් නෑයන්ට වැඩ පිණිස භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කෙළේ බුද්ධත්වයෙන් දෙවෙනි වර්ෂයේදීය. මාන්නක්කාර ශාක්‍යයෝ බුදුරදුන්ගෙන් දහම් අසා පැහැදුණහ. සුදොවුන් රජතුමා සෝවාන් බවට පත්විය. බුදුරජාණන් වහන්සේ අගසවු දෙනම ද කැටුව යසෝදරා දේවිය දක්නට වැඩි සේක. ඕ බුදු පාමුල හඬා වැලප ශෝකය නිවා ගත්තාය. සුදොවුන් රජතුමා ඇගේ පති භක්තිය වර්ණනා කළ කෙනෙහි ඇය පෙරත් එසේ ම බව පවසමින් භාග්‍යවතුන් වහන්සේ සඳ කිඳුරු ජාතකය වදාළ සේක. මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ පුත් නන්ද කුමාරයාත්, යශෝධරාවගේ පුත් රාහුල කුමාරයාත් සසුන්ගත වූයේ මේ දිනවල දී ය.

මෙයට ටික කලකට පසු ආනන්ද හා දේවදත්ත යන කුමාරවරුත් උපාලි නම් කපුවාත් සසුන්ගත වූහ. බුදුරජාණන් වහන්සේ නැවතත් රජගහනුවර වේළුවනාරාමයට වැඩමවා සිටි සමයේදී විශාලා මහනුවර වැස්සෝ ත්‍රිවිධ භයකට ගොදුරු වූහ. බුදුරජාණන් වහන්සේ එහි වැඩ, අනඳ තෙරුන් ලවා රතන සූත්‍ර පිරිත දේශනා කරවා එනුවර වැස්සන් සුවපත් කළහ.

බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව සමාජයේ විවිධ තරාතිරම්වල අය කෙරෙහි යොමු විය. කුලයෙන් පහත් යයි සමාජය විසින් හෙලා දකිනු

ලැබූ සුනීත වැන්නවුන් ද දුකට පත් සෝපාක වැනි අසරණයින් ද පැවිදි ව මහරහතුන් බවට පත්වී දෙවි බඹුන්ගෙන් පවා ගෞරව ලැබුවේ බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව නිසාය.

වරක් බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්නුවර නිග්‍රෝධාරාමයේ වැඩ වසද්දී, රෝහිණී ගඟේ ජලය බෙදා ගත නොහැකිව අරගලයක් ඇති කරගත් ශාක්‍යයෝත්, කෝලියෝත් සටනකට සූදානම් වූහ. මහා කාරුණිකයාණන් වහන්සේ සටන්බිමට වැඩ දෙපිරිසට අවවාද කොට සමගි කළහ. එදින එක් එක් පක්ෂයෙන් දෙසිය පණස බැගින් පන්සියයක් ශාක්‍ය කෝලිය කුමරුවෝ පැවිදි වූහ.

බුද්ධත්වයෙන් පස්වන වස බුදුරජාණන් වහන්සේ විශාලා නුවර කූටාගාර ශාලාවේ වෙසෙන කල, මහාප්‍රජාපතී ගෝතමී දේවිය තවත් කාන්තාවන් පන්සියයක් සමඟ එහි ගොස් පැවිද්ද ඉල්ලා සිටියාය. බුදුරජාණන් වහන්සේ මුලින් අකමැති වුවත් අනඳ තෙරුන්ගේ බලවත් ඉල්ලීම පිට ගරු ධර්ම අටක් පිළිපැදීමට ගෝතමිය කැමති කරවා ගෙන ඇයට පැවිදි උපසම්පදාව ලබා දුන් සේක. ඉක්බිති යසෝදරා දේවිය ඇතුළු අනෙක් කාන්තාවෝ මහාප්‍රජාපතී ගෝතමී තෙරණියගෙන් පැවිද්ද ලැබූහ. මෙතෙක් සමාජයේ අඩු සැලකිල්ල ලබමින් සිටි කාන්තාවනට ද විමුක්ති මාර්ගයේ දොර හැරුණි. බුදුසමය නිසා කාන්තා නිදහසේ උදාව ද ඇරඹුණි.

මේ කාලයේදී ම දෙවන වරටත් ලක්දිව නාගදීපයට වැඩි බුදුරජාණන් වහන්සේ මිණි පළඟකට සටන් වැද සිටි චූලෝදර මහෝදර යන නා රජුන් සමගි කළහ.

සත්වෙනි වස භාග්‍යවතුන් වහන්සේ තව්තිසා දෙව්ලොවට වැඩ මාතෘ දිව්‍ය රාජයාට අභිධර්මය දේශනා කළ සේක. දෙව්පුත් සෝවාන් විය.

බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවර වසන කාලයේදී මාගන්දිය නැමති බමුණෙක් බුදුරදුන්ගේ රූපශ්‍රීය දැක, තමාගේ මාගන්දියා නැමැති රූමත් තරුණ දියණිය ආවාහ කර ගන්නා ලෙස ඉල්ලා සිටියේය. මිනිස් සිරුරේ පිළිකුල් බව පවසා, එම යෝජනාව ප්‍රතික්ෂේප කළ බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය ඇසූ මාගන්දිය බමුණා සෝවාන් ව පැවිදි විය. පසුව උදේන

රජුගේ බිසෝ තනතුරක් ලද මාගන්දියා තරුණ බැමිණිය බුදුරදුන් තමනට නිග්‍රහ කෙළේය යි වරදවා වටහා ගෙන, පලිගන්නා අදහසින් පිරිස් යොදවා මහමඟ වඩිනා බුදුපාමොක් මහ සඟනට නොයෙක් අන්දමින් පරිභව කිරීමට සැලැස්වූවාය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ කම්පා නොවී ඒ නින්දා අපහාස සියල්ල ඉවසා තමන් ගෙන ගිය ලෝසසුන් වැඩ එලෙසම ගෙන ගියහ.

වරක් කොසඹෑ නුවර විනයධර හා ධර්මධර යන භික්ෂූන් අතර අසමගියක් ඇති විය. තමන් වහන්සේගේ අවවාද පිළිගෙන භික්ෂූන් සමඟි නොවූයෙන් භාග්‍යවතුන් වහන්සේ පාරිලෙය්‍ය වනයට වැඩ, ඇත් රජකුගේ උපකාර ලබමින් හුදෙකලාව දසවැනි වස් කාලය ගෙවූහ. පසුව කලහකාරී භික්ෂූහු සමඟි සම්පන්නව බුදුරදුන් කමා කර ගත්හ.

දොළොස්වන වස භාග්‍යවතුන් වහන්සේ උදය නම් බමුණෙකුගේ ආරාධනාවෙන් වේරංජා නුවර වස් විසූහ. එහෙත් උදය බමුණාට ඒ බව අමතක විය. ඒ වස් කාලය දුෂ්කර ලෙස ගත කළත් අටලෝ දහමිහි කම්පා නොවන බුදුරජාණන් වහන්සේ උදය බමුණා කෙරෙහි මෙත් පතුරවා, වස් අවසන ඔහුගේ නිවසට ගොස් තමන් වහන්සේ වස් අවසන් කොට වඩනා බව පවසා චාරිකාවේ යෙදුණාහ.

දහසය වන වස බුදුරජාණන් වහන්සේ ගත කළේ අලව්නුවරය. අලව්යකුට අලව් කුමරුන් බිලිදීමේ දිනය උදා විය. පුරිසදම්මසාරථී බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ඉවසීමේ බලයෙන් අලව් යකු දමනය කොට, ඔහු ඇසූ ප්‍රශ්න ද විසඳා ඔහු තවත් පරපණ නොනසන්නෙකු බවට පත් කළහ. මරණයට කැප වූ අලව්කුමරුට ද තවත් බොහෝ දෙනාට ද ජීවිත දානය ලැබුණි.

බුද්ධත්වයෙන් විසි වන වස ගෙවෙද්දී භාග්‍යවතුන් වහන්සේට වයස අවුරුදු **55**ක් විය. මෙතෙක් උන්වහන්සේට ස්ථිර උපස්ථායකයෙක් නොසිටියේය. තවදුරටත් ලෝකාර්ථ චර්යාවේ යෙදීමට තමන් වහන්සේට ස්ථිර උපස්ථායකයකු ඇත්නම් මැනවැයි උන්වහන්සේට කල්පනා විය. මේ බව මහා සංඝයා වහන්සේට ද දැනුම් දෙන ලදී. බුද්ධෝපස්ථායක තනතුර සඳහා බොහෝ වහන්දෑ ඉල්ලුම් කළ ද, එසේ ඉල්ලීමක් නොකළ

ආනන්ද ස්ථවිරයන්ට ඒ තනතුර ලැබුණේ උන්වහන්සේ පෙර අත්බැව්වල සිට ඒ තනතුර පතා ගෙන ආ බැවිනි.

බුද්ධත්වයෙන් මුල් විසි වස තුළ දඹදිව සොළොස් මහා ජනපද සියල්ලේ ම වාගේ බුදුදහම පැතිර ගියේය. පහත් යයි සම්මත කසල සෝධකයාගේ පටන් රජමැති සිටුවරුන් ආදී ප්‍රභූ මට්ටමේ පුද්ගලයන් දක්වා විවිධ තරාතිරම්වල ජනතාව බුදු බණ අසා සැනසුම ලබා භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් බවට පත් වූහ.

බුදුදහම බොහෝ දෙනෙකුගේ සිත් ගැනීමට හේතු වූ කරුණු රැසකි. භාග්‍යවතුන් වහන්සේගේ ආදර්ශයත්, බුද්ධශ්‍රාවකයන්ගේ විනීත පැවැත්මත්, ධනය, බලය, කුලය ආදී තරාතිරම්වලට නොව මිනිසත් බවට සැලකීමේ විශේෂ ගුණයත්, බුද්ධිගෝචර වූ පෙර නොඇසූ විරූ දහමක් දෙසීමත් ශ්‍රාවකයන් බඳවා ගැනීමට විශේෂ පෙළඹවීමක් නොකිරීමත් අනෙක් ආගම් අදහන්නන් කෙරෙහි බුදුරජාණන් වහන්සේ දැක් වූ සහනශීලි ප්‍රතිපත්තියත්, බුදුදහම ජනප්‍රිය වී පැතිර යාමට හේතු වූ කරුණු කීපයකි.

අභ්‍යාසය :

1. බුද්ධ චරිතයේ මුල් විසි වසර ඇසුරෙන් දියුණුවට පත්වීම සඳහා දරුවෙකුට ගත හැකි ආදර්ශ හැකිතාක් දක්වන්න.

## 3 පාඩම

# බුද්ධ චරිතයේ අවසාන විසිපස් වසර

බුද්ධත්වයෙන් මුල් විසිවස ගෙවෙද්දී බුදුදහම දඹදිව සොළොස් මහා ජනපදවල පැතිරෙමින් තිබුණේය. බුදුරදුන්ගේ කීර්තිනාමය ද රට පුරා පැතිර ගොස් තිබුණි. ඒ අර්හත් වූ, සම්මා සම්බුද්ධ වූ, සුගත වූ, ............ භාග්‍යවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ චාරිකාවේ යෙදෙන ගමන් අපේ ගමටත් වැඩියහ. යන ආරංචිය අසන ගම්වැසියෝ සිය දහස් ගණනින් උන්වහන්සේ වෙත ගොස් තෙරුවන් සරණ ගියහ. බොහෝ දෙනා පැවිදි වූහ. රජවරු, සිටුවරු, කුමාරවරු, සැදැහැවත් බෞද්ධ උපාසකයෝ බවට පත්වූහ. පූජාවට සුදුසු වූ උන්වහන්සේට අපමණ ලාභ කීර්ති ප්‍රශංසා ලැබෙන්නට විය. එහෙත් ඒ කිසිවකට උන් වහන්සේ ඇලුම් නොකළ සේක. මේ අතර උන්වහන්සේට ලැබෙන කීර්ති ප්‍රශංසා ගැන නොසතුටු වූ පිරිස් ද වූහ. දෙව්දත් තෙර හා අන්‍යාගමික තීර්ථක පිරිස් ඒ අතර වූහ.

යසෝදරා දේවියගේ සොහොයුරෙකු වූ දෙව්දත් පැවිදි වූයේ බුදුරජාණන් වහන්සේ මුල් වරට කිඹුල්වත් නුවරට වැඩම වූ කාලයේදීමය. ලෞකික ධ්‍යාන ලබා සිටියත් දෙව්දත් තෙර සෝවාන් ආදී මාර්ගඵල කිසිවක් ලබා සිටියේ නැත. රාජවංශයෙන් පැවිදි වුණු මටත් බුදුරදුන්ට මෙන් ම ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ලැබිය යුතුය යි දෙව්දත් තෙර කල්පනා කෙළේය. එහෙත් මහජන ප්‍රසාදයක් නොලබා සිටි උන්වහන්සේට ඒ කිසිවක් නොලැබිණ. මේ නිසා තථාගතයන් වහන්සේ කෙරෙහි දෙව්දත් තෙරුන්ගේ වෛරයක් ගොඩ නැගිණ.

බිම්බිසාර රජුගේ පුත් අජාසත් කුමරු සමඟ මිත්‍රත්වයක් ඇති කරගත් දෙව්දත් තෙර බිම්බිසාර රජතුමා මරවා අජාසත් කුමරුට මගධ රාජ්‍යය ලබාදීමටත්, බුදුරදුන් නැති කොට තමාට බුද්ධ රාජ්‍යය ලබා ගැනීමටත් වැඩ පිළිවෙලක් යෙදීය. දෙව්දත්ට රැවටුණු අජාසත් කුමරු ඒ අදහසට එකඟව තම පියා 'දහ ගෙට' යවා මගධයෙහි රජ බවට පත් විය.

ඉක්බිති දෙව්දත් තෙර බුදුරදුන් නැසීමට නොයෙක් උපක්‍රම යෙදීය. වරක් බුදුරජාණන් වහන්සේ මැරීමට යැවූ දුනුවායෝ බුදු සරණ ගියහ.

ඉක්බිති ගිජුකුළු පව්වේ සිට, ගල පාමුල ගමන් කරමින් සිටි තථාගතයන් වහන්සේ මතට ගලක් පෙරලන ලද්දේය. අතරමඟ තිබූ ගල් කුලක හැපී එය නතර විණි. අනතුරුව නාලාගිරි නැමති දරුණු ඇතුට රා පොවා බුදුරදුන් වඩනා පෙරමඟට යවන ලද්දේත් දෙව්දත් විසින්මය. ඒ ඇත් මහා කාරුණිකයාණන් වහන්සේගේ මෙත් සිසිලෙන් නැවී බුදු පාමුල දණ නමා, හිස නමා සිටියේය. මෙලෙසින් භාග්‍යවතුන් වහන්සේ නැසීමට දෙව්දත් කළ උපක්‍රම කිසිවක් සාර්ථක නොවීය. කරුණු තේරුම් ගත් අජාසත් රජතුමා ද දෙව්දත්ට කළ සැලකිළි නැවැත්වීය. නැවතත් දෙව්දත් තෙර තමාට පිහිට බුදුරදුන් පමණක් යයි සිතා උන්වහන්සේ වෙත ගොස් රැඳුණේය. එහෙත් ටික දවසකින් භික්ෂූන් අතර අසමගියක් ඇති කිරීමට සිතූ හෙතෙමේ අළුත මහණ වූ පන්සියයක් භික්ෂූන් තමන්ගේ බසට හරවා ගෙන ගයාවට ගොස් එහි නතර විසීය. බුදුරජාණන් වහන්සේ අගසව් දෙනම යවා ඒ නොමග ගිය භික්ෂූන් ආපසු ගෙන්වා ගත්හ. මේ අන්දමින් තමන්ගේ දිවි තොර කිරීමට පවා කටයුතු කළ දෙව්දත් කෙරෙහි මෛත්‍රියෙන් ඒ භාග්‍යවතුන් වහන්සේ නොසැලී කම්පා නොවී කටයුතු කළහ.

අබෞද්ධයන් දහස් ගණනින් බුදු සව්වන් බවට පත්වීම නිසා තමාට ලැබෙන ලාභ ප්‍රයෝජන අඩුවන බව තීර්ථකයෝ දුටුහ. එබැවින් භාග්‍යවතුන් වහන්සේ හා ශ්‍රාවකයන් මහජන අප්‍රසාදයට ලක් කිරීමට ඔවුහු බොහෝ උපක්‍රම යෙදූහ. වරක් ඔවුහු සුන්දරී නැමැති රූප සම්පන්න පරිබ්‍රාජිකාවක රහසින් මරා දෙව්රම් වෙහෙර පොකුණ අසල වළලා දැමූහ. පසුව ඔවුහු සුන්දරී සොයා ගොස් ඇය වළලා දැමූ තැනින් ගොඩ ගෙන එය බුදුරජාණන් වහන්සේගේ හා බුද්ධ ශ්‍රාවකයන්ගේ වැඩකැයි රට පුරා ප්‍රසිද්ධ කළහ. මෙය විශ්වාස කළ සමහරු බුදුරජාණන් වහන්සේටත් ශ්‍රාවකයන් වහන්සේලාටත් නින්දා අපහාස කළහ. බුදුරජාණන් වහන්සේ පිඬු පිණිස පවා නොවැඩ ඒ නින්දා ඉවසූ සේක. සුන්දරීගේ මරණය තීර්ථකයන්ගේ වැඩකැයි අනාවරණය වූ පසු භාග්‍යවතුන් වහන්සේ හා ශ්‍රාවකයන් කෙරෙහි මහජන ප්‍රසාදය තවත් වැඩි විය.

තවත් වරක් තීර්ථකයෝ චිංචා මානවිකාව නම් රූමත් කතක් බුදුරදුන්ට නිග්‍රහ කිරීමට යොදා ගත්හ. චිංචා ගැබිණියක මෙන් සැරසී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස් උන්වහන්සේ නිසා ඇය දරු ප්‍රසූතියට ළංවී ඇති බව කියා සිටියාය. සොහොයුරිය, ඔබේ කථාවේ ඇත්ත දන්නේ ඔබත්

මාත් පමණකැයි භාග්‍යවතුන් වහන්සේ ඉතා සන්සුන්ව වදාළහ. හදිසියේම චිංචාගේ උදරය මහත්වීමට බැඳ තිබුණ දේවල් කඩා හැලී බිම වැටිණ. කාරණය තේරුම්ගත් එහි සිටි මිනිසුන් ඇයට අවමන් කොට ඇය දෙව්රම් වෙහෙරින් පළවා හැරියහ. බුදුරජාණන් වහන්සේගේ තාදි ගුණය උන්වහන්සේ කෙරෙහි මහජන ප්‍රසාදය වැඩිවීමට හේතු විය.

බුදුරජාණන් වහන්සේ මුළු ජීවිත කාලය ම යෙදුවේ පරාර්ථ සේවය සඳහාය. ජීවිතයේ සන්ධ්‍යා භාගයේදී පවා අසරණයන් සොයා දුරබැහැරට පයින්ම වැඩ ඔවුනට පිහිට වූහ. එසේම අසරණ වී තමන් වෙතට පැමිණෙන්නකු ඉතාම සතුටින් පිළිගෙන පිහිටවීම උන්වහන්සේගේ සිරිත විය. එක්තරා ගොවියෙකු කුඹුරක් කරද්දී සීසෑම, වැපිරීම, වල් නෙලීම ආදී සියලු ගොවි කටයුතු කෙරෙන දිනවල කුඹුරට වැඩ, ගොවියා හා කතා බහ කිරීම භාග්‍යවතුන් වහන්සේ සිරිතක් කර ගත්තේ ඔහුට මතු දවසක පිහිට වන අදහසිනි. අස්වැන්නෙන් කොටසක් බුදුරජාණන් වහන්සේට දීමට සිතා සිටි ගොවියාගේ පැසී තිබුණ කුඹුර එක් දිනක මහ වැස්සෙන් විනාශ විය. බුදුරජාණන් වහන්සේ ශෝකයට පත් ගොවියාගේ නිවසටම වැඩම කර ඔහු සනසා, සියලුම ශෝකයන්ට හේතුව අධික බලාපොරොත්තු සුන්වීමය යි පවසමින් දහම් දෙසා ඔහුට සෝවාන් බව පසක් කර ගැනීමට මඟ සැලසූ සේක.

දරුවන් විසින් පිටමන් කරනු ලැබ අසරණ වී සිටි මහලු බමුණෙකුට උන්වහන්සේ නැවතත් දරුවන්ගේ සැලකිල්ල ලබාදීමට කටයුතු කෙළේ උපක්‍රමශීලීවය. කළගුණ නොදන්නා පුතුන් පියෙකුට සලකන හැටි ඇතුළත් ගාථා පෙළක් මහලු බමුණාට උගන්වා එම ගාථා පුතුන් සහිත පිරිස් ඉදිරියේ ගැයීමට සැලැස්වීම එම උපක්‍රමය යි. ගාථා ඇසූ දරුවෝ ලැජ්ජාවට හා බියට පත්ව තම පියාණන් නැවත සිය නිවෙස්වලට කැඳවාගෙන ගොස් මැනවින් උපස්ථාන කළහ.

සැවැත්නුවර සිටි ආනන්ද නම් මසුරු සිටුවරයා මළ පසු සැඩොල් කුලයේ අංග විකල දරුවෙක් වී උපන්නේය. දිනක් මේ සැඩොල් දරුවා සිඟමනට ගියේ තමාගේ පළමු අත්බැව්හි සිටු නිවසටය. එහි සිටි මූලසිරි නැමැති සිටු පුත්‍රයාගේ සේවකයෝ අංග විකල සැඩොල් දරුවා තලා පෙළා කසල ගොඩට ඇද දැමූහ. මහා කාරුණික භාග්‍යවතුන් වහන්සේ එතැනට වැඩ අසරණ

සැඩොල් දරුවා මුලසිරි සිටු පුත්‍රයාගේ මිය ගිය පියා බව සැඩොල් දරුවා ලවාම ඔප්පු කරවා ඔහු සහවා තිබූ නිධානයක් ද පෙන්වා දුන් සේක. මුලසිරි සිටු පුත්‍රයා තෙරුවන් සරණ ගොස් එතැන් පටන් අසරණ සැඩොල් දරුවාට සැළකිලි දැක්වීය.

නොයෙක් හේතූන් නිසා අසරණ තත්ත්වයට පත් වූ විවිධ තරාතිරම් වල කාන්තාවෝ ද මහා කාරුණිකයාණන් වහන්සේ වෙත ගොස් සැනසුම ලබා ගත්හ. ස්වකීය ආදරණීය සැමියාත්, දරුවන් දෙදෙනාත්, මැණියන්, පියාණන් හා සහෝදරයාත් එකම දිනයේදී අහිමි වූ පටාචාරාව පිස්සියක මෙන් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණියේ ඇඳිවත ද නැතිවය. බුදු කරුණාව ලබා දහම් අසා පැවිදි වූ ඕ රහත් බව ලැබුවාය.

කිසා ගෝතමී සිය මළ දරුවා බුදු පාමුල තබා බෙහෙත් කොට ඔහු සුවපත් කර දෙන ලෙස ඉල්ලා සිටියාය. භාග්‍යවතුන් වහන්සේ පුතුට බෙහෙත් කිරීම සඳහා කිසිවකු නොමළ ගෙයකින් අබ ටිකක් ගෙනෙන ලෙස ඇයට වදාළහ. කිසිවකු නොමළ ගෙයකින් අබ සොයා ගිය කිසාගෝතමියට කාරණය වැටහුණෙන් මළ පුතු සොහොනේ දමා ආපසු බුදුරදුන් වෙත පැමිණ පැවිද්ද ලබා රහත් බව පසක් කර ගත්තාය.

ස්වකීය ස්වාමි දුවගේ කෲර අතවරයන්ගෙන් බේරීමට රජ්ජුමාලා දාසිය වනයට ගොස් ගෙල වැලලා ගෙන මිය යන්නට සූදානම් වූවාය. ඒ දුටු මහා කාරුණිකයාණන් වහන්සේ "දියණිය, රජ්ජුමාලා මා වෙත එන්න". යනුවෙන් වදාළහ. ඒ කාරුණික වදන් ඇසූ රජ්ජුමාලා බුදු සිරිපා වැඳ හිඳ ගත්තා, දහම් අසා සෝවාන් ඵලය අත්පත් කර ගත්තාය.

බුදු වීමෙන් පසු හතළිස් පස් වසක්ම දිවා රෑ නොබලා ලෝ සතුන් සුවපත් කිරීමෙහි යෙදුණු භාග්‍යවතුන් වහන්සේ අසූ වියට පත්වෙමින් සිටි සේක. පරිනිර්වාණය සඳහා උන්වහන්සේ රජගහනුවර සිට කුසිනාරා නුවර දක්වා පයින් ම වැඩියේ අතරමඟදී හමු වන භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවන්ට වැඩ සඳහාය. භික්ෂු සංඝයා පිරිවරා නුවරින් නුවරට වඩින උන්වහන්සේ සිය දහස් ගණන් ජනයාට දහම් දෙසූහ. වැඩි වශයෙන් දේශනා කෙළේ ශීල, සමාධි, ප්‍රඥා වැඩීමේ අනුසස්ය.

විසාලා නුවරදී අම්බපාලි නගර ශෝභනිය බුදුරජාණන් වහන්සේට ඇගේ අඹ උයන පුදා මහදන් පැවැත්වූවාය. පැවිදි වූ ඇය පසුව රහත් වූවාය. බුදුරජාණන් වහන්සේ අවසාන වස් කාලය ගත කෙළේ බේලුව ගමේය. එහිදී උන්වහන්සේට බලවත් උදරාබාධයක් ඇති විය. අසනීපය ගැන දුක් වෙමින් සිටි ආනන්ද හාමුදුරුවන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. ආනන්දය, මම දැන් අසූ වයස් ගත වූ මහල්ලෙක්මි. මගේ ශරීරය දිරා ගිය කරත්තයක් බඳුය. තවදුරටත් එය පවත්වා ගත හැක්කේ චිත්ත ශක්තියෙනි.

ආනන්දය, දැන් ඔබ තමා ම පිහිට කොට ගෙන අන් පිහිටක් නොසිතා වාසය කළ යුතුය. ධර්මය පිහිට කොට ගෙන ශික්ෂාකාමී ව කල් ගෙවිය යුතුය.

ගම් නියම් ගම් පසු කරමින් වඩිනා බුදුරජාණන් වහන්සේට පාවා නුවරදී චුන්දකර්මාර පුත්‍රයා දන් පිළිගැන්වීය. එය උන්වහන්සේ අන්තිම වරට වැළඳූ දානයයි. පාවා නුවරින් කුසිනාරා නුවරට වඩිනා උන්වහන්සේ අතරමඟදී ක්ලාන්ත වූහ. අනඳ තෙරුන් ලවා පැන් ගෙන්වා ගෙන පානය කළහ. අවසාන නැවතීම සඳහා උන්වහන්සේ වැඩියේ මල්ල රජවරුන්ගේ උපවර්තන නම් සල් උයනටය. එහිදී අනඳ තෙරුන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ, "ආනන්දය මට හරියට වෙහෙසයි. ක්ලාන්තය දැනෙනවා. මේ සල් ගස් දෙක අතර උතුරට හිස තබා සැතපෙන්නට ආසනයක් පිළියෙල කරන්න". යනුවෙන් පැවසූහ. පනවන ලද ආසනයේ ඒ ශාන්ති නායකයාණෝ දකුණු ශ්‍රී පාදය වම් ශ්‍රී පාදය මත තබා දකුණැලයෙන් සිංහ සෙය්‍යාවෙන් සැතපුණු සේක. එකල අකාලයේ මල් පිපුණු ඒ සල් ගස් දෙක තථාගත ශරීරය මත සල්මල් වගුරවමින් සිටියේය. පරසතු මදාරා ආදී දිව මල් ද අහසින් බුදු බඳ මත පතිත විය. දිව්‍යමය පසඟතුරු හඬ ඇසිනි. අහස් ගී ගැයිණි.

බුද්ධ පරිනිර්වාණය එදින රාත්‍රියේ සිදු වන බව දත් අනඳ තෙරුණුවෝ පසෙකට වී හඬන්නට වූහ. බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන් සනසා, රැස්ව සිටි භික්ෂු පිරිසට අනඳ තෙරුන්ගේ ගුණ කථනයක් ද කළහ.

බුදුරදුන් එදින රාත්‍රියේ පිරිනිවන් පානා බව ඇසූ මල්ල රජදරුවෝ සිය බිරියන් දරු දැරියන් සමඟ චිත් හඬා වැලප බුදු සිරිපා වැන්දාහ.

එවේලෙහි සුභද්ද නම් පරිබ්‍රාජකයෙක් බුදුරදුන්ගෙන් පැනයක් ඇසීමට අවසර ඉල්වීය. අනඳ තෙරුන් එය වැළැක්වීමට අදහස් කළත් බුදුරජාණන් වහන්සේ එයට කැමැත්තෙන් ම අවසර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් සැක දුරුකර ගෙන පැවිදි උපසම්පදාව ලැබූ අන්තිම ශ්‍රාවකයා සුභද්දය.

"මහණෙනි, යම් කිසිවකුට බුදුන්, දහම්, සඟුන් කෙරෙහි හෝ ධර්මය කෙරෙහි හෝ සැකයක් ඇත්නම් දැන් විමසන්න. ඉදින් මා කෙරෙහි ගෞරවයෙන් ප්‍රශ්නයක් ඇසීමට කෙනෙකුට නොසිතේ නම් යහළු නමක් ලවා හෝ විමසන්න". යනුවෙන් මේ අවසාන මොහොතේ දී පවා පැවසීමට තථාගතයන් වහන්සේ කාරුණික වූහ. කිසිවෙක් ප්‍රශ්න නොනැගූහ.

"මහණෙනි, සියලු හටගත් දේ නැසෙන සුලුය. එබැවින් නොපමාව කුසල් දහම් හී හැසිරෙන්න". මේ බුදුරජාණන් වහන්සේගේ අන්තිම වචනයයි.

ක්‍රමයෙන් ධ්‍යානවලට සම වැදුණු ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ අවසන් වරට චතුරර්ථ ධ්‍යානයට සමවැදී එයින් නැගී පිරිනිවන් පා වදාළහ.

එවේලෙහි මහපොළොව කම්පා විය. අහස ගුගුරන්නට විය. ඒ සම්බුද්ධ පරිනිර්වාණය ලොවට දැන්වීමකි.

අභ්‍යාසය :

1. අවසන් මොහොත දක්වාම බුදුරජාණන් වහන්සේ පරාර්ථ චර්යාවේ නියැලුණු සේක. මේ කියමන සැබෑ බවට කරුණු දක්වන්න.

# 4 පාඩම

## බුදුරජාණන් වහන්සේගේ ජීව හිතවාදී ආකල්පය

සිද්ධාර්ථ බෝධිසත්වයන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කෙළේ ලොව දුක් විඳින සියලු ලෝකවාසී සත්වයන් කෙරෙහි අනුකම්පාවෙන්ය.

මම සත්‍යය අවබෝධ කොට ගෙන අන් අයට අවබෝධ කරවන්නෙමි.

මම දුකින් මිදී අන් අය දුකින් මුදවන්නෙමි.

සංසාරය නැමැති මහා සැඩ පහරින් මම එතෙර වී අන් අයත් එතෙර කරවන්නෙමි.

මේ උන්වහන්සේගේ ප්‍රාර්ථනාවයි.

එසේම බුද්ධත්වය ලබා ගැනීමෙන් පසු, ප්‍රථම රහත් හැට නම ධර්මදූත සේවයේ යොදවමින් උන්වහන්සේ ප්‍රකාශ කළේ,

මහණෙනි, බොහෝ දෙනාට හිත සුව පිණිස ද ලොවට අනුකම්පා පිණිස ද, දෙව් මිනිසුනට වැඩ පිණිස ද හිත සුව පිණිස ද චාරිකාවේ හැසිරෙන්න. දෙනමක් එක් මඟින් නොවඩින්න. මුල, මැද, අග කල්‍යාණ වූ අර්ථවත් වූ ධර්මය දේශනා කරන්න යනුවෙනි.

මෙම ප්‍රකාශයන්ගෙන් පෙනෙන්නේ සකල ලෝක සත්වයන් කෙරෙහි උන්වහන්සේ තුළ පැවති හිතවාදී ආකල්පයයි.

අලුයම මහා කරුණාවෙන් යුතු ව බුදු ඇසින් ලොව බලා වදාරන උන්වහන්සේ විසින් තමන්ගේ ඥාන දැලට හසුවන, පීඩාවට පත් සත්වයන් එම පීඩාවන්ගෙන් මුදවා ගත් අවස්ථා මෙන්ම බොහෝ ජීවිත බේරාගත් අවස්ථා ද එමටය. උන්වහන්සේ යුද පිටිවලට වැඩම කරවා සටන් අභිමුඛ ව උන් පිරිස් සමඟි කරවා, සටන් බිම මිය යන්නට උන් භට සේනාවන්ගේ ජීවිත බේරා ගත්හ. බුද්ධත්වයෙන් නව වන දුරුතු මස මහවැලි ගඟ බඩ

මහියංගනයට වැඩම කළ උන්වහන්සේ සටන් අභිමුඛ ව උන් යක්ෂ ගෝත්‍රික දෙපිරිසක් සමඟි කරවූහ. වරක් කිඹුල්වත් නුවර රෝහිණී ගඟේ ජලය බෙදා ගැනීමට නොහැකිව ශාක්‍ය හා කෝලිය යන දෙපිරිස මහ සටනකට සූදානම් වූහ. බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට ගඟ දියට වඩා මිනිස් ජීවිත වටිනා බව ඔවුනට අවබෝධ කරවමින් සටන සමාදානය කෙළෙන් සිදු වන්නට ගිය මිනිස් ඝාතනයක් නැවතිණි. තවත් වරක් බුදුරජාණන් වහන්සේ නාගදීපයට වැඩම කොට මිණි පළඟක් සඳහා සටන් වැද සිටි චූලෝදර මහෝදර ප්‍රමුඛ නාග පිරිස් ඝාතන නැවැත්වූයේ උන්වහන්සේ තුළ පැවති ජීව හිතවාදී ආකල්පය නිසාය.

එක් කෙනෙකුගේ හෝ වැඩි දෙනෙකුගේ හෝ ජීවිත බේරා ගැනීමට ඉතා දුර බැහැරට වුව ද උන්වහන්සේ වැඩම කළහ. මළ මිනියකට බැඳ සොහොනකට ඇද දමා උන් අසරණ සෝපාක දරුවා බුදුරජාණන් වහන්සේ නොසිටින්නට සොහොනෙහි ම මිය යනු ඇත. මිනීමස් කමින් සිටි අළව් යකු නැවත පරපණ නොනසන්නෙකු බවට පත්වූයේ බුදුරජාණන් වහන්සේගේ ජීව හිතවාදී ආකල්පය නිසාය. ගෙල වැලලාගෙන මිය යන්නට සූදානම් වූ රජ්ජුමාලාගේ ජීවිතය බේරුණේ බුදුරජාණන් වහන්සේ නිසාය. උන්වහන්සේගේ කරුණාව මිනිසුන්ට පමණක් නොව තිරිසන් සතුන් කෙරෙහි ද යොමු විය. වරක් ගැරඬියෙකුට ගල් ගසමින් හිරිහැර කරමින් උන් ළමයින් කණ්ඩායමකට අවවාද කොට උන් වහන්සේ එම ගැරඬියා මුදා හැරි සේක. මහලු වූ පසු සැළකිළි නොදක්වා උදේන රජ විසින් පලවා හරින ලද භද්‍රවතිකා නමැති ඇතින්නගේ දුක්බර ජීවිතය දුටු බුදුරජාණන් වහන්සේ නැවතත් ඇයට සත්කාර කොට සැළකිළි දැක්වීමට රජු පෙළඹවූහ. මේ අන්දමින් මහා කරුණාවෙන් කටයුතු කළ බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් බොහෝ විට නිරූපනය වන්නේ උන්වහන්සේගේ ජීව හිතවාදී ආකල්පයයි.

පංච ශීලයේ එන පරපණ නැසීමෙන් වළකිමි යන ශික්ෂාපදයෙන් තහවුරු කරන්නේ මේ මිහිපිට හැම දෙනාටම ජීවත්වීමේ අයිතිය ඇති බවය. තමන් උපමා කොට ගෙන කිසිවකු නොමැරිය යුතුය, නොමැරවිය යුතුය. (අත්තානං උපමං කත්වා නහනෙය්‍ය නඝාතයේ) යනුවෙන් බුදුරජාණන් වහන්සේ දෙන උපදේශයෙන් පැහැදිලි වන්නේ ද සකල ජීවීන් කෙරෙහි උන්වහන්සේ තුළ පැවැති හිතවාදී ආකල්පයයි.

සමාජ හිතවාදියෙකු මෙන් ම, මුළු සත්ව වෘක්ෂ කෙරෙහි දයාව දක්වමින් ජීව හිතවාදියෙකු වීමට බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයනට ඉගැන්වූහ. මිනිස් සමාජයේ වර්ණභේද, කුලභේද, ජාතිභේද ආදිය නොසැලකූ උන්වහන්සේ මිනිසත් බව ලද හැම දෙනාම සමාන අයිතිවාසිකම් ඇත්තවුන් ලෙස සැලකූහ.

සමාජ හිතකාමියෙකු වීම සඳහා සතර සංග්‍රහවස්තු නම් චර්යා ධර්ම හතරක් උන්වහන්සේ ඉගැන්වූහ. දාන, ප්‍රියවචන, අර්ථ චර්යා හා සමානාත්මතා යනු ඒ සතර සංග්‍රහ වස්තුවයි. දාන නම් තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් අන්‍යයන්ට පරිත්‍යාග කිරීමයි. ප්‍රිය වචන නම් බොරුව, කේලාම්, පරුෂ වචනය හා හිස්වචන යන වාග් දුශ්චරිතයන්ගෙන් වෙන් වී අනුන්ගේ යහපත පිණිස වචන කථා කිරීමයි. අර්ථචාර්යා නම් අනුන්ගේ හිතසුව පිණිස කටයුතු කිරීමයි. තමා හා සමාන තත්ත්වයෙන් අනුන් ගැන ද සලකා බලා කටයුතු කිරීම සමානාත්මතාවයි.

සතර සංග්‍රහ වස්තු හැරුණු විට, මිනිසුන් පමණක් නොව ලෝකවාසී හැම සත්වයන් කෙරෙහිම පැවතිය යුතු තවත් හැසිරීම් හතරක් බුදුරජාණන් වහන්සේ ඉගැන්වූහ. සතර බ්‍රහ්ම විහරණ නමින් හැඳින්වෙන්නේ ඒවාය. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ෂා යනු ඒ සතර බ්‍රහ්ම විහරණයි. මේවායින් ජීව හිතවාදී ආකල්පය ඉතා පැහැදිලිව දක්නට ලැබෙන්නේ මෙත්තා හා කරුණා යන හැසිරීම් තුළය.

මෙත්තා යනු මෛත්‍රිය හෙවත් මිතුරුබවයි. කරණීය මෙත්ත සූත්‍රයේදී අප විසින් මෛත්‍රිය වැඩිය යුත්තේ කා වෙතට ද යන්න බුදුරජාණන් වහන්සේ විසින් පැහැදිලිව දක්වා තිබේ. මේ සඳහා කරණී මෙත්ත සූත්‍රයේ අංක 4 හා 5 දරන ගාථා දෙකෙහි අරුත් විමසා බැලීම ප්‍රයෝජනවත්ය. එම ගාථාවල දක්වා ඇති සත්ව කොටස් මෙසේය.

| | | |
|---|---|---|
| තසා | - | තැතිගන්නා සුලු කෙලෙස් සහිත සත්වයෝ |
| ථාවරා | - | රහතන් වහන්සේලාය |
| දීඝා | - | දිග් ශරීර ඇත්තෝ |
| මහන්තා | - | මහත් වූ ශරීර ඇති අය |
| මජ්ඣිමා | - | මධ්‍යම තරමේ සත්වයෝ |
| රස්ස | - | මිටි ශරීර ඇති සත්වයෝ |

| | | |
|---|---|---|
| අණුක | - | ඉතා කුඩා ශරීර ඇති අය |
| ථූලා | - | තරබාරු ශරීර ඇති අය |
| දිට්ඨා | - | ඇසට පෙනෙන සත්වයෝ |
| අදිට්ඨා | - | ඇසට නොපෙනෙන සත්වයෝ |
| දූරෙවසන්ති | - | දුර වසන සත්වයෝ |
| අවිදූරේ වසන්ති | - | ළඟ වසන සත්වයෝ |
| භූතා | - | උපන්නා වූ සත්වයෝ |
| සම්භවේසී | - | ඉපදීමට සිටින්නාවූ සත්වයෝ |

මෙකී යන සියලුම සත්වයෝ සුවපත් වෙත්වා යනුවෙන් මෛත්‍රී වැඩිය යුතුය. බෞද්ධයාගේ මෛත්‍රියට හසු නොවන කිසිම ලෝක සත්වයෙකු නොමැති බව මෙයින් ඔබට අවබෝධ වෙනවා ඇත. බුදුරජාණන් වහන්සේගේ ජීව හිතවාදි ආකල්පයට සමස්ත ලෝකයේ ම සිටින සත්ව සමූහය ඇතුළත් වන බව මෙයින් පැහැදිලිය.

දෙවන බ්‍රහ්ම විහරණය කරුණාවයි. කරුණාව නම් දුකින් පෙළෙන සත්වයන් කෙරෙහි ඇතිවන අනුකම්පාවයි. තමන්ගේ නෑදෑ හිතවතුන්ගේ දුකෙහි දී පමණක් අනුකම්පාව දැක්වීම නියම කරුණාව නොවේ. තමාගේ සම්බන්ධයෙන් ඈත් වූ සත්වයන් දුක් විඳින විට ඇති වන දයාව නියම කරුණාවයි. ඉතියෝපියාවේ දරුවන් ආහාර නොමැතිව ලෙඩ රෝගවලට භාජන වී විඳින දුක් දකින අසන අපගේ සිත්වල කරුණාව ජනිත වේ නම් එය නියම කරුණාවට උදාහරණයකි. මනුෂ්‍යයන් පමණක් නොව තිරිසනුන් විඳින දුක් දකින බෞද්ධ හදවත්වල කරුණාව ජනිත වෙයි. (ධර්මාශෝක රජතුමා, බුද්ධදාස රජතුමා වැනි රජවරු සත්ව රෝහල් සාදා තිරිසන් සතුන්ට ද වෛද්‍ය පහසුකම් ලබා දුන්හ. ඒ බුදුරජාණන් වහන්සේ ඉගැන්වූ ජීව හිතවාදී ආකල්පයේ ප්‍රතිඵලයකි.)

මිනිසා ඇතුළු සියලු ජීවින් ජීවත් වන්නේ පරිසරය පිහිට කොට ගෙනය. වාතය, ජලය, ගහකොළ ආදියත් සමඟ සියලුම පාරිසරික වස්තූන්ගේ සුරක්ෂිතතාව පිළිබඳව බුදුරජාණන් වහන්සේ සැලකිලිමත් වී ඇත්තේ එබැවිනි. ජලය මල මූත්‍රා කෙළ ආදිය දැමීමෙන් අපවිත්‍ර නොකළ යුතු බව උන්වහන්සේ ඉගැන්වූහ. ගස්වැල් වැවීම හා ආරක්ෂා කිරීම නිතර පින් වැඩෙන පින්කම් බව බුදුරජාණන් වහන්සේ ඉගැන්වූයේ ජීව හිතවාදී

ආකල්පය නිසාය. පැන් පෙරා වැළඳීම උන්වහන්සේ අනුදැන වදාළෙත් පැන්වල සිටිය හැකි ක්ෂුද්‍ර ජීවීන් විනාශ වීම වැළැක්වීමටය. පරිසරය විනාශ නොකොට ධනය සපයා ගත යුතු බවත්, පරිසරයෙන් ප්‍රයෝජන ගත යුතු බවත් උන්වහන්සේගේ ඉගැන්වීම්වල ඇතුළත්ය.

ධනය රැස් කර ගත යුත්තේ මලට හානියක් නොකර රොන් ගන්නා මී මැස්සා මෙනැයි සිඟාලෝවාද සූත්‍රයේදී උන්වහන්සේ ප්‍රකාශ කරති. මලෙහි වර්ණයට හෝ ගන්ධයට හානියක් නොකොට මී මැස්සා පැනි ගෙන යන්නා සේ භික්ෂුව ගමෙහි හැසිරිය යුතු බව එක් ධම්මපද ගාථාවක ඉගැන්වෙයි. බුදුරජාණන් වහන්සේගේ මේ දේශනාවලින් පැහැදිලි වන්නේ හානි නොවන අන්දමින් පරිසරය ප්‍රයෝජනයට ගත යුතු බවයි. එය සමස්ත මිනිස් වර්ගයාට මෙන් ම සත්ව වර්ගයාට ද පොදු වූ දායාදයක් ලෙස බුදුරජාණන් වහන්සේ සැලකූහ.

මෙතෙක් සාකච්ඡා කළ කරුණුවලින් පෙනී යන්නේ බුදුරජාණන් වහන්සේ මානව හිතවාදී ශාස්තෘවරයෙකු පමණක් නොව ජීව හිතවාදී ශාස්තෘවරයෙකු බවය.

අභ්‍යාස ප්‍රශ්න :

1. සියලුම ජීවීන් කෙරෙහි දයාව දැක්විය යුතු බව පෙන්වා දෙන බෞද්ධ ඉගැන්වීම් මොනවා ද ?

2. බුදුරජාණන් වහන්සේ විසින් පරිසරය රැක ගත යුතු බවට කළ ප්‍රකාශනයන් රැස් කරන්න.

## 5 පාඩම

# බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය

මිනිසුන් අතර ඉපිද මිනිසුන් සමඟම ජීවත් වෙමින් දෙවියන්ගෙන් හා බඹුන්ගෙන් වැඳුම් ලබමින් ලොව ශ්‍රේෂ්ඨතම පදවිය ලබාගත් උතුමාණෝ බුදුරජාණන් වහන්සේය. මහා කරුණාව, මහා ප්‍රඥාව, යථාවාදී තථාකාරී ගුණය, අකම්ප්‍ය බව ආදී උන්වහන්සේගේ විශිෂ්ට ගුණ බොහෝය. බුදු කෙනෙකුන් වහන්සේගේ ගුණ වර්ණනා කළ හැක්කේ තවත් බුදු කෙනෙකුන් වහන්සේකට පමණක් යයි බුදුරජාණන් වහන්සේ විසින්ම වදාරා තිබේ. එබඳු අසීමිත ගුණ සහිත බුදුරජාණන් වහන්සේගේ එක් ගුණයක් ඔබට පහත සඳහන් කථාවෙන් හඳුනාගත හැකි වෙයි.

වරක් බුදුරජාණන් වහන්සේ උක්කට්ඨා නුවරත් සේතව්‍යා නුවරත් අතර මාර්ගයේ වඩිමින් සිටි සේක. එම මාර්ගයේ ම පසු ව ගමන් කළ ද්‍රෝණ නම් බමුණෙක් පාරේ සලකුණු වී තිබුණු විශේෂ පිය සටහන් පෙළක් දුටුවේය. දහසක් අර ඇති, නිම් වළලු සහිත රෝද සලකුණු එම පිය සටහන්වල ඇති බව දුටු බමුණා, "පුදුමයි, මේ පිය සටහන් නම් මිනිසෙකුගේ නොවෙයි". සිතමින් පිය සටහන් ඔස්සේ ඉදිරියටම ගමන් කළේය.

ටික දුරක් ගිය බමුණාට ගසක් මුල, සන්සුන්ව පළක් බැඳ භාවනායෝගීව වැඩ සිටිනා අසිරිමත් පුද්ගලයෙකු දක්නට ලැබිණි. ඉතා ප්‍රසන්න ලීලාවෙන් වැඩ හුන් මේ අසිරිමත් පුද්ගලයා ළඟට විත් එකත්පස් වූ ද්‍රෝණ බමුණා නිහඬතාව බින්දේය.

'ඔබ දෙවියෙක් ද ?'

'නැත බමුණ, මම දෙවියෙක් නොවෙමි'.

'ඔබ එහෙනම් ගාන්ධර්වයෙක් ද ?'

'නැත බමුණ, මම ගාන්ධර්වයෙක් ද නොවෙමි'.

'එහෙනම් ඔබ යක්ෂයෙක් ද ?'

'බමුණ, මම යක්ෂයෙක් ද නොවෙමි'.

'එහෙනම් ඔබ මනුෂ්‍යයෙක් ද ?'

'බමුණ, මම මනුෂ්‍යයෙක් ද නොවෙමි'.

'භවත්නි, මේක හරි පුදුම කථාවක්නේ, එහෙනම් ඔබ කව් ද ?'

බමුණ, දෙවියන් ගාන්ධර්වයන් හා යක්ෂයන් ළඟ කාමාදී කෙලෙස් තිබේ. කාම කෙලෙස් කිසිවක් නැති මම දෙවියෙක් හෝ ගාන්ධර්වයෙක් හෝ යක්ෂයෙක් හෝ නොවෙමි. එසේ ම මිනිසුන් තුළත් කෙලෙස් පිරී තිබේ. සියලුම කෙලෙස් නැති කළ නිසා මම සාමාන්‍ය මනුෂයෙක් ද නොවෙමි. බ්‍රාහ්මණය, ජලයෙහි ම ඉපදී, ජලයෙහි ම වැඩී, ජලයෙන් ඉහළට මතු වී ජලයෙහි නොගැවී සිටිනා මහනෙල් මලක්, නෙළුම් මලක් හෝ සුදු නෙළුම් මලක් පරිද්දෙන් මිනිසුන් අතර ම ඉපදී, මිනිසුන් අතරම වැඩී, මිනිසුන්ගෙන් ඉස්මතු වී මිනිසුන් සමඟ නොගැවී, නොබැඳී ඉන්නා කෙනෙකි මම. බ්‍රාහ්මණය, මම සියලුම කෙලෙස් නැති කළ උසස්ම මනුෂ්‍යයෙක්. බමුණ, මම බුදුවරයෙක්, ඒ අසිරිමත් පුද්ගලයා බුදුරජාණන් වහන්සේය.

මෙහි දී බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ එක් උපමාවකින් හැඳින්වූ සේක. ජලයෙහි ම ඉපිදී, ජලයෙහි ම වැඩී, ජලයෙන් ඉහළට මතු වී, ජලයෙහි නොගැවී සිටිනා මහනෙල් මලක්, රත් නෙළුම් මලක් හෝ සුදු නෙළුම් මලක් පරිද්දෙන් යන්න ඒ උපමාවයි. මහනෙල්, නෙළුම්, සුදු නෙළුම් ඈ සියල්ල පොදුවේ පද්ම යන්නෙන් හැඳින්විය හැකිය. එබැවින් මේ උපමාව තවත් කෙටි කර පවසතොත් බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ ජලයේ නොගැවී ජලයෙන් ඉහළට මතු වූ පද්මයකට සමාන කර ගත් බව පෙනේ.

ජලයේ නොගැවී ජලයෙන් ඉහළට නැගුණු පද්මය බුද්ධ ස්වභාවය සංකේතවත් කිරීමකි. බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය යනුවෙන් අදහස් කරන්නේ ද මේ බුද්ධස්වභාවය හෙවත් බුදුගුණයයි.

මේ උපමාව අර්ථවත් වන හැටි අපි තවදුරටත් විමසා බලමු.

මඩ හා ජලය සහිත විල ලෝකය බඳුය. විලෙහි හට ගන්නා විවිධාකාර පද්මයන් ලෝක සත්වයා බඳුය. සමහර පද්ම ජලයෙන් මතු වී ජලය මතුපිට සිටී. ඒවා තරමක් කෙලෙස් අඩු සත්වයන් මෙන් ම, තමා ජනිත වී වැඩුණු සමාජය හා බැඳී ගැටී සිටින සත්වයන් බඳුය. ජලයෙන් ඉහළට නැගී, ජලයේ නොගැවී සිටිනා පද්මය බුදුරජාණන් වහන්සේ බඳුය. බුදුරජාණන් වහන්සේ කෙලෙස් සහිත ජන සමාජයේ ඉපදී, එබඳු ජන සමාජයක වැඩුනේ වී නමුත්

කෙලෙස් නසා බුද්ධත්වය ලැබීමෙන් පසු කෙලෙස් සහිත ජන සමාජය සමඟ බැඳීම් හෝ ගැටීම් ඇති කර නොගත් සේක. බුද්ධ පද්මය ජලයෙන් ඉහළට නැගී ජලයේ නොගැටී සිටීමෙන් ප්‍රකාශ කරන්නේ මේ අදහසය.

බුදුරජාණන් වහන්සේ නැමැති පද්මය ජීවත් වන්නේ ද පොකුණ නැමැති සමාජයේ ම ය. පෝෂණය වන්නේ ද පොකුණ නැමැති සමාජයෙන් ම ය. එහෙත් උන්වහන්සේ මඩ හෝ ජලය නැමැති කෙලෙස් තවරා නොගනිති.

බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි දැන් ඔබට තරමකට පැහැදිලි විය හැකිය. සියලු කෙලෙස් නැති කළ බුදුරජාණන් වහන්සේ කෙලෙස් සහිත ජන සමාජයට වැඩ සාදමින් එම කෙලෙස් සහිත ජන සමාජයෙහි ම කෙලෙස්වලින් කිසිසේත් නැවත අපවිත්‍ර නොවී වැඩ වාසය කළ බව මෙයින් අවධාරණය වෙයි.

බුද්ධ චරිතයේ සිද්ධි කීපයක් විමසීමෙන් බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයේ ස්වභාවය වඩාත් පැහැදිලි වෙයි.

බුදුරජාණන් වහන්සේ උරුවෙලාවෙහි නේරංජරා ගඟ බඩ අජපල් නුග රුක මුල වැඩ විසූ දිනක තන්හා, රතී, රගා යන මාර දූහිතෘන් තිදෙනා උන්වහන්සේ රාග පාශයෙන් බැඳ ගනිමු යයි සිතා එහි පැමිණියහ. ඔවුන් තමන්ගේ දෙවහනන් පරයන රූ සපුයෙන් හා ස්ත්‍රී මායමෙන් බුදුරදුන් පොළඹවා ගැනීමට උත්සාහ කළ ද, බුදුරජාණන් වහන්සේගේ බැල්මකුදු ඔවුනට නොලැබිණ.

බුදුරජාණන් වහන්සේගේ රූපශ්‍රීය දුටු කුරු රට මාගන්දිය නම් බමුණෙක් තමන්ගේ දෙවඟනක බඳු රූමත් දියණිය සරසා ගෙනවුත් උන්වහන්සේට ආවාහ කර ගන්නා ලෙස ඉල්ලා සිටියේය. බුදුරජාණන් වහන්සේ එවිට වදාළේ මල මූත්‍රයෙන් පිරුණු ඇගේ සිරුර පාදයෙන් ස්පර්ශ කරන්නටවත් අකමැති බවය.

වරක් අක්කෝස භාරද්වාජ නැමැති බමුණෙක් උන්වහන්සේ වෙත පැමිණ උන්වහන්සේට අසභ්‍ය වචනයෙන් නොසෑහෙන සේ බැණ වැදුණේය. උන්වහන්සේ ඉතා ශාන්ත ව ඒ සියලු ම බැණුම් ඉවසා සිට වදාළේ 'බමුණ,

ඔබ ඒ වචනයෙන් මට කළ සංග්‍රහ මා කිසිවක් භාර ගත්තේ නැත. ඒ සියල්ල ඔබ ම ආපසු භාරගන්න' යනුවෙනි. ද්වේෂය නැති කළ උන්වහන්සේට බමුණා කෙරෙහි කිසි ම ද්වේෂයක් පහළ නොවීය.

තවත් වරක් වේරංජා පුර උදය නම් බමුණෙක් උන්වහන්සේ ඇතුළු මහා සඞ්ඝයාට වස් විසීමට ආරාධනය කළේය. එහෙත් වස් තුන් මස තුළ බුදු පාමොක් මහ සඟනට දන් පැන් පිරිනැමීමට බමුණාට අමතක විය. බුදුරජාණන් වහන්සේ හා භික්ෂු පිරිස වස් කාලය ගත කළේ යව ධාන්‍ය වළඳමින් ඉතා දුෂ්කර ලෙසය. බමුණා කෙරෙහි කිසිම අහිතක් නොසිතූ බුදුරජාණන් වහන්සේ වස් අවසන ආපසු වැඩියේ ද තමා වස් අවසන් කොට ආපසු වඩනා බව බමුණාට පවසමිනි. මේ සිද්ධිවලින් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ සමාජයේ හැසිරෙද්දී නැවත කෙලෙස්වලට වසඟ නොවූ බවය. උන්වහන්සේ ලබා ගෙන තිබූ උසස් තත්ත්වයෙන් නැවත පහළට නොවැටුණු බවය. ජලයේ නොගැවී, ජලයෙන් ඉහළට නැගුණු පද්මය එලෙස ම පැවතුණු බවය.

බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් අපට ගත හැකි ආදර්ශය කුමක් ද ?

අප හැම දෙනා ළඟ ම යම්කිසි තරමකට උසස් ගුණ දහම් තිබේ. සමාජයේ කටයුතු කරන විට අප දියුණු කර ගෙන ඇති කවර හෝ ගුණ දහමකින් නැවත පහතට නොවැටීමට වග බලා ගැනීම බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් අපට ගත හැකි උපදේශයකි.

මෙය උදාහරණයකින් පැහැදිලි කර ගනිමු. සාමාන්‍ය ජීවිතයේදී මත්පැන් නොගන්නා සමහර කෙනෙක් මංගල උත්සවයක දී හෝ ප්‍රිය සම්භාෂණයකදී මත්පැන් ගත්තාට වරදක් නැතැයි සිතති. ඔවුහු එබඳු තැනකදී යහළුවන් සමඟ මත්පැන් නොගෙන සිටීම මදිකමක් යයි සිතා මත්පැන් ගනිති. එය පද්මාකාර ජීවිතයට පටහැනිය. එය තමන් ලබා සිටි උසස් තත්ත්වයෙන් නැවත පරිහාණියට පත්වීමකි. දියෙන් ඉහළ නැගී සිටි පද්මය නැවතත් දිය මත හෝ දිය යටට ඇද හැලීමක් බඳුය.

පරපණ නොනැසීමට පුරුදු වී සිටින්නේ නම් ඖෂධයක් සඳහාවත් නැවත පරපණ නොනැසිය යුතුය. බොරු නොකීමේ ප්‍රතිපත්තිය රකින්නේ

නම් තමන්ට කවර තරමේ පාඩුවක් සිදුවූවත් බොරු නොකිය යුතුය. එසේ හැසිරීම පද්මාකාර ජීවිතයට අනුකූලය. වැරදි කරන්නන් අතර වැරදි නොකර සිටීම පද්මාකාර ජීවිතයට අනුකූලව ජීවත්වීමකි.

මේ අන්දමින් කල්පනා කොට බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය යම්කිසි මට්ටමකට අපේ ජීවතවල ද ගොඩ නගා ගැනීමට උත්සාහ කරමු.

භාවිතයට :

පුණ්ඩරීකං යථා වග්ගු - තෝයෙන නුපලිප්පති
නුපලිත්තොම්හි ලෝකේන - තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ

අභ්‍යාසය :

1. බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් අපට ගත හැකි ආදර්ශ මොනවා ද ?

## 6 පාඩම

# බුද්ධ චරිතයෙන් පිළිබිඹු වන මිනිස් ගුණ

බුදුරජාණන් වහන්සේ තුළ පැවති උදාර පෞරුෂය උන්වහන්සේ දෙවි යන් සහිත ලෝකයාගේ ගෞරවයට හා පූජාවට පාත්‍රවීමට හේතුවක් විය. මිනිස් ලොව මිනිස් දරුවෙකුව උපන් උන්වහන්සේ මහා කරුණාව මහා ප්‍රඥාව වැනි උදාර ගුණයන්ගෙන් සමන්විත වූ සේක. ශීලයෙන්, ගුණයෙන් හා ප්‍රඥාවෙන් ලොව අන් කිසිවෙක් උන් වහන්සේ හා සම නොවෙති. එහෙයින් බුදුරජාණන් වහන්සේ අසම සම යන ගුණ පදයෙන් විශේෂ කොට හැඳින්වෙති.

උදාර මනුෂ්‍යයකු හැටියට බුදුරජාණන් වහන්සේ තුළ පැවති ගුණ සමුදාය අතර කරුණාව, දයාව, ඉවසීම, සමානාත්මතාව වැනි උසස් මිනිස් ගුණ පිළිබඳව අපි මෙම පාඩමෙන් ඉගෙන ගනිමු. හැම විටම ජීවිත පරිත්‍යාගයෙන් හෝ දුකට පත් අයට පිහිටවීම බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට ගුණයක් විය. උදෑසන අවදි වූ මොහොතේ දී ම මහා කරුණාවෙන් ලොව දෙස බලන බුදුරජාණන් වහන්සේ, අසරණයන් දුකට පත් වූවන් සොයා වැඩම කොට පිහිටවූහ.

රජගහනුවර සෝපාක දරුවා බුදුරජාණන් වහන්සේගේ පිහිට ලබා සැනසීම ලද අසරණයෙකි. පියාගේ මරණයෙන් පසු තම සුළු පියා ළඟ ජීවත්වීමට සිදු වූ සෝපාකට ඔහුගෙන් අනේක කරදර හිරිහැර විඳින්නට සිදුවිය. වරක් සෝපාක මරණයට පත්කිරීම සඳහා සුළු පියාණන් විසින් අමු සොහොනේ බැඳ තබා සිටියදී ඔහුට දිවි ගලවා ගෙන සැනසීම ලද හැකි වූයේ බුදුරජාණන් වහන්සේ පිහිට වූ බැවිනි. රජ්ජුමාලා නම් කාන්තාව පිළිබඳ සිද්ධිය ද බුදුරජාණන් වහන්සේගේ මහා කාරුණිකත්වය ප්‍රකට කරන්නකි. දාසියක් වූ රජ්ජුමාලාට තම ස්වාමි දුවගෙන් විඳින්නට සිදු වූ අනේක විධ හිරිහැර පීඩාවලින් මිදීමට ඇය නොයෙක් උපක්‍රම යෙදීය. එහෙත් ඒ කිසිවකින් සැනසීමක් නොලද ඇය වනයට ගොස් ගෙල වැලලාගෙන මැරෙන්නට සූදානම් ව සිටියදී ඇය මරණයෙන් ගලවා ගනු ලැබුයේ බුදුරජාණන් වහන්සේ විසිනි.

ස්වාමියාත්, දරු දෙදෙනාත්, දෙමාපියනුත් එකම සහෝදරයාත් එකම දිනක මිය යාමෙන් මහත් දුකට පත් පටාචාරා සෝකයෙන් මුසපත්ව පිස්සියක මෙන් හැසිරෙන්නට වූවාය. අසරණ බවේ උපරිම අවස්ථාවට පත් ව සිටි ඇය බුදුරජාණන් වහන්සේගේ කාරුණික වදනින් දෙලොවින් ම සැනසීම ලැබුවාය. තම එකම දරුවාගේ වියෝගය නිසා ශෝකයෙන් උමතු වූ කිසාගෝතමිය ද බුදුරජාණන් වහන්සේගේ කාරුණික වදන් අසා පුත්‍ර ශෝකය නිවාගෙන සැනසීම ලද කාන්තාවකි. විශාලා මහනුවර වාසී වාසෙට්ඨ නම් කාන්තාවගේ එකම සුරතල් පුතු දුව පැන ඇවිදිමින් සෙල්ලම් කරන අවදියේ ම මරණයට පත්විය. ඉන් හටගත් ශෝකය දරාගත නොහැකි වාසෙට්ඨි හිස හැරුණු අතේ ඇවිදින්නට පටන් ගත්තාය. එසේ ඇවිදින ඇය දිනක් මියුලුනුවර වීදියකදී බුදුරජාණන් වහන්සේට මුණ ගැසිණි. බුදුරදුන් දුටු කෙනෙහිම වාසෙට්ඨිගේ සිතේ සැනසීමක් ඇති විය. උමතු බව නැති විය. බුදුරජාණන් වහන්සේ ඇයට ධර්මදේශනා කොට පුත්‍ර ශෝකය නිවා ලූ සේක. වාසෙට්ඨි බුදුසසුනේ පැවිදිව රහත් ඵලයට පත්වූවාය.

රජගහ නුවර කාලි යකින්නක් නම් සසරේදී බැඳි වෛරයක් නිසා මිනිස් මවක පසුපස එළවා ආවාය. මෙය දුටු බුදුරජාණන් වහන්සේ වෛර කිරීමෙහි හා සත්ව ඝාතනයෙහි ආදීනව දක්වමින් යකින්නට ධර්ම දේශනා කොට අසරණ මවගේත්, අතහුන් දරුවාගේත් ජීවිත බේරා දුන් සේක. කාල සිටු පුත් චූල්ලපන්ථක, අංගුලිමාලා වැනි නොමහට ගොස් සසර අතරමංවූවෝ ද බුදුරජාණන් වහන්සේගේ පිහිට ලබා සැනසීමට පත් වූහ.

මිනිස්කම උපරිම ලෙස දියුණු කළ බුදුරජාණන් වහන්සේ මිනිසාට පමණක් නොව සෙසු සත්ව වර්ගයාට ද කරුණාව දැක්විය යුතු බව ඉගැන්වූහ. කොසැඹෑනුවර උදේනි රජු විසින් අත් හරින ලද භද්‍රවතිකා ඇතින්න දැක කළගුණ සැළකීම උතුම් මිනිස් ගුණයක් ලෙස රජතුමාට පැහැදිලි කරදීම එවැනි එක් අවස්ථාවකි. බුදුරදුන් සැවැත්නුවර පිඬුසිඟා වඩින අවස්ථාවක ළමයින් කණ්ඩායමක් ගැරඬියෙකුට හිංසා කරනු දැක, තමන්ගේ විනෝදය, සුව පහසුව තකා අනුන්ට හිංසා කිරීම නොමනා දෙයකැයි ඒ ළමා පිරිසට පෙන්වා දුන්හ. උතුම් මිනිස් ගුණයක් ලෙස ඉවසීම ද බුදුරජාණන් වහන්සේ තුළ නොඅඩුව පැවතුණි. එම ගුණය මිනිසා තුළ දියුණු කර ගත යුතු උසස් ගුණයක් ලෙස උන්වහන්සේ ආදර්ශයෙන්ම

පෙන්වා දුන්හ. දෙව්දත් තෙර බුදුරදුන්ට හිංසා පීඩා කිරීම සඳහා විවිධ උපක්‍රම යෙදීය. වරක් දුනුවායන් යෙදවීමෙන් ද, නාලාගිරි ඇතු පොළඹවාලීමෙන් ද, නොනැවතී, තමා විසින්මත් ගල් පෙරළා බුදුරජාණන් වහන්සේ ජීවිතක්ෂයට පත් කිරීමට දෙව්දත් තෙර උත්සාහ කළේය. ඒ සියලු විරුද්ධවාදිකම් බුදුරජාණන් වහන්සේ කරුණාවෙන් ඉවසා වදාළහ. දෙව්දත් තෙරුන්ට විරුද්ධව උන්වහන්සේ කිසිවක් නොකළහ.

තම රූපයට බුදුරජාණන් වහන්සේ නිග්‍රහ කරන ලදැයි මාගන්ධියා බැමිණී දුව බුදුරජාණන් වහන්සේ කෙරෙහි උරණ වූවාය. ඕ ධූර්තයන්ට අත්ලස් දී කොසඹෑ නුවරට වැඩි බුදුරජාණන් වහන්සේට අසභ්‍ය ලෙස බැණ වදිමින් හිංසා කිරීමට පෙළඹුවාය. මේ හිරිහැරවලින් මිදීම සඳහා මෙනුවර හැර වෙනත් ප්‍රදේශයකට යමු යයි අනඳ තෙරණුවන් කියා සිටියදිත් බුදුරජාණන් වහන්සේ කිසිත් කම්පාවකට පත් නොවී ශාන්තව ඒ සියල්ල ඉවසා සිටියහ.

මිනිස්කමත්, චාම් සරල ජීවිතයත්, උසස් චින්තනයත් අගය කළ බුදුරජාණන් වහන්සේ සාධාරණයට ගරු කළහ. සමානාත්මතා ගුණයෙන් යුක්ත වූ සේක. රාහුල කුමරුවන්ටත්, දෙව්දත් තෙරුන්ටත් බුදුරදුන් තුළ පැවතියේ සමාන වූ මෛත්‍රියකි. කුල භේද පන්ති භේද නොසලකා සුදුසුසාට සුදුසු තැන දීමට උන්වහන්සේ ඉදිරිපත් වූහ. කිසිවිටෙකත් අගතිගාමී නොවූහ. වරක් අම්බපාලි නම් නගර ශෝභනිය සිය නිවසේ දානයට වඩින ලෙස බුදුරජාණන් වහන්සේට ආරාධනා කළාය. බුදුරදුන් එම ආරාධනය පිළිගෙන තිබියදී විශාලා මහනුවර ලිච්ඡවි රජවරු ද බුදුරජාණන් වහන්සේට දානය සඳහා ආරාධනය කළහ. එහෙත් ලිච්ඡවීන්ගේ ආරාධනය භාර නොගත් බුදුරජාණන් වහන්සේ අම්බපාලියගේ දානයට වැඩම කළහ.

නිරහංකාර භාවය බුදුරජාණන් වහන්සේ තුළ පැවති උදාර මිනිස් ගුණයකි. කිඹුල්වත් නුවර පිය රජු හා ඥාතීන් දැකීමට වැඩම කළ බුදුරජාණන් වහන්සේ මහා සංඝයා වහන්සේ පිරිවරා දහවල් දානය සඳහා පිඬු සිගා වැඩියහ. මේ අසා ලැජ්ජාවට පත් වූ සුදොවුන් රජතුමා, 'ස්වාමීනි, අපගේ වංශයේ අය කිසිදිනක සිගා ඇවිද්දෝ නොවෙති. එබැවින් මෙසේ සිගා වැඩීමෙන් අපගේ මහා සම්මත රජ පවුලට නින්දා අපහාස නොපමුණුවන්නැ'යි ඉල්ලා සිටියේය. එහෙත් රජතුමාට කරුණු පැහැදිලි

කරදුන් බුදුරජාණන් වහන්සේ ඒ පිළිවෙත අත් නොහළහ. වරක් ගොසිංහ වනය අසලින් වඩිනා බුදුරජාණන් වහන්සේට එම උයනට පිවිසීමට සිත් විය. උයනේ දොරටුව අසලට වැඩම කළේ බුදුරජාණන් වහන්සේ බව හඳුනා නොගත් උද්‍යාන පාලකයා ඒ සඳහා බුදුරජාණන් වහන්සේට අවසර නොදුන්නේය. තමන් බුදුන් යයි පවසා උයනට ඇතුළුවීමට උත්සාහ නොකළ උන්වහන්සේ නිසි අවසරය ලැබෙනතුරු නිහතමානීව දොරටුව අසලට වී ඉවසා සිටියහ.

යමෙකුගේ දක්ෂතාත්, උසස්වීමත් දැක සතුටුවන මිනිසුන් ඉතා අල්පය. මේ උතුම් මිනිස් ගුණය ද බුදුරජාණන් වහන්සේ තුළ නොඅඩු ව පැවතුණි. වංශය, කුලය, තමන්ගේකම ආදිය නොසලකා දක්ෂතා ඇති ශ්‍රාවකයන් වහන්සේලා බුදුරජාණන් වහන්සේගේ ප්‍රශංසාවට ලක් වූහ. වරක් නන්දක තෙරුන්ගේ ධර්ම දේශනාවක් අසා සිටි බුදුරජාණන් වහන්සේ නන්දක ඔබ ඉතා මැනවින් ධර්ම දේශනා කළා යනුවෙන් ප්‍රශංසා කළහ.

සියලු සත්ව ප්‍රජාව කෙරෙහි බුදුරජාණන් වහන්සේ ක්‍රියා කළේ සැබෑ උතුම් මිනිසෙකු ලෙසිනි. උසස් මිනිසා නම් කවරෙක් ද, කිනම් ගුණාංග දියුණු කරගත් තැනැත්තා උතුම් මිනිසෙකු වේ ද යන්න බුදුරජාණන් වහන්සේ ආදර්ශයෙන් ම ලොවට හෙළි කළහ. අපි ද උන්වහන්සේ අනුව යමින් උතුම් මිනිස් ගුණ අපේ ජීවිතවලට සම්බන්ධ කර ගනිමු.

භාවිතයට :

බුදුරජාණන් වහන්සේ තුළ පැවති උදාර මිනිස් ගුණ ප්‍රකට කෙරෙන කතා පුවත් හා සිද්ධි ඇසුරෙන් පුවත්පතකට ලිපියක් ලියන්න.

# 7 පාඩම

## බුද්ධ චරිතයෙන් ගතහැකි ආදර්ශ

බුද්ධ චරිතය ඉගෙන ගැනීමේ එක් අරමුණක් වනුයේ උන්වහන්සේගේ චරිතයෙන් අපේ ජීවිතයට ගතහැකි ආදර්ශ මතුකරගෙන අපේ ජීවිත හැඩගස්වා ගැනීමයි. ඒ අනුව බලනවිට ශිෂ්‍යයකුට, ගුරුවරයකුට, නායකයකුට මෙන්ම ළමා, තරුණ, වැඩිහිටි යන හැම දෙනකුටම තම ජීවිත හැඩගස්වා ගැනීමට වැදගත් වන ආදර්ශ බුද්ධ චරිතයෙන් මතු කර ගත හැකිය.

බෝසත් සිදුහත් කුමරා ශිෂ්‍යයකු වශයෙන් ගත කළ අවදියේදී උගතයුතු සියලු ශිල්ප ශාස්ත්‍ර ඉතා දක්ෂ ලෙසත් කඩිසරව හා නිසිසේත් උගත්තේය. එහෙත් වෙනත් ශිෂ්‍යයනට ගතවන කාලයට වඩා කෙටි කලකින් උගතයුතු දේ උගත් බැවින් සිදුහත් කුමරු විනෝදයෙන් කල් ගත කළා මිස කිසිම ශිල්පයක් නොදත්තේ යයි ඥාතීන් අතර ප්‍රචලිතව තිබිණි. එම අභියෝගයට මුහුණ දුන් සිදුහත් කුමරා ඥාතීන් ඉදිරියේ ශිල්ප දක්වා තම දක්ෂතා ප්‍රකට කළේය. මෙයින් ශිෂ්‍යයෙකුට ගතහැකි ආදර්ශය නම් උගතයුතු දේ දක්ෂ ලෙසත් කඩිසරවත්, නිසිසේත් ඉගෙනීම මෙන්ම අවස්ථාවක් පැමිණි විට තම උගත්කම් දක්ෂතා ඉදිරිපත් කළයුතු බවයි.

සිදුහත් කුමරා උද්‍යාන ක්‍රීඩාව සඳහා නික්මයන අවස්ථාවේදී අතරමගදී දක්නට ලැබුණ පෙර නිමිති පිළිබඳව, තම රියදුරාගෙන් විමසා දැන, ඒ පිළිබඳව ගැඹුරින් කල්පනා කළේය. මෙයින් ශිෂ්‍යයකුට ගතහැකි ආදර්ශ කීපයකි. සිදුහත් කුමරු උස් පහත් භේදයක් නැතිව තම රියදුරාගෙන් වුව ද අසා, විමසා දැන ගැනීමට තරම් නිරහංකාර විය. එමෙන්ම ඔහුගෙන් අසා දැනගත් දේ පිළිබඳව වුව ද විචාර පූර්වකව විමසා බැලීය. ගැඹුරින් කල්පනා කළේය. මේ අනුව අනතිමානීව තමා නොදන්නා දේ දැන ගැනීමත්, ඉගෙන ගන්නා දේ පිළිබඳව විචාර පූර්වකව කල්පනා කිරීමත් ශිෂ්‍යයෙකුට ගතහැකි ආදර්ශයන්ය. මෙම විචාර පූර්වක ආකල්පය තරුණ පරපුරට ද ආදර්ශ සපයන්නකි.

මහභිනික්මන් කළ බෝසතාණන් වහන්සේට, අදින් සත්වන දින සක්විති රජකම ලැබෙතැයි මාර දිව්‍ය පුත්‍රයා පැවසීය. තවුස්දම් අතහැර රජසැප විඳීමට පැමිණෙන ලෙස රජගහ නුවරදී බිම්බිසාර රජතුමා සිදුහත් බෝසතාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. සත්‍ය ගවේෂී සමයේදී ආලාර කාලාම, උද්දකරාම පුත්ත තවුසන් වෙත ගොස් ධර්ම ශාස්ත්‍ර හැදෑරූ බෝසත් තවුසාණෝ ඉතා කෙටි කලකින් දක්ෂ ලෙස ඔවුන්ගේ ධර්මය ඉගෙන නිම කළහ. ඒ අවසානයේ දී එම තාපසවරු බෝසතුනට තනතුරු ද ප්‍රදානය කොට, තම අසපුවල තවදුරටත් රැඳී සිටින ලෙස ආරාධනා කළහ. මේ හැම අවස්ථාවකම බෝසතාණන් වහන්සේ තම ප්‍රධාන අරමුණ අමතක නොකළහ. ලාභ, කීර්ති, ප්‍රසංශා ආදියට ගිජු නොවී තවදුරටත් ගවේෂණයෙහි කැමැත්ත ඇතිව තම ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමේ ස්ථිර අධිෂ්ඨානය ඇතිව ඉදිරියට ගියහ. අතරමගදී ලැබෙන සුළු වාසි ලාභ ප්‍රයෝජන නිසා තම ප්‍රධාන අරමුණ අමතක නොකර ක්‍රියා කළ යුතුය යන්න මෙයින් ශිෂ්‍යයනට ගතහැකි ආදර්ශයකි. දක්ෂව, කඩිසරව ඉගෙනීම් කටයුතුවල නියැලීම, තමන් වෙත ගුරුවර, දෙමාපිය, වැඩිහිටි ආදීන්ගේ සැලකිල්ල ලැබීමට හේතුවන බව ද මින් ගතහැකි අනෙක් ආදර්ශයකි.

දුෂ්කර ක්‍රියාවේ යෙදුණු බෝසතාණන් වහන්සේම එය වැරදි මගක් යයි තේරුම් ගත්පසු එය අතහැර, මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළහ. ඒ අවස්ථාවේ තමන්ට උදව් කරමින් සිටි පස්වග තවුසන්, බෝසතුන් හැර ගිය ද එයින් බෝසතාණන් වහන්සේ කම්පාවකට පත් නොවූහ. මෙම සිද්ධි ඇසුරෙන් ශිෂ්‍යයෙකුට ගතහැකි ආදර්ශ කීපයක් වෙයි. දුෂ්කරතා මධ්‍යයේ වුව ද තම අධ්‍යයන කටයුතු අධිෂ්ඨානයෙන් හා වීර්යයෙන් යුතුව කරගෙන යා යුතුය යන්න ඉන් එකකි. තමා අනුගමනය කරන ක්‍රියාමාර්ගය වැරදි යයි හැඟේ නම් එය අතහැර නිවැරදි මගට පිවිසීමට තරම් නම්‍ය විය යුතු ය යන්න තවත් ආදර්ශයකි. තමා නිවැරදි නම් තමා අනුගමනය කරන ප්‍රතිපත්ති නිවැරදි යයි හැඟේ නම් කවරකු අමනාප වුව ද, නොසැලී ඒ යහපත් ප්‍රතිපත්ති වෙනස් නොකර ආරක්ෂා කිරීමේ වැදගත්කම ද මින් මතුකර ගතහැකි තවත් ආදර්ශයකි.

බුදුරජාණන් වහන්සේ ක්‍රමවත් සැලැස්මක් ඇතිව දිනචරියාවක් අනුව තමන් වහන්සේගේ සේවාවත් කාර්ය භාරයත් මැනවින් ඉටුකළ ශාස්තෘවරයෙකි. අළුයම පිබිදීමේ සිට රාත්‍රී සැතපීම තෙක් කාලය මොහොතක්වත් කාලය අපතේ නොයවා ප්‍රයෝජනවත් වැඩකට යෙදවීම උන්වහන්සේගේ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණයකි. එවන් ක්‍රමවත්, ඵලදායක දිනචර්යාවක් ඇතිව කටයුතු කිරීම ද ශිෂ්‍යයෙකුට මෙන් ම අන් කවරෙකුට වුව ද බුද්ධ චරිතයෙන් ගතහැකි ආදර්ශයකි.

බුදුරජාණන් වහන්සේ තරුණ වියේදීම බුද්ධත්වයට පත් ශාස්තෘවරයෙකි. තරුණ ශ්‍රාවක පිරිසක් ඇතිව සිටි ශාස්තෘවරයෙකි. ඒ අනුව තරුණ සිදුහත් බෝසතාණන් වහන්සේගේ චරිතයෙන් තරුණයන්ට ගතහැකි ආදර්ශ ඇත. විශේෂයෙන් ම තරුණ සිදුහත් කුමරුට ඇති වූ කල්පනාවක් පිළිබඳව අරිය පරියේසන සූත්‍රයෙහි සඳහන් වෙයි. එනම්, ඉපදීම, වයසට යාම, ලෙඩවීම, මරණය, ස්වභාව කොට ඇතිව සිටින තමන් විසින් කළ යුතුව ඇත්තේ, එම සාංසාරික ස්වභාවයන්ගේ ආදීනව දැක එම ස්වභාවයන්ගෙන් තොර වූ ආර්ය පර්යේෂණයක යෙදීම බවයි. මෙයින් තරුණයෙකුට ගතහැකි ආදර්ශය නම්, සරු දේ කුමක් ද නිසරු දේ කුමක් ද කියා ගවේෂණයක යෙදී ඵලදායක, අර්ථවත් ජීවන දර්ශනයක් ගොඩ නගා ගෙන තම ජීවිතය ඒ අනුව පවත්වාගෙන යා යුතුය යන්නයි.

බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ ආදර්ශවත් ගුරුවරයෙකි. එබැවින් උන්වහන්සේගේ චරිතයෙන් ගුරුවරයෙකුට ගතහැකි ආදර්ශ රැසක් ද ඇත. ගුරුවරයකු ලෙස තම ශ්‍රාවක පිරිසේ විශ්වාසය දිනාගැනීමට හැකිවන අන්දමට උන්වහන්සේ ක්‍රියා කළහ. විශේෂයෙන්ම තම ශිෂ්‍ය පිරිසට ඉගැන්වීමට, අවබෝධ කරවීමට අපේක්ෂා කරන දේ පළමුව තමන් වහන්සේ මැනවින් අවබෝධ කරගෙන සිටියහ. තම ශ්‍රාවකයින් තුළ ආත්ම දමනයක් ඇති කිරීමට මගපෙන්වීමට පෙර තමන් වහන්සේ තුළ ආත්ම දමනය ඇතිකරගෙන සිටියහ. 'බුද්ධො සො භගවා බෝධාය ධම්මං දෙසෙති' 'දන්තො සො භගවා දමනාය ධම්මං දෙසෙති' යන පාඨවලින් එම කරුණ පැහැදිලි වෙයි. මෙය ගුරුවරයකුට ගතහැකි අගනා ආදර්ශයකි.

මේ අන්දමට බුද්ධ චරිතය විචාරශීලීව හදාරණවිට බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන්, සමාජයේ හැම කෙනෙකුටම ගතහැකි අගනා ආදර්ශ ඇති බව පැහැදිලිය. එම අගනා ආදර්ශ මතු කරගෙන එම ආදර්ශ අපගේ ජීවිතවලට සම්බන්ධ කරගෙන ක්‍රියාත්මක කිරීම තුළින් බුදු සිරිත හැදෑරීමේ අරමුණ මැනවින් ඉටුවෙයි. දහම් පාසල් ශිෂ්‍යයින් වශයෙන් අපි ද ඒ සඳහා උත්සාහවත් වෙමු.

භාවිතයට :

1. බුදු සිරිතෙන් ශිෂ්‍යයෙකුට ගතහැකි ආදර්ශ යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

8 පාඩම

# බුද්ධ චරිතයෙන් පිළිබිඹුවන නායකත්ව ලක්ෂණ

බුදුරජාණන් වහන්සේ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව් පිරිසේ මාර්ගෝපදේශකයාණෝ වූහ. සමකාලීන දඹදිව විසූ වෙනත් ශාස්තෘවරයන් මෙන් තමන් වටා ගෝල පිරිසක් පිරිවරාගෙන ආගමික සංස්ථාවක නායකයකු ලෙස ක්‍රියා කිරීමට උන්වහන්සේ ප්‍රිය නොකළහ. පිරිනිවන් පෑමට ආසන්න අවස්ථාවක අනඳ තෙරණුවන් ඇමතූ බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා පාලනය කරමියි කියා හෝ භික්ෂු සංඝයා තමන් වහන්සේ උදෙසා විසිය යුතුය කියා හෝ අදහසක් තමන් වහන්සේ තුළ නැති බව වදාළහ. එහෙත් උන්වහන්සේ බෝසත් අවදියේ සිටම ප්‍රජා නායකත්වයක් දීමේ අරමුණ ඇතිව, කරුණාව, වීර්යය, අධිෂ්ඨානය, ප්‍රඥාව වැනි ගුණාංග පෙරදැරි කොටගෙන ක්‍රියා කළ අන්දම බෝසත් සිරිත ඇසුරෙන් පැහැදිලි වෙයි.

ශ්‍රේෂ්ඨ නායකයකු තුළ තිබිය යුතු ගුණාංග බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිබිඹු විය. ඒ නිසාම සමකාලීන සමාජය විසින් උන්වහන්සේ උදාර නායකයකු ලෙස පිළිගෙන තිබිණි. වරක් සේල නැමති බ්‍රාහ්මණයෙක් බුදුරජාණන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ දැක භවත් ගෞතමයන් වහන්ස ඔබ වහන්සේ කෙරෙහි මහා පුරුෂ ලක්ෂණ ඇත. චක්‍රවර්තී රජෙක් වී රාජ්‍ය නොකරන්නේ මන්දැයි ඇසීය. එයට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ

බ්‍රාහ්මණය මම රජෙක්මි. ශ්‍රේෂ්ඨ ධර්ම රාජයෙක්මි. අන් කිසිවෙකුටත් පැවැත්විය නොහැකි ධර්ම රාජ්‍යය මම පවත්වාගෙන යමි යි වදාළහ.

පසේනදී කොසොල් මහරජතුමා වරක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ, උන්වහන්සේගේ නායකත්ව ලක්ෂණ අගය කළ අන්දම මජ්ඣිම නිකායේ ධම්මචේතිය සූත්‍රයෙහි සඳහන් වෙයි. තමන් මහා බලයක් ඇති රජෙක්ව සිටිය ද රාජසභාව සම්පූර්ණ නිශ්ශබ්දතාවකට පත්කර ගැනීමට අපහසුවන අවස්ථා ඇති බව රජතුමා පැවසීය. එහෙත් බුදුරජාණන් වහන්සේ සිව්වණක් පිරිස මධ්‍යයේ ධර්මදේශනා කරන විට කිසිවෙකුත්

කිව්සුමක ශබ්දයක් පවා ඇති නොකරමින් ඉමහත් ගෞරවයකින් බුදුරජාණන් වහන්සේගේ දේශනාවට සවන් දෙන බව රජතුමා පවසා සිටියේ බුදුරජාණන් වහන්සේගේ නායකත්වය ප්‍රශංසාවට ලක් කරමිනි.

බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට චරිතය උන්වහන්සේගේ නායකත්වය ප්‍රකට කරන එක් ලක්ෂණයකි. රහසින්වත් පව් නොකිරීම, විශ්වව්‍යාපී කරුණාව, මෛත්‍රිය, අධිෂ්ඨාන ප්‍රතිබද්ධ වීර්යය, ආත්ම පරිත්‍යාගය, තමන් සතු සියලු සැප සම්පත් හැර දැමීමෙහි ලා පැවැති නිරාශාව, නිරහංකාරත්වය, අයුක්තියට නොසැලකීම, යුක්තියට ගරු කිරීම ආදී ගුණ සමුදායෙන් උන්වහන්සේගේ චරිතය පරිපූර්ණ විය. මහා සීහනාද සූත්‍රයෙහි සඳහන්වන පරිදි මහලු වියේදී වුව ද උන්වහන්සේගේ එම අභ්‍යන්තර ගුණ සමුදායේ පිරිහීමක්, ඌණතාවක් ඇති නොවීය.

සමාජයේ සියලු දෙනා කෙරෙහි සමානතාවෙන් යුතුව සැලකීම ද බුදුරජාණන් වහන්සේ තුළ පැවති විශිෂ්ට නායකත්ව ලක්ෂණයකි. බුදුරදුන් පහළවන අවධියේ දඹදිව කුලභේද දැඩිලෙස පැතිරී තිබිණි. එහෙත් උන්වහන්සේ කුලභේදය මුළුමනින්ම ප්‍රතික්ෂේප කළහ. උසස් පහත් වශයෙන් ප්‍රභේද කොටගෙන පැවති සෑම ජාතියකටම කුලයකටම අයත් වූවන්ට බුදු සසුනේ පැවිදිවීමට ඉඩ සලසා දුන්නේ උන්වහන්සේ තුළ පැවති සමානාත්මතා ගුණය නිසාය. ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන පංච මහා ගංගාවන්හි ජලය මහා සමුද්‍රයට පිවිසි කල එම ජලය වෙන් වශයෙන් නොසලකා මුහුදු ජලය ලෙස හඳුන්වන්නාක් මෙන් කවර වර්ණයකට අයත් පිරිසක් වුවත් සසුන්ගත වූ විට ශ්‍රමණ ශාක්‍යපුත්‍ර යන නමින් හැඳින්වෙන බවත්, බුදුරජාණන් වහන්සේ වදාළහ. උන්වහන්සේ තම ශ්‍රාවකයන්ට වගකීම් පැවරීමේ දී වුව ද උසස් පහත් භේද නොසලකා දක්ෂතාවන්ට මුල්තැනදී ක්‍රියා කළහ. රජුන්, ඇමතියන් මෙන්ම ගොවීන්, කම්කරුවන්, දාසි, දාසාදි වූ කවර තරාතිරමේ කෙනෙකු පිළිබඳව වුව ද සමානාත්මතාවෙන් යුතුව උන්වහන්සේ ක්‍රියා කළහ.

තම ශ්‍රාවකයිනට නිසිකල්හි සුදුසු පරිදි වගකීම් පවරාදීම බුදුරජාණන් වහන්සේගේ චරිතය තුළින් පිළිබිඹුවන තවත් නායකත්ව ලක්ෂණයකි. පැවිදි උපසපන් කිරීමේ වගකීම මුලදී බුදුරජාණන් වහන්සේ විසින් ම සිදු කරනු ලැබූ නමුත්, නොබෝ කලකින්ම ඒ ඒ දිසාවල හා ජනපදවල

ශ්‍රාවකයින් වහන්සේට ද පැවිදි උපසපත් කිරීමේ වගකීම භාරකළහ. ශාසනික භාරය විමධ්‍යගත කිරීමක් හැටියට සැළකිය හැකි මෙය බුදුරජාණන් වහන්සේගේ නායකත්වයේ සුවිශේෂ ලක්ෂණයකි. මේ හැරුණු විට තම ශ්‍රාවකයින් වහන්සේලාට වෙනත් යම් යම් වගකීම් පැවරූ අවස්ථා පිළිබඳව සඳහන් වෙයි. සච්චවිභංග සූත්‍ර දේශනාවේදී චතුරාර්ය සත්‍යය මාතෘකාව වශයෙන් බුදුරජාණන් වහන්සේ විසින් සඳහන් කොට, එය විස්තර කිරීමට සැරියුත් තෙරණුවන් සුදුසු යයි දන්වා බුදුරජාණන් වහන්සේ ධර්මාසනයෙන් බැහැරවීම එවැනි අවස්ථාවකි. ගිලන්ව සිටි ගිරිමානන්ද තෙරණුවන් වෙත වඩින ලෙස අනඳ තෙරණුවන් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටි අවස්ථාවේ, උන්වහන්සේ දස සඤ්ඤා දේශනා කොට, එය ගිරිමානන්ද තෙරණුවන්ට දේශනා කිරීම සඳහා ආනන්ද තෙරණුවන් පිටත් කර යැවීම ද එවැනි සිද්ධියකි.

බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවක පිරිසේ දක්ෂතා හා ප්‍රවීණතා හඳුනාගෙන ඊට අනුකූලව විවිධ තොරතුරු ප්‍රදානය කළහ. පැරණිතම ශ්‍රාවකයන් වහන්සේ හැටියට අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන්ට ද, මහනුවණැති ශ්‍රාවකයන් අතර සැරියුත් තෙරණුවන්ට ද, සෘධිමතුන් අතර මුගලන් තෙරුන්ට ද, ධුතාංගධාරීන් අතර මහා කාශ්‍යප තෙරණුවන්ට ද ආදී වශයෙන් අග තනතුරු ප්‍රදානය කළ අන්දම අංගුත්තර නිකායයේ ඒතදග්ග පාලියේ සඳහන් වෙයි.

තම අනුගාමිකයන් ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කිරීම ද බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිබිඹුවන තවත් නායකත්ව ලක්ෂණයකි. උන්වහන්සේ හැමවිටම තම ශ්‍රාවකයින් බැහැරින් වන උවදුරු චෝදනා ආදියෙන් ආරක්ෂා කරගැනීමට කාරුණික වූහ. කුමාර කාශ්‍යප මාතාවට දරුගැබක් පිහිටීම පිළිබඳ සිද්ධියේදී ඉතා සාධාරණ විනිශ්චයක් ලබාදී එතුමිය එම චෝදනාවෙන් මුදවා ගත්හ. තම ශ්‍රාවක පිරිසේ යමකු නොමග යන අවස්ථාවක් දුටුවිට අනුකම්පාවෙන් අවවාද දී සුමගට හැරවීමට, ඇතැම්විට උපක්‍රමශීලිව ක්‍රියා කළහ. නන්ද තෙරණුවන්, කාල සිටුපුත්, ඛේමා බිසව ආදීන් එසේ සුමගට හරවා ගත් වුන් පිළිබඳ නිදසුන්ය.

ජනමතයට ඇහුම්කන් දීම ද බුද්ධ චරිතයෙන් ප්‍රකටවන විශිෂ්ට නායකත්ව ලක්ෂණයකි. ශ්‍රාවකයින් සඳහා ඇතැම් විනය නීති පනවන

ලද්දේත්, සංශෝධනය කරන ලද්දේත්, ජනමතයට ගරු කිරීමක් වශයෙනි. වැසි කාලවලදී තම ශ්‍රාවකයන් චාරිකා කිරීම නවතා ආරාමවල ම විසිය යුතුය යන විනය නීතිය පනවන ලද්දේ ජනමතයට ගරු කිරීමක් වශයෙනි. ජීවක වෛද්‍යාචරයාගේ ඉල්ලීම මත භික්ෂූන් වහන්සේට අතිරේක ගෘහපති චීවරය පිළිගැනීමට අවසර දීම ද මේ පිළිබඳ තවත් නිදසුනකි. භික්ෂූන් වහන්සේට අවශ්‍ය වැසිසළු, ගිලන් බෙහෙත්, ආගන්තුක බත් ආදිය අනුදැන වදාළේ විශාඛාවන් විසින් කරන ලද මෙවැනිම ඉල්ලීමක් නිසා බව මහාවග්ග පාලියේ සඳහන් වෙයි.

ආදර්ශවත් වීම බුදුසිරිතෙන් ප්‍රකටවන තවත් නායකත්ව ලක්ෂණයකි. බුදුරජාණන් වහන්සේ 'යථාවාදී තථාකාරී' ගුණයෙන් යුක්ත වූහ. දේශනාවත් ඊට අනුරූපව ක්‍රියා කිරීමත් උන්වහන්සේගේ චරිතයෙන් නිරතුරුවම දක්නට ලැබෙන්නකි. බුදුරදුන් අල්පේච්ඡතාවේ අගය දේශනා කළේ තමන් වහන්සේ ද අල්පේච්ඡතා ජීවිතයක් ගත කරමින්ය. අහංකාරකමේ ආදීනව වදාළේ නිරහංකාර වීමෙන්ය. රජ සිටු ආදීන්ගේ අපමණ පූජා සත්කාර විඳිමින් උන්වහන්සේට කල් ගෙවීමට හැකිව තිබිණි. එහෙත් උන්වහන්සේ නිරහංකාරව පිඩුසිඟා යාමෙන් යැපුණහ.

මෙසේ විමසා බලන විට බුදුරජාණන් වහන්සේ විශිෂ්ට නායකත්ව ලක්ෂණවලින් යුක්ත ශාස්තෘවරයෙකු ලෙස හැඳින්විය හැකිය. අපි ද උන්වහන්සේගේ චරිතය ආදර්ශයට ගෙන නායකයින් වශයෙන් වගකීම් පැවරෙන අවස්ථාවලදී ක්‍රියා කිරීමට අදිටන් කර ගනිමු.

භාවිතයට :

1. මෙම පාඩමේ සඳහන් වන බුද්ධචරිතයේ නායකත්ව ලක්ෂණ අනුපිළිවෙලින් ලියන්න.

2. ඔබ ශිෂ්‍ය නායකයෙකු බවට පත්වුවහොත් මෙම නායකත්ව ලක්ෂණ අනුගමනය කරන අන්දම පැහැදිලි කරන්න.

9 පාඩම

# බුදුරජාණන් වහන්සේ පිළිබඳ සමකාලීන අගැයීම්

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයන් වහන්සේය. බුදුරදුන් තුළ පැවති විශිෂ්ට ගුණ සමුදාය නිසා සමකාලීනයන්ගේ මෙන් ම පසුකාලීනයන්ගේ ද ප්‍රශංසාවට හා ඇගැයීමට උන්වහන්සේ පාත්‍ර වූහ. විශේෂයෙන්ම බුද්ධකාලීන අන්‍ය ආගමිකයන් හා බුද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවන් විසින් කරන ලද ඇගයුම්වල වාර්තා පෙළෙහි නිතර හමුවෙයි.

බුදුරජාණන් වහන්සේ පිළිබඳ කීර්තිරාවය සමකාලීන සමාජයේ පැතිර ගිය අන්දම ප්‍රකට කෙරෙන සටහනක් මජ්ඣිම නිකාය සාලෙය්‍යක සූත්‍රයෙහි දක්නට ලැබෙයි. එහි සඳහන් අන්දමට බුදුරජාණන් වහන්සේ නව අරහාදී බුදු ගුණවලින් යුක්ත වෙති. ලෝකයත්, ප්‍රජාවත් පිළිබඳව සිය නුවණින් ම අවබෝධ කොට ගෙන පවසති. අර්ථ සම්පන්න ධර්මයක් ම ඉතා මැනවින් දේශනා කරති. පිරිසිදු නිවැරදි මාර්ගයක් ඉදිරිපත් කරති. එහෙයින් එබඳු වූ තථාගතයන් වහන්සේගේ රුව දැකීමට ලැබීම පවා වාසනාවක් සේ සැලකූ බව එම පාඨයෙන් ප්‍රකාශ වෙයි.

තං ඛො පන භගවන්තං ගොතමං ඒවං කල්‍යාණො කිත්ති සද්දො අබ්භුග්ගතො ඉතිපිසො භගවා අරහං සම්මා සම්බුද්ධො ............ භගවා, සො ඉමං ලෝකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණං පජං සදෙව මනුනස්සං සයං අභිඤ්ඤාය සච්ඡිකත්වා ............සො ධම්මං දෙසති. ආදී කල්‍යාණං, මජ්ඣෙ කල්‍යාණං පරියොසාණ කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති සාධුඛො පන තථා රූපානං අරහතං දස්සනං හොති ති.

(ම. නි. සාලෙය්‍යක සුත්ත)

සමකාලීන ප්‍රකට බමුණන් හා පරිබ්‍රාජකාදීන් බුදුරදුන් පිළිබඳ කරන ලද ඇගයුම්ශීලි වර්ණනා පෙළෙහි එන සූත්‍රවල වාර්තා වෙයි. ඇතැම් ප්‍රකට බමුණන් බුදුරදුන් තුළ පැවති ගුණ සමුදාය නිසාම උන්වහන්සේ දැකීමට යාම සඳහා සූදානම් වන විට බමුණු පූජකයන් ඔවුන් වළකාලීමට උත්සාහ

කර ඇත. විය යුත්තේ බුදුරදුන් වෙත යාම නොව බුදුරදුන් ඔවුන් වෙත පැමිණීම යයි ද ඔවුන් පවසා ඇත. එහෙත් එවැනි අවස්ථාවලදී තමන් බුදුරජාණන් වහන්සේ වෙත යා යුත්තේ උන්වහන්සේගේ කෙබඳු ශ්‍රේෂ්ඨත්වයක් නිසා දැයි එම බ්‍රාහ්මණයන් පැහැදිලිව ප්‍රකාශ කොට ඇත. දීඝ නිකාය සෝණදණ්ඩ සූත්‍රයේ හා මජ්ඣිම නිකාය චංකී සූත්‍රයේ එබඳු වාර්තා සටහන් වෙයි. ඔවුහු උන්වහන්සේගේ මහාභිනිෂ්ක්‍රමණයට පෙර පැවති ගෘහ ජීවිතයේ උසස් බව මෙන් ම බුද්ධත්වයෙන් පසුව පැවති උදාර පෞරුෂයත් වර්ණනාවට පාත්‍ර කළහ.

මවුපිය දෙපාර්ශවයෙන් ම පිරිසිදු පරපුරකට අයිතිවීම, විශාල වැදගත් නෑදෑ පිරිසක් අතහැර පැවිදි වූ අයකු වීම, විශාල ධනයක් අතහැර පැවිදි වූ අයකු වීම, මනා රූ සපුවකින් යුක්ත අයකු වීම, උසස් ශීලයකින් යුත් අයකු වීම, බොහෝ දෙනකුගේ ආචාර්යවරයකු හා ප්‍රාචාර්යවරයකු වීම, කාමාශා දුරු කළ අයකු වීම, කර්මවාදී ක්‍රියාවාදී කෙනෙකුවීම, දුර ප්‍රදේශවල සිටත් නොයෙක් දෙනා කරුණු අසා දැනගැනීමට පැමිණෙනු ලබන තැනැත්තෙකු වීම, ලක්ෂ ගණන් දෙවි දේවතාවුන් උන්වහන්සේ සරණ යාම, අරහ ආදී ගුණවලින් යුක්ත අයකු ලෙස ප්‍රකට වීම, මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් යුත් අයකු වීම, උන්වහන්සේ වැඩ සිටිනා තැන අමනුෂ්‍යයන්ගෙන් මිනිසුනට කිසිදු පීඩාවක් නොවීම, අනෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට වඩා සුපතල කීර්තියක් ඇති කෙනකු වීම, බිම්බිසාර වැනි රජවරුන් හා පොක්ඛරසාති වැනි ප්‍රකට බ්‍රාහ්මණයින් උන්වහන්සේ සරණ ගොස් සිටීම වැනි ගුණයන් එම බමුණු පඬිවරු බුදුරදුන්ගේ ශ්‍රේෂ්ඨත්වය දැක්වීමට ඉදිරිපත් කළහ.

පිලෝතික පරිබ්‍රාජකයා බුදුරදුන්ගේ ප්‍රඥා මහිමය ඉතා උසස් ලෙස අගය කළ අන්දම චුල්ලහත්ථිපදෝම සූත්‍රයෙහි වාර්තා වෙයි. පූර්ණ කාශ්‍යප ආදී ෂඩ් ශාස්තෘන් සමඟ සසඳමින් ප්‍රශ්න ඇසීමට හා විමසීමට බුදුරදුන්ගෙන් ලැබ ඇති නිදහස පිළිබඳව සභිය පරිබ්‍රාජකයා උන්වහන්සේ ප්‍රශංසාවට ලක් කොට ඇත.

නිශ්ශබ්දතාව ප්‍රිය කරන ගතියත්, බුද්ධිමත් භාවය හා සහනශීලී ආගමික ප්‍රතිපත්තියත් පිළිබඳව පොට්ඨපාද, සකුළුදායි හා වච්ඡගොත්ත වැනි පිරිවැජියන් විසින් කරනු ලැබ ඇත්තාහ. බුදුරජාණන් වහන්සේ ඉතා උසස්

ලෙස අගය කොට ඇත. එම ගුණ මහිමයන් ඇගයීමට භාජනය කරමින් තම ආශ්‍රමවලට විශේෂයෙන් ම ඔවුන්ගේ සාකච්ඡා සභාවලට බුදුරදුන් වැඩමවා ගැනීමට ඔවුහු කැමැත්ත පළ කළහ.

බුදුරජාණන් වහන්සේ තුළ පැවති ආචාරශීලි ගති පැවතුම් පිළිබඳව අජාසත් රජතුමා ඉමහත් ප්‍රසාදයට පත් වූ අන්දම දීඝනිකාය සාමඤ්ඤඵල සූත්‍රයෙහි සඳහන් වෙයි. වරක් ජීවක වෛද්‍යවරයා සමහ බුදුරදුන් දැකීම සඳහා ගිය රජතුමා බුදුරජාණන් වහන්සේ හා මහ සහ රුවන සිසිල් ශාන්ත විලක් මෙන් සංවර ව, ප්‍රසන්නව, නොකැළඹුණු ඉදුරන් ඇති ව වසනු දැක මගේ ආදරණීය පුතා උදය හද්‍රත් මේ උපශාන්ත ගතියෙන් සිටියේ නම් යනුවෙන් රජුට සිතිනැයි එම සූත්‍රයෙහි වාර්තා වෙයි.

දීඝනිකාය මහා ගෝවින්ද සූත්‍රයෙහි සඳහන් අන්දමට වෙනත් ශාස්තෘවරයෙකු තුළ දක්නට නොලැබුණු ගුණ අටක් සක්දෙව් රජුගේ වර්ණනාවට ලක් වී ඇත. ලෝකානුකම්පාවෙන් යුතුව බොහෝ දෙනාගේ හිත සුව පිණිස ක්‍රියා කිරීමට ඉදිරිපත් වීම, තම තමා විසින් ම ප්‍රත්‍යක්ෂ කළ යුතු ධර්මයක් දේශනා කිරීම, කුසල් අකුසල් පිළිබඳව මැනවින් දේශනා කිරීම, නිසැකව ම නිවන් අවබෝධ කොට ගත හැකි මහක් පෙන්වා තිබීම, මද ප්‍රමාදයන්ගෙන් තොර ව ආහාර වැළඳීම, යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී වීම හා නිසැකව ම තම පරමාර්ථ ඉටු කරගෙන සිටීම යනු සක් දෙව් රජුගේ පැසසුමට ලක් වූ බුදුගුණයෝය.

සමකාලීන බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා විසින් ද බුදුරදුන්ගේ විවිධ ගුණ සමුදාය දැක උන්වහන්සේ පිළිබඳව ඉමහත් භක්තියකින් යුතුව කරන ලද ප්‍රකාශ පෙළෙහි සටහන් වෙයි. බුදුරජාණන් වහන්සේ ධර්මය මැනවින් අවබෝධ කොට ගෙන අන්‍යයන්ට ධර්මාවබෝධය ඇති කරවනු පිණිස දහම් දෙසති. උන්වහන්සේ ඉන්ද්‍රිය දමනයෙන් යුක්තව ම ශ්‍රාවකයින් තුළ ඉන්ද්‍රිය දමනය ඇති කරවනු පිණිස දහම් දෙසති. ශාන්ත භාවයට පැමිණි බුදුරජාණන් වහන්සේ අන්‍යයන් තුළ ශාන්ත භාවය ඇති කරවනු පිණිස සදහම් දෙසති. බුදුරජාණන් වහන්සේ සසර තරණය කොට අන්‍යයන් එතෙර කරවීම පිණිස දහම් දෙසති. කෙලෙස් පරිනිර්වාණයට පත් බුදුරජාණන් වහන්සේ අන්‍යයන්ට ද ඒ සඳහා සදහම් දෙසති. යනුවෙන් බුදුරජාණන් වහන්සේ ශාස්තෘවරයෙකු වශයෙන් අගය කළ අන්දම මජ්ඣිම නිකාය චූල සච්චක සූත්‍රයෙහි සඳහන් වෙයි.

බුදුරජාණන් වහන්සේගේ ගුණ මහත්තත්වය සමකාලීන සමාජයේ විවිධ තරාතිරම්වල අය විසින් මෙසේ ඇගයීමට භාජනය කළ අන්දම නොයෙක් සූත්‍ර දේශනා ඇසුරෙන් අපට දැක ගත හැකි වෙයි. එමගින් බුදුරදුන් පිළිබඳව අප තුළ ඇති ශ්‍රද්ධා භක්තිය දියුණු වෙයි.

අපි ද උන්වහන්සේ අනුගාමී වෙමු.

පුහුණුවට :

බුදුරජාණන් වහන්සේගේ ගුණ වර්ණනා සඳහන් වන සූත්‍ර පාඨ පිටක ග්‍රන්ථවලින් සොයා කියවන්න.

# 10 පාඩම

## බුදුරජාණන් වහන්සේ පිළිබඳ නූතන ඇගයීම්

මීට පෙර පාඩමේදී බුදුරජාණන් වහන්සේ පිළිබඳ සමකාලීනයන්ගේ ඇගයීම් අධ්‍යයනය කළ ඔබට මේ පාඩමේ දී, උන්වහන්සේ පිළිබඳව නූතන විද්වතුන් කළ ඇගයීම් ප්‍රකාශන කීපයක් විමසීමට ඉඩ ලැබෙනු ඇත.

19 වන සියවසේ පටන් බුදුදහම, යුරෝපය, ඇමරිකාව ආදී මහද්වීපයන්හි පැතිර යාම ආරම්භ විය. විශේෂයෙන් බුදුදහම කෙරෙහි කැමැත්තක් දැක්වූයේ මේ රටවල වාසය කරන උගත් ජනතාවය. බුදුදහමේ විද්‍යාත්මක ස්වරූපය, නිදහස් චින්තනය අගය කිරීම, මනුෂ්‍යත්වය අගය කිරීම වැනි බුදුදහමේ කැපී පෙනෙන විශේෂ ලක්ෂණ මෙයට හේතු විය. ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන් ආදී ලෝක භාෂාවලින් බුදුදහම ඉගෙනීමට දොර විවෘත වීම නිසා බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් විදේශිකයන් අතට පහසුවෙන් පත්වන්නට විය. ආසියාවට ආලෝකයක් වූ බුදුදහම යුරෝපයේදී අනෙක් මහද්වීපයන්ට ද ආලෝකය පතුරවන්නට පටන් ගත්තේ ඉන් පසුව ය.

බුදුරජාණන් වහන්සේගේ සමකාලීනයන් උන් වහන්සේ පිළිබඳව ඇගයීම් කෙළේ උන්වහන්සේ සියැසින් දැකීමෙනි, උන්වහන්සේගේ ධර්මය සිය කනින් ඇසීමෙනි. එහෙත් නූතන විද්වතුන් උන්වහන්සේ අගයන්නේ උන්වහන්සේගේ ධර්මය ඇසීමෙනි. 'යමෙක් ධර්මය දකී ද හේ මා දකී' යන බුදුරදුන්ගේ කියමන ද ඔබට මතක් වෙනවා ඇත.

නුදුරු අතීතයේ සිටියාවූත්, වර්තමානයේ ජීවත් වන්නාවූත් පෙර අපර දෙදිගට ම අයත් විද්වතුන් විසින් බුදුරජාණන් වහන්සේ පිළිබඳවත් උන්වහන්සේගේ ධර්මය පිළිබඳවත් කළ ප්‍රශංසාත්මක ප්‍රකාශන සමහරක් මෙතැන් සිට ඉදිරිපත් කෙරේ.

1. ජර්මන් මහාචාර්යවරයෙකු වූ මැක්ස්මුලර් පඬිතුමා මෙසේ කියයි.

බුදුරජාණන් වහන්සේ වනාහි උන්වහන්සේ විසින් දේශනා කරන ලද සියලුම ගුණ ධර්මයන්ගේ ප්‍රතිමූර්තියයි. හතලිස් පස් වසරක කාලය තුළදී

තමන් විසින් ප්‍රකාශ කරන ලද වචන උන්වහන්සේ ක්‍රියාවට නඟා පෙන්වූහ. මොනම දුබලතාවක් හෝ පහත් හැඟීමක් හෝ උන්වහන්සේගෙන් කිසි විටෙකත් ප්‍රකාශ නොවීය. ලෝකයට ඉතා ම පරිපූර්ණ ආචාරධර්ම පද්ධතියක් ඉදිරිපත් කෙළේ ද බුදුරජාණන් වහන්සේය.

2. "මා ක්‍රිස්තු භක්තිකයෙකු නොවන්නේ මන් ද ?" යන පොත ලියූ බර්ට්‍රන් රසල් නමැති දාර්ශනිකයා බුදුරජාණන් වහන්සේ ගැන පවසන්නේ මෙසේය.

ඓතිහාසික පුද්ගලයන් අතර ප්‍රඥාවෙන් හා ශීලයෙන් ඉහළ ම ස්ථානයේ සිටින්නේ ක්‍රිස්තුස් වහන්සේය යන්න මට පිළිගත නොහැකිය. ඒ දෙකරුණෙන් ම ක්‍රිස්තුස් වහන්සේට වඩා ඉහළින් සිටින්නේ බුදුරජාණන් වහන්සේ යයි මම සිතමි. බර්ට්‍රන් රසල්ගේ තවත් අදහසක් මෙන්න.

ලෝකයේ සුප්‍රසිද්ධ ආගම්වලින් මා බුදුදහමට විශේෂයෙන් මුල් බුදුදහමට කැමැති වන්නේ එය කිසිවෙකු නොපෙළන බැවිනි.

3. පහත දැක්වෙන්නේ බුදුදහමේ සාරය නැමැති ග්‍රන්ථය රචනා කළ ලක්ෂ්මි නරසූ නමැති මහාචාර්ය වරියගේ කියමනකි. බුදුරජාණන් වහන්සේ ලෞකික ආශා නැමැති ගිනිගත් නිවෙස තුළ ඇවෙන දරුවන් බේරා ගැනීමට උපාය මාර්ග යොදන්නාවූත්, බේරා ගැනීමෙන් පසු නිර්වාණය නැමැති ආරක්ෂක ස්ථානයට මඟ පෙන්වන්නාවූත් පියකු බඳුය.

සූෆි පණිවුඩය නැමැති ඉස්ලාම් ග්‍රන්ථයේ කර්තෘ හස්රාත් ඉනායත් ඛාන් ගේ අදහසක් මෙසේය.

බුදුරජාණන් වහන්සේගේ ධර්මදූත කාර්යයේ ස්වභාවය අද්විතීයයි. එබැවින් බුදුදහම ලෝකයේ අනෙක් සියලු ආගම්වලින් කැපී පෙනේ. උන්වහන්සේගේ දූත සේවාව යොමු වූයේ අහසේ පියාඹන පරමාදර්ශයේ කුරුල්ලන් පොළොව අසලට ගෙන්වා ගැනීමටය. මක්නිසා ද යත්, ඒ කුරුල්ලන්ගේ ශරීරයට අවශ්‍ය ආහාර ඇත්තේ පොළොව මතුපිට බැවිනි.

ලෝක ප්‍රසිද්ධ ඉතිහාසඥයකු හා ගත් කතුවරයෙකු වූ එච්. ජී. වෙල්ස් බුදුරජාණන් වහන්සේ ගැන මෙසේ කියයි.

බුදුරජාණන් වහන්සේ යන සංකල්පය තුළ මා දකින්නේ ඉතා චාම්, ධාර්මික මනුෂ්‍යයෙකි. ආලෝකය සඳහා සටන් කළ ප්‍රාණවත් පෞරුෂයකි. ආශ්චර්යවත් මිථ්‍යා ප්‍රවාදයන්ගෙන් ආවරණය වූ හැබෑ මිනිසෙකි. එතුමෝ සමස්ත මිනිස් වර්ගයාට සාර්ව භෞමික පණිවිඩයක් දුන්හ. අපේ බොහෝ නූතන අදහස් උන්වහන්සේගේ අදහස් හා ගැලපේ. ජීවිතයේ සියලු ම දුක් ගැහැට හා අතෘප්තිජනක තත්ත්වයන්ට හේතුව ආත්මාර්ථකාමිත්වය බව එතුමෝ ඉගැන්වූහ. ආත්මාර්ථකාමිත්වය ත්‍රිවිධාකාරයකින් පෙනී සිටියි. ඉන්ද්‍රියයන් තෘප්ත කිරීමේ ආශාව එකකි. අමරණීයත්වයට ඇති ආශාව තවෙකකි. ලෞකික සැප සම්පත්වලට ඇති ආශාව තුන්වැන්නයි.

පවිත්‍රත්වයට හෙවත් නිවී සැනහීමට අවශ්‍ය නම් පළමුවෙන් ඉන්ද්‍රියයන් වෙනුවෙන් හෝ තමන් වෙනුවෙන් හෝ ජීවත්වීමෙන් වැළකිය යුතුය.

තමන් පිළිබඳ ඇල්ම අමතක කරන ලෙස බුදුරජාණන් වහන්සේ මිනිස් වර්ගයාට ප්‍රකාශ කළේ ක්‍රිස්තු පූර්ව පන්සිය වසරකටත් පෙරය.

තවත් අවස්ථාවක දී එච්. ජී. වෙල්ස් මෙසේ කියයි.

මිනිස් වර්ගයාගේ වංශ කථාවෙහි ලෝක ශිෂ්ටාචාරය හා සැබෑ සංස්කෘතියක් ගොඩ නැගීමට මෙහෙයක් කළ, බුද්ධ ධර්මය තරම් බලවේගයක් තවත් නැත්තේය.

"ආසියා අලෝකය" නැමැති බුද්ධ චරිත කාව්‍යය රචනා කළ එඩ්වින් ආර්නෝල්ඩ් නැමැති කවියා කාව්‍යමය ස්වරූපයකින් බුදුරදුන් හඳුන්වා දුන්නේ පහත සඳහන් අන්දමිනි.

බුදුරජාණන් වහන්සේ අපේ මානව වෘක්ෂයේ පිපුණු මලයි. ඒ මල පිපෙන්නේ අසීමිත ලක්ෂ සංඛ්‍යාත වසර ගණනකට පසුව ය. එයින් වහනය වන ප්‍රඥා සුගන්ධයෙනුත්, ඇද හැලෙන දයාව නැමති මකරන්ධයෙනුත් ලෝකය පිරෙයි.

මිනිස් වර්ගයාගෙන් වැඩි ම සංඛ්‍යාවකින් පූජා ලද තැනැත්තා ලෙස ඉතා පහසුවෙන්ම වෙන් කොට දැක්විය හැකි තැනැත්තා නම් බුදුරජාණන්

වහන්සේය යනුවෙන් පවසන්නේ පෙරදිග තරුණ ක්‍රිස්තියානි සංගමයේ සාහිත්‍ය ලේකම්වරයා වූ මහාචාර්ය සෝන්ඩර්ස්ය.

නිදහස් ඉන්දියාවේ ප්‍රථම අගමැතිවරයා වූ ශ්‍රී ජවහර්ලාල් නේරුතුමන් බුදුදහම ගැන දැක්වූ අදහසකි පහත දැක්වෙන්නේ.

කැලඹිලි, කලහ, වෛරය හා භීෂණය ආදියෙන් පිරුණු ලෝකයේ බුදුරජාණන් වහන්සේගේ පණිවිඩය රැස් විහිදෙන සූර්යයා මෙන් බබලයි. පරමාණු හා ජලකර බෝම්බ නිපදවන වර්තමාන ලෝකයට තරම් අතීතයේ කවර කලකදීවත් ඒ පණිවුඩය අවශ්‍ය වූයේ නැත. අවුරුදු දෙදහස් පන්සීයක කාලයක් තුළදී බුදුරජාණන් වහන්සේගේ ඒ පණිවුඩයේ සත්‍යතාවට තව තවත් ජීවය එකතු වී ඇත. එම අමරණීය පණිවුඩය සිහි කරමින් අපේ සිතුවිලි හා ක්‍රියාදාමයන් උන්වහන්සේගේ ඉගැන්වීම් අනුව හැඩ ගසා ගැනීමට උත්සාහ කරමු. බුදුරජාණන් වහන්සේගෙන් ගත හැකි පාඩමක් පිළිබඳව ශ්‍රී නේරු පවසන තවත් අදහසක් මෙන්න. ඔබට ප්‍රශ්නයක් දෙස බැලීමට ඇත්තේ නම් බුදුරජාණන් වහන්සේ ඉගැන්වූ ලෙස ශාන්ත ව ඉවසීමෙන් හා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ඒ දෙස බලන්න.

බුදුරජාණන් වහන්සේ නව මානව වංශයක් පහළ කළහ. එය සදාචාර යෝධයන්ගේ වංශයකි. විමුක්තිදායක වැඩකාරයින්ගේ වංශයකි. බුද්ධ වංශයකි. එසේ පවසන්නේ මන්මථනාත් ශාස්ත්‍රි නැමැති ඉන්දියානු පඬුවාය.

බුදුරජාණන් වහන්සේ ජීවත් නොවූ කෙනෙකු යයි යමෙකු ඔප්පු කළත් බුදුදහමේ ඉගැන්වීම් නම් කෙසේවත් වෙනස් නොවී පවතිනු ඇත. යනුවෙන් ප්‍රකාශ කරන්නේ බුදුදහම පිළිබඳව ඉංග්‍රීසි බසින් පොත්පත් රාශියක් ලියා පළ කළ ක්‍රිස්මස් හම්ප්‍රීස් නැමැති ඉංග්‍රීසි ලේඛකයාය.

තම අනුගාමිකයන් අතර විමංසන ආකල්පය වගා කරන, තමා විසින් දේශනා කරනු ලබන ධර්මය වුවත් අන්ධ භක්තියෙන් පිළිනොගන්නා ලෙස අවවාද කරන ලොව සිටි එකම ආගම් කතුවරයාණෝ බුදුරජාණන් වහන්සේ යි පවසන්නේ ප්‍රංශ බෞද්ධ පඬිවරියක වූ ඩේවි නිල් මැතිණියයි.

ජර්මන් බෞද්ධ පඬිවරයෙකු වූ පූජ්‍ය ඥානාතිලෝක හිමියෝ බුදුදහම ගැන මෙසේ පවසති.

බුදුදහම අඳුරු දුකින් පිරුණු ආගමක් ලෙස සමහරු පිළිගනිති. එය එසේ නොවේ. බුදුදහම, එය අදහන්නන් ආලෝකවත් හා ප්‍රීතිමත් බවට පමුණුවයි. බෝසත් කථා කියවන අපට එතුමා ඉවසීම ආදී පාරමිතා පිරූ හැටි අසන්නට ලැබෙයි. මහා දුක් කරදර මැද සතුටින් සිටීමටත්, අන්‍යයන්ගේ සැප සම්පත් හා වැඩි දියුණුව ගැන ප්‍රීති වීමටත් එයින් අපට පිහිට ලැබෙයි.

ආසියාව බුද්ධ ක්ෂෙත්‍රය හෙවත් බුද්ධ විජිතයයි. එහි දස ලක්ෂ පන්සියකටත් වඩා ජනකායක් බුදුදහම අදහන්නෝය. ඉතිහාසයේ එක් කාලයකදී ආසියාතික විවිධ ජාතීන් හා සංස්කෘතීන් ආධ්‍යාත්මික වශයෙන් සම්බන්ධ කරන ලද්දේ බුදුදහම විසිනි. ආසියාව නැවතත් ඒකාබද්ධ කිරීමට හැක්කේ බුදුදහම නැමැති සාධකයට බව මම විශ්වාස කරමි. මෙසේ පවසන්නේ ආචාර්ය එන්. ගැන්ගුලි මහතාය.

ලන්ඩන් පාලි පොත් සමාගමේ දිගු කලක් සේවයේ යෙදී සිටි මහාචාර්ය රීස් ඩේවිඩ්ස් පඬිතුමා බුදුදහම පිළිබඳව පවසන්නේ මෙසේය.

බුදුදහමත්, ලෝකයේ ප්‍රධාන ගණයේ වෙනත් සියලු ම ආගම් ද මම පරීක්ෂා කර බැලුවෙමි. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ආර්ය අෂ්ටාංගික මාර්ගයත්, චතුරාර්ය සත්‍යයත් තරම් ශෝභන වූත් පැහැදිලි වූත් ධර්මයක් මම ඒ කිසි ම ආගමක නුදුටුවෙමි. මම මගේ ජීවිතය උන්වහන්සේ පෙන්වා දුන් මාර්ගය ඔස්සේ හැඩ ගසා ගැනීමෙන් තෘප්ත වෙමි.

තවත් වරක් රීස් ඩේවිඩ්ස් පඬිතුමා මෙසේ ද පවසන්නේය. 'බුද්ධ ධර්මයේ දීර්ඝ ඉතිහාසය තුළ බෞද්ධයින් විසින් අන්‍ය ආගම්කාරයන් පෙළූ අවස්ථාවක් වාර්තාගත වී නැත්තේය'.

"ඉර හඳ පවතිනා තෙක් මෙන් ම මිනිස් වර්ගයා මිහිපිට ජීවත් වනතුරු ම බුදුදහම පවතිනු ඇත. එසේ වන්නේ එය මිනිසාගේ ආගම වන බැවිනි." මෙසේ පැවසුවේ ශ්‍රී ලංකා ඉතිහාසයේ නවයුගයක් උදා කළ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාණෝය.

මිනිසාට ඔහුගේම දෙපයින් නැඟී සිටීමටත් ආත්ම විශ්වාසය හා ජීව ශක්තිය ලබා ගැනීමටත් ශක්තිය ලබා දෙන්නේ බුදුදහමයි. එසේ පවසන්නේ දෙස් විදෙස්හි බුදුදහම පැතිරවීමට සිය ජීවිතය කැප කළ අපේ නාරද හාමුදුරුවෝය. උන්වහන්සේ මෙසේ ද පවසති. 'බෞද්ධයා කිසි විටකත් පොතට හෝ පුද්ගලයෙකුට වහල් නොවෙයි. බෞද්ධයෙකු වීමෙන් ඔහු ස්වකීය නිදහස කැප නොකරයි. ඔහුට අවශ්‍ය නම් බුද්ධත්වය ලබා ගැනීමට වුව ද චිත්ත ශක්තිය හා දැනුම වර්ධනය කර ගත හැකිය.

නිදහස් ඉන්දියාවේ ප්‍රථම අධිකරණ ඇමතිවරයා වූත්, නූතන භාරත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්මාතෘවරයා වූත්, 1956 බුද්ධ ජයන්ති වර්ෂයේ දී දකුණු ඉන්දියානු හරිජනයන් පන් ලක්ෂයක් දෙනා බුදුදහම වැළඳ ගැනීමට පෙළඹවූවා වූත් ආචාර්ය භීම්රාඕ රාම්ජි අම්බෙඩ්කාර් මහතාගේ කියමනකින් මේ පාඩම අවසන් කරමු.

'බෞද්ධයෙකුගේ යුතුකම හුදෙක් හොඳ බෞද්ධයෙකු වීම පමණක් නොවේ. බුදුදහම පැතිරවීම ඔහුගේ යුතුකම විය යුතුය. බුදුදහම පැතිරවීම යනු සමස්ත මිනිස් වර්ගයාට ම සේවය කිරීම බව ඔහු පිළිගත යුතුය'.

අභ්‍යාසය :

1. බුදුරජාණන් වහන්සේ හා බුදුදහම පිළිබඳ නූතන ඇගයීම්වලින් බුදුරදුන් හා බුදුදහමේ කවර ලක්ෂණ අවධාරණයවී තිබේදැයි විමසන්න.

# 11 පාඩම

## ලාභීන් අතර අගතැන් පත් සීවලී රහතන් වහන්සේ

ආසනයක වැඩ හිඳ පාත්‍රයක දන් වළඳන ස්වාමීන් වහන්සේ නමකගේ පින්තූර නිවෙස්වල හා වෙළඳසැල් වල එල්ලා තිබෙන අයුරු ඔබ දැක තිබේ. ඒ සීවලී මහ රහතන් වහන්සේගේ පින්තූරයයි. උන්වහන්සේගේ පින්තූරයට පවා වැඳුම් පිදුම් කිරීමෙන් ආහාර පානාදියෙන් අගහිඟයක් ඇති නොවේ යයි බෞද්ධයෝ සලකති. මෙහි දක්වා ඇත්තේ සීවලී මහරහතන් වහන්සේගේ කථා පුවතය.

මේ අප බුදුරදුන් ලොව පහළ වූ සමයයි. කෝලිය නුවර මහා ලිච්ඡවී රජුට දාව සුප්පවාසා නම් කෝලිය රජ බිසව කුස දරුවෙක් පිළිසිඳ ගති. සත්හවුරුදු සත්මසක් යන තුරු දරුවා මෙලොවට බිහි නොවීය. එහෙයින් මවත් දරුවාත් එපමණ කලක් ම මහත් දුක් වින්දහ. දරුවා මෙලොවට බිහිවන අන්තිම සතියෙහි බිසව වඩාත් දුකට පත් වූවාය. ඕ තොමෝ බුදුරදුන් සිහි කළාය. සැමියා මගින් තම දුක බුදුරදුන්ට දැන්වූවාය.

මහමෙත් කුළුණු ගුණයෙන් පිරි බුදුරජාණන් වහන්සේ ඇයට ද දරුවාට ද ආශිර්වාද කළහ. පුදුමයකි, ඒ ආශිර්වාදයත් සමඟම නිවසේ සිටි සුප්පවාසාව නිදුකින් පින්බර පුතෙකු බිහි කළාය. සියල්ලන්ගේ සිත් සතන් සිසිල් කරමින් උපන් හෙයින් කුමරුට සීවලී යන නම තැබූහ. බෙහෙතකින් නොලත්, ආශිර්වාදයෙන් ලත් මේ අසිරිමත් සිදුවීම කෙරෙහි සුප්පවාසාවගේ සිත දැඩිලෙස බැඳී ගියේය. එහෙයින් ඕ තොමෝ සත්දිනක් බුදුපාමොක් මහ සඟරුවනට දන් දුන්නාය.

සත් හැවිරිදි සීවලී කුමරු පැවිදිවීමට රුචියක් දැක්වූයේය. කුමරුගේ පැවිද්දට කටයුතු සැලසිණ. ඔහුගේ හිසකෙස් කපා නිම විය. හිසේ බර එලෙසින් ඉවත් විය. කුඩා වුවත් මහ නුවණැති කුමරු හිස කෙස් කපා නිම වීමත් සමඟම රහතන්වහන්සේ නමක් විය. සිතේ කෙලෙස් බරින් ද එසේ නිදහස් වූ කුඩා රහතන් වහන්සේ සැරියුත් මුගලන් රහතන් වහන්සේලා දෙනමගේ ප්‍රධානත්වයෙන් පැවිදි වූහ.

පුණ්‍ය බලයෙන් සීවලී මහ රහතන් වහන්සේට කිසි දිනෙක දානයෙන් හිඟයක් නොවීය. වේරංජා නුවර වස් විසූ බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට පවා දානය ලබාගැනීම අපහසු විය. සීවලී මහ තෙරුන් වහන්සේ සමඟ වඩින භික්ෂූන්ට දානයෙන් හිඟයක් නොවූ බවට මේ එක් උදාහරණයකි.

ඉක්බිති එක් සමයෙකැ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ සැරියුත් මහතෙරුන් වහන්සේගේ බාලමල් වූ රේවත තෙරුන් දක්නා පිණිස කිහිරවන විහාරයට වඩනා සේක්, තිස් දහසක් භික්ෂූන් හා සමඟ නික්මුණු සේක. ඉක්බිති මඳක් තැන් වඩනා කල්හි අනඳ මහ තෙරුන් වහන්සේ දෙමඟක් දැක සිටිසේක්, ස්වාමිනී, මේ මං දෙකම රේවත මහතෙරුන් වසන තෙනට යන මාර්ගය, මේ මං දෙකින් තෙල සැටයොදුන් මග මනුෂ්‍ය වාසය, තෙල තිස් යොදුන් සෘජු මාර්ගය මිනිසුන් නැති අමනුෂ්‍ය වාසය, මෙ මං දෙකින් කවර මගෙකැ යමෝ දැයි දැන්වූ සේක. එකලැ බුදුහු ආනන්දයෙනි, අප හා සමඟ සීවලී අවුදැයි විචාරා එසේය ස්වාමීනි යි' කී කල්හි එසේ වී නම් ළං මගැ ම යම්හයි වදාළ සේක ...... සීවලී මහතෙරුන් වහන්සේගේ කුශලය විපාක දෙන්ට අවසර ලත් තැන යයි දැන ම ඔබගේ කුශල මහිමය ප්‍රකාශ කොට දක්වන පිණිස සීවලී අවු නම් ළං මගැ යම්හයි වදාළ සේක.

මෙසේ කිසිවකුටත් නොලැබූ අයුරින් සීවලී මහරහතන් වහන්සේට ප්‍රත්‍ය පහසුව සැලසුණි. එහෙයින්ම පසු කලෙක බුදුරජාණන් වහන්සේ සීවලී මහතෙරුන් වහන්සේ ප්‍රත්‍යලාභීන් අතර අගතනතුරෙහි තැබූහ.

මෙ අගතනතුර ලැබීමට උන්වහන්සේ සසර දී කළ විශේෂ කුශලයක් හේතු විය. ඒ හා සම්බන්ධ අතීත කථාව මෙසේය. පියුමතුරා බුදුරජාණන් වහන්සේ එක් භික්ෂුවක ප්‍රත්‍යලාභීන් අතර අගතනතුරෙහි පිහිටවූහ. එකල සීවලී තෙරණුවෝ තරුණයෙක් වූහ. ඔහු ද මතු බුදු සසුනක ප්‍රත්‍යලාභීන් අතර අගතනතුරු පැතීය. දිගු කාලයක් ගෙවී ගොස් විපස්සී බුදු සසුන ලොව පහළවිය. එදා ප්‍රාර්ථනා තැබූ තරුණයා මෙදා ගම්වැසි තරුණයෙක් විය. දිනක් දී කිරි රැගෙන නුවරට යන ඔහුට අතරමඟ දී දඬුවැල් බෑ මීයක් හමුවිය. එහි පැණි ද රැගෙන නුවරට එන අතරතුර එක් පුරුෂයෙක් ඔහුට හමුවිය. ඔහු සොයා යන්නේ දී කිරි හා මී පැණිය. විපස්සී බුදුරදුන් ඇතුළු මහ සඟරුවනට රජතුමා දුන් දන් පරදවා මහ දනක් දීමට නුවර වැසියන්ට අවශ්‍ය විය. ඒ සඳහා අවශ්‍යම දාන වස්තු දෙක දී කිරි හා පැණිය. දාන වස්තු සොයාගිය පුරුෂයා දී කිරි හා පැණි මිලදී ගැනීමට සූදානම් වුව ද

ගම් වැසි තරුණයා ඒවා නොවිකුණුවේය. පිං පිණිස බුදු පාමොක් මහ සඟනට ඒවා සියතින්ම පූජා කළේය.

මේ කුසල් බලෙන් ප්‍රත්‍යලාභීන් අතර සීවලී මහ තෙරණුවෝ අග තනතුරු ලැබූහ. කරන ලද අකුසලයක විපාකයෙන් මෙලොවට බිහිවීමට පෙර සත් අවුරුදු සත් මසක් මව් කුස තුළ දුක් විඳීමට ද සිදුවිය. ඒ අකුසලය පිළිබඳ කථා පුවත මෙසේය.

පෙර කලක සීවලී මහ තෙරණුවෝ බරණැස් නුවර රජබවට පැමිණියෝය. තම රාජ්‍යයෙන් සෑහීමකට නොපත් රජතුමා වෙනත් රාජධානියක් තමා සතු කර ගැනීමට සිතීය. දිනක් එක් රාජධානියක් අල්ලා ගැනීමට සේනා සමග රජතුමා පිටත් විය. නුවර සතර වාසල් දොරටු රැකවල්ලා ගෙන සත් අවුරුදු සත් මසක් සිටිය ද රාජ්‍ය අල්ලා ගත නොහැකි විය. රජුගේ මව් බිසව පුතුගේ අසාර්ථක ක්‍රියාව ගැන අසා නුවරින් පිටවීමට ඇති කුඩා දොරටු පවා වසා රැකවල්ලා සිටින ලෙස දන්වා යැවූවාය. පුත් රජතුමා ද මවගේ වචනය ඉටු කළේය. නුවර වැසියෝ දැඩි වෙහෙසට පත් වූහ. තම රජතුමා මරා දැමූ නුවර වැසියෝ රාජ්‍ය බරණැස් රජුට භාර දුන්හ. සත් අවුරුදු සත් මසක් නුවර ජනතාව නුවර තුළ සිරකරුවන් බවට පත් කිරීමෙහි දරුණු විපාකය අපා දුක් ලබා දීමෙන් කෙළවර නොවීය. රහත්වන ජීවිතයේ දී එදා කළ අකුසලයෙහි ශේෂ විපාකය පල දෙමින් සත් අවුරුදු සත් මසක් මව් කුස තුළ දුකට පත් කළේය. එදා පුතුගේ නරක ක්‍රියාවට මව ද සහභාගි වූ හෙයින් මෙදා සුප්පවාසාව තම දරුවා සත් අවුරුදු සත් මසක් කුසෙහි දරමින් දැඩි දුක් වින්දාය.

ගොනා පසුපස එන රියසක මෙන් අකුසල විපාකය ද, තමා අතනොහැර යන සෙවනැල්ල මෙන් කුසල විපාකය ද සත්වයා පසුපස එන අයුරු මේ කතා පුවතින් ඉතා පැහැදිලිව අපට උගත හැකිය.

අභ්‍යාස :

1. ගොනා පසුපස එන රියසක මෙන් අකුසල කර්මයක් විපාක දුන් අයුරු පැහැදිලි කෙරෙන කතා පුවතක් ලියන්න.
2. තමා අත නොහැර යන සෙවනැල්ල මෙන් කුසල කර්මයක් විපාක දුන් අයුරු පැහැදිලි කෙරෙන කතා පුවතක් ලියන්න.

# 12 පාඩම

## ඉවසීමේ ගුණයෙන් ජයගත් සූනාපරන්ත පූර්ණ රහතන් වහන්සේ

දඹදිව සූනාපරන්ත නම් රටක් විය. එහි එක් වෙළඳ ගමක වෙළඳ සොහොයුරන් දෙදෙනෙක් විසූහ. වැඩිමහළු සොහොයුරා පූර්ණ නම් විය. දිනක ඔහු තම වෙළඳ කණ්ඩායම සමඟ වෙළඳාම පිණිස පිටත් විය. ක්‍රමයෙන් ඔවුහු සැවැත් නුවර ජේතවනාරාමය අසලට සැපත් වූහ. මේ වන විට නුවර වැසියෝ බුදුරදුන්ගෙන් බණ ඇසීමට දෙව්රම දෙසට යමින් සිටියහ. පූර්ණ ඔවුන්ගෙන් යන ගමන ගැන විමසීය. තමන් බුදුරදුන්ගෙන් බණ ඇසීමට යන බව ඔවුහු පැවසූහ. බුද්ධ යන වචනය ඇසූ ඔහුට ඇති වූයේ පුදුම සතුටකි. හෙතෙමේ ද ඔවුන් අනුව ගොස් දහම් ඇසීය. පැහැදුනු ඔහු බුදුපාමොක් සඟනට පසුදිනට දනට ඇයුරම් කළේය.

අතරමග ලැගුම් ගෙන සිටි වෙළඳ පිරිස පසුදින දානය සඳහා තාවකාලික දන්සලක් ලහි ලහියේ ම ඉදි කළහ. පසු දින බුදුපාමොක් මහ සඟරුවන එහි වැඩමකොට පැනවූ අසුන්හි වැඩ හුන්හ. පූර්ණ සිය පිරිස සමඟ හද පිරි සැදැහැයෙන් යුතුව උන්වහන්සේලාට දන් වැළඳවීය. පින්කම අවසන්හි පූර්ණ තම භාණ්ඩාගාරික කැඳවීය. 'මගේ වස්තුව ගෙන ගොස් මල්ලීට දෙන්න'. යනුවෙන් පැවසූ හෙතෙම පැවිදිබිමට ඇතුළත් විය.

පූර්ණ හිමියෝ භාවනාවට සිත යොමු කළහ. එය සාර්ථක නොවීය. 'මෙ පෙදෙස බවුන් වැඩීම පිණිස මට නුසුදුසු ය. බුදුරදුන් හමු වී කමටහන් ලබාගෙන මව්බිම වූ සූනාපරන්තයට මා යා යුතුය'. මෙසේ සිතූ උන්වහන්සේ බුදුරදුන් හමුවට වැඩම කළහ. එහිදී දෙදෙනා වහන්සේ අතර සංවාදයක් ඇති විය. ඒ මෙසේය.

පූර්ණ, සූනාපරන්තයෙහි මිනිසුන් දරුණුයි. ඔවුන් ඔබට දෝෂාරෝපණය කළොත් ඔබ මොනව ද හිතන්නේ ?

ස්වාමිනී, මට දොස් කියන ඔවුන් අතින් මට නොගසන හෙයින් හොඳයයි මා සිතනවා.

ඉතින්, ඔවුන් ඔබට අතින් පහර දුන්නොත් ?

ගල් කැටවලින් මට නොගසන ඔවුන් හොඳ යයි මා සිතනවා ස්වාමිනී.

හොඳයි පුණ්ණ, ඔවුන් ඔබට ගල් කැටවලින් පහර දුන්නොත් ?

දඬු මුගුරුවලින් පහර නොදෙන නිසා ඔවුන් හොඳයයි මා සිතනවා.

පුණ්ණ, ඔවුන් දඬු මුගුරුවලින් ඔබට පහර දුන්නොත් ඔබ මොක ද හිතන්නේ ?

ස්වාමිනී, ආයුධවලින් මට පහර නොදෙන ඔවුන් කොතරම් හොඳ ද කියා මා සිතනවා.

ඉතින් ආයුධවලින් පහර දුන්නොත් අදහස් කරන්නේ කුමක් ද ?

ආයුධවලින් පහර දුන්නත් මා මරණයට පත් නොකරන ඔවුන් හොඳ යයි මා සිතනවා ස්වාමිනී.

පුණ්ණ, ආයුධවලින් පහරදී ඔබ මරණයට පත් කරන්න සූදානම් වුනොත් ?

ස්වාමිනී, ඔබ වහන්සේගේ ඇතැම් ශ්‍රාවකයින් භාවනා කොට ජීවිතය ගැන කලකිරීමෙන් දිවි තොර කරවා ගැනීමට ආයුධ ගත්තවුන් සොයනවා. ඉතින්, සෙවීමකින් තොරව ම ආයුධ ගත්තවුන් මට ලැබෙනවායයි මා සිතනවා.

ඉතා ම හොඳයි පුණ්ණ, ඉවසීමෙන් යුත් ඔබට, සංසිඳීමෙන් යුත් ඔබට සූනාපරන්තය භාවනා කිරීමට ඉතා සුදුසුයි.

බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ අනුමැතිය ලබාගත් පුණ්ණ තෙරණුවෝ සූනාපරන්තයට වැඩම කළහ. භාවනා කළ උන්වහන්සේ වස් තුන්මාසය තුළදී ම රහත් බවට පත්වූහ.

වස් තුන් මාසය තුළ දිනක පුණ්ණ තෙරුන් වහන්සේගේ මලණුවෝ පන්සියයක් පමණ සිය වෙළෙඳුන් සමඟ විදෙස්හි වෙළඳාම පිණිස නැව් වලට භාණ්ඩ පැටවූහ. නැව් නගින දිනය උදාවිය. උසස් චාරිත්‍රයක් අනුගමනය කරමින් මලණුවෝ පුණ්ණ තෙරුන්වහන්සේට දන් පිළිගැන්වූහ. පන්සිල් ද සමාදන් වූහ. මුහුදු ගමන අනතුරු සහිත හෙයින් අනතුරක් වුවහොත් අප මුදාගන්නැයි තෙරුන් වහන්සේගෙන් ඉල්ලීමක් ද කළෝය.

ඉන්පසු මුහුදු ගමන ආරම්භ කළ ඔවුහු ටික දුරක් මුහුදෙහි යාත්‍රා කළහ. හදිසියේ ඇති වූ සැඩ සුළඟකින් නැව් සියල්ල වෙනත් දිවයිනකට ළඟා විය. එය රත් සඳුන් වනයකි. එකල රත් සඳුන් ඉතා වටිනා දැව වර්ගයක් විය. එහෙයින් නැව්වල අඩු වටිනාකම් ඇති භාණ්ඩ ඉවත් කොට රත්සඳුන් පුරවා ගත්හ. බලාපොරොත්තු සහිතව ඔවුහු නැවතත් ගමන ඇරඹූහ. එහෙත් අවාසනාවන්ත ලෙස මුහුද මැද අනතුරකට මුහුණපෑමට ඔවුන්ට සිදු විය. නැව්වල සිටි වෙළෙන්දෝ තම තමන්ගේ දෙවියන් සිහි කරන්නට වූහ. පුණ්ණ තෙරුන් වහන්සේගේ මලණුවෝ තම සොහොයුරු හිමියන් ගැන සිහි කළහ. පුණ්ණ තෙරුන්වහන්සේ සෘද්ධියෙන් එහි වැඩම කොට සියලු දෙනා නැව් සමඟ ම බේරා ගත්හ.

වෙළෙන්දෝ සිය නිවෙස්වලට ගොස් මුහුදු අනතුරින් තමන් මිදුනු හැටි නිවැසියන්ට මහත් සතුටින් දන්වා සිටියහ. ඒ ඇසූ අඹුදරුවෝ අපමණ සතුටට පත්වූහ. වෙළෙන්දෝ පන්සියය ද ඔවුන්ගේ භාර්යාවන් පන්සියය ද යන දහසක් පමණ පිරිස තෙරුවන් සරණ ගොස් උපාසක උපාසිකාවන් බවට පත්වූහ. වෙළෙන්දෝ තම රත්සඳුන්වලින් කොටසක් පුණ්ණ තෙරුන් වහන්සේට පිළිගැන්වීමට තරම් කළගුණ දත් අය වූහ.

සූනාපරන්ත වැසියන් කිසි දිනෙක බුදුරජාණන් වහන්සේ නුදුටු පිරිසකි. උන්වහන්සේගේ දර්ශනය මොවුන්ට මහත් ලාභයකි. එහෙයින් මම බුදුරදුන් මෙහි වැඩම කරවන්නෙමි. මෙසේ සිතූ පුණ්ණ තෙරුන් වහන්සේ එම රත්සඳුන් කොටසින් බුදුරදුන් උදෙසා මණ්ඩපයක් ඉදිකරන ලෙස ඔවුනට දැන්වූහ. මණ්ඩපය ඉදිවිණි. දානය ද පිළියෙල කෙරුණි. ගම් වැසියෝ බුදුරදුන් වඩිනතුරු මහත් නොඉවසිල්ලෙන් පසුවූහ.

පුණ්ණ තෙරුන් වහන්සේ බුදුපාමොක් මහසඟරුවන සුනාපරන්තයට වැඩම කරවූහ. ගම් වැසියෝ මහත් සතුටින් දන් පිළිගැන්වූහ. ධර්මය ද ඇසූහ. නැණවත් ඔවුහු ධර්මය අවබෝධ කර ගත්හ.

ඉවසීමෙන්, සංවරයෙන්, වීර්යයෙන් හා ප්‍රඥාවෙන් යුත් උතුම් එක් පුද්ගලයකුට ඉතා කෙටි කලකින් ආත්මාර්ථයත් පරාර්ථයත් සිදුකිරීමට හැකිවීම මහඟු ආදර්ශයකි. රහත් වීමෙන් ආත්මාර්ථය සිදුකරගත් පුණ්ණ තෙරුන් වහන්සේ මුහුදු අනතුරට ලක් වූ පන්සියයක් පිරිස නැව් සමඟ බේරා ගත්හ. තමන් වහන්සේට ලැබුණු රත්සඳුන් කොටසින් බුදුරදුන් උදෙසා මණ්ඩපයක් කරවීමෙන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවය ද පුද කළහ. කල්ප ගණනකින් ලොව පහලවන බුදු කෙනෙකුන් ගම් වැසියන්ට දැකගන්නට සැලැස්වූහ. ඔවුහු දන් දී බණ අසා ධර්මාවබෝධය කළහ. මේ සා මහ මෙහෙවරක යෙදුණු සුනාපරන්ත පුණ්ණ රහතන් වහන්සේ වස් කාලය තුළදී ම පිරිනිවන් පා වදාළහ.

ගමක මිනිසුන්ට ලෞකික ලෝකෝත්තර සුවය ලබාදුන් පුණ්ණ තෙරුන් වහන්සේගේ ශ්‍රී ශරීරය ආදාහනය කළ උපාසක උපාසිකාවෝ උන්වහන්සේගේ ධාතූන් වහන්සේලා තැන්පත් කොට චෛත්‍යයක් ඉදිකිරීමෙන් තම කෘතවේදිත්වය පළ කළහ.

අභ්‍යාසය :

1. ඉවසීමේ අගය පැහැදිලි කරන්න.

# 13 පාඩම

## ධර්ම කථිකත්වයෙන් අගතැන් ලත් ධම්මදින්නා රහත් තෙරණිය

දඹදිව බුදුදහම පැතිරෙමින් තිබුණි. එක් කුලගෙයක පිනැති කුමරියක් උපන්නාය. නමින් ධම්මදින්නා වූ කුමරිය වැඩිවියට පත්ව සිටි කල්හි විසාඛ සිටුවරයා සමඟ විවාහ වූවාය. සිටුතුමා විවාහයට පෙර ම සෝවාන් ව සිටි අතර සෝවාන්ව සිටි බිම්බිසාර රජතුමාගේ කල්‍යාණ මිත්‍රයෙක් ද විය.

නව දම්පතීහු කලක්ගතවන තුරු ම දැහැමින් හා ප්‍රීතියෙන් ගත කළහ. වරින් වර දහම් ඇසීම සිටුවරයාගේ පුරුද්දක් විය. දහම් ඇසූ එක් දිනක නිවන් මග තවත් පියවර දෙකක් ඉදිරියට යමින් සිටුවරයා අනාගාමී උපාසකයකු විය. අනාගාමී වන්නේ කාමරාග - පටිඝ යන සසර බැම් දෙක ඉවත් වීමෙනි. තවදුරටත් අඹුසැමියන් ලෙස කල්ගත කිරීමට සිටුවරයාගේ සිතෙහි කාමරාගය නොමැත.

දහම් අසා අනාගාමීව සිය නිවසට පැමිණි සිටුවරයා නිවසෙහි පියගැට පෙළ නගින්නට විය. ධම්මදින්නාවෝ සිරිත් පරිදි පියගැටපෙළ මත්තෙහි සිට සිය සැමියා වෙත සාදරයෙන් අත දිගු කළාය. එහෙත් වෙනදා මෙන් ඇගේ අත නොගත් සිටුතුමා නිවසට ඇතුල් විය. ආහාර අනුභව කරන වේලෙහි වෙනදා මෙන් කැම බෙදන ලෙස ද ඇගෙන් ඉල්ලීම නොකළේය. තමාගෙන් කිසියම් වරදක් සිදු වී ඇතැයි සිතූ ධම්මදින්නා සිය සැමියාගෙන් කරුණු විමසූවාය.

ධම්මදින්නාවෙනි, අද දහම් ඇසීමෙන් මගේ සිත කාමරාගයෙන් තොර විය. එහෙයින් තවදුරටත් විවාහ ජීවිතයක් ගත කිරීමට මම සුදුස්සෙක් නොවෙමි. එහෙත් ඔබ කැමති නම් මේ සිටු මාළිගයෙහි ජීවත්වන්න ඔබට පුළුවනි. මෙහි ඇති ධනයෙන් කැමතිතාක් ගෙන ආපසු සිය නිවසට ගොස් ජීවත්වන්න හෝ ඔබට පුළුවනි. සැමියාගේ මේ වදන්වලින් ධම්මදින්නාවන්ගේ සිතෙහි දහම් සිතිවිලි මතුවන්නට විය.

'ස්වාමිනී මේ සිටුමාළිගයෙහි සැප සම්පත් විඳිමින් ජීවත් වීමෙන් මට ද පලක් නැත. ඔබ වහන්සේ අනුගමනය කරන නිවන් මග යාමට මම ද කැමැත්තෙමි. මට පැවිදිවීමට අවසර දෙනු මැනවි'. මේ ධම්මදින්නාවගේ මුවින් පිටවූ වදන්ය.

සැමියාගේ අවසරය පැතූ පරිදි ම ඇයට ලැබුණි. ඕ තොමෝ මෙහෙණියක වූවාය. අනාගාමී වූ සැමියා නිසා ම පැවිදි බවට පත් ධම්මදින්නාවෝ මනාකොට සිත පිහිටුවා ගත්හ. කාන්තාවක වීම ඒ සඳහා එතුමියට බාධාවක් නොවීය. නොබෝ කලකින් ම ධම්මදින්නාවෝ සිවුපිළිසිඹියා සහිත රහත් බවට පත්වූහ.

දැන් එතුමියගේ අභිලාෂය සම්පූර්ණය. එහෙයින් ධර්මයෙන් ඥාති සංග්‍රහ කිරීම පිණිස ආපසු රජගහනුවරට වඩින්නට සිතා ධම්මදින්නා රහත් මෙහෙණින් වහන්සේ එහි වැඩම කළහ. මේ බව විසාඛ සිටුවරයාට සැළවි ය. ඇය පැවිද්දට කළකිරී ආපසු එන්නට ඇතැයි ඔහු සිතුවේය. විමසා දැනගනු රිසියෙන් විසාඛ සිටුතුමා මෙහෙණවරට ගියේය. පෙර තම බිරිඳ වුවත් දැන් මෙහෙණියක හෙයින් සිටුතුමා ධම්මදින්නා රහත් තෙරණියට වැඳ වාඩිවීමට තරම් ආචාර සම්පන්න විය. තෙරණිය රහත් වී ඇති බව නොදත් සිටුතුමා මෙසේ සිතීය.

පළමු කොටම පැවිද්දට කළකිරී ඇත්දැයි ඇසීම නුසුදුසුය. ධර්මය පිළිබඳ ගැඹුරු ප්‍රශ්න ඇසීමෙන් ම පැවිද්දට කළකිරී ඇත්දැයි දැනගත හැකිය.

අනතුරුව ධර්මයෙහි ගැඹුරුතැන් අළලා සිටුතුමා ධම්මදින්නා රහත් තෙරණියගෙන් ප්‍රශ්න අසන්නට විය. ඇසූ ඇසූ ප්‍රශ්නවලට නිසිලෙස පිළිතුරු දීමට රහත් තෙරණියෝ සමත් වූහ. සිටුතුමා තවත් ප්‍රශ්නයක් ඇසීය. ඕ තොමෝ එයට පිළිතුරක් නුදුන් හ. එසේ පිළිතුරු නුදුන්නේ අනාගාමී ඔහුට එය තේරුම්ගත නොහැකිවන හෙයිනි. එතැනින් සාකච්ඡාව අවසන් විය.

ඉන්පසුව සිටුතුමා තෙරණියට වැඳ බුදුරදුන් හමුවට ගොස් සිදුවූ සාකච්ඡාව උන්වහන්සේට දැන්වීය. සිටුතුමනි, ඔබ ඒ ප්‍රශ්න මගෙන් විමසුවත් මා දෙනු ලබන්නේත් ඒ පිළිතුරුමය. යනුවෙන් උන්වහන්සේ වදාළහ.

'පියුමතුරා බුදුරදුන් සමීපයෙහි මම මතු බුදු සසුනක ධර්මකථික භික්ෂුණීන් අතර අග තනතුර පතමි' යනුවෙන් එතුමිය කළ ප්‍රාර්ථනාව ඉටු කරමින් බුදුරජාණන් වහන්සේ පසුකලෙක ධර්මකථික භික්ෂුණීන් අතර ධම්මදින්නා රහත් තෙරණිය අග තනතුරෙහි තැබූහ.

අභ්‍යාස :

1. ධර්මකථිකයකු හා සාමාන්‍ය කථිකයකු අතර තිබිය යුතු විශේෂතා පැහැදිලි කරන්න.

2. ධම්මදින්නා චරිතයෙන් ඔබ ගන්නා ආදර්ශ මොනවා ද ?

# 14 පාඩම

# බුද්ධ කාලීන උපාසකවරු

සිවුවණක් පිරිසෙහි තෙවැනි තැන හිමිවන්නේ උපාසකවරුනටය. බුදුරදුන් වැඩසිටි කල ජීවත් වූ විවිධ චරිත ඇති උපාසකවරුන් අතරින් තිදෙනෙකුගේ චරිත හා ඒවායින් ගතහැකි ආදර්ශ ලුහුඬින් විමසා බැලීමට අපි සූදානම් වෙමු.

## උපාලි ගෘහපති

### කණවැල අතහල විචාරකයෙක්

'නිගණ්ඨනාථපුත්තයන් වහන්ස, මම බුදුරදුන් හමුවට යමි. දිග ලොම් ඇති එළුවකු, ලොම්වලින් ඔබ්මොබ ඇද වෙහෙසට පත්කරන්නාක් මෙන් මම බුදුරදුන් සමඟ වාද කොට උන්වහන්සේ වෙහෙසට පත් කරන්නෙමි.'

මේ, නිගණ්ඨනාථපුත්තගේ ගිහි සව්වෙකු වූ නාලන්දා නුවර විසූ ඉතා ධනවත් උපාලි ගෘහපතියා නිගණ්ඨනාථපුත්ත අභියස වහසිබස් දෙඩූ අයුරුය.

එතෙක් තම දිවියෙහි කිසිදිනක බුදුරදුන් නොහමුවූ උපාලි, තථාගතයන් වහන්සේගේ ප්‍රඥා මහිමය නොදැන සිටියේය. තම ප්‍රඥා මහිමයෙන් බුදුරදුන් ඉක්මවා යාමට හැකියයි සිතූ උපාලි උන්වහන්සේ හමුවට ගියේ මහත් අභිමානයෙන් යුතුවය. ගොස් වැඳ එකත්පසෙක වාඩිවිය. බුදුරදුන් සමඟ වාදය ඔහු විසින් ම ආරම්භ කෙරිණි. එය කර්මය පිළිබඳ වාදයක් විය. වාග් දණ්ඩ, මනෝ දණ්ඩ දෙකට වඩා කාය දණ්ඩය බලවත් බව උපාලිගේ තර්කය විය. බුදුරජාණන් වහන්සේ දණ්ඩ යන වදනට කර්ම යන වචනය භාවිත කරති. එහෙයින් කාය කර්ම, වාක් කර්මවලට වඩා මනෝ කර්මය බලවත් බව සනාථ කිරීමට උන්වහන්සේ පළමු ප්‍රති තර්කය ඉදිරිපත් කළහ. උපාලිගේ වැසී තිබූ ප්‍රඥාව විවෘත විය. එහෙත් බුදුරජාණන් වහන්සේ තම ප්‍රඥාවෙන් කරුණු සහිතව තම තර්කය තවදුරටත් බිඳ හෙළන අයුරු ඇසීමෙහි රුචි වූ උපාලි තම මතය ඉදිරියටත් එසේම ප්‍රකාශ කළේය.

සත්‍යය දුටුකල එය පිළිගැනීම බුද්ධිමතුන්ගේ ලක්ෂණයකි. වැරදි බව දැක දැකත් තම වැරදි මතයෙහි ම ගැලී සිටින්නෝ අඥානයෝ ය. එහෙයින් උපාලි විසින් මනෝ කර්මයෙහි ප්‍රධානත්වය පිළිගැනුනි. බුදුරජාණන් වහන්සේ ඔහුට ධර්මය දේශනා කළහ. දහම් ඇසූ උපාලි සෝවාන් විය. උන්වහන්සේට ප්‍රශංසා කොට තෙරුවන් සරණ ගොස් තම උපාසක බව ද ප්‍රකාශ කළේය.

පළමු හමුවෙහි, පළමු දහම් ඇසුමෙහි අනුසස් ලෙස නිවන්මග පළමු පියවරට සැපත් උපාලි තම උපාසක බව පළකළ කෙණෙහි සිතීමේ නිදහස පැහැදිලිවන අයුරින් බුදුරජාණන් වහන්සේ 'ඔබ වැනි ප්‍රසිද්ධ අය විසින් තීරණ ගැනීමෙහි දී තවදුරටත් සිතා බැලිය යුතුය' යි වදාළහ. එම වචනයට ඔහු වඩාත් පැහැදුණි. මෙතෙක් නිගණ්ඨයන් වෙනුවෙන් පවත්වාගෙන ආ දන්වැට එලෙස ම පවත්වාගෙන යන්නැයි පළ කළ බුද්ධ වචනය ඇසූ උපාලි තමාගේ පැහැදීම තවත් වැඩිවූ බව ප්‍රකාශ කළේ දක්නා ගුණයෙහි පැහැදීම ප්‍රඥාවන්තයින්ගේ ම ලක්ෂණයක් හෙයිනි.

පසු දිනෙක නිගණ්ඨනාථපුත්ත පිරිස් සහිතව උපාලි හමුවීමට ඔහුගේ නිවසට පැමිණියේය. නාථපුත්තයන් ඉදිරිපිටදී පෙර දිනක බුදුරදුන් වාදයෙන් වෙහෙසට පත් කරමි'යි වහසිබස් දෙඩූ උපාලිම එදින ඔහු ඉදිරියේ එක් ගීයක ගුණ දහය බැගින් යුත් තිටිවන බුදුගුණ ගී දහයක් ගැයීමෙන් ම ඔහුගේ බුද්ධි මහිමය ප්‍රකට වෙයි.

ගුරුළුගෝමී මහෝපාසකතුමා සිය අමාවතුර ග්‍රන්ථයෙහි 'ගෘහපති දමන' නම් පරිච්ඡේදයෙහි මේ ගැන සඳහන් කර ඇත්තේ මෙසේය.

'එසඳ උපාලි ගහපති හුනස්නෙන් නැගී උතුරුසළු එකස් කොටලා බුදුන් වසන දසට ඇඳිලි බැඳ' මම යමක්හුගේ සව්යෙමි ද ඔහුගේ ගුණ අසවයි. බුදුන්ගේ ගුණ වනතුයේ තමා සැබෙවින් කී දැයක් අනෙකාකාරයෙන් දන්නා උද්ඝටිතඥ පුඟුල්වන බැවින් සොවන් මඟින් ම ආ පිළිසිඹියා විසයෙහි සිටවන බැවිනුද්

| | | |
|---|---|---|
| ධීරස්ස | - | විගතමොහස්ස |
| පභින්නඛිලස්ස | - | විජිත විජයස්ස |
| අනීඝස්ස | - | සුසම චිත්තස්ස |

| | | |
|---|---|---|
| වුද්ධ සීලස්ස | - | සාධු පඤ්ඤස්ස |
| වෙස්සන්තරස්ස | - | විමලස්ස |
| භගවතො තස්ස සාවකෝ | - | භමස්මි. |

යනාදී විසින් දස ගාථායෙකින් සියක් පදයෙන් බුදුන්ගේ ගුණවන 'මම මෙබඳු ගුණ ඇති බුදුන්ගේ සව්යෙමි' කීය. එකල නිගණ්ඨනාථපුත්‍ර 'තා මහණ ගොයුම්හු කරා දැන් ගොස් අව. එවිගස මෙගුණ කිසෙ කියන්නට නිසිවිහි කීයැ. එසඳ සිටි' යම්සෙ නානා පුෂ්පයන්ගෙ මහත් මල් රැසක් දක්ෂ වූ මල්ලරෙක් තමා දක්ෂවන බැවිනුදු මල්හි නොයෙක් පැහැ ඇතිවන බැවිනුදු විසිතුරු කොට ගොතා ද එසෙයින් ම බුදුන්ගේ නන් නන් ගුණ කුසුම් ගොතන්නට මා වැනි දක්ෂ පුරුෂයෙක් නොනිසි වෙදැ යි කීය'.

| | | |
|---|---|---|
| සැබෙවින් | - | සැකෙවින් කෙටියෙන් |
| උද්ඝටිතඥ | - | කී දෙය වහා අවබෝධ වන |
| පුහුල් | - | පුද්ගල |
| පිළිසිඹියා | - | ඥානයේ ප්‍රභේද |
| සිටි | - | සිටුවරයා (උපාලි) |
| මල්ලරෙක් | - | මල්කරුවෙක් |

## චිත්ත ගහපති

## මිතුරු බවට ආගම බාධාවක් කර නොගත් කලණ මිතුරෙක්

අචේල කස්සප ජෛන ආගමේ පැවිදි වීමට පෙර චිත්ත ගහපතිතුමාගේ යහළුවෙක් විය. ඔහු දිනක් මච්ඡිකාසණ්ඩයට පැමිණෙයි. චිත්ත ගහපති එතුමා හමුවීමට ගොස් සතුටු සාමීචි කතා කොට පසෙක වාඩි වෙයි. ඉන්පසු දෙදෙනා අතර ඇති වූ දෙබස මෙසේය.

චිත්ත - ඔබ පැවිදි වී කොපමණ කල් ද ස්වාමිනී ?

කස්සප - ගැහැවිය, අවුරුදු තිහක් පමණ වෙනවා.

චිත්ත - ස්වාමිනි, පැවිදි වී තිස් අවුරුද්දක් ගත වන ඔබට දසකුසල් නැමැති මනුෂ්‍ය ධර්මය ඉක්මවා ගිය කිසියම් උත්තරීතර මනුෂ්‍ය ධර්මයක් තිබෙනවා ද ?

කස්සප - නග්න බවත්, හිස මුඩු බවත්, වාඩිවන තැන වැලි පිස දමන මොනර පිල් කලඹක් හැර මා සතු කිසි උතුරු මිනිස් දමක් නැහැ ගැහැවිය.

චිත්ත - අහෝ, තිස් වසරක් පැවිදි වී සිටත් කිසියම් උත්තරීතර මනුෂ්‍ය ධර්මයක් ලබන්නට නොහැකි වී ඇත්තේ නිගණ්ඨ ධර්මය මනා ව නොදෙසන (දුරක්ඛාත) ලද්දක් වන බැවිනි. එහෙත් බුදුදහම මනාව දෙසන ලද (ස්වාක්ඛාත) දහමකි. පුදුමයි ස්වාමිනී, පුදුමයි.

කස්සප - ඔබ බෞද්ධ උපාසකයකු වී කොපමණ කල් ද ගැහැවිය ?

චිත්ත - අවුරුදු තිහක් පමණ වෙනවා ස්වාමිනී.

කස්සප - උපාසකයකු වී ගෙවී ගිය ඒ දිගු කාලය තුළ ගැහැවිය, ඔබ කිසියම් උතුරු මිනිස් දමක් ලබා තිබෙනවා ද ?

චිත්ත - ස්වාමිනී, ඇයි නැත්තේ, මට කැමති තාක් ප්‍රථම ධ්‍යානයට සමවැද සිටිය හැකියි. එසේම ද්විතීය ධ්‍යානයට ද, තෘතිය ධ්‍යානයට ද, චතුර්ථධ්‍යානයට ද සමවැද සිටිය හැකියි.

ස්වාමිනී, බුදුරජාණන් වහන්සේ පිරිනිවීමට කලින් මා මියගිය හොත් චිත්ත ගහපති අනාගාමී වී සිටි අයෙකු බවට උන්වහන්සේ මා ගැන පවසනු ඇත.

කස්සප - පුදුමයි, චිත්ත පුදුමයි, බුදුදහම යනු ගිහියන්ට පවා උතුරු මිනිස්දම් ලැබිය හැකි මනා ව දෙසන ලද දහමක් බව ඇත්තකි. ගැහැවිය, මා ද බුදුසසුනෙහි පැවිදි ව උපසම්පදා වීමට කැමැතියි.

කල්‍යාණ මිත්‍රයෙකු වශයෙන් තමාගෙන් තම පැරණි මිතුරාට ඉටු විය යුතු යුතුකම ඉටු කිරීමට චිත්ත ගහපතිතුමා එකඟ විය. එහෙයින් තම යහළුවාට නිවැරදි මඟ, කුසල මඟ අනුගමනය කිරීමට පැවිදි උපසම්පදාව ලබා දෙනු පිණිස අචෙලකස්සප සමඟ භික්ෂූන් වහන්සේ වෙත එළඹෙයි.

චිත්ත - ස්වාමීනී, මේ අචේල කස්සප ගිහි කල මගේ යහළුවෙකි. ඔබ වහන්සේලා මොහු පැවිදි උපසම්පදා කරනු මැනවි. ඔහු පැවිදි වූ කල ඔහුට සිවුපසයෙන් උපස්ථාන කිරීම මට භාරය.

භික්ෂූන් වහන්සේ වෙතින් පැවිදි උපසම්පදාව ලබා ගත් අචේලකස්සප නොබෝ කලකින් ම රහතන් වහන්සේ නමක් බවට පත් විය.

චිත්ත ගහපතිතුමා මච්ඡිකා සණ්ඩයෙහි ජීවත් වූ කෙනෙකි. මච්ඡිකා සණ්ඩයෙහි අම්බාටක වනයට වැඩම කළ බොහෝ භික්ෂූන් වහන්සේගෙන් හෙතෙම ධර්මය ඇසීය. ධර්ම ඥානය කොතෙක් තිබුණ ද තමා දහම් නොඇසිය යුත්තෙකු කොට හෙතෙම නොසිතීය. ධර්මඥානය අඩු භික්ෂූන් වහන්සේට පවා හේ ධර්මය දෙසීය. ගිහියෙකුගෙන් ධර්මය ඇසීමට භික්ෂූහු ද පසුබට නොවූහ. නිරතුරුව ම පාහේ මහ සඟනට දන්දීම ද චිත්ත ගහපතිතුමාගේ ලක්ෂණයක් විය. තම පෙදෙසෙහි වැඩ සිටින ලෙස බොහෝ විට භික්ෂූන් වහන්සේලාට ඇරයුම් කිරීමට ද මොහු දැක්වූයේ බලවත් රුචියකි. එසේ ආරාධනා කොට නිහඬවීම ඔහුට නුපුරුදුය. සිවුපසයෙන් උන්වහන්සේලාට සලකන බව පැවසීමට ද හෙතෙම අමතක නොකළේය.

පියුමතුරා බුදුරදුන් සමයෙහි සිට බලාපොරොත්තු සහිත ව පින් දහම් කළ චිත්ත ගහපතිතුමා මච්ඡිකා සණ්ඩ නුවරෙහි සිටු තනතුරක් ද ඉසිලීය. එකල පංච වග්ගිය භික්ෂූන්ට අයත් මහානාම රහතන් වහන්සේ මච්ඡිකා සණ්ඩයට වැඩම කළ දිනක උන්වහන්සේ කෙරෙහි පැහැදී අම්බාටකාරාම නම් වූ උයනට වැඩම කරවා වැඩ විසීමට අවශ්‍ය තැන් ඉදි කරවා එහි වැඩ සිටින ලෙස ද ඇරයුම් කළේය. උන්වහන්සේගෙන් දහම් ඇසූ චිත්ත ගහපති වැඩි කල් නොගොස් රූපාවචර ධ්‍යාන සතර ද ලැබීය. සක්කාය දිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බත පරාමාස - කාමරාග - පටිඝ යන ඔරංභාගිය සංයෝජන පස ද දුරු කරමින් අනාගාමී ඵලයට පත්වීමට තරම් ඔහුගේ ප්‍රඥාව මුහුකුරා ගොස් තිබුණි. පසුව හෙතෙම සහ පිරිවරින් බුදුරජාණන් වහන්සේ දැකීමට ගියේය.

බුදුරජාණන් වහන්සේ ධර්ම කථික උපාසකයන් අතර අග්‍රතනතුර චිත්ත ගහපතිතුමාට ප්‍රදානයක කළහ. පසු කලෙක අසනීපයෙන් මරණාසන්න

වූ ඔහු වෙතට පැමිණි දෙවිවරුන් මතු දිනෙක සක්විති රජවන්නට සිත් ඇති කර ගන්නැයි කළ ඉල්ලීම ද සක්විති රජකමෙහි අනිත්‍ය බව ප්‍රකාශ කරමින් ප්‍රතික්ෂේප කළේය. සිය නෑදෑ හිතමිතුරන්ට දැහැමින් දිවි ගෙවන්නට උපදෙස් දුන් චිත්ත ගහපති මියගොස් උත්පත්ති වශයෙන් නැවත කාම ලෝකයට නොඑන ලෙස ශුද්ධාවාස බඹලොවක උපත ලැබීය.

මතු දිනෙක එම බඹලොවදීම හෙතෙමේ රහතන් වහන්සේ නමක් ව පිරිනිවන් පානු ඇත.

කලණ මිතුරකු වශයෙන් කටයුතු කිරීම, දහම් ඇසීම, දහම් දෙසීම, දන් දීම, සෙනසුන් ඉදිකරවීම ආදී යහපත් ක්‍රියාවන්හි නිරත වූ චිත්ත ගහපතිතුමා උත්තරී මනුෂ්‍ය ධර්මවලට අයත් රූපාවචර ධ්‍යාන ද අනාගාමී ඵලය ද ලබා ගැනීමෙන් ශ්‍රේෂ්ඨ ආදර්ශවත් මහෝපාසකවරයෙක් බවට පත් විය.

## තම නුගුණ හෙළි කළ අතුල උපාසක

සිල්වතුන් දැකීමේ රුචියත් දහම් ඇසීමේ රුචියත් සැදැහැ ඇත්තෙකුගේ ලක්ෂණ දෙකකි. අතුල සැදැහැති උවසුවෙකි. මහ පිරිස් ඇති තැනැත්තා මහේශාක්‍යය. පන්සියයක් පමණ උපාසක පිරිසක් ඇතිව සිටි හෙයින් අතුල මහේශාක්‍යය. හෙතෙම ජීවත් වූයේ බුදුරජාණන් වහන්සේ වරින් වර වැඩ සිටි සැවැත්නුවරය.

දිනක් අතුල සිය පිරිස සමඟ දහම් ඇසීමට රේවත තෙරුන් වහන්සේ වෙත ගොස් උන්වහන්සේට වැඳ පසෙක වාඩි විය. විවේකයෙහි සිත් අලවා වැඩ සිටි හෙයින් උන්වහන්සේ අතුල ප්‍රධාන පිරිසට කිසිවක් නො දෙසූහ. අතුල, සාමාන්‍යයෙන් කිපෙන සුළු චරිතයක් ඇති කෙනෙකි. එහෙයින් කිසිවක් නොදෙසූ රේවත තෙරුන් වහන්සේ කෙරෙහි කිපුණු අතුල දහම් ඇසීම පිණිස සැරියුත් මහ රහතන් වහන්සේ වෙත පිරිස් සහිත ව ගියේය.

සැරියුත් තෙරණුවෝ - අතුල, ඔබ පිරිස් සහිතව මෙහි පැමිණියේ ඇයි ?

අතුල - ස්වාමිනී, දහම් ඇසීමට රේවත තෙරුන් වහන්සේ වෙත ගිය අපට උන්වහන්සේ කිසිවක් දේශනා කළේ නැහැ. එනිසා කිපුණු මා පිරිස් සමඟ මෙහි පැමිණියේ දහම් ඇසීමටය.

සැරියුත් තෙරණුවෝ - එසේ නම් උපාසකවරුනි හිඳ ගන්න.

හිඳ ගත් ඔවුන්ට උන්වහන්සේ දීර්ඝ ලෙස අභිධර්ම දේශනාවක් කළහ. දීර්ඝ ධර්ම දේශනාවක් කිරීම ගැන කිපුණු අතුල එතැනින් ඉවත් ව බුද්ධෝපස්ථායක ආනන්ද තෙරුන් වහන්සේ වෙත සිය පිරිසත් සමඟ ගියේය.

ආනන්ද තෙරණුවෝ - උපාසකවරුනි, ඔබ පැමිණියේ කුමක් සඳහා ද ?

අතුල - ස්වාමිනී, අපි මුලින් ම රේවත තෙරුන් වහන්සේ වෙත දහම් ඇසීමට ගියෙමු. කිසිවක් නොදෙසූ උන්වහන්සේ කෙරෙහි කිපී සැරියුත් මහරහතන් වහන්සේ වෙත ගියෙමු. උන්වහන්සේ අපට දේශනා කළේ අභිධර්මය ය. එයින් අපට ඇති ප්‍රයෝජනය කුමක් ද ? කිපුණු මා පිරිසත් සමඟ මෙහි පැමිණියේ දහම් ඇසීමේ බලාපොරොත්තුව ඇතිවයි ස්වාමිනී.

ආනන්ද තෙරණුවෝ - එසේ නම් අතුල හිඳ ගන්න. දහම් අසන්න.

සියල්ලෝ ම උන්වහන්සේට වැඳ හිඳ ගත්හ. උන්වහන්සේ ඉතා කෙටියෙන් දහම් දෙසූහ. අතුල කෙටියෙන් දහම් දෙසූ ආනන්ද තෙරුන් වහන්සේ කෙරෙහි ද කිපුණි.

අවසන් වරට සියල්ලෝ ම භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. උන්වහන්සේ පැමිණීමට හේතු විමසූහ. අතුල උපාසක සිදු වූ සියල්ල උන්වහන්සේට පැවසීය.

ඔහුට දහම් දෙසමින් බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

අතුල, නිහඬව සිටින්නාටත් බොහෝ කොට කථා කරන්නාටත් සුළුවෙන් කථා කරන්නාටත් නින්දා කිරීම, ගැරහීම, බොහෝ කල් සිට පැවත

එන්නකි. ඒකාන්තයෙන් ගැරහිය යුත්තෙකු හෝ ඒකාන්තයෙන් පැසසිය යුත්තෙකු හෝ නැත. බුදුරජාණන් වහන්සේටත් ඇතැම්හු ගරහති. මෝඩ මිනිසුන් කරන නින්දා ප්‍රශංසා අප්‍රමාණය. ඒවායෙහි වටිනාකමක් ද නැත. නියම නින්දාව නම් නැණවතුන් විසින් කරනු ලබන නින්දාවය. ප්‍රශංසාවත් එසේමය.

මෙම දහම් ඇසූ අතුල, පිරිස් සහිතව සෝවාන් විය. ඒ නිසා සක්කාය දිට්ඨි ආදි සංයෝජන තුනක් ඔවුන්ගේ සිතින් සහමුලින්ම දුරු වී ගියේය. අපායගාමී අකුසල් නොකරන තත්වයට පත් විය. ඔවුහු මතු කිසිකලෙක නරක - තිරිසන් - ප්‍රේත - අසුර යන සතර අපායෙහි නූපදිති. පංච ආනන්තර්ය කර්ම ද නොකරති. බුදුසරණ හැර අන් සරණක් නොපතති. සිතින්, කයින් හෝ වදනින් සිදුවන කුඩා වරදක් වුවත් නොසඟවති.

කිපීම දුර්ගුණයක් වුව ද තමා තුළ ඇති එය හෙළි නොකිරීමට අතුල උපාසක කිසිවිටෙකත් උත්සාහ ගෙන නැත. සිදුවන වරද ස්ථිර වශයෙන් ම නොසඟවන තත්ත්වය සෝවාන් වූ විට ලැබෙතත් සෝවාන් වීමට කලින් සිටම තමා තුළ ඇති කිපෙන සුළු ගතිය නොසැඟවීම අතුල උපාසකතුමාගේ චරිතයේ පැවති විශිෂ්ට ගුණාංගයන් අතර එකක් විය.

අභ්‍යාස :

1. උපාසක චරිත තුළින් ගතහැකි ආදර්ශ හැකිතාක් ගොනුකරන්න.
2. සිසුවෙකු හා මිතුරකු වශයෙන් ගුරුවරුන් හා මිතුරන් කෙරෙහි පිළිපැදිය යුතු අයුරු මෙම උපාසක චරිතවලින් මතුකර දක්වන්න.

# 15 පාඩම

# බුද්ධකාලීන උපාසිකාවෝ

උපාසකවරුන්ට මෙන්ම උපාසිකාවන්ට ද බුදුසසුනෙහි වැදගත් තැනක් හිමි වී ඇත. උසස් චිත්ත ශක්තියක් ලැබීමට කාන්තාවක වීම බාධාවක් නොවූ අයුරු මෙහි සඳහන් උපාසිකා චරිතවලින් ඔබට තේරුම්ගත හැකිය.

## නකුල මාතාව

### සිතින් පවා පතිවත රැකි උත්තමාව

ස්වාමිනී, භාග්‍යවතුන් වහන්ස මේ නකුල මාතාව මගේ බිරිඳය. නව යොවුන් වියෙහි සිටි මම ඇය ආවාහ කර ගතිමි. ඈ කයින් තබා සිතිනුදු පතිවත නොඉක්මවන්නීය. එහෙයින් ස්වාමිනී අප දෙදෙන මෙලොව දී මෙන් ම පරලොවදී ද එක්ව ජීවත් වීමට කැමති වෙමු.

දඹදිව භගුරට නකුල පිතු නම් ගැහැවි තෙමේ බුදුරදුන් සිය නිවසට වැඩම කළ අවස්ථාවක උන්වහන්සේ අබියස කළ ප්‍රකාශයකි මෙය. මෙලොවදී පවා අඹුසැමියන් ලෙස ජීවත්වීමට අවස්ථාව නොලබන ඇතැම්හු "අපි පරලොවදී එක්වෙමු" යි සිය දිවි හානි කර ගනිති. එහෙත් දහමට අනුව එම අදහස ඉටුවීමක් ගැන බලාපොරොත්තු තැබිය නොහැකිය. ශ්‍රද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥා යන ගුණධර්ම සම තත්ත්වයෙන් ආරක්ෂා කරන අඹුසැමියන්ට මෙලොවදී මෙන් ම පරලොවදීත් බලාපොරොත්තු අනුව සුහද සිතින් එක්වීමට හැකි බව එහිදී බුදුරජාණන් වහන්සේ වදාළහ.

දිනක නකුල පිතුවරයා දැඩි ලෙස රෝගී විය. හැකි හැම අයුරකින් ම බෙහෙතින් පිළියම් කොට තම සැමියා සුවපත් කරගැනීමට නකුල මාතාව උත්සුක වූවාය. එහෙත් එම උත්සාහය අසාර්ථක විය. තම චරිතයෙහි ඇති උසස් ගුණ සිහි කරමින් එම ගුණ බලයෙන් සිය සැමියාට සුවය ලබාදීම කෙරෙහි ඇගේ සිත යොමු විය. ඒ අනුව සත්‍යක්‍රියා කිරීම සඳහා ඕ තොමෝ සිය රෝගී සැමියා අසලට වූවාය.

හිමියනි, ඔබගේ මරණයෙන් පසු මට දූ දරුවන් පෝෂණය කර ගැනීම අපහසු දෙයකැයි කියා හෝ මා වෙනත් සැමියකු වෙත යන බවක් හෝ සිතන්න එපා. එසේ ම බුදුපාමොක් මහසඟරුවන හමුවීමට නොයන, සිල්නොපුරන කෙනෙකු බවට මා පත්වේවි කියා සිතන්නත් එපා. මා චිත්ත සමාධියක් නොලබන්නියකැයි යනුවෙන් හෝ බුදුසසුනෙන් පිහිටක් නොලබන්නියකැයි යනුවෙන් හෝ සිතන්න එපා.

මෙසේ බලාපොරොත්තු සහිතව ආසාවෙන් යුතුව මරණයට පත්වීම දුක්සහිත බව සඳහන් කරමින් ඕ තොමෝ සිය සැමියාට කරුණු පැහැදිලි කළාය.

රෝගී සැමියකු අසලට වී කවරෙකු හෝ මරණය ගැන සිහිකරනවාට පවා බියවන යහපත් භාර්යාවන් අතර තමා ම ඉදිරිපත් ව අපේක්ෂා සහිත මරණය දුක්සහිත බව පැවසීමට තරම් මේ මාතාව දිරිමත් වූයේ තම චරිතයේ ඇති පිවිතුරු බව හා දහම් අවබෝධයෙන් සෝවාන් ව සිටීම නිසාය. ඇගේ අවවාදාත්මක සත්‍යක්‍රියාව අවසානයේ සැමියා නිරෝගී විය.

මගේ හිතවත් බොදු ජනතාවෙනි, ඔබ ද මා මෙන් විවාහ දිවියෙහි රස විඳින්න. එහෙත් එය පන්සිල් සුරැකෙන පරිද්දෙන් ම වියයුතු බව අමතක නොකරන්න. නියම බිරිඳක ලෙස සැමියාට සලකන්න. දරුවන් ද සුරැකිව බලා ගන්න. සැමට ඇදහිය හැකි වචන පාවිච්චි කරන්න. නිවසේ කටයුතු බහුල බව කුශලයට බාධාවක් කර නොගන්න. දැහැමි දිවියක් ගත කරන්න. තෙරුවන් ඇසුරු කරන්න. එවිට සියලු දෙනා ද මා මෙන් සතුටු වනු ඇත.

නකුල මාතාව ඇගේ චරිතයෙන් ඔබට දෙන අවවාදය මෙවැන්නක් විය නොහැකි ද ?

ඇදහිය හැකි විශ්වාස කතා ඇති මහෝපාසිකාවක වූ නකුල මාතාව බුදුරදුන් විසින් විශ්වාසවන්ත කතා ඇති උපාසිකාවන් අතර අග තනතුරෙහි පිහිටවනු ලැබූවාය. එය පියුමතුරා බුදුරදුන් කල ඇය කළ පැතුම් ඉටුවීමකි.

සුජාතාව

## සිවු බඹ ගුණ පිරි කුලඟනක්

ඉදින් සම ජාතික සැමියකු සමග විවාහ වීමෙන් පසු ලැබෙන පළමු දරුවා පුතෙකු වන්නේ නම් මම වාර්ෂිකව පුද පූජා පවත්වන්නෙමි යි නුග රුකක් මුලදී එක් කුලඟනක් ප්‍රාර්ථනා කළාය. පැතූ පැතුම් අනුව ලැබූ පළමු දරුවා පුතෙකු වූ හෙයින් ඕ තොමෝ පොරොන්දුව ඉටු කරමින් වාර්ෂිකව එම නුගරුක මුලට පැමිණ පූජා පැවැත්වූවාය. අපේක්ෂාවන් මුදුන්පත් වූ කල මුලින් වූ පොරොන්දු අමතක කරන අය අනුකරණය කොට පොරොන්දු කඩ කරන්නියක නොවීම ඇගේ සුවිශේෂ චරිත ලක්ෂණයක් විය. ඒ අන්කවරෙකුවත් නොව උරුවෙල් දනව්වෙහි සේනානි නම් නියම් ගමෙහි උපත ලද බරණැස් සිටුවරයාගේ බිරිඳ වූ සුජාතා නම් සිටු දියණියයි.

සිදුහත් බෝසතාණන් වහන්සේ බුදු බව පතා සාවුරුද්දක් ගත කළ දුක්බර දිවිය නිමකොට මැද පිළිවෙතට පිවිස එළඹි වෙසක් පුණු පෝ දින අළුයම එම අජපල් නුග රුක මූලට වැඩම කොට රුක් සෙවනෙහි වැඩ හුන්හ. සුජාතා සිටු දියණිය සිරිත් පරිදි වාර්ෂික පූජාව පවත්වන්නට එහි පැමිණියාය. පෙර කිසිදිනක නොදුටු රුක්දෙවියා රුක් මුල වැඩ සිටින්නේය යි සිතූ ඕ තොමෝ ක්ෂීරපායාසය රන්තලිය සමඟ පූජා කොට මගේ අදහස් ඉටු වූවක් මෙන් ඔබවහන්සේගේ අදහස් ද ඉටු වේවා යි සුබ පතන්නට අමතක නොකළාය. තම අදහස් ඉටුවීමෙන් උද්දාමයට පත්ව උපකාර කළවුන් අමතක නොකොට සුබ පැතීමේ ගුණය සුජාතාවගේ චරිතය වඩාත් ඔප්නංවන්නට සමත් විය.

සෘතු තුනට ගැලපෙන සේ ඉදි කළ මාළිගා තුනෙන් බිමට නොබසින, විවාහ දිවියට පත්ව පස්කම් සුව විඳින යස නම් වූ සිය පුතු උදෑසන දැක සුවදුක් විමසා බැලීම සුජාතාවගේ දිනපතා පුරුද්දක් විය. පහයෙන් බිමට නොබසින දරුවා ගැන වුව ද ඇය තුළ පැවතියේ අසීමිත දාරක ප්‍රේමයකි. සිරිත් පරිදි සුජාතාවෝ පුතු බැලීමට පහයට ගිය දිනක පුතු එහි නැති බව දැන ඒ බව සිය සැමියා වූ බරණැස් සිටුවරයාට දැන්වීමට පමා නොවූහ. යස කුල පුතු කම් සැපයෙහි කලකිරී ගිහි ගෙයින් නික්මුණු බව මාළිගාවෙහි

කිසිවෙක් නොදැන සිටියහ. කළයුත්ත පසෙක තබා ලේලිය සමඟ ගැටුම් ඇතිකර ගැනීමට තරම් සුජාතාව දරුණු වූයේ ද නැත. දරු සෙනෙහස හදවත පුරා නැගෙත් නැගෙත් ම හැඬූ කඳුලින් ම ඇගේ කාලය ගෙවී යන්නට විය.

මේ වනවිට බුදුරදුන් ලොව පහළ වූවා පමණි. සදහම් නදිය ගලන්නට පටන් ගත්තා පමණි. එහෙයින් සදහම් දියෙන් සුජාතාවට තම සිතෙහි වූ කෙලෙස් කුණු කසල සෝදා හරින්නට නොහැකි විය. එබඳු වූ ඇයට, සිවුබඹ ගුණයෙන් හද පිරී මවක් වූ ඇයට දරුවා නොදුටු සොවින් වැළපෙනු මිස කළහැකි අන් යමක් වී ද ?

යසකුල පුත් තෙමේ ගිහිගෙයින් නික්ම ගිය දිනයෙහි ම බුදුරදුන් හමු වී සදහම් අසා පළමුව සෝවාන් විය. එදින ම පෙරවරුවෙහි පුතු සොයා බරණැස ඉසිපතන මිගදායට පැමිණි බරණැස් සිටුවරයාට දෙසූ දහම් අසා යසකුල පුත් තෙමේ රහත් විය. එදිනම දහවල් දනට පැවිද්දෙකු ලෙස තම පුතු ද සමඟ නිවසට වඩින ලෙස සිටුතුමා බුදුරදුන්ට ඇරයුම් කළේය. පියා අරමින් බැහැර වූ පසු එතෙක් ගිහි ව සිටි යස රහතන් වහන්සේ බුදුරදුන්ගෙන් 'ඒහි භික්ඛු' පැවිදි උපසම්පදාව ලැබූහ.

දහවල් යස තෙරුන් වහන්සේ සමඟ සිටු මාළිගයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ දන් වළඳා සුජාතාවට හා ඇගේ ලේලියට සදහම් දෙසූහ. සෝවාන් වූ දෙදෙනාම එක්ව තෙරුවන් සරණ ගිය පළමු උපාසිකාවෝ දෙදෙන වූහ.

සුජාතාව හා ලේලිය තෙරුවන් සරණ ගිය පළමු උවැසියන් දෙදෙනා වුව ද තෙරුවන් සරණ ගිය පළමු උවැසිය ලෙස අග තනතුරු ලැබීමේ භාග්‍යය උදාවූයේ සුජාතා සිටුදියණියට ය. ඒ අන් කිසිවක් නිසා නොව පියුමතුරා (පදුමුත්තර) බුදුරදුන් කල කරන ලද පැතුම නිසා ය.

## බන්ධුල මල්ලිකාව

## සසල ලොව නිසල වූ කතක්.

ඒ කෝසල රජ්ජුරුවන්ගේ බන්ධුලසේනාධිපතිය යි යන සෙනෙවිරත් කෙණෙක් ඇත්තාහ. උන්ගේ බන්ධුලමල්ලිකා දේවිය යි යන බිරින්දක්

ඇත්තාහ. උන් වඳ හෙයින් බන්ධුලසේනාධිපති තෙම වඳ තැනැත්තන් මාගේ ගෙයි ඉඳිනට කාරණා කිම් ද ? තොප තොපගේ දෙමව්පියන්ගේ ගමට යවයි කීහ. බන්ධුල මල්ලිකාවෝත් යහපතැයි කියා දෙමව්පියන්ගේ ගමට යන්නාහු සර්වඥයන් වහන්සේ දැක වැඳපුදා අවසර ඉල්ලා ගෙණ යෙමියි ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේ වැඳ එකත්පස්ව සිටියාය.

සර්වඥයන් වහන්සේ ඇයි මල්ලිකා දේවිනි කොයි යව්දැයි විචාළ සේක. මල්ලිකා දේවි කියන්නාහු ස්වාමිනී බන්ධුලසේනාධිපති මිඩියට දරුවන් නැතැයි කියා මිඩියගේ දෙමව්පියන්ගේ ගමට යන්ට කිවුය. මිඩිය ගමට යන තැනැත්ති ස්වාමීන් දැක වැඳපුදා අවසර ඉල්වාගෙන යන පිණිස ආමි කීය. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මල්ලිකා දේවීනි, දරුවන් නිසා වී නම් ගමට නොගොස් තොපගේ ගෙට ආපස්සේ යවයි වදාළ සේක.

මල්ලිකා දේවීන් යහපතැයි තමන්ගේ ගෙට ගියහ. බන්ධුල සේනාධිපති තොප ආයේ ඇයිදැයි විචාරා සර්වඥයන් වහන්සේ දරුවන් නිසා වී නම් ගමට නොගොස් ගෙට යවයි කී හෙයින් ආමි කීහ. බන්ධුල සේනාධිපති සර්වඥයන් වහන්සේ විසින් කාරණයක් දක්නා ලද්දේයයි කීයේය. බන්ධුල මල්ලිකාවෝ නොබෝ කලකින් දරුගැබ් ලැබ උපන් දොළ ඇතිව මට දොළක් ඇත්තේ යයි දැන්වූවාය.

(භද්දසාල ජාතකය)

මෙසේ සිය සැමියාගේ වචනයට එකවරම කීකරුවීමේ ගුණයෙන් යුතු වූ බන්ධුල මල්ලිකාවෝ තෙරුවන්. කෙරෙහි ද දැඩි ඇල්මක් දැක්වූවාය. දරුවන් ලැබීමේ වාසනාවෙන් යුතු ඈ අවස්ථා සොළසකදී දෙදෙනා බැගින් දරුවන් දෙතිස් දෙදෙනෙකු ලැබූවාය. වැඩිවියට පත් දරුවන් දෙතිස් දෙනාද පියා මෙන් යුද සේවයට එක් වූහ. දිනක් බන්ධුල සේනාධිපති තම දරුවන් සියලු දෙනා ද සමඟ ගමක සොරබිය නැති කිරීමට රජඅණ අනුව පිටත් විය. ඔවුහු එගම සොරබිය දුරු කළහ. ඉන්පසු සිදුවූයේ කොසොල් රජුගේ යෝධයන් අතින් කිසිවකු අපේක්ෂා නොකළ දෙයකි.

බන්ධුල සේනාධිපති එගම මිනිසුන් සෙමෙහි තබා සැවැත්නුවරට නික්මුණාහ. ඒ යෝධයෝත් වලින් එලිබැස බන්ධුලසේනාධිපතිත් දරුවන් දෙතිස්දෙනාත් අල්වා මැරූහයි නියාව කියා මල්ලිකා දේවියට අස්නක්

යැවූහ. මල්ලිකා දේවි ඒ වෙලාවට සැරියුත් - මුගලන් දෙදෙනා වහන්සේ ඇතුළු වූ පන්සියයක් දෙනාවහන්සේ ගෙයි වඩා හිඳුවා දන් දෙන්නාහ. එක් කෙල්ලක් එළඟිතෙල් කලයක් ගෙනයන තැනැත්තී බිඳපුහ. සැරියුත් ස්වාමී, මල්ලිකා දේවිනි, නස්නා සුලු දෙය නස්නේය. තොපි ඊට කනස්සළු නොවවයි වදාළ සේක. ඒ වේලෙහි මල්ලිකා දේවි ස්වාමිනී මාගේ මේ තෙල් කලයට මුසුප්පු වන්නේ ද ? මේ මාගේ ස්වාමි පුත්‍රයාණන් හා දරුවන් දෙතිස් දෙනා ද මරාපු නියාවට ගෙනා පත නොවේදැයි ඉණ තබාගත් පත පෑ විට පවා මුසුප්පු නුවූ මම තෙල් කලයට මුසුප්පු වෙම්දැයි කීහ.

සිය සැමියා හා දරුවන් කෙරෙහි ඇගේ සෙනෙහසෙහි කිසිදු අඩුවක් නොවූවද ඔවුනගේ මරණය නිසා හඬා වැලපීමෙන් තමාට වෙහෙසක් වන බවත් මියගියවුන්ට යහපතක් නොවන බවත් තේරුම් ගැනීමට ඕ තොමෝ සමත් වූයේ බුදුරදුන්ගේ ඇසුර තුළින් ලත් දහම් දැනුම නිසාය. දුක්වේදනා විඳදරා නොසැලෙන මනසකින් යුතුව කෙනෙකුට කටයුතු කළ හැකි බව තේරුම් ගතහැක්කේ විපත්තිවලට මුහුණ දෙන අවස්ථාවලදී යයි. (ආපදාසුථාමෝ වේදිතබ්බෝ) වදාළ බුදුවදන මැනවින් ප්‍රකටවන සිදුවීමකි මෙය. දෙනු ලබන දානයට හෝ ඉන් ලැබෙන පිනට හෝ බාධාවක් නොවන ලෙස ක්‍රියා කිරීම කාන්තාවන්ට පමණක් නොව සියලු දෙනාටම මහඟු ආදර්ශයකි. දන් දීමෙන් පසු අවස්ථාවක මල්ලිකා දේවි තමන්ගේ යෙහෙලියන් දෙතිස් දෙනා කැඳවා කියන්නාහු එම්බා තොප තොපගේ ස්වාමිපුත්‍රයෝ දෙතිස් දෙනාම රජ්ජුරුවෝ නිස්කාරණයේ නසාපු සේක. තෙපි හැම, මැරවූ රජ්ජුරුවන් කෙරෙහිද විස්වකම් කියා බිඳවූවන් කෙරෙහි ද කනස්සල්ලක් නොව ගිය ජාතියෙහි තම තමා කළ අකුසල් විපාක දින. කිසි වරද නොව මෙබන්දක්වූයේ යයි සිතා ඉඳින පමණක් විනා කිසිකෙනෙකුන් කෙරේ කනස්සල්ලෙන් නොව මෛත්‍රි කරවයි අවවාද කීහ.

වෛරයෙන් වෛරය කිසිකළෙක නොසන්සිඳේ. අවෛරයෙන් ම එය සන්සිඳේ යන බුදුවදන දත් බන්ධුල මල්ලිකාවන්ට තම ලේලිවරුන් දෙතිස් දෙනා සමඟ සතුරු සියලු දෙනාට මෙත් වැඩීමට තිබූ හැකියාව පුදුම සහගතය. නමින් පමණක් බෞද්ධ කාන්තාවක් නොවූ බන්ධුල මල්ලිකාවෝ බෞද්ද ගුණාංගවලින් සිය චරිතය ශෝභාවත් කර ගැනීමට තරම් බුද්ධිමත් වූහ.

| | | |
|---|---|---|
| මිඩිය | - | සේවිකාව |
| මුසුප්පු | - | කණගාටුව |
| යෙහෙළිය | - | ලේලිය |

අභ්‍යාස

1. සාර්ථක ගිහි ජීවිතයක් ගත කිරීම සඳහා ඔබ උගත් උපාසිකා චරිතවල සිද්ධි ඉදිරිපත් කරමින් ගතහැකි ආදර්ශ හැකිතාක් පෙන්වා දෙන්න.

2. වර්තමාන කාන්තාවන්ගේ ජීවිතවලට බලපාන යම්යම් ගැටළුවලට විසඳුම් මේ චරිත කථා තුළින් හඳුනාගත හැකිය. ඒ පිළිබඳ විමසීමක් කරන්න.

## 16 පාඩම

# මෑත ඉතිහාසයේ යුගකාරක තෙරවරු

ශ්‍රී ලංකාවේ වර්තමාන බෞද්ධ ප්‍රබෝධයටත්, පැවිදි සමාජයේ උන්නතියටත් විශාල මෙහෙයක් කළ පැවිදි පඬිවරුන් තිදෙනෙකු පිළිබඳව ඔබට මේ පාඩමේදී ඉගෙනීමට ලැබේ. ඒ වැලිවිට සරණංකර සංඝරාජ හිමි, වැලිතර ඤාණවිමල නාහිමි හා අඹගහවත්තේ ඉන්දාසභවරඤාණ සාමි යන තිදෙනා වහන්සේය.

### වැලිවිට සරණංකර සඟරජ මාහිමිපාණෝ

පෘතුගීසි, ලන්දේසි ආදී බටහිර ජාතීන් ලංකාවේ මුහුදු බඩ පළාත් පාලනය කිරීම ආරම්භ වූවායින් පසු ලක්දිව දේශීය අධ්‍යාපනයත් බෞද්ධ කටයුතුත් ක්‍රමයෙන් පිරිහීමට පටන් ගත්තේය. උඩරට රාජධානියත් නායක්කර් වංශික අබෞද්ධ රජවරුන්ගේ පාලනයට යටත්වීම නිසා ඒ පෙදෙස්වල මේ තත්ත්වය ඇතිවිය. දහහත්වන සියවසේ මැදභාගය වන විට පැරණි අධ්‍යාපන මධ්‍යස්ථාන හෝ උගත් ගුරුවරුන් නැත්තට ම නැති තරම් විය. එකද උපසම්පදා භික්ෂුවක් සොයාගත නොහැකි විය. වැලිවිට සරණංකර සඟරජ මාහිමියන් පහළ වූයේ මෙබඳු සමයක දී ය.

ක්‍රි. ව. 1698 ජුනි 18 දින උඩරට තුම්පනේ ප්‍රදේශයේ වැලිවිට නම් ගමේ කුලවත් පවුලක කුලතුංග බණ්ඩාර නම් දරුවෙක් උපන්නේය. උපතින් ම භාග්‍යවන්තයකු වූ මේ පින්වත් කුමාරයා නිති පන්සිල් රැකීමටත් පොහෝදින අටසිල් රැකීමටත් පුරුදු විය. සොළොස් වයසට පත් වූ කුලතුංග බණ්ඩාරයෝ මහනුවර සූරියගොඩ විහාරයේ දී වැලිවිට සරණංකර නමින් පැවිදි වූහ.

ගුරුවරුන් හෝ පොත පත සොයා ගැනීම ඉතාම දුෂ්කර වූ මේ කාලයේ දී සරණංකර සාමණේරයන් වහන්සේට ඉගෙනීම ඉතා ම ගැටළුවක් විය. එහෙත් උන්වහන්සේ ගුරුවරුන් සොයා ඈත පෙදෙස්වලට ගොස් ඉගෙනීමට

උත්සාහවත් වූහ. බාලාවතාරය නැමැති පාලි ව්‍යාකරණ පොතෙන් කොටසක් උන්වහන්සේ ඉගෙනගත්තේ එකල සිරදඬුවමක් විඳිමින් සිටි ලෙව්කේරාල නැමැති ගුරුවරයකු සොයා යැමෙනි. පසුව පල්කුඹුරේ අත්ථදස්සි නම් තවත් සාමණේරයන් වහන්සේ නමක් වෙත ගිය සරණංකර හාමුදුරුවෝ උන්වහන්සේගෙන් බාලාවතාරයේ ඉතිරි කොටස උගත්හ.

ඉගෙනීමට උනන්දුවක් දැක්වූ සරණංකර සාමණේරයන් වහන්සේ ස්වෝත්සාහයෙන් ම සිංහල, පාලි, සංස්කෘත, බුද්ධ ධර්මය හා කාව්‍ය ශාස්ත්‍රය ආදී විෂයයන් මැනවින් ඉගෙන ගත්හ. මේ කාලයේදී උන්වහන්සේ විසින් ඉගෙනීමට කැමැත්තක් දක්වන තවත් පිරිසක් එකතු කොට ගෙන සිල්වත් සමාගම නමින් සංවිධානයක් ද ඇතිකර ගන්නා ලදී. තවදුරටත් ඉගෙනීමට කැමති අයට උදව් කිරීමට කැමති වූ සරණංකර හාමුදුරුවෝ සිංහල හා පාලි පොත් ලියන්ට පටන් ගත්හ. උන්වහන්සේ විසින් ලියන ලද ප්‍රසිද්ධ ධර්ම ග්‍රන්ථයක් නම් සරාර්ථ සංග්‍රහයයි. එය ලියා ඇත්තේ සත්ථා යන බුදුගුණය විස්තර කිරීමටය.

ශික්ෂාකාමී අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමට කැමති වූ වැලිවිට සරණංකර හාමුදුරුවන් පැවිදි වූ දා සිටම යැපුනේ පිඬුසිඟා වැඩීමෙනුයි. එබැවින් පිණ්ඩපාතික සරණංකර යනුවෙන් ද උන්වහන්සේ හැඳින්වුනහ. ගමින් ගමට වඩිමින් දහම් දෙසමින් අසරණයන්ට පිහිට වූ බැවින් අසරණ සරණ සරණංකර යන නමිනුත් උන්වහන්සේ ප්‍රසිද්ධ වූහ.

මේ කාලයේදී ඉන්දියාවේ බමුණු පඬිවරයෙක් මහනුවර රාජසභාවට පැමිණියේය. ඔහු සමඟ කථා කිරීමට රජතුමා විසින් උගතකු වශයෙන් ඉදිරිපත් කළේ සරණංකර හාමුදුරුවන්ය. බ්‍රාහ්මණ පඬිතුමා සරණංකර හාමුදුරුවන්ගේ පාණ්ඩිත්‍යය ගැන ඉතා ම පැහැදුණේය.

පණස් විය ඉක්ම වුවත් සරණංකර හාමුදුරුවෝ තවමත් සාමණේර නමකි. මෙතෙක් උන්වහන්සේට උපසම්පදාව ලබාගත නොහැකි වූයේ උපසම්පදාව ලද භික්ෂූන් වහන්සේ එකල රටේ නොසිටි බැවිනි. සරණංකර හාමුදුරුවෝ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ උදව් ඇතිව උපසම්පදා භික්ෂූන් වහන්සේලා පිරිසක් වැඩමවා ගැනීම සඳහා දූත පිරිසක් අද තායිලන්තය නමින් හැඳින්වෙන සියම් රටට යැවීමට කටයුතු කළහ. සියම් රජතුමා

උපාලි මහ තෙරුන් වහන්සේ ප්‍රමුඛ උපසම්පදාලාභී භික්ෂූන් වහන්සේ විසි නමක් ලක්දිවට එවීය. 1753 දී සියම් රටින් පැමිණි මේ භික්ෂූන් වහන්සේලා වෙතින් සරණංකර හාමුදුරුවන් ඇතුළු හයනමක් උපසම්පදාව ලබා ගැනීමෙන් ලක්දිව නැවතත් උපසම්පදාව ඇති විය. මේ දක්වා පවතින ශ්‍යාමෝපාලි මහා නිකාය නමින් හැඳින්වෙන භික්ෂු පරපුර ශ්‍රී ලංකාවේ ඇති වූයේ මෙපරිද්දෙනි.

උගත්කමින් හා ශික්ෂාකාමිත්වයෙන් අගතැන් පැමිණ සිටි සරණංකර ස්ථවිරයන් වහන්සේට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සඟරජ පදවිය පිරිනැමීමෙන් ගෞරව කරන ලදී.

සංඝරාජ හාමුදුරුවෝ භික්ෂූන් වහන්සේලාට ධර්ම ශාස්ත්‍ර ප්‍රගුණ කරවීමටත් ධර්ම දේශනා කිරීම පුහුණු කරවීමටත් උනන්දුවෙන් කටයුතු කළහ. අනුරාධපුරය, පොළොන්නරුව, දඹුල්ල ආදී පැරණි බෞද්ධ විහාරස්ථාන කරවා පූජා පැවැත්වීමටත් කටයුතු සැලසුනේ උන්වහන්සේගේ උද්යෝගය නිසාය. මහනුවර පැවැත්වූ දේව පෙරහැරට දළදා මාළිගාවේ පෙරහැර එක් කරන ලද්දේත් උන්වහන්සේගේ උපදෙස් පිටය. නූතන බෞද්ධාගමික ප්‍රබෝධයේ පුරෝගාමියා ලෙස සැලකිය හැක්කේ වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සඟරජ මාහිමියන් වහන්සේය. 1778 ඇසළ පුරපසළොස්වක් පොහෝ දිනදී උන්වහන්සේ අපවත් වී වදාළහ.

## වැලිතර ඥාණවිමලතිස්ස මහානායක ස්වාමීන්වහන්සේ

වැලිවිට සංඝරාජ මාහිමියන් වහන්සේගෙන් ඇරඹුණු ශාසනික පුනරාලෝකය වඩාත් උද්දීපනය කැරෙන නවයුගයක් උදාකිරීමට පුරෝගාමී වූ ස්වාමීන්වහන්සේ අතර මුල්තැන් හිමිවන්නේ වැලිතර අඹගහ පිටියේ ඥාණවිමල තිස්ස මහානායක ස්වාමීන් වහන්සේට ය. වර්තමාන ශ්‍රී ලංකාවේ සෑම දිසාවක ම පාහේ පැතිර පවතින අමරපුර නිකාය නම් භික්ෂු සංවිධානයේ ආදී කතෘවරයා උන්වහන්සේය. වැලිතර මහකරාව නම් ගමේ කරෝලිස් ද සිල්වා වෙදආරච්චි මහතාණන්ගේ පුතණුවකු වූ උන්වහන්සේ වැලිවිට සංඝරාජයන් වහන්සේ වෙතින් පැවිද්ද ලබාගත් කෙනෙකි. පැවිදි කිරීම සඳහා මහනුවරට කැඳවාගෙන යන ලද්දේ සඟරජ හිමියන්ගේ ශිෂ්‍යයකු වූ මාතර බෝවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ විසිනි.

පැවිදි වීමෙන් පසු වර්ෂ හතක් පමණ සංඝරාජයන් වහන්සේගෙන් ධර්ම විනය හා පාලි භාෂාව හදාළ ඥාණවිමල ස්වාමින් වහන්සේ ආපසු ගම් ප්‍රදේශයට වැඩම කළහ. අඹගහපිටිය විහාරස්ථානයෙහි වැඩ වෙසෙමින් ශාසනික සේවය කළහ. වර්තමානයෙහි වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරය යනුවෙන් හැඳින්වෙන්නේ ඒ විහාරස්ථානයයි. එකී විහාරයට මඳක් ඈතින් පුෂ්පාරාමය නමින් විහාරයක් කරවා ගෙන එහිද වරින් වර වැඩ විසූහ. ඊට පුෂ්පාරාමය යන නම තබන ලද්දේ මහනුවර මල්වත්තේ පුෂ්පාරාමයට ගරු කිරීම පිණිස බව සඳහන් වෙයි. එයින් පැහැදිලි වන්නේ උන්වහන්සේගේ කෘතවේදී භාවයයි. වර්තමානයේ වැලිතර නායක පන්සල යයි හැඳින්වෙන්නේ එම පුෂ්පාරාමයයි.

තිස් හැවිරිදි ඥාණවිමල ස්වාමින් වහන්සේගේ බලවත් කැමැත්ත වූයේ සියමට වැඩම කර උපසම්පදාව ලබා ගැනීමටය. සංඝරාජ මාහිමියන්ගෙන් හා බෝවල ධම්මානන්ද මාහිමියන්ගෙන් අවසරය ලබා ගෙන සියම බලා පිටත්වුණු උන්වහන්සේ අතරමගදී පැමිණි බාධක නිසා බුරුම රටට වැඩම කළහ. බු. ව. 2342 දී හෙවත් ක්‍රි. ව. 1799 දී පිටත්වුණු මේ ගමනට සාමණේරයන් වහන්සේ පස් නමක් හා කැපකරු දායකයින් තිදෙනෙක් සම්බන්ධ වූහ. බුරුමයේ අගනුවර වූ අමරපුරයේදී එරට රජතුමන් විසින් මහත් හරසරින් පිළිගනු ලැබූ ඥාණවිමල ස්වාමින් වහන්සේ ප්‍රධාන පිරිස ඥාණභිවංස ධම්ම සේනාපති මහා ධම්මරාජාධිරාජගුරු සංඝරාජයන් වහන්සේ වෙත කැඳවා ගෙන යන ලදහ. වසර කීපයක් උන්වහන්සේ වෙතින් ධර්ම විනය හැදෑරූ ඥාණවිමල ස්වාමින්වහන්සේ අනෙක් පස් නමද සමඟ උපසම්පදාවට පත්ව ආපසු ලක්දිවට වැඩම කළහ. උන්වහන්සේ ඊළඟට කළේ බුරුම ජාතික අග්ගසාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් මාදුගහේ බලපිටිමෝදර උදකුක්ඛේප සීමාවේදී උපසම්පදා විනය කර්මයක් සිදු කිරීමයි. ඒ සමගම බුරුමයට සම්බන්ධ භික්ෂු පරපුරක් මෙරට ඇති විය. එකල එය හඳුන්වන ලද්දේ අමරපුර සමාගම නමිනි. එහි ප්‍රධානත්වයට පත් වූයේ වැලිතර ඥාණවිමල ස්වාමින් වහන්සේය. මහාධම්ම රාජාධිරාජගුරු යන ගෞරව නාමය සහිත මහානායක පදවිය බුරුම සංඝරාජයන් වහන්සේ විසින් ඥාණවිමල ස්වාමින්වහන්සේට පිරිනමන ලදී. ඒ පිළිබඳ අක්තපත්‍රය උන්වහන්සේ වෙත පිරිනැමූ එඩ්වඩ් බාන්ස් ශ්‍රී ලංකා ආණ්ඩුකාරවරයා එම මහානායක පදවිය රජය පිළිගත් පදවියක් බවට පත් කළේය.

ලක්දිව අමරපුර නිකාය සුපේශල ශික්ෂාකාමී ආදර්ශවත් භික්ෂූන් වහන්සේගෙන් යුක්ත වූ භික්ෂු සංවිධානයක් බවට පත් කිරීමට ඤාණවිමල ස්වාමින්වහන්සේට අතිශයින් සහාය වූ ස්වාමින්වහන්සේ සිවු නමක් වූහ. උන්වහන්සේලා නම් කපුගම ධම්මක්ඛන්ධ, බෝගහපිටියේ ධම්මජෝති, අත්තුඩාවේ ධම්මරක්ඛිත, කතළුවේ ගුණරතන යන මහා ස්වාමින්වහන්සේලාය. මෙම පස් දෙනා වහන්සේගේ අනල්ප උත්සාහය හා පුණ්‍ය මහිමය නිසා දරුණු නියභයකින් කාලාන්තරයක් තිස්සේ පීඩා විඳිමින් තිබූ දේශයක් මහ වැහි කලෙක සරුසාර වන්නාක් මෙන් සිරිලක් දිවයිනෙහි යළිදු පරම පවිත්‍ර සම්බුද්ධ ශාසනය වැඩි දියුණුවට පත්විනැයි මුහන්දිරම් මුල්ලපිටියේ කේ. එච්. ද සිල්වා විජය ශ්‍රී වර්ධන මැතිතුමා සිය ශ්‍රී ලංකා අමරපුර වංශය නම් කෘතියේදී සඳහන් කර ඇත. යුගකාරක තෙර නමක වශයෙන් වැලිතර ඤාණවිමල තිස්ස මහානායක ස්වාමින්වහන්සේගේ වටිනාකම එම සඳහනින් අනාවරණය වෙයි. එම කෘතියෙහි ම සඳහන් වන පරිදි බුරුමයෙන් උපසම්පදාව ගෙනා අලුතම, එවකට පහතරට පෙදෙස පාලනය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරයා ඔබවහන්සේගේ "අවසරයක් නොමැතිව මගේ බල ප්‍රදේශය තුළ කිසිවකුට සසුන්ගත වීමට අවසර නොදෙමිය" ඤාණවිමල ස්වාමින් වහන්සේට දන්වා ඇත. ධර්ම විනය විරෝධී එම තීරණයට උන්වහන්සේ එකඟ වී නැත. උන්වහන්සේගේ අභිප්‍රාය වූයේ කිසිදු භේදයකින් තොරව විනයානුකූලව මහණ දම් පුරනු කැමැති සැමට ඒ සඳහා ඉඩකඩ සැලසීමයි. ඒ නිසාම මුහුදුබඩ පළාත් අන්‍යාගමික ආක්‍රමණවලින් බොහෝ දුරට ආරක්ෂාවූ අතර දිවයිනේ සෙසු ප්‍රදේශවලද ශාසනික පුනරාලෝකයක් ඇති විය. බෝධිසත්ව ගුණෝපේත වැලිතර ඤාණවිමල තිස්ස මහානායක ස්වාමීන්වහන්සේ ක්‍රි. ව. 1834 දී අපවත් වූ සේක. උන්වහන්සේගෙන් විහිදුණු ශාසනාලෝකය අද දක්වාම පැතිරී ඇත.

## අඹගහවත්තේ ඉන්දාසභවරඤාණ සාමි මාහිමියෝ

ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකාය නැමැති භික්ෂු පරපුරේ නිර්මාතෘවරයා වූ ද, සුපේශල ශික්ෂාකාමී පඬිවරයෙකු වූ ද අඹගහවත්තේ සරණංකර ඉන්දාසභවරඤාණ සාමි හිමියෝ ලංකා භික්ෂු ඉතිහාසයේ මිණි පහනකි.

ගාල්ලේ අක්මීමන අඹගහවත්තේ මතෙස් මදනායක දම්පතීන්ට පුත්ව 1832 නොවැම්බර් 16 දින උපන් පුත් කුමරා හැඳින්වූනේ වත්හිමි නමිනි.

හෙතෙම 1847 ජුනි 15 දින ගාල්ලේ තුවක්කුගලවත්ත විහාරයේදී අඹගහවත්තේ සරණංකර නමින් පැවිදි විය. මුන්වහන්සේ 1861 ජුනි 12 දින උපසම්පදාව ලැබුවේ ධම්මාභි මුනිවර ඤාණකිත්ති ශ්‍රී මාහිමියන් උපාධ්‍යාය කොට රාමඤ්ඤ රට භික්ෂූන්වහන්සේ වෙතිනි. ලක්දිව රාමඤ්ඤ නිකාය නැමැති නව භික්ෂු පරපුර ආරම්භ කළ මුන්වහන්සේ විශේෂයෙන් වැදගත් වන්නේ උන්වහන්සේ තුළ පැවැති විශිෂ්ට චරිත ලක්ෂණ නිසාය. ස්වාධීනව ස්ථිර නිගමනයකට බසිනාතුරු ගවේෂණශීලි වීම උන්වහන්සේගේ විශිෂ්ට ලක්ෂණයකි. සියම් හා අමරපුර නිකායන්ට ඇතුළත් වීමෙනුත් බුරුමයේ රාමඤ්ඤ දේශයේදී උපසම්පදා වීමෙනුත් පෙනෙන්නේ උන්වහන්සේගේ මේ ලක්ෂණයයි. උන්වහන්සේගේ පාණ්ඩිත්‍යය හා ශික්ෂාකාමී විනයගරුක බව පිළිබඳව කර්නල් ඕල්කොට්තුමා ද ගෞරවයෙන් සඳහන් කරයි. එසේම උන්වහන්සේ ඇරඹූ භික්ෂු පරපුර 1872 වනවිට ඉතා ජනප්‍රියව පැවැති බව රීස් ඩේවිඩ් පඬිතුමාත් සඳහන් කරයි. මෙතරම් වියත් ධර්මකථිකයෙක් හෝ ලජ්ජී සුපේශල ශික්ෂාකාමියෙක් හෝ ලක්දිව බොහෝ කලකින් නූපන්නේ යයි එකල පැවති "ලක්මිනි පහණ" (1886 පෙබරවාරි 9) නැමැති පුවත්පත සඳහන් කරයි.

පසු කාලයේ රාමඤ්ඤ නිකායෙන් බිහි වූ විද්‍යාස්ථාන හා ගිහි පැවිදි උගතුන්ගෙන් රටට සිදුවූ සේවය අගයන විට ඉන්ද්‍රාසභවරඤාණසාමි මාහිමියන්ගේ කීර්තිනාමය තවතවත් බැබලෙන්නේය. 1886 ජනවාරි 29 දින උන්වහන්සේ පයාගල ධර්මගුප්ත පිරිවෙනේ දී අපවත් වූහ.

කොතරම් දුෂ්කරතා බාධක තිබුණත් අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව ඉගෙනීමේ කටයුතුවල නිරතවීමත්, ශික්ෂාකාමී විනයගරුක ජීවිතයක් ගත කිරීමත් මේ තිදෙනා වහන්සේගෙන් අපේ ජීවිතවලට ගතහැකි ආදර්ශ අතරින් වැදගත් දෙකකි.

අභ්‍යාස :

මෙම පාඩමේ සඳහන් තිදෙනා වහන්සේගෙන් එක් නමක් පිළිබඳව ඔබට කථාවක් කිරීමට සිදු වුවහොත් ඔබ ඉදිරිපත් කරන ප්‍රධාන කරුණු මොනවාදැයි සටහන් කරන්න.

## 17 පාඩම

# බුදු සසුන බැබැළු වූ සිංහල රජවරු දෙදෙනෙක්

ක්‍රි. පූර්ව තුන්වන සියවසේදී මහින්ද මහ රහතන් වහන්සේගේ ලංකාගමනයෙන් පසු දෙවන පෑතිස්ස රජ්ජුරුවෝත් සිරිලක් වැස්සෝත් බෞද්ධයන් බවට පත්වූහ. රාජ අනුග්‍රහය යටතේ මුළු දිවයිනෙහි ම බුදු දහම පැතිර ගියේ ය. රට පුරා බෞද්ධ වෙහෙර විහාර ගොඩ නැගිණ. බෞද්ධ ජීවන ක්‍රමයක් යටතේ රටවැසියෝ සුඛිත මුදිත වූහ. මහජනාදරය දිනා ගැනීමට නම් බුදු සසුන රැක ගනිමින් වෙහෙර විහාර ඉදිකිරීම් ආදී බෞද්ධ කටයුතුවල නිරත වියයුතු බව අපේ රජවරු අවබෝධ කර ගත්හ. එබැවින් හැම පැරණි සිංහල රජකෙනෙක්ම පාහේ ශාසනික කටයුතුවලට නොදෙවෙනි තැනක් දෙමින් බුදු සසුන රැක ගැනීමට උත්සාහ කළහ. මෙම පාඩමෙන් ඉදිරිපත් කෙරෙන්නේ බුදු සසුන බැබළ වූ ශ්‍රද්ධාවත් රජවරුන් දෙදෙනෙකුගේ චරිතයි. ඒ දුටුගැමුණු හා මහ පැරකුම්බා රජවරුන්ගේ චරිතයි.

## දුටුගැමුණු රජතුමා (ක්‍රි. පූර්ව 161 - 137)

බුදු දහම ලක්දිව පැතිරී සියවසක් යන්නටත් පළමු සිරිලක්දිවට දුර්භාග්‍ය සමයක් උදාවිය. සොළී රටින් පැමිණි එළාර නැමැති ද්‍රවිඩ රජකු රජරට අල්ලාගෙන උතුරු ලක්දිව පාලන බලය ලබාගැනීම මෙයට හේතුවයි. ද්‍රවිඩයෝ වෙහෙර විහාර විනාශ කරමින්, වස්තුව පැහැර ගනිමින්, බෞද්ධ භික්ෂූන් වහන්සේට ද හිරිහැර කළහ. මෙයින් රජරට බෞද්ධයන්ට අවාසනාවන්ත කාලයක් උදාවිය. මේ අවස්ථාවේ දී රට පරසතුරන්ගෙන් ගලවාගෙන නැවත බුදු සසුන නගා සිටුවීමට වීරයෙක් රුහුණු රටින් පහළ විය. ඒ පසුව දුටුගැමුණු නමින් රජ වූ ගාමිණී අභය කුමාරයායි.

මාගම අගනුවර කරගෙන රුහුණු රට රජකම් කළ කාවන්තිස්ස නම් රජකෙනෙක් විය. එතුමාගේ බිසව වූයේ, වරක් මුහුද ගොඩ ගලද්දී රට බේරාගැනීම සඳහා සිය කැමැත්තෙන් මුහුදට බිලි වූ දේවී නැමැති කැලණිතිස්ස රජුගේ එඩිතර දියණියයි. කාවන්තිස්ස රජුටත් විරෝදාර විහාරමහාදේවියටත් ගැමුණු හා තිස්ස නමින් පුත්තු දෙදෙනෙක් වූහ.

මේ කුමාරවරු දෙදෙන මෑණියන්ගේ උපදෙස් යටතේ ධීරවීර ගුණයෙන් යුතුව වැඩුණාහ.

ස්වකීය පුතුන් මතු දවසක රට බේරා ගැනීමට පරසතුරන් සමඟ යුද වදින බව තේරුම් ගත් කාවන්තිස්ස රජතුමා ඒ සඳහා සුදුසු පසුබිම සකස් කළේය. රුහුණු රට වී ගොවිතැන සශ්‍රීක කළේය. දසමහ යෝධයන් නැමැති සෙන්පතියන් යටතේ භට හමුදාවක් ද සංවිධානය කළේය. ශාසනික කටයුතු ද දියුණු කිරීම තුළින් ජනතාව තුළ සමගිය හා සමාදානය ගොඩ නැංවීය. එපමණක් නොව තම පුතුන් දෙදෙනා කිසිවිටෙක අසමගි නොවන බවට ද, කුල දේවතාවුන් වූ මහසඟ රුවන කෙරෙහි කළ නොකිරෙන බවට ද පොරොන්දු කරවා ගත්තේ ය.

කාවන්තිස්ස රජතුමාගේ මරණින් පසු ගැමුණු කුමාරයා රුහුණු රටේ රජවිය. යුවරජු බවට පත්කරනු ලැබූ තිස්ස කුමාරයා ට සංවර්ධනය සඳහා දිගාමඩුල්ල ප්‍රදේශය භාර දෙන ලද්දේය. දුටුගැමුණු රජුගේ ඊළඟ අරමුණ වූයේ පරසතුරන්ගෙන් රජරට බේරා ගැනීමය.

මේ සඳහා හෙතෙම දසමහ යෝධයන් සහිත බළ සෙනඟ පිරිවරා රජරට ද්‍රවිඩයනට විරුද්ධව සටන් ආරම්භ කළේය. විහාර මහා දේවි යගේ මෙන් ම මහා සංඝයාගේ ද උපදෙස් මේ සඳහා රජතුමාට ලැබිණි.

"මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය." යනුවෙන් රජතුමා සටන් කිරීමෙහි අරමුණ පැහැදිලි කළේය. වැඩිකල් නොගොස් එළාර රජු පරදවා ද්‍රවිඩ බලයෙන් රජරට මුදා ගත් දුටුගැමුණු රජතුමා අනුරාධපුරය අගනුවර කරගෙන මුළු ලක්දිව ම අගරජ විය.

ඉක්බිති රජතුමා රටවැසියාගේ සුභ සිද්ධිය සඳහාත් බුද්ධ ශාසනයේ උන්නතිය සඳහාත් තම කාලය යෙදවීය. සටනින් මරණයට පත් වූ එළාර රජුගේ අවසාන කටයුතු ඉතා ගෞරව සහිතව කරවීම දුටුගැමුණු රජතුමාගේ උසස් ගුණයකි. අනුරාධපුරයේ මිරිසවැටි දාගැබ එතුමා විසින් කරවන ලද පළමුවන චෛත්‍යයයි. බෞද්ධ ලෝකයේ මුදුන් මල් කඩක් සේ සලකනු ලබන, එතුමා විසින් කරවනු ලැබූ රුවන්වැලි සෑය හෙවත් මහාථූපය එකල බෞද්ධ ලෝකයේ තිබූ විශාලතම දාගැබයි.

මේ දාගැබ ගොඩ නැගීමේ යෙදුණු සියලුම කාර්මිකයන්ට ආහාරපාන, ඇඳුම් පැළඳුම් හා වැටුප් දෙන ලද බව මහාවංශය නැමැති අපේ ඉතිහාස ග්‍රන්ථයෙහි සඳහන්ය. මහාථූපයේ ධාතු නිධානෝත්සවයට ඉන්දියාව හා බටහිර ආසියානු රටවලින් දහස් ගණන් භික්ෂූන් වහන්සේලා වැඩි බව පෙනේ.

ලෝවාමහාපාය නමින් හැඳින්වෙන, අනුරාධපුරයේ පිහිටි මහා විහාර පොහොය ගෙය ද දුටුගැමුණු රජතුමාගේ නිර්මාණයකි. එකල නවමහල් ප්‍රසාදයක් වූ ලෝවා මහා ප්‍රසාදයේ අද දක්නට ඇත්තේ එහි බිම්මහලේ වූ ගල්කණු 1600 ක් පමණි.

දුටුගැමුණු රජතුමා ධර්ම ශ්‍රවණයට මෙන්ම ධර්ම දේශනාවට ද කැමැත්තක් දැක්වීය. එබැවින් සෑම ගමකම ධර්ම දේශකයන් වහන්සේලා ලවා ධර්ම දේශනා පැවැත්වීමට සලස්වා උන්වහන්සේලා ට පරිත්‍යාග කිරීමට ද කටයුතු සැලසීය. එතුමා රාජ්‍යය කළ සූවිසි අවුරුද්ද තුළ වෙසක් උත්සව 24 ක් පැවැත්වූ බව ද මහාවංශයේ සඳහන් ය. රටේ ආරෝග්‍යශාලා පිහිටුවා ගිලන්හල් සේවාවක් ආරම්භ කිරීම ද දුටුගැමුණු රජතුමාගේ තවත් සේවාවක් විය.

ගැමුණු රජතුමා හදිසියේ ම රෝගාතුර විය. ඒ වන විටත් නොනිමියා වූ රුවන්වැලි දාගැබේ කටයුතු සම්පූර්ණ කිරීමට සොහොවුරු සද්ධාතිස්ස රජතුමාට පවරන ලදී. එතුමා විසින් නොනිමියා වූ කොත්කැරැල්ල හුණදඬුවලින් සාදා සුදු රෙදිවලින් ආවරණය කොට චෛත්‍යයේ වැඩ අවසන් වූ ලෙසට මරණ මංචකයේ හුන් දුටුගැමුණු රජතුමාට පෙන්වන ලද්දේ ය. ස්වකීය පින් පොතට සවන් දෙමින්, රුවන්වැලි සෑය දෙස සතුටින් බලා සිටියදී රජතුමා කාලක්‍රියා කළේය. දුටුගැමුණු රජතුමාගේ නාමය ශ්‍රී ලංකා බෞද්ධ ඉතිහාසයේ රන් අකුරින් ලියැවී ඇත්තේ ය.

## මහා පරාක්‍රමබාහු රජතුමා (1153 - 1186)

අනුරාධපුර යුගයේ මෙන් ම පොළොන්නරු යුගය ආරම්භ වෙත්දීත් ලංකාවේ රජරට ප්‍රදේශය පාලනය කළේ දකුණු ඉන්දියාවේ සොළීන් විසිනි. ඒ වර සොළීන් පලවා හැර ලක්දිව එක්සේසත් කළේ 1 වන විජයබාහු (1055 - 1110) රජතුමාය. එතුමාගෙන් පසුව රජ වූ දුර්වල රජවරුන් කීපදෙනෙකු නිසා රට කුඩා රාජ්‍ය කීපයකට කැඩී ගිය අතර බුද්ධ ශාසනය ද පිරිහී ගියේ ය. රට නැවතත් එක්සත් කොට බුදු

සසුන බැබලවීමට කුමාරයෙක් රුහුණෙන් පහළ විය. පළමුවන පරාක්‍රමබාහු නමින් රජබවට පත්වූයේ එතුමාය.

පරාක්‍රමබාහු රුහුණේ රජකළ මානාභරණ රජුගේත්, රත්නාවලී බිසවගේත් පුත්‍රයා ය. හෙතෙම ඉතා බුද්ධිමත් වූත් උත්සාහවන්තවූත් පුද්ගලයෙක් විය. තරුණ වයසට පත් වූ පරාක්‍රමබාහු කුමාරයා මායාරට නමින් හැඳින්වෙන පෙදෙසේ පළමුවෙන් රජබවට පත්විය. රට එක්සත් කිරීම අරමුණු කරගත් එතුමෝ "හැමට පළමු ධාන්‍ය එක්රැස් කළ යුතුය" යි ප්‍රකාශ කොට කෘෂිකර්ම කටයුතුවලට අවශ්‍ය වැව් අමුණු බැඳවීම ආරම්භ කළහ. මායා රටේ සිටි කාලයේ එතුමාගේ අගනුවර වූයේ වර්තමානයේ පඬුවස්නුවර යයි හඳුන්වනු ලබන පරාක්‍රම පුරයයි. මායා රටේ වැව් අමුණු බඳවා ඇළවල් මගින් ජලසම්පාදනය කොට ඒ පෙදෙස වී ගොවිතැනින් සශ්‍රීක කිරීම රජතුමාගේ ප්‍රථම කටයුත්ත විය. ඉක්බිති රට එක්සත් කිරීමේ කාර්යයට සිත මෙහෙයවූ එතුමෝ රුහුණු රටේත්, රජ රටේත් අධිපතීන් අභිබවා ක්‍රි. ව. 1153 දී, රුහුණු, මායා, පිහිටි යන තුන් සිරිලකම එක්සත් කොට, පොළොන්නරුව අගනුවර කොටගෙන මහා පරාක්‍රමබාහු නමින් දිවයිනෙහි ම අග රජ බවට පත්වූහ.

ඉක්බිති හෙතෙමේ රටේ වල් බිහිව තිබුණා වූ, වැව්, අමුණු, ඇලවල් සියල්ල ප්‍රතිසංස්කරණය කොට වී ගොවිතැනින් රට ස්වයංපෝෂිත කළේය. මෙතුමා ප්‍රතිසංස්කරණය කළාවූත්, අළුතෙන් තනවන ලද්දාවූත් වාරිකර්මාන්තවලට මහවැව් 163 ක් ද, කුඩා වැව් 2,376 ක් ද, අමුණු 165 ක් ද, ඇළවල් 3,910 ක් ද, ඇතුළත් වූ බව වර්තාගතය.

වැව් කීපයක් ඒකාබද්ධ කොට නිමැවූ පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය එතුමාගේ විශාලතම වාරිකර්මාන්තය ලෙස සලකනු ලැබේ. මහපැරකුම්බා රජ සමයේ ශ්‍රී ලංකාව ධන ධාන්‍යයෙන් පිරී ගියේය යි කියනු ලැබේ.

පිරිහී තිබූ බුදු සසුන නගා සිටුවීමට මහ පැරකුම්බා රජුගෙන් සිදුවූ මෙහෙය ද ඉතා වැදගත්ය. ලාභ ප්‍රයෝජන බලාපොරොත්තුවෙන් සසුන්ගතව සිටි දුසිල් මහණුන් සසුනෙන් පිටමන් කිරීමට එතුමා කටයුතු කළේය. මේ කටයුතුවලදී එතුමාට දිඹුලාගල මහා කාශ්‍යප මහතෙරුන් වහන්සේ සහාය වූහ. මහාවිහාර, අභයගිරි හා ජේතවන නමින් පැවති තුන් නිකායේ භික්ෂූන් වහන්සේලා සමගි කොට මහා විහාර නමින් එක් භික්ෂු පරම්පරාවක් ඇති කිරීම ද මහා පරාක්‍රමබාහු රජුගේ වැදගත් ශාසනික සේවයකි. භික්ෂූන් වහන්සේලාගේ මනා

පැවැත්ම සඳහා මහා සංඝයාගේ සහාය ඇතිව විනය නීති මාලාවක් ද එතුමා සකස් කළේය. පොළොන්නරු කතිකාවත නමින් හැඳින්වෙන මේ විනය නීති මාලාව පොළොන්නරුවේ ගල් විහාරයේ ශිලා ලේඛනය නමින් මෙකල හැඳින්වෙයි.

කලා රසිකයෙකු වූ මහා පරාක්‍රමබාහු රජතුමා පොළොන්නරු නගරය රජමාලිගා, රහහල්, උයන්, නාන පොකුණු ආදියෙන් අලංකාර කෙළේය. පොළොන්නරුවේ දෙමළ මහා සෑය, කිරිවෙහෙර යන දාගැබ් ගොඩනැගුණේ මෙතුමාගේ කාලයේදී ය. පොළොන්නරුවේ ථූපාරාමය, ලංකාතිලකය හා තිවංක පිළිම ගේ වැනි ගෙඩිගේ සම්ප්‍රදායට අයත් විශාල පිළිම ගෙවල් පැරකුම්බා යුගයට අයත් ය. උත්තරාරාමය හෙවත් ගල් විහාරය නමින් හැඳින්වෙන ස්ථානයේ ගලින් නෙලා ඇති, ඉතා විශාල වැඩඉඳිනා, වැඩසිටිනා හා සැතපෙන බුදු පිළිම මහා පැරකුම්බා රජසමයේ මූර්ති ශිල්පයේ තරම කියාපායි. තිවංක පිළිමගෙයි ඇති බිතු සිතුවම් එකල උසස් චිත්‍රකලා සම්ප්‍රදායක් පැවති බවටද නිදර්ශන වෙයි. පොළොන්නරුවේ තෝපාවැව කෙළවර, පොත්ගුල් විහාරය ඉදිරිපිට ඇති දෑතෙහි පුස්කොළ පොතක් වැනි දැයක් රඳවාගත් තේජස්සම්පන්න අභිමානවත් පුද්ගලයාගේ පිළිරුව මහා පරාක්‍රමබාහු රජුගේ ප්‍රතිමාව යනු බොහෝ දෙනෙකුගේ පිළිගැනීමයි.

මහා පරාක්‍රමබාහු රජු දවස බුරුමයේ උත්තරාජීව නම් තෙරණු කෙනෙක් ඡප්පට නම් තවත් සාමණේර නමක් සමග ලක්දිවට වැඩම කළහ. ඡප්පට සාමණේරයෝ මහා විහාරයේ අවුරුදු කීපයක් නැවතී සිට ධර්ම විනය ඉගෙන ගෙන උපසම්පදාව ලබාගෙන, තවත් සිංහල භික්ෂූන් වහන්සේලා සිවුනමක් සමග ආපසු බුරුමයට වැඩියහ. මේ භික්ෂු පිරිස එහිදී සීහළ සංඝ නම් භික්ෂු පරම්පරාවක් ඇතිකළ බව කියනු ලැබේ. මෙයින් පෙනෙන්නේ මහ පැරකුම්බා රජසමයේදී විදේශයන්හි පැතිර යන තරමට ලක්දිව බුදුදහම දීප්තිමත්ව බැබැළුණු බවය.

රට ආර්ථික වශයෙන් සමෘද්ධිමත් කොට, බුදු සසුන ද ඉතා උසස් අන්දමින් බැබළීමට පත්කළ ප්‍රතාපවත් පාලකයෙකු වශයෙන් මහා පරාක්‍රමබාහු රජතුමා අගය කළ හැකිය.

අභ්‍යාසය

දුටුගැමුණු රජතුමාගේ හා මහා පරාක්‍රමබාහු රජතුමාගේ ශාසනික සේවාවන් සංසන්දනය කරන්න.

18 පාඩම

## විසිවන සියවසේ විසූ ශ්‍රී ලාංකික ගිහි බෞද්ධ පඬිවරු දෙදෙනෙක්

බුද්ධ කාලයේ සිට මේ දක්වා ජීවත් වූ ගිහිපැවිදි උතුමන් ගණනාවකගේ චරිත ඔබ දැන් ඉගෙන ඇත. ඒ එක් එක් චරිතය සුවිශේෂ වූ ආගමික, ජාතික හෝ ශාස්ත්‍රීය සේවාවක් හෝ සේවා කීපයක් නිසා කැපී පෙනෙයි. මේ පාඩමේ දී ඔබට ඉගෙනීමට ලැබෙන්නේ මේ ශතවර්ෂයේ ජීවත්වූ, බුද්ධ ධර්මය ඉගෙනීමේ වටිනාකම මේ රටෙහි මෙන්ම විදේශවල ජනතාවට ද පැහැදිලි කරදීමට විශාල සේවයක් කළ පඬිවරුන් දෙදෙනෙකු පිළිබඳවය. ඒ දෙදෙනා නම් ගුණපාල මලලසේකර හා කේ. එන්. ජයතිලක යන මහාචාර්යවරුය.

### ගුණපාල මලලසේකර මැතිතුමා

වර්ෂ 1899 ක් වූ නොවැම්බර් මස 09 දින පාණදුරේ මාලමුල්ලේ උපත ලැබූ ගුණපාල මලලසේකර මහතා ප්‍රසිද්ධ වෛද්‍යවරයෙකුගේ පුත්‍රයෙකි. පාණදුරේ ශාන්ත ජෝන් ශාස්ත්‍ර ශාලාවෙන් ඉංග්‍රීසි බසින් මූලික අධ්‍යාපනය ලැබූ මලලසේකර ශිෂ්‍යයාට පාසල් විෂයයන් සමග ඉංග්‍රීසි, ප්‍රංශ, ලතින් හා ග්‍රීක් යන භාෂා ද ඉගෙනීමට ඉඩ ලැබුණේය. තම පුත්‍රයා දක්ෂ වෛද්‍යවරයෙකු කිරීමට කැමැත්තක් දැක්වූ පියතුමා ඔහුට ගෙදරදී සිංහල, පාලි හා සංස්කෘත යන පෙරදිග භාෂා ද ඉගැන්වීය. ඉතා සාර්ථක ලෙස පාසල් අධ්‍යාපනය අවසන් කළ මලලසේකර තරුණයා වෛද්‍ය ශාස්ත්‍රය හැදෑරීමට ඇතුළත් වූයේ කොළඹ වෛද්‍ය විද්‍යාලයටයි.

වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වී වසර තුනක් පමණ ගතවෙද්දී මලලසේකර මහතාගේ පියතුමා අභාවයට පත්විය. මේ නිසා ඇති වූ ආර්ථික දුෂ්කරතා නිසා එතුමාට වෛද්‍ය අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට නොහැකි විය. එබැවින් වෛද්‍ය විද්‍යාලයෙන් අස්වූ එතුමා භාෂා අධ්‍යාපනය කෙරෙහි සිත මෙහෙය විය. මේ කාලයේ දී එතුමාට අනගාරික ධර්මපාලතුමා හමුවිය. එතුමා තරුණ මලලසේකර විශ්ව විද්‍යාල අධ්‍යාපනයට පොළඹවා ඒ සඳහා උදව් ද කෙළේය. උත්සාහවත්

බුද්ධිමත් මලලසේකර තරුණයා එකල පැවති කොළඹ විශ්ව විද්‍යාල කොලීජියට බැඳී ඉගෙනීම කොට 1919 දී ලන්ඩන් විශ්ව විද්‍යාලයේ බී. ඒ. උපාධිය ලබා ගත්තේ ය. අඩු වයසෙන් බී. ඒ. උපාධිය ලබා ගත් පළමුවැන්නා වූයේ ද ගුණපාල මලලසේකර මහතා යයි කියනු ලැබේ.

1921 දී කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පති වූ පී. ද ඇස්. කුලරත්න මහතා විසින් මලලසේකර මහතා එහි උපගුරු තනතුරකට බඳවා ගන්නා ලදී. ආනන්ද විද්‍යාලයේ සිසුන්ට පාලි භාෂාව හයමසකින් උගන්වා සීනියර් විභාගයෙන් උසස් ප්‍රතිඵල ලබාදීමට මලලසේකර මහතා පොහොසත් විය. එතුමා බෞද්ධ සිරිත් විරිත් ඉතා අගය කළේය. කුලරත්න මහතාත්, මලලසේකර මහතාත් රෙදි බැනියම් ඇඳගෙන ඉංග්‍රීසි විද්‍යාලයක ඉගැන්වීම ඒ කාලයේ අන්දමට විප්ලවකාරී ක්‍රියාවක් විය.

1923 දී මලලසේකර මහතා ලන්ඩන් විශ්ව විද්‍යාලයට ගියේ ශිෂ්‍යත්වයක් ලබා ගැනීමෙනි. එහිදී ශාස්ත්‍රපති උපාධිය (එම්. ඒ.) හා ආචාර්ය උපාධිය (පී. එච්. ඩී.) එකවර ලබාගෙන ස්වකීය දක්ෂතා පෙන්වා මලලසේකර මහතා 1925 දී නැවතත් ලංකාවට පැමිණියේ ය. ඒ වර එතුමාට කොළඹ නාලන්දා විද්‍යාලයේ විදුහල්පතිකම ලැබිණ. 1927 දී කොළඹ විශ්ව විද්‍යාල කොලීජියේ පෙරදිග භාෂා අංශය භාරව කටයුතු කිරීමට එතුමා තෝරාගනු ලැබීය. පේරාදෙනියේ ලංකා විශ්ව විද්‍යාලය ආරම්භ වූ පසු එහි පාලි භාෂාව පිළිබඳ මහාචාර්ය ධුරය ලැබුණු මලලසේකර මහතා 1957 වන තුරුම එම තනතුර හෙබවීය. එතුමා විශ්ව විද්‍යාලයේ ජනප්‍රිය ගුරුවරයෙක් විය.

විශ්ව විද්‍යාල සේවයේ යෙදෙන ගමන් ම මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා විවිධ බෞද්ධ සමිති සමාගම්වල කටයුතුවලත්, ශාස්ත්‍රීය පොතපත ලිවීමෙහිත් නිරත විය. 1937 සිට 1957 දී රුසියාවේ ලංකා තානාපති තනතුරට පත්ව යනතුරුම එතුමා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති තනතුර හෙබවීය. පාලි, සංස්කෘත භාෂා අධ්‍යයනයට සිසුන් පොළඹවමින් ඒ සඳහා පොත් රචනා කිරීම ද එතුමාගේ තවත් සේවාවකි. පාලි සංඥානාම අකාරාදිය හා ලංකාවේ පාලි සාහිත්‍ය ඉතිහාසය එතුමා විසින් රචිත කෘති දෙකකි. පාසල්

සිසුන් අතර ද ජනප්‍රිය මලලසේකර ඉංග්‍රීසි - සිංහල ශබ්ද කෝෂය ද එතුමාගේ කෘතියකි. පුවත්පත් සඟරා ආදියට එතුමා විසින් ලියා ඇති ලිපි ගණන ද ඉතා විශාලය. 2500 බුද්ධ ජයන්තිය නිමිති කරගෙන 1956 දී ආරම්භ වූ බෞද්ධ විශ්ව කෝෂය ලිවීමේ කාර්යයෙහි ප්‍රධාන කර්තෘ ධුරය එතුමා පරලෝ සැපත් වනතුරුම දැරීය. එතුමා කලක් උසස් අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ද කටයුතු කළේය.

රුසියාව, එක්සත් රාජධානිය ආදී රටවලත්, එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ආයතනවලත් ලංකා නියෝජිතයා වශයෙන් සේවය කළ එතුමා ස්වකීය උගත් කමින් ලංකාවට කීර්තියක් ලබා දුන්නේ ය. තම විදේශ සේවයේදී, බුදුදහම සාමකාමී අවිහිංසාවාදී, මානව හිතවාදී හා ප්‍රඥාවට හා කරුණාවට මුල්තැන දෙන්නාවූත් දහමක් බව දේශනා පැවැත්වීමෙන් හා ලිපිලේඛන සැපයීමෙන් එතුමා ලොවට ප්‍රකට කළේය. ලෝක භාෂා රාශියක් දැන සිට මලලසේකර මහතා චතුර කථිකයෙක් විය. රෙද්දත් බැනියමත් හැඳගත්, අනතිමානී බෞද්ධ සංස්කෘතියේ මූර්තියක් බඳු මේ උදාර පුද්ගලයාගේ ප්‍රසාදජනක කථා ඇසීමෙන් බුදු සසුනේ පැහැදුණු විදේශීය බුද්ධිමතුන්ගේ ගණන බොහෝ ය.

ආගන්තුක සත්කාරය, ප්‍රියවචන කථා කිරීම, පාණ්ඩිත්‍යය, අනතිමානීබව, චාම් සරල පැවැත්ම, දුක් දොම්නස් මැද වුවත් කම්පා නොවී නිතර ප්‍රබෝධමත්ව දිවි ගෙවීම එතුමාගේ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණවලින් සමහරකි. පෞද්ගලික වූත් පොදුවූත් ජීවිතයේ හැම කටයුත්තකදීම මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළයුතු බව ද එතුමා නිතර කියා සිටියේ ය.

තමන් ගිය ගිය රටෙහි දී බුදුදහම හඳුන්වා දීමට වෑයම් කළ, තම බුද්ධියෙන් හා උගත්කමින් ලංකාවට කීර්තියක් අත්කර දුන් ගුණපාල මලලසේකර පඬිරුවන 1973 මැයි 23 දින දී අප අතරින් වෙන් වී ගියේ ය. විපදි ධෛර්යම් සම්පදි ක්ෂමා විපතේදී දිරිමත්වීම හා සැපතේදී උදම් නොවීම යන එතුමාගේ කියමන අපගේ ජීවිතයට සම්බන්ධ කරගත යුතු වටිනා ආදර්ශ පාඨයකි.

## කේ. එන්. ජයතිලක මහාචාර්යතුමා

බෞද්ධ දර්ශනය ස්වදේශයෙහිත් විදේශයෙහිත් ප්‍රචාරය කිරීමට කටයුතු කළ විසිවන සියවසෙහි ජීවත්වූ තවත් පඬිරුවනක් මහාචාර්ය කේ. එන්. ජයතිලක මහතා ය.

රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමට වරම් ලද කේ. එන්. ජයතිලක මහතා 1938 දී කේම්බ්‍රිජ් සීනියර් විභාගයෙන් සමත් විය. 1943 දී ඒ මහතා ඉන්දු ආර්ය භාෂාවලින් ලන්ඩන් විශ්ව විද්‍යාලයේ බී. ඒ. උපාධිය ලබා ගත්තේ ය. ඉගෙනීමේ විශේෂ දක්ෂතා පෑ ජයතිලක මහතා තවත් විෂය ක්ෂේත්‍රයකින් ප්‍රථම උපාධිය ලබා ගැනීමට කටයුතු කළේය. ඒ අනුව හෙතෙම 1949 දී ලන්ඩන් විශ්ව විද්‍යාලයේ බටහිර දර්ශන පිළිබඳ බී. ඒ. උපාධිය හිමිකර ගත්තේ ය. ඔහු මේ ඉගෙනීම් කළේ රැකියාවක යෙදෙමින් ය. 1943 දී ජයතිලක මහතා මතුගම ආනන්ද ශාස්ත්‍රාලයේ විදුහල්පති ධුරය භාර ගත්තේ ය.

1948 දී පළාත් පාලන සහකාර කොමසාරිස් තනතුර ලබා ගැනීමෙන් වෙනත් ක්ෂේත්‍රයක අත්දැකීම් ද එතුමාට හිමිකර ගත හැකි විය.

1954 දී පේරාදෙනිය ලංකා විශ්ව විද්‍යාලයේ දර්ශන කථිකාචාර්ය තනතුරක් ලබා ගැනීමෙන් තමාට ගැලපෙන්නාවූත්, ශාස්ත්‍රීය සේවයක් ඉටු කළ හැක්කාවූත් වෘත්තියක් එතුමා ආරම්භ කළේය. තවදුරටත් උසස් අධ්‍යාපනයෙහි යෙදුණු එතුමා 1961 දි ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් දර්ශන ශූරී උපාධිය දිනා ගත්තේ සේවයේ යෙදී සිටිමින් මය. එතුමා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශන මහාචාර්ය තනතුරට ද පත්විය.

ජයතිලක මැතිතුමා ශාස්ත්‍රීය නිබන්ධන රාශියක් ලියා ඇති අතර පුවත්පත් සඟරා ආදියට ද බෞද්ධ ධර්මය, දර්ශනය හා සංස්කෘතිය සම්බන්ධ ලිපි සැපයීම ද කළේය. ඥානය පිළිබඳ ආදී බෞද්ධ මතය (අර්ලි බුඩිස්ට් තියරි ඔෆ් නොලේජ්) යන්න එතුමාගේ ශාස්ත්‍රීය නිබන්ධනයයි. බුදුදහම හා ජාති ප්‍රශ්නය නැමති වැදගත් නිබන්ධන ද එතුමාත් මහාචාර්ය මලලසේකර මැතිතුමාත් එකතු වී ලියන ලද්දකි. බෞද්ධ සමාජ දර්ශනය පිළිබඳව එතුමා ලියූ ලියවිල බොහෝ උගතුන්ගේ ප්‍රසාදයට හේතු විය.

විදේශීය විශ්ව විද්‍යාල රාශියක එතුමා බෞද්ධ දර්ශනය සම්බන්ධ දේශන පැවැත්වීය. ඔක්ස්පර්ඩ්, හාවඩ්, ටෙල්අවිව්, හවායි, හේග් හා යොකෝහමා මෙයින් කීපයකි.

ලංකාවට නිදහස ලැබීමෙන් පසුව එතුමෝ එල්. එච්. මෙත්තානන්ද මහතා වැනි අය සමඟ ලංකාවට සුදුසු ජාතික අධ්‍යාපනයක් ගැන ද කරුණු ඉදිරිපත් කළහ. මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා මෙන් ස්වදේශයේ මෙන්ම විදේශයන්හිත් බෞද්ධ දර්ශනය පිළිබඳ ප්‍රබෝධයක් ඇති කිරීමට කටයුතු කළ කේ. එන්. ජයතිලක පඬිවරයා 1970 දී අපට අහිමිවද්දී එතුමාගේ වයස අවුරුදු 49 කි.

අභ්‍යාසය

ගුණපාල මලලසේකර හා කේ. එන්. ජයතිලක යන පඬිවරුන්ගේ ජීවිත චරිතවලින් අපට ගතහැකි ආදර්ශ කවරේදැයි ගුරුතුමා/ගුරුතුමී සමඟ සාකච්ඡා කරන්න.

19 පාඩම

# ලක්දිව බෞද්ධ ප්‍රබෝධයට උරදුන් විදේශීය කාන්තාවෝ

ලක්දිව බෞද්ධ අධ්‍යාපනය පිරිහී තිබුණු ඉංග්‍රීසි පාලන යුගයේදී එය නගා සිටුවීමට උත්සාහයක් කළ රීස් ඩේවිඩ් පඬිතුමන් හා සෙන්පති ඕල්කට් සිරිමතාණන් පිළිබඳව ඔබ මීට පෙර ඉගෙන ගෙන ඇත. මේ පාඩමෙන් බලාපොරොත්තු වන්නේ ඒ පරාධීන යුගයේදී ලක්දිව බෞද්ධ අධ්‍යාපනය කෙරෙහි උද්යෝගිමත් වූ විදේශීය කාන්තාවන් කීප දෙනෙකු හඳුන්වා දීමටය.

ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනර්ජීවනය හා සම්බන්ධ කටයුතුවලට සහභාගිවීම සඳහා ලක්දිවට පැමිණි ප්‍රථම විදේශීය කාන්තාව හෙලේනා පෙත්‍රොව්නා බ්ලැවට්ස්කි මැතිණියයි. ඇ 1831 දී උපත ලද රුසියානු කාන්තාවකි. 1875 දී ඇ ඇමෙරිකාවේ නිව්යෝර්ක් නුවර පරමවිඥානාර්ථ සමාගම පිහිටුවීමට කර්නල් ඕල්කොට්තුමාට සහාය විය. ඉක්බිති 1880 දී කර්නල් ඕල්කට්තුමා සමග ශ්‍රී ලංකාවට පැමිණි ඇ ගාල්ල විජයානන්ද විහාරයේදී පන්සිල් සමාදන් වී බෞද්ධ වූවාය. ශ්‍රී ලංකාවේ දී ඕල්කට්තුමාගේ බෞද්ධ කටයුතුවලට නොයෙක් අන්දමින් සහාය වූවාය. මේ කාලයේදී ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාට ද ඇගේ ඇසුර ලබා ගැනීමට හැකි විය. එකල දඹදිව බෞද්ධ සිද්ධස්ථානවල තත්වය හැදෑරීමට ධර්මපාලතුමා එහි ගියේ ඕල්කට්තුමා හා බ්ලැවැට්ස්කි මැතිණිය ද සමගය. අනගාරික ධර්මපාලතුමාගේ බෞද්ධ පුනර්ජීවන කටයුතුවලට උපදෙස් ලබා දුන් බ්ලැවැට්ස්කි මැතිණිය 1981 දී පරලෝකප්‍රාප්ත වූවාය.

අනගාරික ධර්මපාලතුමාගේ බෞද්ධ පුනර්ජීවන කටයුතුවලට උදව් දුන් තවත් ධනවත් කාන්තාවක් නම් හවායි දූපතේ උපත ලැබූ මේරි එළිසැබෙත් ෆෝස්ටර් මැතිණියයි. ඇය ධර්මපාලතුමාට හමු වූයේ 1893 දී ය. ඉන්දියාවේ ධර්මප්‍රචාර කටයුතුවලට ඇ ධර්මපාලතුමාට මුදලින් ආධාර කළාය. කල්කටාවේ මහාබෝධි සමාගම පිහිටුවීමට ඉඩම ගැනීම හා එහි විහාරය ගොඩ නැගීමට රු. 57,000 ක් ද, සාරානාත්

විහාරය සඳහා රු. 18,000 ක් ද, ඈ ධර්මපාලතුමාට පරිත්‍යාග කළාය. ධර්මපාලතුමා තමා හදා ගත් මවට මෙන් ඇයට සැලකුවේ යයි කියනු ලැබේ.

පසුගිය ශතවර්ෂයේ ලක්දිවට පැමිණි විදේශීය කාන්තාවන්ගෙන් ලංකාවට ඉතා උසස් සේවාවක් සිදු වූයේ මේරි මියුසියස් හිගින්ස් මැතිණිය අතිනි. 1855 දී ජර්මනියේ උපත ලද ඈ ඇමරිකාවට ගොස් එහි දී ඇමරිකානු ඉංජිනේරුවකු සමග විවාහ වූවාය. අකාලයේ සිය සැමියාගේ අභාවය සිදු වීම නිසා ජීවිතයේ නිස්සාරත්වය ඈ ගැඹුරින් අවබෝධ කර ගත්තාය. මේ අතර කර්නල් ඕල්කට්තුමා විසින් ආරම්භ කරන ලද පරමවිඥානාර්ථ සමාගමේ සාමාජිකාවක වූ ඇය 1891 දී ශ්‍රී ලංකාවට පැමිණියාය. හිගින්ස් මැතිණිය අධ්‍යාපනය පිළිබඳ ප්‍රවීනත්වයක් දැරූ තැනැත්තියකි. ලංකාවේ බෞද්ධ බාලිකාවන්ට උසස් අධ්‍යාපනයක් ලැබීමට පහසුකම් නොමැති බව ද ඇයට පැහැදිලි විය. 1891 දී මරදානේ සංඝමිත්තා බාලිකා විදුහලේ විදුහල්පතිණි තනතුර භාර ගෙන බෞද්ධ බාලිකාවන්ට සුදුසු අධ්‍යාපනයක් ගොඩ නැගීමට ඇය උත්සාහ කළේ එබැවිනි.

1893 දී බෞද්ධ බාලිකාවන්ට උසස් අධ්‍යාපනයක් දීම සඳහා කොළඹ මියුසියස් කාන්තා විද්‍යාලය පිහිටුවන ලද්දේ ඇය මුල්වීමෙනි. බෞද්ධ බාලිකාවන්ට සිංහල ආරිය සිරිත් විරිත් පුහුණු කිරීම ඇගේ එක් අරමුණක් විය. එසේ ම දරුවන් තුළ ජාත්‍යාලය හා බුදුදහම කෙරෙහි ශ්‍රද්ධාව ඇති කිරීම ද ඇගේ අධ්‍යාපනයේ තවත් අරමුණකි.

මේ කාලයේ බෞද්ධ දරුවනට කියැවීමට සුදුසු පොත පත නැති බව ඇයට පෙනී ගියේ ය. මේ සඳහා ජාතික ඉතිහාසය පිළිබඳ කථාන්තරත් ජාතක කථාත් සරල සිංහලයෙන් හා සරල ඉංග්‍රීසියෙන් ලිවීමට ඈ පෙළඹුණාය. රාවණ රජ සමයෙන් ආරම්භ කොට එළාර රජ පුවතෙන් අවසන් කළ ඓතිහාසික කථා සංග්‍රහයේ පළමුවන කොටසත්, ගජබා රජ පුවතින් ආරම්භ කොට මහ පැරකුම්බා රජ පුවතින් අවසන් කළ එහි දෙවන කොටසත් ඇගේ උත්සාහයේ සාර්ථක ප්‍රතිඵලයි. සිංහල දරුවනට රාවණ රජ, රාම සීතා, විජය කුවේණි, උන්මාද චිත්‍රා, පණ්ඩුකාභය, විහාරමහා දේවී, දුටුගැමුණු, වළගම්බා,

සෝමාදේවී ආදි පැරණි රජවරුන්ගේ හා බිසෝවරුන්ගේ කථාන්තර මුල්වරට කියැවීමට ලැබුණේ මේ පොත්වලිනි. ඕ ජාතකමාලා නමින් ජාතක කථා සමූහයක් ද සරල ඉංග්‍රීසියට පරිවර්තනය කළාය.

බටහිරින් පැමිණි ඊසොප්ගේ උපමා කථා හා බයිබල් කථා පමණක් ඇතුළත් කථාන්තර පොත් තිබුණු කාලයක දී සිංහල වීරවරයන්ගේ කථා හා බෞද්ධ කථා ඇතුළත් කියැවීම් පොත් පෙළක් ඉදිරිපත් කිරීම මියුසියස් හිගින්ස් මැතිණියගෙන් සිදුවූ ඉතා වැදගත් සේවාවකි. සිංහල දරු දැරියන් විසින් ඉතා ආදරයෙන් සලකනු ලැබූ ඉතා කරුණාවන්ත මේ විදේශීය කාන්තාව එකල හැඳින්වුණේ 'සුදු අම්මා' නමිනි.

මියුසියස් හිගින්ස් මැතිණියගේ තවත් සේවාවක් නම් බෞද්ධ ගුරුවරියන් පුහුණු කිරීම සඳහා කොළඹ මියුසියස් කාන්තා ගුරු අභ්‍යාස විද්‍යාලය පිහිටුවීමයි. දිවයිනේ නොයෙක් පෙදෙස්වල මේ ගුරු විදුහලින් පුහුණුව ලැබූ  බෞද්ධ ගුරුවරියෝ තවමත් සේවයේ යෙදී සිටිති. පසු කාලයේදී කළුතර ඉඩකඩ ඇති භූමියකට මියුසියස් ගුරු විද්‍යාලය ගෙන යන ලදී. තිස්පස් වසරක් ලක්දිව බෞද්ධ අධ්‍යාපනයට නොමැකෙන සේවයක් ඉටුකළ 'සුදු අම්මා' 1926 ජුලි 16 දින අවසන් හුස්ම හෙළුවාය.

අභ්‍යාස

මේරි මියුසියස් හිගින්ස් මැතිණිය ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට කළ සේවය පහදන්න.

20 පාඩම

# පටිච්ච සමුප්පාදය

බුද්ධත්වයෙන් පළමු සතිය විමුක්ති සුවයෙන් ගත කළ බුදුරජාණන් වහන්සේ සත්වන දින රාත්‍රියෙහි පටිච්ච සමුප්පාදය මෙනෙහි කළ බව මහාවග්ග පාලියෙහි සඳහන් වෙයි. එම **පටිච්ච සමුප්පාදය** බුදුදහමේ මූලික ඉගැන්වීමකි. එය **බෞද්ධ හේතුඵලවාදය** ලෙස ද හඳුන්වනු ලැබේ. දුක ඇතිවීම හා නැතිවීම පිළිබඳ බෞද්ධ විග්‍රහය පැහැදිලි කැරෙන්නේ පටිච්ච සමුප්පාදයෙනි. එය ගැඹුරු දහමකි. එය අවබෝධ නොකරන තාක් කල් ප්‍රජාව වැරැදි දෘෂ්ටිවලට බැස ගන්නා බවත් ඒ නිසාම සසරින් එතෙරවීමට නොහැකි වන බවත් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. එසේම **යමෙක් පටිච්ච සමුප්පාදය දකියි නම් හෙතෙම ධර්මය දකින බවත් යමෙක් ධර්මය දකියි නම් හෙතෙම පටිච්ච සමුප්පාදය දකින බවත්** දේශනා කර ඇත. එබැවින් එම ගැඹුරුවූත් විශිෂ්ටවූත් ධර්මය පිළිබඳ ව යම් ප්‍රමාණයක හෝ අවබෝධයක් ලබා ගැනීමට උත්සාහ දැරීම අතිශයින් වැදගත් වෙයි.

පටිච්ච සමුප්පාද යන්නෙන් අදහස් කැරෙන්නේ සහේතුක බවයි. සප්‍රත්‍ය බවයි. අහේතුක අප්‍රත්‍ය නොවන බවයි. එනම් ලෝකයේ වස්තු පුද්ගල සිද්ධි යන සියල්ලක් ම හේතු ප්‍රත්‍යය සම්බන්ධතාවකට අනුව ක්‍රියාත්මක වන බවයි. මෙහි හේතු යන්නෙන් අදහස් කැරෙන්නේ කිසියම් ප්‍රතිඵලයක් ඇතිවීම කෙරෙහි බලපාන ප්‍රධාන කාරණයයි. ඒ සඳහා බලපාන අනෙකුත් සාධක, ප්‍රත්‍ය යන්නෙන් අදහස් කෙරේ. අංකුරයක් ඇතිවීමට **හේතුව** වන්නේ **බීජයයි**. පස, ජලය, වාතය ආදිය ප්‍රත්‍යයි. බුදුදහම ලෝකයේ වස්තු, පුද්ගල, සිද්ධි යන සියල්ලක් ම විග්‍රහ කරන්නේ මෙම න්‍යාය පදනම් කර ගෙන ය.

ඉහත සඳහන් ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යාය බුදුරජාණන් වහන්සේ ඉතා ම කෙටියෙන් මෙසේ දේශනා කරනු ලැබ ඇත :

ඉමස්මිං සති ඉදං හොති
ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති

ඉමස්මිං අසති ඉදං න හොති
ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති.

මෙම පාලි වාක්‍ය හතර සිංහලෙන් මෙසේ ලිවිය හැකිය.

මෙය ඇති කල්හි මෙය වෙයි.
මෙය ඉපදීමෙන් මෙය උපදී.
මෙය නැති කල්හි මෙය නොවේ.
මෙය නැති වී යෑමෙන් මෙය නැතිව යයි.

මෙහි මෙය යන්නට සංකේතයක් යෙදුවහොත් මෙසේ ලියා දැක්විය හැකිය.

අ ඇති කල ආ වෙයි.
අ උපදිත ආ උපදියි.
අ නැති කල ආ නොවේ.
අ නැතිවෙත ආ නැති වේ.

මෙහි එකම දේ දෙවරක් සඳහන් වෙතැයි ඇතැම් විට හැඟී යා හැකිය. එහෙත් එය එසේ නොවේ. පළමු වාක්‍යයේ වෙයි යන්න වෙනුවට දෙවැන්නෙහි උපදියි යනුවෙන් සඳහන් වීම සැළකිල්ලට ගත්විට මෙහි වෙනසක් ඇති බව තේරුම් ගත හැකිය. මෙහි ඇත්තේ හේතුඵල සම්බන්ධය දැක්විය හැකි ආකාර දෙකකි.

1. පළමු වැන්නෙන් පැවැත්මේ සම්බන්ධය දැක්වෙයි.
2. දෙවැන්නෙන් උත්පාද සම්බන්ධය දැක්වෙයි.

තරාදියක් ගැන සිතමු. එහි තටු දෙක පවතින්නේ සමාන්තරවය. එක් තටුවක් පහත් වී පැවැතෙතොත් ඊට සමාන්තරව අනෙක් තටුව එස වී පවතියි. මුලින් කී තටුව එස වී පැවතුනොත් ඊට සමාන්තරව අනෙක් තටුව පහත් වී පවතියි. පළමු වාක්‍යයෙන් දැක්වෙන්නේ එබඳු සම්බන්ධයකි. භෞතික නිදසුනක් යොදා ගැනුනේ තේරුම් ගැනීමේ පහසුවටය. ආධ්‍යාත්මික කරුණුවලදී ද එබඳු පැවැත්මේ සබඳතාවක් ඇත.

උත්පාද සම්බන්ධය පැහැදිලි කර ගැනීමට ද භෞතික උදාහරණයක් ගනිමු. පහන් සිළුව සහ ආලෝකය අතර සම්බන්ධය ගැන සිතන්න. ආලෝකය ඇති වූයේ පහන් සිළුව නිසාය. පහන් සිළුව හෙවත් පහන උපන් නිසා ආලෝකය උපන්නේ ය. පහන් සිල ඇතිවීමත් ආලෝකය ඇතිවීමත් අතර කාල වශයෙන් දීර්ඝ පරතරයක් නොවුන ද මුලින් ඇතිවූයේ පහන් සිල බව පැහැදිලිය. එයින් පැහැදිලි කැරෙන්නේ එක් දෙයක උපත තවත් දෙයක උපතට ප්‍රත්‍යය වන බවය. ඒ අනුව පළමු වැකි දෙකින් පැවැත්ම හා ඉපැත්ම පිළිබඳවත් දෙවන වැකි දෙකින් නොපැවැත්ම හා නැති වී යාම පිළිබඳවත් සඳහන් වෙයි. එක් තරාදි තටුවක් පහත්ව නොතිබිණි නම් අනෙක් තටුව ඊට සමාන්තරව උස්ව නොතිබෙනු ඇත. පහන් සිල නොහටගත්තේ නම් ආලෝකයක්ද ඇති නොවේ. ආධ්‍යාත්මික කරුණුවලදී ද මෙම න්‍යාය ක්‍රියාත්මක වෙයි. එය පැහැදිලි කරන්නේ පටිච්ච සමුප්පාදයයි.

ඉහත සඳහන් වාක්‍ය යුගලයන්හි හේතු ප්‍රත්‍ය සම්බන්ධතාව දැක්වීමේ සියුම් වෙනස බුදුදහම වැඩිදුරට හැදෑරීමේ දී වටහා ගත හැකිය. වෙනස යයි සඳහන් කළේ ප්‍රවෘත්ති සම්බන්ධය හා උත්පාද සම්බන්ධය දැක්වීමේ වෙනසයි. මෙහිදී ඒ දෙකෙන් ම පැහැදිලි කැරෙන්නේ සියල්ල ම සහේතුක සප්‍රත්‍ය බවයයි තේරුම් ගැනීම ප්‍රමාණවත්ය.

බුදුරජාණන් වහන්සේ බෝධි මූලයේදී පටිච්ච සමුප්පාද ධර්මය මෙනෙහි කළේ කෙසේ ද? එහි දී උන්වහන්සේ මෙනෙහි කළේ ක්‍රමානුකූලව දුක ඇතිවන අයුරු හා දුක නැති වන අයුරුය. අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති ජරා මරණ, සොක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස යන මේවා එකිනෙකට සම්බන්ධව ක්‍රියාත්මක වීම නිසා දුක හට ගන්නා බව උන්වහන්සේ මෙනෙහි කළහ. එසේම ඒවායේ ක්‍රියාකාරිත්වය නැති වීමෙන් දුක නිවී යන ආකාරය ද මෙනෙහි කළහ. දුක ඇති වන ආකාරය දැක්වීම අනුලෝම පටිච්ච සමුප්පාදය ලෙසත්, දුක නැතිවන ආකාරය දැක්වීම පටිලෝම පටිච්ච සමුප්පාදය ලෙසත් හැඳින්වේ.

අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වෙයි.
සංස්කාර ප්‍රත්‍යයෙන් විඥාන වෙයි.

විඤ්ඤාන ප්‍රත්‍යයෙන් නාමරූප වෙයි.
නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වෙයි.
ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි.
ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාව වෙයි.
වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වෙයි.
තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානය වෙයි.
උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි.
භව ප්‍රත්‍යයෙන් ජාතිය වෙයි.
ජාති ප්‍රත්‍යයෙන් ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස වෙයි.
මෙසේ දුක්ඛ රාශියෙහි හට ගැනීම වේ.

මේ අනුලෝම පටිච්ච සමුප්පාදයයි. පටිලෝම පටිච්ච සමුප්පාදය පහත දැක්වේ :

අවිද්‍යාව සම්පූර්ණයෙන් ම නැතිවීමෙන් සංස්කාර නැති වේ.
සංස්කාර නිරෝධයෙන් විඤ්ඤාන නිරෝධය වේ.
විඤ්ඤාන නිරෝධයෙන් නාමරූප නිරෝධය වේ.
නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වේ.
ෂඩායතන නිරෝධයෙන් ස්පර්ශ නිරෝධය වේ.
ස්පර්ශ නිරෝධයෙන් වේදනා නිරෝධය වේ.
වේදනා නිරෝධයෙන් තණ්හා නිරෝධය වේ.
තණ්හා නිරෝධයෙන් උපාදාන නිරෝධය වේ.
උපාදාන නිරෝධයෙන් භව නිරෝධය වේ.
භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ.
ජාති නිරෝධයෙන් ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස නිරෝධය වෙයි.
මෙසේ මේ දුක්ඛ රාශියෙහි නැතිවී යාම වෙයි.

මෙහි අවිජ්ජා නම් ඇත්ත ඇති සැටි නොදැකීමයි. එනම් චතුරාර්ය සත්‍යය නිසි ලෙස අවබෝධ නොවීමයි. සංස්කාර නම් සිතින් කයින් වචනයෙන් කරන පින් පව්ය. විඥාන නම් මවු කුසක පිළිසඳ ගන්නා සිතයි. ඒ සිත හා සම්බන්ධවන වින්දන ශක්තිය ආදී නාම ධර්ම හා මූලික රූප කොටස් නාමරූප නම් වේ. රූප ශබ්ද ආදී අරමුණු ගැනීමට සුදුසු පරිදි සැකසෙන චක්ඛු, සෝත ආදිය ෂඩායතනයි. ඵස්ස නම් ස්පර්ශයයි. එනම් ඇස ආදී ඉන්ද්‍රියයන් සමග රූපාදී අරමුණුත් ඒ සමගම ක්‍රියාත්මක වන විඥානයත් එකට එකතු වීමයි. ඒ ස්පර්ශය නිසා දැනෙන සැප දුක් ආදිය වේදනාවයි. තණ්හා නම් ඒ වින්දනයන් නිසා රූපාදියට ඇලුම් කිරීමයි. ඇලුම් කිරීම නිසා ඒ අරමුණු දැඩි ලෙස සිතින් ග්‍රහණය කිරීම උපාදානයයි. ඒ නිසා කරන කර්ම භව නම් වේ. කර්ම ශක්තිය නිසා නැවතත් ලබන උපත ජාති යන්නෙන් අදහස් කෙරේ. උපතින් පසු සිදු වන දුක් කීපයක් ඊළඟ වචනවලින් දැක්වේ. ජරා නම් දිරා යාමයි. මරණ නම් ශරීරයේ බිඳී යාමයි. කරදර විපත්ති නිසා පසුතැවීම ශෝකයයි. වැලපීම පරිදේවයයි. කායික පීඩා දුක්ඛ නමිනුත් මානසික් පීඩා දෝමනස්ස නමිනුත් දැක්වෙන අතර, උපායාස නමින් දැක්වෙන්නේ සුසුම්ලන ගතිය හෙවත් සිතේ වෙහෙසකර ගතියයි. දුකෙහි ඇති වීම ලෙස සැලකෙන්නේ මේ සියල්ලේ ක්‍රියාත්මක වීමයි. ඒවායේ නැතිවීම දුකෙහි නැතිවීමයි.

මෙයින් පැහැදිලි වන්නේ දුක ඇතිවීම හේතු ප්‍රත්‍යය අනුව සිදු වන බව හා ඒ හේතු ප්‍රත්‍යය වෙනස්වීමෙන් දුක නැති වන බවයි. එසේ නොමැති ව ඒවා ඉබේ අහේතුකව හෝ කිසියම් දෙවි කෙනෙකුගේ මැදිල්ලකට අනුව සිදු නොවන බවයි.

ඉහත සඳහන් පරිදි ජරා මරණාදී පුද්ගල දුක් පමණක් නොව සමාජගත දුක් හෙවත් ගැටලු ද ඇතිවන්නේ හා නැතිවන්නේ ප්‍රතීත්‍ය සමුප්පාද න්‍යායට අනුකූලවය. එනම් හැම සමාජ ගැටලුවකට ම හේතු හා ප්‍රත්‍යය ඇත. ගැටලු විසඳෙන්නේ එම හේතු හා ප්‍රත්‍ය ඉවත් වීමෙනි. එබැවින් එය විශ්ව ව්‍යාප්ත සදාතනික ධර්මතාවයකි. එම ධර්මතාව බුද්ධෝත්පාද කාලවලත් අබුද්ධෝත්පාද කාලවලත් ක්‍රියාත්මක වන්නකි. බුදුරජාණන් වහන්සේ කරන්නේ එය අවබෝධ කර ගෙන ලෝකයාට දේශනා කිරීමයි.

පුහුණුවට :

අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා, විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං නාමරූප පච්චයා සළායතනං, සළායාතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණ සොක පරිදේව දුක්ඛ දෝමනස්සුපායාසා සම්භවන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

භාවිතයට

1. පුහුණුවට දී ඇත්තේ අනුලෝම පටිච්ච සමුප්පාදයයි.
   පටිලෝම පටිච්ච සමුප්පාදය ද අසා දැන ගෙන ලියන්න.

2. ''පටිච්ච සමුප්පාද'' යන්නෙහි අදහස පැහැදිලි කරන්න.

3. ගැටලු විසඳා ගැනීමට ප්‍රතීත්‍ය සමුත්පාද දර්ශනය උපකාර වන ආකාරය නිදසුනකින් පැහැදිලි කරන්න.

# බෞද්ධ කර්ම සංකල්පයේ විශේෂත්වය

කර්මය පිළිබඳ ඉගැන්වීම බුදු දහමට පමණක් සීමා වූවක් නොවේ. ජෛන හින්දු වැනි වෙනත් ආගම්වල ද කර්ම සංකල්පය සඳහන් වේ. එම ඉගැන්වීම් බුදුදහම සමඟ සසඳා බැලීමේ දී බෞද්ධ කර්ම සංකල්පයෙහි විශේෂත්වයක් ඇති බව පැහැදිලි වෙයි. ජෛන ධර්මය අනුව කර්ම යනු ආත්මය සමඟ බැඳුනු ද්‍රව්‍යමය අංශු විශේෂයකි. එහෙත් ආත්ම නමින් ගත හැකි කිසිවක් පුද්ගලයා තුළ නැතැයි සඳහන් කරන බුදුදහම කර්මය ආත්මයක් සමඟ බැඳුනකියි යන අදහස සම්පූර්ණයෙන් ම බැහැර කරයි. කර්මය ද්‍රව්‍යමය වූවකි යන ඉගැන්වීම ද ප්‍රතික්ෂේප කරන බුදුසමය එය මානසික වූවක් බව උගන්වයි.

බෞද්ධ කර්ම සංකල්පයට අනුව කයින් සිදු වන දෙයකට වුව ද මනසේ සබඳතාවක් නොවුනහොත් එය කර්ම ගණයට නොවැටේ. කර්ම ලෙස හැඳින්වෙන්නේ සිතා මතා කරන ක්‍රියාවන්ය. සිතින් සිතා කයින් වචනයෙන් හා මනසින් කර්ම කරන බැවින් "මහණෙනි, මම චේතනාව කර්මය ලෙස හඳුන්වමි" යි බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. සම්පූර්ණ කර්මයක් සිදුවීමට චේතනාව පමණක් ප්‍රමාණවත් නැත. නමුත් ප්‍රධාන වන්නේ චේතනාව බැවින් එය කර්මය ලෙස හඳුන්වනු ලැබේ. එසේ චේතනාව මුල් කොට ඇති ක්‍රියා කර්මය ලෙස හැඳින්වීම බෞද්ධ කර්මය සංකල්පයෙහි විශේෂත්වයකි.

පුද්ගල ජීවිතය හා බැඳුණු සෑම සිද්ධියක්ම පෙර භවයන්හි කරන ලද කර්මයන්හි විපාක යයි නූගැන්වීම ද බෞද්ධ කර්ම ධර්මයේ විශේෂත්වයකි. පුබ්බේකත හේතුවාදය හෙවත් සියල්ල ම පෙර කර්මය අනුව සිදුවෙතැයි කැරෙන ඉගැන්වීම වැරදි දෘෂ්ටියක් බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. ඇතැම් සිද්ධි පෙර කර්ම බලපෑමෙන් විය හැකිය. ඇතැම් ඒවා කාලගුණික දේශගුණික විපර්යාසය අනුව මෙන්ම ආර්ථික සාමාජික බලපෑම් අනුව ද විය හැකිය. බුදු දහමේ නියාම ධර්ම පිළිබඳව උගන්වන්නේ මෙම කරුණ පැහැදිලි කිරීමටය. නියාම ධර්ම පහකි.

1. උතු නියාම 2. බීජ නියාම

3. කම්ම නියාම 4. ධම්ම නියාම

5. චිත්ත නියාම

**උතු නියාමය** නම් ඒ ඒ ඍතුන්හි ඇති වන කාලගුණික වෙනස්වීම්ය. දැඩි නියං කාලයක ජලය හිඟවීම, ගොවිතැන් පාළු වීම, ආහාර පාන දුර්ලභ වීම, බෝවන රෝග බහුල වීම ආදිය නිසා පුද්ගලයාට කරදර හිරිහැර සිදු වෙයි. වර්ෂාපතනය සමව සිදුවන කාලවල එම දුෂ්කරතාවයන්ට මුහුණපෑමට සිදු නොවේ. මේ වෙනසට හේතු වූයේ පුද්ගලයාගේ අතීත කර්මය නොව කාලගුණික විපර්යාසයයි.

කොස් ඇටයකින් කොස් පැලයක් හට ගන්නේ **බීජ නියාමය** අනුවය. දරුවන් මවුපියන්ගේ හැඩරුව ගැනීමට බීජ නියාමයට අනුව සිදුවන්නකි. ගමන් විලාසය, කට හඬ ආදිය ද මවුපියන්ගේ බීජ උරුමයට අනුව සිදු විය හැකිය. රූමත් මවුපිය දෙපලකට අතිශයින් විරූපී දරුවකු ලැබුණහොත් එහි දී බීජ නියාමය පරදවා ඇතැම්විට කර්ම නියාමය ක්‍රියාත්මක විනැයි සිතිය හැකිය.

ස්වාභාවික ව පුද්ගලයෙක් වයස්ගත වීම, ඔවුන්ගේ කෙහෙ රවුලු පැසීම, ඇඟ රැලි වැටීම, දත් හැලීම, ආදිය **ධම්ම නියාමය** පැහැදිලි කැරෙන නිදසුන්ය. ඒවා අතීතයේ කරන ලද කර්මයන්ගේ විපාක ලෙස හැඳින්විය නොහැකිය. සිත් ඇතිවීම, නැතිවීම ක්ෂණිකව සිදුවන්නකි. ඉතා දුර වහා ගමන් කරන ශක්තියක් සිතෙහි ඇත. එක් ක්ෂණයක සිත් දෙකක් ඇති නොවේ. ලෝභ චේතනාදියෙන් යුක්ත වූ විට සිත ඊට අනුව ක්‍රියාක්මක වන අතර, අලෝභාදියෙන් මිශ්‍ර වූ විට ඊට අනුව ක්‍රියාත්මක වේ. ඒ සිතේ ස්වභාවයයි. **චිත්ත නියාමය** ලෙස හැඳින්වෙන්නේ මෙම ස්වාභාවයයි.

කර්මයක් සිදුවූ විට විපාක ගෙන දෙන ශක්තියක් එහි ම ඇතුලත් වේ. බාහිර පුද්ගලයෙකුගේ මෙහෙයවීමකින් තොරව සුදුසු පරිසරයක් ගොඩ නැගුණු විට විපාකය ඉදිරිපත් වේ. විපාකය ඉදිරිපත් වන්නේ ක්‍රියාවට ප්‍රතික්‍රියාවක් වශයෙනි.

ඇතැම් කර්ම මේ ජීවිතයේ දී විපාක දෙන අතර ඇතැම් ඒවා ඊළඟ ආත්ම භාවයේදී විපාක දෙයි. සසර කවදා හෝ විපාක දිය හැකි කර්ම ද ඇත. ඇතැම් කර්ම විපාක නොදී අහෝසි වී යයි. කර්මයන්ගේ මේ ස්වභාවය කර්ම නියාමයයි.

පුද්ගලයා කෙරෙහි බලපාන එකම දේ කර්මය නොවන බව නියාම ධර්ම අනුව පැහැදිලි වෙයි. රෝග හට ගන්නා හේතු අතර කර්මය එකක් පමණක් බවද බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ සියල්ල ම සිදු වන්නේ පෙර කර්මයෙන්ය යන මතය බුදුදහමින් ප්‍රතික්ෂේප වන බවයි.

සමහර කර්මයන්ගේ විපාක දාන ශක්තිය උත්සාහය වැනි බාහිර කරුණුවලින් පාලනය කළ හැකි යයි දැක්වීම ද බෞද්ධ කර්ම සංකල්පයෙහි විශේෂත්වයකි. පයෝග සම්පත්තිය නිසා සමහර අකුසල කර්මත් පයෝග විපත්තිය නිසා සමහර කුසල කර්මත් වි පාක දීමෙන් වැලකෙන බව බුදුදහමෙහි සඳහන් වෙයි. ගති, උපධි, කාල සම්පත් හා විපත් නිසා ද කර්ම විපාක දීමේ වෙනස්කම් සිදු විය හැකි බව බෞද්ධ ඉගැන්වීමයි.

යහපත් ආර්ථික පරිසරයක් ඇති පවුලක උපන් අයෙකුට සමහර අකුසල කර්ම විපාක දීමට අවකාශ නොලැබී යා හැකිය. ඒ ගති සම්පත් නිසාය. තිරිසන්ගත සතෙකුව ඉපදී විපාක ලැබිය යුතු කර්මයක් සිදු කළ අයකු වෙනත් යහපත් කර්මයක් නිසා මිනිසකුව උපන්නොත් යටකී අකුසල කර්මයට ඉඩක් නොලැබී යා හැකිය. එය ද ගති සම්පත්තිය නිසාය. අයහපත් පවුල් පරිසරයක හෝ තිරිසන් ආත්ම භාවයක උපත ලද විට සමහර කුසල විපාක නොලැබීමට ඉඩ ඇත. ඒ ගති විපත්තිය නිසාය.

කුසල කර්මයක් නිසා බොහෝ සුව පහසුකම් ඇති පවුලක උපන්නත් ශාරීරික අඩුපාඩුවක් නිසා සැප විඳීමට නොලැබිය හැකිය. එහි ඇත්තේ උපධි විපත්තියයි. අකුසල කර්මයක් බලපෑමෙන් දුප්පත් පවුලක උපන්නත් මනා රූසපුව නිසා සුව පහසු පරිසරයක සැප සම්පත් විඳීමට භාග්‍යය උදා විය හැකිය. ඒ උපධි සම්පත්තිය නිසාය. සැප

සම්පත් ලැබීමට අවශ්‍ය පුණ්‍ය ශක්තීන් තිබුණත් රටේ ආර්ථික දුෂ්කරතාවන් බහුල කාලයක ඒ පුණ්‍ය විපාක විඳීමට ඉඩක නොලැබේ. එහි දක්නට ලැබෙන්නේ කාල විපත්තියය.

රටේ සමෘද්ධිමත් කාලවලදී සමහර අකුසල කර්මවලට ඉඩක් නොලැබේ. ඒ කාල සම්පත්තිය නිසාය. වඩා ශක්තිමත් කර්මයක් නම් මේ කිසිවකින් යටපත් නොවී විපාක දෙනු ලැබේ. කෙසේ නමුත් ඇතැම් කර්ම වෙනත් බලපෑම් මත පාලනය වන බව ඉගැන්වීම බෞද්ධ කර්ම සංකල්පයෙහි දක්නට ලැබෙන විශේෂත්වයකි.

දුකින් මිදීමට නම් තමා එතෙක් සිදු කර ඇති සියලු පව්කම් ගෙවා දැමිය යුතු යයි ඇතැම් ආගම්වල සඳහන් වෙයි. එම අදහස ප්‍රතික්ෂේප කිරීම බෞද්ධ කර්ම ධර්මයෙහි තවත් විශේෂත්වයකි. එම අදහස පිළිගතහොත් සිල් රැකීම භාවනා කිරීම ආදිය තේරුමක් නැති ක්‍රියා බවට පත්වන්නේ යයි බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. බුදු දහම අනුව නිවන් දැකීම සඳහා පුද්ගලයෙකු සිය අතීත කර්ම සියල්ල ම විඳ අවසන් කළයුතු නොවේ. රහත් වී අළුතින් කර්ම නොකරන තත්වයට පත්වුවහොත් පුනර්භවයක් නැත. විපාක නොදී ඉතිරි වී තිබුණු කර්මවලට විපාක දීමට අවස්ථාවක් නොලැබී ඒවා අහෝසි වී යයි. අංගුලිමාල රහතන් වහන්සේගේ පරිනිර්වාණය ඊට හොඳ ම නිදර්ශනයකි. තමාගේ ම අභ්‍යන්තර පරිවර්තනයකින් එබඳු තත්වයකට පත්වනු මිස ශාස්තෘවරයාට හෝ දෙවි කෙනෙකුට යාඥා කර කර්ම විපාක නොලැබෙන සේ සමාවක් ලබා ගත හැකි යයි බෞද්ධ කර්ම ධර්මයෙහි සඳහන් නොවීම විශේෂ ලක්ෂණයකි.

භාවිතයට :

බෞද්ධ කර්ම සංකල්පයෙහි විශේෂතා ලෙස මෙම පාඩමේ සඳහන් වන කරුණු අංක අනුපිළිවෙලකට මාතෘකා වශයෙන් පමණක් ලියන්න.

## 22 පාඩම

# කර්ම සංකල්පය සහ සදාචාර සංවර්ධනය

සත්ව ඝාතනය, සොරකම, බොරුකීම, ආදී කිසිවකින් සිදුවන පාපයක් නැතැයි ද දන්දීම, ඉඳුරන් සංවර කර ගැනීම, ආදියෙන් සිදුවන පිනක් නැතැයි ද අකිරියවාදී ආගමිකයෝ ඉගැන්වූහ. කර්මයක් හෝ පුනර්භවයක් නැති බැවින් ජීවත්ව සිටින කාලය තුළ හොඳින් කා බී විනෝදයෙන් සිටිය යුතු යයි ඇතමෙක් කීහ. මෙබඳු අදහස් පිළිගත් සමාජයක සදාචාරවත් පැවැත්මක් අපේක්ෂා කළ හැකි නොවේ. කරන කියන දෙයක විශේෂ විපාකයක් නැත්නම් ඒ කරන කියන දේ තෝරා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවක් දැක්විය යුතු නොවේ. ඕනෑම දෙයක් කිරීමට ඕනෑම වචනයක් ප්‍රකාශ කිරීමට ලජ්ජාවක් හෝ බියක් දැක්විය යුතු නොවේ. ලජ්ජා භය දෙකින් තොරවූ සමාජයක සදාචාර සංවර්ධනයට ඉඩක් නැත.

හිරි ඔත්තප්ප දෙක හෙවත් ලජ්ජා භය දෙක ලෝක පාලක ධර්ම ලෙස බුදු දහමෙහි සඳහන් වෙයි. ලොවැ සදාචාරය ඇතිවන සේ පාලනය වන්නේ එම ධර්ම දෙකිනි. ඒවා නැති සමාජය තිරිසන් තත්වයට වැටෙන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හිරි ඔත්තප්ප දෙකින් යුතු සමාජයක් ගොඩනගා ගැනීමට උපකාර වෙයි. දුසිරිතෙහි යෙදීමට, පව්කම් කිරීමට ලජ්ජා වන්නේ හෝ බිය වන්නේ ඒවා දුසිරිත් බව, පාපක්‍රියා බව පිළිගත් තැනැත්තාය. බෞද්ධයා එබඳු තැනැත්තෙකි. බෞද්ධ කර්ම සංකල්පයට අනුව ප්‍රාණඝාතය පාපක්‍රියාවකි. අකුසල කර්මයකි. මෙලොවත් පරලොවත් දුක් විපාක ගෙන දෙන්නකි. මේ පිළිගැනීම ඇති තැනැත්තා ජීවිතයක් විනාශ කිරීමට බිය වෙයි. සියලු සතුන් කෙරෙහි දයාවත් අනුකම්පාවත් ඇති කර ගනියි. ජීවිත විනාශ නොකරන සතුන් කෙරෙහි දයාව - අනුකම්පාව ඇති සමාජය සදාචාර සම්පන්න සමාජයකි. දූෂිත සමාජයක ලක්ෂණයක් වූ සොරකම ද මෙලොව හා පරලොව දුකට හේතුවන අකුසල කර්මයක් බව බුදුදහම උගන්වයි. එම ඉගැන්වීමේ සත්‍යතාව බුද්ධිමත්ව වටහාගත් තැනැත්තා නුදුන් දේ ගැනීමෙන් වළකියි. දුන් දේ පමණක් ගැනීමෙන් සෑහීමකට පත්වීමටත් හැකි හැම

විටම අන් සන්තකය පවා ආරක්ෂා කිරීමටත් පෙළඹෙයි. එබන්දන්ගෙන් යුක්ත වූ සමාජය සදාචාර සම්පන්න වූවකි.

බෞද්ධ කර්ම ධර්මයට අනුව කාම මිත්‍යාචාරය කායික අකුසල කර්මයකි. මෙලොව පරලොව දෙකේදී ම දුක් විඳීමට හේතුවන පවක් එයින් සිදු වේ. ඒ බව පිළිගත් සමාජයෙහි වෙසෙන්නේ කාම අපරාධ කිරීමට බියක් ලජ්ජාවක් ඇති පුද්ගලයන්ය. බොරුකීම ආදී වාචසික අකුසල් කිරීමෙන් වැලකීමට ද පවට බිය පුද්ගලයා උත්සාහවත් වෙයි. එසේ වූ විට අනුන් නොරවටන, අසභ්‍යවූත් අප්‍රසන්නවූත් වචන නොපවසන, පුද්ගලයන් අතර හා සමාජය තුළ මතභේද ඇති කැරෙන ප්‍රකාශනවලින් ඉවත්වන, සාමය සමගිය ඇතිකරන අර්ථවත් වදන් පවසන සදාචාරසම්පන්න සමාජයක් ඇති කර ගත හැකිය. සමාජයේ දුසිරිත වැඩි කැරෙන ප්‍රබල කරුණකි සුරාපානය. එය පුද්ගලයාගේ හිරිඔතප් නැති කැරෙන, ධනය, සෞඛ්‍ය හා ගුණනුවණ පරිහානියට පත්කරන පරලොවදී උමතු පුද්ගලයෙකු බවට පත් කැරෙන කර්මයක් බව බුදුදහම උගන්වයි. එම ඉගැන්වීම පිළිගෙන සුරාපානයෙන් ඉවත් වීමෙන් සමාජය සදාචාර සම්පන්න වේ.

සදාචාරවත් සමාජයක ලක්ෂණය වන්නේ දුශ්චරිතයන්ගෙන් වැලකීම පමණක් නොවේ. පරිත්‍යාගය, පරෝපකාරය, ගුරු දෙගුරුන්ට සැලකීම, ගුණ නුවණින් හා වයසින් වැඩි අයට ගරු කිරීම වැනි ලක්ෂණ ද එහි තිබිය යුතුය. බෞද්ධ කර්ම සංකල්පයට අනුව දන්දීම ආදී සෑම යහපත් ක්‍රියාවක් ම පින්කම්ය. ඒ බව පිළිගත් පුද්ගලයෝ දන්දීමට පෙළඹෙති. මවට පියාට උවටැන් කිරීමට යොමුවෙති. වැඩි වැඩියෙන් යහපත් ක්‍රියා තෝරාගෙන කිරීමට පෙළඹෙති. පරෝපකාරයෙහි යෙදෙති. එබඳු ලක්ෂණ වැඩි වූ තරමට සමාජය සදාචාර සම්පන්න වේ.

බෞද්ධ ඉගැන්වීම් අනුව පුද්ගලයාට මුහුණ පෑමට සිදුවන සෑම ක්‍රියාවක්ම අතීත කර්මයකම විපාකයක් නොවන බැවින් අසරණයන් කෙරෙහි දයානුකම්පාවෙන් යුතුව කටයුතු කිරීමට පෙළඹීමක් ඇති වේ. දුගියන් ඒ තත්වයට පත්වී ඇත්තේ ඔවුන්ගේ අතීත කර්ම නිසාම යයි නිගමනය කිරීමට බෞද්ධ කර්ම ධර්මය වටහාගත් තැනැත්තා ඉක්මන් නොවෙයි. වර්තමාන ඇතැම් කර්ම හේතුවෙන් ද සමහර පුද්ගලයන් දුගී භාවයට පත්වන බව හෙතෙම දනී. එබැවින් දුගියන්ගේ අසරණභාවය නැති කිරීම සඳහා තමාට කළ හැකි දෙයක් කිරීමට පෙළඹෙයි. එබඳු ක්‍රියාවන්ගෙන් සමාජය වඩාත් සදාචාර සම්පන්න වේ.

බෞද්ධ කර්ම සංකල්පයට අනුව තමා කරන හොඳ - නරක ක්‍රියාවන්ගේ විපාක විඳීමේ වගකීම පැවරෙන්නේ ද තමාටමය. එය වෙන කෙනකුට පැවරිය නොහැකිය. ඇතැම් කර්මයන්ගේ විපාක මේ ජීවිතයේදී ම ලැබේ. ඇතැම් ඒවා ඊළඟ ආත්ම භාවයේදී ලැබෙන අතර සමහර කර්ම විපාක සසර කුමන ආත්මභාවයකදී හෝ විඳීමට සිදු වේ. මෙසේ තමා කරන කියන දෙයෙහි විපාක විඳීමේ වගකීම තමා වෙතම පැවැරෙන හෙයින් දුක් විපාක ලබාදෙන දුසිරිත් සමාජයෙන් ඈත් වී යයි.

කෝපයට පත් වී කාන්තාවකගේ ඇස් අන්ධ කළ වෛද්‍යවරයකු සසර නොයෙක් දුක් විඳ අවසාන ආත්ම භාවයේදී ඇස්දෙක අන්ධ වීමට භාජනය වීම පිළිබඳ කර්ම ඵල කතාන්තරය චක්ඛුපාල තෙරුන්ගේ කථාවස්තුවෙන් පැහැදිලි වෙයි. ඌරන් මැරීම ජීවිකාව කරගත් අයකු මෙලොවදී නොයෙක් දුක් විඳ පරලොව අපාගත වීම පිළිබඳ පුවත චුන්ද සූකරික කථාවස්තුවෙන් ඉදිරිපත් කරයි. එම කථා පුවත් මගින් පැහැදිලි කැරෙන්නේ පුද්ගලයා කරන කියනදේට විපාක විඳීමට සිදුවන බවයි. එබඳු සිදුවීම් ඇසුරින් කර්මය හා විපාකය අතර සම්බන්ධය වටහා ගන්නා තැනැත්තා දුසිරිත්වලින් හැකිතාක් වෙන්ව සුසිරිත් පුහුණු කර ගනී. එය සදාචාර සංවර්ධනයට අතිශයින් ම ඉවහල් වෙයි. තමා කළ සියලු කර්මයන්හි විපාක විඳ අවසන් වනතුරු දුකින් නිදහස් විය නොහැකි යයි බුදුදහම නොපිළිගන්නා හෙයින් මුලින් පවට බරවූ පුද්ගලයෙකුට වුවද වෙනස් වී සුසිරිතෙහි යෙදීමට මග පෙන්වනු ලැබේ. තමාට කවදාවත් වෙනස්විය නොහැකි යයි පිළිගත් තැනැත්තෙකුගෙන් සදාචාරයක් බලාපොරොත්තු විය නොහැකිය. බෞද්ධ කර්ම ධර්මයට අනුව දුසිරිතෙහි යෙදුන තැනැත්තා සුසිරිතට යොමු කැරෙන බැවින් සදාචාර සංවර්ධනයට මග සැලසේ. මේ කරුණු අනුව පැහැදිලි වන්නේ කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නගා ගැනීමට බෙහෙවින් ම උපකාර වන බවයි.

භාවිතයට

1. කර්මඵල විශ්වාසය නිසා පුද්ගලයා දුසිරිත්වලින් ඉවත්වන අයුරු පැහැදිලි කරන්න.

2. කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගලයා හොඳ දේ කිරීමට පොළඹවන අයුරු පැහැදිලි කරන්න.

3. සදාචාරවත් ක්‍රියා හා දුරාචාරවත් ක්‍රියා ලෙස හැඳින්විය හැකි දේ වෙන වෙනම සටහන් කරන්න.

## 23 පාඩම

# පුනර්භවය තහවුරු වන සාධක

පුනරුත්පත්ති, පුනර්භව යන වචන දෙක ම වර්තමානයෙහි යෙදෙන්නේ එකම අර්ථයෙනි. එයින් ප්‍රකට කෙරෙන්නේ ජීවත්ව සිටින අයෙකු මිය ගොස් අළුත් උපතක් ලැබීමයි. අතීතයේ මේ වචන දෙකම යෙදී ඇත්තේ එකම සංකල්පයක් හැඳින්වීම සඳහා වුව ද අර්ථ වශයෙන් වෙනසක් පවතී. ඇතැම් ආගමිකයන් කීයේ පුද්ගල ජීවය තුළ ආත්ම නමින් හැඳින්විය යුතු ස්ථිර දෙයක් තිබෙන බවයි. මරණයේදී එම ආත්මය ශරීරයෙන් ඉවත් ව ගොස් අළුත් ශරීරයක් ලැබීම ඔවුන් හැඳින්වූයේ පුනරුත්පත්තිය කියායි. පුද්ගලයෙකුගේ මරණයේදී ශරීරයෙන් ඉවත් වී ගොස් නව ශරීරයකට ඇතුලත් වන ආත්මයක් ගැන බුදුදහමෙහි සඳහන් නොවේ. මේ ජීවිතයේ ක්‍රියාත්මක වන සිත් පරපුරෙහි අවසාන සිත ඇසුරු කර ගෙන නව සිත් පරපුරක්, අළුත් රූපකායක් ආශ්‍රයෙන් ක්‍රියාත්මක වේ. එම සිදුවීම බුදුදහමෙහි හැඳින්වෙන්නේ "පුනර්භවය කියායි". වචන දෙකින් අදහස් කැරෙන දෙයෙහි එබඳු වෙනසක් තුබුණද වර්තමානයෙහි සමාන අර්ථයෙන් ව්‍යවහාර වන බව පෙනේ.

ඇතැම් ආගමිකයෝ පුනරුත්පත්තියක් හෝ පුනර්භවයක් හෝ ඇතැයි නොපිළිගත්හ. මරණයෙන් සම්පූර්ණ ජීවිතය ම කෙළවර වන බව ඔවුහු කීහ. මෙම මතය දරන්නෝ වර්තමානයේ ද සිටිති. එබැවින් පුනර්භවයක් ඇතැයි බුද්ධිමත් ලෙස අප පිළිගන්නේ කුමන පදනමක පිහිටා දැයි විමසිලිමත් වීම වැදගත්ය.

මූලික වශයෙන් ම අප පුනර්භවයක් ඇතැයි පිළිගන්නේ බුද්ධ වචනය පදනම් කරගෙනය. අපි බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය පිළිගත් උන් වහන්සේගේ අනුගාමිකයෝ වෙමු. උන් වහන්සේගේ දෙසුම් කෙරෙහි බුද්ධිමත් ලෙස විශ්වාසය තබා පුනර්භවයක් ඇති බව අපි පිළිගනිමු.

චතුරාර්ය සත්‍යය අවබෝධ නොවීම නිසා තමන් වහන්සේත් ශ්‍රාවකයනුත් දිගු කලක් සසර සැරිසැරූ බව බුදුරජාණන් වහන්සේ

දේශනා කර ඇත. චතුරාර්ය සත්‍යය නිසි පරිදි අවබෝධ වීමෙන් පසු "මේ මාගේ අන්තිම උපතයි දැන් පුනර්භවයක් නැතැ" යි යන දැනීම ඇති වූ බව ධම්මචක්කප්පවත්තන සූත්‍රයේදී දේශනා කර ඇත. එයින් පැවසෙන්නේ එතෙක් උන්වහන්සේ සසර අනන්ත කාලයක් පුනර්භවයට පත්වූ බවයි.

ජාතක කථා මගින් ඉදිරිපත් කර ඇත්තේ ද බුදුරජාණන් වහන්සේගේ අතීත ජීවිත පිළිබඳ තොරතුරුය. ඇතැම් භික්ෂූන් වහන්සේ මුහුණ පෑ ගැටලු අතීත භවයන්හි කරන ලද කර්මයන්ගේ විපාක යයි බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් අවස්ථා ද ඇත. නිදසුනක් ලෙස චක්ඛුපාල තෙරුන් වහන්සේගේ කතා පුවත දැක්විය හැකිය.

වර්තමාන ජීවිතය ගත කළ පිළිවෙල අනුව ඊළග ජීවිතය සකස් වූ ආකාරය ගැන කරන ලද පැහැදිලි කිරීම ද ඇත. පූරාණ හා ඉසිදත්ත යන දෙදෙන මරණින් පසු තුසිත කායිකව උපත ලැබූ බව ප්‍රකාශ කිරීම නිදසුනකි.

බුදුරජාණන් වහන්සේ ශ්‍රද්ධාව ඇති බෞද්ධයාට උන්වහන්සේගේ වචන කෙරෙහි පූර්ණ විශ්වාසය තබා පුනර්භවයක් ඇති බව පිළිගත හැකිය. එහෙත් අබෞද්ධයන්ට හා ශ්‍රද්ධාවෙන් හීන වූ බෞද්ධයන්ට බුද්ධ වචනය පමණක් ප්‍රමාණවත් නොවේ. එබඳු අයගේ ප්‍රයෝජනය සඳහා වෙනත් සාධක ද සැලකිල්ලට ගත යුතු වේ.

යමක් අපගේ නුවණට ගොදුරු නොවූ තරමින් ප්‍රතික්ෂේප කිරීම සුදුසු නොවේ. අඳුරු කාමරයක ඇති දෑ ආලෝකයක ආධාරයකින් තොරව අපට නොපෙනේ. එහෙත් ඇතැම් සතුන්ට ආලෝකයකින් තොරව ම අඳුරු කාමරයේ ඇති දෑ දැක ගත හැකිය. අපට නැති ශක්ති ඇතැම් සතුන්ට ද තිබෙන බව එයින් පැහැදිලි වේ. සොරකුගේ සෙරෙප්පුවේ ගඳ අනෙක් සියළු ගන්ධයන්ගෙන් වෙන් කර ගෙන ඒ අනුව ගොස් සොරා අල්ලාදීමට සමත් පුහුණු සුනඛයෝ වෙති. එහෙත් එබඳු ශක්තියක් අපට නැත. යම් ශක්තියක් අපට නැතිවූ තරමින් අන් අයටද එය නැතැයි නිගමනය කළ නොහැකිය.

තමන් වහන්සේගේ අතීත ආත්මභාවය දැකීමට යොමු වන පුබ්බේ නිවාසානුස්සති ඤාණයත් සත්වයන්ගේ චුතවීම් ඉපදීම් දැකීමට යොමු වන චුතූපපාත ඤාණයත් බුදුරජාණන් වහන්සේට ඇති බව අපි පිළිගනිමු. එබඳු පිළිගැනීමක් නැති අයට පුනර්භවයක් ඇති බව අවබෝධ කරවිය හැක්කේ වෙනත් සාක්ෂි පදනම් කරගෙනය.

පුනර්භවය තහවුරු කිරීමට අදාළ වන සාක්ෂි, වර්ග තුනකට බෙදා දක්වනු ලැබේ. එහි පළමු වර්ගය හැඳින්වෙන්නේ **සම්පරීක්ෂණමය සාක්ෂි** කියායි. ඒවා විවිධ පර්යේෂණ මගින් හෙළි කරනු ලබන සාක්ෂියි. පුද්ගලයකු මෝහනයට පත් කර ඒ පුද්ගලයාගේ ම අතීත ජීවිත පිළිබඳ තොරතුරු හෙළි කර ගත් අවස්ථා ඇත. එබඳු එක් ප්‍රසිද්ධ ම අවස්ථාවකි අමෙරිකාවේ රූත් සීමන්ස් මහත්මිය පිළිබඳ සිද්ධිය. වශීකරණයට භාජනය කරනු ලැබූ ඇය වසර 160 කට පමණ පෙර අයර්ලන්තයේ "බ්‍රයිඩේමර්ෆි" නම් කාන්තාවක වූ බව හෙළි කළාය.

ඇගේ පෙර ජීවිතයට අදාළව පළ කළ තොරතුරු රැසක් ම සත්‍ය බව අනාවරණය කර ගන්නා ලදි.

ඇතැම් අය ස්වයං මෝහනයට පත්වී අන් අය ගැන පළ කළ තොරතුරුවලින් ඒ අයගේ අතීත ආත්මභාව ගැන කියැවී ඇත. එබඳු තොරතුරු රැසක් "සංසාර මන්දිර" නම් පරිවර්තන කෘතියෙහි ඇතුලත්ව තිබේ. එහි තිබෙන්නේ එඩ්ගා කේසී නම් තැනැත්තා ස්වයං මෝහනයට පත්ව කරන ලද හෙළි කිරීම්ය. ඉහත ආත්මභාවයකදී විරුද්ධ ගෝත්‍රිකයන්ගේ ඇස්වලට උල්වලින් ඇන අන්ධ කිරීමේ නියුතු වූවකු වර්තමාන ජීවිතයේදී අන්ධ වීම පිළිබඳ පුවත එහි සඳහන් වන්නකි.

පුනර්භවය තහවුරු කිරීමට අදාල වන දෙවන සාක්ෂි වර්ගය හැඳින්වෙන්නේ **ස්වයමුද්ගත සාක්ෂි** කියායි. ඒවා නම් කුඩා ළමයින්ට ජාතිස්මරණ ශක්තිය ලැබී ඔවුන් පළ කළ තොරතුරුවලින් හෙළි වන කරුණුය. ඉන්දියාවේ ශාන්තිදේවි නම් දැරිය පෙර ආත්මභාවයේදී ලුග්දි නමින් උපත ලබා සිටි බව හෙළි කළාය. ලංකාවේ ඤාණතිලකා නම් දැරිය ඊට පෙර තිලකරත්න නමින් උපත ලබා සිටි බව පැවසුවාය. ඒ

දෙදෙනා සිය අතීත ජන්මයන්ට අදාළව පළ කළ තොරතුරු බොහොමයක් සත්‍ය බව පරීක්ෂණ වලින් හෙළි විය.

සම්පරීක්ෂණමය සාක්ෂි හා ස්වයංමුද්ගත සාක්ෂි හැර අනෙක් ඒවා තුන්වන සාක්ෂි වර්ගයට ඇතුලත් කෙරේ. අසාමාන්‍ය දක්ෂතා ඇති ළමයින් පුනර්භවය සනාථ කරන එක් සාධකයක් ලෙස එහිදී ඉදිරිපත් කැරේ. අමෙරිකාවේ ආශ්චර්යවත් දරුවා නමින් හඳුන්වන ලද විලියම් ජේම්ස් සිඩිස් වයස දෙක වන විට ප්‍රංශ, ජර්මන්, රුසියන් හා ඉංග්‍රීසි යන භාෂා කථා කිරීමටත්, කියවීමට හා ලිවීමටත් හැකියාව ලැබුවෙකි. වයස එකොළහේදී මහාචාර්ය සම්මේලනයක් අමතා නවීන විද්‍යාව පිළිබඳ දේශනයක් විලියම් ජේම්ස් විසින් පවත්වා ඇත. එබඳු හැකියාවන් පෙර භවයකදී ලත් පුහුණුව මත ලැබෙන්නට ඇතැයි සිතනු ලැබේ. බෞද්ධ සූත්‍ර ධර්ම ඉතා නිවැරදි ලෙස කටපාඩමින් කියන දරුවකු පිළිබඳ ලංකාවේ මහනුවර ප්‍රදේශයෙන් වාර්තා විය. ඔහු එම සූත්‍ර ධර්ම මේ ජීවිතයේ කිසි දිනෙක පාඩම් කර නැත. එසේ නම් පෙර භවයකදී පාඩම් කර ගත් ඒවා විය යුතුය.

පෙර කිසි දිනෙක හමුනොවූ ඇතමුන් හමු වූ විට බොහෝ කලක සිට ඇසුරු කළ සේ සුහද හැඟීම් ඇතිවීම ද පෙර ආත්මභාවයක සම්බන්ධය කියාපාන්නක් විය යුතුය.

මෙබඳු කරුණු ගැන බුද්ධිමත්ව කල්පනා කරන්නෙකුට පුනර්භව සංකල්පය මිත්‍යා සංකල්පයක් නොවන බව වටහා ගැනීම අපහසු නොවේ.

භාවිතයට

1. පුනරුත්පත්තිය, පුනර්භවය යන සංකල්පයන්හි වෙනස පැහැදිලි කරන්න.
2. චක්ඛුපාල තෙරණුවන්ගේ ඇස් අන්ධවීම කෙරෙහි බල පෑ අතීත පුවත විස්තර කරන්න.
3. පුනරුත්පත්තියට අදාළව පුවත්පත්වල පළවන ලිපි එකතු කරන්න.

24 පාඩම

# සත්වයා පිළිබඳ බෞද්ධ විග්‍රහය

සර්වබලධාරී දෙවි කෙනෙකු විසින් සත්වයා මවන ලදැයි ඇතැම් ආගම්වල ඉගැන්වේ. එය වැරදි අදහසක් බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. මුලින් ම සත්වයා ඇතිවූයේ කෙසේදැයි විස්තර කිරීමට බුදුරජාණන් වහන්සේ උත්සාහ දරා නැත. ඊට හේතුව ඒ පිළිබඳ දැනීම නිවන් අවබෝධයට අවශ්‍ය ම නොවීමයි. උන්වහන්සේ කළේ උපදිමින් මැරෙමින් සසර දුකට භාජනය වී සිටින සත්වයාගේ එම දුක නැති කර ගැනීමට මග පෙන්වීමයි. සත්වයා පිළිබඳ විවරණය කරන්නේ එම අරමුණ ඇතිවය.

මෝටර් රථය යයි කියන්නේ කුමක් ද? එය තනි උපකරණයක් නොවේ. උපකරණ රාශියක එකතුවකි. එම උපකරණ සියල්ල වෙන වෙනම තැබුවහොත් එතැන මෝටර් රථයක් නැත. ඒවා කිසියම් පිළිවෙලකට ගලපා ඒ සියල්ලේ එකතුව හැඳින්වීමට මෝටර් රථය යන ව්‍යවහාරය යොදා ගෙන ඇත. අප සත්වයා යයි ව්‍යවහාර කරන්නේ ද එබඳු කොටස් රැසක එකතුවකටය. එම කොටස් ස්කන්ධ යන නමින් හැඳින්වේ. මිනිසා නැමැති සත්වයා සකස් වී තිබෙන්නේ ස්කන්ධ පහක එකතුවෙනි. ඒවාට පංචස්කන්ධ යයි කියනු ලැබේ. එම ස්කන්ධ පස මෙසේය :

1. රූපස්කන්ධය
2. වේදනාස්කන්ධය
3. සංඥාස්කන්ධය
4. සංස්කාරස්කන්ධය
5. විඥානස්කන්ධය

නාම රූප යනුවෙන් බෙදා දැක්වෙන්නේ ද මෙම පංචස්කන්ධයය. රූප කොටසට රූපස්කන්ධය ඇතුලත් වන අතර අනෙක් ස්කන්ධ සතර නාම කොටසට ඇතුලත් වෙයි. ඒ අනුව අප සත්වයා, මිනිසා යනුවෙන් ව්‍යවහාර කරන්නේ නාමරූප දෙකට බව පැහැදිලිය.

රූප යනුවෙන් හැඳින්වෙන්නේ තනි රූපයක් නොවේ. රූප රැසක එකතුවකි. එම රූප රාශිය හැඳින්වීමටය. "රූපස්කන්ධ" යන ව්‍යවහාරය කැරෙන්නේ. ස්කන්ධ යන වචනයේ තේරුම ද රාශිය - සමූහය යන්නය. රූප රාශිය අභිධර්ම පාඩම්වල විස්තර වෙයි.

වේදනා ස්කන්ධය ලෙස හැඳින්වෙන්නේ ද තනි වූ එක් වේදනාවක් නොවේ. වේදනා රාශියකි. සැප වේදනා, දුක් වේදනා, මධ්‍යස්ථ වේදනා ආදි සියල්ල ඊට ඇතුලත්ය. වේදනාව චෛතසිකයකි. එනම් සිතෙහි ඇතිවන්නකි. ලස්සන රූපයක් අපේ ඇසට හමුවූ විට සිතට මිහිරක් දැනේ. එය සුඛ වේදනාවකි. පිළිකුල් සහගත දෙයක් දුටුවිට අමිහිරක් දැනේ. එය දුක්ඛ වේදනාවකි. සමහර දේ දුටුවිට අමුතු මිහිරක්වත් අමිහිරක්වත් නොදැනේ. එම අවස්ථාවේ දැනෙන්නේ සැපක් හෝ දුකක් නොවූ මධ්‍යස්ථ ගතියකි. මෙබඳු වින්දන සියල්ල ම වේදනාස්කන්ධයට ඇතුලත් වේ.

ඇසට ගොදුරුවන රූප අපි හඳුනා ගනිමු. ඒවායේ මිහිරි බව අමිහිරි බව ආදිය සිතේ සටහන් කර ගනිමු. කණට ශබ්ද ගොදුරු වූ විට ද ඒ ශබ්ද හඳුනාගෙන සිතේ සටහන් කර ගනිමු. එසේ රූප ශබ්ද ආදිය හඳුනා ගන්නා ස්වභාවය සංඥාවයි. එය ද චෛතසිකයකි. රූප සංඥා, ශබ්ද සංඥා ආදී වශයෙන් සංඥා රැසක් ඇත. ඒ සියල්ල සංඥා ස්කන්ධයයි.

වේදනා සංඥා යන චෛතසික දෙක හැර චේතනාව ප්‍රධාන කොට ඇති අනෙක් චෛතසික සියල්ල ම සංස්කාරස්කන්ධය ලෙස හැඳින්වේ.

විඤ්ඤාණ නම් සිතයි. විඤ්ඤාණය කියා හෝ සිත කියා හෝ ඒක වචනයෙන් සඳහන් කළත් අප තුළ දිගටම ක්‍රියාත්මක වන්නේ එකම විඤ්ඤාණයක් නොවේ. විඤ්ඤාණ පරම්පරාවකි. ඒවා ඒ ඒ අවස්ථා අනුව චක්ඛු විඤ්ඤාණ සෝත විඤ්ඤාණ ආදී නම් වලින් හැඳින්වේ.

පහනක් දැල්වූ විට එය නිවී යනතුරු ම දක්නට ලැබෙන්නේ එකම පහන් දැල්ල යයි අපට හැඟේ. එහෙත් එය එසේ නොවේ. සෑම මොහොතක ම පහන් තිරය අළුතින් තෙල් උරාගනී. ඒ හැමවිටම පහන් දැල්ල ද අළුත් වෙයි. ඒ නිසා එහි ඇත්තේ පහන් සිළු පරපුරක් මිස තනි පහන් දැල්ලක් නොවේ. අපේ විඤ්ඤාණය ද එසේය. ඇස කණ ආදී ඉන්ද්‍රියයන් ඇසුරෙන් විවිධ විඤ්ඤාණ පහළ වේ. විඥානස්කන්ධය ලෙස හැඳින්වෙන්නේ ඒ සියලුම විඤ්ඤාණයයි.

මේ අනුව පැහැදිලි වන්නේ රූප වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංචස්කන්ධයෙන් එකක්වත් තනිකර පවත්නා, නොවෙනස් වන ස්වභාවයක් නොවන බවයි. එක් එක් ස්කන්ධය සඳහා බුදුරජාණන්වහන්සේ දක්වන උපමාවන්ගෙන් එම ස්කන්ධයන්ගේ අස්ථිර බව හා අසාර බව මැනවින් පැහැදිලි වේ.

රූපය පෙණ පිඩක් වැනිය.
වේදනාව දිය බුබුලක් වැනිය.
සඤ්ඤාව මිරිඟුවක් වැනිය.
සංඛාර කෙසෙල් කඳක් වැනිය.
විඤ්ඤාණය මායාවක් වැනිය.

මෙබඳු අස්ථිර වූ අසාර වූ ස්කන්ධයන්හි වෙනස් නොවන කිසිම පදාර්ථයක් තිබිය නොහැකිය. ඒ නිසා සදාකාලික ආත්මයක් ලෙස සැලකිය හැකි කිසිවක් එක ද ස්කන්ධයක් තුළවත් නැත. සත්වයා ලෙස හැඳින්වෙන්නේ එබඳු ස්කන්ධයන්ගේ එකතුව නිසා ම එම සත්වයා තුළ ද ආත්ම නමින් හැඳින්වෙන නොවෙනස් වන දෙයක් තිබිය හැකි නොවේ. ඒ නිසා සත්වයා තුළ ආත්මයක් ඇතැයි ඇතැම් ආගම්වලින් ඉදිරිපත් කැරෙන මතය බුදුදහම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ස්කන්ධ පස එකට එකතු කර ''සත්වයා'' නිර්මාණය කරන බාහිර පුද්ගලයෙක් නැත. ඒවා එකතු වීමේ ස්වයං ක්‍රියාකාරී ශක්තියක් ඒවා තුළම ඇත. කාන්දම මෙනි. ස්කන්ධ පිළිබඳ නිසි අවබෝධයක් නැති නිසා ඒවා සමඟ බැඳෙන ගතියක් ස්වභාවයෙන් ම ඇති වේ. සත්වයා තුළ ඇති එම බැඳීම හැඳින්වෙන්නේ උපාදාන නමිනි. එයටම ඡන්දරාගය කියා ද කියනු ලැබේ. එම ඡන්ද රාගය පවත්නා තුරු සත්වයා උපදිමින් මැරෙමින් දුකට භාජනය වෙයි. සසරින් මිදීමක් නොවෙයි. දුකින් නිදහස් වීම නම් පංචස්කන්ධය කෙරෙහි ඇති ඡන්දරාගය සම්පූර්ණයෙන් ම නැතිවීමයි. ඒ සඳහා පංචස්කන්ධයේ නියම ස්වභාවය නුවණැසින් දැකිය යුතුය.

ස්කන්ධ විභාගය මගින් සත්වයා පිළිබඳ කැරෙන විවරණය උපකාර වන්නේ නිර්වාණාවබෝධයට පමණක් නොවේ. විවිධ ජාතීන් අතර විවිධ ආගමිකයන් අතර සමගිය ඇතිකර ගැනීමට ද ආධාර වෙයි. මිනිසුන් වන අප විවිධ කොටස්වලට බෙදී සිටියත් ස්කන්ධ වශයෙන් ගත්විට එක සමානය. ඒවාට ජාති භේදයක් හෝ ආගම් භේදයක් නැත. ජාති අනුව ස්කන්ධ කොටු කරනු ලබන්නේ මිනිසා විසින්ම ය.

ජාතීන් අනුව ස්කන්ධයන්ගේ වෙනසක් දක්නට නොලැබුනත් නාම ධර්මයන්ගේ ක්‍රියාකාරිත්වය අනුව පුද්ගලයන්ගේ වෙනස්කම් ඇතිවේ. සිතේ හා චෛතසිකයන්ගේ ක්‍රියාකාරීත්වය ලෝභ දෝස මෝහයන්ගේ බලපෑමෙන් නිදහස් වූ තරමට යහපතට යොමු වේ. වෙනස ඇතිවන්නේ එම ක්‍රියාකාරිත්වය

මතය. එක් පංචස්කන්ධයක් රහතන් වහන්සේ නමක ලෙස නම් කැරෙන අතර තවත් පංචස්කන්ධයක් දරුණු අපරාධකරුවෙකු ලෙස නම් කැරෙන්නේ නාමධර්ම ක්‍රියාකාරිත්වයේ වෙනස පදනම් කරගෙනය.

පුහුණුවට

ඵෙණ පිණ්ඩූපමං රූපං
වේදනා බුබ්බුලූපමා
මරීචිකූපමා සඤ්ඤා
සංඛාරා කදලූපමා
මායූපමංච විඤ්ඤාණං
දෙසිතාදිච්ච බන්ධුනා

භාවිතයට

1. පංචස්කන්ධය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

2. "ආත්ම" නමින් ගතහැකි ස්ථිර පදාර්ථයක් සත්වයා තුළ නැති බව පංචස්කන්ධය විභාගය ඇසුරින් පැහැදිලි කරන්න.

25 පාඩම

## සවිසත සතසත සිව් බඹ විහරණ

මිනිස් දිවිය උසස් කැරෙන උතුම් ගුණ දහම් සතරක් බඹ විහරණ නමින් බුදුදහමෙහි සඳහන් වෙයි. මෙත්තා, කරුණා, මුදිතා උපෙක්ඛා යනු ඒ සතරයි. මේවා බ්‍රහ්ම විහාර, බඹ විහරණ යනුවෙන් හැඳින්වෙන්නේ උතුම් ගුණ දහම් නිසාය. බ්‍රහ්ම යන වචනයෙහි ශ්‍රේෂ්ඨ යන අර්ථය ඇත. විහාර, විහරණ යන වචනවල වාසය කිරීම පැවැත්ම යන තේරුම් ඇත. ශ්‍රේෂ්ඨ ලෙස හැසිරීම, උසස් පැවැත්ම බඹ විහරණයයි. පුද්ගලයෙකුගේ එම ශ්‍රේෂ්ඨත්වය ඇති කැරෙන ධර්ම සතරක් බැවින් මෙත්තා ආදී සතරට සිව් බඹ විහරණ යයි කියනු ලැබේ.

බ්‍රහ්ම නමින් හැඳින්වෙන දේව කොට්ඨාශයක් ඇත. ඔවුන්ගේ ප්‍රධානියා මහා බ්‍රහ්ම නම් වේ. බ්‍රහ්ම තත්වයට පත්වන්නේ උසස් ගුණ දහම් සම්පූර්ණ කිරීම නිසාය. මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා යන ගුණ දහම් උසස් මට්ටමින් මහාබ්‍රහ්ම තුළ ඇත. එම ගුණ දහම් පුරුදු කිරීම බ්‍රහ්මට සමාන ජීවිතයකට යොමු වීමකි. ඒ නිසාද බ්‍රහ්ම ව්‍යවහාරයයි කියනු ලැබේ. මවුපියන් හැඳින්වීමට "බ්‍රහ්ම" යන පදය යෙදෙන්නේ ද මෙම ගුණ දහම් බ්‍රහ්මට සමානව මවුපියන් තුළ පවත්නා බැවිනි.

මෙත්තා නම් හිතවත් භාවයයි. යමක් හෝ යමකු තමාට අයත් කර ගැනීමට ඇති ආශාව නිසා ස්නේහයක් ඇති විය හැකිය. එය මෛත්‍රිය නොවේ. එබඳු ගිජුකමකින් තොරව සියල්ලන් කෙරෙහි අවංකව දක්වන හිතවත් භාවය මෛත්‍රියයි. මිතුරකු පිළිබඳ තමා තුළ ඇති හිතවත් භාවයට සමාන හිතවත්කමක් සියලුම සතුන් කෙරෙහි ඇතිකර ගැනීමට ලබන මානසික පුහුණුව මෛත්‍රී භාවනාවයි. අවංක මිතුරෙක් කිසි විටෙක තම මිතුරාට විපතක් කරදරයක් වේවායි නොපතයි. ඔහු හැම විටෙකම ප්‍රාර්ථනා කරන්නේ තම මිතුරාට යහපතක්ම වේවා කියායි. ඒ මිතුරා පිළිබඳව ඇති ප්‍රාර්ථනාව තමා සමඟ අමනාප අය ඇතුළු සියල්ලන් පිළිබඳවම ඇති කර ගැනීමට තරම් සමත් වන හිතවත් භාවය මෛත්‍රියයි. එය බ්‍රහ්ම විහාරයක් වන්නේ කිසිදු ආයාසයකින් තොරව ඉබේම මෙන් ඕනෑම කෙනෙකු පිළිබඳව හිතවත් ව බැලීමට තරම් පුරුදු වී ඇත්නම් ය.

කරුණාව නම් අනුන්ගේ දුකක් දුටුවිට ඔවුන් දුකින් මුදවා ගැනීම සඳහා ඉදිරිපත් වීමට තරම් සිතෙහි ඇතිවන අනුකම්පාවයි. ඕනෑම අසරණයකු දුටු විට එම අසරණයාට පිහිට විය යුතුය යන හැඟීම කිසිදු ආයාසයකින් තොරව ඇති වන්නේ නම් එය බ්‍රහ්ම විහාරයකි. හිතවත්කම් නෑදෑකම් ආදිය සළකා දුකට පත් අයට පිහිටවීමට ඇති කරගන්නා උනන්දුව කරුණාව

නොවේ. නියම කාරුණිකයා අසරණයාගේ දුක්ඛිත තත්වය ගැන මිස ඔහුගේ ජාතිය, කුලය, පක්ෂය ආදිය ගැන සැලකිලිමත් නොවේ.

මුදිතාව නම් අනුන්ගේ සතුටෙහි දී තමන්ට ලැබුණු සතුටක් සේ සළකා ප්‍රීතියට පත්වන ස්වභාවයයි. අනුන්ගේ දුකෙහිදී අනුකම්පාව දැක්වීම තරම් අනුන්ගේ සැපතෙහිදී සතුටුවීම පහසු නැත. එම අපහසු තත්වය යමකු තුළ ඇති වන්නේ නම් එය උසස් ගුණයකි. සැපතට පත් තැනැත්තා තමාගේ ඥාතියෙකු හෝ හිතවතකු නිසා තමාද සතුටු වීම මුදිතා බ්‍රහ්ම විහාරය නොවේ. කිසිදු භේදයකින් තොරව ඕනෑම අයෙකු සැපවත් වනු දැක අවංකව සතුටුවන ගතිය මුදිතා බ්‍රහ්ම විහාරයයි. සොරකම් අල්ලස් ගැනීම් ආදී දුසිරිත්වලින් ධනවත් වී ප්‍රීතිවත්නකු පිළිබඳව ඇති කර ගත යුතු වන්නේ මුදිතාව නොව කරුණාවයි. දැනට තාවකාලිකව සතුටක් ඔහු ලැබුවත් දුසිරිත් නිසාම අනාගත දුකට භාජනය වන බව දැකීමෙන් ඇති වන්නේ අනුකම්පාවකි. මොන ක්‍රමයකින් හෝ ඔහු එම දුසිරිත්වලින් මුදවා ගැනීමට ක්‍රියා කරන්නේ කරුණාව ඇති වුවහොත් පමණකි. කරුණාව ඇති නොවුවහොත් ඇති වන්නේ මුදිතාව නොව ද්වේශයකි.

සැප සම්පත් වලින් ආඪ්‍යව එහෙත් පරිත්‍යාග නොකර කා බී විනෝදයෙන් ගත කරන අයට බුදුරජාණන් වහන්සේ දහම් දෙසා පරිත්‍යාගයට නැඹුරු කර වූයේ කරුණාව නිසාය. ආත්මාර්ථකාමී ව සැපවත් ජීවිතයක් ගත කරන්නන් කෙරෙහි කරුණාව දැක්විය යුත්තේ ඔවුන් ආධ්‍යාත්මිකව අසරණ තත්වයේ පසු වන බැවිනි. ඔවුන් පිළිබඳව මුදිතාව ඇතිකර ගත නොහැකිය. ඒ නිසා මුදිතාව නම් දැහැමිවය ප්‍රීතිවන්නන්ට ඊර්ෂ්‍යා නොකර ඔවුන් සතුටින් විසීම ගැන සතුටට පත්වන ගතියයි.

උපේක්ෂාව නම් සිත්හි ඇතිවන නොසැලෙන මැදහත් බවයි. එය අලසකම නිසා හෝ අඥාන භාවය නිසා හෝ ඇතිවන කිසිවක් ගණන් නොගන්නා ස්වභාවය නොවේ. ලෝකයේ හා ජීවිතයේ ස්වභාවය පිළිබඳව වැටහීමක් ඇති ව, කවර තත්වයක් හමුවේ වුවද සිතෙහි සමබර කම පවත්වා ගැනීමයි. ලෝකයේ දුක්වන්නන් අනුව දුක්වීමට ද ප්‍රීතිවන්නන් අනුව ප්‍රීති වීමට ද යැමෙන් සමබරතාව නැතිව යයි. පුද්ගලයන් හා වස්තූන් කෙරෙහි දැඩි ඇලුම් ඇති කර ගැනීමත් පුද්ගලයන් හෝ වස්තූන් සමඟ ගැටුම් ඇතිකර ගැනීමත් නිසා සිතේ සමබර කම නැතිව යයි. එම ඇලීම් ගැටීම් - අනුරෝධ විරෝධ ඉක්මවා ගිය මධ්‍යස්ථ පැවැත්ම උපේක්ෂාවයි.

සිව් බඹ විහරණයෙන් යුක්තවීම තමන්ගේ සැනසීම පිණිසත් අන්‍යයාගේ සැනසීම පිණිසත් හේතුවෙයි. බොහෝ විට අප තුළ නොසන්සුන්කම්,

අසහනකාරී ගති ඇතිවන්නේ ඊර්ෂ්‍යාව වෛරය ක්‍රෝධය හිංසක සිතුවිලි හා අසංවරශීලි කාමුක කල්පනා ආදිය සිතෙහි බලපැවැත්වෙන විටය. සිව් බඹ විහරණයන් ප්‍රගුණ කරන විට ඉහත කී හිංසක සිතිවිලි ආදිය පහව යන බැවින් සිතට ඇතිවන්නේ මහත් සහනයකි. මෙය උදාහරණයකින් පැහැදිලි කර ගත හැකිය.

ධනදාස ඊර්ෂ්‍යා බහුල පුද්ගලයෙකි. අසල්වාසීන් තබා ඔහුගේ ම සහෝදරයන් වුවද දියුණුවනු දැකීමට ඔහු කැමති නැති. තම සහෝදරයා අළුත් නිවාසයක් සාදාගෙන ඇත. දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබාදී රැකියාවක ද යොදවා ඇත. ඔවුහු සමගියෙන් සතුටින් නව නිවස තුළ වෙසෙති. අසල්වාසීන් සමඟ ද ඔවුන් පවත්වන්නේ සුහද සම්බන්ධයකි. මේ තත්වය දකින ධනදාස තුළ ඇති වන්නේ මහත් නොසතුටකි. නොඉවසන සුළු ගතියකි. බලවත් අසහනයකි. මෙම අසහනකාරී මානසික තත්ත්වය ධනදාස විසින් ම ඇතිකර ගත්තකි. ඊට හේතුව ඔහු තුළ බල පැවැත්වෙන අනුන්ගේ සැපත නොඉවසන සුළු වූ ඊර්ෂ්‍යාවයි. කල්‍යාණ මිත්‍රයෙකුගේ මග පෙන්වීම නිසා ධනදාස ටිකෙන් ටික මේ තත්වය වෙනස් කර ගනී. මුදිතා ගුණය වර්ධනය කර ගනී. අනුන්ගේ සැපත දකින විට කලින් ඔහු තුළ ඇති වූ ඊර්ෂ්‍යාව වෙනුවට දැන් ඇතිවන්නේ සතුටකි. එයින් සිතට වෙහෙසක් අසහනයක් ඇති නොවේ. කා සමගත් සුහදව ජීවත්වීමේ හැකියාව ද ඇත. ධනදාස තුළ සහනශීලී වාතාවරණයක් ගොඩ නැගුනේ මුදිතා ගුණය ප්‍රගුණ කිරීම නිසාය. මෛත්‍රිය කරුණාව හා උපේක්ෂාව දියුණු කර ගැනීමෙන් ද මෙසේ සහනශීලි මානසික පරිසරයක් ගොඩ නැගෙන අයුරු අවබෝධ කරගත හැකිය.

සිව් බඹ විහරණ උපකාර වන්නේ ඉහත සඳහන් ලෙස පෞද්ගලික සැනසීම සඳහා පමණක් නොවේ. සමාජයේ පොදු අභිවෘද්ධියට ද උපකාර වේ. සමාජයේ සාමාජිකයන් අතර අන්‍යොන්‍ය වශයෙන් සුහද වූ මිත්‍රශීලි සම්බන්ධයක් ඇති වීමට මෙම ගුණ දහම් බලපානු ලැබේ. කිසිදු භේදයකින් තොරව සියළු දෙනා වෙත මෛත්සිත පතුරුවන්නේ නම් ඔවුනොවුන් අතර ප්‍රතිවිරුද්ධතා ඇතිවීමට ඉඩක් නැත. එසේම විවිධ ආකල්ප පදනම් කරගෙන ගොඩනංවා ඇති අසමානකම්, සමාජ විෂමතා නැති වී සමානාත්මතාව ක්‍රියාත්මකවන සමාජයක් බිහි වෙයි. එබඳු සමාජයක අසාධාරණකම් අකටයුතුකම් සිදුවීමට ඉඩක් නැත්තේ සියලු දෙනා සියලු දෙනාගේ ම සැපත ප්‍රාර්ථනා කරමින් ඒ සඳහාම ක්‍රියාත්මක වන බැවිනි. මෛත්‍රී සිතින් කෙනෙකුට උපකාර කරන්නේ ඔහුගෙන් ප්‍රති උපකාර බලාපොරොත්තුව නොවේ. එසේ වූ විට තමාට අකෘතඥ විනැයි කිසිවකු පිළිබඳව අහිතක් අමනාපයක් ඇති නොවේ.

සමාජයේ සාමාජිකයන් තුළ කරුණාව නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ නම් අසරණයින්ගේ මුවින් පිටවන දුක් අඳෝනා තවදුරටත් ඇසීමට ඉඩක් නැත. කාරුණික සෑම සාමාජිකයකු ම අසරණයාගේ දුකට පිහිටවීමට ඉදිරිපත් වන බැවිනි. විවිධ දුක් පීඩාවන්ට ගොදුරුවූවන් කරුණාවට පාත්‍ර වන බැවින් දුක පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීමට උත්සාහ දරන සමාජයක් බිහි වෙයි. අද තමා සැපෙන් සිටියත් හෙට මෙබඳු දුකකට භාජනය විය හැකි බැවින් අද කළ යුතු යහපත අද ම කළ යුතුය. යන උද්යෝගවත් සිතිවිල්ල ඇතිවීමට කරුණාව බලපෑ හැකිය. එසේම අපට වඩා දුක් විඳින්නන් සමාජයෙහි සිටින බව පෙන්වා දීමෙන් කරුණාව කරන්නේ අකම්පිතව දුකට මුහුණදීමට ශක්තියක් ලබාදීමයි. මෙසේ අද කළ යුතු හොඳ දේ අද ම කරන, නොබියව හා කම්පා නොවී කරදර විපත්වලට මුහුණ දෙන සාමාජිකයන්ගෙන් යුත් සමාජයක් බිහිවීමට ද කරුණාව තුළින් පදනමක් වැටෙන අයුරු පැහැදිලි වේ.

මුදිතා ගුණයෙන් පිරි පුද්ගලයන් වැඩි වූ තරමට සොම්නසින් යුත් සමාජයක් බිහිවේ. එසේම ඊර්ෂ්‍යාවෙන් තොරව එකිනෙකාට උදව් කරගන්නා පුද්ගලයන්ගෙන් සමාජය සමන්විත වේ. ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය වැනි මානසික දුබලතා නිසා ඔවුනොවුන් අතර ඇති විය හැකි ගැටුම් අවුල් වියවුල්වලින් නිදහස් වීමටද මුදිතාව උපකාර වේ. මෛත්‍රිය හා කරුණාව නිසාද සමාජයෙහි ගැටුම් අඩුවේ. උපේක්ෂාව දියුණු වූ තරමට අෂ්ටලෝක ධර්මය හමුවේ අකම්පිතව ක්‍රියා කරන පිරිසක් බිහිවේ. මේ අනුව සිව්බඹ විහරණයන්ගෙන් ම සමාජයට සැලසෙන්නේ සෙතකි.

මෙත්තා, කරුණා මුදිතා උපේක්ඛා යන සතර ජාති භේද කුල භේද ආදියෙන් තොරව යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට උපකාර වන අතරම ඒවා භාවනා වශයෙන් පුහුණු කිරීමෙන් මනා චිත්ත සමාධියක් ඇති කරගත හැකිවේ.

ඉහත කී කුමන ප්‍රතිඵලයක් වුවද ලබා ගත හැක්කේ මෛත්‍රිය කරුණාව මුදිතාව හා උපේක්ෂාව පුද්ගලයාගේ චරිතයෙන් වෙන් නොකළ හැකි පරිදි චරිතයේ ම කොටසක් වන සේ ප්‍රගුණ කළහොත්ය. ඒවා චරිතයේ ම කොටසක් වන්නේ තදින් සිත තුළ කාවැදී ඇති විටය. ඒ සඳහා ක්‍රමානුකූලව මනස පුහුණු කළ යුතුය. එසේ පුහුණු කිරීම බ්‍රහ්ම විහාර භාවනාවයි.

භාවිතයට

1. සිව්බඹ විහාරණ කෙටියෙන් හඳුන්වා දෙන්න.
2. ජන වර්ගයන් අතර සුහදතාව වර්ධනය කර ගැනීමට සිව්බඹ විහරණ උපකාර වන අන්දම පැහැදිලි කරන්න.
3. බිත්ති පුවත්පතක පළ කිරීම සඳහා කරුණාවේ සාමාජික අගය මැයෙන් රචනයක් ලියන්න.

26 පාඩම

# නිදහස පිළිබඳ බෞද්ධ චින්තනය

නිදහස යන සංකල්පය බුදුදහමට ආගන්තුක වූවක් නොවේ. එය බුදුදහමේ බෙහෙවින් අගය කැරෙන්නකි. බෞද්ධ ප්‍රතිපදාවේ අවසාන අරමුණ ද පූර්ණ නිදහසයි. එනම් සියලුම කෙලෙස් බැම් වලින් නිදහස් වීමයි. පුද්ගලයා සසරට බැඳෙන බැම් දසයක් ඇත. ඒවා හැඳින්වෙන්නේ සංයෝජන නමිනි. ඒවායින් තුනකින් නිදහස් වීමෙනි සෝවාන් වෙන්නේ. ඊළඟ සංයෝජන දෙක ලිහිල් වීමෙන් සකෘදාගාමී වන අතර ඒ දෙක සම්පූර්ණයෙන් නැති වීමෙන් අනාගාමී වේ. ඉතිරි සංයෝජනයන් ද නැති වී සම්පූර්ණයෙන් ම කෙලෙසුන්ගෙන් නිදහස් වීම අර්හත්වයයි.

ප්‍රථම ධර්මදූත පිරිස පිටත්කර හැරීමට පෙර කරන ලද දේශනයේ දී බුදුරජාණන් වහන්සේ, මහණෙනි, මානුෂිකවූත් දිව්‍යමයවූත් සියලු බන්ධනයන්ගෙන් මම නිදහස් වූයෙමි. ඔබද ඒ සියලු බැම්වලින් මිදුණාහුය කියා වදාළහ. එසේ බන්ධනයන්ගෙන් නිදහස් වීම පරාර්ථ චර්යාව පහසුවීමට අවශ්‍ය කාරණයක් සේ සැලකුණු බව පෙනේ.

වැරැදි දෘෂ්ටිවලට ගොදුරුව සිටිනතාක් කල් සසර බැම්වලින් නිදහස් විය නොහැකිය. එබැවින් දෘෂ්ටිවලින් නිදහස් වීම අත්‍යවශ්‍යවූවක් ලෙස බුදුදහම දක්වයි. ලෝකය හා සත්වයා දෙවියන් විසින් මවන ලදැයි ඉගැන්වෙන ආගම්වල අනුගාමිකයාගේ නිදහස ඇහිරී ඇත. ඔහු දේව කැමැත්තට අනුව ම ක්‍රියා කළ යුතු බැවිනි. සියල්ල ම කිසියම් වෙනස් නොවන රටාවකට හෙවත් නියතියකට අනුව සිදු වෙතැයි ඉගැන්වෙන ආගම්වලද නිදහසක් නැත. වර්තමානයේ සිදුවන සියල්ල අතීත කර්මයට පවරණ පුබ්බේකත හේතුවාදී ආගම්වලින් ද පුද්ගල නිදහස ඇහිරී ඇත. එහෙත් බෞද්ධ චින්තනය අනුව පුද්ගලයාගේ ස්වාමියා එම පුද්ගලයාමය. ප්‍රඥාවත් වීර්යයත් ආධාර කරගෙන සියලු ම බන්ධනවලින් නිදහස් වීමේ ශක්තිය මිනිසා සතුව පවත්නා බව බුද්ධ දේශනාවෙහි සඳහන් වෙයි.

මෙහිදී සිතීමේ, විමසීමේ හා තීරණ ගැනීමේ නිදහස පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය. මේ පිළිබඳ අගනා දේශනාවක් අංගුත්තර නිකායේ කාලාම සූත්‍රයෙහි සඳහන් වෙයි. "කාලාම" යන නමින් හැඳින්වුණු මිනිසුන් වාසය කළ කේසපුත්ත නම් නියම් ගමට වරක් බුදුරජාණන් වහන්සේ වැඩම කළහ. උන්වහන්සේ හමුවීමට පැමිණි කාලාමයෝ තමන් මුහුණ පා ඇති ගැටලුවක් ඉදිරිපත් කළහ. ඔවුන් සඳහන් කළ පරිදි කේසපුත්තයට විවිධ ආගමික ශ්‍රමණ බ්‍රාහ්මණයෝ පැමිණෙති. ඒ සියලු දෙනම ප්‍රකාශ කරන්නේ තමන්

කියන දේම සත්‍ය බවත් අන් මහණ බමුණන් කියන දේ අසත්‍ය බවත්ය. සියලු දෙනම එසේ පවසන විට කවරෙක් නම් ඇත්ත කියත් ද කවරෙක් නම් බොරු කියත්දැයි කාලාමයන් තුළ සැකයක් ඇති විය. ඔවුන් බුදුරජාණන් වහන්සේ වෙත ඉදිරිපත් කළේ එම සැකයයි.

අනෙක් සියලුම ශාස්තෘවරුන් උගන්වන දෑ අසත්‍ය බවත් තමන් වහන්සේ උගන්වන දෑ පමණක් සත්‍ය බවත් පිළිගන්නා ලෙස බුදුරජාණන් වහන්සේ නොවදාළහ. කාලාමයන්ට සැක ඇතිවීම සාධාරණ බවත් ඔවුන් සැක පහළකර ඇත්තේ සැක කළයුතු ම තැනකදී බවත් වදාළ බුදුරජාණන් වහන්සේ යමක් පිළිගැනීමේදී හෝ ප්‍රතික්ෂේප කිරීමේදී නිදහස්ව සිතා විමසා බැලීමේ අවශ්‍යතාව පෙන්වා දුන් සේක. ආරංචිය, පරම්පරාගත පිළිගැනීම්, කට කථා, ආගමික ග්‍රන්ථවල සඳහන් වන කරුණු තර්කය, නීතිය, ඉදිරිපත්වන කරුණෙහි බාහිර ස්වරූපය තම පිළිගැනීම්වලට ගැලපීම, කියන්නාගේ සුදුසුකම් හා ගුරු වදනක් වීම යන කරුණු සියල්ල හෝ එකක් පමණක් පදනම් කරගෙන යමක සත්‍ය අසත්‍ය භාවය හෝ කුසල අකුසල භාවය පිළිබඳ නිගමනය නොකළ යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. උන්වහන්සේ වදාළේ තමාගේම බුද්ධිය මෙහෙයවා නිදහස්ව සිතා බැලිය යුතු බවයි.

මෙයින් අදහස් වන්නේ ආරංචි, කටකථා, තර්කය ආදිය සම්පූර්ණයෙන් ම බැහැර කළ යුතු බව නොවේ. ඒවා පමණක් පදනම් කරගෙන නිගමනවලට නොඑළඹිය යුතු බවයි. මෙය අකුසලයක් ද, වැරදි ක්‍රියාවක් ද, නිවැරදි ක්‍රියාවක් ද නුවණැතියන්ගේ නින්දාවට භාජනය වන දෙයක් ද නැතහොත් ප්‍රශංසාවට භාජනය වන දෙයක් ද තමාගේත් අනුන්ගේත් අහිත පිණිස, දුක් පිණිස, පවතින්නක් ද නැතහොත් හිත සැප පිණිස පවතින්නක් ද කියා තමා ම නිදහස්ව සිතා බැලිය යුතු බව දැක්වෙයි.

එසේ නිදහස්ව සිතා බැලීමට මෙන්ම තමා කරන්නේ කුමක් දැයි හෘද සාක්ෂියට එකඟව තෝරා ගැනීමට ද පුද්ගලයාට නිදහස ඇති බව බුදු දහම පිළිගනියි. එසේ තෝරා ගැනීමේ නිදහස නැත්නම් කරන කියන දේවල විපාක විඳීමේ වගකීම පුද්ගලයා වෙත පැවරිය නොහැකිය. මා විපාක විඳිය යුත්තේ මා විසින්ම තෝරා ගත් ක්‍රියාවටය. අනුන්ගේ වුවමනාවට කරන ක්‍රියාවට විපාක විඳීමේ වගකීමක් මා වෙත පැවරීම සුදුසු නැත. එයින් පැහැදිලි වන්නේ බුදුදහමේ ඉගැන්වෙන පුද්ගල නිදහස, වගකීම සමඟ අනිවාර්යයෙන් ම බැඳී පවතින බවයි. බෞද්ධ චින්තනයට අනුව පුද්ගලයාගේ නිදහස සීමා කැරෙන කිසිදු පුද්ගලයකු හෝ බාහිර බලවේගයක් නොමැත. එය සීමාවන්නේ තමාගේම වගකීමෙනි. යම් යම් දේ කිරීමෙහි අවශ්‍යතාව හා නිදහස අපට කොතරම් තිබුණත් අප ඒ දේ නොකරන්නේ ඒවා කළොත් එහි විපාක විඳීමේ වගකීම ද අපට පැවරෙන බැවිනි.

හොඳින් සිතා විමසා බලා නිගමනවලට එළඹීමේ නිදහස බුදු දහම අගය කරන බව මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රයෙන් ද පැහැදිලි වෙයි. බුදුරජාණන් වහන්සේ සමඟ වාදයකට පැමිණි ජෛන ආගමිකයකු වූ උපාලි ගෘහපතියා බුදුරදුන්ගෙන් බණ අසා බුද්ධ ශ්‍රාවකයකු වීමට තීරණය කළේය. එහිදී බුදුරජාණන් වහන්සේ වදාළේ ගෘහපතිය, හොඳින් සිතා බලන්න, ඔබ වැනි ප්‍රසිද්ධ පුද්ගලයන්ට ගැලපෙන්නේ හොඳින් සිතා බලා නිගමනයට එළඹීම යි කියායි. ප්‍රශ්න කිරීමේ නිදහස බුදුදහමේ ඇති බව මනාව පැහැදිලි වේ. තෙරුවන් පිළිබඳව හෝ ප්‍රතිපදාව පිළිබඳව හෝ කිසියම් සැකයක් විමතියක් ඇත්නම් ප්‍රශ්න කරන ලෙස පරිනිර්වාණයට ආසන්න කාලයේ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේට වදාළේ ප්‍රශ්න කිරීමේ නිදහස අගය කළ බැවිනි.

නිදහස පිළිබඳ සාකච්ඡා කිරීමේ දී වර්තමාන කාලයෙහි කාන්තා නිදහස ගැන ද අවධානය යොමු කරනු ලැබේ. බුදුරජාණන් වහන්සේ පහළවන යුගය වන විට බමුණු දහම විසින් භාරතීය කාන්තාවගේ නිදහස අහුරා තිබිණි. විශේෂයෙන් ඇයට ආගමික හා සාමාජික නිදහසක් නොවීය. සිත හොඳින් සකස් කර ගත් විට ආධ්‍යාත්මික දියුණුවට ස්ත්‍රීභාවය බාධාවක් නොවන බව එක්තරා භික්ෂුණින් වහන්සේ නමක් ප්‍රකාශ කළාය.

බමුණු දහම පදනම් කරගත් සමාජයෙහි නිදහසක් නොවූයේ කාන්තාවන්ට පමණක් නොවේ. පහත් යයි සම්මත ඇතැම් කුලවල අයගේද නිදහස අවුරා තිබිණි. වේදය හැදෑරීමාදිය ඔවුනට තහනම් විය. එහෙත් කුලභේදය නොසලකන බුදුදහම සැම දෙනාගේම නිදහස අගය කර ඇත. ඕනෑම කුලයක අයකුට බෞද්ධවීමට හෝ පැවිදි වීමට නිදහස ඇත. කුලය මානව නිදහස අහිමි කරන්නක් ලෙස බුදුරජාණන් වහන්සේ හඳුන්වා දුන්හ.

ආර්ථික නිදහස ද බුදුදහම අගය කරයි. ගිහියාට දිළිඳුකම දුකක් බව දේශනා කළ බුදුරජාණන් වහ්නසේ ඒ නිසාම දිළිඳුකමින් පුද්ගලයා නිදහස් විය යුතු බව දේශනා කළහ. පුද්ගලයකුට තමාගේ අවශ්‍යතා ඉෂ්ටකර ගැනීමට ප්‍රමාණවත් ධනයක් ඇතැයි සොම්නස් වීමට හැකිවිය යුතු අතර ණය බරින් ද නිදහස් විය යුතු බව අංගුත්තර නිකායයේ අනණ සූත්‍රයෙහි සඳහන් වෙයි.

මෙසේ බලනවිට බුදුදහම, විවිධ අංශයන්ගෙන් නිදහස අගය කරන අයුරු පැහැදිලි වේ. ධර්මය වැඩිදුර හදාරණ විට ඒ පිළිබඳව වඩාත් වැටහෙනු ඇත.

භාවිතයට

1. නිදහස් චින්තනය බුදුදහමෙහි අගය කැරෙන අයුරු පෙන්වා දෙන්න.
2. නිදහස හා වගකීම අතර ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

27 පාඩම

## සහජීවනය පිළිබඳ බෞද්ධ ආකල්පය

සහජීවනය නම් සාමයෙන් සමගියෙන් සහයෝගයෙන් එකට ජීවත්වීමයි. එය මනුෂ්‍ය සමාජයේ තිබිය යුතු උසස් ම ලක්ෂණයක් ලෙස බුදු සමය සලකයි. "සමවායො එව සාධු "සමගිය ම යහපති, සමග්ගා හොථ මා විවදථ සමගිවන්න වාද විවාද ඇතිකර නොගන්න. වැනි උපදේශයන්ගෙනුත් අසමගියේ ආදීනව හා සමගියේ ආනිසංස දැක්වෙන බණකතා මගිනුත් ඉදිරිපත් කර තිබෙන්නේ සහජීවනයේ අවශ්‍යතාව හා වැදගත්කමයි. සමගියෙන් සතුටින් විවාදයන්ගෙන් තොරව කිරි සහ ජලය මෙන් එකට එකතු වී ඔවුනොවුන් දෙස ප්‍රියශීලීව බලමින් ජීවත්විම බුදුරජාණන් වහන්සේ විසින් නිතරම අගය කරනු ලැබ ඇත.

බෞද්ධ අදහසට අනුව සහජීවනය සඳහා පුද්ගලයා ඇතැම් ආකල්පවලින් බැහැර විය යුතු අතර,. ඇතැම් ආකල්ප වර්ධනය කර ගත යුතුය. ජාතිය කුලය වැනි කරුණු පදනම් කරගෙන මනුෂ්‍ය වර්ගයා අතර එක කොටසක් උසස් ලෙසත් තවත් කොටසක් පහත් ලෙසත් සැලකීමේ ආකල්පය සහජීවනයට බාධාවකි. උසස් යයි සම්මත අය විසින් පහත්යයි සම්මත අය විවිධාකාර පීඩාවන්ට භාජනය කරනු ලබයි. ඒ පීඩිත ජනතාව තුළ නිතරම ගොඩ නැගෙන්නේ උසස් යයි සම්මත ජන කොට්ඨාශය කෙරෙහි ද්වේශයකි. සුහද ආකල්පයක් ඇති වීමට ඉඩක් නැත. ඒ නිසා ජාතිය කුලය වැනි කරුණු මත පුද්ගලයන් පහත් කොට සැලකීමේ ආකල්පය බැහැර කිරීමට බුදුසමය මඟ පෙන්වයි. සමානාත්මතා ආකල්පය වර්ධනය කර ගත යුත්තක් ලෙස දක්වයි. වර්ණ ධර්මය මත උසස් පහත්කම් තීරණය කළ බ්‍රාහ්මණ සංස්කෘතිය බැහැර කරමින් බුදුදහම ඉදිරිපත් කළේ චත්තාරො වණ්ණා සමසමා වර්ණ සතරම සමානය යන අදහසයි. මෙබඳු අදහස්වලින් පෝෂණය වූ මිනිසුන් අතරය සහජීවනය ඇති වන්නේ.

බෞද්ධ ඉගැන්වීම් අනුව දුක් වේදනා ආදියට ජාති - ආගම් කුලභේද කිසිවක් නැත. වේදනාව කාටත් පොදුය. සැම දෙනම සැපතට කැමති වන අතර දුක් විඳීමට අකමැති වෙයි. එබැවින් තමාගේ සැපත සඳහා අනුන්ට හිංසා නොකළ යුතු බවත් අනුන්ගේ දැහැමි සැපතට බාධා නොකළ යුතු බවත් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. අත්තුපනායික ධර්ම පර්යාය ඉදිරිපත් කර ඇත්තේ ද එම ආකල්පය ගොඩ නගා ගැනීම පිණිසය. අත්තුපනායික ධර්ම පර්යාය නම් අන් අයට හිංසා පීඩා කිරීමේ වරද වටහා ගැනීම සඳහා තමන් උපමාවට ගෙන සිතා බලන ක්‍රමයයි. කරවකු හෝ මට හිංසා කරනවාට මම අකමැත්තෙමි. අනෙක් අයද එසේමය. ඒ අයත් හිංසාවට

භාජනය වීමට කැමැති නොවෙති. ඒ නිසා මම කිසිවකුට හිංසා නොකරමි. මෙසේ සිතීම තමන් උපමාවට ගැනීමයි. මෙබඳු සිතිවිලි ක්‍රමයක් සැම දෙනම තුළ ම ගොඩ නගා ගැනීම සහජීවනය සඳහා අවශ්‍යය.

පන්සිල් සුරැකීම ද සහජීවනය සඳහා උපකාර වන්නකි. අනුන්ගේ ජීවිතයට හා දේපොලවලට ගරු නොකරන, හානි පමුණුවන සමාජයක සහජීවනයක් බලාපොරොත්තු විය නොහැකිය. එසේම කාම අපරාධ බහුල, බොරුව සෝලම වැනි දුසිරිත්වලින් පිරුණු සමාජයක ද සහජීවනයක් පිළිබඳ බලාපොරොත්තු තබාගත හැකි නොවේ. මත්ද්‍රව්‍යවලට ගොදුරු වූ සමාජයෙහි ද සහජීවනයට බාධා පැමිණෙයි. මේ අනුව ප්‍රාණඝාතයෙන් අදත්තාදානයෙන් කාම මිථ්‍යාචාරයෙන් මුසාවාදයෙන් හා සුරාමේරය පානයෙන් වැලකීම සහජීවනයට උපකාරක කරුණක් ලෙස බුදුදහම සලකයි. ගිහියාගේ නිත්‍ය සීලය ලෙස පංච සීලය දැක්වීමේ එක් හේතුවක් වන්නේ එය සහජීවනයට බෙහෙවින් උපකාරවත් වීමයි.

අන්‍යොන්‍ය අවිශ්වාසය, අමනාපකම් කලහ, විවාද ඇතිවීමට ප්‍රබල හේතුවකි. අන්‍යොන්‍ය යුතුකම් පැහැර හැරීම. එබැවින් සහජීවනය සඳහා යුතුකම් ඉටුකිරීමේ අවශ්‍යතාව බුදුදහම පෙන්වා දෙයි. යුතුකම් දැක්වීමේදී මවුපිය-දූදරු, ගුරු - ශිෂ්‍ය, ස්වාමි - භාර්යා, හිත මිතුරු, සේව්‍ය - සේවක, ගිහි - පැවිදි වශයෙන් ඉටුවිය යුතු යුතුකම් දක්වා ඇත. ඒවා 7, 8 ශ්‍රේණි දහම් පාසල් පාඨ ග්‍රන්ථයන්හි සඳහන් වෙයි. අන්‍යොන්‍ය වශයෙන් යුතුකම් ඉටුවිය යුතු කණ්ඩායම් දෙක අතුරින් කවර කණ්ඩායමක හෝ යුතුකම් පැහැර හැරුණු විටෙක ඒ දෙපිරිසෙහි සුහදත්වයට බාධා පැමිණෙයි. සහජීවනය සඳහා, යුතුකම් ඉටු කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්නේ එබැවිනි.

සහජීවනය සඳහා තවත් අවශ්‍ය ගුණාංගයකි ඉවසීම. විවිධ පිරිස් එකතු වූ සමාජයක ඒකාකාර ජීවන රටාවක් හෝ සමාන ආචාර ධර්ම පද්ධතියක් හෝ බලාපොරොත්තු විය නොහැකිය. තම තමන්ට අන්‍යොන්‍ය වශයෙන් නොගැලපෙන පුද්ගලයන් හෝ කණ්ඩායම් සමඟ වාසය කරන විට ඔවුනොවුන්ට නොගැලපෙන හැසිරීම් රටාවන් නිසා ඉවසිය නොහැකි අවස්ථා එළඹෙයි. එහෙත් එබඳු අවස්ථාවන්හි නොඉවසිලිවන්තව කලබලකාරී ලෙස අදහස් පළ කිරීම නිසා හෝ ක්‍රියා කිරීම නිසා ඔවුනොවුන්ගේ සුහදත්වය නැති වී සහජීවනයට බාධා පැමිණෙයි. ඒ නිසා එකට වාසය කරන අයෙකුගේ වුවද තමාට පෙනෙන අඩුපාඩුවක් ඇත්නම් එය සුහදව ඉවසීමෙන් යුතුව පෙන්වා දිය යුතුය. තමාගේ වරදක් අනුන් විසින් පෙන්වා දෙනු ලබන විට ද ඒ ගැන කෝපයට, අසතුටට පත් නොවී එබඳු දුබලතාවක් තමා තුළ ඇත්දැයි

ඉවසිල්ලෙන් විමසා බැලිය යුතුය. තමා තුළ වරදක් ඇතැයි පෙනෙන විටෙක එය නිවරැදි කර ගැනීමට උත්සාහ දැරියයුතු අතර තමාගේ වරදක් නැතැයි පෙනෙන අවස්ථාවක වරදක් ඇතැයි ප්‍රකාශ කළ තැනැත්තා කෙරෙහි උරණ නොවීමට තරම් ඉවසිලිමත් විය යුතුය.

සහජීවනය සඳහා ඉවසීම අවශ්‍ය වන්නේ ඉහත කී අවස්ථාවන්හි පමණක් නොවේ. තමාට පිළිගත නොහැකි, තමා අනුමත නොකරන අදහස් අනුන්ගෙන් පළවූවිටක ද ඉවසිලිවන්තවීම අවශ්‍යය. අන් අයගේ අදහස් විවේචනය කිරීමේ හා පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ද ඇත. ඒ නිසා අන්‍ය මත ඉවසීමට පුරුදු විය යුතුය. විවිධ ජාතීන් විවිධ ආගමිකයින් වෙසෙන රටකට අන්‍ය මත ඉවසීමේ පුරුද්ද අත්‍යාවශ්‍යය ය. එය සහජීවනය සඳහා උපකාර වෙයි.

බුද්ධකාලීන භාරතීය සමාජයේ පැවති විවිධ ආගමික ඉගැන්වීම් බුදුරජාණන් වහන්සේගේ විවේචනයට ලක්විය. එහෙත් ඒ කිසිදු ඉගැන්වීමකට බාධා කරවීමට හෝ තමන් වහන්සේගේ ඉගැන්වීමේ බලහත්කාරයෙන් කිසිවකුට පිළිගැන්වීමට හෝ උන්වහන්සේ ප්‍රයත්න නොදැරූහ. අදහස්වල නොගැලපීම් සුහදත්වයට බාධාවක් කර නොගත්හ. ඒ නිසාම අන්‍යාගමික ආරාමවලට වැඩම කර ඔවුන් සමඟ සුහද සාකච්ඡාවන්හි යෙදුනු සේක. ඇතැම් විටෙක ගැඹුරු ධර්ම සාකච්ඡාවන්ට සහභාගී වූහ. තමන් වහන්සේ වෙතට පැමිණි අන්‍ය මතධාරීන් සුහදව පිළිගෙන ඔවුන් ඉදිරිපත් කළ දාර්ශනික ගැටලු ගැන දීර්ඝ ලෙස සාකච්ඡා කළහ. ඇතැම් විට තර්ක කළහ. ඔවුන් දරණ මතයන්හි වැරදි සහගත බව පෙන්වා දුන්හ. එහෙත් එය සුහදත්වයට බාධාවක් කර ගත්තේ නැත.

බහු ආගමික සමාජයක අන්‍යාගමිකයන් තම ආගමට හරවා ගැනීමට ප්‍රයෝගකාරී ලෙස ක්‍රියා කිරීම සහජීවනයට බාධාවකි. බුදුරජාණන් වහන්සේ හෝ බුද්ධ ශ්‍රාවකයෝ කිසිවිටෙකත් එබඳු ක්‍රියා මාර්ගයක් අනුගමනය නොකළහ. බුදුරජාණන් වහන්සේ සමඟ කර්ම සංකල්පය පිළිබඳ තර්ක කිරීමට පැමිණි ජෛන ආගමික උපාලි ගෘහපතියා අවසානයේ තෙරුවන් සරණ යාමට තීරණය කළේය. එවිට බුදුරජාණන් වහන්සේ වදාළේ ඉක්මන් තීරණ නොගෙන හොඳින් සිතාබලා තීරණයකට එළඹෙන ලෙසය. දෙවනුවත් තෙවනුවත් උපාලි තෙරුවන් සරණ ගියේය. එවිට බුදුරජාණන් වහන්සේ ඔහු එතෙක් ජෛන ශාස්තෘවරයාට හා ශ්‍රාවකයන්ට කරගෙන ආ පුද සැලකිලි දන් පැන් දීම් ආදිය නොනවත්වා සිදු කරන ලෙස උපාලි ගෘහපතියාට වදාළහ. සහජීවනයට ආගමික පිළිගැනීම් ආදිය බාධාවක් කර නොගත යුතු ය යන පණිවුඩය ඒ තුළ ගැබ්වී ඇත.

භාවිතයට :

1. සහජීවනය සඳහා පුද්ගලයන් තුළ වර්ධනය කර ගත යුතු ගුණ ධර්ම මොනවාදැයි පැහැදිලි කරන්න.

2. පුද්ගලයන් තුළ පවත්නා කෙබඳු ආකල්ප සහජීවනයට බාධා කෙරේ දැයි දක්වන්න.

3. සහජීවනයේ අගය පෙන්වන බණ කතාවක් පන්තියට ඉදිරිපත් කරන්න.

28 වන පාඩම

# දේශපාලනික හා ආර්ථික දියුණුවට මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම්

බුදුදහම ලෝකෝත්තර සැපත ගැන පමණක් හෝ පරලොව දියුණුව ගැන පමණක් හෝ සඳහන් කරන දහමක් නොවේ. එහි මෙලොව දියුණුව සලසා ගැනීමට අවශ්‍ය උපදෙස් ද ඇතුලත්ව තිබේ. ඒ බව පැහැදිලි කර ගැනීමට දේශපාලනික හා ආර්ථික කරුණු පිළිබඳව බුදුදහමේ එන ඉගැන්වීම් සලකා බැලීම ද ප්‍රයෝජනවත්ය.

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූයේ දේශපාලනඥයෙකුගේ හෝ ආර්ථික විද්‍යාඥයෙකුගේ හෝ කාර්යය කිරීමට නොවේ. එසේ වුවද උන්වහන්සේගේ ඇතැම් දේශනාවන්හි දේශපාලනික කරුණු මෙන් ම ආර්ථික කරුණු ද ඇතුලත් ව ඇත. අවස්ථානුකූලව දහම් දෙසීමේදී ආර්ථික හෝ දේශපාලනික ප්‍රශ්න සම්පූර්ණයෙන් ම නොසලකා හැරීමට බුදුරජාණන් වහන්සේ කල්පනා නොකළහ. බොහෝ ජනයාගේ හිත සුව පිණිස දහම් දෙසූ ශාස්තෘවරයෙකු වූ උන්වහන්සේට එම කරුණු සම්පූර්ණයෙන් ම නොසලකා හැරීමට නොහැකිය. දේශපාලනික හා ආර්ථික කරුණු ද ජනතා සුවය කෙරෙහි බලපැවැත්වෙන බැවිනි.

පාලකයන්ට තම කටයුතු වඩා දැහැමිව හා සාර්ථකව ඉටු කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ දුන් උපදෙස් ඇතැම් සූත්‍රවල ඇත. එසේම උන්වහන්සේ බෝධිසත්ව අවධියේ දුන් උපදෙස් යලි සිහිගැන්වීම් වශයෙන් කළ ප්‍රකාශ ද සූත්‍ර ධර්මවල මෙන් ම ජාතක කථාවන්හි ද ඇත. රාජ්‍ය පාලකයන්ට දහම් දෙසීමේදී පාලකයකුට ගැලපෙන චරිතයක් ගොඩ නගා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදුන්හ. එසේම ජනතාවට වඩා යහපතක් සිදුවන දැහැමි පාලක ප්‍රතිපත්ති සකසා ගැනීමට මග පෙන්වූහ. ආර්ථික කරුණු පිළිබඳව ද එසේමය. දැහැමි බව සුරකෙන පරිදි ඉපයීමට හා පරිභෝජනයට අවශ්‍ය මග පෙන්වීම කළහ.

රටක පාලනික හා ආර්ථික ප්‍රතිපත්ති සැකසෙන්නේ රටේ සංවර්ධනය අරමුණු කරගෙනය. සංවර්ධනය යන්නෙන් බුදුදහම අදහස් කරන්නේ සෑම රටවැසියෙකුටම හොඳ ආර්ථික තත්වයක් තිබීම පමණක් නොවේ. විශාල මං මාවත් යානවාහන, ගොඩනැගිලි ආදිය තිබුණු පමණින් ද සංවර්ධිත

රටක් නොවේ. ඒවා සමගම පුද්ගලයන්ගේ සදාචාරවත් පැවැත්මක් තිබීම ද අවශ්‍ය බව බුදුදහම දක්වයි. එබැවින්, දේශපාලනික කරුණු වලදී මෙන්ම ආර්ථික කරුණු වලදීත් දැහැමි බව ගැන වැඩි අවධානයක් යොමු කිරීම බෞද්ධ පිලිවෙතයි.

බෞද්ධ දේශපාලන දර්ශනයේ දී ඉදිරිපත් කැරෙන ප්‍රධාන කරුණක් නම් ජනතාවට නායකත්වය දෙන පාලකයන් සදාචාර සම්පන්න ආදර්ශවත් අය විය යුතුය යන්නයි. ගව රැළක නායක ගවයා ඇදට යන විට පසු පසින් පැමිණෙන සියලු දෙනුන් ද ඇදට යන්නාක් මෙන් සමාජයේ ප්‍රධානීන් අධාර්මිකව කටයුතු කරන විට අනෙක් අයද එසේම කරන බවත් රජු අධාර්මික වූ විට මුළු රට ම විපතට පත් වන බවත් රාජෝවාද ජාතකයෙහි සඳහන් වෙයි. නායක ගවයා කෙළින් ගමන් කරන විට දෙනුන් ද කෙළින් යන්නාක් මෙන් සමාජ ප්‍රධානීන් දැහැමිව කටයුතු කරන විට සෙසු අය ද එසේම කරන බවත් රජු දැහැමි වූ කළ මුළු රට ම සැපතට පත්වන බවත් එහි ම සඳහන් වෙයි.

චක්කවත්ති සීහනාද සූත්‍රයට අනුව යහපත් පාලකයාගේ ප්‍රධාන ලක්ෂණය වන්නේ ධර්මයට මුල් තැන දීමයි. මෙහි ධර්මය යන්නෙන් අදහස් කැරෙන්නේ මනුෂ්‍ය ධර්මයයි. එනම් ජීවිත විනාශ කිරීම් ආදියෙන් වැලකුණු බවයි. එයින් කියැවෙන්නේ රටක පාලන තන්ත්‍රය යහපත් වීමට නම් පාලක පක්ෂය මිනිස්කමට නොගැලපෙන ක්‍රියාවන්ගෙන් වැලකිය යුතු බවයි. දසරාජ ධර්මයෙන් දැක්වෙන්නේ ද පාලකයකු තුළ පැවැතිය යුතු උසස් ආචාර ධර්ම පද්ධතියකි. දස රාජධර්මය ගාථාවකින් දක්වා ඇති අයුරු මෙසේයි.

දානං සීලං පරිච්චාගං - අජ්ජවං මද්දවං තපං
අක්කෝධං අවිහිංසඤ්ච - ඛන්තිඤ්ච අවිරොධනං

මෙහි දානය යන්නෙන් ගත යුත්තේ ජනතාවට අවශ්‍ය ආහාරපාන නිවාස ආදී මූලික පහසුකම් සැලසීමයි. ආපසු අය කර ගැනීමේ අදහසින් තොරව ජනතාවට තම ව්‍යාපාරික කටයුතු ඇරඹීමාදියට ආධාර සැපයීමද ඊට අයත් වේ. සීලය නම් සදාචාරවත් වීමයි. පන්සිල් පදනම් කරගත් ප්‍රතිපත්තියක පිහිටා අල්ලස් ගැනීම වැනි දූෂණයන්ගෙන් තොර වීමයි. පාලකයා රටවැසියා වෙනුවෙන් සිය කාලය ශ්‍රමය ධනය හා සුවපහසුකම් ආදිය කැප කිරීම පරිත්‍යාගයයි. අජ්ජව නම් සෘජු හෙවත් අවංක හා සාධාරණ බවයි. ජනතාව

රැවටීම් ආදියෙන් තොරව අගතිගාමී නොවී ස්ථිර ප්‍රතිපත්තියක පිහිටා ක්‍රියා කිරීමයි. මද්දව නම් මෘදු ස්වභාවයයි. එනම් ආඥාදායකයෙකුගේ ස්වරූපයෙන් තොරව ජනතා දයානුකම්පාවෙන් යුතුව ක්‍රියා කරන ගතියයි. තප යන්නෙන් අදහස් කැරෙන්නේ කාමුක සිතුවිලි ආදිය නිසා අසංවර නොවී ඉඳුරන්ගේ දමනයක් ඇති කර ගැනීමයි. එනම් පාලනය කර ගත් හැකීම් ඇත්තෙකු වීමයි. ජනතාව සමඟ මිත්‍රශීලි වීම අක්‍රෝධයයි. ජනතාවගේ දුර්වලතා තිබුණත් පියකු තම දරුවන් දෙස බලන්නාක් මෙන් මෛත්‍රී සහගතව කටයුතු කිරීමයි. හිංසක ක්‍රියාවන්ගෙන් වැලකීම අවිහිංසාවයි. මානව හිමිකම් පවා අහිමිවන සේ මර්ධන නීති රීති ක්‍රියාත්මක කිරීම, අසාධාරණ ලෙස බදු බර පැටවීම ආදිය ජනතාවට කරන හිංසාය. ඒවායින් වෙන්වීම අවිහිංසාවයි. ඛන්ති නම් ඉවසීමයි. ඉක්මන් තීරණ නොගැනීම, තම අත බලය තිබුණු තරමට දුබල අයගෙන් පළි නොගැනීම ආදිය තුළ ක්‍රියාත්මක වන්නේ ඉවසීමයි. අවිරෝධය නම් ජනතාව සමඟ ගැටුම් ඇති කර නොගැනීමයි. ගැටුම් ඇති වන්නේ ජනතා අදහස්වලට ඇහුම්කන් නොදෙන විටය. ඒ නිසා සාධාරණ ජන හඬට විරුද්ධ නොවීම අවිරෝධයයි.

ඉහත සඳහන් ආචාර ධර්ම රටක පාලකයන් තුළ ක්‍රියාත්මක වන්නේ නම් එම රටෙහි සාමය හා සමෘද්ධිය ඇති වේ.

රටවැසියන්ගේ ආරක්ෂාව සැපයීම පාලකයන්ගේ වගකීමකි. බෞද්ධ දේශපාලන දර්ශනය අනුව මිනිසුන්ගේ පමණක් නොව එම රටෙහි වෙසෙන සිවුපාවුන්ගේ හා පක්ෂීන්ගේ පවා ආරක්ෂාව සැපයීම දැහැමි පාලකයාගේ ලක්ෂණයකි. ඒ බව චක්කවත්ති සීහනාද සූත්‍රයෙන් පැහැදිලි වෙයි. එම සූත්‍රයෙහි සක්විති වත් දහයක් ඇත. ඒවාට අනුව පාලකයා පළමුව තම පවුලේ අය සදාචාරවත් පිළිවෙත්හි පිහිටුවා ඔවුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කර දෙමින් ආරක්ෂාව සැලසිය යුතුය. එසේම පිළිවෙලින් ආරක්ෂක හමුදාවෙහි, රජ පරපුරේ ජනයාගේ, රාජ්‍ය නිලධාරීන්ගේ, බ්‍රාහ්මණ ගෘහපති ආදී විවිධ ජන කොටස්වල නියම්ගම් දනවු වැසියන්ගේ හා රටේ සිටින සිල්වත් ගුණවත් පැවිද්දන්ගේ ආරක්ෂාව සැලසිය යුතුය. රටේ අපරාධ නැති කිරීම සඳහා දිළිඳු අයට ව්‍යාපාර ඇරඹීමාදියට ආධාර සැපයිය යුතුය. එසේම සිය රාජ්‍යයෙහි වෙසෙන පැවිදි උතුමන් වෙත වරින් වර පැමිණ උපදෙස් ලබා ගත යුතුය.

චක්කවත්ති සීහනාද සූත්‍රයෙහි දී ඉතා පැහැදිලිව දක්වා ඇති කරුණක් නම් පාලකයින් විසින් නිර්ධන කොටස් නොසලකා හරිනු ලැබීම නිසා

සොරකම් හා වෙනත් අපරාධ උග්‍ර වී මුළු රට ම ගැටලු රැසකට මුහුණ පාන බවයි. දිළින්දන්ට ආධාර සැපයෙන විට ඔවුන්ගේ මූලික ආර්ථික ප්‍රශ්න විසඳී බොහොමයක් සමාජ ගැටලු නිරාකරණය වේ. දුප්පත්කම නිසා අපරාධවලට යොමු වන එක් අයකුට හෝ කීපදෙනෙකුට පමණක් සහනාධාර සැපයීම හෝ අඩුවීම් කිරීම ප්‍රශ්නයට විසඳුමක් නොවන බවත් එය පොදු සමාජ ප්‍රශ්නයක් ලෙස සලකා ආධාර සැපයිය යුතු බවත් චක්කවත්ති සීහනාද සූත්‍රයෙන් පෙන්වා දී ඇත.

කූටදන්ත සූත්‍රයෙන් සැපයෙන දේශපාලනික උපදෙස් ද ඉතා වැදගත් ය. එහි සඳහන් වන්නේ රටේ කැරලි කෝලාහල හොර මැරකම් අපරාධ ආදිය නැති කිරීමට නම් රටවැසියන්ට රැකියා මාර්ග සුලභ කළ යුතු බවයි. කෘෂි කර්මාන්තයට කැමැති අයට බීජාධාර සැපයීම, වෙළඳාමට කැමති අයට මූලධනය සැපයීම ආදී වශයෙන් පුද්ගලයන්ට ආදායම් මාර්ග සකසා දිය යුතු බවත් එමගින් අපරාධ හා දූෂණ අඩුවන බවත් එම සූත්‍රයෙහි සඳහන් වෙයි.

මෙතෙක් සඳහන් කළ කරුණුවලින් පැහැදිලි වන්නේ ලෞකික ජීවිතයේ ප්‍රධාන අංගයක් වූ රාජ්‍ය පරිපාලන විධි සකස් කර ගැනීමේ දී බෞද්ධ ඉගැන්වීම් බෙහෙවින් ප්‍රයෝජනවත් වන බවයි.

මෙහි සඳහන් කරුණුවලට අමතරව සප්ත අපරිහානිය ධර්ම, සතර සංග්‍රහ වස්තු ආදිය ද යහපත් පාලන ක්‍රමයකට මඟ පෙන්වයි.

## ආර්ථික දර්ශනය

බෞද්ධ ආර්ථික දර්ශනය ගැන අවධානය යොමු කිරීමේදී පළමුව සඳහන් කළ යුත්තේ ලෞකික ජීවිතයක් සාර්ථක කර ගැනීමට ධනය අවශ්‍යය යන්න බුදුදහම පිළිගන්නා බවයි. ගිහියාට දිළිඳුකම දුකක් වන බවත් අවශ්‍යතා ඉටු කර ගැනීමට ප්‍රමාණවත් ධනයක් තිබීම සැපතක් බවත් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.ඒ නිසාම ඉපයීම, රක්ෂණය පරිභෝජනය, ආයෝජනය, ණය ගැනීම, ආදිය ගැන කරන ලද දේශනා සූත්‍ර ධර්මයන්හි ඇතුලත්ව තිබේ.

බුදුදහම උගන්වන්නේ ඉපයීම් දැහැමි ලෙස කළ යුතු බවයි. සතුන්, අවි ආයුධ, මස්මාංශ, මත්ද්‍රව්‍ය, හා වස විෂ ආදිය වෙළඳාම අධාර්මික ඉපයීම් මාර්ගය. දැහැමි වෙළඳාම, ගොවිතැන, ගව පාලනය, රාජ්‍ය සේවය වැනි

මාර්ගයකින් ධනය උපයා ගත යුතුය. ශ්‍රමය වැය කොට දහඩිය මහන්සියෙන් හරි හම්බ කර ගැනීම බුදුදහම අගය කරයි.

දැහැමි ලෙස උපයා ගන්නා ධනය ආරක්ෂා කර ගතයුතු බව ද සැලැස්මක් ඇතිව පරිභෝජනයට ගත යුතු බව ද බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. අප උපයන ධනය විනාශ වන්නේ සොර සතුරු උවදුරු ගිනි ගැනීම්, ජල ගැලීම්, ආදියෙන් පමණක් නොවේ. සුරාව, සූදුව, දුරාචාරය, පාපමිත්‍ර සේවනය වැනි දුර්වලතා නිසා ද ධනය විනාශ වී යයි. එබැවින් යහපත් ආර්ථික තත්වයක් ඇති කර ගැනීම සඳහා එබඳු දුර්වලතා නැති කරගත යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.

මහන්සියෙන් උපයා අනවශ්‍ය වියදම් නොකර ආරක්ෂා කර ගන්නා ධනය සැලසුම් සහගතව පරිහරණය කළ යුතුය. එහිදී එදිනෙදා පරිභෝජනය, ආයෝජනය හා ඉතිරිකිරීම යන කරුණු ගැන ද සැලකිලිමත් විය යුතු බව සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් වෙයි. එහි සඳහන් වන්නේ පුද්ගලයකු සම්බන්ධයෙන් වුවද රාජ්‍යයක් වශයෙන් ගන්නා විට ද එම කරුණු ගැන සැලකිලිමත් විය යුතු වෙයි. ආදායමෙන් වැඩි කොටසක් යලි ආයෝජනය කළ යුතු යයි දක්වා තිබීමේ වැදගත්කම මෙහිදී විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුය. ආදායමෙන් එක් කොටසක් පරිභෝජනය සඳහා ද කොටස් දෙකක් කර්මාන්ත ආදිය සඳහා ද වෙන් කළ යුතු බවත් සිව්වැන්න ඉතිරි කළ යුතු බවත් සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වෙයි.

ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වන ආකාරයට අය සහ වැය අතර විශාල පරතරයක් ඇති නොවනසේ කටයුතු සංවිධානය කළ යුතුය. එය හැඳින්වෙන්නේ **සම ජීවිකතාව** ලෙසය. විශාල ආදායමක් තිබියදී අවශ්‍යතා සඳහා වියදම් නොකිරීමත් ආදායම ඉතා පහළ මට්ටමක තිබියදී අධික වියදම් කිරීමත් යන දෙකම නොවිය යුතු බවයි බුදුදහමෙහි සඳහන් වන්නේ.

ධනය ඉපයිය යුත්තේ තෘෂ්ණාවෙන් රැස් කර තබා ගැනීම සඳහා නොව තමන්ගේත් තම මවුපියන්ගේත්, අඹුදරුවන් ඇතුළු සමාජයේ යහපත සඳහා බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.

අරපිරිමැස්ම බෞද්ධ ආර්ථික විද්‍යාවේ බෙහෙවින් අගය කෙරෙන්නකි. බොහෝ දෙනෙකු වියදම් කරන්නේ මූලික අවශ්‍යතාවයන්ට වඩා අවශ්‍යම

නොවූ දේ සඳහාය. මත්පැන්, දුම්වැටි, විවිධ විලාසිතා අධික විනෝදවීම් ආදිය සඳහා අපමණ වියදම් කරන්නෝ සිටිති. අල්පේච්ඡ, සැහැල්ලු අඩු වියදම් සහිත ජීවිතයක් ගොඩ නගා ගැනීමට බුදුදහමින් මඟ පෙන්වන්නේ ධනය ඉපයීම තම සැපත සඳහා පමණක් නොවන බැවිනි. තමාගේ සීමිත අවශ්‍යතා සඳහා වියදම් කර ඉතිරියක් වේ නම් එය පොදු කටයුතු සඳහා යෙදවිය හැකිය.

දේශපාලන දර්ශනය පිළිබඳ සාකච්ඡාවේ දී සඳහන් කළාක් මෙන් පාලක පක්ෂය රටේ ආර්ථික තත්වය නඟා සිටුවීම සඳහා ක්‍රියාත්මක විය යුතු බව බුදුදහමෙහි සඳහන් වෙයි. ගොවිතැන වෙළඳාම ආදී කටයුතු සඳහා ඉදිරිපත් වන අයට අවශ්‍ය ආධාර දිය යුතු බව කූටදන්ත සූත්‍රයෙහි සඳහන් වන්නේ එබැවිනි.

ණය ගැති කම බුදුදහමෙහි සැලකෙන්නේ දුකක් වශයෙනි. ණය නැතිකම සැපයකි. පුද්ගලයකු වශයෙන් හෝ රටක් වශයෙන් හෝ ණය බරින් තොරවීමට නම්. ඉපයීම, රක්ෂණය, පරිභෝජනය, ආයෝජනය ආදී සියල්ල විධිමත් විය යුතුය. ධර්මය අමතක නොකර, ධර්මයෙහි පිහිටා සියළු ආර්ථික කටයුතු කළ යුතුය. ආර්ථිකය පිළිබඳ බෞද්ධ ආකල්පය එයයි.

දේශපාලනික හා ආර්ථික කටයුතු පිළිබඳව මෙහි සඳහන් කරුණු සලකා බැලීමෙන් බුදුදහම මෙලොව දියුණුව ගැන කොතරම් සැලකිල්ලක් යොමු කර තිබේ දැයි වටහා ගත හැකිය.

භාවිතයට

1. බුදුදහම අනුව පාලකයකු තුළ පැවතිය යුතු ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න.

2. යහපත් ආර්ථික තත්වයක් ඇතිකර ගැනීමට අනුගමනය කළයුතු පිළිවෙත් මොනවාදැයි බුදුදහම ඇසුරෙන් පැහැදිලි කරන්න.

29 පාඩම

## ගෘහස්ථ හා සාමාජික දියුණුවට බුදුදහමේ උපදෙස්

මිනිසා ස්වභාවයෙන් ම හුදකලාව ජීවත් වන්නකු නොව සමාජයක ජීවත් වන්නෙකි. පුද්ගලයන් කිහිපදෙනෙකු ඒකරාශි වූ තරමින් සමාජයක් නොවේ. සමාජයක් ලෙස සැලකෙන්නේ එකිනෙකා කෙරෙහි අන්‍යෝන්‍ය වශයෙන් බලපැවැත්වෙන ක්‍රියාකාරකම් සහිත පුද්ගල එකතුවකි. එබැවින් පුද්ගලයා සමාජය කෙරෙහිත් සමාජය පුද්ගලයා කෙරෙහිත් බලපායි.

සමාජයේ කුඩා ම ඒකකය පවුලයි. එය සැකසෙන්නේ අඹු සැමියන් මුල් කරගෙනය. අඹු සැමියන් හා ඔවුන්ගේ දරුවන්ගෙන් යුක්ත වූ ගෘහ ජීවිතයේ යහපත් පැවැත්ම සඳහාත් එබඳු පවුල්වලින් යුක්ත වූ සමාජයේ අභිවෘද්ධිය සඳහාත් බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද දේශනා විවිධ සූත්‍රධර්මයන්හි ඇතුලත් ව තිබේ.

පවුලේ නායකත්වය ගෘහ ජීවිතයේ දියුණුව හෝ පිරිහීම කෙරෙහි බලපායි. ප්‍රධානියා මනා චරිත ශක්තියක් ඇත්තෙකු විය යුතුය. ආර්ථික වශයෙන් සමෘද්ධියට පත් වූ පවුලක පරිහානියට හේතුවන ප්‍රධාන කරුණු හතරක් අංගුත්තර නිකායයේ චතුක්ක නිපාතයේ කුල සූත්‍රයෙහි සඳහන් වෙයි. ඒවා අතර එකකි දුස්සීල වූ කාන්තාවක හෝ පුරුෂයකු එම පවුලේ ප්‍රධානත්වයට පත්වීම. මෙහි දුස්සීල යන්නෙන් අදහස් කැරෙන්නේ විවිධ දුසිරිත්වල ඇලුණු ගැලුණු බවයි. කාම අපචාර, සූදුව, සුරාව, වංචාව, හිංසාව වැනි දේට යොමු වූ තැනැත්තකුට නිවසක් පාලනය කළ නොහැකිය. එබඳු තැනැත්තෙකුගෙන් පවුලේ අනෙක් සාමාජිකයන්ට ලැබෙන්නේ වැරදි ආදර්ශය . එවිට ඒ අයද දුසිරිතට යොමු වෙති. සුරාව, සූදුව, කාමසේවනය, ආදියට අතිශයින් ලොල් වූ කිසිදු පාලනයකින් අරපිරිමැස්මකින් තොරව වියහියදම් කරන තැනැත්තකු ප්‍රධානත්වයට පත් කර ගැනීම පිරිහීමේ දොරටුවක් බව සුත්ත නිපාතයේ පරාභව සූත්‍රයෙහි ද සඳහන් වෙයි. මෙම දේශනාවන්ගෙන් පැහැදිලි වන්නේ පවුලක් දියුණු වීමට නම් එම පවුලට මනා චරිතයක් ඇති කෙනෙකුගේ නායකත්වයක් තිබිය යුතුය යන්න බුදුදහමෙහි ඉගැන්වෙන බවයි.

ගෘහ ජීවිතයේ දියුණුවට පවුලේ ආර්ථික ශක්තිය බෙහෙවින් බලපායි. එබැවින් එම ශක්තිය රැක ගැනීමට ගත යුතු පියවර ගැන බුදුදහමින් මඟ පෙන්වා ඇත. ධනය ඉපයීම පමණක් ප්‍රමාණවත් නොවේ. එහි සුරක්ෂිතභාවය

ද අවශ්‍යය. කූල සූත්‍රයෙහි සඳහන් පරිදි කිසියම් පවුලක් සතුව ඇති දෑ නැති වන විට ඒ වෙනුවට අළුතින් රැස් කිරීම් නොකැරෙන්නේ නම් එම පවුල පිරිහීමට පත්වේ. එසේම දිරාගිය දෑ ප්‍රතිසංස්කරණය නොකිරීමද පරිහානියට හේතුවකි. ආහාරපාන ඇඳුම් පැළඳුම් ආදිය සඳහා අධික වියදම් කිරීම ද පවුලේ පිරිහීමට හේතුවන්නක් බව එම සූත්‍රයෙහි සඳහන් වෙයි. විනාශ වූ දෑ වෙනුවට අළුතින් සෙවීම, දිරාගිය දෑ අළුත්වැඩියා කිරීම හා ආහාරපානාදිය සඳහා ප්‍රමාණයක් ඇතුව වියදම් කිරීම සාර්ථක ගෘහ ජීවිතයකට අවශ්‍යය.

පවුලේ සාමාජිකයන් අතර අන්‍යොන්‍ය වශයෙන් මනා සුහද සම්බන්ධතාවයක් තිබීම ද ගෘහස්ත ජීවිතයේ සාර්ථකත්වයට අවශ්‍යය. ඔවුනොවුන්ගෙන් ඉටු විය යුතු යුතුකම් පිළිබඳව බුදුදහමේ සඳහන් වන්නේ එබැවිනි. මවුපියන්ගෙන් දරුවන්ට හෝ දරුවන්ගෙන් මවුපියන්ට හෝ ඉටු විය යුතු දෑ කුමන පක්ෂයකින් හෝ ඉටු නුනොත් එම පවුල තුළ මනා මවුපිය දූදරු සම්බන්ධතාවයක් ඇති නොවේ. එසේම බිරිඳගෙන් සැමියාට හෝ සැමියාගෙන් බිරිඳට හෝ ඉටුවිය යුතුකම් ඒ දෙදෙනාගෙන් එක් අයෙකුගෙන් හෝ ඉටු නූනහොත් මනා ස්වාමි - භාර්යා සම්බන්ධතාවයක් ඇති නොවේ. පවුලේ අනෙකුත් සාමාජිකයන් අතර අන්‍යොන්‍ය යුතුකම් ඉටු නොවන විට සම්බන්ධතා බිඳී යන අයුරු අපට දක්නට ලැබේ. සම්බන්ධකම් සුරක්ෂිත වීමට හා දියුණුවීමට යුතුකම් ඉටු කිරීම අතිශයින් උපකාර වෙයි. ගිහි විනය හැටියට හැඳින්වෙන සිඟාලෝවාද සූත්‍රයෙහි විශේෂ අවධානයක් යුතුකම් ඉටුකිරීම පිළිබඳව යොමු කර ඇත්තේ එම නිසාය. ගෘහස්ත සාමාජිකයන්ගේ එම යුතුකම් මොනවාදැයි දහම් පාසල 7, 8 ශ්‍රේණි පාඨ ග්‍රන්ථවල සඳහන් වෙයි.

පවුලක ප්‍රධාන සාමාජිකයන් දෙදෙනාවන අඹු සැමි යුවළ තුල පැවතිය යුතු ගුණාංග පිළිබඳව සිඟාලෝවාද සූත්‍රයට අමතරව වෙනත් දේශනාවන්හි ද සඳහන් වෙයි. යුග දිවිය සාර්ථක වීම සඳහා දෙදෙනාම ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, ත්‍යාගශීලිත්වයෙන් හා ප්‍රඥාවෙන් සමාන තත්වයක සිටීම වැදගත් වන බව අංගුත්තර නිකායේ සමජීවී සූත්‍රයෙහි සඳහන් වෙයි.සංවාස සූත්‍රයෙහි සඳහන් වන පරිදි අඹු සැමි දෙදෙනම අශීලාචාර වුවහොත් ඒ දෙදෙනාගේ එකතුව මළමිනී දෙකක එකතුවක් වැනිය. දැහැමි දිවියක් ඇති පුරුෂයා යුගදිවිය ගත කරන්නේ අශීලාචාර කාන්තාවක සමඟ නම් එය දෙවියෙකු සමඟ මළ මිනියක් එකතුවීමක් වැනිය. ශීලාචාර කාන්තාව යුග දිවිය ගෙවන්නේ අශීලාචාර පුරුෂයකු සමඟ නම් එහි ඇත්තේ දෙවඟනක සමඟ

මළ මිනියක් එකතු වීමකි. අඹු සැමි යුවලම දැහැමි නම් එතැන දක්නට ලැබෙන්නේ දෙවියකුගේ හා දෙවඟනකගේ එකතුවකි. තම නිවස ම දෙව්ලොවක් කර ගැනීමට නම් ස්වාමි භාර්යාවන් දැහැමි ලෙස ජීවත් විය යුතු බවයි මෙයින් ප්‍රකාශ වන්නේ.

සාර්ථක ගෘහස්ථ ජීවිතයක් සඳහා සෞඛ්‍ය සම්පන්න වීම අවශ්‍යය. ලැබීම් අතර උසස් ම ලාභය නිරෝගීකම බව බුදුදහමෙහි සඳහන් වෙයි. ඒ සඳහා ගේ දොර වත්තපිටිය, වැසිකිළි කැසිකිළි ආදිය පිරිසිදුව තබා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දී ඇත. එසේම දත් මැදීම, නිය කැපීම, ඇඳුම් පිරිසිදු කිරීම ආදියේ වැදගත්කම ද සඳහන් වෙයි. ගෘහස්ථ ජීවිතයේ සාර්ථකත්වයට උපකාර වන්නේ ශාරීරික සෞඛ්‍යය පමණක් නොවේ. මානසික සෞඛ්‍යය ද උපකාරී වේ. ඒ සඳහා කරුණාව, මෛත්‍රිය, මුදිතාව, උපේක්ෂාව, ඉවසීම, පරිත්‍යාගශීලීත්වය, වැනි ගුණාංග ප්‍රගුණ කිරීම අවශ්‍යය. පවුලේ සාමාජිකයන් සියළු දෙන එම ගුණාංගයන්ගෙන් යුක්ත වන විට ඔවුන් මානසික වශයෙන් සෞඛ්‍ය සම්පන්න වන අතර ගෘහස්ථ පරිසරය ද සාමකාමී හා සැනසිලිදායක වේ.

සාමාජික දියුණුවට අදාළ බෞද්ධ උපදෙස් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පළමුව පංචශීලය ගැන සඳහන් කළ යුතු වෙයි. පන්සිල් රකින සමාජය ආරක්ෂිත සමාජයකි. පළමු ශික්ෂාපදය නොරැකෙන සමාජයේ නිතරම ජීවත් වන්නට සිදු වන්නේ කුමන මොහොතක හෝ තමාගේ ජීවිතය අනෙකකු විසින් විනාශ කරනු ලැබිය හැකිය යන සැකයෙන් හෝ බියෙන් යුතුවය. දෙවන ශික්ෂාපදය ආරක්ෂා නොවන සමාජයේ පවතින්නේ කුමන මොහොතක හෝ තමා අයත් දෑ පැහැර ගනු ඇතැයි යන සැකය මුසු බියයි. එම ශික්ෂාපද සැම දෙනම විසින් ආරක්ෂා කරනු ලැබේ නම් සැකෙන් බියෙන් තොර සමාජයක් ඇතිවේ. කාම මිථ්‍යාචාරයෙන් වැලකෙන විට සමාජයෙහි කාම අපරාධ සිදු නොවේ. අඹු සැමියන්ට අන්‍යොන්‍ය සැකයෙන් තොරව සාමකාමී පවුල් ජීවිත ගත කිරීමට අවස්ථාව සැලසේ. මුසාවාදයෙන් වැලකුණු සමාජයෙහි කවරකු හෝ විසින් තමා රවටනු ඇතැයි යන සැකයෙන් තොරව ජීවත් වීමට හැකිවන අතර පස්වන ශික්ෂාපදය රැකෙන සමාජයෙහි මත්ද්‍රව්‍ය නිසා සිදුවන විවිධ අපරාධ, දූෂණ, ධන පරිහානි, සෞඛ්‍ය පරිහානි ආදියෙන් තොරව සිහිබුද්ධියෙන් ක්‍රියා කරන සෞඛ්‍ය සම්පන්න පිරිසක් බිහි වේ. මෙසේ පංච ශීලය ආරක්ෂා වන්නේ නම් සාමාජික වශයෙන් ඇති වන දියුණුව ඉමහත්ය.

වේළුද්වාර සූත්‍රයේ සඳහන් වන අත්තූපනායික ධර්ම පර්යාය ද සාමාජික දියුණුවට උපකාර වන ඉගැන්වීමකි. තමා විඳීමට අකමැති දුක් වේදනාවන් අන් අයට විඳීමට සැලසීමෙන් වැලකීම එම ධර්ම පර්යායෙන් සිදුවේ. යමෙක් මා හට අයත් දෙයක් සොරකම් කරයි නම් එයට මම අකමැත්තෙමි. මා ද අනෙකකුට අයත් දෙයක් සොරකම් කරන්නේ නම් හෙතෙමේ ද එයට අකමැති වෙයි. මා අප්‍රිය කරන දේ අනෙකාට ප්‍රියයි. එබැවින් මා අප්‍රිය කරන දුක් වේදනාව අනෙකකුට විඳීමට සැලසීම සුදුසු නොවේ. යනාදීන් කල්පනා කර තමාත් සොරකමින් වැලකෙයි. අනෙක් අයත් සොරකමින් වලක්වයි. සොරකමින් වැලකීමේ වටිනාකම ද කියා දෙයි. මෙසේ කරන විට ක්‍රියාත්මක වන්නේ අත්තූපනායික ධර්ම ක්‍රමයයි. ප්‍රාණඝාතාදී අනෙකුත් අකුසලයන්ගෙන් වැලකීමේ දී ද මෙම ක්‍රමය අනුගමනය කළ යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. මෙම ධර්ම පර්යාය සමාජයේ සියළු සාමාජිකයන් විසින් අනුගමනය කැරෙන්නේ නම් සාමාජික වශයෙන් ඉමහත් දියුණුවක් සැලසෙයි.

සමාජයේ දියුණුව සඳහා යුතුකම් ඉටු කිරීම ද අවශ්‍ය වේ. සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන් වන ගුරු ශිෂ්‍ය අන්‍යොන්‍ය යුතුකම්, හිත-මිතුරු යුතුකම්, ගිහි පැවිදි යුතුකම් හා සේව්‍ය සේවක යුතුකම් ඉටුවීම ප්‍රබල ලෙස සමාජය කෙරෙහි බලපැවැත්වේ. ඒවා ඉටු නොවන විට සමාජයෙහි අවුල් වියවුල් හට ගැනේ.

සතර බ්‍රහ්ම විහාර හා සතර සංග්‍රහ වස්තු ක්‍රියාත්මක වන සමාජය ද දියුණුවට පත්වෙයි. සිව් බඹ විහරණ පිළිබඳ මෙම ග්‍රන්ථයෙහි ම වෙනත් පාඩමක සඳහන් වෙයි. සතර සංග්‍රහ වස්තුව නම් දාන, ප්‍රියවචන, අර්ථචර්යා, සමානාත්මතා යන සතරයි. අනුන් කෙරෙහි පරිත්‍යාගශීලිවීම, සුහද ප්‍රියශීලි වචන කථා කරන බව, අන් අයගේ දියුණුව සඳහා ක්‍රියා කරන බව සහ කුමන ආකාරයක හෝ භේද නොසලකා සැම දෙනාගේම දුක සැප දෙකේදීම හිතවත්ව ක්‍රියාකිරීම සමාජයක දියුණුවට හේතු වෙයි.

අගතිගාමී නොවී සාධාරණ ලෙස ක්‍රියා කිරීම ද සමාජයක යහ පැවැත්ම සඳහා අවශ්‍ය වේ. පුද්ගලයාට සතර අගතියෙන් ඈත් වන ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත්තේ එබැවිනි.

වසල සූත්‍රයේ සඳහන් වන සමහර වසලකරණ ධර්ම පැහැදිලිව ම සාමාජීය දියුණුවට බාධකයන්ය. ණය හිමියකු ණයකරුවකුගෙන් තම ණය මුදල ආපසු ඉල්ලූ විට මා ඔබෙන් ගත් ණයක් නැතැයි ණය ගෙවීම වංචනික ලෙස පැහැර හැරීම, බැහැර නිවසකට ගිය විට තමාට ආහාරපානවලින් හොඳින් සංග්‍රහ කළ අයෙකු තම නිවසට පැමිණි විට පෙරළා ඔහුට සංග්‍රහ නොකිරීම වැනි කරුණු ඒ අතර වෙයි. සාමාජික දියුණුව සඳහා එබඳු ලක්ෂණ පුද්ගලයන් තුළින් ඉවත් විය යුතු බව බුදු දහම සඳහන් කරයි.

මෙසේ සලකා බලන විට ගෘහස්ථ හා සාමාජික ජීවිතයේ දියුණුවට මහ පෙන්වන උපදෙස් රැසක් බුදුදහමෙහි අන්තර්ගතව ඇති බව පෙනේ. බුදුදහම වැඩිදුර හදාරණ විට එබඳු උපදෙස් තව තවත් දැන ගැනීමට හැකි වනු ඇත. ඒ සියල්ල අපට හෙළි කරන්නේ "බුදු දහම මෙලොව ජීවිතයට ප්‍රයෝජනයක් නැති දහමකි "යන මතය කිසිදු පදනමක් නැති අවිචාරවත් එකක් බවයි.

භාවිතයට

1. පවුලක පිරිහීම හෝ දියුණුව කෙරෙහි ගෘහ මූලිකයාගේ ක්‍රියා කලාපය බලපාන අයුරු බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් පැහැදිලි කරන්න.

2. යුතුකම් ඉටු කිරීම ගෘහස්ථ හා සාමාජික දියුණුවට උපකාරවන අයුරු පෙන්වා දෙන්න.

30 පාඩම

# බුදුදහම පිළිබඳ වැරදි විචාර

උපතින් ම ඇස් අන්ධව සිටි කීපදෙනෙක් ඇතාගේ හැඩරුව හඳුනා ගැනීම සඳහා ඇතාගේ ශරීරය අතගා බැලූහ. ඔවුන්ගෙන් එක් අයකු කීයේ ඇතා වංගෙඩියක හැඩරුව ඇති බවයි. ඔහු එසේ නිගමනය කළේ ඇතාගේ කකුලක් පමණක් අත ගෑ නිසයි. කනක් පමණක් අත ගෑ තැනැත්තාගේ මතය වූයේ ඇතා කුල්ලකට සමාන බවයි. ඇතාගේ හැඩරුව මුස්නකට සමාන යයි පැවසූයේ වල්ගය පමණක් අත ගෑ තැනැත්තාය. ඒ එක් අයකුටවත් ඇතාගේ නියම හැඩරුව හඳුනාගැනීමට නොහැකි විණි. ඊට හේතුව කිසිවකුට සම්පූර්ණ ශරීරය හසු කර ගැනීමට නොහැකි වීමයි.

ඇතාගේ ශරීරයේ යම් යම් කොටස් අත ගෑ අන්ධයන් මෙන් බුදුදහම පිළිබඳ සම්පූර්ණ හැදෑරීමක් නොකර, එහි කිසියම් ඉගැන්වීමක් යම්තමින් ඉගෙන ගත් අය යම් යම් වැරදි නිගමන ඉදිරිපත් කර ඇත. ඒ නිගමන මත බුදු දහම විචාරයට ලක් කොට තිබේ. එබඳු සාවද්‍ය නිගමනයක් නම් **බුදුසමය මිනිසාගේ මෙලොව ප්‍රගතිය හා සම්බන්ධ නොවූ පරලොව සුගතිය සඳහා පමණක් වූ දහමක් ය යන්නයි.** ගිහියාගේ මෙලොව ජීවිතය සැපවත් කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත් පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේ විසින් කර ඇති දේශන රාශිය අතුරින් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයවත් කියවීමට ලැබිණි නම් ඉහත කී නිගමනයට නොඑළඹෙනු ඇත.

ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සඳහන් පරිදි දීඝජානු නම් තැනැත්තා බුදුරජාණන් වහන්සේට පැහැදිලිව ම ආරාධනා කළේ කාමභෝගී ගිහි ජීවිතයක් ගත කරන තමන් ඇතුළු පිරිසට මෙලොව සැපවත් කර ගැනීමටත් පරලොව සැපවත් කර ගැනීමටත් උපකාර වන දහමක් දේශනා කරන ලෙසයි. එහි දී බුදුරජාණන් වහන්සේ මෙලොව දියුණුවට අවශ්‍ය වන කරුණු හතරකුත් පරලොව සැපත පිණිස අවශ්‍ය වන කරුණු හතරකුත් වෙන වෙන ම දේශනා කළහ.

කම්මැලිකමින් තොරව උත්සාහවන්තව දැහැමි රැකියාවක නිරතවීම, දහඩිය මහන්සියෙන් දැහැමිව උපයාගන්නා ධනය ආරක්ෂා කර ගැනීම, යහපත් මිත්‍රයන් ඇසුරු කිරීම හා තමාගේ ආදායම් තත්වය වටහා ගෙන වැය කළ හැකි පමණට නොමසුරුව වැයකිරීම යන කරුණු මෙලොව යහපත සඳහා අවශ්‍ය බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ.

ගිහි විනය යන ජනප්‍රිය නාමයෙන් හැඳින්වෙන සිඟාලෝවාද සූත්‍රයෙහි ඇතුළත් කරුණු මෙලොව පුද්ගල සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට ද මඟ පෙන්වන සර්වකාලීන වටිනාකමක් ඇති ඉගැන්වීම් ය. මවුපිය-දූදරු, ස්වාමි - භාර්යා ආදී ලෞකික ජීවිතයට අදාළ ප්‍රධාන සම්බන්ධතා මනාව පවත්වාගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම එම සූත්‍රයෙහි දක්නට ලැබේ. පවුල් ජීවිතයේ න්‍යෂ්ටිය වන අඹු-සැමි සම්බන්ධය සාර්ථකව ගොඩ නඟා ගැනීමට අවශ්‍ය උපදෙස් අංගුත්තර නිකායේ සංවාස සූත්‍රය ආදී දේශනාවන්ගෙන් ද ඉදිරිපත් කර ඇත. දීඝ නිකායේ චක්කවත්ති සීහනාද, කූට දන්ත වැනි සූත්‍රවලින් ඉදිරිපත් කැරෙන කරුණුවලින් දේශපාලනික හා ආර්ථික ක්ෂේත්‍රය කෙරෙහි බුදුදහම දක්වන අවධානය පැහැදිලි වෙයි. මෙම කරුණු හා මෙබඳු තවත් බොහෝ දේශනා කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොකළ පුද්ගලයන් විසිනි. බුදුදහම මෙලොව ප්‍රගතිය හා සම්බන්ධ නොවූ දහමක් ලෙස හඳුන්වනු ලබන්නේ.

බුදුදහම විවේචනය කරන ඇතමකුගේ මතය වන්නේ එය සියල්ල ම කර්මය වෙත පවරා මිනිසුන් උදාසීන කරන දහමක් බවයි. එය ද බෞද්ධ කර්ම සංකල්පය නිසි පරිදි වටහා නොගත්තවුන්ගේ නිගමනයකි. පුබ්බේකත හේතුවාදය බුදුරජාණන් වහන්සේ විසින් පැහැදිලිව ම ප්‍රතික්ෂේප කරන ලද බව කර්මය පිළිබඳ පාඩම්වල දී අනාවරණය කැරිණි. නියාම ධර්ම පිළිබඳ ඉගැන්වීමෙන් ද පැහැදිලි කැරෙන්නේ පුද්ගල ජීවිතය කෙරෙහි බලපවත්වන්නේ කර්මය පමණක් නොවන බවයි. එසේ ම උත්සාහ සම්පත්තිය නිසා ඇතැම් අකුසල විපාක වැලකෙන බවත් විපත්තිය (අලස බව) නිසා ඇතැම් කුසල විපාක වැලකෙන බවත් බුදුදහමෙහි සඳහන් වෙයි. ඒ නිසා කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම මිනිසුන් උදාසීන කරවන්නක් ලෙස හැඳින්වීම වැරදිය. බෞද්ධ කර්ම සංකල්පය වැරදි ලෙස තේරුම් ගත් අය නම් සියල්ල ම ධර්මයට පවරා උදාසීනව සිටිය හැකිය. එය වැරදි වැටහීමේ වරදක් මිස කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමේ වරදක් නොවේ.

ඇතැම් බටහිර උගතුන් බුදුදහම දකින්නේ උද්යෝගිමත් යුරෝපියයන්ට නොගැලපෙන අශුභවාදී දහමක් ලෙසයි. අශුභවාදී ඉගැන්වීම්වල ස්වභාවය ජීවිතයේ අඳුරු පැත්ත, දුක්බර පැත්ත ගැන පමණක් අවධානය යොමු කිරීමය. දුක පිළිබඳව බුදුදහමේ කැරෙන ඉගැන්වීම එය අශුභවාදී දහමක් ලෙස හැඳින්වීමට සාධක කර ගෙන ඇත. එය ද ඇතාගේ එක් ශරීරාංගයක් පමණක් අතගා ඇතා එබඳු සතෙකැයි නිගමනය කිරීමට සමානය. බුදුදහම සර්ව අශුභවාදයකැයි කිව හැක්කේ එය කිසිදු සැපතක් ගැන සඳහන් නොකරන දුක ගැන පමණක් ම උගන්වන දහමක් නම් පමණකි. එහෙත් බුදුදහම එවැනි ඉගැන්වීමක් නොවේ.

ජීවිතය දුක් සහිත යයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද නමුත් එහි කිසිදු සැපතක් නැතැයි නොදෙසූහ. ගිහි සුඛ, පබ්බජිත සුඛ, කායික සුඛ, චෛතසික සුඛ, ආදී වශයෙන් විවිධ සැප ගැන දේශනා කර ඇත. අප සැප ලෙස සලකනු ලබන බොහෝ දේ වෙනස් වන නිසා ඒවාත් නියම වශයෙන් ඇතුළත් විය යුත්තේ දුක්ඛ සංඛ්‍යාවට ම බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. යදනිච්චං තං දුක්ඛං - යමක් අනිත්‍ය ද - වෙනස්වන සුළු ද එය දුක් සහිත යයි දේශනා කළහ. එය ඇත්ත ඇති සැටි හෙළි කිරීමක් මිස අමුතුවෙන් අශුභවාදී අමිහිරි තත්වයන් ගෙන හැර දැක්වීමක් නොවේ.

කම් සැපවල ආදීනව එනම් කම්සැප විඳීමෙන් ලැබෙන අයහපත් ප්‍රතිඵල ගැන බුදුදහමෙහි ඉගැන්වෙන නිසා ද එය අශුභවාදයක් ලෙස ඇතැම්හු හඳුන්වති. එහෙත් කාමයන්හි ආශ්වාදයක් පිළිබඳවද බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති බව ඔවුහු අමතක කරති. කාමයන්හි ආශ්වාදයක් නැත්නම් සත්වයන් ඒවායෙහි නොඇලෙන බවත්, කාමයන්හි ඇලෙන්නේ ආශ්වාදයක් - රස වින්දනයක් ඇති නිසා ම බවත් බුදුරජාණන් වහන්සේ වදාරා ඇත. එහෙයින් 'කාමයන් ආස්වාද හා ආදීනව යන දෙකින් යුක්ත බව පැහැදිලිය.

කාමයන්හි ආදීනව වටහා ගෙන ඒවායෙහි ඇලීමෙන් වෙන්වීම නිස්සරණ නමින් හැඳින්වෙයි. එසේ වෙන්වීම සැපතට හේතුවෙයි. මෙම කරුණුවලින් අනාවරණය වන්නේ කාමාදීනව පමණක් බුදුරජාණන් වහන්සේ දේශනා නොකරන බවය. එසේම ඇති තතු හෙළි කිරීමක් මිස අමුතු අඳුරු තත්වයක් නිර්මාණය කර නොපෙන්වන බවය.

බෞද්ධයාගේ පරම නිෂ්ටාව වන නිර්වාණය පිළිබඳ ගොඩ නගා ගෙන ඇති වැරදි සංකල්පය නිසා ද බුදුදහම අශුභවාදයක් ලෙස ඇතැමුන් හඳුන්වන බව පෙනේ. ඇතැම් ආගම්වල උගන්වන්නේ යහපතෙහි යෙදුනු මිනිසා මරණින් පසු සදාකාලිකව ම සැප විඳින ස්වර්ගයට සම්බන්ධ වන බවය. බුදුදහමෙහි ඉගැන්වෙන නිර්වාණය සදාකාලික ස්වර්ගය වැන්නක් නොවේ. එය මරණින් පසු ලබන තත්වයක් ද නොවේ. නිවන නම් රාග දෝස මෝහ යලි නූපදින පරිදි සම්පූර්ණයෙන් ම චිත්ත සන්තානය පිරිසිදු වීමයි. රාගය නම් රූපාදී අරමුණුවල ඇලෙන ගතියයි. දෝසය නම් අරමුණුවල ගැටෙන ගතියයි. එනම් අප්‍රිය අරමුණු නිසා සිත දූෂණය වන ගතියයි. මෝහය නම් අරමුණු නිසි පරිදි වටහා ගත නොහැකිව මුලාවන ගතියයි. අපට බොහෝ දුක් ඇති වන්නේ එකී රාග දෝස මෝහයන් සිතෙහි බලපැවැත්වෙන විටය. ඒවා සම්පූර්ණයෙන් ම ඉවත්වීම මහත් සැනසුමකි.

උසස් ම සැනසුම එයයි. එබඳු සැනසුමකට මඟ පෙන්වන දහමක් අශුභවාදයක්යැයි හඳුන්වන්නේ කෙසේ ද?

ලෝකය දුකින් පිරී ඇති බව පමණක් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්නම් බුදුදහම සර්ව අශුභවාදයකැයි හැඳින්විය හැකිය. එහෙත් බුදුදහමේ සඳහන් වන්නේ දුක ගැන පමණක් නොවේ. දුකෙහි හේතුව ගැනත් ඒ හේතුව නැති වීමෙන් ලැබෙන සැපත ගැනත් දැක්වෙයි. ඒ සඳහා අනුගමනය කළ යුතු පිළිවෙතක් ද පෙන්වා තිබේ. අස්වාභාවික අඳුරු තත්වයක් හෝ නැති සුන්දරත්වයක් මවා නොපෙන්වා ලෝකයේ නියම තත්වය හා ඊට මුහුණදිය යුතු ආකාරය පැහැදිලි කිරීමයි, බුදුදහමින් සිදු වී තිබෙන්නේ.

සත්වයා සදාකාලික ව අපාගත වීමක් ගැන බුදුදහමෙහි සඳහන් වන්නේ නම් එය අශුභවාදයක් ලෙස හැඳින්වීමට සුදුසුකම් ලබයි. අපාගත පාපකාරීන්ට පවා ඉන් මිදී උතුම් පුද්ගලයන් බවට පත්වීමේ හැකියාව ඇති බව බුදුදහමෙහි ඉගැන්වෙයි. ඒ නිසා සදාකාලික අපායක් ගැන සඳහන් නොකරන බුදුදහම අශුභවාදයක් ලෙසට හැඳින්වීම සුදුසු නොවේ.

මෙතෙක් සඳහන් කළ කරුණු අනුව පැහැදිලි වන්නේ බුදුදහමේ යථා ස්වරූපය පිළිබඳ අනවබෝධය නිසා ඇතැමුන් යම් යම් වැරදි නිගමනවලට එළඹී ඇති බවයි.

භාවිතයට :

1. බුදුදහම පිළිබඳ වැරදි නිගමන ලෙස මෙම පාඩමේ සඳහන් වන කරුණු මොනවාදැයි ලියන්න.

2. දහම් පාසල් පාඨ ග්‍රන්ථ ඇසුරින් මෙලොව දියුණුවට අදාළ වන බුද්ධ දේශනා පිළිබඳ සටහනක් පිළියෙල කරන්න.

31 පාඩම

# ථෙරවාදී බුදුදහමේ චිරස්ථිතිය පිණිස අනුගමනය කෙරුණු ක්‍රියා මාර්ග

බුදුදහමේ දිගුකල් පැවැත්මට හෙවත් චිරස්ථිතියට අවශ්‍ය කටයුතු මුලින් ම ක්‍රියාත්මක කළේ බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේ ගන්නා ලද පියවර කීපයකි.

* භික්ෂු- භික්ෂුණීන් සඳහා ශික්ෂාපද පැණවීම.
* භික්ෂුණී සංඝයා ඇතිවීමට කලින්ම අෂ්ට ගරු ධර්ම පැණවීම.
* භික්ෂු - භික්ෂුණී උපාසක උපාසිකා යන සිවු පිරිස ධර්මයෙහි විනයෙහි විශාරදයන් හෙවත් දක්ෂයන් බවට පත්වීම බුදුරජාණන් වහන්සේ අපේක්ෂා කිරීම.
* වැරදි මත බුදුදහමට එක් වීමට ඇති අවස්ථා වැළැක්වීම.

තථාගත පරිනිර්වාණයෙන් පසු ශාසන චිරස්ථිතිය පිණිස කලින් කල මහ තෙරවරු ධර්ම-විනය සංගායනා කළහ. ධර්ම විනය සංගායනා කිරීම යනු කුමක් ද ? සූත්‍ර හා අභිධර්මය "ධර්ම" නම් වේ. ශික්ෂාපද හා හික්මීමට අවශ්‍ය වෙනත් දේශනා "විනය" නම් වේ. ධර්මය-විනය කොතැනක දී, කව්රුන් උදෙසා කුමක් නිසා බුදුරදුන් දේශනා කරන ලද්දේදැයි රැස් වූ සමගි සංඝයා අතුරින් දක්ෂ භික්ෂුවක විසින් විමසනු ලබයි. දක්ෂ වෙනත් භික්ෂුනමක් බුදුරජාණන් වදාළ ලෙසට කිසිදු වෙනස් කිරීමක් නොකර ප්‍රකාශ කරයි. අනතුරුව සියලු දෙනා වහන්සේ එක්ව දේශනා කරති. සමගි සංඝයා එය පිළිගනියි. සංගායනා කිරීම යනු එයයි.

මේ නිසා කලින් කලට ධර්ම-විනය වෙනස් කිරීමට ඇති අවස්ථාව නැති වෙයි. එහෙයින් පිරිසිදු ධර්ම-විනය දිගටම පවතියි. ධර්ම-විනය දිගුකල් පවත්වා ගැනීමට සංගායනාවන් හේතු වන්නේ මේ අන්දමින්ය. දැන් අපි සංගායනා පිළිබඳ විමසා බලමු.

## ප්‍රථම ධර්ම සංගායනාව

ඇවැත්නි, ශෝක කරන්න එපා. වැළපෙන්න එපා. දැන් අපි බුදුරජාණන් වහන්සේගෙන් නිදහස්ව සිටිමු. මෙය ඔබට සුදුසුය. මෙය ඔබට නුසුදුසුය.

යනුවෙන් උන්වහන්සේ නීති පැනවීම නිසා අපි වෙහෙසට පත් වුනෙමු. දැන් අපි කැමති දේ කරමු. අපට අකමැති දේ නොකරමු.

මෙය තථාගත පරිනිර්වාණය නිසා සතුටට පත් සුභද්‍ර භික්ෂුව විසින් කළ ප්‍රකාශයයි. මෙය සිදුවූයේ බුද්ධ පරිනිර්වාණයෙන් සත් වැනි දිනයෙහිය. ශ්‍රී දේහය ආදාහන කිරීමටත් කළින් භික්ෂූන් මේ අදහස් පළ කිරීමෙන් අනාගතයෙහි සසුනට බරපතල විපත් සිදුවිය හැකි බව මහා කාශ්‍යප මහරහතන් වහන්සේ අවබෝධ කොට ගත්හ.

"ආයුෂ්මතුනි, අපි ධර්මය විනය සංගායනා කරමු. අනාගතයෙහි අධර්මය හා අවිනය බබලන්නේය. ධර්මය හා විනය නොබබලන්නේය. අධර්මවාදීහු හා අවිනයවාදීහු බබලන්නෝය. ධර්මවාදීහු හා විනයවාදීහු නොබබලන්නාහ."

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කිරීමෙන් පසු මහ කසුප් තෙරුන් වහන්සේ මෙම ප්‍රකාශය කළේ එහෙයිනි. සංගායනාව පිණිස අවශ්‍ය මූලික කටයුතු ඉක්මණින් ම ක්‍රියාත්මක විය.

ඒ අනුව

* රහතන් වහන්සේලා 500ක් සහභාගී වීම.
* උන්වහන්සේලා පමණක් රජගහනුවර වස් එළඹීම.
* රජගහනුවර දී සංගායනාව පැවැත්වීම සිදු විය.

අජාසත් රජු විසින් සත්තපණ්ණි ගුහා දොරකඩ දර්ශනීය මණ්ඩපයක් ඉදි කරවනු ලැබීය. සංගායනාවට පෙර දින ආනන්ද හිමියෝ රහත් වූහ. සියලු දෙනා වහන්සේ මණ්ඩපයට රැස් වූහ. මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ පළමුවෙන් ම උපාලි මහරහතන් වහන්සේගෙන් විනය විමසූහ. උන්වහන්සේ ඒවා විසඳූහ. සියලු දෙනා වහන්සේ ධර්ම-විනය එක්ව සංගායනා කිරීමෙන් ධර්මයට හා විනයට විවිධ මත ඇතුළත් වීම උන්වහන්සේලා වැළැක්වූහ.

ඉන්පසු ඉදිරියට බුදුදහම පවත්වා ගෙන යාම සඳහා උන්වහන්සේලා පියවර ගත්හ. විනය උගන්වමින් එය ආරක්ෂා කිරීමේ වගකීම විනයධර උපාලි මහරහතන් වහන්සේට පැවරුණි. ධර්මය උගන්වමින් එය ආරක්ෂා කිරීමේ වගකීම භාරදී ඇත්තේ මෙසේ ය.

දීඝ නිකාය - ආනන්ද මහරහතන් වහන්සේට
මජ්ඣිම නිකාය - සැරියුත් මහරහතන් වහන්සේගේ ශිෂ්‍ය පිරිසට
සංයුත්ත නිකාය - මහා කාශ්‍යප මහරහතන් වහන්සේට
අංගුත්තර නිකාය - අනුරුද්ධ මහරහතන් වහන්සේට

පිරිනිවීමට ආසන්නයෙහි බුදුරදුන් විසින් "සංඝයා කැමති නම් මගේ ඇවෑමෙන් පසු කුඩා අනුකුඩා සිකපද ඉක්මවීමට පුළුවනැයි "කළ ප්‍රකාශයද සංගායනාව අවසානයේ දී සාකච්ඡාවට ගැනුණි. එහි දී මහා කාශ්‍යප මහරහතන් වහන්සේ මෙසේ පැවසූ හ.

* සංඝයා බුදුරදුන් නොපැණවූ සිකපද නොපණවති.
* පැණවූ සිකපද නොඉක්මවති.
* පැණවූ සිකපද සමාදන්ව ඒ වූ පරිදි පිළිපදිති.

සංගායනාව රැස්වූ පන්සියයක් පමණ රහතුන් වහන්සේලා විසින් බුදුදහමේ චිරස්ථිතිය පිණිස අනුගමනය කෙරුණු ක්‍රියාමාර්ග දැන් අපි සැකෙවින් හඳුනා ගනිමු.

* ධර්ම-විනය සංගායනා කිරීම.
* ඒවා ආරක්ෂා කර ගැනීමේ පහසුව පිණිස කොටස් කර බෙදා ගැනීම.
* කුඩා, අනුකුඩා සිකපද ඉගැන්වීම පිළිබඳ සංඝයා තීරණයක් ගැනීම.

මේ සංඝායනාවේ ඇතැම් ප්‍රතිඵල සියවසක් පමණ ගත වන තුරු දක්නට ලැබිණි. ක්‍රමයෙන් සසුනේ පැවැත්මට බාධා එල්ල වන්නට විය. එහෙයින් තවත් සංගායනාවක් කිරීමේ අවශ්‍යතාව ඇති විය.

## ද්විතීය ධර්ම සංගායනාව

තථාගතයන් වහන්සේගේ පිරිනිවීමෙන් සිය වෙනි වසර උදා විය. මේ වන විට විශාලා මහනුවර වජ්ජි පුත්තක භික්ෂූහු විනය විරෝධී කරුණු දහයක් විනයානුකූල යයි සම්මත කොට ගෙන ඒ අනුව කටයුතු කරන්නට පුරුදුව සිටියහ. කුඩා අනුකුඩා සිකපද ගැන ගන්නා ලද සම්මුතියට මෙය විරුද්ධව යාමකි.

දිනක් කාකණ්ඩ පුත්ත යස මහරහතන් වහන්සේ විසාලාවට වැඩම කළහ. සිදුවෙමින් පවතින විනය විරෝධී ක්‍රියාව දුටහ. මේ ශාසන විනාශය

වැළැක්වීමට අවශ්‍ය පියවර ගත යුතු යයි උන්වහන්සේ තීරණය කළහ. මේ සඳහා සුදුසු භික්ෂූන් රැස් කිරීමේ දුෂ්කර වූත් භාරදූර වූත් ක්‍රියාවට උන්වහන්සේ ඉදිරිපත් වූහ.

මෙහි ප්‍රතිඵලයක් ලෙස පාවා නුවරින් හා අවන්ති දක්ඛිණා පථයෙන් එකසිය හතළිහක් පමණ රහතන් වහන්සේලා අහෝගංග පර්වතයට රැස්වූහ. උන්වහන්සේලාත් සෝරෙය්‍ය නුවර රේවත මහරහතන් වහන්සේත් දුරු මහ ගෙවා සහජාත නුවරට රැස්වූහ. එහි දී යස තෙරුන් වහන්සේ විසින් විමසන ලදුව රේවත තෙරුන් වහන්සේ දස වස්තුව අකැප බව විනිශ්චය කළහ. ඉන්පසු සියලු දෙනා වහන්සේ මෙම ශාසන අර්බුද විසාලා මහනුවර දී ම විසඳීමට තිරණයකොට එහි වැඩම කළහ. වජ්ජි පුත්තක භික්ෂූන්ගේ පක්ෂය ගෙන ක්‍රියා කළ කාලාශෝක රජුගේ සහාය රහතන් වහන්සේලාට ලබාදීමට නන්ද රහත් තෙරණින් වහන්සේ ක්‍රියා කළහ. විසාලාවට රැස් වූ රහතන් වහන්සේලාගේ සංඛ්‍යාව 700කි. රේවත මහතෙරුන් වහන්සේ විසින් දස වස්තුව වෙන් වෙන් විමසන ලදුව සබ්බකාමී මහරහතන් වහන්සේ ඒ සියල්ල විනය විරෝධී බව කරුණු සහිතව ඔප්පු කළහ. ඉන්පසුව ධර්මය හා විනය සංඝායනා කොට ශාසන චිරස්ථිතිය තහවුරු කළහ. මේ සඳහා අට මසක් ගත විය.

දෙවන සංගායනාවෙන් පසු විනය සිකපද වෙනස් කර ගෙන ජීවත්වීමට පුරුදුව සිටි වජ්ජි පුත්තක භික්ෂූහු මහා සංඝික නමින් වෙනම නිකායක් හෙවත් කොටසක් හැටියට කටයුතු කරන්නට වූහ. එහෙයින් පළමු සංගායනාවේ සිට මේ වනතුරු එක්ව සිටි භික්ෂු පිරිස දෙපිරිසක් බවට පත්විය. මේ නිසා සංඝායනා සිදු කළ රහතන් වහන්සේලාගේ හෙවත් ස්ථවි ර භික්ෂූන්ගේ පක්ෂය ස්ථවිරවාද නිකාය ථෙරවාද නිකාය යන නමින් ප්‍රසිද්ධියට පත්විය. ස්ථවිර භික්ෂූන් වහන්සේ අනුගමනය කළ දහම ථෙරවාද බුදුදහම විය.

වජ්ජි පුත්තක භික්ෂූන් වෙනම නිකායක් ඇති කර ගැනීම නිසා ස්ථවිරවාද භික්ෂූන්ට නියම බුදුදහම ආරක්ෂා කර ගැනීමට අවස්ථාව උදා විය. මේ අනුව දෙවන වරට සිදු කළ ශාසන ශුද්ධිය නිසා උදාවූ ප්‍රතිඵල ලුහුඬින් මෙසේ ය.

* දස වස්තුව අකැප බව තීරණය වීම.
* ධර්ම-විනය දෙවන වරට සංඝායනා කිරීම.
* ථෙරවාද භික්ෂූන්ට පිරිසිදු බුදුදහම ඉදිරියට පවත්වා ගෙන යාමට හැකිවීම.

මෙම ප්‍රතිඵල අවුරුදු 136ක් පමණ ඉදිරියට පැවතුණි. මේ කාලය තුළ වරින් වර මහා සංඝික හා ථෙරවාද යන නිකාය දෙකක් ඇතුළුව නිකාය 18ක් බිහි විය. එහෙත් මූලික ථෙරවාද නිකාය නියම බුදුදහම රැක ගෙන පැමිණි හෙයින් නවත් ශාසන ශුද්ධියක් කිරීමේ අවශ්‍යතාවක් නොවීය. අනිත් නිකාය මෙන් මූලික ථෙරවාද නිකාය ධර්ම විනය වෙනස් නොකෙළේය. එහෙත් වෙනත් හේතූන් මත ශාසන ශුද්ධියක් කිරීම අවශ්‍යම විය. ශාසන චිරස්ථිතිය සඳහා ගන්නා ලද ඒ ක්‍රියා මාර්ග ගැන මෙතැන් සිට විමසා බලමු.

## තෘතිය ධර්ම සංගායනාව

ධර්මාශෝක රජතුමා බෞද්ධයකු බවට පත්විය. රජතුමා හා බෞද්ධ ජනතාව ප්‍රතිපත්තිකාමී භික්ෂූන්ට මැනවින් ප්‍රත්‍ය පහසුව සැලසූහ. මේ වන විට බුද්ධ වර්ෂ 220ක් ඉක්මී ගොසිනි. ජනතා ප්‍රසාදයට අවශ්‍ය ප්‍රතිපත්තිවලින් බොහෝ දුරට ඈත්ව සිටි බ්‍රාහ්මණ, ආජීවක, ආදි පිරිස්වලට ආහාරපානාදියෙන් දුෂ්කරතා ඇතිවිය. එහෙයින් ප්‍රත්‍යලාභය සඳහා ඔවුහු බුදුසසුනට ඇතුළ්වූහ. බුදුසසුනට ඇතුල් වූ ඔවුහු තම තමන්ගේ පරණ පුරුදුවලට ම අනුව ගිනි පිදීම, හිරු පිදීම ආදිය සිදු කළහ. තම තමන්ගේ ධර්මයම දෙසූහ. එසේ කරමින් ම නියම බෞද්ධ භික්ෂූන්ගේ විනය කටයුතුවලට ද සහභාගී වීමට පටන් ගත්හ. ඔවුන්ගේ මේ ක්‍රියා නිසා නිර්මල බුදු සසුන කිළිටි විය.ප්‍රතිපත්තිකාමී භික්ෂූහු පොහොය කිරීම ආදී විනය කටයුතු පිරිසිදුව කළ නොහැකි හෙයින් නවතා දැමූහ. මේ නිසා ශාසනය තුළ බලවත් අර්බුදයක් ඇති විය.

අපිරිසිදු වූ භික්ෂු පිරිස ඉවත් කොට සසුන පිරිසිදු කිරීමට ධර්මාශෝක රජතුමා මැදිහත් විය. එවකට අහෝගංග පර්වතයෙහි මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ වැඩ සිටියහ. රජතුමා ශාසන ශුද්ධියක් කිරීමට වඩින ලෙස දන්වා උන්වහන්සේ වෙත භික්ෂූන් හා ඇමතිවරුන් යැවීය. උන්වහන්සේ ආරාධනය පිළිගෙන පැළලුප් නුවරට වැඩියහ. රජතුමාට සතියක් පමණ උන්වහන්සේ බුදුදහම ඉගැන්වූහ.

ඉන්පසු රාජ්‍ය අනුග්‍රහය ඇතිව සැට දහසක් පමණ දුසිල් මහණුන් සිවුරු හරවා ගිහි බවට පත් කෙරිණි. පිරිසිදුවූ භික්ෂු පිරිස වසර ගණනාවක් නවත්වා තිබූ පොහොය ආදී විනය කටයුතු ඇරඹූහ. ථෙරවාදී භික්ෂූන් නොවන අයගේ මාර්ගයෙන් බුදු සසුනට එක්වී තිබූ වැරදි අදහස් හෙවත්

පරවාද බිඳ දැමීමට මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ කථාවත්ථුප්පකරණය නම් ග්‍රන්ථය සම්පාදනය කළහ. අවසානයේ දී ධර්ම-විනය සංගායනාවට සුදුසු මහරහතන් වහන්සේලා දහසකගේ සහභාගිත්වයෙන් පැළලුප් නුවර අශෝකාරාමයේ දී නව මසක් තිස්සේ තෙවන වරට ධර්ම-විනය සංගායනා කිරීම සිදුවිය. මේ උතුම් ක්‍රියාව සිදු වූයේ බුද්ධ වර්ෂ 236 දී පමණි.

සංගායනාව අවසානයේ දී මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ අනාගතයෙහි බුදුසසුන ආරක්ෂා වීම සඳහා විශේෂ පියවරක් ගත්හ. ඒ අනුව දඹදිව මධ්‍ය ප්‍රදේශයෙන් බැහැර රටවල් නවයකට උපසම්පදා භික්ෂූන් පස් නම බැගින් පිටත් කර යැවීම සිදු විය.

මිහිඳු මාහිමියන් ඇතුළු පිරිස ලක්දිවට වැඩම කළේ ඒ අනුවය. දඹදිව මධ්‍ය ප්‍රදේශයෙන් පසු කාලයේ බුදුසසුන නැති වී යද්දී බුදුසසුන රැකුනේ එම රටවලය.

මේ අනුව තෙවන වරට ශාසන චිරස්ථිතිය පිණිස අනුගමනය කෙරුණු ක්‍රියාමාර්ග කිහිපය මෙසේ වෙන්කර දැක්විය හැකිය.

* දුසිල් මහණුන් 60,000 ක් ගිහියන් බවට පත් කිරීම.
* සුසිල් මහණුන්ට බුදුසසුනේ ආයුෂය වන විනය ආරක්ෂා කරමින් පොහොය ආදී විනය කර්ම සිදුකිරීමට අවස්ථාව සැලසීම.
* මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසින් පරවාද බිඳීමට කථාවත්ථුප්පකරණය සම්පාදනය කිරීම.
* ධර්ම-විනය සංගායනා කිරීම.
* නවරට සසුන් පිහිටුවීම.

දඹදිව පැවති තෙවන සංගායනාවෙන් පසු නව රට සසුන් පිහිටුවීම යටතේ ලක්දිවට මිහිඳු මාහිමියන් ඇතුළු පිරිස වැඩම කළහ. උන්වහන්සේලා මෙහි බුදුසසුන පිහිටවූහ. රාජ්‍ය අනුග්‍රහ ලබමින් ලක් බුදුසසුන සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට විය. ලක්දිව ථෙරවාද බුදුසසුනට ද වරින් වර විපත් පැමිණියේය. කාලානුරූපව ඒවා විසඳීමෙන් බුදු සසුන ආරක්ෂා විය. මෙතැන් සිට ලුහුඬින් දක්වා ඇත්තේ ලක්දිව ථෙරවාද බුදුසසුනෙහි චිරස්ථිතිය පිණිස ගන්නා ලද ක්‍රියාමාර්ග කීපයකි.

බුද්ධ වර්ෂ පස්වන සියවස තුළ ලංකාවෙහි දොළොස් අවුරුදු නියගයක් ඇති වී දුර්භික්ෂයක් ඇති විය. භික්ෂූන් වහන්සේලා මහත් දුෂ්කරතා මැද

කටපාඩමෙන් රැක ගෙන ආ බුද්ධ ධර්මය ආරක්ෂා කර ගත්හ. දුර්භික්ෂය අවසන් වූ පසු භික්ෂූන් වහන්සේලා කට පාඩමෙන් ධර්මය රැකගැනීමට ශක්තිමත් භික්ෂූන් අනාගතයෙහි ඇතිවීම දුර්ලභය. මෙබඳු දුර්භික්ෂයක් ඇති වුවහොත් ධර්මය විනාශ වී යා හැකිය යි සිතූහ. ඒ නිසා වළගම්බා රජුගේ කාලයේදී ත්‍රිපිටකය පොත්වල ලියා තැබූහ. මෙය සිදු වූයේ මාතලේ අලුලෙන් විහාරයේ දී ය.

අභ්‍යාස :

1. බුද්ධ කාලයේ සිට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම තෙක් ථෙරවාදී බුදුදහම ආරක්ෂා කිරීමට ගන්නා ලද ක්‍රියා මාර්ග අනුපිළිවෙලින් ලේඛනගත කරන්න.

32 පාඩම

# දඹදිව වන්දනීය ස්ථාන සතර

පිරිනිවන් මංචකයේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන් අමතා පහත සඳහන් අන්දමින් වදාළ බව මහා පරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වෙයි. ආනන්ද, ශ්‍රද්ධාවත් කුල පුත්‍රයෙකු විසින් දැකීමට සුදුසු වූ දැක සංවේග ඉපදිය යුතු වූ ස්ථාන සතරකි. ඒ ස්ථාන සතර නම් තථාගතයන් වහන්සේ මෙලොව උපන් ස්ථානයත්, උන්වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත් ස්ථානයත්, උන්වහන්සේ උතුම් වූ ධර්මචක්‍රය පැවැත්වූ ස්ථානයත්, උන්වහන්සේ අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ ස්ථානයත් ය. ආනන්ද, ශ්‍රද්ධාවත් භික්ෂු, භික්ෂුණී උපාසක උපාසිකා පිරිස් මේ ස්ථාන නැරඹීමට එන්නෝය. ආනන්ද, මේ චෛත්‍යයන් වෙත ගමන් කරමින් සිටි යම්කිසි අයකු පැහැදුනා වූ සිතින් කාලක්‍රියා කළහොත් මරණින් පසු ඒ තැනැත්තා දෙව්ලොව උපදින්නේය.

බුදුරජාණන් වහන්සේගේ ජීවන චරිතයේ වැදගත් සිද්ධීන් සිහියට නංවා සැදැහැවතකු තුළ සංවේගය දනවන මේ ස්ථාන සතර අප විසින් හඳුනාගත යුතුය. හැකි දිනක දැක බලා ගත යුතුය. එම සතර නම් උන්වහන්සේ උපත ලද කිඹුල්වත් නුවර ලුම්බිනි උයනත්, සම්බෝධියට පත් බුද්ධගයාවත්, ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූ බරණැස ඉසිපතනයත්, පිරිනිවන් පා වදාළ කුසිනාරා නුවර මල්ල රජවරුන්ගේ සල් උයනත් ය. යම්කිසි දිනක මේ ස්ථානවලට ගොස් සියැසින් දැක වැඳ පුදා ගන්නා තෙක් අද අපි මේ ස්ථාන මනසින් ගොස් නරඹමු.

## ලුම්බිනිය

නෞතන්වා උතුරු ඉන්දියානු දුම්රියපලෙන් බැස කි. මී. 19ක් පමණ ගිය තැන නේපාල රාජ්‍යයෙහි රුම්න්දෙයි ගම හමු වෙයි. පැරණි ලුම්බිනි ග්‍රාමය වර්තමාන මේ රුම්න්දෙයි ගමයි. මෙහි සිට උතුරට හැරී බැලූ කල කි. මී. 40ක් පමණ ඈතින් පෙනෙන්නේ අඩි 26,000ක් පමණ ඉහළට නිල් අහසට විහිදෙන දම් පැහැති හිමාලය කඳු පසුබිම් කරගත් රමණීය දර්ශනයයි.

ක්‍රි. පූ. 6 වන සියවසෙහි එක්තරා වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයක ලුම්බිණි උයනෙහි සිරි නරඹමින් සැරිසරන පිරිවර සහිත රජ බිසවක ඔබේ සිහියට නැගෙනු ඇත. ඒ කිඹුල්වත් නුවර සුද්ධෝදන රජතුමාගේ අගමෙහෙසිය වන මහාමායා දේවිය යි.

එදා නන්වන් පැහැගත් මල්පල බරින් ගැවසී ගත් තුරුලතාවන්ගෙන් සැරසුණු ලුම්බිනි උයන දෙව් උයනක සිරිගති. අතුපතර හිඳ ගිරා කොබෙයි මොණර ඈ සියොත්හු මිහිරි නාද පැවැත්වූහ. රුකක් පාසා පියාඹමින් මල් රොන් ගන්නා බඹරුන්ගේ 'ගුමු ගුමු 'නාදය දෙසවන් පිනවීය. හිමවත දෙසින් හමන සිසිල් මඳනල මල් සුවඳ දසත පතුරවමින් ගත සිත පිනවීය. දරු උපත ළං වූ මහාමායා දේවී තොමෝ පිපුණු සල් රුකක් මුල ඉසුඹුලමින් සිටියාය. සිදුහත් මහබෝසතාණන් වහන්සේ මෙලොව එළිය දුටුවේ ඒ වේලාවේය. සත් පියවරක් වැඩි පින්වත් පුංචි කුමාරයා මිහිරි සරින් 'අග්ගෝ හමස්මි ලෝකස්ස' යනුවෙන් ගීයක් ගැයූ සැටි දැන් ඔබේ මනැසට පෙනෙයි. ඒ එදා ලුම්බිනි උයනේ බෝසත් උපත පිළිබඳ අසිරිමත් සිද්ධිය සිදු වූ සැටියි.

ඉතිහාසයේ ලුම්බිණී උයන නැවත අපට හමුවන්නේ බුද්ධ පරිනිවර්වාණයෙන් අවුරුදු දෙසිය ගණනක් ඉක්ම වූ පසුය. ඒ අශෝක රජතුමා ලුම්බිණියට පැමිණී අවස්ථාවේය. 'අශෝකාවදානය' නැමැති ග්‍රන්ථයට අනුව අශෝක මහරජතුමා ලුම්බිනි උයනට පැමිණියේ 'උපගුප්ත' නම් මහ රහතන් වහන්සේ සමගයි. උපගුප්ත රහතන් වහන්සේ දකුණත දිගුකොට 'මහරජ, මේ තථාගතයන් වහන්සේ උපන් ස්ථානය' යි බෝසත් උපත සිදු වූ තැන පෙන්වා වදාළහ. අශෝක රජතුමන් විසින් එහි පිහිටුවන ලද ශිලාස්ථම්භය ද ශිලා ලේඛනය ද ඔබට දැනුදු දැකිය හැකිය. අශෝකාක්ෂරයෙන් ලියා ඇති එම ශිලා ලේඛනයේ සිංහලානුවාදය මෙසේය.

දේවානම්පියපියදස්සි රජු විසින් අභිෂේකයෙන් විසි වන වර්ෂයෙහි තමා ම පැමිණ ශාක්‍යමුනි වූ බුදුහු මෙහි උපන්හ යි වැඳුම් පිදුම් පවත්වන ලදී. මෙහි භාග්‍යවතුන් වහන්සේ උපන් සේකැයි ශිලාස්ථම්භයක් ද පිහිටුවන ලදී. අය බද්දෙන් කොටසක් ගන්නා ලෙසට ලුම්බිණී ගමට විශේෂ වරප්‍රසාද දෙන ලදී.

අශෝක රජුගේ පැමිණීමෙන් පසු, ලුම්බිනිය වන්දනාකරුවන් නිතර පැමිණෙන බෞද්ධ පූජ්‍ය ස්ථානයක් විය. ක්‍රි. ව. 636 දී හියුං සියං නමැති චීන භික්ෂූන් වහන්සේ ලුම්බිනිය වන්දනාවට පැමිණියහ. දරු උපතට ප්‍රථම මහාමායා දේවිය ස්නානය කළ පොකුණත්, මහබඹු විසින් බෝසතුන් පිළිගත් ස්ථානයේ කරවනු ලැබූ ස්ථූපයත්, සතරවරම් දෙවියන් බෝසත් කුමරුවන් පිළිගත් තැන පිහිටි ස්තූප හතරත් අශෝක රජතුමා විසින් කරවන ලද අශ්ව රූපයකින් සැදුම්ලද කුලුණු ශීර්ෂය සහිත ශිලා ස්ථම්භයත් තමා විසින් දුටු බව හියුං සියං භික්ෂූන් වහන්සේ විසින් තමන්ගේ ගමන් විස්තරයේ සඳහන් කොට ඇත.

15 වන සියවසේ ඉන්දියාව මුස්ලිම් බලයට යටවන තුරු ම ලුම්බිනිය බෞද්ධ වන්දනා බිමක් ව පැවති බව පෙනේ. මුස්ලිම් පාලනය යටතේ බෞද්ධ වෙහෙර විහාර ගොඩනැගිලි විනාශයට පත් වූයෙන් අභාවයට ගිය ලුම්බිනිය නැවත සොයා ගනු ලැබුවේ ඉංග්‍රීසි පාලන යුගයේ පුරාවිද්‍යාඥයින් විසින් 1895 දී ය. එක්සත් ජාතීන්ගේ ද උදව් ඇතිව නේපාල රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ පිළිවෙලක් යටතේ ලුම්බිනියේ පැරණි ශ්‍රී විභූතිය ගොඩ නැගෙමින් පවතී. මේ යටතේ රටවල් කීපයක් ම එහි විහාර හා විශ්‍රාම ශාලා ගොඩ නගා ඇත. පැරණි ලුම්බිනි උද්‍යානයේ භූ දර්ශනය ගොඩ නහා ඇති අතර එහි අඹ පැල, 25,000ක් රෝපණය කිරීමේ ව්‍යාපෘතියක් ද ආරම්භ කර ඇත්තේ ය.

## බුද්ධගයාව

ඊළඟට අපි සිදුහත් මහාබෝසතාණන් වහන්සේ සම්බෝධිය ලැබූ බුද්ධගයාවට යමු. ගයා දුම්රිය පොලේ සිට බුද්ධගයාවට කි. මී. 11ක් පමණ වෙයි. අද බුද්ධගයාව නමින් හැඳින්වෙන මේ ප්‍රදේශය එකල හැඳින්වූයේ නේරංජනා ගඟබඩ පිහිටි උරුවෙල් දනව්ව නමිනි. එදා සුදුවැලිතලාවන්ගෙන් හා නාන තොටුපලින් යුක්ත වූ සිදුහත් බෝසතුන්ගේ සිත් ඇඳ බැඳ ගත් නේරංජරා නදිය ඒ බුද්ධාංකුරයන්ගේ අප්‍රතිහත ධෛර්යය සිහි කරමින් මෙන් තවමත් නිහඬව ගලා බසින්නී ය. අද ඇය හැඳින්වෙන්නේ ඵාල්ගු නමිනි.

අද බුද්ධගයා මහා විහාරය පිහිටි තැනට ගිය විට ඔබට 'බුදු බව ලබා මිස මෙතැනින්න නොනැගිටිමි' යි අස්වත්ථ රුක්ඛ මූලයෙහි වැඩ හිඳ ගත් බෝසතාණන් වහන්සේ සිහියට නැගෙනු ඇත. උන්වහන්සේ මාර පරාජය කොට සම්මාසම්බෝධිය ලැබ අනේක ජාති සංසාරං ආදී ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ ස්ථානයෙහි අද බුද්ධගයා මහා විහාරය පිහිටියේ ය. උන්වහන්සේ සත්සතිය ගෙවූ ස්ථාන ද අද හඳුනාගෙන ඇත්තේ ය.

ලුම්බිනිය මෙන් බුද්ධගයාව ද සැදැහැවතුන්ගේ වන්දනා බිමක් බවට පත් ව ඇත්තේ අශෝක රජු මෙහි වන්දනාවට පැමිණීමෙන් පසුවය. එතුමා උපගුප්ත මහරහතන් වහන්සේ සමඟ බුද්ධගයාවට පැමිණියේ රාජ්‍යයට පැමිණි 18 වන වර්ෂයේ දී ය. බුද්ධගයා විහාරයේ මුල් ආරාමය ගොඩ නහන ලද්දේ අශෝක රජතුමා විසිනි. ශ්‍රී මහා බෝධිරාජයාණන් වටා අඩි 10ක් උස ගල් ගරාදි වැටක් නිර්මාණය කරන ලද්දේ ද අශෝක රජතුමා විසිනි. අශෝක යුගයෙන් පසුව උතුරෙන් චීනයත් දකුණෙන් ලංකාවත් අතර ආසියාතික බෞද්ධයන්ගේ ප්‍රධාන තම වන්දනා භූමිය වූයේ බුද්ධගයාවයි.

ලක්දිව රජ කළ කිත්සිරිමෙවන් (301-328) රජතුමා බුද්ධගයාවේ සිංහල භික්ෂූන් වහන්සේලා උදෙසා සංඝාරාමයක් ගොඩ නැගූ බව සඳහන් ය. බුද්ධගයාවේ ඇති ඉතා වැදගත් පූජනීය වස්තුවක් නම් බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලබාගැනීම සඳහා වැඩහිඳි වජ්‍රාසනයයි. කැටයම් කළ සෙල් අසුනක් වූ මෙය බෝධීන් වහන්සේටත් බුද්ධගයා විහාරයටත් වන්දනාවට පැමිණි පාහියන් චීන භික්ෂූන් වහන්සේගේ විස්තරය අනුව බුදුරජාණන් වහන්සේ සත්සති ගෙවූ ස්ථානවලත්, කාශ්‍යප ජටිල සහෝදරයන් දමනය කළ ස්ථානවලත් කුඩා ස්තූප විය.

බුද්ධගයාවේ අද දක්නට ලැබෙන ප්‍රතාපවත් ගොඩනැගිල්ල බුද්ධගයා මහා විහාරයයි. පැත්තක් අඩි 50ක් පමණ සතරැස් වේදිකාවක් මත ගොඩ නගා ඇති මේ සිත්කලු මන්දිරයේ බිම සිට කොත් කැරැල්ල දක්වා උස අඩි 170ක් පමණ වෙයි. ගොඩනැගිල්ලේ සතර කොනෙහි ද ප්‍රධාන මධ්‍ය ගොඩනැගිල්ලේ ස්වරූපය ගත් කුඩා ගොඩනැගිලි සතරකි. මෙම විහාරයේ පැතලි බිත්ති කුඩා කවුළු කැටයමකින් සරසා ඇත්තේ ය. මේ සැම කවුළුවකම රන්වන් බුදුපිළිම වූ බව 7 වන සියවසේ බුද්ධගයාව වන්දනාවට පැමිණි හියුං සියං පවසයි. වර්තමානයේ දක්නට ලැබෙන ගොඩනැගිල්ල රජතුමා විසින් මුලින් කළ ගොඩනැගිල්ලේ නටබුන් මත ක්‍රි. ව. 500 දී ගොඩ නඟන ලද්දක් සේ පෙනේ.

15 වන සියවසෙන් පසු බලයට පත් මුස්ලිම් පාලන යුගයේ දී වෙනත් බෞද්ධ ගොඩනැගිලි මෙන්ම බුද්ධගයා විහාරය ද පරිහානියට පත්විය. 20 වන සියවසේ මුල් භාගය වන විට එය සතුව තිබුණේ හින්දූන් ටය. හින්දූන්ගෙන් බුද්ධගයාව බේරා ගැනීමට මහත් උත්සාහයෙන් කටයුතු කළේ සිංහලයෙකි. ඒ අනගාරික ධර්මපාලතුමාය. නීති මාර්ගයෙන් කටයුතු කළ ධර්මපාලතුමාට 1896 දී බුද්ධගයාව ආපසු බෞද්ධයන්ට ලබා ගත හැකි විය. අද ලෝකවාසී බෞද්ධ වන්දනාකරුවන්ගේ අතිපූජනීය ස්ථානය වී පවතින්නේ බුද්ධගයාවයි. මීට වර්ෂ කීපයකට ඉහත දී ලක්දිව ජනාධිපතිව සිටි රණසිංහ ප්‍රේමදාස මහතා බුද්ධගයා ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා රන් වැටක් ඉදි කළ අතර, වජ්‍රාසනය රන් වියනකින් පිදී ය. බුද්ධගයා, ප්‍රදේශවාසී දුප්පත් ජනතාව වෙනුවෙන් නිවාස සීයක් ඉදි කොට විවෘත කළ 'බුද්ධගයාගම' ද එතුමාගේ තවත් සිහිවටනයකි.

### ඉසිපතනය

බරණැස දුම්රියපොළෙන් බැස කි. මී. 10ක් පමණ ඈතින් පිහිටි ඉසිපතනයට යමු. පස්වග තවුසන්ට ප්‍රථම ධර්මදේශනාව පැවැත්වීම සඳහා

බුද්ධගයාවේ සිට කි. මී. 240ක් පමණ දුරින් පිහිටි බරණැස ඉසිපතනයට එදා බුදුරජාණන් වහන්සේ වැඩියේ පා ගමනින් මය. ඈතින් වඩිනා බුදුරජාණන් වහන්සේ දුටු පස්වග තවුසන් කතිකා කර ගත් සැටිත්, උන් වහන්සේ ළං වුන විට හැසිරුණු හැටිත් දැන් ඔබට සිහියට නැගෙනවා ඇත.

එදා ඇසළ පුර පසළොස්වක දින සන්ධ්‍යාවේ දී ගෞතම බුදුරජාණන් වහන්සේ මහණෙනි, පැවිද්දකු විසින් අත්හැරිය යුතු වූ අන්ත දෙකකි. ඉන් එකක් නම් කාමසුඛල්ලිකානු යෝගය යි. අනෙක නම්, අත්තකිලමථානු යෝගය යි. ආදීන් දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කොට වදාළේ ඉසිපතනයේ මිගදාය නමැති මේ මුව වනයේ දී ය. අද එහි ක්‍රි. පූර්ව 3 සියවසේ සිට 12 වන සියවස දක්වා වරින් වර ඉදි කරන ලැබූ ගොඩනැගිලි රාශියක නටඹුන් දැකිය හැකිය.

අශෝක රජතුමා විසින් බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළ ස්ථානයේ ඉදි කළ ස්තූපය අද නටබුන් වී ඇත්තේ ය. මේ නටබුන් ගොඩැල්ල අද හැඳින්වෙන්නේ ජගත්සිංහ ස්තූපය නමිනි. ජගත්සිංහ රජතුමා විසින් 1794 දී මේ දාගැබ බිඳවා එහි ගඩොල් බරණැස ගෙවල් සෑදීමට ගත් බව කියනු ලැබේ. අශෝක රජතුමා විසින් ඉදි කරනු ලැබූ ශිලාස්ථම්භයකට අයත් සිංහ හිස් සහිත කුළුණු ශීර්ෂය මේ අසලින් සොයා ගනු ලැබූවකි. දැනට සාරානාත් කෞතුකාගාරයේ තැන්පත් කොට ඇති මෙ කුළුණු හිස මෞර්ය යුගයේ ශ්‍රේෂ්ඨ කලා නිර්මාණයක් ලෙස සලකනු ලැබේ.

ඉසිපතනයේ අද දක්නට ලැබෙන ප්‍රතාපවත් ගොඩනැගිල්ල ධම්මික ස්තූපයයි. සිලින්ඩරාකාර මේ ථූපයේ පහළ කොටස ගලින් ද, ඉහළ කොටස ගඩොලින් ද නිර්මාණයකර තිබේ. අඩි 100ක් පමණ විෂ්කම්භය ඇති එහි වර්තමාන උස අඩි 50ක් පමණ වෙයි. හියුං සියුං විසින් විස්තර කරනු ලබන අඩි 200ක් පමණ උස ඉසිපතන විහාරය වෙනුවට අද එහි ඇත්තේ අඩි 20ක් පමණ උස් වූ නටබුන් ගොඩකි. මේ ස්ථානයෙන් සොයා ගෙන ඇති බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සුතුර දේශනා කරන අයුරු දැක්වෙන ප්‍රතිමාව ගුප්ත කලාකරුවන්ගේ විශිෂ්ට නිර්මාණයක් ලෙස සලකනු ලැබේ.

අනගාරික ධර්මපාලතුමාගේ මග පෙන්වීම යටතේ මහාබෝධි සමාගම විසින් මෑත භාගයේ ගොඩනභා ඇති මූලගන්ධකුටි විහාරය ද උසස් නිර්මාණයකි.

ප්‍රථම වස් කාලය ඉසිපතනයේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ ධර්ම ප්‍රචාර කටයුතු ඇරඹුවේ ද එහි සිට ය.

මහණෙනි, බොහෝ දෙනාගේ හිත සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස හැසිරෙන්න. එක මඟ දෙදෙනෙක් නොයන්න. මුල කලණ මු මැද කලණ වූ අග කලණ වූ අර්ථ සහිත වූ දහම් දෙසන්න. යනුවෙන් ප්‍රථම ධර්ම දූත කණ්ඩායම මෙහෙය වූ සැටි ඔබට සිහියට නැගෙනු ඇත. එදා ඉසිපතනයෙන් ආරම්භ වූ දහම් ගඟ තවමත් ගලා බසී.

## කුසිනාරා නුවර

සම්බුද්ධ පරිනිර්වාණය සිදු වූ කුසිනාරා නුවරට දැන් අපි යමු. ගොරොක්පූර් දුම්රිය පොළෙන් බැස සැතපුම් 48ක් පමණ ගිය විට පැරණි කුසිනාරා නුවර හමුවෙයි. අද එය හැඳින්වෙන්නේ කාසියා නමිනි.

අසූවියට පත් වූ ගිලන් ව සිටි බුදුරජාණන් වහන්සේ එක්තරා වෙසක් පුර පසළොස්වක දිනක කුසිනාරා නුවර මල්ල රජවරුන්ගේ උපවර්තන නම් සල් උයනට වැඩමවා අනඳ තෙරුන්ට මෙසේ වදාළහ. 'ආනන්ද, මට මේ සල් ගස් දෙක අතර උතුරට හිස තබා ගත හැකිසේ ආසනයක් සකස් කරන්න. ආනන්ද, මට හරියට මහන්සියි, ක්ලාන්තය වගේ දැනෙනවා. මට සැතපෙන්නට ඕනෑ.'

අද කුසිනාරා නුවර පරිනිර්වාණ චෛත්‍යය දක්නට ලැබෙන්නේ එදා බුදුරජාණන් වහන්සේ අන්තිම වරට සැතපුණු තැන ය. අද දක්නට ලැබෙන සිලින්ඩරාකාර කඳක් මත අර්ධ ගෝලාකාර චෛත්‍යය එදා මල්ල රජවරුන් විසින් සර්වඥධාතු නිදන් කොට ගොඩ නැගූ චෛත්‍යය නොවේ. ඒ මුල් චෛත්‍යය අශෝක රජතුමා විසින් ද ප්‍රතිසංස්කරණය කරන ලද්දේ ය. හියුං සියං භික්ෂූන් වහන්සේ පැමිණෙත් දී ඒ දාගැබ ද නටබුන්ව පැවති බව කියනු ලැබේ. කෙසේ නමුත් අද දක්නට ලැබෙන දාගැබ පැරණි පරිනිර්වාණ චෛත්‍යය මත ම ගොඩ නැගුවක් බව ගුප්ත යුගයේ රජවරුන්ගේ ශිලා ලේඛනයකින් පැහැදිලි වෙයි. නටබුන් වී ඇති පැරණි විහාරය ගින්නෙන් හා අව්වෙන් විනාශ වී ඇති බව පුරා විද්‍යාඥයෝ කියති. එහි දැනට දක්නට ලැබෙන සම්බුද්ධ පරිනිර්වාණය නිරූපිත පිළිමවහන්සේ සැදැහැවතුන්ගේ ඇසට කඳුළු නංවයි.

ශ්‍රද්ධාවත් කුල පුත්‍රයකු විසින් දැක සංවේග ඉපදවිය යුතු ස්ථාන හතර සිතින් දැක ගතිමු. මේ ස්ථාන නෙතින් දැක ගැනීමට ඉටා ගනිමු.

භාවිතයට :

> ඔබ දඹදිව වන්දනාමානයෙහි යෙදුණු අයකු යයි සිතින් සිතාගෙන සංවේග ස්ථාන හතර පිළිබඳ පංතියට විස්තර කරන්න.

33 පාඩම

# අපි යමු සොළොස්තැන් වට වන්දනාවේ

මතු දිනක නෙතින් දැක තුටුසිතින් වැඳ පුදා සැදැසිත් වඩන්නට කල් උදාවන තුරු අපි පමා නොවීමු. නොපමාව සිතින් දඹදිව වන්දනාවේ ගොස් දැකිය යුතු, දැක සංවේග කටයුතු තැන් සතර අප වැඳ පුදා ගත්තේ එහෙයිනි.

ලක්දිව පිහිටි සම්බුදු පහසින් පිවිතුරු වූ සොළොස් තැන් ද නෙතින් දකිනතුරු සිතින් දැක වැඳ පුදා සැදැ සිත් වඩන්නට තවත් වන්දනා ගමනක් යාමට දැන් අපි සූදානම් වෙමු.

පළමුව සොළොස් තැන් වදින ගාථාව සැදැසිත් වැඩෙන ලෙස නිසි අයුරින් ගායනා කරමු.

මහියංගනං - නාගදීපං - කල්‍යාණං - පදලාඤ්ඡනං
දිවාගුහං - දීඝවාපී - චේතියං - මුතියංගනං
තිස්සමහාවිහාරං ච - බෝධිං මරිච වට්ටියං
සොණ්ණමාලී මහා චේතියං - ථූපාරාම හයාගිරිං
ජේතවනං - සේලචේතියං - තථා කාචර ගාමකං
ඒතේ සෝළසඨානානි - අහං වන්දාමි සබ්බදා

දැන් අපි ඒ එක් එක් ස්ථාන වෙත සිතින් යමු. මග නොවැරදීමට සොළොස් තැන් දැක්වෙන සිතියම භාවිත කරමු. ගොස් ඒ තැන් පිළිබඳ තොරතුරු හදාරමු. වන්දනා කරමු. පළමුව අපි යා යුත්තේ මහියංගනයට යි.

(1) මහියංගන චෛත්‍යය

දැන් අප පැමිණ සිටින්නේ බදුලු දිස්ත්‍රික්කයෙහි බිම්තැන්න හෙවත් මහියංගනය වෙතය.කොළඹ සිට දුර ප්‍රමාණය කිලෝමීටර 185ක් පමණ වේ. එක් පසෙකින් අර පෙනෙන්නෙ මහනුවර දිස්ත්‍රික් මායිමෙන් ගලා බස්නා මහවැලි නදිය යි.

බුද්ධත්වයෙන් නවවන මස බුදුරජාණන් වහන්සේ පළමුවරට මහියංගනයට වැඩ මෙම සෑය පිහිටි තැන අහසෙහි වැඩහුන්හ. යක්ෂයන් දමනය කළ

උන්වහන්සේ සුමන සමන් දෙව්රජුගේ ඉල්ලීම පරිදි ඔහුට කේශධාතු ලබා දුන්හ. සුමන සමන් දෙවිරද ඒවා නිදන් කොට බුදුරදුන් වැඩ සිටි තැන බිම ඉඳුනිල් මිණියෙන් සත් රියන් උස සෑයක් ඉදි කළේය. මහියංගන චෛත්‍යය යනු එයයි.

පසු කලෙක සරභූ මහ රහතන් වහන්සේ සර්වඥ ග්‍රීවා ධාතුව නිදන් කරවා පළමු සෑය මැදිවන සේ දොළොස් රියන් උස චෛත්‍යයක් කරවූහ. ඉන්පසු දෙවන පෑතිස් රජුගේ සොයුරු උද්ධ චූලාභය කුමරු එම සෑයතිස් රියන් උසට බැන්දවීය. දුටුගැමුණු රජතුමා එය අසූරියන් උස් කොට බැන්දවීය. වෝහාරතිස්ස, ධාතුසේන, විමල ධර්මසූරිය ආදී රජවරුන්ගේ කාලවල දී මේ චෛත්‍යය ප්‍රතිසංස්කරණ කටයුතු කරවා තිබේ.

කාලයක් වල්බිහිව තිබූ මේ සෑයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු මෙම සියවස මැද භාගයේ දී පමණ ඩී. ඇස්. සේනානායක මැතිතුමන් විසින් අරඹන ලදී. පසුව මහියංගන චෛත්‍යවර්ධන සමිතියේ ද අනුග්‍රහය ඇතිව ඩඩ්ලි සේනානායක මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රතිසංස්කරණය කරන ලද මහියංගන සෑ රදුන් ය අද දක්නට ඇත්තේ. වාර්ෂිකව පැවැත්වෙන දුරුතු පෙරහැර සමයේ බෞද්ධයෝ මෙහි වන්දනාවේ ඒමට පුරුදුව සිටිති.

(2) නාගදීප චෛත්‍යය

කොළඹ සිට කිලෝමීටර් 400ක් පමණ දුරින් උතුරු පෙදෙසහි යාපනය පිහිටා තිබේ. යාපනය අර්ධද්වීපයට අයත්, මුහුදින් වට වූ නයිනතිව් නම් කුඩා දූපත නාගදීපය යනුවෙන් සැලකේ. මහියංගනය වන්දනා කළ අප දැන් සිටින්නේ නාගදීපයෙහි ය.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පස්වන වසරෙහි බක් මාසයෙහි නාගදීපයට වැඩම කළහ. මයිලණු වූ මහෝදර බෑණා වූ චූලෝදර යන නාග ගෝත්‍රිකයන් දෙදෙනා අතර මැණික් පුටුවක් වෙනුවෙන් සිදුවන්නට ගිය යුද්ධය නැවැත්වීම එම ගමනට හේතු විය. එදින බුදුරදුන් සමඟ සමිද්ධි සුමන දෙව්රජ විසින් රජායතන නම් කිරිපලු ගසක් ද ගෙන එන ලදී. බුදුරජාණන් වහන්සේ තම යුද්ධය නැවැත්වීමේ හේතුවෙන් සතුටට පත්ව නා රජවරු දෙදෙන මැණික් පුටුව උන්වහන්සේට පූජා කළහ. රාජායතන වෘක්ෂය ද එම බිමෙහි රෝපණය කළහ. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි මැණික් පුටුව තැනපත් කොට චෛත්‍යයක් ගොඩ නැගීය. ඒ මේ නාගදීපය චෛත්‍යයයි. රාජායතන චෛත්‍යය යනුවෙන් ද මෙය හැඳින්වෙයි.

පසුව දෙවන පෑ තිස්, දුටුගැමුණු ආදී රජවරුන් මේ ස්ථානය දියුණු කොට වෙහෙර විහාර ද කරවා ඇත.

ඉන්පසු උතුරේ සිංහල රජ බලය පිරිහී යාමත් සමඟ නාගදීපය ද බෞද්ධ බලයෙන් පිරිහී ගියේය. ක්‍රි. ව. 1938 දී පමණ රන්දොඹේ සෝමසිරිතිස්ස ස්වාමීන්වහන්සේ මෙහි වැඩම කොට නාගදීප චෛත්‍යය ප්‍රතිසංස්කරණය කරවූහ.

**(3) කැලණි චෛත්‍යය**

ගම්පහ දිස්ත්‍රික්කයට අයත් කැළණිය, කොළඹ සිට කිලෝමීටර 10ක පමණ දුරින් කැලණි නදිය අසබඩ පිහිටා තිබේ. නාගදීපය වැඳපුදා ගෙන කැළණියට පැමිණි අපි මෙහි තොරතුරු විමසා බලමු. වන්දනා කරමු.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අටවන වසරෙහි වෙසක් පුන් පොහෝ දින තෙවන වරට කැලණියට වැඩම කළහ. එය සිදුවූයේ මණිඅක්ඛික නා රජු නාගදීපයේ දී බුදුරජුන්ට කළ ඇරයුම අනුව ය. නා රජු පිරිස් සහිතව බුදුරජදුන් හා මහ සඟරුවන හරසරින් පිළිගෙන විශේෂයෙන් මෙහි ඉදි කළ මණ්ඩපය වෙත වැඩමවා ගෙන ආයේ ය.

මණ්ඩපයෙහි වූ මාහැඟි මැණික් පුටුවෙහි බුදුරජාණන් වහන්සේ වැඩ සිටියහ. දන් වළඳා අවසන් හි බුදුරජාණන් වහන්සේ දහම් දෙසූහ. මණිඅක්ඛිත නා රජ බුදුරදුන් වැඩ සිටි මැණික් පුටුව නිදන් කරවා වී ගොඩක හැඩයෙන් යුත් (ධාන්‍යාකාර) චෛත්‍යයක් කරවීය.

පසුකළ මෙම ස්ථානය බොහෝ විහාරාංගවලින් සමන්විත විය. කැළණි මහසෑය අසලින් ම පෙනෙන්නේ මෑත යුගයේ හෙලේනා විජේවර්ධන මැතිණිය විසින් කරවන ලද දර්ශණීය විහාර මන්දිරයයි. එහි චිත්‍ර සෝලියස් මැන්දිස් කලාකරුවානන්ගේ ය. මෙසේ අලංකාර වූ පූජනීය වූ කැළණියයි දැන් අපට දක්නට ලැබෙන්නේ.

**(4) පද ලාංඡනය (ශ්‍රී පාදය)**

සබරගමුව පලාතෙහි රත්නපුර දිස්ත්‍රික්කයෙහි නුවරඑළියට මායිම්ව කොළඹ සිට කිලෝමීටර් 140ක් දුරින් සමනොල කන්ද පිහිටා තිබේ. අඩි 7860ක් පමණ උසැති සමනොල ගිරි මුදුනට දැන් අපි පැමිණියෙමු.

බුදුරජාණන් වහන්සේ තෙවනවර ලක්දිවට වැඩම කළ අවස්ථාවේ සුමන සමන් දෙවි රජුගේ අරයුමින් මෙහි වැඩමකොට සමනොලගිරි මුදුනෙහි වම් සිරිපා ලකුණ පිහිටවූ හ.

බුදු සිරිපා පහසින් පූජනීයත්වයට පත් මෙම කන්දට ඇත්තේ අමුතුම දැකුම්කළු බවකි. භාතිකාභය රජුගේ උයනෙහි මල් නෙළීමට පැමිණි දෙවහනකගේ මහ පෙන්වීමෙන් ශ්‍රී පාදස්ථානය සොයාගත් බව ජනප්‍රවාද යයි. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා සිරිපා ලකුණ අටලොස් රියන් ගලකින් වස්වා ඒ මත සිරිපා සටහන කෙටූ බව කියැවේ.

දැනට රත්නපුරය හරහා ද හැටන් හරහා ද සිරිපා කඳු මුදුනට නැගීමට මාර්ග දෙකක් ඇත. මෙකල හද පිරි බැතින් බුදු සිරිපා දැක වැඳ පුදා ගැනීම් වස් සෑම වසරකම උඳුවප් පෝ දින සිට සමසක් සිරිපා කරුණා කිරීමට බෞද්ධයෝ පුරුදුව සිටිති.

## (5) දිවාගුහාව

සිරිපා කරුණා කොට හැටන් පාරේ දොරටුවෙන් බැස දැන් අප පැමිණ සිටින්නේ මහගිරිදඹය අසල පිහිටි භගවා ලෙන සමීපයට ය. ඇතැමුන් සලකන පරිදි දිවාගුහාව යනු මේ භගවා ලෙනය. එහෙත් ස්ථිර වශයෙන් ම ඒ පිළිබඳ නිගමනයකට එළඹීමට තවමත් හැකිවී නැත.

ඒ කෙසේ වෙතත් සමනොල ගිරි මුදුන් හි සිරිපා ලකුණ පිහිටුවා වදාළ බුදුරජාණන් වහන්සේ දිවා කාලයෙහි ගත කළ ගුහාව 'දිවා ගුහාව' නමින් හැඳින්වෙයි. දිවාගුහාව ස්ථිර වශයෙන් සොයාගත නොහැකි වුව ද බුදුරජාණන් වැඩසිටි තැනක් ලෙස පූජනීයත්වයෙන් සලකා සිතින් වැඳීමෙන් පවා බෞද්ධයෝ බුද්ධාලම්බන ප්‍රීතියට පත්වෙති. අපිත් දිවාගුහාවෙහි බුදුරදුන් වැඩසිටින අයුරු සිතින් මවාගෙන බුදුගුණ සිහිකොට පසඟ පිහිටුවා උන්වහන්සේට නමස්කාර කරමු.

## (6) දීඝවාපි චෛත්‍යය

සිරිපා අඩවියේ සිට දැන් අපි දීඝවාපි චෛත්‍යය අසලට පැමිණ සිටිමු. මෙම චෛත්‍ය පිහිටා ඇත්තේ නැගෙනහිර පළාතේ අම්පාර හෙවත් දිගාමඩුලු දිස්ත්‍රික්කයේ අම්පාරෙන් කිලෝමීටර 19ක් පමණ දුරින් නැගෙනහිර වෙරළාසන්නයේ ය.

බුදුරජාණන් වහන්සේ තෙවන වර ලක්දිවට වැඩම කළ අවස්ථාවේ මෙම චෛත්‍යය පිහිටි තැන සමවත් සුවයෙන් කල් ගෙවූහ. එසේ පාරිශුද්ධත්වයට පත් වූ භූමියෙහි දුටුගැමුණු රජුගේ සොහොයුරු සද්ධාතිස්ස රජතුමා දීඝවාපි චෛත්‍යය ඉදිකරවූ අතර විහාරයක් ද කරවීය. එතුමා කරවූ දීඝවාපි නම් වැව නිසා මෙම චෛත්‍යයට ද දීඝවාපී යන නම ලැබිණ.

කාලයාගේ ඇවෑමෙන් මේ චෛත්‍යය වල්බිහි වන්නට විය. අද ඉතිරිව ඇත්තේ හතරැස් කොටුවෙන් පහළ කොටස පමණි. එයින් මුල් කොටස අළුත්වැඩියා කර ඇති අතර ඉහළ කොටස තවමත් වල්බිහිවී පවතී.

දැන් අපි දීඝවාපී සෑ රදුන් වැඳපුදාගෙන කල්පිත වන්දනා ගමනේ ඊළඟ සිද්ධස්ථානය බලා පිටත් වෙමු.

### (7) මූතියංගන චෛත්‍යය

මෙම චෛත්‍යය පිහිටා ඇත්තේ බදුල්ල නගරාසන්නෙයෙහි ය. කොළඹ සිට කිලෝමීටර 230ක් දුරින් පිහිටා ඇති බදුලු දිස්ත්‍රික්කයෙහි අගනුවරය. මූතියංගන සෑය අසලට සිතින් පැමිණි අපි එහි පුරාවෘත්තය දැන ගනිමු.

බුදුරජාණන් වහන්සේ තෙවනවර ලක්දිවට වැඩම කළ අවස්ථාවෙහි මූතියංගන චෛත්‍යය පිහිටි තැන නිරෝධ සමාපත්තියෙන් වැඩ සිට පූජනීයත්වයට පත් කළහ. ඉන් පසුව මෙම ස්ථානයෙහි චෛත්‍යයක් ඉදිකර ඇති අතර, චෛත්‍යයට ආසන්නයෙහි දෙතිස් ඵලරුහ බෝධීන් වහන්සේ නමක් රෝපණය කරවා ඇත. බෝධි රෝපණය කරවා ඇත්තේ දේවානම්පියතිස්ස මහ රජතුමා විසිනි. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ගෙන් හටගත් ඇටවලින් බෝ පැල දෙතිසක් හට ගැනිණි. ඒවා දෙතිස් ඵල රුහ බෝධි යනුවෙන් සැළකේ.

බුදුවසින් නවවන සියවසෙහි අනුරපුර රජ කළ දෙටුතිස් රජතුමා විසින් මූතියංගන චෛත්‍යය විශාල කොට බන්දවන ලදී.

මලියදේව මහ රහතන් වහන්සේ මෙහි දී දේශනා කරන ලද ධර්මය අසා සැට නමක් රහත් වූහ. එසේ සංසාර විමුක්තිය ලැබූ අංගනය හෙවත් පෙදෙස මූතියංගනය වී යයි කියනු ලැබේ.

(8) තිස්සමහාරාම චෛත්‍යය

මුතියංගන වන්දනා කර අනතුරුව දුර ගමන් යා හැකි සිතින් දැන් අපි තිස්සමහාරාමයට පැමිණියෙමු.

තිස්සමහාරාමය පිහිටා ඇත්තේ දකුණු පළාත් හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි මාගම් පත්තුවෙහිය. දුර ප්‍රමාණය කොළඹ සිට කිලෝ මීටර 270ක් පමණ වේ.

බුද්ධ වර්ෂයෙන් සිව්වන සියවසෙහි කාවන්තිස්ස රජතුමා රුහුණෙහි රජකම් කරද්දී තිස්සමහාරාමය කරවීය. බුදුරදුන්ගේ වම් දළදා නිදන් කොට මෙහි ඉදිකළ චෛත්‍යය තිස්සමහාරාම චෛත්‍යයි. ඉන්පසු කාලවල ඉලනාග වෝහාරතිස්ස ආදි රජවරුන් විසින් චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ කටයුතු කරවා තිබේ. කාලයාගේ ඇවෑමෙන් වල්බිහි වූ තිස්සමහාරාමය ක්‍රි. ව. 1853 දී වේපතඉර සුමන සාමණේරයන්වහන්සේ ගේ මූලිකත්වයෙන් නැවතත් පිළිසකර කිරීම ඇරඹුනි.

බුදුරදුන් සමාපත්ති සුවයෙන් වැඩ සිටීමෙන් පූජනීය භූමියක් වූ තිස්සමහාරාමයෙහි අඩි 86ක් උසට ඉදිකර ඇති ප්‍රතිසංස්කරණයට ලක් වූ ඒ උතුම් චෛත්‍යය සැදැහැ සිතින් වන්දනා කරමු.

(9) ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ

සොළොස් තැනින් සත් තැනක් ම පිහිටි, සියවස් පසළොසක් තරම් දිගුකලක් ලක්දිව රාජධානියව පැවති අනුරාධපුරයට තිස්සමහාරාමයේ සිට දැන් අපි සම්ප්‍රාප්ත වී සිටිමු.

උතුරු මැද පළාතෙහි අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි අගනුවර වන අනුරාධපුරයෙහි පිහිටි මහමෙවුනා උයන මේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩ සිටින පුණ්‍ය භූමිය යි.

මහින්දාගමනයෙන් පසු දෙවන පෑතිස් රජතුමා දඹදිව අශෝක රජතුමා වෙත දූතයන් මගින් හසුනක් යැවීය. එහි සඳහන් වූයේ සඟමිත් තෙරණින් වහන්සේ හා සිරි මා බෝ සම්බුදුන්ගේ දක්ෂිණ ශාඛාවක් ලක්දිවට එවන්නැයි කළ ඉල්ලීමය.

ඒ අනුව සඟමිත් තෙරණියෝ දක්ෂිණ බෝධි ශාඛාව ද රැගෙන නැව් නැංගාහ. පිරිස් සහිත නැව යාපනයේ දඹකොළ පටුනට ළඟා විය. දෙවන පෑතිස් රජතුමා බෝධි ශාඛාව පිළිගෙන අනුරාධපුරයෙහි මහමෙව්නා උයනෙහි රෝපනය කරවීය.

කාලයත් සමඟ එම පෙදෙස වල්බිහි විය. බෝ සමීපූ වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා බෝ සමීපූ වටා ගල් බැම්මක් බැන්දවීය. දැනට දශක කීපයකට පෙර ආරක්ෂාව හා ගෞරවය පිණිස රන් වැටකින් බෝධීන් වහන්සේ පුදනු ලැබූහ. බෝධීන් වහන්සේ වටා තොරණ හා පිළිම ගෙවල් ද ඉදිකර ඇත. වසර 2200කටත් වඩා පැරණි මෙම ශ්‍රී මහා බෝධීන් වහන්සේ බෞද්ධ ජනතාවගේ උතුම් ම පූජනීය වස්තුවක් ලෙස සලකා දැන් අපි වන්දනා කරමු.

## (10) මිරිසවැටි සෑය

දැන් අප මිරිසවැටිය සෑය වෙතට යා යුතුය. එය පිහිටා ඇත්තේ ශ්‍රී මහා බෝධීන් වහන්සේට නුදුරින් තිසා වැව අසල ය.

දුටුගැමුණු රජතුමා දිනක් තිසා වැවට යමින් සිටිය දී දැනට මිරිසවැටි සෑය ඉදිකර ඇති තැන්හි ධාතූන් වහන්සේ තැන්පත් තම කුන්තය තැන්පත් කළේය. ආපසු එන ගමනේ දී කුන්තය ගැනීමට උත්සාහ කළත් එය ගත නොහැකි විය. එහෙයින් කුන්තය මැදි වනසේ චෛත්‍යයක් කරවූ රජතුමා ඒ අසළ විහාරයක් ද කරවීය. චෛත්‍යයට මිරිසවැටි සෑය හෙවත් "මරිචවට්ටි චේතිය" යනුවෙන් නම් තැබීය. සංඝයාට පිළිගන්වා ආහාර අනුභව කරන සිරිතක් රජතුමා සතුවිය. දිනක් එසේ කිරීමට අමතක වී මිරිස් මාලුවක් අනුභව කළ වරදට මරිචවට්ටි යන නම එම චෛත්‍යයට හා විහාරයට තැබූ බව කියැවේ. මුල් චෛත්‍යයේ සතරැස් කොටුව සහිත ඉහළ කොටස නොවීය.

පසු කලක සියම් රජ කුමරකුගේ ධන පරිත්‍යාගයෙන් හා ලක් රජයේ ආධාර ද ඇතිව චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කෙරුණි. මෑත භාගයේ දී ලක් රජයේ හා බෞද්ධ ජනතාවගේ ආධාර ඇතිව චෛත්‍යයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිමකොට ඇත. මිරිසවැටි සෑය වන්දනා කොට දැන් අපි මහාසෑය වෙත පිටත් වෙමු.

(11) රුවන්වැලි මහා සෑය

ශ්‍රී මහා බෝධීන් වහන්සේට නුදුරින් අභය වැව අසල පිහිටි මහා සෑය නම් මෙයයි. බුද්ධ වර්ෂ 4 වන සියවසෙහි දී දුටුගැමුණු නරපතියන් විසින් කරවූ මෙම මහා සෑය අඩි 350ක් උසය. ලක්දිව ඇති චෛත්‍යය අතර උසින් තෙවන තැන මෙයට හිමි වේ.

දුටුගැමුණු රජතුමා ඉතා උනන්දුවෙන් ආරම්භ කළ මෙම සෑය දිය බුබුලක හැඩයෙන් ඉදි කර තිබේ. සතරැස් කොටුවේ වැඩ නිමවන විට රජතුමා මරණාසන්න විය. ඉතිරි වැඩ කොටස සොයුරු සද්ධාතිස්ස රජු විසින් කරවන ලදී.

ධාතු ගර්භය තුළ අටළොස් රියන් රත්නමය බෝධි වෘක්ෂයක් තනවා ඇති අතර ද්‍රෝණයක් පමණ සර්වඥධාතූන් වහන්සේ මෙහි නිදන් කොට තිබේ. චෛත්‍යය වටා ගල් ඇල්ලූ සලපතල මළුව ද වටා ඇත් පවුරක් ද දක්නට ලැබේ. ඇත් පවුරට පිටින් ඇත්තේ වැලි මළුවයි.

කාලයාගේ ඇවෑමෙන් වල්බිහි වූ චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රි. ව. 1873 දී පමණ ආරම්භ කරන ලද්දේ සුමනසාර නම් හිමිනමක් විසිනි. 1938 වසරේ දී රුවන්වැලි මහා සෑය සම්පූර්ණයෙන් පිළිසකර කොට නිමවා කොත් පැළඳීවීම සිදු කරන ලදී. එදා සිට අද වනතුරු මෙන් ම මතුවටත් මේ මහසෑය බෞද්ධයන්ගේ නොමඳ පුද සත්කාර ලබමින් තව බොහෝ කලක් පවතිනු ඇත.

(12) ථූපාරාම චෛත්‍යය

මහා සෑය වන්දනා කළ අපි දැන් පැමිණ සිටින්නේ ඒ අසල පිහිටි ථූපාරාම චෛත්‍යය වෙතය.

මිහිඳු මාහිමියන් බුද්ධ වර්ෂ තුන්වන සියවසෙහි ලක්දිවට වැඩම කළ පසු ඉදි කරනු ලැබූ පළමු චෛත්‍යය මෙය වේ.

මිහිඳු මාහිමියන්ගේ වන්දනා කිරීමේ අවශ්‍යතාවය මත දෙවන පෑතිස් රජතුමා විසින් මෙම චෛත්‍යය ඉදි කරවනු ලැබීය. සුමන සාමණේරයන් වහන්සේ දෙව්ලොවින් ගෙනා බුදුරදුන්ගේ දකුණු අකු ධාතුව මෙහි නිදන් කොට තිබේ. චෛත්‍යය පිහිටි පෙදෙසෙහි ආරාමයක් ද කරවීය. ථූපය

ප්‍රධාන කොට ඇති ආරාමය ථූපාරාමය යනුවෙන් ව්‍යවහාරයට පත්විය. එහි ඇති චෛත්‍යය ද ඒ අනුව ථූපාරාම චෛත්‍යය යනුවෙන් භාවිතයට පත්විය.

අඩි 59ක් පමණ උස මෙම චෛත්‍යය වටා වසභ රජතුමා විසින් ගෘහයක් කරවීය. එය "චේතියඝර" නමින් හැඳින්වේ. චෛත්‍යයේ සිට පිටතට උසින් අඩුවන සේ සිට වූ ගල්කණු පේළි සතරක් මත වහලයක් යෙදීමෙන් චේතියඝරය නිමකොට ඇතත් අද දක්නට ලැබෙන්නේ ගල් කණු කීපයක් පමණි.

බුදුරදුන් සමාපත්ති සුවයෙන් වැඩ සිට පූජනීයත්වයට පත් කළ ස්ථානයෙහි ඉදි කරවා ඇති මේ චෛත්‍යය, චේතියඝරය නිසාත් ප්‍රමාණයෙන් කුඩා නිසාත් වැඩි උවදුරකට ලක් නොවී පැවතුණු බව පෙනේ.

## (13) අභයගිරි චෛත්‍යය

ථූපාරාම චෛත්‍යය වන්දනා කොට පියැගට පෙළින් බැස වම් අත දිසාවට ඇති මාවත ඔස්සේ අභයගිරි චෛත්‍යය වෙතට දැන් අපි යමු.

අනුරපුර සමාධි ප්‍රතිමා වහන්සේ අසළ පිහිටා ඇති මෙය ඉදිකරවා ඇත්තේ බුද්ධ වර්ෂ 5 වන සියවසෙහි වළගම්බා රජතුමා විසිනි. උස අඩි 370ක් පමණ වූ මේ මහා සෑය ලෝකයේ ඇති උස ම චෛත්‍යවලින් දෙවන තැන හිමි කරගෙන සිටී.

ගිරි නම් වූ නිගණ්ඨයාගේ ආරාමය පිහිටි තැන වට්ටගාමිණී අභය රජතුමා අභයගිරි විහාරය හා ධාතු තැන්පත් චෛත්‍යය කරවන ලදී. තමාගේ 'අභය' යන නමත් නිගණ්ඨයාගේ 'ගිරි' යන නමත් එක්කොට අභයගිරි යනුවෙන් එයට නම තබා තිබේ. කුපික්කල විහාරවාසී මහාතිස්ස තෙරුන්ට රජතුමා විසින් මෙම විහාරය පූජා කරන ලදී.

චෛත්‍යයේ විශාලත්වය අනුව ප්‍රතිසංස්කරණ කටයුතු එතරම් පහසු නොවීය. කෙසේ වෙතත් පිරිහීමට පත් වූ මෙම චෛත්‍යය පළමුවන පැරකුම්බා රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කරවන ලදී. සංස්කෘතික ත්‍රිකෝණය මගින් දැනට මේ සෑයෙහි පිළිසකර කටයුතු කරගෙන යනු ලැබේ.

(14) ජේතවන චෛත්‍යය

අභය ගිරි මහාසෑය වැඳගත් අපි රුවන්වැලි මහසෑ රදුන්ට වඩාත් සමීපව පිහිටි මහසෑය වන ජේතවන චෛත්‍යය වෙතට ලඟාවෙමු.

ලෝකයේ ඇති උස ම චෛත්‍යය වන මෙය උසින් අඩි 400ක් වනසේ ඉදි කරවූයේ බුද්ධ වර්ෂ නවවන සියවසෙහි මහසෙන් රජතුමා විසිනි. කාලයක් වැරදීමකින් ජේතවන සෑයට අභයගිරි සෑය යන ව්‍යවහාරයක් ද පැවතුණි.

මහසෙන් රජතුමා වැරදි මහ පෙන්වීමකට හසුවී අනුරපුර බොහෝ වෙහෙර විහාර විනාශ කරවීය. මේඝවර්ණාභය ඇමතිගේ මැදිහත් වීමෙන් නැවතත් ඒවා පිළිසකර කිරීමට රජතුමා කැමති විය. එහෙත් මුලදී වැරදි මහ පෙන්වූ භික්ෂු නිකායට අයත් කොහොන්තිස්ස නම් හිමි නමකට රජතුමා පැහැදී සිටියේය. එහෙයින් ජෝතිවන උයනෙහි ආරාමයක් කරවා ඒ හිමියන්ට පිදී ය. එය ජේතවනාරාම නම් විය. එහි ඉදිකළ චෛත්‍යය ජේතවන චෛත්‍යයයි.

චෛත්‍යය ඉදිකර ඇති තැන බුදුරදුන් සමවත් සුවයෙන් වැඩ සිටීමෙන් පූජනීයත්වයට පත්ව ඇත. බුදුරදුන්ගේ පටි ධාතුවෙන් කොටසක් හා සර්වඥ ධාතු නිදන් කොට චෛත්‍යය ඉදි කිරීමෙන් එහි පූජනීයත්වය තවත් වැඩි වී තිබේ.

පසු කාලයේ දී සිරිමෙවන් මහානාග ආදී රජවරුන් මෙම මහා සෑය ප්‍රතිසංස්කරණය කරවූ බව කියැවේ. දැනට සංස්කෘතික ත්‍රිකෝණය යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු කෙරෙමින් පවතී. අපි දැන් මේ වන්දනා කරන්නේ ලොව ඇති උස ම සෑරදුන්ටය.

(15) සේල චේතිය

අනුරපුරයෙන් සැතපුම් 8ක් පමණ දුරින් පිහිටි මිහින්තලයෙහි සේල චේතිය පිහිටි තැනට අපි දැන් පැමිණ සිටිමු. බුද්ධත්වයෙන් 7 වන සියවසෙහි දී අඩි 150ක් පමණ උසට මහාදාඨික මහානාග රජතුමා විසින් මෙම චෛත්‍යය කරවන ලදී.

බුදුරදුන් තෙවන වර ලක්දිවට වැඩම කළ අවස්ථාවේ සමවත් සුවයෙන් වැඩ සිටීමෙන් මෙම ස්ථානය පාරිශුද්ධත්වයට පත්විණි. උඩ මලුවෙහි ඇති අම්බස්තල චෛත්‍යයට ඉහළින් ගල්තලාවක පිහිටි හෙයින් ශෛල චෛත්‍යය

හෙවත් සේල චේතිය යන නම් ලැබී ඇත. බුදුරදුන්ගේ ඌර්ණ රෝම ධාතුව නිදන් කොට මේ චෛත්‍යය ඉදි කළ පසු රජතුමා විසින් ගිරි භණ්ඩ නම් උදාර පූජාවක් පවත්වන ලදී.

කාලයාගේ ඇවෑමෙන් වල්බිහිව තිබූ මෙම චෛත්‍යය ලක් රජය විසින් 1960 ගණන්වල දී සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කරවන ලදී. අද අපට දක්නට ලැබෙන්නේ එසේ වැඩ නිමකොට ඇති ශෛල චෛත්‍යයයි. අපි මේ ආගැබ ද වන්දනා කොට පිටත් වෙමු.

## (16) කතරගම කිරි වෙහෙර

කොළඹ සිට කිලෝ මීටර් 283ක් දුරින් පිහිටි කරතගම, හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත්වේ. තිස්සමහාරාමයේ සිට කිලෝමීටර් 16ක් දුරින් පිහිටා තිබේ. පැරණි බෙදීමට අනුව රුහුණු රටට කතරගම අයත් වේ. දැන් අපි එතැනට පැමිණ සිටිමු.

දෙවන පෑතිස් රජුගේ සොහොයුරු මහානාග යුවරජු මාගම අගනුවර කොට ගෙන රුහුණ පාලනය කළේ ය. ඔහු මෙහි බොහෝ වෙහෙර විහාර කරවීය. කතරගම කිරිවෙහෙර ද ඔහු විසින් කරවන ලද්දක් බව ජනප්‍රවාදයේ එයි. ඒ අනුව බුද්ධ වර්ෂ තුන්වන සියවසෙහි පමණ කිරි වෙහෙර චෛත්‍යය කරවන්නට ඇතැයි සැලකිය හැකිය.

බුදුරදුන් තෙවන වර ලක්දිවට වැඩි අවස්ථාවේ මේ චෛත්‍යය පිහිටි තැන සමවත් සුවයෙන් වැඩ සිටි රන් ආසනය ද උන්වහන්සේගේ කේෂ ධාතූන් ද නිදන් කොට චෛත්‍යය ගොඩනංවා තිබේ.

දෙවන පෑතිස් රජතුමා විසින් දෙතිස් ඵලරුහ බෝධීන් වහන්සේ නමක් ද රෝපනය කරවන ලදී. එය පිහිටා ඇත්තේ කරතගම මහ දේවාලය සමීපයෙහි ය.

වෙනත් චෛත්‍යයන්ට මෙන්ම කිරිවෙහෙර චෛත්‍යයට ද කාවන්තිස්ස, දුටුගැමුණු ආදී රජවරුන්ගේ ආරක්ෂාව සැලසිණි. කාලයාගේ ඇවෑමෙන් ගරා වැටී තිබුණු මෙම චෛත්‍යය 1950 ගණන්වලින් පසුව ප්‍රතිසංස්කරණය කෙරිණි.

මංගල මහා චෛත්‍යයයි නම් ලත් මෙම චෛත්‍යයට කිරිවෙහෙර යන නම ලැබී ඇත්තේ කිහිරි ගස්වලින් යුත් උයනක කරවූ බැවිනැයි සැලකිය හැකිය.

මෙසේ ලක්දිව සොළොස් තැන් සිතින් වන්දනා කළ අපි මතු දිනෙක නෙතින් දැක වන්දනා කරන්නට අදිටන් කර ගනිමු.

භාවිතයට :

බෞද්ධ සිද්ධස්ථානවල පින්තූර අලවා, ඒවා ගැන කෙටි සටහන් ලියා වැඩ පොතක් පිළියෙල කරන්න.

# බෞද්ධ උත්සව

බෞද්ධ සංස්කෘතික අංග අතර උත්සව වලට හිමි වන්නේ වැදගත් තැනකි. විවිධ අරමුණු මුල්කරගෙන උත්සව පැවැත්වීමෙන් නිරාමිෂ ප්‍රීතියක් ලබන බෞද්ධයා පිනක් ද රැස්කර ගනී. එබඳු ප්‍රධාන උත්සව කීපයක් පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරේ.

## වෙසක් උත්සවය

මැයි මාසයේ විසා නැකතින් උදාවන වෙසක් නම් වූ පුර පසළොස්වක පෝය දිනය බෞද්ධ ජනතාවට අතිශයින් ම ශ්‍රේෂ්ඨ දිනයකි. සිද්ධාර්ථ ගෞතම බෝධිසත්වයන් වහන්සේගේ උත්පත්තිය, බුද්ධත්වය හා උන්වහන්සේගේ පරිනිර්වාණය යන ත්‍රිවිධ අවස්ථාවන් ම මෙම දිනයේ සිදුවීම එයට හේතුවකි.

ශ්‍රී ලංකාව හා සම්බන්ධව සලකා බලන විට ද වෙසක් පුන් පෝය දිනයේ දී සිදුවූ වැදගත් සිදුවීම් කීපයක් ඇත.

* බුද්ධත්වයෙන් අටවන වසරෙහි බුදුරදුන් තෙවන වරට ලක්දිව කැළණියට වැඩම කිරීම හා සමනොල ගිරි මුදුනෙහි සිරිපා පිහිටුවීම.

* සොළොස්මස්ථානයන්ට අයත් අනිත් ස්ථානයන් ද බුද්ධ ස්පර්ශයෙන් පාරිශුද්ධත්වයට පත්වීම.

* පිරිනිවන් මංචකයෙහි වැඩ සිටි බුදුරදුන් සක්දෙව් රදුන් අමතා ලක්දිවත් සිංහල ජාතියත් රැකගන්නා ලෙස පැවසීම.

* ලාට රට සිංහපුරයෙහි සිංහබාහු රජුගේ වැඩිමහලු පුත් විජය කුමරු ලක්දිවට පැමිණීමෙන් සිංහල ජාතියේ ආරම්භය සිදුවීම.

* ධර්මාශෝක රජතුමා විසින් කරවන ලද පංච කකුධ භාණ්ඩ සහිතව දෙවන පෑතිස් නරනිදුන්ගේ දෙවන වර අභිෂේකය සිදුවීම.

* දුටුගැමුණු නරනිඳු විසින් රුවන්වැලි මහසෑය ඉදිකිරීමේ මූලික වැඩ කටයුතු විසා නැකතින් ඇරඹීම.

හෙළ වංසකථාවන්ට අනුව සිදු වී ඇති මේ කරුණු නිසා වෙසක් පුන් පෝ දිනය සිංහල බෞද්ධ ජනතාව අතර වඩාත් ශ්‍රේෂ්ඨත්වයට පත් ව ඇත. හෙළ නරපතියෝ මේ උතුම් පෝය දිනය උත්සවාකාරයෙන් සැමරීමට අමතක නොකළහ. දුටුගැමුණු නරපතියන් විසින් සූවිසි අවුරුද්දක් වෙසක් උත්සව පැවැත්වූ බව මහාවංශයේ සඳහන්ව ඇත. වෙසක් උත්සවය පිළිබඳ මහාවංසයේ එන පළමු සටහන ද එයයි. භාතිය රජතුමා වෙසක් උත්සව විසි අටක් ද වසභ රජතුමා වෙසක් උත්සව සතළිස් සතරක් ද කරවා ඇත. වෝහාරතිස්ස, ගෝඨාභය ජෙට්ඨතිස්ස ආදී රජවරුන් ද වෙසක් උත්සව පවත්වා තිබේ.

මෙසේ හෙළ නරපතියන් ඇතුළු බොදු ජනයා විසින් සියවස් ගණනක් තිස්සේ පවත්වාගෙන ආ වෙසක් උත්සවය මේ දක්වා ම අඛණ්ඩව පවත්වාගෙන එනු ලැබේ.

බුදු සිරිත ඇසුරින් නෙත් බඳනා වෙසක් පහන්, තොරණ සැරසිලි ආදියෙන් ද සවන් පිනවන බොදු ගී ආදිය ගායනයෙන් ද නැහැය පිනවන සුවඳ දුම් පූජාවෙන් ද දිව පිනවන ආහාර පාන දන්දීමෙන් ද කය සනසන ලේ දන්දීම්, ගිලන් උවටැන් ආදියෙන් ද පසිඳුරන් සනහන, කුසල් සිත් වඩවන ආමිස පූජාවෙන් වෙසක් උත්සවය සැමරීමෙන් බොදු ජනතාව ලබන්නේ අසීමිත සාමිස සුවයකි. අටසිල්, දසසිල් සමාදන් වීමෙන්, භාවනා කිරීමෙන් මනස පිරිසිදු කරන ප්‍රතිපත්ති පූජාවෙන් ලබන්නේ නිරාමිස සුවයකි.

මෙසේ වෙසක් උත්සවය සමස්ත බෞද්ධ ජනතාවගේ අති ශ්‍රේෂ්ඨ පූජනීය දිනයක් ලෙසින් ඉදිරියටත් පවතිනු ඇත.

### පොසොන් උත්සවය

තෙවරක් ලක්බිමට වැඩම කළ සම්බුදු රදුන්ගේ පිරිනිවීමෙන් තෙවන සියවසෙහි තෙවන දසකය උදාවිය. එහි සවැනි වසරේ සවැනි (ජූනි) මස සෙමින් සෙමින් ගෙවී යන්නට විය. අවරදිග අහසින් හිරු බැස ගොස් පෙරදිග අහසින් දෙට නැකතින් පොසොන් පුන් සඳ උදාවන්නට පෙර ම උතුරු දිග අහසින් අඹතලා මුදුනට උදා වූ නව පොසොන් පුන් සඳ කිරණ මුළු හෙළය ම එකලු කරන්නට සමත් විය. මේ නව පොසොන් පුන්සඳ නම්

මැදුම් පිළිවෙතින් පෝෂණය වී සම්මා ඤාණ, සම්මා විමුක්තියෙන් පරිපූර්ණත්වයට පත් අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ය.

මොහඳුරෙහි මුලා වී මුව කෙළියෙහි යෙදුණු, මුටසීව රජුගේ පුත් දෙවන පැතිස් නිරිඳු දුනු හී පොළොව මත පතිත කොට නැණ නුවන යොමා මිහිඳු මාහිමියන් විහිද වූ දහම් එළියෙන් ආලෝකවත් වූ මාවතට පිවිසියේ ය.

එතැන් සිට මේ දක්වා සියවස් විසිතුනක් මුළුල්ලේ වැව්දියෙන් කුසගිනි නිවා දහම් දියෙන් කෙළෙස් ගිනි නිවා සැනසුණු උතුමන්ගෙන් ද ඒ සඳහා වෙර දතර බොදු ජනයාගෙන් ද අප ලක් දෙරණ නො සිස් විය.

එහෙයින් මේ උදාර, සමාජ - සංස්කෘතික - ආගමික නවෝදයක් ඇති කළ පොසොන් පොහොය ලක්වැසි ජනතාවගේ සදානුස්මරණීය උතුම් පූජනීය දිනයක් බවට පත් ව ඇත. පොසොන් පෝ උදාවත් සමග ලක්ෂ සංඛ්‍යාත බොදුනුවන් අනුරපුර මිහින්තලාවට පියවර නගන්නේත් ආමිස, ප්‍රතිපත්ති පූජාවෙන් මිහිඳු මාහිමියන් හද පිරි බැතින් සිහි කරමින් බුදුරදුන් පුදනු ලබන්නේත් කෘතවේදිත්වයෙනි. පොසොන් පෙරහැර, පොසොන් තොරණ, පොසොන් දන්සල් පැවැත්වීම මගින් ආමිෂ පූජාවෙන් ද ශීල, භාවනාවන්හි යෙදීමෙන් ප්‍රතිපත්ති පූජාවෙන් ද පොසොන් උත්සවය වාර්ෂිකව පැවැත්වීමට බොදුනුවෝ පුරුදුව සිටිති.

## ඇසළ උත්සවය

අසාල්හ නැකතින් උදාවන හෙයින් ඇසළ නම් වූ පුන් පෝ දිනය පොහොය සමයෙන් අනතුරුව උදාවන ශ්‍රේෂ්ඨ දිනයයි. ඇසළ පෝය දිනය හා සම්බන්ධව සිදුවී ඇති කරුණු මතුකර ගැනීමෙන් එහි ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි කරගත හැකිය.

සිදුහත් බෝසතුන් මව්කුස පිළිබඳ ගැනීම, රාහුල කුමරුගේ උපත හා මහ බෝසතුන්ගේ මහබිනික්මන සිදුවූයේ ඇසළ පුන් පෝ දිනකය. තවදුරටත් එදින සිදුවූ වැදගත් සිදුවීම් කීපයක් මෙසේය.

* බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායේ දී පළමු දම් දෙසුම වන දම්සක් පැවතුම් සුතුර දෙසීම

* පස්වග මහණුන් සමග බුදුරජාණන් වහන්සේ පළමු වස් එළඹීම ඇසළ පුන් පෝ දිනය ගෙවීමත් සමග සිදුවීම.

* බුදුරදුන් ගණ්ඩබ්බ වෘක්ෂ මූලයේ දී තීර්ථකයන්ගේ මානය බිඳීම සඳහා යමා මහ පෙළහර පෑම.

* සත්වැනි වස තව්තිසා දෙව්ලොවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ දෙවියන්ට අභිධර්මය දේශනා කිරීම.

* බුද්ධ පරිනිර්වාණයෙන් දෙමසකට පසු රජගහනුවර දී ප්‍රථම ධර්ම සංගායනාව සඳහා මූලික කටයුතු ආරම්භ කිරීම.

දඹදිව සිදුවූ මෙම වැදගත් කරුණුවලට අමතරව ලක්දිව සිදුවූ කරුණු කීපයක් ද ඇත.

* මිහිඳුමාහිමියන් ලක්දිවට වැඩම කළ පසු දෙවන පැතිස් නිරිඳුන් මිහින්තලා පව්වෙහි මාසයක් තුළ අටසැට ලෙන් කරවා උන්වහන්සේලාට පූජා කිරීම.

* රුවන්වැලි මහාසෑය ඉදිකිරීමට දුටුගැමුණු රජතුමා විසින් මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය කිරීම.

* බුද්ධ වර්ෂ 847 දී කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුගේ කාලයෙහි කළිඟු රටින් හේමමාලා කුමරිය හා දන්ත කුමරු ලක්දිවට දළදා වහන්සේ වැඩමවා ගෙන ආ පසු වාර්ෂික දළදා පෙරහැර ආරම්භ කිරීම.

මේ අනුව ඇසළ පුන් පෝය කොතරම් වැදගත් ද යනු පැහැදිලිය. මේ කරුණු අතරින් බෞද්ධ ජනතාව අතර විශේෂත්වයක් ගනු ලබන්නේ කරුණු දෙකකි. වස් එළඹෙන දිනට පෙර දින ඇසළ පුන් පෝය යෙදීම නිසා භික්ෂූන් වහන්සේලාට ද වස් කාලය විවිධ පිංකම්වලට සහභාගී වීමට මහ පැදී ඇති හෙයින් බෞද්ධ ජනතාවට ද මෙම දිනය වැදගත් ය. එය පළමු කරුණයි. වාර්ෂිකව සිදු කෙරෙන දළදා පෙරහැර දෙවැනි කරුණයි. මෙම ප්‍රධාන කරුණු දෙක විශේෂත්වයක් ගනිමින් ඇසළ උත්සවය බෞද්ධ ජනතාවගේ සදානුස්මරණීය තත්වයට පත්ව ඇත.

## කඨින පූජෝත්සවය

හේමන්ත ගිම්හාන, වස්සාන යනුවෙන් වසරකට සෘතු තුනක් ඇත. එක් සෘතුවක් සාරමසකින් යුක්තය. වස්සාන සෘතුව ඇරඹෙන්නේ ඇසළ පුර පසළොස්වක දිනයෙනි. එම පසළොස්වක පෝය දිනට පසුදින එනම් අව පැළවිය දිනයෙහි භික්ෂූන් වහන්සේලා පෙරවස් එළඹෙති. එක් විහාරස්ථානයක එක් භික්ෂූන් වහන්සේ නමකට හෝ ඊට වැඩි ගණනකට වස් එළඹිය හැකිය. එතැන සිට තුන්මසක් යනතුරු එළඹි වස ආරක්ෂා කරගත යුතුය. වප් පුර පසළොස්වකට පසු දින පවාරණය කළ යුතුය. පෙරවස් පවාරණය කළ භික්ෂුව කඨින චීවරයක් ලැබීමට සුදුසුකම ලබයි. කඨින චීවරය සඳහා දෙපට සිවුර (සංඝාටිය) තනිපට සිවුර (උත්තරාසංගය) අඳනය (අන්තර වාසකය) යන චීවර තුනින් කවරක් වුවද සුදුසුය. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන කවරෙකුට වුවද කඨින චීවරයක් පූජා කිරීමේ හිමිකම ලැබී ඇත. එහෙත් කඨින චීවර පූජාව ලැබීමේ අයිතිය ඇත්තේ භික්ෂු සංඝයාට හෝ භික්ෂුණී සංඝයාට පමණි. යටත් පිරිසෙයින් උපසම්පන්න භික්ෂූන් හෝ භික්ෂුණීන් සිවු නමක් සංඝ යනුවෙන් අදහස් කරනු ලැබේ.

නියමිත දින පවාරණය කළ පසු ඉල් පුර පසළොස්වක පෝය තෙක් ඇති මාසය තුළ චීවර පූජා කළ යුතුය. එහෙයින් එම මාසය චීවර මාසය යනුවෙන් ව්‍යවහාරයෙහි පවතී. මෙම චීවර මාසය තුළ කුමන හෝ දිනයක එක් විහාරස්ථානයක එක් කඨින චීවර පූජාවක් සිදු කළ හැකිය. සංඝයා විසින් එම කඨින චීවරය වස් විසූ භික්ෂූන් අතරින් එක් භික්ෂුනමකට පවරනු ලැබේ.

මෙකල බොහෝ දුරට කඨින චීවර පූජාව සිදු කිරීමේ දී උත්කර්ෂවත් අයුරින් සිදු කිරීමට බෞද්ධ ජනතාව පුරුදුව සිටිති. එයට හේතුව කොපමණ පහසුකම් තිබුණත් එක් තැනක එක් කඨින චීවර පූජාවකට වඩා කළ නොහැකි වීම. කඨින චීවර බොහෝ ගණනක් පූජා කළ හැකිව තිබුණ ද අද බෙහෙවින් සිදු වන්නේ එකම කඨින චීවරයක් පූජා කිරීමය. මෙය ද කඨින චීවර පූජාව උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට තවත් හේතුවක් වී ඇත. කඨින චීවර පූජාව භාරගත් තැනැත්තා සියලු දායක දායිකාවන්ගේ සහභාගිත්වයෙන් තම නිවසේ සිට වීදි සංචාරය කරමින් අලංකාර පෙරහැරකින් කඨින චීවරය විහාරස්ථානයට වැඩමවා ගෙන එයි. බොහෝ විට මෙම පෙරහැර නිවසින් පිටත්වන්නේ අලුයම් කාලයෙහි ය. පෙරහර වීදි සංචාරය කරද්දී නිවැසියෝ පෙරහැරට එක්වෙති. අලංකාරවත් පෙරහැර

විහාරස්ථානයට ලඟා වූ පසු කඨින චීවරය සියලු දායකයන්ගේ සහභාගිත්වයෙන් සහසතු කොට පූජා කිරීම සිදුවෙයි.

කඨින චීවර පූජාව සමග කල්පවෘක්ෂ පූජාවක් ද සිදු කරනු ඇතැම් තැනක දැකිය හැකිය. ගසකින් කපාගන්නා ලද අත්තක් සරසා එහි විවිධ පූජා භාණ්ඩ එල්ලනු ලැබේ. පූජා භාණ්ඩ සහිත එම අත්ත කල්පවෘක්ෂය යනුවෙන් සැලකේ. කඨින චීවර පූජෝත්සවය ගුණාත්මක ලෙස පෝෂණය කිරීම සඳහා බෝධිපූජා, බුද්ධ පූජා, ධර්ම දේශනා, සහසතු දන් පිරිනැමීම ආදිය ද එක් කර ගැනීමට බෞද්ධයෝ පුරුදුව සිටිති.

භාවිතයට :

1. බෞද්ධයා තුළ ගුණදම් පෝෂණයට බෞද්ධ උත්සව උපකාරීවන අන්දම පෙන්වා දෙන්න.

2. මෙම පාඩමේ සඳහන් උත්සවන අවස්ථාවන්හි දහම් පාසල් දරුවන් වශයෙන් ඔබට කළ හැකි දේ ලියන්න.

35 පාඩම

## ගමයි පන්සලයි අතර යටගියාවේ සබැඳියාව

ගමයි පන්සලයි අතර සම්බන්ධතාවේ ඉතිහාසය බුද්ධ කාලය තෙක්ම ගමන් කරයි. මෙහි පන්සල යන්නෙන් අදහස් කැරෙන්නේ වර්තමානයේ දක්නට ලැබෙන විවිධ ආරාම අංගනයන්ගෙන් සැදුම්ලත් විහාර භූමිය ම නොවේ. බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය යි. ගමයි පන්සලයි අතර එකල පැවැති සබඳතාව ලෙස සැලකෙන්නේ ගම් නියම් නගරයන්හි වාසය කළ ජනතාව හා බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නය අතර අන්‍යෝන්‍ය වශයෙන් පැවැති ආශ්‍රය යි.

බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රථම ධර්මදූත රහත් සැටනම පිටත්කර හැරීමත් සමගම භික්ෂූන් වහන්සේ ජනතාව අතරට වැඩමවීම ආරම්භ විණි. ආරණ්‍ය, වෘක්ෂමූල, ශූන්‍යාගාර ඇසුරු කරමින් සංචාරක ජීවිතයක් ගතකළ බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා සඳහා ම වෙන්වූ ආරාම පූජාව ආරම්භ වූවාට පසුව එම ආරාම කරා ජනතාවගේ පැමිණීම ද ඇරඹිණි.

බුදුරජාණන් වහන්සේත් සංඝයාත් ජනතාවට මග පෙන්වීම සඳහා ඔවුන් අතරට වැඩමකර දහම් දෙසූහ. උපාසක උපාසිකාවෝ ද බුදුරදුන් දැක වැඳපුදා ගැනීමට සහ බණ ඇසීමට උන්වහන්සේ වැඩ සිටි ස්ථාන කරා ගියහ. ඇතැම්හු පිඬුසිඟා වැඩි බුදුරජාණන් වහන්සේට හා භික්ෂූන් වහන්සේට පිණ්ඩපාතය පිළිගැන්වූහ. ඇතැම්හු තම නිවෙස්වලට වඩින ලෙස භික්ෂූන් වහන්සේට ආරාධනා කර නිවෙස්වලදී ම දානය පිළිගැන්වූහ. ආමිස දානයෙන් උපකාර කරන ගිහියාට බුදුරජාණන් වහන්සේත් ශ්‍රාවක සංඝයාත් ප්‍රතිඋපකාර කළේ ධර්ම දානයෙනි.

ඇතැමුන් බුදුරජාණන් වහන්සේ කරා ගියේ උන්වහන්සේ දැක වැඳ බණ අසා සිත සනසා ගැනීමට ය. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සඳහන් දීඝජානු කෝලිය පුත්‍රයා වැනි අය ගියේ තම මෙලොව ගිහි ජීවිතයත් පරලොව ජීවිතයත් සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාගැනීමට ය. දරුවන් විසින් පිටමං කරනු ලැබූ බමුණා තම දුක කියාපෑමට බුදුරජාණන් වහන්සේ වෙත ගිය අතර කිසාගෝතමී තම මළ පුතු රැගෙන ගියේ එම පුතු සුවපත් කර ගැනීමට බෙහෙතක් දැනගැනීමට ය. තම මිත්තනිය මිය යෑම නිසා ඇති වූ දුක කියාපෑම, තම බිසව වඩාත්ම ආදරය කරන්නේ ඇයටම බව පැවසීම නිසා ඇති වූ චිත්ත පීඩාව දුරුකර ගැනීම වැනි කරුණු සඳහා කොසොල් රජ නොයෙක් වර බුදුරදුන් සොයා ගියේය. ඒ සියළු දෙනාට ම අවශ්‍ය

උපදෙස් දෙමින් බුදුරජාණන් වහන්සේ ක්‍රියා කළ ආකාරය සූත්‍ර පිටකයේ හා අටුවා කතාවන්හි සටහන් ව ඇත.

මරණින් පසු ඇතමකු දුගතිගාමී වීමටත් ඇතමකු සුගතගාමී වීටමත් හේතු මොනවාද වැනි ප්‍රශ්න ඉදිරිපත් කළ සාලෙය්‍යක බ්‍රාහ්මණයන් වැනි අයට ඔවුන්ගේ ගැටළු විසඳෙන සේ දහම් දෙසූහ. එසේ ම වගා කළ කුඹුරු පාළු වූ ගොවියා වැනි අය සොයාගෙන ගොස් ඔවුන්ගේ දුක නිවා සැනසීමට පත්කිරීම වැනි ක්‍රියා ද යුධ අරගලවලට පෙළඹුණු අය අතරට වැඩමකර එම අරගල සංසිඳවීම වැනි ක්‍රියා ද බුදුරදුන්ගෙන් සිදු විණි.

අනේපිඬු සිටුතුමා, විශාඛා උපාසිකාව වැනි අය ආරාම සාදා පූජා කර නිතරම බුදුරජාණන් වහන්සේත් ශ්‍රාවක සංඝයාත් ඇසුරු කරමින් ගුණ නැණ දියුණු කර ගත්හ. අනේපිඬු සිටුවරයා තම පුත් යහමඟට හැරවීම සඳහා යැව්වේ බුදුරදුන් වෙතට ය. සිටුතුමා ගිලන් වූ විට ඔහුගේ නිවසට වැඩම කළ සැරියුත් මහ රහතන් වහන්සේ ඔහුට දහම් දෙසා කායික මානසික සුවය ලබා දුන් සේක. මෙම කරුණුවලින් අනාවරණය වන්නේ බුද්ධ කාලයේ ම ගමයි පන්සලයි අතර පැවැති සම්බන්ධය හා එමඟින් සිදුවූ සේවාවයි.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ව භික්ෂූන් වහන්සේගේ සංචාරක ජීවිතය බොහෝ දුරට ම අඩු විය. වස් කාලයේ පමණක් නොව අනෙක් කාලවල ද ආරාමවලම ජීවත්වීමේ ක්‍රමය වර්ධනය විණි. කාලීන අවශ්‍යතා අනුව ධර්මය පමණක් නොව වෙනත් උචිත ශිල්ප ශාස්ත්‍ර ද බෙදාදෙන මධ්‍යස්ථානය බවට පන්සල පත්විය. එහි ප්‍රතිඵලය වශයෙනි. අවට ජනතාවට පමණක් නොව විදේශීයයනට පවා විවිධ විෂය හැදෑරිය හැකි නාලන්දා, වික්‍රමශිලා වැනි බෞද්ධ විශ්ව විද්‍යාලය බිහිවූයේ. එකල පන්සලෙන් ගමට රටට පමණක් නොව ලොවට ම සිදුවූයේ මහඟු සේවයකි. ප්‍රධාන ම සේවාව ධර්ම දානයයි.

අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ විසින් බුදු සමය ස්ථිරව පිහිටුවීමට කටයුතු යෙදීමත් සමග ම ශ්‍රී ලංකාවේ ද ගමයි පන්සලයි අතර සම්බන්ධය ගොඩනැගීමට අවශ්‍ය පසුබිම සැකසිණි. ලක්වැසි ජනයාගේ ආගමික අධ්‍යාපනික හා සංස්කෘතික මධ්‍යස්ථානය වූයේ පන්සලයි. එකල පැවැති සමාජ පරිසරය අනුව ගිහියාට ධර්ම දේශනා කිරීම පමණක් ප්‍රමාණවත් නොවීය. ගිහියා ද ධර්මයට අමතරව ලෞකික ජීවිතයේ සාර්ථකත්වයට අවශ්‍ය විවිධ මගපෙන්වීම් හා අනුග්‍රහ භික්ෂූන් වහන්සේගෙන් අවශ්‍ය විවිධ මගපෙන්වීම් හා අනුග්‍රහ භික්ෂූන් වහන්සේගෙන් බලාපොරොත්තු විය. ඔහුගේ හිතවතාත් ගුරුවරයාත් වූයේ ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේ යි. ගැමියාගේ පටන් රජ කුමරු තෙක් සියල්ලන් ම අධ්‍යාපනය ලැබුයේ පන්සලෙනි. ඒ

සඳහා ඇපකැප වන භික්ෂූන් වහන්සේ රැක ගැනීම හා පෝෂණය කිරීම රජුගේත්, රටවැසියාගේත් යුතුකමක් ලෙස සැළකිණි. විශේෂයෙන් රජවරුන් විසින් විහාරස්ථානයන්ට ඉඩකඩම් පූජා කිරීමාදිය පවා කැරුනේ එම යුතුකම ඉටුකිරීම් වශයෙනි. ඉඩමක් හෝ වැවක් පූජා කිරීමේ දී සිවුපසය සඳහා මෙම පූජාව පිළිගනු මැනැවයි ආරාධනා කළවිට එය පිළිගැනීම සුදුසු බවට සම්මතයක් ද භික්ෂූන් වහන්සේ අතර විය. එසේ විවිධ ක්‍රමයන්ගෙන් සිවුපසයෙන් උපකාර කරන ගිහියාට ධර්මදානයෙන් උපකාර කිරීම තම යුතුකම බව භික්ෂූන් වහන්සේ සැලකූහ. මෙහි ධර්මදාන යන්නට ධර්මය, අධ්‍යාපනය, සංස්කෘතියෙන් පිළිබඳ හැම සේවාවක් ම ඇතුළත් වූ බවත් ඒ නිසා ගිහියාට ධර්මයෙන් අධ්‍යාපනයෙන් හා සංස්කෘතියෙන් ප්‍රතිසංග්‍රහ කිරීම තම පරම යුතුකමක් සේ භික්ෂූන් වහන්සේ සැලකූ බවත් ලංකාවේ බුදු සමයේ ඉතිහාසය නම් ග්‍රන්ථයේ දී මහාචාර්ය වල්පොල රාහුල ස්වාමීන් වහන්සේ සඳහන් කරති.

භික්ෂූන් වහන්සේ සිල්වත් වීම සලකන ලද්දේ තනිකර ම පෞද්ගලික කාර්යයක් වශයෙන් පමණක් නොව ගිහියාට කරන උපකාරයක් ද වශයෙනි. සීලසම්පන්න භික්ෂූන් වහන්සේ ට දන්පැන් පිරිනමා පින් රැස්කර ගැනීමට ලැබීම ගිහියාට ලැබෙන විශේෂ භාග්‍යයක් ලෙස සැලකිණි. ඒ නිසා සිල්වත් වීමෙන් තමන් ගිහියාට යුතුකමක් ඉටුකරන බව භික්ෂූන් වහන්සේ විසින් සලකන ලදී. එසේ ම දායක දායිකාවන් සීලසම්පන් බවට පත්කිරීමට කටයුතු කිරීම යුතුකමක් ලෙස සැළකිණි. එබැවින් රජවරුන් පවා උපොසථ සීලයෙහි පිහිටා භික්ෂූන් වහන්සේගේ උපදෙස් මත පෝදා ගතකළ බව සද්ධාතිස්ස, දාඨෝපතිස්ස වැනි රජවරුන්ගේ ජීවිත තොරතුරුවලින් පැහැදිලි වෙයි.

එදා ගිහියා පන්සලට ගියේ අධ්‍යාපනය ලබා ගැනීමට දන්පැන් පිරිනමා වතාවත් පවත්වා පින් රැස්කර ගැනීමට පමණක් නොවේ. ඇතැම් අවස්ථාවන්හි වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට ගියේ ද පන්සලට ය. වෙදකම රැකියාවක් හෝ තමන්වහන්සේට අදාළ ම කාර්යයක් ලෙස සලකා ක්‍රියා කිරීමට භික්ෂූන් වහන්සේට ඉඩක් නැත. එහෙත් ගමේ ජනතාවගේ අවශ්‍යතාව ද ඉටුවිය යුතුය. එබැවින් කැප සරුප් ලෙස වෛද්‍ය උපදේශ ලබාදීමේ විධි භික්ෂූන් වහන්සේ විසින් සකසාගෙන තිබුණු බව අටුවා කතාවන්ගෙන් පැහැදිලි වෙයි. සමන්තපාසාදිකා නමින් හැඳින්වෙන විනය අටුවාවෙහි සඳහන් වන එක් පුවතකට අනුව භික්ෂූන් වහන්සේ විසින් කැප සරුප් ලෙස බෙහෙත් කියාදීමෙන් රජ බිසවකගේ ද රෝගයක් සුවකර ගැනීමට සහාය වී ඇත. වසභ රජුගේ බිසවට වැළඳී ඇති රෝගයක් පිළිබඳව මහාපදුම නම් ස්වාමීන් වහන්සේට දැන්වූයේ එක්තරා කාන්තාවකි. ඒ සඳහා බෙහෙතක් නියම

කරන ලෙස එම කාන්තාව ආයාචනයක් ද කළා ය. එහෙත් මෙන්න මේ බෙහෙත සාදා දෙන්නැයි මහා පදුම ස්වාමීන් වහන්සේ එම කාන්තාවට නියම නොකළහ. ඒ වෙනුවෙන් කළේ එම රෝගයට කරන ප්‍රතිකාර පිළිබඳව පන්සෙලේ අනෙකුත් භික්ෂූන් වහන්සේ සමඟ සාකච්ඡාවක් කිරීමයි. සාකච්ඡාවට සවන් දුන් කාන්තාව එහි දී කියැවුනු බෙහෙත් රජබිසවට පිළියෙලකර දුන්නා ය. මහා පදුම ස්වාමීන් වහන්සේට පුද පිරිකර ද යවන ලදී. මෙයින් බිසවගේ අසනීපය සුවවූ බැවින් පැහැදිලි වන්නේ විනය නීතිරීතිවලට පටහැනි නොවන පරිදි තම දායකයන්ට පිහිටවීම යුතුකමක් ලෙස භික්ෂූන් වහන්සේ සැලකූ බවත් ගිහියා එබඳු සේවාවන් පන්සලෙන් බලාපොරොත්තු වූ බවත් ය. පසු භාගය වන විට එම සේවා වඩාත් සංවිධානාත්මක විය.

සාමාන්‍ය ගැමියන් පමණක් නොව රජ පවුලේ අය පවා සැලකුයේ පන්සල තම ආරක්ෂක ස්ථානය ලෙසය. දුටුගැමුණු සද්ධාතිස්ස කුමාරවරුන්ගේ අරගලයේ දී සද්ධාතිස්ස කුමරු ආරක්ෂාව සොයා පන්සලට ගියේ එබැවිනි. එබඳු අවස්ථාවන්හි ඔවුන් ආරක්ෂා කිරීම තම වගකීමක් ලෙස භික්ෂූන් වහන්සේ සැලැකූහ. රටේ හා ගමේ සාමය ඇතිකිරීමට මැදහත් වීම ද පන්සලෙන් සිදුවුණු සේවාවකි. රාජ්‍ය අර්බුදවල දී ඒවා සමථයකට පත් කිරීමට භික්ෂූන් වහන්සේ ක්‍රියා කළ බව ට පලවන වාර්තාවලින් ඒ බව පැහැදිලි වෙයි. ඇතැම් භික්ෂූන් වහන්සේ නඩු විසඳීමට පවා ඉදිරිපත් වූ බවත් එම විසඳීම් පිළිගැනීමට ජනතාවත් රජුත් කැමති වූ බවත් ගෝදත්ත තෙරුන් පිළිබඳ කතා පුවතින්න අනාවරණය වෙයි.

එදා ගැමියා පන්සල ඇසුරු කළේ ආර්ථිකමය ආධාර බලාපොරොත්තුවෙන් නොවේ සෑම කටයුත්තක දී ම උපදේශ බලාපොරොත්තුවෙන් පන්සලට ගිය ද පන්සලට අයත් දේපලවලින් කිසිවක් බලාපොරොත්තු නොවී ය. තමන් උපයාගත් දෙයින් පළමු කොටස පන්සලට පුදා ඉතිරිය පරිහරණය කිරීම සිරිත විය. සංඝයා සතුදේ තමන් ලබා ගැනීම පවක් ලෙස සලකන ලදී. කලාතුරකින් භික්ෂූන් වහන්සේගේ සිවුර පවා සොරකම් කිරීමට පෙළඹුණු අය සිටියත් එබඳු අයට දඬුවම් කිරීමට දායක පක්ෂය ම ඉදිරිපත් වූ බව හරන්තික නමැති සොරා පිළිබඳ කතා පුවතින් අනාවරණය වෙයි. එබඳු සොරුන්ට පවා පන්සලෙන් ලැබුණේ අනුකම්පාවකි.

ගම්වැසියාගේ ගුණදහම් පෝෂණය කිරීම සඳහා විවිධ පින්කම් පන්සල මුල්කොට සංවිධානය විණි. ඇතැම් පූණ්‍ය උත්සවවලට රාජ්‍ය අනුග්‍රහය ද ලැබිණි. කඨින පූජෝත්වය අරියවංස උත්සවය ආදිය පිළිබඳ තොරතුරුවලින් ඒ බව පැහැදිලි වෙයි. ඇතැම් ධර්ම දේශනා ද පවත්වන ලද්දේ උත්සව

ස්වරූපයෙනි. එක් අතකින් ධර්මඥානය ලබාදෙන අතරම අනෙක් අතින් ධාර්මික විනෝදයක් ලබා ගැනීමට සැලසීම ද එම උත්සව මගින් සිදුවිණි. ප්‍රධාන අරමුණ වූයේ මෙලොව දැහැමි ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය මග පෙන්වීමත් සගමොක් සුව සලසා ගැනීමට අවශ්‍ය ආධ්‍යාත්මික පසුබිම සකස් කිරීමත් ය. ගිහියා පන්සලට ගියේත් ස්වාමීන් වහන්සේ පන්සලේ සේවා සංවිධානය කළේත් එම අරමුණ ඇතුව ය.

ගමට නායකත්වය දුන්නේ පන්සල ය. ගමේ සෑම පොදු කටයුත්තක් සඳහාම සාකච්ඡා කෙරෙන මධ්‍යස්ථානය වූයේ පන්සල ය. රැස්වීම් සඳහා ජනතාව රැස්කර වූයේ ඝණ්ඨාව නාද කිරීමෙනි සමගියෙන් රැස්ව සමගියෙන් සාකච්ඡා කර සමගියෙන් විසිර යෑමට හැකිවූයේ ස්වාමීන් වහන්සේගේ නායකත්වය පිළිගෙන උන්වහන්සේගේ අනුශාසනා යටතේ ගම්වැසියන් ක්‍රියා කිරීම නිසා ය. දරුවකුගේ උපතේ සිට මරණය තෙක් වූ සෑම සිහි කටයුතු අවස්ථාවකම පන්සලේ ස්වාමීන් වහන්සේ සම්බන්ධ වූහ. ඒ නිසා ම කුල දේවතා යන අතිරේක නාමයකින් උන්වහන්සේ හැඳින්වීමට ජනතාව පුරුදු විය.

ගම හා පන්සල අතර පැවැති මෙම සැබැඳියාව නිසා යුරෝපීය ආධිපත්‍යයට ශ්‍රී ලංකාව පත්වනතුරු ම ධර්මද්වීපය නාමයෙන් හැඳින්වීමට සැබවින්ම සුදුසු පරිසරයක් ගොඩනැගී තිබිණි.

භාවිතයට

(1) නිතරම ආමිස දානයෙන් උපකාර කරන ගිහියාට ධර්ම දානයෙන් උපකාර කරන්න. යන උපදේශය අතීතයේ ක්‍රියාත්මක වී ඇති අයුරු කෙටියෙන් පහදන්න.

(2) අතීතයේ ගම සහ පන්සල අතර පැවති සබැඳියාවෙන් වර්තමානයට ඔබ ගන්නා ආදර්ශය කුමක් ද?

# 36 පාඩම

## ගමයි පන්සලයි අතර වර්තමාන සම්බන්ධතාව

පුරාණයේ ශ්‍රී ලංකාවේ ගමක ආගමික, සංස්කෘතික හා අධ්‍යාපනික කටයුතුවල මධ්‍යස්ථානය වූයේ පන්සලයි. මෙකී සේවාවන්ට අමතරව පොදු සමාජ කටයුතු සඳහා උපදේශක සේවාවක් ද පන්සලෙන් සැපයිණ. මේ පිළිබඳව මීට ප්‍රථම පාඩමෙන් ඉගෙන ගන්නට ලැබිණ. මේ පාඩමෙන් බලාපොරොත්තු වනුයේ වර්තමානයේ ගමත් පන්සලෙන් සැපයිණ. මේ පිළිබඳව මීට ප්‍රථම පාඩමෙන් ඉගෙන ගන්නට ලැබිණ. මේ පාඩමෙන් බලාපොරොත්තු වනුයේ වර්තමානයේ ගමත් පන්සලත් අතර ඇති සබඳතාව හා පන්සලෙන් කෙරෙන සේවාව පිළිබඳව සොයා බැලීම ය.

ශ්‍රී ලංකාව බටහිර ජාතීන්ගේ පාලනයට යටත් වූ පසු ක්‍රමයෙන් ගමත් පන්සලත් අතර සබඳතාව පිරිහීමට පටන් ගත් බව පෙනේ. 1815 දී, විශේෂයෙන් ශ්‍රී ලංකාව ඉංග්‍රීසි යටත් විජිතයක් වූ පසු මේ තත්වය වඩාත් සීඝ්‍ර විය. ගමත් පන්සලත් අතර සම්බන්ධය දැඩි වූ තරමට ජනතාවගේ එකමුතුකම වැඩිවන බවත් එබැවින් ඔවුන් යටත් වැසියන් වශයෙන් තබා ගැනීමට දුෂ්කර බවත් සුදු පාලකයන්ට වැටහිණ. එබැවින් ඉංග්‍රීසි පාලකයෝ ගමත් පන්සලත් අතර සම්බන්ධය අඩුවීමට සියුම් උපක්‍රම සැලැස්වූහ.

ශ්‍රී ලංකාව බෞද්ධ රජවරුන් යටතේ පාලනය වන කාලයේ දී පාලකයන්ගේ ගෞරවය හා සැලකිල්ල නිතැතින්ම පන්සලටත් භික්ෂූන් වහන්සේටත් ලැබිණි. මේ තත්වය මහජන ගෞරවය පන්සලට ලැබීමට ද හේතු විය. එහෙත් අබෞද්ධ විජාතික පාලනය යටතේ ගෞවරය පන්සලට හා භික්ෂූන් වහන්සේට ලැබුණේ නැත. මේ තත්වය රාජ්‍ය සේවකයන් ඇතුළු සාමාන්‍ය ජනයාත් පන්සල කෙරෙහි තිබුණු සැලකිල්ල අඩුවීමට තරමක හේතුවක් වූ බව පෙනේ.

විදේශීය පාලන සමයේ දී සාමාන්‍ය වැසියන්ට අධ්‍යාපනය, ලබාදීමේ කාර්යභාරය ක්‍රමයෙන් භික්ෂූන් වහන්සේගෙන් ගිලිහී යාමට කටයුතු සැලසිණ. පෙර කියැවීම, ලිවීම ගණිත මිණිත ආදි සියල්ල ගම්වැසියන් ඉගෙන ගත්තේ පන්සලෙනි. බටහිර පාලන සමයේ දී මේ කාර්යය සඳහා පාසල නමැති අළුත් ආයතනයක් ඇති විය. මේ ආයතනය මුලදී ආරම්භ කරන ලද්දේ අන්‍ය ආගමික පූජකවරුන් විසින් ය. එබැවින් එම පාසල්වල

බෞද්ධ ආගමික පරිසරයක් හෝ බුදුදහම ඉගැන්වීමක් නොවීය. ඉංග්‍රීසි පාලන යුගයේ දී රජයේ පාසල් ද ආරම්භ විය. ඒවායේ ද ශ්‍රී ලංකාවට නිදහස ලැබීම ආරම්භ වන තුරු ම කිසිම ආගමක් ඉගැන්වූයේ නැත. පාසල් අධ්‍යාපනය පුළුල් වී යාමත් සමඟ ගිහියන්ගේ සාමාන්‍ය අධ්‍යාපනය සම්පූර්ණයෙන් ම පන්සලෙන් ඉවත් විය. ගිහි පැවිදි සම්බන්ධය පිරිහී යාමට මෙය ප්‍රධාන හේතුවක් විය.

පුරාණයේ දී දරුවාට මුලින් ම අකුරු කියවන ලද්දේ ගමේ පන්සලේ හාමුදුරුවන් විසිනි. පාසල් ඇරඹීමෙන් පසුවත් මේ සිරිත ගම්බද පෙදෙස්වල ටික කලක් පැවතිණ. අද චාරිත්‍රයක් වශයෙන් නමුත් භික්ෂූන් වහන්සේ නමක ලවා අත පොත තබා අකුරු කියවාගැනීම කරුණු ලබන අවස්ථා දක්නට ලැබෙනුයේ ඉතා කලාතුරකිනි.

ලක්දිව නිවාඩු ක්‍රමය වෙනස්වීම ද ගමත් පන්සලත් අතර සම්බන්ධය අඩුවීමට හේතුවක් විය. සිංහල පාලන යුගයේ දී සතර පෝය ම වැසියෝ ගොවි කර්මාන්ත ආදියෙන් ඉවත් වී විවේක ගත්හ. පෝය දිනයේ පන්සල් යාම බෞද්ධයෝ අනිවාර්යෙන් ම සිදු කළහ. බටහිර පාලනය ඇරඹුණු පසු පෝය දිනය වෙනුවට ඉරිදා දිනය සතියේ විවේක දිනය බවට පත් විය. පෝය දිනයන් ද රජයේ වැඩ කරන දිනයන් මෙන් ම (පසළොස්වක් පොහෝ දිනය නිවාඩු දිනයක් බවට පත් වූයේ ලක්දිව නිදහස ලබා ටික කලකට පසුව ය.) පාසල් පවත්වන දිනයන් බවට පත් විය. මේ නිසා පෝය දිනයේ පන්සලට යාමට ද සැහෙන අවහිරයක් ඇති විය. භික්ෂූන් වහන්සේ හා ගිහියන් අතර සම්බන්ධකම් අඩුවීමට මේ තත්වය ද සැහෙන හේතුවක් වූ බව පෙනේ.

බටහිර අධ්‍යාපනය ලැබීමෙන් පසු ලාංකික සමාජයේ පවුල් ක්‍රමය හා ආර්ථික කටයුතු ද බෙහෙවින් වෙනස් විය. පැරණි පවුලේ විශාල සාමාජික පිරිසක් වූහ. එහි දෙමව්පියන් දරුවන් පමණක් නොව නැන්දලා, මාමලා, ආච්චිලා, සීයලා ආදී විවිධ තරාතිරම්වල අය වූහ. එකල වැඩි වශයෙන් රැකියාවක යෙදුණේ වැඩිහිටි පිරිමි පමණි.

කාන්තාවෝ නිදහස් ගෘහ කර්මාන්ත ආදියෙහි යෙදුනත් අද මෙන් සේවා ස්වාමීන් යටතේ වැටුප් ලබන වෘත්තීවල නොයෙදුණහ. නිවෙස්වල වැඩි පිරිසක් රැඳී සිටියහ. රැකියාවල යෙදුණු පිරිමින්ට ඉඩකඩ නැති වුණත් ගෙවල්වල සිටි වයසක උදවියත්, කාන්තාවෝත් පන්සලේ අවශ්‍යතා සොයා

බැලූහ. ගිහියන්ගෙන් පන්සලට ඉටු විය යුතු යුතුකම් ඉටු කිරීමට ඒ අය වග බලා ගත්හ.

මෙකල පවුල නැමැති ආයතනය ක්‍රමයෙන් කුඩා වෙමින් සකස්වන බව පෙනේ. අද එහි සාමාජික සංඛ්‍යාව මවටත්, පියාටත්, දරුවකුටත් හෝ දරුවන් කීප දෙනෙකුටත් සීමාවේ. පෙර මෙන් නොව මෙකල පවුලේ මවත් පියාත් දෙදෙනාම රැකියාවක යෙදෙති. දරුවෝ පාසල් යති. සතියේ නිවාඩු දිනය ද දෙමව්පියන්ට කාර්ය බහුල ය. එබැවින් ඔවුනට පන්සල අමතක වනසේ ය. මේ නිසා බොහෝ ගිහි පක්ෂයෙන් පන්සලට ඉටු විය යුතු යුතුකම් කොටස ඉටු වන බවක් නොපෙනේ.

සමාජයේ මේ විවිධ වෙනස්වීම් ඇති වුවද භික්ෂූන් වහන්සේ ගිහි පිරිස වෙනුවෙන් තම සේවාවන් නොපිරිහෙලා ඉටු කරති.

පන්සල සමඟ ඇසුරක් නොපවත්වන ගම් වැසියකු වුවද තම පවුලේ කෙනෙකුගේ අවමඟුලක් සිදු වූ විට ආගමික කටයුතු කිරීමට ආරාධනය කරන්නේ ගමේ පන්සලේ හාමුදුරුවන්ට ය. උන්වහන්සේ කරුණාවෙන් අවමඟුල් කටයුතු කෙරෙන තැනට වැඩම කොට, පැමිණි වෙනත් භික්ෂූන් වහන්සේගේ සහාය ද ඇති ව, මතක වස්ත්‍ර මහා සංඝයා විෂයෙහි පූජා කරවා ආගමික කටයුතු පවත්වති. එසේම අවස්ථාවට උචිත පරිදි මිය ගිය අයගේ ගුණ කථන ආදියත් කොට සුදුසු ධර්මානුශාසනයක් ද පවත්වා, ශෝකයට පත්වූවන්ගේ ශෝකය ද තුනී කරති. එසේම මිය ගිය අයගේ සත් දවස හා තෙමස් සම්පූර්ණ වීම නිමිත්තෙන් පැවැත්වෙන බණ පින්කම් ආදියට ද නිසි උපදෙස් දී පින්කම් පැවැත්වීමට සලස්වා මළවුන්ට පින් පමුණුවති.

දායකයකුගේ අසනීප ආදියක් ගැන ගත්තට ලැබුණොත් ඔහුගේ නිවසට වැඩම කොට පිරිත් සජ්ජායනා කොට ආශිර්වාද කිරීමට ද උන්වහන්සේ අමතක නොකරති. ගෘහ ප්‍රවේශ මංගල්‍යය, නව ව්‍යාපාර, ආරම්භ කිරීම හා විදේශ ගමන් ආදියෙහි දී ද ගිහි බෞද්ධයෝ භික්ෂූන්වහන්සේගේ ආශිර්වාදය බලාපොරොත්තු වෙති. කාර්ය බහුල වුවත් ආරාධනයක් ලැබුණොත් භිකෂූන් වහන්සේ මේ අවස්ථා කිසි විටෙකත් මඟ නොහරිති. අවශ්‍ය තැනට වැඩම කොට පිරිත් සජ්ජායනය කොට සෙත් පැතීමට කාරුණික වෙති.

මේ හැරෙන්නට ගමේ රෝග උපද්‍රව ආදිය ඇති වුවහොත් ආරාධනා ඇති ව මෙන් ම ස්ව කැමැත්තෙන් ම ද බෝධි පූජා ආදිය පවත්වා දෙවියන්ට

පින් දී උපද්‍රව මහ හරවා ගැනීමට පෙරමුණ ගන්නේ ද ගමේ පන්සලේ හාමුදුරුවෝය. උපදෙස් පතන්නන් සඳහා කවර විටක දී වුවත් දැන මුතුකම්, උපදෙස් ධර්ම අවවාද ආදිය දීමට උන්වහන්සේ කිසිවිටෙකත් මැලිකම් නොදක්වන සේක. සිංහල අවුරුදු උත්සවය, වෙසක් උත්සවය, පොසොන් උත්සවය ආදි ජාතික හා ආගමික උත්සව පැවැත්වීමට තවමත් නායකත්වය ගෙන කටයුතු කරන්නේ ගම්බද භික්ෂූන් වහන්සේ ය.

ගමත් පන්සලත් අතර සම්බන්ධය පිරිහී යාමට එක් හේතුවක් වූයේ සාමාන්‍ය අධ්‍යාපනය පන්සලෙන් ගිලිහී යාම බව යට සඳහන් කරන ලදී. මේ අඩුපාඩුව තරමකට හෝ පිරිමසාලීමට වර්තමාන භික්ෂූන් වහන්සේ විසින් කරන වෑයමක් රිවිදින දහම් පාසල් අධ්‍යාපනයෙන් දක්නට ලැබේ. දැනට මෙබඳු දහම් පාසල් අටදාහක් පමණ දිවයිනෙහි ඇත. දැහැමි සමාජයක් බිහි කිරීම සඳහා ගමේ පන්සලේ හාමුදුරුවන්ගෙ නායකත්වයෙන් කෙරෙන මේ ස්වේච්ඡා සේවය බුද්ධිමත් ජනතාවගේ පැසසුමට ලක්වී ඇත. පාසල් යන සියලුම බෞද්ධ ළමයින් දහම් පාසැලට යන බව නොපෙනේ. තම දරුවන් අනිවාර්යයෙන් දහම් පාසලකට යැවීම බෞද්ධ දෙමව්පියන්ගේ යුතුකමකි. කුඩා කාලයේ සිට ම ළමයින්ට පන්සල ඇසුරු කිරීමට ඉඩ සලස්වන්නේ නම් ගමත් පන්සලත් අතර සම්බන්ධය සෑහෙන තරමකට ගොඩ නැගිය හැකි බව පෙනේ.

වර්තමාන ජීවිත ගැටළු විසඳා ගැනීමට පන්සලෙන් සහායත්, උපදේශයත්, ලැබේනම් එය ද ගමත් පන්සලත් අතර සම්බන්ධය ගොඩ නැගීමට හේතු වනවා ඇත.

ජනගහනය වැඩිවීමත්, සමාජාර්ථික රටා වෙනස් වීමත් නිසා අද සමාජයේ දක්නට ලැබෙන්නේ තරඟකාරී ජීවිතයකි. අධ්‍යාපනයත් තරඟයකි. රැකියාවත් තරඟයකි. අනෙක් කවර කටයුත්තක දී වුවත් තරඟකර ජය ලබාගත යුතු ය. තරඟයක දී ජය ලැබෙන්නේ සුළු පිරිසකට ය. වැඩි දෙනෙක් අසරණ වෙති. විශේෂයෙන් තරුණතරුණියන්ට ආර්ථික දියුණුවකට මඟ පෙන්වන සංවිධාන හා ආයතන අද අවශ්‍ය වී තිබේ. මේ කාරණය තේරුම් ගත් සමහර භික්ෂූන් වහන්සේලා පන්සල් මුල් කරගෙන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කර ඇති බව දක්නට ලැබේ.

ජපන් පන්සලෙන් මේ සඳහා අපටත් උපදේශයක්, ආදර්ශයක් ලබාගත හැකි යයි සිතේ. ජපානයේ පන්සලෙන් ඉටු වනුයේ ආගමික මෙහෙය පමණක්

නොවේ. ගමේ ආරෝග්‍යශාලාවත්, ආනාථ දරු නිවාසයත්, අභය භූමියත්, මහලු නිවාසයත්, වැන්දඹුවන්ගේ ක්ෂේම භූමියත් පිහිටා ඇත්තේ පන්සලේ ය. භික්ෂු භික්ෂුණී දෙපිරිසම ධර්ම ප්‍රචාරයෙහි මෙන්ම වෛද්‍යවරුන් හා හෙදියන් සේ ද කටයුතු කරති. මෙයින් අප සිතා ගත යුත්තේ පන්සල සමාජ සේවා මධ්‍යස්ථානයක් බවය. අපේ රටේ ද පන්සලේ හාමුදුරුවන්ගේ නායකත්වය බව ය. අපේ රටේ ද පන්සලේ හාමුදුරුවන්ගේ නායකත්වය හා උපදේශය යටතේ පරෝපකාර සමිති, ඉතිරි කිරීමේ සමිති, ග්‍රාම සංවර්ධන සමිති, කුලහන සමිති, ආදිය පන්සලේ පවත්වන බව දක්නට ලැබේ. ආරවුල් සඳහා සමථ මණ්ඩල ආදියට භික්ෂූන් වහන්සේ සහභාගි වෙති. ගමත් පන්සලත් අතර සම්බන්ධය ගොඩ නැඟීමට එය සුභ ලකුණක් වන බව කිව යුතුය.

පන්සලෙන් සමාජ සේවා මැනවින් ඉටුවීමට දායක පක්ෂය විසින් සිව්පසය ආදි භික්ෂූන් වහන්සේගේ අවශ්‍යතා ද ඉටු කළ යුතු ය. බුදුසසුන රැක ගැනීමට නම් සංඝරත්නය රැක ගත යුතු ය.

එබැවින් ගමත් පන්සලත් අතර මනා සම්බන්ධය ගොඩ නහා ගැනීමට ගිහි බෞද්ධයන් වශයෙන් අපේ යුතුකම් ද මැනවින් ඉටු කිරීමට සිතා ගනිමු.

අභ්‍යාස:

වර්තමානයේ පන්සලෙන්/හාමුදුරුවන්ගෙන් ගමට සිදුවන සේවාවන් ලැයිස්තුගත කරන්න.

37 පාඩම

# නිවසක පින්කම් හා බැඳුණු වත් පිළිවෙත්

බෞද්ධයෝ ස්වකීය නිවෙස්වල ද පින්කම් පවත්වති. විශේෂයෙන් පින්කම් කිරීම ආශිර්වාදයක් ලෙස සලකනු ලැබේ. දන් පිරිනැමීම, ධර්මදේශනා කරවීම හා පිරිත් දේශනා පවත්වා ගැනීම, නිවසට භික්ෂූන් වහන්සේලා වැඩම්මාගෙන කරනු ලබන ප්‍රධාන පින්කම් තුනකි. මේ එක එකක් හා බැඳුණු බෞද්ධ වත් පිළිවෙත් ඇත.

## නිවසක දානමය පින්කමක්

විවිධ අරමුණු මුල් කරගෙන ස්වකීය නිවසේ දී සාංඝික දානයක් පිරිනැමීමට බෞද්ධයෝ පුරුදුව සිටිති. විශේෂයෙන් මියගිය අයට පිං පැමිණවීම සඳහා සත් දිනක දී, තෙමසකදී හා වාර්ෂිකව දානමය පින්කම් පැවැත්වීම සිරිතකි. ඒ හැරුණුවිට විවාහ මංගල උත්සව, ගෙවැදීමේ උත්සව, උපන්දින උත්සව ආදී විවිධ උත්සව කටයුතුවල අංගයක් වශයෙනුත් අළුතෙන් ආරම්භ කෙරෙන ව්‍යාපාර කටයුතුවලට ත්‍රිවිධ රත්නයේ ආශිර්වාද ලබාගැනීම සඳහාත් දානමය පින්කම් පවත්වනු ලැබේ. මේ කවර අවස්ථාවක දී වුවත් සාංඝික දානයක් දීම සඳහා අනුගමනය කරන පිළිවෙළ එක් බඳුය.

පළමුවෙන් ගෙහිමියා දැහැත් වට්ටියක් පිළිගන්වා ගමේ පන්සලේ හාමුදුරුවන්ට කල් ඇතිව දානයට ආරාධනා කරයි. දානයට වැඩම කරවා ගැනීමට බලාපොරොත්තුවන භික්ෂූන් වහන්සේගේ සඛ්‍යාව ද දැනුම් දෙයි. ආරාධනාව පිළිගන්නා ස්වාමීන් වහන්සේ අවශ්‍ය භික්ෂූන් වහන්සේලා ගණන සම්පූර්ණ වීම සඳහා තමන් වහන්සේ විසින් ම අවට පන්සල්වල භික්ෂූන් වහන්සේලාට ආරාධනා කරනු ලැබේ.

ඉක්බිති නිවස පවිත්‍රකොට අවශ්‍ය උපකරණ හා දානවස්තු සපයා ගැනීම සිදුවේ. නෑදෑ හිතවතුනට ද පැමිණෙන ලෙස ආරාධනා කරන්නේ පින්කමට ඔවුන් සහභාගී කරවා ගැනීමට ය.

පින්කම පවත්වනු ලබන දිනයේ දී තෙරුවන් කෙරෙහි කරන ගෞරවයක් වශයෙන් නිවසට සැරසිල්ලක් කිරීම ද සාමාන්‍ය සිරිතකි. අඩුතරමේ නිවස ඉදිරිපිට ගොක් කොළ ආරුක්කුවකින් හෝ බෞද්ධ කොඩියකින් සරසනු

ලැබේ. දාන ශාලාව ලෙස සකස් කරනු ලබන ස්ථානයෙහි වියන් බැඳ බිම කලාල හෝ පැදුරු එලනු ලැබේ. ඉක්බිති සුදු ඇතිරිලි එලා ආසන පනවන්නේ වැඩමකරවනු ලබන භික්ෂූන් වහන්සේගේ ගණනට සරිලන සේ ය.

දානය පිළියෙල කරනු ලබන්නේ ද මහත් සැලකිල්ලෙනි. ව්‍යඤ්ජන ආදිය පිළියෙල කරනු ලබන්නේ ඉඳුල් නොකර ය. ගම්බද සමහර සැදැහැවතුන් දානය හා ව්‍යඤ්ජන පිසීම සඳහා ගිනි දැල්වීමට යොදාගනු ලබන්නේ කුරුඳු වැනි සුවඳ දර ය. පින්කම ආරම්භ කිරීමට ප්‍රථම දානය ව්‍යඤ්ජන, අවුලුපත්, පිරිකර ආදී දානවස්තු දාන ශාලාවේ ඇතිරිලි මත තැන්පත් කර, තවත් සුදු ඇතිරිල්ලකින් වසනු ලැබේ.

ගමේ පන්සලේ සිට ධාතුකරඬුව සහිත සංඝරත්නය නිවසට වැඩම කරවනු ලබන්නේ හේවිසි සහිත පෙරහැරකිනි. වැඩිහිටියෙකුගේ හිසින් ගෞරව සහිතව උඩුවියන් යට දා කරඬුව වැඩමවනු ලැබේ.

නිවසට ඇතුල්වීමට පෙර එක් සැදැහැවතෙක් භික්ෂූන් වහන්සේගේ පා ධෝවනය කරයි. තවත් කෙනෙක් සළුවකින් පා පිසියි. පියවිලි පිටින් වඩිනා භික්ෂූන් වහන්සේ සඟමහලු පිළිවෙලින් පනවන ලද අසුන්වල වැඩ හිඳිති. ඊට පෙරදා කරඬුව විශේෂයෙන් සකස් කරන ලද මණ්ඩපයක ගෞරවයෙන් වඩා හිඳුවනු ලැබේ.

ඉක්බිති එක් භික්ෂූන් වහන්සේ නමක් රැස්ව සිටින පිරිස පන්සිල් හි පිහිටුවා බුද්ධ පූජාව පවත්වයි. අනතුරුව දානමය පින්කමේ අරමුණු සහ අනුසස් පැහැදිලි කිරීම්වස් පවත්වනු ලබන කෙටි අනුශාසනාවකි. අදාළ වාක්‍යය කියා චාරිත්‍රානුකූලව දානය සඟසතු කොට පූජා කරන්නේ ඉනික්බිතිව ය. සාංඝික වාක්‍යය කියවීම දායකයන් විසින් කළ යුත්තක් වුවද භික්ෂූන් වහන්සේ විසින් කියවනු ලබන්නේ එම දායකයන්ගේ පහසුව පිණිසය.

අනතුරුව භික්ෂූන් වහන්සේට දන් පැන් පිළිගන්වනු ලැබේ. දන් වළඳා අවසන් වූ විට පිරිකර පූජා කරනු ලැබේ. ඉන්පසු සිදුවන්නේ භුත්තානුමෝදනා ධර්ම දේශනාවයි.

දෙවියන්ටත් මියගිය නෑයින්ටත් සහභාගි වූ හැමටත් පින් අනුමෝදන් කරවීමෙන් පසු පින්කම අවසන් වෙයි.

දා කරඬුව සහිත සංඝරත්නය නැවත පන්සලට වැඩමවනු ලැබේ. පැමිණ සිටි නෑදෑ හිතවතුන්ට ආහාරපානයෙන් සංග්‍රහ කිරීම ඉන්පසු සිදුවේ.

සම්පූර්ණ පින්කම් කාලය තුළ හැකිතාක් නිශ්ශබ්දව හා සංවරව කටයුතු කිරීම බෞද්ධ සම්ප්‍රදායයි.

## ධර්ම දේශනාමය පින්කමක්

විවිධ හේතූන් අරමුණු කර භික්ෂූන් වහන්සේ නමක් නිවසට වැඩමවාගෙන ධර්ම දේශනයක් පවත්වා ගැනීම චාරිත්‍රානුකූල බෞද්ධ පින්කමකි. පවුලේ සාමාජිකයෙකු අභාවප්‍රාප්ත වී සත් දිනක් පිරීම, තෙමසක් පිරීම නිමිත්තෙන් පින්කම් කොට මිය ගිය අයට පින් දීම බෞද්ධ සිරිතකි. සාමාන්‍යයෙන් මේ පින්කමක ස්වභාවය සන්ධ්‍යාවේ භික්ෂූන් වහන්සේ නමක් ලවා ධර්මදේශනයක් පවත්වා පසුදින සංඝගත දක්ෂිණාවක් පිරිනැමීම ය. මළවුන්ට පින්දීම සඳහා ධර්ම දේශනා පැවැත්වීම හැරුණවිට වෙනත් සුවිශේෂ හේතුවක් නිසා ද භික්ෂූන් වහ්නසේ නමක් නිවසට වැඩමවා ධර්මදේශනා පවත්වා ගනු ලැබේ.

මේ කවර අවස්ථාවක දී වුවත් පින්කමක් වශයෙන් ධර්ම දේශනය පවත්වනු ලබන්නේ නම් ඥාති මිත්‍රාදීන්ට ද ධර්ම ශ්‍රවණය සඳහා ආරාධනය කරනු ලැබේ. මෙබඳු ධර්ම දේශනා පවත්වනු ලබන්නේ රාත්‍රී කාලයේ යි.

නිවසේ සුදුසු තැනක උඩුවියනක් බැඳ ඒ යට ධර්මාසනය පිළියෙළ කරනු ලැබේ. ධර්මාසනය තබනු ලබන්නේ එලන ලද කලාල හෝ බුමුතුරුණක් මත ය. ධර්මාසනයට සුදු ඇතිරිල්ලක් එලීම සිරිත ය. ධර්මාසනය ඉදිරියෙන් කුඩා මේසයක් තබා ගැනීමෙන් ධර්මදේශකයන් වහන්සේට දැහැත්, ගිලන්පස ආදිය පිළිගැන්වීම පහසු වේ. ගරුසරු සහිතව දේශකයන් වහන්සේ වඩා හිඳුවීමට කටයුතු සූදානම් කිරීම ධර්ම රත්නයටත් සංඝරත්නයටත් කරන ප්‍රණාමයකි.

පය ධෝවනය කර පියවිලි උඩින් දේශකයන් වහන්සේ ධර්මාසනයට වැඩමවනු ලැබේ. ඉක්බිති දැහැත්, ගිලන්පස පිළිගන්වනු ලැබේ.

ධර්ම ශ්‍රවණයට පැමිණි අය බිම පැදුරු මත පහසු ඉරියව්වකින් වාඩි වෙති. පිරිමි බද්ධ පර්යංකයෙනුත් කාන්තාවන් අර්ධ පර්යංකයෙනුත් වාඩිවීම වඩා උචිත ය. ධර්මාසනය දෙසට පා දිගු කිරීමත්, ධර්මාසනයට වඩා උස් වූ ආසනයක සිට ධර්මය ඇසීමත් ධර්මයට කරන අගෞරවයකි. ධර්ම දේශනයට හා ධර්ම ශ්‍රවණයට බාධාවන පරිද්දෙන් කථා කිරීමත්, නැගිට

පිරිස මැද ඒ මේ අත ගමන් කිරීමත් නුසුදුසු ය. ගෞරවයෙන් යුක්තව ධර්ම ශ්‍රවණය කළයුතු බව ලෝවැඩ සඟරාවේ කියන්නේ මෙසේ ය.

දිවමන් මුනිඳුනි දුටු මෙන් තොස වා
බණ දන්නන් හට වැඳ අත් ඔස වා
පදයෙන් පදයට අරින්ද අස වා
එ පිනෙන් නිරයට යන මං වස වා

ආරාධනයට අනුව කාලෝචිත ධර්ම දේශනයක් දේශකයාණන් වහන්සේ පවත්වති. දේශනාවසානයේ දී ධර්මයට කරන පූජාවක් වශයෙන් පිරිකරක් පිළිගැන්වීම ද චාරිත්‍රයකි.

## පරිත්‍රාණ ධර්ම දේශනයක්

නිවසක පරිත්‍රාණ ධර්ම දේශනයක් පවත්වා ගැනීම ඉතා උසස් පින්කමක් ලෙස සලකනු ලැබේ. අපල උපද්‍රව දුරුකර ගැනීමටත්, නිවසකට ගෙවැදීම සඳහාත් වෙනත් යම්කිසි අවශ්‍යතාවයක් සඳහා ත්‍රිවිධ රත්නයේ ආශිර්වාද ලබාගැනීමටත් පරිත්‍රාණ ධර්ම දේශනාව පවත්වනු ලැබේ.

සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව තරමක උත්සව ශ්‍රීයෙන් පවත්වනු ලබන්නකි. මේ සඳහා කල්තියා ගමේ පන්සලේ හාමුදුරුවන්ට දැහැත් වට්ටියක් පිළිගන්වා ආරාධනා කළ යුතු ය. සාමාන්‍යයෙන් සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවකට ස්වාමීන් වහන්සේලා දොළොස් නමක්වත් සහභාගී වීම අවශ්‍ය ය. . ආරාධනය භාරගත් ස්වාමීන් වහන්සේ ඒ සඳහා අනෙක් ස්වාමීන් වහන්සේලාට ආරාධනා කරති. උන්වහන්සේලාගේ ගමන් පහසුව සැලසීම දායක පක්ෂයේ යුතුකමකි.

පරිත්‍රාණ ධර්ම දේශනය පවත්වනු ලබන්නේ විශේෂයෙන් සකස් කරනු ලැබූ පිරිත් මණ්ඩපයක් තුළ ය. සාමාන්‍යයෙන් හරිහතරැස් හෝ අටපට්ටම් හැඩයෙන් සක්ස කරනු ලබන පිරිත් මණ්ඩපය ගොක් සැරසිලිවලින් හෝ කඩදාසි කැටයමින් අලංකාර කරනු ලැබේ. අවම වශයෙන් මණ්ඩපය තුළ ආසන දොළහක්වත් පනවා සුදු ඇතිරිලි දමනු ලැබේ. මණ්ඩපයේ උඩුවියන් බැඳ, එම වියනේ ජාලාකාරව නූල් ඇද, ඒවායේ සන්ධිස්ථානවල බුලත් කිනිති, නාදලු හා පුවක් මල් ආදී මංගල සම්මත ශාක එල්වා සැරසීම ද සිරිත ය. පිරිත ආරම්භ කිරීමට ප්‍රථම අඹ, විලඳ, සමන් කැකුළු, සුණුසාල් හා ඊතණ යන ලද පස්මල් මණ්ඩපය තුළ විසුරුවනු ලැබේ. පිළිවෙලින්

ධාතු කරඬුව, හා පිරුවානා පොත් වහන්සේ පිරිත් හුය සහ භික්ෂූන් වහන්සේලා පිරිත් මණ්ඩපයට වැඩමවනු ලබන්නේ හේවිසි හොරණෑ සහිත පෙරහරිනි. ධාතු කරඬුව සහ පිරුවානා පොත් වහන්සේ තැන්පත් කිරීම සඳහා මණ්ඩපය තුළ විශේෂ ආසනයක් පිළියෙල කරනු ලැබේ. පිරිත් මණ්ඩපය ත්‍රිවිධ රත්නයම වැඩ සිටිනා ස්ථානයකි.

ගෙහිමියා දැහැත් වට්ටියක් පිළිගන්වා සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව පවත්වන ලෙස භික්ෂූන් වහන්සේට ආරාධනා කරති. ඉක්බිති මහා සංඝයා වහන්සේ රැස්ව සිටින පිරිස පන්සිල්හි පිහිටුවා, බුද්ධ පූජා පවත්වා පිරිත් දේශනයේ අරමුණු හා අනුසස් වදාරා පරිත්‍රාණ ධර්මදේශනාව ආරම්භ කරති. මේ සමහම පිරිත් මණ්ඩපයේ වටා පිහිටි පුන්කලස්වල හා මල්පැලෙහි පහන් දල්වනු ලැබේ. පහන් දැල්වීමට ගිතෙල් ගනු ලබතත් සත්ව තෙල් යොදාගනු නොලැබේ. සඳුන් කූරු, කපුරු ආදී සුවඳ දැල්වීම ද සිරිතය. පෙරාගත් පිරිසිදු පැන් ඇතුළත් නැවුම් කළය ද කපු නූල් ද පිරිතේ බලය රැස්වීමට හෙවත් ජේවීම සඳහා මණ්ඩපයේ තබා ඇත. හේවිසි කණ්ඩායම අවශ්‍ය අවස්ථාවල දී ශබ්ද පූජා පවත්වති.

මහ පිරිත් දේශනයට ආරාධිත සියලු ම භික්ෂූන් වහන්සේ ද ඉන්පසු පැවැත්වෙන යුග දේශනාව සඳහා දෙනම බැගින් ද හමාර දේශනය නම් වූ ආටානාටිය සූත්‍ර දේශනාව සඳහා සිව්නමක් ද සහභාගී වෙති. අලුයම පිරිත අවසාන කරන්නේ යටත් පිරිසෙයින් භික්ෂූන් වහන්සේලා හයනමක්වත් සහභාගී වීමෙනි.

පිරිත් පින්කම අවසන් වන්නේ සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමෙනි. සැදැහැවත්හු ත්‍රිවිධ රත්නයේ ආශිර්වාද ලබා ගැනීම සඳහා පිරිත් පැන් පානය කොට පිරිත් නූල් ද දකුණතෙහි බැඳගනිති. මේ සාමාන්‍යයෙන් සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයක් පවත්වනු ලබන පිළිවෙල ය.

පැවරුම:

ඔබේ නිවසේ හෝ නැදෑ හිතවතුන්ගේ නිවසේ සිදුකළ පින්කමක් පිළිබඳ රචනයක් ලියන්න. පින්කම හා සම්බන්ධවත් පිළිවෙත් ඇතුළත් කිරීම ඉතා ම වැදගත් ය.

38 පාඩම

# දවස ගෙවුනු හැටි
# (බෞද්ධ තිවසක දිනචර්යාව)

බිත්ති ඔර්ලෝසුවේ අලුයම 5 වැදිණ. ඒ අප පාසලේ නොයන සෙනසුරාදා දිනයකි. එහෙත් පුරුදු පරිදි වෙනදා වෙලාවට ම මම අවදිවීමි. මුව දොවා පන්සිල් සමාදන් වී මෙත් වැඩීමි. එය මට පුරුදු වූයේ ආත්තම්මාගෙනි.

"සුබා අක්කේ, අද පාසල් යන්නේ නැහැ නේද ? ඇයි ඉතින් මේ තරම් පාන්දරින් ම නැගිටින්නේ "? ඒ ඇසුවේ පොඩි නංගීයි. "පාසල් ගියත් නැතත් උදේ පාන්දරින් ම අවදි වන එක හොඳයි නංගියේ. ඒක හොඳ පුරුද්දක් . නංගිට ඇහෙනව ද එළියේ පුංචි කුරුල්ලෝ සින්දු කියනවා. උන් ඔක්කොම පාන්දරින් ම අවදිවෙලා" මම පිළිතුරු දුනිමි. "ඔව්, අක්කේ, ඇහෙනවා, හරි ලස්සනයි නේද ? පුංචි කුරුල්ලන්ටත් පාන්දරින් අවදි වන්නට පුළුවන්නම් ඇයි අපට බැරි. මමත් හැමදාම උදෙන් අවදිවෙනවා" එසේ කිව්වේ නංගී ය.

මගේ නම සුභාෂිණී, පාසලේ ඉගෙන ගන්නේ නව වන වසරේ. මල්ලිගේ නම ධම්මික. ඉගෙන ගන්නේ හය වන වසරේ. නංගි මේධාවී ඉගෙන ගන්නේ තුන් වන වසරේ.

මම කුස්සියට ගොස් ලිප ගිනි මොළවා කේතලය ලිප තැබීමි. තේ පෝච්චිය සෝදා තේ වත් කළෙමි. මැතක සිට හැමදාම උදෑසන මා විසින් තේ පිළියල කිරීම අම්මාට ලොකු උදව්වකි.

මම පළමුවෙන් තේ කෝප්පයක් හා වතුර ගෙන ආත්තම්මාගේ කාමරයට ගියෙමි. ආත්තම්මා ද අවදි වී පන්සිල් ගෙන අවසන් වූවා පමණි. මගේ දුවට තුරුණුවන්ගේ සරණයි. කියමින් තේ කෝප්පය පිළිගත්තා ය. ඉක්බිති මම තාත්තාටත් අම්මාටත් තේ පිළිගැන්වීමි.

උදේ අවදි වූ වහා ම පිරිසිදු වතුර වීදුරුවක් බීම මල්ලිගේ සිරිතයි. මල්ලිගේ කාමරයේ ආලෝකය ද මට පෙනේ. "මල්ලී, තේ බොන්න එන්න." මම මල්ලීට කථා කළෙමි. සෙනසුරාදා තාත්තා රැකියාවට නොයන බැවින් වෙනදා මෙන් කලබලයක් අම්මාට මෙදින නැත . වෙනදා නම් මේ වනවිටත් අම්මා තාත්තාට ගෙනයාම සඳහා දිවා ආහාර පිළියෙළ කරමින් සිටින්නී ය. අද ඒ අවශ්‍යතාව නැත. එසේ වුවත් උදේ ආහාරය සඳහා කිරිබතක් පිළියෙල කිරිමට අම්මා කුස්සියට ආවා ය. මම පොල් ගා දී උදව් කෙළෙමි.

දැන් හොඳට ම එළිය වැටී ඇත. සෙනසුරාදාවල මිදුල අමදින්නේ මල්ලීත් මාත් ය. අපි ගෙයි ඉදිරිපස හා පසුපස මිදුල් අතු ගාවෙමු. ඉදලෙන් මිදුලේ ඇඳී ඇති රටාව දුටු තාත්තා පුතාලා ලස්සනට මිදුල ඇමදලා යයි ප්‍රකාශ කළේ ය.

සේපාලිකා ගස්වල මල් විසිරී ඇත. උදෑසන හිරු රැසින් මල් අතර පිනිකැට මිණිකැට ලෙසින් දිලෙයි. නංගී වට්ටියක් ගෙන සේපාලිකා මල් ඇහින්දා ය. ඒ ආලින්දය කෙළවරේ කාමරයේ වැඩ සිටිනා කුඩා බුදු පිළිම වහන්සේට පූජා කිරීම සඳහා ය. සතියේ දිනවල උදේට සේපාලිකා මල් අහුලන්නට අපට වෙලාවක් නැත. ඒ පමා නොවී පාසල් යාම සඳහා සූදානම් වීමට ඇති බැවිනි. එහෙත් සෑම ඉරිදා දිනකම දහම් පාසලට ගෙනයාම සඳහා අපි තිදෙනා එකතු වී ලස්සන මල්වට්ටියක් සකස් කර ගන්නෙමු.

නංගීත් මල්ලීත් මමත් ළිඳට ගොස් දත් මැද මුහුණ සෝදා ගත්තෙමු. ඉක්බිතිව සේපාලිකා මල් වට්ටිය ගෙදර හැමදෙනාටම අත ගස්වා බුදු පිළිම වහන්සේ වෙත පූජා කළේ නංගී ය.

මේ වන විට උදෑසන ආහාරය සකස් වී තිබිණ. අපි සියලු දෙනා ම එකතුව කිරිබත් කා තේ බීවෙමු. අද තාත්තා ඈත ගමනක් යන්නට සූදානම් ය. තාත්තා ගෙදර එන්නේ හෙට හවස ය. "මම ගිහින් එන්නම්." තාත්තා අම්මාට කීය. "හොඳයි, ගිහින් එන්න. තුණුරුවන්ගේ සරණයි." අම්මා සුබ පැතුවා ය. මල්ලීත්, නංගීත් මමත් තාත්තාට දණ ගසා වැන්දෙමු. වෙනදා පාසල් යාමට ප්‍රථම අම්මාටත්, තාත්තාටත්, ආත්තම්මාටත් දණ ගසා වඳින අපට මෙය අමුත්තක් නොවේ.

අද සෙනසුරාදාවක් බැවින් අපට වැඩ කටයුතු බොහෝ ය. මම නංගිගේ ඇඳුම් ද මගේ ඇඳුම් ද සෝදා අව්වේ වැනුවෙමි. මල්ලීගේ ඇඳුම් සෝදා අව්වේ වනන ලද්දේ මල්ලී විසින් ම ය. ඉක්බිති අපි ටික වේලාවක් එළිමහනේ වැඩ කෙළෙමු. මම මගේ ගොටුකොළ පාත්තියෙන් ගොටුකොළ කඩා දවල් ව්‍යඤ්ජනයකට ගැනීමට අම්මාට දුනිමි. ගොටුකොළ පාත්තියේ පස් බුරුල් කොට පොහොර යොදා වතුර ද දැමීමි. මල්ලී මිදුලේ මල් පාත්තියට සාත්තු කළේ ය. ඒ අතරම මිදුලේ තැනින් තැන වූ වල් පැලැටි උදුරා දැම්මේ ය. නංගීගේ සියම් කුඩලුවල දැන් පාට පාට මල් පිපී ඇත. නංගීට මහත් සතුටකි. ඈ මල් පැලවලට සාත්තු කරන්නේ අම්මා කෙනෙකු පොඩි දරුවකු බලා ගන්නා පරිද්දෙනි.

අම්මා කුස්සියේ දවල් ආහාරය සූදානම් කරමින් සිටියා ය. මම ඇයට උදවු වුනෙමි. මල්ලී ලිප ළඟට දර ගෙනවිත් දීමෙන් හා ලූනු ශුද්ධකර දීමෙන් අම්මාට උදව් විය.

"අම්මේ, අම්මේ, අඹගහමුල කුරුළු ලෑල්ල ළඟ දෙමළිත්තන් හා මයිනන් ඇවිත් ඉන්නවා." කුස්සියට දුවගෙන ආ නංගී කීවා ය. කුරුළු ලෑල්ල වෙත බත් සහ වතුර ගෙන ගොස් තැබුවේ මල්ලී ය. "දෙමළිත්තන් හත්දෙනයි." කියමින් උන් බත් අහුලන හැටි නංගී ටිකක් ඈතට වී බලා සිටියාය. "අයියේ, අන්න ලේනෙක් එනවා." හදිසියේම නංගී කෑ ගැසුවාය. නංගී සද්ද කරන්න එපා. ලේන්නු දෙන්නයි. කියමින් මල්ලී ද ටිකක් ඈතට විය. දෙමළිත්තෝ මඳකට ඉවත් වූහ. ලේනුන් බත් කන හැටි නංගීත් මල්ලීත් සතුටින් බලා සිටියහ.

අත්තම්මා නාන්නේ පෙරවරුවේ ය. මම ඇයට නාන බාල්දියට වතුර සූදානම් කර දුනිමි. ඇය පුංචි බංකුවක වාඩි වී ලොකු කෝප්පයකින් නාන හැටි නංගී බලා සිටියේ ලොකු සතුටකිනි. ආත්තම්මා නා අවසන් වූවාට පසු ආත්තම්මාගේ දිය රෙද්දත් තුවායත් මම අව්වේ වැනුවෙමි. ඉක්බිති නංගීත් මල්ලීත් පිළිවෙළින් නැවෝය. අම්මාත් මාත් නැවේ සියල්ලන්ට ම පසුව ය.

පන්සලේ සණ්ඨානාදය ඇසුණි. ඒ බුද්ධ පූජාව පැවැත්වූ වේලාවයි. දවල් දොළහ පසුවන්නට පෙර කෑම ගැනීම ආත්තම්මාගේ සිරිතයි. ආත්තම්මාගේ කෑම පිඟාන පිළියෙල කරදුන්නේ අම්මා ය. මම ආත්තම්මාට කෑමත් වතුරත් ගෙන ගොස් දුනිමි. ඇය කෑම පිඟාන අතට ගත්තේ පින් දීමෙනි. එය ආත්තම්මාගේ සිරිත ය. ඇය කෑම කා අවසන් වනතුරු මමත් නංගීත් එතැන රැඳුණේ ආත්තම්මාට වුවමනා දෙයක් සැපයීමට ය.

"පුතේ, අද බූලා නැව්වොත් හොඳයි නේ ද?" අම්මා ඒ යෝජනාව කෙළේ මල්ලීටය. මල්ලී නාන බාල්දියට වතුර පුරවා කෝප්පයෙන් බූලා නැවීය. මල්ලී විසින් නාවා අවසන් කරනු ලැබූ බූලා මිදුල වටා රවුම් හත අටක් ම වේගයෙන් දිව්වේ තමන් නැවීම ගැන සතුට ප්‍රකාශ කරන්නාක් මෙනි.

අපි දවල් කෑමට සූදානම් වූවා පමණි. එවිට ම බූලා බුරන්නට විය. පන් කොළ මල්ලක් අතින් ගත් මවක් ඇගේ දරු දෙදෙනාත් සමඟ මිදුලේ හිටගෙන හිටියාය. පිරිමි ළමයා මල්ලී තරම් වන අතර ගැහැණු ළමයා නම් නංගීට ටිකක් කුඩා ය. ඔවුන් ඇඳ සිටියේ කිලිටි වැරහැලි ය. මල්ලී ඔවුන් දෙස බලා සිටියේ ය. "අනේ පුංචි මහත්තයෝ, මේ දරුවන්ට කෑමට මොකුත් ලැබුණොත්

පින් සිද්ධ වෙනවා.'' ඒ කීවේ ආගන්තුක කාන්තාව ය. මල්ලී අපේ අම්මා දෙස බැලුවේය. ''අම්මේ, අපි ඒ ගොල්ලන්ට බත් දෙමු.'' නංගී යෝජනා කළාය. ''හොඳයි පුතේ ''කියමින් අම්මා එකඟත්වය පළකළා ය. මල්ලීත් මමත් කුස්සියට ගොස් ඒ තිදෙනාට බත් පාර්සලයක් සකස් කෙළෙමු.

මල්ලී බත් පාර්සලය දිගු කළේ පිරිමි ළමයා වෙතය. ඔහු හිස නමා දෑතින් පාර්සලය ගත්තේ ය. ''අනේ ලොකු මැණිකේ, මේ දරුවන්ට පරණ ඇඳුම් යමක් ලැබෙනවා නම් හොඳයි '' ඒ කාන්තාව අම්මා දෙසට හැරී බැගෑපත් ලෙස කීවාය.

මල්ලී ගෙට දුවගොස් ප්‍රමාණයෙන් තමාට මඳක් කුඩා වූ කමිසයක් හා කලිසමක් ගෙනාවේ ය. ''අම්මේ අර මට අඳින්නට බැරි මල්ගවුම මේ බබාට දෙමු ''යි නංගී කියා සිටියා ය. අම්මා ඊට එකඟත්වය පළ කළා ය. අම්මාගේ පරණ සාරියකුත් සමඟ, ඒ සියල්ල ඔවුනට දුනිමු. ''මැණිකෙලාට සතර මහා නිධානේ පහළවෙන්නට ඕනෑ''කියමින් ඒ කාන්තාව සියල්ල තමා ළඟ තිබූ පංකොළ මල්ලට දමා ගත්තා ය. ඒ පිරිමි ළමයාත්, ගැහැණු ළමයාත් ආපසු යන ගමනේ කීපවිටක් ම අප දෙස හැරී බැලූහ.

දිවා ආහාරයෙන් පසු අපි ටික වේලාවක් විවේකයෙන් ගත කෙළෙමු. අම්මාත් මමත් දිවයින පත්‍රය බැලුවෙමු. නංගීත් මල්ලීත් සතර පත්‍රය බෙදාගෙන බැලූහ.

මද්දහනේ ඉර අව්ව තද ය. අපි කොට්ට මෙට්ට ඇඳ ඇතිරිලි ආදිය අව්වේ දැමුවෙමු. ඉක්බිති මම ඉගෙනීමේ කටයුතුවල නිරත වූයෙමි. ගෙදර දී කළ යුතු ගණිත අභ්‍යාසය සම්පූර්ණ කිරීමට උත්සාහ ගතිමි. මල්ලී සහ නංගී පොත් පාඩම් කිරීමේ නිරත වූහ.

සෙනසුරාදා ඉරිදා දිනවල හැන්දෑවේ ටික වේලාවක් සෙල්ලම් කිරීම ද අපේ සිරිත ය. අප සමග සෙල්ලම් කිරීමට පහළ ගෙදර මේනුකාත්, රසිකත් බොහෝ දිනවල පැමිණෙති. අද ද ඒ අය පැමිණියහ. අපි ටික වේලාවක් මිදුලේ සෙල්ලම් කෙළෙමු.

හැන්දෑවේ තේ පානය සඳහා අම්මා කථා කළා ය. සතියේ දිනවල තාත්තා වැඩ ඇරී එන්නේ මේ වේලාවට ය. නංගී තාත්තා පිළිගන්නේ පෙරමඟට දුවගොස් ය. බොහෝ දිනවල තාත්තාට මූණ සෝදා ගැනීමට අවශ්‍ය සබන්, තුවාය ආදිය ළිඳ ළඟට ගෙන ගොස් දෙන්නේ මල්ලී ය. තාත්තාට තේ එක ලැබෙන්නේ අම්මා අතින් හෝ මා අතින් ය. අද තාත්තා නැත. මේනුකාත් රසිකත් අප සමඟ තේ පානය කළහ.

අඳුර වැටීගෙන එද්දී අම්මා රාත්‍රී ආහාර පිළියෙල කිරීමට පටන් ගත්තා ය. මම ඇයට කුස්සියේ වැඩට උදව් වීමි. මල්ලීත් නංගීත් සන්ධ්‍යාවේ බුද්ධ වන්දනාවට අවශ්‍ය මල් රැස් කළහ. ආත්තම්මා පහන් වැටි අඹරා දුන්නා ය. රාත්‍රී ආහාර පිළියෙල වී අවසානය. අපි සියලු දෙනාම මුහුණකට සෝදා බුද්ධ වන්දනාවට සූදානම් වුණෙමු. බුදුපිළිම වහන්සේ වැඩ සිටින කාමරයේ පැදුරු එළා අත්තම්මාත් අම්මාත් මමත් වාඩි වුනෙමු. මල්ලී පහන් දල්වා සුවඳ දුම් පූජා කෙළේ ය. මල්වට්ටිය හැමට අත ගස්සා පූජා කළේ නංගී ය. අද තාත්තා නොමැති බැවින් අත්තම්මා අනුකරණය කරමින් අපි පන්සිල් ගෙන බුද්ධ වන්දනාවේ යෙදුණෙමු. බුද්ධ වන්දනාව අවසන් වූයේ කරණීය මෙත්ත සූත්‍රය කියා දෙවියන්ට පින් දීමෙනි.

රාත්‍රී ආහාරයෙන් පසු ටික වේලාවක් සතුටු සාමීචියේ යෙදීම ද අපේ සිරිත ය. අපේ පාසල් වැඩ ආදිය ගැන තාත්තා විමසා බලන්නේත් මේ වේලාවේ ය.

හෙට ඉරිදා දහම් පාසල් යන දිනයයි. නංගීත් මල්ලීත් මමත් දහම් පාසල් පොත් ගෙන ටික වේලාවක් පාඩම් කෙළෙමු. දහම් පාසලට අඳින ඇඳුම් ආදිය සකසා තැබුවෙමු.

දත් මැද මුව දොවා, දෙපා සෝදා ගත්තෙමු. අත්තම්මාට වැන්ද අපි දසමාසේ උරේ කත්වා ආදී ගාථාව කියා මවට වැන්දෙමු. එදින තාත්තා නිවසේ නොසිටි බැවින් තාත්තා වෙනුවෙන් ද වුද්ධිකාරෝ ආලිංගිත්වා යන ගාථාව කියා නැවතත් අම්මාට වැඳ අවසර ගෙන නින්දට ගියෙමු.

පැවරුම :

වැඳීම් ලැබිය යුතු අය අභිමුඛයේ නොමැති විට ඊට සරිලන වෙනත් කෙනෙකුට ඒ වෙනුවෙන් වැඳීමේ සිරිත පැහැදිලි කිරීමට බෞද්ධ සාහිත්‍යයෙන් කරුණු විමසා බලන්න.

39 පාඩම

# වන්දනා ගමන් හා එහි අරමුණු

වන්දනා ගමන් යාම, බෞද්ධයන්ගේ චිරාගත මෙන් ම ජනප්‍රිය පින්කමකි. බුදුරජාණන් වහන්සේ විසින් ම වන්දනා ගමන් අනු දැන වදාළ බව මහා පරිනිබ්බාන සූත්‍රයේ එන පහත සඳහන් පාඨයෙන් සිතා ගත හැකිය.

ආනන්දය, සැදැහැවතුන් කුලපුත්‍රයකු විසින් ප්‍රසාද සංවේගයෙන් යුතුව නැරඹිය යුතු ස්ථාන සතරකි. එනම් තථාගතයන් වහන්සේ බිහි වූ ස්ථානය, බුදු වූ ස්ථානය, දම්සක් පැවැත්වූ ස්ථානය හා පිරිනිවන් පෑ ස්ථානයයි. භික්ෂු, භක්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස ම අනාගතයේ දී මේ ස්ථාන කරා එළඹෙන්නේ ය.

බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළේ තමන් වහන්සේ නිතර ඇසුරුකළ අනඳ හිමියන්ට ය.

මෙහි සඳහන් බුදුරජාණන් වහන්සේ ගේ ජීවිතයේ ඉතා වැදගත් සිද්ධි හා සම්බන්ධ භූගෝලීය ස්ථාන හතර නම් ලුම්බිණිය, බුද්ධගයාව, ඉසිපතනය හා කුසිනාරාවයි. සම්බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු 200ට පමණ පසු මෙකී ස්ථානවලට ධර්ම යාත්‍රාවෙහි යෙදුණු අශෝක රජ්ජුරුවෝ ප්‍රසාද සංවේගයෙන් යුතුව ඒ ස්ථාන වැඳ පුදාගෙන ඒ එක් එක් ස්ථානයෙහි ශිලා ස්තම්භ පිහිටුවූහ. එසේ කරන ලද්දේ මතු පරම්පරාවලට ඒ ස්ථාන පහසුවෙන් හඳුනාගැනීමට හැකිවීම සඳහා ය. වර්තමානයේ දඹදිව වන්දනාවේ යෙදෙන බෞද්ධ සැදැහැවත්තු අනිවාර්යයෙන් මේ ස්ථාන සතර වන්දනා කරති.

අශෝක යුගයෙන් පසු බුද්ධ ධර්මය දඹදිවින් පිටරටවලට ද පැතිර ගියේ ය. එයින් පසු බුදුරජාණන් වහන්සේගේ හෝ රහතන් වහන්සේගේ ධාතු නිදන් කොට චෛත්‍ය නිර්මාණය කිරීමත්, තථාගතයන් වහන්සේ සම්බෝධිය ලද ස්ථානයේ වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් ලබාගත් ශාඛා රෝපණය කිරීමත් බුදු දහම ගිය වෙනත් රටවලට ද පැතිර ගියේය. මේ නිසා බෞද්ධයන් විසින් ප්‍රසාද සංවේගයෙන් නැරඹිය හැකි, නරඹා වැඳුම් පිදුම් කළ හැකි පූජනීය ස්ථාන දඹදිව පමණක් නොව වෙනත් රටවල ද ඇති විය. ශ්‍රී ලංකාව ට ද බුදුදහම පැමිණ නොබෝ දිනකින් ම ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් අනුරාධපුර මහමෙව්නා උයනේ රෝපණය කරන

ලද අතර තථාගත ශාරීරික ධාතු නිදන්කොට චෛත්‍ය නිර්මාණය කිරීම ද සිදු විය.

ලක්දිව බෞද්ධ පූජනීය ස්ථානවල විශේෂත්වයක් ඇත. අපේ වංශකථා අනුව බුදුරජාණන් වහන්සේ තෙවරක් ම ලක්දිවට වැඩ මෙරට ශුද්ධ භූමියක් බවට පත් කළහ. උන්වහන්සේගේ පාදස්පර්ශය ලැබ පුණ්‍යභූමි බවට පත් වූ ස්ථාන සොළසක් ශ්‍රී ලංකාවේ වෙයි. "මහියංගනං නාගදීපං ......................" ආදි චෛත්‍ය වන්දනා ගාථාවෙන් අප සිහිපත් කරන්නේ ඒ ස්ථාන සොළසයි. මේවායින් කැලණිය, මහියංගනය වැනි ස්ථානවල බුද්ධ කාලයේ දී ම දාගැබ් ඉදිවුණු බව වංශකථා කියයි. කෙසේ නමුත් බුදු දහම ලක්දිවට පැමිණ වැඩිකල් යන්නට මත්තෙන් මේ ස්ථාන ප්‍රසාද සංවේගයෙන් යුතුව නැරඹිය යුතු බෞද්ධ සිද්ධස්ථාන බවට පත්විය. තවද ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් හටගත් බෝ අංකුර රෝපණය කිරීමෙන් දිවයිනේ බොහෝ තැන්වල බෞද්ධ සිද්ධස්ථාන තවතවත් ඇතිවිය. මෙසේ දැක බලා ප්‍රසාදයට පත්විය හැකි බෞද්ධ සිද්ධස්ථාන ගණන වැඩිවීමත් ලක්දිව බෞද්ධයන්ට වන්දනා ගමන් ජනප්‍රිය වීමට එක් හේතුවක් වන්නට ඇත.

අශෝක අධිරාජයාණන් අනුගමනය කළ පැරණි සිංහල බෞද්ධ රජවරුන් ද වන්දනා ගමන් සඳහා කැමැත්තක් දැක්වූ බව පෙනේ. උදාහරණයක් වශයෙන් පළමුවන විජයබාහු රජතුමා ඉදිරිපත් කළ හැකිය. එතුමා සිරිපා වන්දනාවේ යන්නන්ගේ පහසුව සඳහා ශ්‍රී පාද ගමන් මාර්ගය අළුත්වැඩියා කොට, මාර්ගයෙහි විවේකාගාර සකස්කොට වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ගිලීමලේ නැමැති ගමේ ආදායම ද වෙන්කළ බව කියනු ලැබේ.

පෙර මෙන්ම වර්තමානයේ දී ද, ලාංකික බෞද්ධයෝ මෙරට බෞද්ධ සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට පමණක් නොව දඹදිව, බුරුමය, සියම ආදී රටවල බෞද්ධ සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට ද යති. චීන, ජපන්, බුරුම, සියම් ආදී විදේශික බෞද්ධයෝ ද ලක්දිව බෞද්ධ සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට එති. මේ අන්දමින් බෞද්ධයන් වන්දනා ගමන්වලට මහත් ලැදිකමක් දක්වන්නේ කුමක් නිසාදැයි සොයා බැලීම ප්‍රයෝජනවත් ය.

මෙම පාඩමේ මුල දී සඳහන් කළ මහා පරිනිබ්බාණ සූත්‍රයෙන් උපුටාගත් පාඨය නැවත වරක් සිහිකිරීම මෙහි දී ප්‍රයෝජනවත් වෙයි. සැදැහැවත් කුල පුත්‍රයකු විසින් ප්‍රසාද සංවේගයෙන් යුතුව නැරඹිය යුතු ස්ථාන මොනවාද ? ඒ බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ ප්‍රධාන සිද්ධි හතර සිදුවූ ස්ථානයයි.

මේ ස්ථානවලින් නියෝජනය වන්නේ බුද්ධ චරිතයයි. ඒ අනුව වන්දනා ගමනකින් අපට සිහිපත් කරන්නේ බුද්ධ චරිතයයි. අද ජීවතුන් අතර නැති බුදුරජාණන් වහන්සේ සිහිකර ගැනීම උන්වහන්සේගේ ජීවිතය හා සම්බන්ධ ස්ථාන හෝ වස්තූන් දැක බලාගැනීමෙන් පහසුවෙන් කළ හැකිය. මෙයින් සිදුවන්නේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව වැඩි දියුණු වීමයි. එබැවින් වන්දනා ගමන්වල ප්‍රධාන ප්‍රයෝජනයක් ලෙස දැක්විය හැක්කේ ශ්‍රද්ධාව වැඩි දියුණු කර ගැනීමයි. ශ්‍රද්ධාව ඇති කර ගැනීම බෞද්ධ ශික්ෂණ මාර්ගයේ මුල්ම පියවරකි.

වන්දනා ගමනකින් තවත් ලැබෙන විපුල ප්‍රයෝජනයක් නම් නුදුටු දේවල් දැක බලාගෙන නොඇසූ දේවල් අසා දැනගෙන, අලුත් අත්දැකීම් ලබා ගැනීමට හැකිවීම ය. විශේෂයෙන් දැන උගත්කමක් නැති සැදැහැවතුන් ඉගෙන ගන්නේ ද වන්දනා ගමනකිනි. ගමන් පහසුකම් සුලභ නොවූ මෙයට ශතවර්ෂයකට පමණ ඉහත කාලයේ දී දිවයින තුළ සැතපුම් සීයක් හමාරක් පමණ ඈත වූ ස්ථානයකට වුවද වන්දනා ගමනක් ගොස් ඒමට සති ගණනක් ගත වෙයි. එකල වන්දනා ගමන් යන්නේ කණ්ඩායම් වශයෙනි. සමහර විට කණ්ඩායම් නායකයා තරමක දැන උගත් කෙනෙකු හෝ භික්ෂූන් වහන්සේ නමක් හෝ විය හැකි ය. කණ්ඩායම් නායකයා හෝ භික්ෂූන් වහන්සේ වන්දනාකරුවන්ට ඒ ඒ ස්ථානයේ දී අලුත් දැනුම ලබාදෙයි. එසේම පූජනීය ස්ථානයේ සිටින භික්ෂූන් වහන්සේගෙන් හෝ මාර්ගෝපදේශකයකුගෙන් ද තොරතුරු ලැබෙයි. වන්දනා කණ්ඩායමේ සාමාජිකයන් අතර අදහස් හුවමාරු වීමෙන් ද ඔවුනොවුන්ගේ දැනුම වැඩි දියුණු වෙයි.

භික්ෂූන් වහන්සේලාට ද තරමක ඒකාකාරී වූ ජීවිතයෙන් මිදී විවිධත්වයක් ලබා ගැනීමට වන්දනා ගමන් හේතු වෙයි. තවද බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ චාරිත්‍ර ධර්මයක යෙදී ශ්‍රද්ධාව වැඩි දියුණු කර ගැනීමට හේතුවෙයි. ඒ ඒ ප්‍රදේශවල අය සමඟ දැන ඇඳුනුම්කම් ඇති කර ගැනීමට හැකිවීම තවත් ප්‍රයෝජනයකි.

සති කීපයක දීර්ඝ වන්දනා ගමනක යෙදීමට ලැබීම ආධ්‍යාත්මික වශයනේ ගිහියකුට බොහෝ ඵල සහිත වූවකි. ගිහි ජීවිතය බොහෝ කම්කටොලු සහිත ය. ගැටළු සහිත ය. දරුවන්ට, දෙමවුපියන්ට, නෑදෑයන්ට, අසල්වැසියන්ට ඔහුගේ බැඳීම් වැඩි ය. තාවකාලිකව හෝ මේ ජීවිත බරෙන් බැඳීම්වලින් නිදහස් වීමට ඔහුට ඉඩ ලැබෙන්නේ වන්දනා ගමනක යෙදීමෙනි. වන්දනා ගමන තාවකාලික අභිනිෂ්ක්‍රමණයක් බඳු ය. වුවමනාකම් ගණන ඉතා ම

පහළ මට්ටමකට අඩුකර ගෙන මේ දින කීපය අල්පේච්ඡව ජීවත්වීමට ඔහුට ඉඩ ලැබෙනු ඇත. ගෙන යන්නා වූ ඉතා සැහැල්ලු වූ ගමන් මල්ලකින් ඔහුගේ අවශ්‍යතා යන්තමින් පිරිමැසෙනු ඇත. වන්දනා ගමන තරමක සංචාරක තවුස් ජීවිතයක් බඳුය.

මෙහි දී විශේෂයෙන් මතක් කළ යුතු දෙයක් වෙයි. වර්තමානයේ දී සමහරු වන්දනා ගමනක මුවාවෙන් විනෝද චාරිකාවල යෙදෙති. බොහෝ විට ඒවායේ මත්පැන් පානය කිරීම් වැනි විවිධ දුසිරිත් කෙරෙති. වන්දනා ගමනක දී නුසුදුසු ගීත ගායනයෙන් හෝ නුසුදුසු පටිගත කළ ගීත ගායනා ඉදිරිපත් කිරීමෙන් හෝ වැලකිය යුතු ය.

වන්දනා ගමනක් බොහෝ විට අභ්‍යන්තර ගුණධර්ම වර්ධනයට ද හේතු වෙයි. වන්දනා ගමනක දී වැරදි පැවතුම්වලින් මිදීමට බොහෝ අය උත්සාහ දරති. මේ කාලය තුළ දී බොහෝ විට පන්සිල් රැකේ. අනුන් ගැන සැලකිලිමත් වෙති. තම නඩයේ යන අයට හෝ උදව් කිරීමට පෙළඹෙති. මේ අනුව පරාර්ථකාමීත්වය, ගිලානෝපස්ථානය, අල්පේච්ඡතාව, වැනි මහඟු බෞද්ධ ගුණධර්ම පුහුණු වීමට වන්දනා ගමන ඉවහල් වන බව ද කිව යුතුය. නිවාඩු කාලයක සුවදායක පෙදෙසකට ගොස් විවේක ගැනීමට වඩා වන්දනා ගමනක් යාම ජීවිතය ප්‍රබෝධවත් කර ගැනීමට උපකාර වන බව පෙනේ.

පැවරුම:

වන්දනා ගමනක් ආධ්‍යාත්මික ගුණ වගාවට හේතුවන හැටි පෙන්වීමට කරුණු දක්වන්න.

## 40 පාඩම

# පොහෝ දින වත් පිළිවෙත්

නිතර පන්සිල් රැකීමෙන් පොහෝ දිනයේ දී පෙහෙවස් සමාදන් වී අටසිල් රැකීමෙන් පෙර සිට පැවත එන සිරිතකි. රැකීරක්ෂා කටයුතුවලින් නිවාඩු ගෙන පිළිවෙත් පිරීම සඳහා බෞද්ධයා විශේෂයෙන් වෙන් කර ගත් දිනය පුර පසළොස්වක පොහෝ දින යි.

මසකට සතර පොහොයක් ඇත. අපේ පැරැන්නන්ට නම් මේ සතර පොහොය අමතක වන්නේ නැත. ඒ පොහෝ දිනය ඔවුන්ට සතියේ විවේක දිනය වූ බැවිනි. එහෙත් අද තත්වය මීට වඩා වෙනස්ය. මෙකල අපේ සතියේ විවේක දිනය වී ඇත්තේ ඉරු දිනයි. මීට අතිරේක ව සෑම පුර පසළොස්වක් දිනයක් ම රජයේ සහ පෞද්ගලික අංශවල නිවාඩු දිනයක් බවට පත් කර තිබේ.

රැකියාවල යෙදෙන්නන්ට සතර පොහොයට ම ආගමික කටයුතුවල නිරත වීමට ඉඩ නොලැබෙයි. එසේ වුවත් පුර පසළොස්වක් පොහෝ දිනය ඒ සඳහා ම වෙන් කර ඇති බැවින් එදින පහසුවෙන් ම ආගමික කටයුතුවල යෙදිය හැකිය. පාසල් දරුවන්ටත් විශ්වවිද්‍යාල ආදී උසස් අධ්‍යාපන ආයතනවලටත් පසළොස්වක් පොහෝ දිනය නිවාඩු ය. එබැවින් රැකියාවල යෙදෙන්නන් වුවත් අධ්‍යාපනයෙහි යෙදෙනන් වුවත් පුරපසළොස්වක් පොහෝ දිනය වෙනත් කටයුත්තකට යොදා ගැනීම යුතු නැත. වෙනත් පෞද්ගලික කටයුතු සඳහා ඉරු දින ඇතුළු සති අන්තය විවේක ලැබෙන බැවිනි.

පුර පසළොස්වක පොහෝ දිනයේ යෙදිය යුතු ඉතා උසස් ම ආගමික කාර්යය නම් අෂ්ටාංග උපෝසථ සීලය සමාදන් වීම යි. එය විමුක්ති මාර්ගයට අවතීර්න වීමකි. මේ පාඩමේ දී වැඩි සැලකිල්ලට යොමු වනුයේ පොහෝ දින පෙහෙවස් සමාදන් වීමට අදාළ වත් පිළිවෙත් ය.

පෙහෙවස් සමාදන් වීමට බලාපොරොත්තු වන සැදැහැවතා සිල් සමාදන් වන දිනයට පළමු දිනයේ හෝ එම දිනයේ අලුයමින් හෝ ස්නානය කොට

පවිත්‍ර වෙයි. අලුයමින් අවදි වන ඔහු හෝ ඇය සිල් ඇඳුමෙන් සැරසෙයි. සිල් ඇඳුම ඉතා ම චාම් ය, පවිත්‍ර ය. සුදු ය. පිරිමි සුදු රෙද්දක් හෝ සුදු සරමක් ඇඳ සුදු බැනියමකින් ද, කාන්තාවෝ චාම් සුදු හැට්ටයකින් හා සුදු රෙද්දකින් ද සැරසෙති. ගැහුණු පිරිමි කවුරුත් එක් උරයක් වැසෙන සේ උතුරු සළුවක් පොරවා ගැනීම ද සිරිතය. පත්කඩය ද සිල් ඇඳුමේ කොටසකි. එය වන්දනා මාන කිරීම් ආදියේ දී බිම එලා ගන්නා රෙදි කැබැල්ලකි. සිල් ඇඳුමෙන් සැරසෙන උවසුවාට හෝ උවැසියට බාහිර වශයෙන් ශාන්ත ස්වරූපයක් ලැබෙයි.

සිල් ඇඳුම උවසුවකු හෝ උවැසියක හඳුනා ගෙන ඔවුන්ට ගරු සැලකිලි දැක්වීමට අන්‍යයන් තුළ පෙළඹවීමක් ඇති කරයි.

තෙල් මල් පහන් ආදී පූජා භාණ්ඩ ද රැගෙන විහාරයට යන සැදැහැවතුන් බොහෝ විට සිල් සමාදන් වන්නේ සාමූහිකව ය. විහාර මලුවේ, බෝ මලුවේ හෝ ධර්ම ශාලාවේ රැස්වන පිරිස ස්වාමීන් වහන්සේ වැඳ සිල් ඉල්වති. සිල් ඉල් වන්නේ පහත සඳහන් වාක්‍ය කියමිනි.

'ඔකාස! ඔකාස!! ඔකාස!!!

අහංභන්තෙ තිසරණේන සද්ධිං අට්ඨංග උපාදාය උපොසථ සීලං ධම්මං යාචාමි අනුග්ගහංකත්වා සීලං දෙථ මෙ භන්තෙ අනුකම්පං

අවසර ස්වාමීනි, තිසරණ සහිත අට්ඨංග උපෝසථ ශීලය අයදිමි මට උපකාරයක් ලෙස අනුකම්පා කර මා අටසිල්හි පිහිටුවනු මැනවි!

ඉක්බිති ස්වාමීන් වහන්සේගේ අවසරය පරිදි පිරිස සිහින් හඬින් ඇසෙන සේ නමස්කාරය කියති. අනතුරුව ස්වාමීන් වහන්සේ පිරිස තිසරණ සහිත අෂ්ටාංග ශීලයේ පිහිටුවන සේක.

සිල් අනුසස් දක්වමින් හා දවස ගත කළ යුතු අන්දම පැහැදිලි කරමින් කෙටි අනුශාසනාවක් කිරීම ද උන්වහන්සේගෙන් මේ අවස්ථාවේ සිදු වෙයි.

සාමාන්‍ය දිනයක ගිහි බෞද්ධයන්ගේ ඇවතුම් පැවතුම්වලට වඩා පෙහෙවස් සමාදන් වූ අයගේ ඇවතුම් පැවතුම් යම් යම් කරුණුවලින් වෙනස් වෙයි. මේ

වෙනස්වීම්වලට බෙහෙවින් පදනම් වී ඇත්තේ එදින පුරන විශේෂ ශික්ෂාපද සතරකි. පහත දැක්වෙන්නේ ඒ විශේෂ ශික්ෂාපද හතරේ අරුත් ය.

මම අබ්‍රහ්මචර්යාවෙන් හෙවත් ගිහිකාමභෝගී ජීවිතයෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

විකාල භෝජනයෙන් හෙවත් අවේලාවේ ආහාර ගැනීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

නැටුම්, ගැයුම්, වැයුම් හා විහිළු දැකීම්වලින් ද, මල් ගඳවිලවුන් දැරීමෙන් හා ගත සැරසීමෙන් ද වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

උස් අසුන් හා මහ අසුන් භාවිතයෙන් වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

සාමාන්‍ය දිනවල කාමයෙහි වරදවා නොහැසිරෙන ගිහියා පෙහෙවස් සමාදන් වූ විට එම කාලය තුළ ගිහි කාමභෝගී ජීවිතයෙන් සම්පූර්ණයෙන් ඉවත් වෙයි. විවාහක අඹුසැමියන් වුවද අඹුසැමියන් වශයෙන් ජීවත්වීමෙන් ඉවත් වන බව මෙයින් අදහස් කෙරෙයි. විකාල භෝජනයෙන් වෙන්වීම ආදී ඉතිරි ශික්ෂාපද සැලකිල්ලට ගත් විට අටසිල් සමාදන් වූවකුගේ හැසිරීම පැවිදි උතුමකුගේ හැසිරීමේ ස්වභාවය ගනියි. මේ අනුව අටසිල් සමාදන් වීම තාවකාලික ව ගිහිගෙයින් ඉවත් වීමකි. තාවකාලික අභිනිෂ්ක්‍රමණයකි. එය රහතන් වහන්සේ නමක මෙන් ජීවත්වීමට කරන උත්සාහයකි.

මේ අරමුණ ඉටු කර ගැනීමට උදව්වන පැවතුම් පෙහෙවස් සමාදන් වූ උවසුවා හෝ උවැසිය ඇති කර ගනී. පෙහෙවස් සමාදන් වූ විට ගෙදර පරිසරයෙන් ඉවත් වී පන්සලෙහි ම කාලය ගත කිරීමෙන් ගෘහ ජීවිතයේ අවශ්‍යතා අමතක වෙයි. අභිනිෂ්ක්‍රමණයක් වීමට නම් එය අවශ්‍යය. සිල් ගත් අඹුසැමියන් අතර හෝ දූ දරුවන් සමග හෝ ලෞකික ජීවිතයේ අවශ්‍යතා පිළිබඳව කතාබහ ආදියෙන් වැලකීමට නිවසින් බැහැර වී සිටීම ප්‍රයෝජනවත් වෙයි. අටසිල් සමාදන් වී පිළිපදිනු ලබන සියලු ම ශික්ෂාපද බ්‍රහ්මචර්යාවට හෙවත් උතුම් හැසිරීමට සම්බන්ධ ය.

සිල්ගත් දින ආහාර ගැනීම වෙනදාට වඩා වෙනස්ය. සාමාන්‍ය ගිහියකුට කැමති ම වේලාවක හෝ ඕනෑ තරම් වාර ගණනක් හෝ ආහාර ගැනීමට බාධාවක් නැත. පෙහෙවස් සමාදන් වූ උවසු උවසියෝ ආහාර ගැනීම උදෑසන

හීල් දානයටත්, දවල් දානයටත් පමණක් සීමා කරති. මේ ආහාර වේල් දෙකම ගැනෙනුයේ පෙරවරුවේ හෙවත් හිරු අවරට යාමට පෙර ය. විකාල භෝජනයෙන් වැලකීම යනුවෙන් අදහස් කරන්නේ හිරු අවරට යාමෙන් පසු ආහාර නොගන්නා බව ය.

උදෑසන බුද්ධ පූජාව පවත්වා උදෑසන ආහාරයත්, දවල් බුද්ධ පූජාව පවත්වා දිවා ආහාරයත් ගැනීම පෙහෙවස් සමාදන් වූවන්ගේ සාමාන්‍ය සිරිතය. වාඩි වී මිස හිටගෙන හෝ ඇවිදිමින් ආහාර ගැනීමක් නො කෙරේ. බිම පනවන ලද ආසනවල හෝ පැදුරුවල වාඩි වී සංවර ව ආහාර ගැනීම සිරිතය.

භික්ෂූන් වහන්සේ නමක මෙන් ප්‍රත්‍යවේක්ෂා කරමින් ආහාර වැළඳීම ද සිරිතකි. මේ ආහාරය වළඳන්නේ රූව වැඩි වීම සඳහාවත් ශක්තිය වැඩි කර ගැනීම සඳහාවත් නොව හුදෙක් දිවි පවත්වා ගැනීම සඳහාය. යනුවෙන් සිතීම ආහාර ප්‍රත්‍යවේක්ෂා කිරීමයි. සිල් පිරිසක් වශයෙන් සාමූහිකව ආහාර ගැනීමේ යෙදී සිටී නම් ආහාර වැළඳීම එක්වර ආරම්භ කිරීමත් සියලු දෙනා ම ආහාර වළඳා අවසන් වනතුරු අසුන්වලින් නොනැගිටීමත් සිරිතකි.

පෙහෙවස් සමාදන් වූ විට පිළිපදින මූලින් සඳහන් කළ විශේෂ ශික්ෂාපදවලින් බලාපොරොත්තු වනුයේ ඉඳුරන්ට වහල් වී ඉඳුරන් පිනවීම සඳහා කරනු ලබන හැසිරීම්වලින් වැලකී සිටීමය. වෙලාව අවේලාව නොබලා මිහිරි ආහාර සොය සොයා යෑම දිව පිනවීමකි. විකාල භෝජන ශික්ෂාපදය රැකීමෙන් එය වැළකේ. නාට්‍ය හා විසුලු දැකුම් සොය සොයා යාම ඇස පිනවීමකි. ගීත හෝ වාදන ශ්‍රවණය කණ පිනවීමකි. මල් ගඳවිලවුන් දැරීම හා ආභරණ පැළඳීම නාසය පිනවීමක් මෙන් ම ඇස පිනවීමක් ද වෙයි. එසේ ම සැප පහසුකම් ඇති ආසන සොය සොයා ගොස් ඉඳීම, සැතපීම ආදිය ස්පර්ශයෙන් කය පිනවීමකි. මේ නිසා පෙහෙවස් සමාදන් වූවෝ මෙකියන ලද හැසිරීම්වලින් වෙන් වී වාසය කිරීමට උත්සාහ කරති. ඉඳුරන් පිනවීම සඳහා කෙරෙන හැසිරීම් සියල්ල රාගය වැඩිදියුණු වීමට හේතු වෙයි. බ්‍රහ්මචාරී ජීවිතයේ මූලික අරමුණ නම් රාගය තුනී කිරීම ය.

පෙහෙවස් රැකීමේ සමහර පිළිවෙත් මානය දුරු වී සමානාත්මතාව ඇති වීමට ද හේතු වෙයි.

සියලු ම තරාතිරම්වල අයගේ සිල් ඇඳුම එක් බඳු ය. ධනවත් කුලවත් ආදී භේදයන්ගෙන් තොරව කවුරුත් එක් බඳු වීම සමානාත්මතා ගුණ ධර්මයට මහ පාදයි. එසේම මල් පැළඳීම, ආභරණ පැළඳීම ආදිය ද කැපී පෙනීමට

හේතුවෙයි. එය මානය හා සම්බන්ධ වූවකි. රජවරු, සිටුවරු, ප්‍රභූවරු, කුලීනයෝ , කුලහීනයෝ, ස්වාමිවරු, සේවකයෝ මේ කවුරුත් පෙහෙවස් සමාදන් වූ විට බිම පැදුරුවල වාඩිවෙති. මෙය මානය හීන වී සමානාත්මතාවය වර්ධනය වීමට හේතු වෙයි. සිල් ගුණය අනෙක් සියලු බලයන් යටපත් කොට නැගී සිටින බව ද මෙයින් පෙනේ.

පෙහෙවස් සමාදන් වූ විට දවස ගත කෙරෙන්නේ කාලසටහනකට අනුව ය. බුද්ධ පූජා පැවැත්වීමට, ධර්ම ශ්‍රවණ, ධර්ම සාකච්ඡා, දහම් පොත් කියවීම ආදිය මේ වැඩසටහන්වලට ඇතුළත් වෙයි. උදෑසන, දවල් හා සන්ධ්‍යාවේ බුද්ධ පූජා පවත්වා මල් පහන් පිදීම අනිවාර්යයෙන් ම වාගේ සිදු වෙයි.

රාත්‍රිය ද පෙහෙවස් විසීමට කැමති වන්නෝ නැවතත් සන්ධ්‍යාවේ භික්ෂූන් වහන්සේ නමක වෙතින් සිල් සමාදන් වෙති. ඔවුහු රාත්‍රී කාලයෙන් වැඩි කොටසක් ධර්ම ශ්‍රවණ, ධර්ම සාකච්ඡා, දහම් පොත් කියවීම හා භාවනා ආදියෙහි නිරත වීමෙන් ගෙවති. දිවා කාලයෙන් පෙහෙවස් විසීම අවසන් කරන්නෝ සන්ධ්‍යාවේ පඤ්චශීලයේ පිහිටීමෙන් අටසිල් පවාරණය කරති. පූර්ණ දවස ම ශීලයෙහි පිහිටන්නෝ පසුදින උදෑසන පවාරණය කරති. සිල් පවාරණය කළ විට වයසින් වැඩි උවසු උවැසියනට වැඳ අවසර ගෙන යාම ද සිංහල බෞද්ධයන් අතර තිබෙන සිරිතකි.

භාවිතයට :

1. සාමාන්‍ය පුද්ගලයෙකුට වඩා අටසිල් සමාදන් වූ කෙනෙකුගේ හැසිරීමේ දැකිය හැකි ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න.

2. වරින් වර අටසිල් සමාදන් වීම නිසා එදිනෙදා ජීවිතයට ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි විස්තර කරන්න.

41 පාඩම

## සෞන්දර්ය සංකල්පය හා බුදුදහම

සෞන්දර්ය යනු සුන්දරත්වය යි. සුන්දර දේවල් අගය කිරීම සෞන්දර්ය රසාස්වාදයයි. මිනිසා පළමුකොට සෞන්දර්යය රස විඳීම අරඹන්නට ඇත්තේ ස්වභාව ධර්මය තුළිනැයි සිතිය හැකි ය. නැගෙන හිරු රැසින් දිළිසෙන පිනිකැට, වර්ණවත් සැන්දෑවළා සුළඟට ලෙලදෙන ලා දලු, පිපුණු මල්, හඬ නභාගෙන ගලා බස්නා දියඇලි, ඉගිලෙන සමනල රැන්, කුරුලු හඬ, නිල් තණබිමක කෙළි දෙලෙන් රඟන හා පැටව් ආදී සොබා දහමේ දහසක් සුන්දර දේ දකින අසන මිනිසාට ඉබේම කවි කියැවෙන්නට ඇත. කලාව උපදින්නට ඇත්තේ ඒ අන්දමින් යයි සිතීමට ඉඩ තිබේ. කලාව කෙසේ ඉපදුනත් මිනිසා විවේකය ගත කිරීම සඳහා සුන්දර දේවල් රස විඳින්නට ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මිනිසා අතින ද චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ, නාටය, සංගීත, සාහිත්‍ය ආදී සුන්දර දේවල් බිහිවන්නට ඇත. මෙකල සෞන්දර්ය නිර්මාණ හෙවත් කලා කෘති වශයෙන් සලකනු ලබන්නේ මේවා ය.

ශිෂ්ටාචාර වූ සියලු ම මිනිසුන් සතුව දියුණු වූ කලා ශිල්ප තිබුණු බව ඉතිහාසයෙන් පෙනේ. කලාව මිනිසුන්ගේ දළ ගති මටසිලුටු කිරීමටත්, විවේකය යහතින් ගත කිරීමටත් මහ පාදන්නේ ය යනු උගතුන් පිළිගත් අදහස කි. එබැවින් කලා නිර්මාණය නොහැකිවුණත් කලා රස විඳීමේ හැකියාව හැම පුරවැසියෙකුට ම තිබිය යුතුයයි අද පිළිගනු ලැබේ. අපේ පාසල් විෂය මාලාවේ සෞන්දර්ය විෂයයක් අනිවාර්ය කොට ඇත්තේ එබැවිනි.

ඉඳුරන් දමනය කර ගැනීමට වෑයම් කරන බෞද්ධයාට කලා රස විඳීමට ඉඩක් තිබේදැයි කෙනෙක් ප්‍රශ්න කරති. මීට බොහෝ දුරට සමාන ප්‍රශ්නයකට වරක් බුදුරජාණන් වහන්සේ දුන් පිළිතුරෙන් මේ ප්‍රශ්නයටත් පිළිතුරු ලැබේ යයි සිතේ. වරක් දෙවියෙක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ මිනිසුන් වරදට පෙළඹෙන්නේ ලෝකයේ ඇති විසිතුරු බව නිසාය යි පැවසීය. එවිට බුදුරජාණන් වහන්සේ මිනිසුන් වරදට පොළඹවන කාමය හටගන්නේ විසිතුරු වස්තුවල නොව මිනිස් සිතේය, විසිතුරු වස්තු එසේ ම තිබෙද්දී නුවණැත්තෝ තම සිත රැකගනිත් යනුවෙන් පැවසූහ.

දෙවියා චෝදනාව එල්ල කළේ විසිතුරු වස්තුවලටය. බුදුරජාණන් වහන්සේ චෝදනාව එල්ල කළේ විසිතුරු වස්තුවලට නොව මිනිස් සිතට ය.

බුදු දහම අනුව දුකට හේතුව වන්නේ තදින් අල්ලා ගැනීමයි. එයට ධර්මයේ භාවිතා වන වචනය උපාදානය යි. බුදුරජාණන් වහන්සේ දෙවියාට, දුන් පිළිතුරෙන් අපට බැසගත හැකි නිගමනයක් නම් තදින් අල්ලා ගැනීමෙන් හෝ අයත් කර ගැනීමේ ආශාවෙන් තොරව යථා තත්ත්වය සලකා කලා රස විඳීමට බෞද්ධයන්ට ඉඩ තිබේ යන්නයි. බුදුරජාණන් වහන්සේත් කෙලෙස් නැති කළ රහතන් වහන්සේලාත් සුන්දරත්වය අගය කළ අවස්ථා අපට ත්‍රිපිටක සාහිත්‍යයෙන් හමු වේ.

සිදුහත් බෝසත්තුමා භාවනා වැඩීමට උරුවෙලාව තෝරා ගත්තේ ද එහි ඇති සුන්දරත්වය නිසාය. ඒ බව උන්වහන්සේ ම ප්‍රකාශ කරන්නේ මෙසේ ය.

.........මගධ රට පිළිවෙලින් සැරිසරමින් උරුවෙලාහි සේනානි නම් නියම්ගමට පැමිණියෙමියි........ ඒ දුටු මට මෙසේ සිතිණ. මේ බිම රමණීය යි. වන ලැහැබ ද සිත් සතුටු කරයි. සුදු වැලි තලා ඇති, මහා තොට ඇති, රමණීය හොය ද ගලයි. හාත්පසින් ගොදුරු බිම ද වෙයි. වීර්ය කරනු කැමති කුල පුත්‍රයකුහට භාවනා වැඩීමට මේ ඉතා ම මැනවි. මම මෙතන නැවතී පධන් වීර්යය වඩමි.

ලස්සන දේ ලස්සන බව පැවසීමට බුදුරජාණන් වහන්සේ මැලි නොවූහ.

"ආනන්දය, මේ විසාලා මහනුවර රමණීය යි. උදේන චෛත්‍යය ද සිත් අලවන සුලුය. ......චාපාල චෛත්‍යය ද සිත් පිණවයි. යන ලෙසින් පැවසූ බව මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් ය. කෙලෙස් නැසූ රහතන් වහන්සේලා සෞන්දර්යය අගය කළ අවස්ථා ථෙර ගාථාවල එයි. ස්වභාව සෞන්දර්යයයෙන් අනූන වූ අජකරණී ගඟ බඩ විවේක සුවයෙන් විසූ සප්පක නම් රහතන් වහන්සේ ගැයූ ගීයක සිංහල අදහස මෙසේ ය.

"එදා කොකුන් සුදු පියා විදාලා
බියෙන් තැවී කළු වලා පෙනීලා
අහස් නැගී යන නිවෙස් බලාලා
අජකරණී ගඟ මා සිත ගන්නී"

වනයෙහි මහා පර්වතයන්හි සොබා අසිරිය රස වින්ද වනවච්ඡ නම් තෙරණුවන්ගේ උදානයක සිංහල අදහස මෙසේ ය.

පැදි දිය රැදි ඇති
පුළුල් ගල් තලා ඇති
වඳුරු මුව පිරී ඇති
දිය සෙවෙල් බැදී ඇති
ඒ මහා පරුවතයෝ
මගේ සිත ඇදගනිත්

රතියෙන් තොරව ස්වභාව ධර්මයේ සුන්දරත්වය අගය කළ වනවාසී තෙරුන්වහන්සේලා ඒ සුන්දර පරිසරයත්, ස්වකීය චිත්ත සංවර්ධනයට උදව් කරගත්හ.

පසුකාලීන භික්ෂූන් වහන්සේලා ස්වකීය විහාර ආරාම සඳහා තෝරා ගත්තේ ද සුන්දර පරිසරයන් ය. දඹදිව අජන්තා ලෙන් විහාරය එබඳු තැනකි. ලක්දිව බුදු සමය පැතුරුණු මුල් කාලයේදී ම බෞද්ධ භික්ෂූන් වහන්සේලා පර්වත වනපෙත් පොකුණු ආදියෙන් අලංකාරවූ මිහින්තලය, ඉසුරුමුනිය, සිතුල්පව්ව, වැනි සුන්දර පෙදෙස් ස්වකීය ආරාම සඳහා තෝරා ගත්හ.

අතීතයේ සිටම විනෝදාස්වාදයක් ලබමින් කුසල් දහම් කිරීමට බෞද්ධයෝ පුරුදු වූහ. පැහැපත් සුවඳමල් මුනි සිරිපා අබියස සිත්කළු රටාවකට පුදන සැදැහැවත් බෞද්ධයා පළමුවෙන් ප්‍රසන්න වූ ආස්වාදයක් ලබයි. මල මැලවෙන්නේ යම් සේද එසේම මගේ ශරීරයද විනාශයට පත් වෙයි. යනුවෙන් සිතන ඔහු ඊළඟට ලෝකයේ යථා ස්වභාවය මලෙහිද දකිමින් භාවනාවක යෙදෙයි.

ධාර්මික විනෝදාස්වාදය සමගින් කුසල් රැස්කර ගැනීමට පෙළඹෙන බෞද්ධයා නැටුම්, ගැයුම්, වැයුම් ආදී කලාවන් බුද්ධ පූජාව සඳහා යොදා ගනියි. නැටුම් ගැයුම්, වැයුම් ආදියෙන් සමලංකෘත මහනුවර දළදා පෙරහැර හොඳ උදාහරණයකි.

බෞද්ධ කලාකරුවෝ පොදු ජනයාට දහම් දැනුම ලබාදීමටත් එසේම ඔවුන් තුළ ශ්‍රද්ධාව ජනනය කිරීමටත් කලාව යොදා ගත්හ. චිත්‍ර ශිල්පීහු බුදු සිරිත

හා ජාතක කථා සිතුවමට නැගූහ. කවියෝ කවියට නැගූහ. මූර්ති ශිල්පීහු මහ කළුගල්වලට පණ දී බුදුරදුන්ගේ රූ සිරිය හා ගුන සිරිය මවාලූහ. ගෘහ නිර්මාණ ශිල්පීහු නිල් අහසට විහිදුණු රන්වන් කොත් කැරලි සහිත සුදෝ සුදු මහ දාගැබ් ඉදි කළහ. බුදු දහම පැතිර ගිය කවර රටක වුව ද බෞද්ධ කලා ශිල්ප සම්භාරයක් අපට දැකිය හැකි වන්නේ එය කලා ශිල්ප වර්ධනයට මහත් රුකුලක් වූ බැවිනි.

පුහුණුවට :

මේ පාඩමේ මුලින් සඳහන් වූ සප්පක තෙරුන්ගේ හා වනවච්ඡ තෙරුන්ගේ උදාන ගාථා දෙක පිළිවෙලින් පහත දැක්වේ.

යදා බලාකා සුචි පණ්ඩරච්ඡදා
කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා
පලේහිති ආලය මාලයේ සිනී
තදා නදී අජකරණී රමෙති මං

අච්ඡොදිකා පුථුසිලා ගෝනඩ්ගුල මිගා යුතා
අම්බුසේවාල සඤ්ජන්නා තේ සේලා රමයන්ති මං

අභ්‍යාසය :

බුදු පුද සඳහා පිළියෙල වූ කලාත්මක මල් බඳුනක් දෙස බලන විට ඔබට ඇති වන හැඟීම් විස්තර කරන්න.

## 42 පාඩම

# බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය

බුදු දහමත් සමග අපට ලැබුණු විවිධ දායාදවලින් එකක් නම් බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයයි. චෛත්‍ය, චේතියඝර, බෝධිඝර හා පටිමාඝර බෞද්ධ ගෘහ නිර්මාන ශිල්පයට අයත් ප්‍රධාන ගොඩනැගිලි වර්ග කීපයකි. මේවායින් චෛත්‍යය පිළිබඳව අපි හයවන ශ්‍රේණියේ දී උගතිමු. මෙම පාඩමෙන් ඔබට මූලික ගොඩනැගිලි වර්ග හඳුනා ගැනීමට ලැබෙයි.

## චේතියඝර

චේතියඝර චෛත්‍යය හා සම්බන්ධ වූ තවත් ගොඩනැගිලි විශේෂයකි. ඝර යන පාලි වචනයේ තේරුම ගෙය යන්නයි. එබැවින් චේතියඝර යන්න දාගැබ් ගෙය යනුවෙන්ද හැඳින්විය හැකි ය.

පුරාණ ලංකාවේ කුඩා හා මධ්‍යම තරමේ ස්තූප ආවරණය කොට ගෙවල් සාදා තිබූ බව පෙනේ. අනුරාධපුරයේ ථූපාරාම දාගැබ, ලංකාරාම දාගැබ් වැනි ස්තූප වටා තවමත් ඉතිරි වී ඇති ගල් කුළුණු පේළිවලින් මේ බව සිතා ගත හැකිය. ඇතුළතින් ම පිහිටි ගල් කුළුණු වටයේ ගල් කුළුණු අඩි 20 ක් පමන උස් වෙයි. ඊළඟ පේළිවල උස ක්‍රමයෙන් අඩු වෙයි. පිටතින් ම පිහිටි අන්ති ම වටයේ ගල් කුළුනක උස අඩි 14 කි. මේ ගල් කුළුණු මත පිටතට බෑවුම් වන සේ වෘත්තාකාර පියස්සක් ලීයෙන් සාදා තිබූ බව පුරාවිද්‍යාඥයෝ පවසති. චෛත්‍යයේ කොත් කැරැල්ලට ඉහළින් තිබුණු පියස්සේ කොටස අර්ධගෝලාකාර හැඩයෙන් යුක්ත වී යයි අදහස් කරනු ලැබේ. පින්තූරය බැලීමෙන් මෙය ඔබට පැහැදිලි වනු ඇත.

චේතියඝර ගල් කුලුණුවල පහළ කොටස චතුරශ්‍රාකාර වූ අතර ඉහළ කොටස අෂ්ටාශ්‍රාකාර විය. කුළුණු කෙළවර වන්නේ අෂ්ටශ්‍රාකාර කුළුණු හිසකිනි.

චේතියඝර නිසා චෛත්‍යයට ආරක්ෂාවක් සැලසින. එසේ ම අව්වෙන් වැස්සෙන් පීඩා නොවිඳ චෛත්‍ය වන්දනාවේ නිරතවීමට සැදැහැවතුනට එයින් ඉඩ ලැබිණ.

චෛතියඝරය ම වර්ධනය වීමෙන් ගොඩ නැගුණු තවත් වෘත්තාකාර මන්දිර විශේෂයක් අනුරාධපුර යුගයේ පසු භාගයේ දී දක්නට ලැබේ. ඒවා හැඳින්වෙන්නේ වටදාගේ නමිනි. වෘත්තාකාර වේදිකාවක් මත වෘත්තාකාර ව පිහිටි කුළුන පේලි කීපයක් සහිතව ඉදිවුණු මෙම මන්දිර මධ්‍යයේ දක්නට ලැබෙන්නේ ඉතා කුඩා චෛත්‍යයක ස්වරූපයෙන් පිහිටි ධාතු ගර්භයකි. මේ ධාතු ගර්භය වටා සතර දිසාවට මුහුණලා ඉදි කළ බුදුපිළිම සතරකි. පොළොන්නරුවේ වටදාගෙහි මේ පිළිම වහන්සේලා තවමත් නිරුපද්‍රිතව වැඩ සිටිති. වටදාගෙවල් ධාතු ගර්භයක් සහිත පිළිමගෙවල් ලෙසද සැළකිය හැකි ය.

ඉතා ම කලාත්මක වූ වටදාගෙය දක්නට ලැබෙන්නේ තමන්කඩු දිස්ත්‍රික්කයට අයත් මැදිරිගිරියේ ය. එය පුරාණයේ දී හැඳින්වුනේ මණ්ඩගිරි විහාරය නමිනි. ගල් තලාවක් මත පිහිටි මෙම වටදාගෙයට නැගීමට ඇති ශෛලමය පියගැටපෙළද අගනා නිර්මාණයකි.

තවත් සැලකිය යුතු වටදාගෙයක් නම් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි තිරියාය වටදාගෙයයි. එය තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් බුදුරජාණන් වහන්සේගේ කේශධාතු නිදන් කොට සාදවන ලද ගිරිහඬු විහාරය ලෙස සලකනු ලැබේ. කැටයම් කළ හෝ කැටයම් නොකළ ගලින් කළ අර්ධ බිත්තියකින් වටකොට තිබීමද වටදා ගෙවල ලක්ෂණයකි. මේ වර්ගයේ වටදාගෙවල් ගොඩ නගා ඇත්තේ අනුරාධපුර යුගයේ ක්‍රි. ව. 7 වන 8 වන ශත වර්ෂවල දී යයි අදහස් කරනු ලැබේ.

බෝධිඝර

බෝධීන් වහන්සේ නමක් සඳහා ඉදිකළ ගෘහය බෝධිඝර යයි. බෝගෙය හෙවත් බොධිඝරය බෝධීන් වහන්සේ වටා ඉදි කරනු ලැබූ පියස්සක් සහිත ගොඩනැගිල්ලකි. මෙහි මධ්‍යය විවෘත ය. එයින් බෝධීන් වහන්සේ අතු පතර විහිදා අහසට නැගී සිටිති. බෝධීන් වහන්සේ පැදකුණු කරන හා වන්දනා කරන අයට වටේ පිහිටි බෝධිඝරය අව්වෙන් වැස්සෙන් ආරක්ෂාව සපයයි.

ඉතා හොඳ තත්ත්වයේ තිබෙන ගලින් කළ බෝධිඝරයක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගල නම් ස්ථානයේ දක්නට ලැබේ. එහෙත් අද එහි බෝධීන් වහන්සේ නමක් නොමැත. අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ

වටා ද පුරානයේ බෝධිඝරයක් තිබූ බව කියනු ලැබේ. වර්තමානයේ බෝධීන් වහන්සේලා වටා බොහෝ විට දක්නට ලැබෙන්නේ බෝධිඝර නොව බෝධිප්‍රකාරයි.

පටිමාඝර

තවත් විශිෂ්ඨ බෞද්ධ ගොඩනැගිලි විශේෂයක් නම් පටිමාඝර හෙවත් පිළිමගෙවල් ය. බුදුපිළිම නෙළීම ආරම්භ වූ මුල් කාලයේ දී බුදු පිළිම වහන්සේලා බෝධි වෘක්ෂයක් යට එළිමහනේ තබන ලද්දේ යයි අදහස් කරනු ලැබේ. එහෙත් වැඩි කල් නොගොස් බුදු පිළිම වහන්සේලා සඳහා පිළිම ගෙවල් ඉදි කර ඇත.

මුල් කාලයේ ඉදි කළ පිළිම ගෙවල් අද දක්නට නැතත් ඒවායේ අඩිතාලම අනුරාධපුර නටඹුන් අතර දක්නට ලැබේ. හරි හතරැස් කාමරයක් හා එයට යාබද මණ්ඩපයක් තිබූ බව ගඩොලින් නිම වී ඇති මේ අඩිතාලම්වලින් පැහැදිලි වෙයි. අනුරාධපුරයේ කිරිබත්වෙහෙර පිළිම ගෙය මෙයට හොඳ උදාහරණයකි. මුලින් සාදන ලද මණ්ඩපය මිනිසුන්ට රැස්වීමට ඉඩ මඳ බව දැනුනු විට එයට ඉදිරියෙන් තවත් මණ්ඩපයක් හෙවත් රැස්වීම් ශාලාවක් ගොඩනැගූ බව පෙනේ. මෙයින් පසු පැරණි මණ්ඩපය අන්තරාලයක් බවට පත් විය. අනුරාධපුරයේ ථූපාරාමය අසල පිළිමගෙයි අඩිතාලම මෙයට හොඳ උදාහරණයකි.

සම්පූර්ණ පියස්ස සහිත පැරණි පිළිම ගෙවල් අපට දක්නට ලැබෙන්නේ පොළොන්නරුවේය. මෙම පිළිම ගෙවල් සම්පූර්නයෙන් ම ගඩොලින් හා හුණු බදාමයෙන් සාදන ලද අතර ඒවායේ පියසි ද ආරුක්කු ආකාරයට ගඩොලින් ම නිමවන ලද්දේ වෙයි. මේ නිසා ගෙඩිගේ යන විශේෂ නාමයකින් මේ පිළිමගෙවල් හැඳින්වේ. මෙම පිළිම ගෙවල බිත්ති අඩි හයක් හෝ හතක් පමණ ඝන වීම විශේෂ ලක්ෂණයකි. එබැවින් පිටතින් පෙනෙන විශාලත්වයට සරිලන ඉඩක් මෙම ගොඩනැගිලිවල ඇතුලත දක්නට නොලැබේ. බිත්තිවල පිටපැත්ත කුළුනු කැටයම් හා සිංහ, හංස හා වාමන යන සත්ව රූපාවලීන්ගෙන් අලංකාර කොට තිබීම ද තවත් විශේෂ ලක්ෂණයකි.

පොළොන්නරුවේ ථූපාරාම පිළිමගෙය එහි ආරුක්කු ආකාර පියස්ස සහිතව තවමත් දක්නට ලැබේ. පියස්ස කැඩී ඇති, තවමත් අඩි 55ක් පමණ

උසැති බිත්ති දක්නට ලැබෙන පොළොන්නරුවේ ලංකාතිලක පිළිමගෙය මේ වර්ගයේ ඉතා විශාල පිළිම ගෙයකි. පොළොන්නරුවේ ම ඇති තිවංක පිළිම ගෙය ද තවත් එබන්දකි. ගෙඩිගේ වර්ගයට අයත් ඉහත සඳහන් පිළිමගෙවල් තුන ම මහා පාරක්‍රමබාහු (ව්‍යවහාර වර්ෂ 1153 - 1186) රජතුමාගේ කෘතීන් ලෙස සලකනු ලැබේ.

මේ පිළිම ගෙවල්වල සම්ප්‍රදායට ම අයත් එහෙත් ඊට වඩා වෙනස් වූ පිළිමගෙවල් දෙකක් නම් මහනුවර ආසන්නයේ උඩුනුවර පිහිටි ගඩලාදෙණි හා ලංකාතිලක විහාරයන් ය. ගඩලාදෙනි විහාරය හින්දු කෝවිලක හැඩය ගත් තනි කළු ගලින් නිමවන ලද්දකි. ලංකාතිලකය ගඩොලින් නිමවන ලද මහල් කීපයකින් යුත් අලංකාර ගොඩනැගිල්ලකි. එහි පියස්ස ද ආරුක්කු ආකාරයට නිමවා ඇතත් ඒ මතු පිට දැවයෙන් කළ උළු සෙවිලි කළ පියස්සක් ද විද්‍යමාන වේ.

මහනුවර යුගයේ ඉදි වූ තවත් මාදිලියක පිළිම ගෙවල් විශේෂයක් හැඳින්වෙන්නේ ටැම්පිට විහාර නමිනි. ගල්කණු මත දැව ඇද ඊ මත්තේ ලෑලි අතුරුවා ඒ උඩ බිත්ති බැඳ සාදන ලද මෙම පිළිම ගෙවල් බුදු පිළිම වහන්සේ වැඩ සිටින්නේ උඩු මහලේ ය. මෙබඳු පිළිම ගෙවල් දඹදෙනියේ, බුදුමුත්තාවේ හා මැදවෙල ආදි තැන් වල දක්නට ලැබේ.

මේ හැරෙන්නට ස්වාභාවිකව පිහිටි විශාල ගල්ගුහා ඉදිරියෙන් බිත්ති බැඳ පිළිම ගෙවල් බවට හරවා ගැනීමේ සම්ප්‍රදායක් ද පුරාණයේ සිට පැවති බව පෙනේ. සුප්‍රසිද්ධ රන්ගිරි දඹුලු විහාරය, රිදී විහාරය හා දෙගල්දොරු විහාරය මෙබඳු ලෙන් විහාර කීපයකට උදාහරණයි.

දාගැබ් වහන්සේ, බෝධීන් වහන්සේ හා බුදුපිළිම වහන්සේ යන ත්‍රිවිධ චෛත්‍යයන් සම්බන්ධ බෞද්ධ ගෘහ නිර්මාණ කීපයක් අපි මේ පාඩමෙන් උගත්තෙමු. තම ජීවිත කාලය තුළදී අඩු තරමේ වරක් දෙකක් වත් වන්දනා ගමන් වල යෙදෙන සෑදැහැවතුනට බෞද්ධ කලා ශිල්ප හා බෞද්ධ ගොඩනැගිලි ආදිය දැක බලා ගැනීමට ඉඩ ලැබේ.

පැවරුම :

මෙම පාඩමෙහි සඳහන් විවිධ බෞද්ධ ගොඩනැගිලිවල පින්තූර පුවත් පත් සඟරා ආදියෙන් රැස්කර බිහි වැඩ පොතක අලවා බෞද්ධ කලා ශිල්ප පිළිබඳ තොරතුරුවලට එක්කර ගන්න.

## 43 පාඩම

# බෞද්ධ චිත්‍ර කලාව

බෞද්ධ විහාරයකට වන්දනාවේ යන බාල මහලු කවුරුත් බිතුසිතුවම් නැරඹීමට කැමැත්තක් දක්වති. පුරාණයේ සිට ම බෞද්ධ විහාර බිතුසිතුවමින් අලංකාර කොට ඇත්තේ පැහැදිලි අරමුණු ඇතිව ය. වන්දනාකරුවන් තුළ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ජනිත කරවීම එක් අරමුණකි. සැදැහැවතුනට සදාචාරාත්මක පාඩම් ඉගැන්වීම හෙවත් උපදෙස් දීම තවත් අරමුණකි. කියැවීමට නොහැකි අයට වුවත් සිතුවම් බලා ආශ්වාදයක් අවබෝදයක් ලබා ගැනීමට හැකි වීම චිත්‍රවල ඇති විශේෂ ලක්ෂණයකි.

බෞද්ධ විහාරයක බිතුසිතුවම් අතර දක්නට ලැබෙන තේමාවන් විවිධය. සූවිසි විවරණ ඇතුළු බුද්ධ චරිතය, ජාතක කථා, බෞද්ධ ඓතිහාසික සිද්ධි, දෙව්ලොව වර්ණනා, අපාය විස්තර හා සැරසිලි චිත්‍ර මේ තේමාවන් සමහරකි. මේ සියල්ල ම නැති වුණත් මෙයින් එක වර්ගයක සිතුවම් හෝ විහාරයක දී දක්නට නොලැබෙන්නේ නම් ඒ කලාතුරකිනි.

ලංකාවේ පැරණි සිතුවම් කලාවක් තිබෙන්නට ඇත. එහෙත් බෞද්ධ සිතුවම් කලාව අපට ලැබුණේ බුදු දහමත් සමගය. අනුරාධපුරයේ මුල් කාලයේ අඳින ලද සිතුවම් අද අපට දක්නට නොලැබේ. දුටුගැමුණු රජතුමා විසින් කරවන ලද රුවන්වැලි සෑයේ ධාතු ගර්භයේ බිත්තිවල විචිත්‍ර සිතුවම් ඇඳ තිබූ බව මහාවංශයේ කියවෙයි. ජාතක කථා අඳින ලද චිත්‍ර වස්තු වලින් වෙසක් දින අනුරාධපුරයේ නගරය අලංකාරව තිබූ බව ලක්දිවට පැමිණි පාහියන් නැමැති චීන භික්ෂූන් වහන්සේගේ ගමන් විස්තරයේ (5 සියවස) සඳහන් වෙයි.

අනුරාධපුර යුගයට අයත් බිතුසිතුවමක් මිහින්තලේ චෛත්‍යයක ධාතු ගර්භයකින් සොයා ගෙන තිබේ. මේ සිතුවම් වලාකුළුවලින් මතුවන දේවතා සමූහයකගේ රේඛා චිත්‍රයකි. දැනට ඉතිරි වී ඇති අනුරාධපුර යුගයට අයත් හොඳ ම සිතුවම් පස්වන සියවසට අයත් සීගිරි චිත්‍ර යි. මහනුවර ආසන්නයේ පිහිටි හිඳගල විහාරයේ ද මැකී ගෙන යන පැරණි සිතුවම් කොටසක් ඇත්තේය. හත්වන සියවසට අයත් සේ සලකනු ලබන මෙම චිත්‍රයෙන් බුදුරාජාණන් වහන්සේ හමුවීමට ශක්‍රයා ඉන්ද්‍රශාල ගුහාවට පැමිණි අවස්ථාව නිරූපණය වේ යනු හිටපු පුරාවිද්‍යා කොමසාරිස්වරයෙකු වන ආචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ අදහස විය.

පොළොන්නරු යුගයේ චිත්‍ර

පොළොන්නරු යුගයේ මුල් කාලයට අයත් සිතුවම් අපට පළමුවරට හමුවන්නේ පැරණි මහියංගන චෛත්‍යයේ ධාතු ගර්භයෙනි. මාර පරාජය කොට බුද්ධත්වය ලබා ගැනීමේ සිද්ධිය මේ චිත්‍රයෙන් දැක් වේ. බුදුරජාණන් වහන්සේ දෙවි බඹුන් පිරිවරා බෝමුල වැඩ සිටිති. වෙන් වෙන් ව අඳින ලද බෝපත් පැහැදිලි ව දැක්වේ. දෙවිපිරිස අතර ශිව හා විශ්ණු යන දෙවිවරුන් දෙදෙනා ද දක්නට ලැබේ. රතු, කහ, සුදු, කළු යන වර්ණ යොදා ඇඳ ඇති මේ සිතුවම් සෞන්දර්යය අතින් උසස් තැනක් ගන්නා බව කියනු ලැබේ. මහියංගන ධාතු ගර්භයේ සිතුවම් 1 විජයබාහු රජ (ව්‍යවහාර වර්ෂ 10-55 - 1110-) සමයට අයත් වෙයි.

පොළොන්නරු යුගයට අයත් වැදගත් බිතු සිතුවම් රාශියක් දක්නට ලැබෙන්නේ මහා පරාක්‍රමබාහු රජු (ව්‍යවහාර වර්ෂ 1153 - 1186) විසින් ගොඩ නගන ලද තිවංක පිළිම ගේ නැමැති විහාරයේ ය. මෙම විහාරය ඒ නමින් හැඳින්වෙන්නේ උරහිස, ඉග හා දෙදණ යන තුන් තැනකින් වක් වූ බුදු පිළිම වහන්සේ නමක් එහි සිටිනා බැවිනි.

මෙහි ගන්ධ කුටියේ බිත්තිවල බුද්ධ චරිතය දැක්වෙන විශාල සිතුවම් තිබූ බව පෙනේ. බුදුරජාණන් වහන්සේ දෙව්ලොව සිට සංකස්ස පුරයට වැඩම කරවීමත්, විශාලා මහනුවර වැසියන් තුන් බියෙන් මුදවා ගැනීමට ගංගානදිය දිගේ නැවකින් වැඩම කරවීම දැක්වෙන සිතුවමක් තවමත් හඳුනා ගත හැකිය. මෙම විහාරයේ අන්තරාලයේ බිත්තිවල තීරු වශයෙන් ජාතක කථා සිතුවම් කර ඇති අයුරු පෙනේ. ඒවා අතරින් සස, වෙස්සන්තර, අසංඛවතී, තුණ්ඩිල, විදුර, ගුත්තිල, චූල්ලපදුම, මෛත්‍රීබල හා සාම යන ජාතක කථා සිතුවම් හඳුනා ගත හැකිය. ගන්ධකුටියත් අන්තරාලයත් අතර බිත්තියක දැක්වෙන විශාල දෙවිපිරිසක් ඇතුළත් චිත්‍රය ද වැදගත් ය. තුසිත භවනයේ වැඩසිටින බෝසතානන් වහන්සේට බුදු වීම සඳහා මනුලොව වැඩීමට කරන දේවාරාධනාව මේ චිත්‍රයෙන් දැක්වෙන බව මහාචාර්ය පරණවිතාන මහතාගේ අදහස විය. මේ දෙවිපිරිස් අතර අතකින් නෙලුම් මලක් දරා සිටින්නේ බෝසත් තුමා බව කියනු ලැබේ. මේ රූපවල විවිධ හැඩයේ මුහුණු දක්නට ලැබේ. අත්, ඇඟිලි, ඇස්, ඇඳුම් හා ආභරණ ඉතා සියුම් වූ රේඛාවලින් ඇඳ දක්වා ඇත. රතු, කහ සහ කොළ යන වර්ණ බෙහෙවින් භාවිත කොට ඇති බව ද

පෙනේ. අනුරාධපුර යුගයේ පැවති උසස් බිතු සිතුවම් සම්ප්‍රදාය පොළොන්නරු යුගය දක්වා ම පැවති බව තිවංක පිළිමගෙයි සිතුවම් වලින් සිතා ගත හැකිය.

පොළොන්නරුවේ ගල් විහාර පිළිමගෙයි බිත්තිමුල්ලක ඉතිරි වී ඇති රුවුලක් සහිත ප්‍රතාපවත් පුද්ගලයාගේ උඩුකය දැක්වෙන සිතුවම ද උසස් චිත්‍රයකි. දිඹුලාගල මාරවිදිය නම් ස්ථානයේ ද පුල්ලිගොඩ ගල්ගේ නම් ස්ථානයේ ද පොළොන්නරු යුගයට අයත් තවත් සිතුවම් දක්නට ලැබේ.

## මහනුවර යුගයේ චිත්‍ර

පොළොන්නරු යුගයෙන් පසු ව අපට විහාර බිතුසිතුවම් දක්නට ලැබෙන්නේ මහනුවර යුගයේ දීය. දහඅටවන සියවසේ දී කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ ඇති වූ බෞද්ධ ප්‍රබෝධය නිසා පැරන විහාර රාශියක් අළුත්වැඩියා කරනු ලැබිණ. මේවා අතර බිතුසිතුවම් නිසා ඉතා ප්‍රසිද්ධියට පත් විහාර කීපයක් නම් රන්ගිරි දඹුළු විහාරය, රිදී විහාරය, දෙගල්දොරු විහාරය, හා කැළණි විහාරය යි.

මේ විහාරවල දැක්වෙන මහනුවර යුගයේ චිත්‍රවල කැපී පෙනෙන පොදු ලක්ෂණ තිබේ. වැඩි වශයෙන් ජාතක කථා චිත්‍රයට නගා ඇත්තේ බිත්තිවල කුඩා තීරු වශයෙනි. එක් එක් කථාව හා සම්බන්ධ සිද්ධි රාශියක් අනුපිළිවෙලින් තීරුවල දක්වනු ලැබේ. එක් එක් සිද්ධියේ දී කථා නායකයා නැවත නැවත ඇඳ දක්වනු ලබන මේ චිත්‍ර සම්ප්‍රදාය අඛණ්ඩ කථන ක්‍රමය නමින් හඳුන්වනු ලැබේ. අනුපිළිවෙලින් සිද්ධි නැරඹීමෙන් නරඹන්නෙකුට පහසුවෙන් කථාන්තරය ඉගෙන ගත හැකිය. මෙම සිතුවම්වල ජීවරූප, ගස්කොළන්, ආදිය දක්වා ඇත්තේ එකම පාද රේඛාවකය. රූපවල බාහිර රේඛාව පැහැදිලිය. අඳුර ආලෝකය නොදක්වා පැතලි වර්ණ යොදා ඇත. බොහෝ චිත්‍රවල පසුබිම තද රතින් හෝ දුඹුරු වර්ණයෙන් දක්වා ඇත.

මිනිස් රූප හැරී තිබුනත් ඇස් අඳින්නේ ඉදිරියට පෙනෙන ආකාරයටය. එසේ ම ඉදිරි බලා සිටින අයගේ පාද අඳින්නේ ඇලයට පෙනෙන ආකාරය ට ය. ගස් වල කොළ වෙන් වෙන් ව අඳිනු ලබන අතර, ඒවා මෝස්තර ස්වභාවයක් ගනියි. සිද්ධියක් ප්‍රකාශ කිරීම හැරුණු විට මෙම චිත්‍ර වලින් සියුම් හැඟීම් ප්‍රකාශ කිරීමක් සිදු නොකෙරේ. එහෙත් මේ සිතුවම් නරඹන්නාගේ ඇස් පිනවයි. මේ පොදු ලක්ෂණ නුවර යුගයේ සෑම විහාර බිතුසිතුවම්වල ම දක්නට

ලැබෙයි. මීළඟට නුවර යුගයේ විහාර කීපයක බිතුසිතුවම් වෙන් වෙන් ම විමසා බලමු.

## රන්ගිරි දඹුලු විහාරයේ බිතුසිතුවම්

ඉතා විශාල ප්‍රමාණයේ ලෙන් විහාර පහක් ඇති දඹුලු විහාරය මහනුවර යුගයේ මහා චිත්‍රාගාරයක් ලෙස සැලකිය හැකි ය. ලොකු කුඩා බුදුපිළිම වහන්සේලා සිය ගණනක් වැඩ සිටිනා මෙම ලෙන් විහාර ගෙවල බිත්ති හා ගල් සීලිම චිත්‍රවලින් ම පිරී ඇත. බුද්ධ චරිතයේ සිද්ධි හා ජාතක කතා හැරුණු විට බෞද්ධ ඉතිහාස පුවත් රාශියක් දඹුලු විහාරයේ චිත්‍රගත කොට ඇත. විජය කුමරුගේ ලංකාවතරණය, දුටුගැමුණු එළාර යුද්ධය, රුවන්වැලි මහා සෑයේ ධාතු නිධානෝත්සවය, සඟමිත් තෙරණිය ශ්‍රී මහාබොධීන් වහන්සේ වැඩමවීම ඒවායින් කීපයකි. ඉඩකඩ ඇති විශාල ගල් බිත්ති හා ගල් පියස්ස නිසා සිත්තරාට විශාල සිතුවම් ඇඳීමට ඉඩ ලැබී ඇත. එක් විහාර ගෙයක ගල් සීලිමේ ඇඳ ඇති මාර පරාජය දැක්වෙන සිතුවම කොයිතරම් විශාල ද කියතොත් නරඹන්නාගේ දර්ශන පථයට එකවර අසුකර ගත නො හැකිය.

## දෙගල්දොරු විහාරයේ බිතුසිතුවම්

මහනුවර ආසන්නයේ පිහිටි දෙගල්දොරු විහාරය කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් කරවා පූජා කරන ලද්දකි. මෙහි පිළිම ගෙය ලෙන් විහාරයකි. ඒ ඉදිරිපිට සාදන ලද මණ්ඩපයකි. පිළිමගෙයි බිත්ති, මණ්ඩපයට මුහුණලා ඇති බිත්තිත් සීලිමත් චිත්‍රකරණයට යොදා ගෙන ඇත්තේ ය. බිත්තියේ ජාතක කථා චිත්‍රයට නගා ඇත්තේ කුඩා තීරු වශයෙනි. සීලව, වෙස්සන්තර, සුතසෝම හා සත්තුභත්ත මෙහි චිත්‍රයට නගා ඇති ජාතක කථා කීපයකි. වෙස්සන්තර ජාතකයට ප්‍රධාන තැනක් හිමි වී තිබේ. එහි සිද්ධි 25 ක් චිත්‍රයට නගා ඇති අතර, එක් එක් චිත්‍රය යටින් සිද්ධියේ මාතෘකාව ද ලියා ඇත.

ඒ සිද්ධි වලින් කීපයක් පිළිවෙලින් මෙසේ ය.

1. සිවි රට සඳමහරජාණෝ රජකරන වග
2. බිහි වූ කෙනෙහි මව් දේවීන්ගෙන් දාන වස්තු ඉල් වූ වග
3. රාජාභිෂේක කළ වග
4. අලි ඇතුන් දන් දුන් වග

5. වෙසතුරු රජාණෝ දසරාජ ධර්මයෙන් රජකළ වග

දෙගල්දොරුවේ සිතුවම් අඳින ලද්දේ දෙවරගම්පොල සිල්වත් තැන නැමැත්තෙකි.

## කැලණි විහාරයේ බිතුසිතුවම්

කැලණියේ පැරණි විහාරය හා අලුත් විහාරය යනුවෙන් පිළිම ගෙවල් දෙකකි. එයින් පැරණි විහාරයේ ඇත්තේ දෙගල්දොරු විහාරයේ සිතුවම්වලට සමාන මහනුවර යුගයට අයත් බිතු සිතුවම් ය. අලුත් විහාරයේ දක්නට ලැබෙන නව ආරක බිතුසිතුවම් විසිවන සියවසේ මුල් දශකවල දී අඳින ලද්දේ සෝලියස් මැන්දිස් නැමැති ශිල්පියා විසිනි. ඒ මහතා පැරණි ඉන්දියානු අජන්තා චිත්‍ර සම්ප්‍රදායයත් පැරණි දේශීය චිත්‍ර සම්ප්‍රදායයත් මැනවින් අධ්‍යයනය කොට කලාත්මක ගුණයෙන් පරිපූර්ණ සිත් ගන්නා අලුත් චිත්‍ර සම්ප්‍රදායක් බිහිකොට ඇත්තේ ය. මේ සිතුවම් ප්‍රමාණයෙන් විශාලය. ශිල්පියා වැඩි වශයෙන් චිත්‍රයට නගා ඇත්තේ ආගමික වශයෙන් හා ඓතිහාසික වශයෙන් වැදගත් සිද්ධීන්ය. බුදුරජාණන් වහන්සේ කැලණියට වැඩීම, නාගදීපයට වැඩීම මහියංගනයේ දී යකුන් දමනය කිරීම, සමන්තකූටයේ සිරිපතුල පිහිටවීම, විජයාවතරණය, මහින්දාගමනය, ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවීම, හේමමාලා හා දන්තකුමරු දළදා වහන්සේ වැඩම කරවීම මෙහි ඇති චිත්‍රවලින් සමහරකි. සියලු දේ විස්තරාත්මකව නිරූපණය කිරීම මේ සිතුවම්වල විශේෂ ලක්ෂණයකි.

පැවරුම :

ඔබට පහසු විහාරයක බෞද්ධ බිතුසිතුවම් නරඹා එහි දී දක්නට ලැබුණු බිතු සිතුවම් පහත සඳහන් ශීර්ෂ යටතේ ලේඛන ගත කරන්න.

1. බුද්ධ චරිතය හා සම්බන්ධ සිතුවම්
2. ජාතක කථා
3. ශාසන ඉතිහාසය

## 44 පාඩම

# සඳකඩ පහණ හා එය ආශ්‍රිත කලා නිර්මාණ

පැරණි විහාරයකට හෝ දාගැබ් මලුවකට ඇතුල්වීමට ඇති පියගැට පෙළ පාමුල බෙහෝ විට අර්ධ කවාකාර ගල්පඩියක් දක්නට ලැබේ. සඳෙන් අඩක් බඳු ගල යන අරතැ ඇති ව මේ ගල් පුවරුව සඳකඩ පහණ යන නමින් හැඳින්වෙයි. මුලින් ම නෙලන ලද සඳකඩ පහණ කැටයම් රහිත වුවත් පසු කාලයේ දී එය අලංකාර කැටයමින් හෙබි කලා කෘතියක් බවට පත් විය.

සඳකඩ පහණ අපට බෙහෙවින් දක්නට ලැබෙන්නේ අනුරාධපුර හා පොළොන්නරු නටඹුන් අතර ය. අනුරාධපුර යුගයේ මැද භාගය පමණ වන විට ඉතා විශිෂ්ට ගණයේ සඳකඩ පහන බිහි වී ඇති බව පෙනේ. අනුරාධපුර යුගයේ කවර සඳකඩ පහණක වුවද කැටයම් නෙලා ඇත්තේ බොහෝ දුරට එක රටාවකටය. එහි මධ්‍යයෙහි අර්ධ පද්මයකි. එය වටා ඒකකේන්ද්‍රික ව බොරදම් වශයෙන් අනෙක් කැටයම් නෙලා ඇත්තේ ය. අර්ධ පද්මය වටා ගමන් කරන්නේ නෙළුම් කැකුළු තුඩින් ගත් හංස පේළියකි. හංස පේළියට පිටින් ලියපත් මෝස්තරයෙන් අලංකාර වූ ලියවැලක් දිවෙයි. ලියවැලට පිටින් එක එකා පිටුපසින් දිවයන සේ නිරූපිත ඇත්, ගව, සිංහ, අස්, යන සත්ව රූප වැලකි. මේ සතුන් සිව් දෙනා නැවත නැවතත් අනුපිළිවෙලින් යෙදෙයි. මේ පහනේ බාහිර අඩ රවුමේ යෙදී ඇත්තේ පලාපෙති මෝස්තරයකි. සත්ව රූප, ලියපත්, පලාපෙති, ආදිය පැතලි ගල් තලයේ ඉතා හොඳින් මතුකොට සියුම් විස්තර සහිත ව දැක්වීමට කලාරුවා සමත් වී තිබේ. සමස්තයක් වශයෙන් ගත් කල අනුරාධපුර සඳකඩ පහණ ඉතා උසස් කලා නිර්මාණයකි. අනුරාධපුරයේ අභයගිරි විහාර ප්‍රදේශයේ මහසෙන් මණ්ඩපය (බිසෝමාලිගය) නැමැති ගොඩනැගිල්ල ආසන්නයේ පිහිටි සඳකඩ පහණ විශිෂ්ට ගණයේ නිර්මාණයක් ලෙස සලකනු ලැබේ.

පොළොන්නරුවේ සඳකඩ පහණ කරුණු කීපයකින් අනුරාධපුර සඳකඩ පහණට වඩා වෙනස් වෙයි. ගවරූපය කැටයම් අතරින් ඉවත් කර තිබීම එහි විශේෂ ලක්ෂණයකි. පොළොන්නරු යුගය හින්දු බලපෑම වැඩි වූ කාලයකි. හින්දුවරුන්ගේ ශුද්ධ සත්වයකු වූ ගවයා පයට පෑගෙන ගල් පඩියෙන් ඉවත් කරන්නට ඇත. යනු මේ පිළිබඳව උගතුන් දරන මතයයි. අනුරාධපුර යුගයේ

සඳකඩ පහණේ සත්ව පෙරහැර පොළොන්නරු සඳකඩ පහණේ යොදා ඇත්තේ ඇත් පෙළක්, අශ්ව පෙළක්, සිංහ පෙළක් වශයෙන් එක් එක් සත්වයා වෙන් වෙන් වශයෙනි. පොදුවේ සැලකූ විට පොළොන්නරු සඳකඩ පහණ අනුරාධපුර සඳකඩ පහණට වඩා චාම් බවින් හා කලාත්මක බවින් අඩු යයි කිව හැකිය.

පොළොන්නරුවේ වටදාගෙයි උතුරු දොරකඩ පිහිටි සඳකඩ පහණ ඒ යුගයට අයත් උසස් සඳකඩ පහණ ලෙස සලකනු ලැබේ.

මහනුවර යුගය වන විට සඳකඩ පහණේ ලොකු වෙනසක් සිදු වී ඇති බව පෙනේ. මධ්‍යයෙහි නෙළුම් මල අඩක් නොව සම්පූර්ණයෙන් ම නිරූපිත බැවින් සඳකඩ පහණෙ හැඩය අඩ කවයකට වඩා විශාල වී ඇති බව පෙනේ. එය තරමකට ත්‍රිකෝණාකාර හැඩයකට ළංවී ඇත. මෝස්තර අතරින් සත්ව රූප ඉවත් වී ඇත. නෙළුම් මල හැරුණු පසු ඉතිරි කොටස සම්පූර්ණයෙන් ම වාගේ ලියවැල හා ලියපත ඇසුරෙන් සකස් වූ නිර්මාණයන්ගෙන් යුක්ත වෙයි. මෙසේ යුගයෙන් යුගය සඳකඩ පහණ වෙනස් වුවත් එය ලාංකික කලාකරුවන්ගේ උසස් නිර්මාණයක් ලෙස පිළිගනු ලැබේ. සඳකඩ පහණට ගැබ් වූ විශිෂ්ට අර්ථයක්ද ඇත්තේය. ඒ පිළිබඳ ව ඔබට ඊළඟ ශ්‍රේණියේ දී ඉගෙන ගැනීමට ලැබෙනවා ඇත.

සඳකඩ පහණ ආශ්‍රිතව පිහිටි තවත් කලා නිර්මාණ කීපයකි. ඒවා නම් පියගැට, කොරවක් ගල් හා මුරගල් ය.

පියගැට

පියගැට යනු ගල් පඩි ය. දාගැබ් මලුවකට හෝ විහාර මලුවකට නැගීමට ඇති පියගැට පෙළක පහළ ම ගල් පඩිය නම් මුලින් සඳහන් කරන ලද සඳකඩ පහණ යි. සඳකඩ පහණෙහි ම විස්කම්භයට සමාන දිගක් ඇති පියගැට ආයතාකාරය. මෙම පියගැටවල පයට නොපෑගෙන සිරස්තලය කැටයමින් අලංකාර කරන ලද්දේ වෙයි.

අනුරාධපුර හා පොළොන්නරු පියගැටවල සිරස්තලයෙහි බෙහෙවින් දක්නට ලැබෙන කැටයම් බරක් උසුලාගෙන සිටින ආකාරයෙන් නිරූපිත වාමන රූප හෙවත් මිටි මිනිස් රූප යි. අනුරාධපුරයේ බොහෝ පියගැටවල

දෙකෙලවර හා මැද වාමන රූප තුනකි. දෙඅත් දණමත තබා ඉදිරිපස බලා ගෙන මුවගට සිනාවක් නගා ගෙන, උදරය ඉදිරියට නෙරා සිටින අයුරින් වාඩි වී සිටින මෙම අගුටුමිට්ටන් දකින කාගේ වුවද මුවග සිනාවක් නැගෙනු ඇත. පොළොන්රුවේ පියගැටවල දක්නට ලැබෙන විශේෂ වෙනස නම් මෙම වාමන රූප සංඛ්‍යාවෙන් වැඩිවීම හා ඒවායේ ඉරියව් වෙනස් වීමයි.

## කොරවක් ගල්

පියගැට පෙල දෙපස පිහිටි කැටයමින් අලංකෘත විශාල ගල් පුවරු දෙකකි. කොරවක්ගල් නමින් හැඳින්වෙන්නේ මේ ගල් පුවරුය. පියගැට පෙලේ ආරක්ෂාව සැපයීමත්, පියගැට මත ගමන් කරන්නවුනට අත් වැලක ආධාරය ලබා දීමත්, එසේ ම පියගැට පෙලට අලංකාරයක් ලබාදීමත් කොරවක් ගලෙන් අපේක්ෂා කරන ලද බව සිතිය හැකි ය.

අනුරාධපුරයේ හා පොළොන්නරුවේ කොරවක් ගලක ශීර්ෂය මකර මුඛයකින් නිකුත් වන ලියවැලක ස්වභාවය ගනී. ලියවැල කෙළවර වන්නේ වෘත්තාකාර දගරයකින් හෙවත් සංඛපූරි ලතාකරණයකිනි. මකර රූපයේ පාද පිහිටියේ කොරවක් ගලේ පසු භාගයේ මතුකර ඇති කුළුණු ආකෘතියක ජේකඩ මතය. මකරාගේ හිස හා කඳ පියුම් ලියකමින් අලංකාර කොට ඇත්තේ ය. කොරවක් ගලක පිටට පෙනෙන බිත්තියහි හෙවත් සිරස් තලයෙහි ද අලංකාර කැටයම් දැකිය හැකිය. මේවායේ බොහෝ විට දක්නට ලැබෙන්නේ විවිධ ඉරියව්වෙන් සිටින සිංහ, හස්ති හෝ වාමන රූප කැටයම් ය.

මකර හිස් සහිත කොරවක් ගල් වෙනුවට ගජසිංහ හිස්, ඇත් හිස් හෝ සිංහ හිස් සහිත කොරවක් ගල් පොළොන්නරු යුගයෙන් පසු කාලයේ දක්නට ලැබේ. යාපහුවේ දළදා මාළිගාවේ පියගැට පෙළෙහි දෙපස යොදා ඇති ගජසිංහ රූප සහිත කොරවක් ගල් එක් උදාහරණයකි.

## මුරගල්

කොරවක් ගල්වලට ඉදිරිපසින්, සඳකඩ පහණට දෙපසින් සිටුවා ඇති සාමාන්‍යයෙන් අර්ධ කවාකාර මුදුනක් සහිත කැටයම් කළ ගල් පුවරු මුරගල් නමින් හැඳින් වේ. ද්වාරපාල රූප දොරටුපාල රූප නමින් හඳුන්වන්නේ ද මේ

මුරගල් මය. පලාපෙති හැඩයෙන් යුත් ආදිම මුරගල් කැටයම් රහිත ගල් පුවරුය. පසු කාලයේ පූර්ණඝටය හෙවත් පුන් කලස, බහිරව රූප (වාමන රූප වැනි මිටි මිනිස් රූප) පෙණ පහක් හෝ හතක් සහිත නාග රූප, මිනිස් වෙසින් සිටින නා රජ රූප යන මේවායින් එකක් මුරගල් කැටයම් වශයෙන් යෙදී ඇති බව පෙනේ.

මුරගලක දියුණු ම අවස්ථාව මිනිස් වෙයින් සිටින නා රජ රුව සහිත මුරගල් ය. නා රජුගේ හිස වටා විහිදෙන නයි පෙණ මලාවකි. ත්‍රිභංග ලීලාවෙන් නැගී සිටින නා රජුගේ වැලමිටෙන් ඉහළට නැමුණු එක් අතක ඇත්තේ මල් පිරවූ පුන් කලසකි. අනෙක් අතේ ඇත්තේ මල් අත්තක් වැනි දෙයකි. නා රජු ගේ දෙපා මුල වාමන රූප එකක් හෝ දෙකක් වෙයි.

කලා කෘතියක් වශයෙන් ඉතා ම අගය කරනු ලබන මුරගල හමු වන්නේ අනුරාධපුරයේ රත්න ප්‍රාසාදය නැමැති ගොඩනැගිල්ලෙනි. මුහුණේ ප්‍රියංකර භාවයත්, සිරුරේ සියුමැලි බවත් එහි ශිල්පියා මැනවින් පෙන්වා තිබේ. නා රජුගේ යටිකය අලංකාර ධෝතියකින් සැරසී ඇති අතර උඩුකය විවෘත නමුත් මාල හා වෙනත් පළඳනා විශේෂයන්ගෙන් සැරසුණේ වෙයි. දෑත් හා දෙපය වළලුයෙන් සැරසුනේ ය. අලංකාර ඔටුන්නක් හිස පැළඳ සිටින නා රජුගේ එල්ලෙන කන් හෙවත් ළඹ සවන් හි රැඳි කර්ණාභරණ උරහිස් ස්පර්ශ කරයි. රෙදිපිළිවල සියුම් රැලි හා ආභරණවල සියුම් කැටයම් පවා පෙන්වීමට මූර්ති ශිල්පියා සමත් වී සිටී. ආභරණ හා රෙදිපිළි අතරින් ශරීර අවයවයන්ගේ හැඩයත්, මස් පිඩුවල මෘදු බවත් මතු කර පෙන්වා ඇති මේ මුරගල ගුප්ත මූර්ති කලා ලක්ෂණ පෙන්වන බව කලා විචාරකයෝ කියති.

45 පාඩම

# පෙරදිග ථෙරවාදි බෞද්ධ රටවල්

බුදු දහමේ ප්‍රධාන ශාඛා දෙකකි. එකක් ථෙරවාද බුදුදහමය. අනෙක මහායාන බුදු දහම ය. බුදුරජාණන් වහන්සේ වදාළ පිරිසිදු බුදු දහම මේ යයි මහතෙරවරුන් විසින් සම්මත කර ගැනීමෙන් පසු ව පැවත එන්නේ ථෙරවාද බුදු දහමයි. මහින්ද මහරහතන් වහන්සේ විසින් ලක් දිවට ගෙන එනු ලැබ ශ්‍රී ලංකාවේ පවතින්නේ ථෙරවාද බුදුදහමයි. ථෙරවාද බෞද්ධයෝ බුදු, පසේබුදු, මහරහත් යන තුන්තරා බෝධියෙන් එක් බෝධියකින් නිවන් ලැබීමට අපේක්ෂා කරති. මහායාන බෞද්ධයෝ බුද්ධත්වය ලබා ගැනීමෙන් පමණක් නිවන් ලැබීමට අපේක්ෂා කරති. බුද්ධත්වය නිවන් ලබා ගැනීමේ උසස් ම මාර්ගය බැවින් එය මහායානය නමින් හැඳින්වෙයි.

මහායාන බුදුදහම වැඩී ඇත්තේ තිබ්බතය, චීනය, ජපානය, කොරියාව ආදී උතුරු දිග ආසියාතික රටවල ය. ඒ රටවල පරිසරයේ බලපෑම නිසා ඇති වූ විශේෂ සංස්කෘතික ලක්ෂන මහායානයේ දක්නට ලැබෙයි. ඒ පිළිබඳව ඔබට ඊළඟ ශ්‍රේණියේ දී ඉගෙනීමට ලැබෙනු ඇත. මේ පාඩමෙන් ඔබට ඉගෙනීමට ලැබෙනේ පෙරදිග ථෙරවාද බෞද්ධ රටවල් පිළිබඳ ව ය.

ශ්‍රී ලංකාව ථෙරවාද බුදුසමය පවත්නා ප්‍රධාන රටකි. ශ්‍රී ලංකාවට මෙන් පැරණි ඉතිහාසයක් ඇති ථෙරවාද බුදුසමය පවත්නා රටවල් කීපයක් අග්නිදිග ආසියාවේ ඇත්තේය. එකිනෙකට සම්බන්ධ ව පිහිටි මේ රටවල් නම් මියන්මාර් හෙවත් පැරණි බුරුමය, තායිලන්තය හෙවත් පැරණි සියම, ඛ්මේර් හෙවත් කාම්බෝජය සහ ලාඕසය යි. මේ හැරුණු විට නේපාලය, බංගලිදේශය හා ඉන්දියාවේ විශාල ප්‍රදේශයක ද වර්තමානයේ දී ථෙරවාද බුදුදහම පැතිර පවතී.

සිතියමෙන් මේ රටවල පිහිටීම බලාගත හැකි ය. මේවායින් රටවල් වැඩි ගණනක් අතීතයේ සිට ම ලංකාව සමග සම්බන්ධකම් පවත්වන බැවින් ඒවා ගැන දැන සිටීම ප්‍රයෝජනවත් ය.

## මියෙන්මාර්

වර්තමානයේ දී මියෙන්මාර් නමින් හැඳින්වෙන මේ රට නුදුරු අතීතයේ දී හැඳින්වුණේ බුරුමය නමිනි. ඊටත් පෙර මරම්ම දේශය, රාමඤ්ඤ දේශය යන නම් වලින් ද එරට හැඳින්වුණේය. ඉරවඩි නදියෙන් ජලාශ්‍රිත වන මේ රට ශ්‍රී ලංකාව මෙන් දස ගුණයක් විශාල වෙයි. රැන්ගුන් හා මණ්ඩලේ මෙහි ප්‍රධාන නගර දෙකකි.

මියෙන්මාර් රටට බුදු සමය පැමිණ ඇත්තේ ද ලක්දිවට බුදුසමය පැමිණි කාලයේ දී ය. අශෝක රජතුමා විසින් ධර්ම ප්‍රචාරය සඳහා යැවූ සෝණ හා උත්තර යන හිමිවරුන් වැඩියේ යයි සඳහන් වන ස්වර්ණ භූමිය මියෙන්මාර් හෙවත් බුරුම දේශය බව බුරුම බෞද්ධයෝ පිළිගනිති. ඈත අතීතයේ දී මෙරට දියුණුව පැවති බෞද්ධ රාජ්‍ය දෙකක් නම් හංසවතී රාජ්‍යය හා සුධම්මවතී රාජ්‍යයයි.

11 වන සියවසේ දී ද බුරුමයේ දී බුදුදහම දියුණුව පැවති බව පෙනේ. එකල ඒ රජ්‍යය හැඳින්වුණේ අරිමද්දන පුරය නමිනි. එහි රජකල අනවරථ හෙවත් අනුරුද්ධ (1044-1077) රජතුමාටත් ඔහු පුත් කෙයං සිත්ථ (1084 - 1113) රජතුමාටත් එකල බුරුමයේ පැවති බෞද්ධ සංස්කෘතික දියුණුවේ කීර්තිය හිමි වේ. සුප්‍රසිද්ධ ස්වේදගොන් චෛත්‍යය ඉදිවුණේද මේ රජවරුන්ගේ කාලයේ දී ය. එකල බුරුමයේ සෑම කඳු ගැටයක් ම විශාල දාගැබ් හා විහාර මන්දිරවලින් බැබළුණු බව කියනු ලැබේ.

ශ්‍රී ලංකාවත්, මියෙන්මාර් හෙවත් බුරුම රටත් අතර සම්බන්ධය අතීතයේ සිට මේ දක්වා ම පවතී. එක් එක් රටේ බුදුදහම පිරිහී ගිය විට දී අනෙක් රටින් උදව් ලබා ගෙන ශාසනික දියුණුව ඇති කර ගැනීමට උත්සාහ කළ අයුරු දෙරට ඉතිහාසයෙන් පෙනේ.

ලංකාවේ බුදු සසුන පිරිහී ගිය අවස්ථාවක දී උපසම්පදාව ඇති කිරීම සඳහා 1 වන විජයබාහු රජතුමා (1055 - 1110) සිල්වත් උපසම්පදා භික්ෂූන් වැඩම කරවා ගත්තේ බුරුම දේශයෙනි. බුරුමයේ බුදු සසුන පිරිහී ගිය විටක එරට ධම්මචේතිය රජතුමා කෝට්ටේ සිටු වන භුවනෙක බා රජු වෙත බුරුම භික්ෂූන් එවා සිංහල භික්ෂු සංඝයා වෙතින් උපසම්පදා කරවා ගත්තේ ය.

දැනට ලක්දිව පවත්නා අමරපුර නිකාය හා රාමඤ්ඤ නිකාය අරඹුණේ ද බුරුමයෙනි. වැලිතර අඹගහපිටියේ ඥානවිමල තිස්ස මහ තෙරණුවෝ බුරුමයට වැඩ උපසම්පදාව ලබා ගෙන විත් 1802 දී ලක්දිව අමරපුර නිකාය ආරම්භ කළහ. 1862 දී බුරුම දේශයට වැඩම කළ අඹගහවත්තේ ඉන්දා සහ වරඤාණ සාමි ලක් දිවට පැමිණ රාමඤ්ඤ නිකාය නැමැති භික්ෂු පරපුර ආරම්භ කළහ.

බුරුම බෞද්ධයෝ ඉතා ම ශ්‍රද්ධාවත්හු ය. ප්‍රතිපත්ති ගරුකය. ඔවුහු භාවනා කිරීමටත් අභිධර්මය ඉගෙනීමටත් විශේෂ කැමැත්තක් දක්වති. සෑම පිරිමියෙකු ම ටික කලක් හෝ පැවිදි වී සිටීම එරට සම්ප්‍රදායකි. ඉතා හොඳ ගිහි පැවිදි සම්බන්ධයක් තිබීම ද බුරුමයේ කැපී පෙනෙන ලක්ෂණයකි.

ලක්දිව බෞද්ධ සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට බුරුම බෞද්ධයෝ නිතර පැමිණෙති. එසේ ම සැදැහැවත්තු ලක්දිව බෞද්ධ කටයුතුවලට පරිත්‍යාග ද කරති.

## තායිලන්තය

මියෙන්මාර් රටට යාබදව නැගෙනහිරින් පිහිටියේ වර්තමාන තායිලන්තය හෙවත් පැරණි සියම් රට යි. මිනැම් ගඟෙන් ජලාශ්‍රිත වන මේ රටේ වාසය කරන්නේ ගොවි ජනතාවකි. බැංකොක් මෙහි වර්තමාන අගනුවරයි.

ජනප්‍රවාද අනුව තායිලන්තයට බුදු සමය පැමිණ ඇත්තේ ක්‍රි. පූ. 3 වන සියවසසේ දී ය. ස්වර්ණභූමියට පැමිණි සෝණ හා උත්තර යන තෙරුන් වහන්සේලා ගෙන් ම එරටටත් බුදුසමය පැමිණි බව තායි වැසියෝ පිළි ගනිති. ක්‍රි. ව. 7 වන සියවස පමණේ දී ද්වාරවතී නැමති බෞද්ධ රාජ්‍යයක් එරට තිබූ බව හියුං සාං කියයි.

ශ්‍රී ලංකාවත් තායිලන්තයත් අතර සම්බන්ධකම් 13 වන සියවසේ දී පැවති බව පෙනේ. එකල තායිලන්තයේ සුඛෝදය රාජ්‍යයේ සිටි රෝච නම් රජතුමා ලක්දිවින් මහානුභාව සම්පන්න බුදු පිළිම වහන්සේ නමක් ලබාගත් බව එරට ශාසන වංශයේ සඳහන් ය. සීහල පටිමා නමින් හැඳින්වෙන බුදු පිළිම වහන්සේලා කීප නමක් මේ දක්වා ම එරට වැඩ වෙසෙති.

කෝට්ටේ ස වන සිරි පැරකුම්බා රජු සමයේ ද තායි භික්ෂූන් වහන්සේලා පිරිසක් ලක්දිවට පැමිණ උපසම්පදාව ලබා ගෙන ගිය බව ඉතිහාස ගත වාර්තා වල සඳහන් ය. ලක්දිව බුදුසමය පිරිහී ගිය අවදියේ දී වැලිවිට ශ්‍රී සරණංකර මාහිමියන් ගේ ඉල්ලීම පිට 1795 දී මෙහි පැමිණි උපාලි හිමියන් ප්‍රමුඛ සියම් භික්ෂූන් වහන්සේලා ලක්දිව උපසම්පදාව නැවතත් ඇති කළහ. මෙකල පවත්නා සියම් නිකාය නමැති භික්ෂු පරපුර ආරම්භ වූයේ එමගිනි.

තායිලන්තයේ රජයේ ආගම බුදුදහමයි. සියලු ම බෞද්ධ කටයුතු කෙරෙන්නේත් වෙහෙර විහාර ආදිය පාලනය වන්නේ ත් රාජ්‍ය දෙපාර්තමේන්තුවක් යටතේය. බුරුමයේ මෙන් ම තායිලන්ත පිරිමි අඩු වශයෙන් තෙමසක් වත් පැවිදි ව පිළිවෙත් රැකීමට අමතක නො කරත්, ටික කලක් හෝ පැවිදිව සිටී ම එරට ගිහියෙකු විවාහයට ලබන සුදුසු කමකි. මනා ගිහි පැවිදි සම්බන්ධයක් ද එරට පවතී. එරට වැසියෝ භික්ෂූන් වහන්සේලාට තම පවුලේ අයට මෙන් ප්‍රිය මනාප බවක් දක්වන අතර ගෞරව කරති.

භික්ෂූන් වහන්සේලාගේ පාලනය සඳහා මනා පැවිදි සංවිධානයක් ද තායිලන්තයේ ඇත. තායි පන්සල බෞද්ධ සාරධර්ම පුරුදු පුහුණු කරන මධ්‍යස්ථානයකි. එමෙන් ම දරුවන්ගේ චරිත වර්ධනය සඳහා සුදුසු අධ්‍යාපනයක් ලබාදෙන අධ්‍යාපන මධ්‍යස්ථානයකි.

## ඛ්මේර්

වර්තමානයේ ඛ්මේර් රාජ්‍ය නමින් හැඳින්වෙන පැරණි කාම්බෝජය ථෙරවාදී බෞද්ධ රටකි. එය තායිලන්තයට යාබ ද ඊට නැගෙනහිරින් පිහිටියේ ය. (සිතියම බලන්න) මිකොං නදියෙන් ජලාශ්‍රිත වන මෙය ද කෘෂිකාර්මික රටකි. එහි අගනුවර නොම්පෙන්ග් ය.

ඛ්මේර් රාජ්‍යයේ මුල් කාලයේ තොරතුරු පැහැදිලි නැත. එහෙත් 12 වන සියවසේ සිට එය ලංකාව සමග සම්බන්ධකම් පැවැත්වූ බව පෙනේ. මහ පැරකුම්බා රජු දවස සිංහල කුමරියක කාම්බෝජයට යැවූ බවත් සඳහන්ය. එසේම එකල කාම්බෝජ රජුගේ පුත් කුමරකු වූ ෂින්තාමලින් ද පැවිදි ව ලක් දිව දී උපසම්පදාව ලැබූ බවට ඓතිහාසික වාර්තා තිබේ. කෝට්ටේ ස වන පැරකුම්බා රජ සමයෙහි දී කාම්බෝජ භික්ෂූන් වහන්සේ අට නමක් කැළණියේ දී සිංහල භික්ෂු සංඝයා වෙතින් උපසම්පදාව ලැබූ බව ජිනකාල මාලිනී නැමැති ග්‍රන්ථයේ සඳහන් ය.

හින්දු ධර්මය ද පැතිර තිබූ කාම්බෝජයේ 12 වන සියවසේ සිට බුදු දහම බලවත් වූ බව පෙනේ. අද ඛ්මේර් රාජ්‍යයේ රාජ්‍ය ආගම බුදු දහම වී තිබේ. එරට රජතුමාගේ සහාය ඇති ව භික්ෂූන් වහන්සේලා පාලනය වේ. නායක තනතුරුවලට භික්ෂූන් වහන්සේලා පත් කරනු ලබන්නේ රජතුමා විසිනි. අරණ්‍යවාසී හා ග්‍රාම වාසී යනුවෙන් වර්තමාන භික්ෂු සමාජය කොටස් දෙකකි. ජනගහනය අනුව බලන විට විශාල භික්ෂු පිරිසක් සිටින රටකි. බුරුමයේ හා තායිලන්තයේ මෙන් ම මෙහි පිරිමි ද ටික කලක් හෝ පැවිදි වී සිටීමට කැමැත්ත දක්වති. කාම්බෝජ පන්සල ද පාසලක් මෙනි. සියලු දෙනා ම පාහේ පන්සලෙන් ඉගෙනීම ලබති.

ලාඕසය

ඛ්මේර් රාජ්‍යයට උතුරින් තායිලන්තයට ද යාබද ව පිහිටි ලාඕසය කඳුකර රටකි. එය ද ථෙරවාද බෞද්ධ රටකි. ලුඅං ප්‍රභං එහි අගනුවරයි. මෙහි දේශපාලන තොරතුරු හමුවන්නේ 14 වන සියවසේ සිටය. එහි බුදු දහම පැතිර ගොස් ඇත්තේ ත් ඒ කාලයේ ය. එහි ධර්ම ප්‍රචාරය කළ භික්ෂූන් අතර සිංහල භික්ෂූන් වහන්සේලා ද සිට බව පෙනේ.

වරින් වර ලාඕසය තායි බලයට හෝ කාම්බෝජ බලයට යටත් වුවද එයින් එරට ආගමික කටයුතුවලට හානියක් සිදු වූ බව නො පෙනේ. ඒ කාම්බෝජයත් තායිලන්තයත් ථෙරවාද බෞද්ධ රටවල් වූ බැවිනි.

ලාඕසයේ ගිහි පැවිදි ජීවිත ද බොහෝ දුරට අසල්වැසි රටවල ගිහි පැවි දි ජීවිතවලට සමාන බව කිව හැකිය.

## ඉන්දියාව

ඉන්දියාවේ බුදුදහම පිළිබඳ තත්ත්වය කෙසේ දැයි දැන් විමසා බලමු.

බුද්ධ කාලයේ දී ම මගධ, කොසල වැනි රාජ්‍යවල බහුල වශයෙන් බුදුදහම ව්‍යාප්ත විය. ක්‍රි.පූ. 3 වන සියවසේ දී උතුරු ඉන්දියාවේ විශාල ප්‍රදේශයක පමණක් නොව ඉන්දියාවෙන් පිටත ද බුදුදහම පැතිර ගියේය. කනිෂ්ක රාජ සමයත් (ක්‍රි. ව. 1 වන සියවස) හර්ෂ රාජ සමයත් (ක්‍රි. ව. 6 වන සියවස) ඉන්දියාවේ බුදුදහම දියුණුව තිබූ තවත් කාල පරිච්ඡේදයන්ය. ක්‍රි. ව. 12 වන සියවස වන විට ඉන්දියාවේ දේශපාලන බලය ලැබුණේ මුස්ලිම්වරුන්ටය. මුස්ලිම් අධිරාජ්‍ය තුළ බුදු දහම ඉන්දියාවෙන් සම්පූර්ණයෙන් ම තුරන් වීමට කටයුතු සැලසිණ.

නැවත ඉන්දියාවට බුදුදහම හඳුන්වා දෙන ලද්දේ 19 වන සියවසේ අග භාගයේ දී අනගාරික ධර්මපාලතුමන් විසිනි. බුදුරදුන් බුද්ධත්වය ලැබූ බුද්ධගයාව හින්දුන්ගෙන් බේරා ගැනීමට අනගාරික ධර්මපාලතුමාට මහ සටනක් කරන්නට සිදු විය. 1891 දී එතුමා විසින් මහාබෝධි සමාගම ආරම්භ කරන ලද්දේ මේ සඳහාය. නීති මාර්ගයෙන් කටයුතු කිරීම නිසා 1896 දී බුද්ධගයාව බෞද්ධයාට ලැබුණි. අනගාරික ධර්මපාලතුමාගේ පුරෝගාමීත්වයෙන් බුද්ධගයාවේ බෞද්ධ මධ්‍යස්ථානයක් පිහිටුවා ධර්මප්‍රචාරක කටයුතු අරඹන ලද්දේය. ධර්මප්‍රචාරක කටයුතු සඳහා ලක්දිව භික්ෂූන් වහන්සේලා එහි වැඩියහ. ඉන්දියා මහාබෝධි සමාගමේ ශාඛා දැන් බුද්ධගයා, සාරානාත්, ලුම්බිණි, ලක්නව්, සාංචි හා නවදිල්ලිය ආදී ස්ථානවල පිහිටුවා ඇති අතර, ථෙරවාදී බුදුදහම අදහන අයගේ ගණන ක්‍රමයෙන් වැඩිවෙන බව පෙනේ.

ලක්දිවින් වැඩි භික්ෂූන් වහන්සේලා ඉහත සඳහන් මධ්‍යස්ථානවල සේවය කරති. 2500 සම්බුද්ධ ජයන්තිය සැමරූ 1956 වර්ෂයේදී ඉන්දියාවේ අපූරු සිද්ධියක් සිදු විය. හින්දු කුලවාදය නිසා සමාජ අසාධාරණයක් දීර්ඝ කාලයක් පීඩා විඳි දකුණු ඉන්දියානු හරිජන කුලහීනයන් පන්ලක්ෂයක්

දෙනා ආචාර්ය බී. ආර්. අම්බේඩ්කාර්ගේ මෙහෙයීම යටතේ බුදුසමය වැළඳ ගැනීම ඒ සිද්ධියයි.

මිනිසත් බව අගයන බුදුදහම පැතිරයාම කාට වැලකිය හැකි ද?

පැවැරුම

බුදුදහම වෙනත් රටවල තහවුරු කිරීමට හෝ ව්‍යාප්ත කිරීමට ශ්‍රී ලංකාව උදවු වූ අවස්ථාවන් කෙටියෙන් දක්වන්න.

46 පාඩම

## අපරදිග රටවල ථෙරවාදී බුදුසමය

ක්‍රිස්තු පූර්ව 3 වන සියවසේ දී අශෝක අධිරාජයාගේ සමයේ දී බුදුදහම ඉන්දියාවෙන් පිටරටවලට ද පැතිර ගියේය. අශෝක ධර්ම දූතයන් ගිය එක් රටක් නම් යෝනක දේශයයි. කෙනෙක් මෙය ග්‍රීසිය ලෙස හඳුන්වති. එහෙත් ඒ රටවල බුදුදහම පැතිර ගිය බවක් නොපෙනේ. ක්‍රිස්තු වර්ෂය ආරම්භයෙන් ටික කලකට පසු රාජකීය අනුග්‍රහය ද ලැබ යුරෝපීය රටවල පැතිර ගියේ ක්‍රිස්තු ධර්මයයි.

ථෙරවාද බුදු සමය පිළිබඳ පණිවිඩය මුලින් ම යුරෝපීය රටවලට ගියේ ඉංග්‍රීසි යටත් විජිතයන්හි සේවය කළ ඉංග්‍රීසි උගතුන් කීප දෙනෙකුගේ මාර්ගයෙනි. ලංකාව, ඉන්දියාව වැනි රටවල පාලි හා සංස්කෘත යන භාෂාවලින් ලියැවුණු වටිනා සාහිත්‍යයක් ඇති බව ඔවුනට පෙනී ගියේය. පාලි හා සංස්කෘත ඉගෙනගත් ඔවුහු මේ පොත් කියවා බැලූහ. බටහිර උගතුනට ද මේ සාහිත්‍ය ග්‍රන්ථ හඳුන්වා දීමට ඔවුහු සිතූහ.

1837 දී ජෝර්ජ් ටර්නර් නැමැත්තා අපේ මහාවංශය නමැති ඉතිහාස ග්‍රන්ථය ඉංග්‍රීසියට පරිවර්තනය කොට ඉංග්‍රීසි උගතුනට ඉදිරිපත් කළේය. මෙයින් ප්‍රබෝධයට පත් ඉන්දීය දර්ශන ශාස්ත්‍ර පිළිබඳ උගතකු වූ හේගන් හි වින්සන්ට් පෝස්බෝල් මහතා 1855 දී ධම්මපදයේ ලතින් පරිවර්තනයක් ඉදිරිපත් කළේය. ඉංග්‍රීසි පාඨකයන්ගේ අවධානය බුදුදහම කෙරෙහි යොමු කළ ඉතා වැදගත් ග්‍රන්ථයක් 1879 දී පිට විය. එය නම් ශ්‍රීමත් එඩ්වින් අර්නෝල්ඩ් මහතාගේ ආසියා ආලෝකය නමැති බුද්ධ චරිත කාව්‍යයයි. මේ පොත කොයිතරම් ජනප්‍රිය වීද යත්න එය එංගලන්තයේ දී 60 වාරයකට වැඩියෙනුත්, ඇමරිකාවේදී 80 වාරයකට වැඩියෙනුත් මුද්‍රණය වීමෙන් පෙනේ. මෙ පොත ලක්ෂ සංඛ්‍යාත ඉංග්‍රීසි පාඨකයන්ගේ සිත් දිනා ගැනීමට පොහොසත් වී තිබේ.

බුදුදහමේ වැදගත් කම තේරුම්ගත් උගත්තු එය මුලින් ම ලියැවී ඇති පාලි පොත් කියැවීමට උනන්දු වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1881 දී එංගලන්තයේ පාලි පොත් සමාගම පිහිටුවන ලද්දේය. එය බුද්ධ ධර්මය ඇතුළත් පාලි ත්‍රිපිටක ග්‍රන්ථ ඉංග්‍රීසි අකුරෙන් මුද්‍රණය කළ අතර ඒවායේ ඉංග්‍රීසි පරිවර්තන ද ඉදිරිපත් කළේය.

පාලි පොත් සමාගම වෙනුවෙන් ත්‍රිපිටක පොත් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමෙහි යෙදුණු ප්‍රසිද්ධ දෙදෙනෙක් නම් ටී. ඩබ්ලිව්. රීස්. ඩේවිඩ් පඬිතුමාත් එතුමාගේ බිරිඳ වූ සී. ඒ. රීස් ඩේවිඩ් මැතිණියත් ය.

ලංකාවේ සිවිල් නිලධාරියෙකු ව සිටි කාලයේ දී (1864-1872) රීස් ඩේවිඩ් මහතා කොළඹ විද්‍යෝදය පිරිවෙනෙන් පාලි ඉගෙන ගත් කෙනෙකි.

1902 දී ඇලන් බෙනට් නම් කතෝලික මහතෙක් බුරුමයට ගොස් ආනන්ද මෛත්‍රීය නමින් පැවිදි විය. ඉන්පසු උන්වහන්සේ ආපසු එංගලන්තයට පැමිණ බෞද්ධ ධර්ම ප්‍රචාරක කටයුතු ආරම්භ කළහ. 20 වන සියවසේ මුල් භාගයේ දී එංගලන්තයේ ධර්ම ප්‍රචාරක කටයුතුවලට උදව් වූ තවත් ඉංග්‍රීසි ජාතිකයෙක් නම් ක්‍රිස්මස් හම්ප්‍රීස් මහතාය. එතුමා ලන්ඩන් බෞද්ධ සමාගම පිහිටුවා ඉංග්‍රීසියෙන් බෞද්ධ පොත් පත් රාශියක් ලියා ප්‍රසිද්ධ කළේය.

එංගලන්තයේ බෞද්ධ ධර්ම ප්‍රචාරක කටයුතු ක්‍රමවත්ව ආරම්භ වූයේ 1926 දී අනගාරික ධර්මපාලතුමා විසින් ලන්ඩන් නුවර මහාබොධි සමාගම පිහිටුවීමෙන් පසුවය. 1954 දී ලන්ඩන් නුවර බෞද්ධ විහාරයක් ආරම්භ කරන ලද්දේය. මෙයින් එරට බෞද්ධ උගතුනට ආගමානුකූල ජීවිතයක් ගත කිරීමට ඉඩ සැලසිණ. ලන්ඩන් බෞද්ධ විහාරයේ කලක් අධිපති ව වැඩ සිටි හම්මලව සද්ධාතිස්ස හිමියන්ගෙන් එරට ධර්ම ප්‍රචාරක කටයුතුවලට ලොකු සේවයක් විය. 1994 මැයි මාසයේ දී ලන්ඩන් බෞද්ධ විහාර ලන්ඩන් නුවර බෙඩ්පෝර්ඩ් උද්‍යානයේ ඉඩකඩ ඇති වඩා හොඳ ගොඩනැගිල්ලකට ගෙන යන ලද්දේය. මෙකල එහි අධිපති ව වැඩ සිටිමින් ධර්ම ප්‍රචාර කටයුතුවල යෙදෙන්නේ ආචාර්ය මැදගම වජිරඥාණ නායක හිමිපාණන් වහන්සේය.

ලන්ඩන් විහාරයෙන් ධර්මඥානය ලබාගත් බෞද්ධයෝ මැන්චෙස්ටර්, ලීඩ්ස්, ඔක්ස්ෆර්ඩ්, බයිටන්, කේම්බ්‍රිජ්, තේම්ස් වැනි නගරවල ද බෞද්ධ මධ්‍යස්ථාන පිහිටුවා ගෙන සිටිති. ක්‍රිස්තු භක්තිකයන් ද බුදුදහම ඉගෙනීමට උනන්දුවක් දැක්වීම එංගලන්තයේ විශේෂ ලක්ෂණයකි. 1980 වන විට 60,000ක් පමණ බෞද්ධයන් එහි සිටි බව පෙනේ.

බෞද්ධ පොත පත පිළිබඳව විචාරාත්මක ඉගෙනුමක් කරන තවත් යුරෝපීය රටක් නම් ප්‍රංශයයි. පැරිස් නගරයේ පිහිටුවා ඇත් බෞද්ධ මධ්‍යස්ථානයෙන් ද,පැරිසියේ සෝර්බෝන් විශ්වවිද්‍යාලයෙන් ද බෞද්ධ ධර්ම

ප්‍රචාරක කටයුතු සිදු වෙයි. කලක් සෝර්බෝන් විශ්වවිද්‍යාලයේ වැඩ සිටි ආචාර්ය වල්පොල රාහුල හිමිපාණන්ගෙන් එරට බුදුදහම ඉගෙන ගන්නන්ට මග පෙන්වීමක් ලැබිණි.

උගතුන්ගේ උත්සාහයෙන් ම බුද්ධ ධර්මය ප්‍රචාරය වන තවත් යුරෝපීය රටක් නම් ජර්මනියයි. එහි බුදුදහමේ වටිනාකම තේරුම් ගොස් ඇත්තේ දාර්ශනියකයන්ටය. ෂොපන්හවර්, ඉමානුවෙල් කාන්ට් වැනි දාර්ශනිකයෝ බුදුදහමේ වටිනාකම කියා පෑහ. එයින් ප්‍රබෝධ වී ජර්මනියේ බෞද්ධ අදහස් ව්‍යාප්ත කිරීමට උනන්දු වූ ප්‍රසිද්ධ පඬිවරුන් කීප දෙනෙක් නම් මැක්ස්මුලර්, හර්මන් ඕල්ඩන්බර්ග් සහ විල්හෙල්ම් ගෛගර්ය. සිංහල, පාලි භාෂා ඉගෙන ගත් ගෛගර් පඬිතුමා අපේ මහාවංශය ඉංග්‍රීසියට පරිවර්තනය කළ අතර, සිංහල පාලි සඳහා ව්‍යාකරණ පොත් ඉංග්‍රීසි බසින් ලිවීය. ජර්මනියේ බර්ලින් විහාරය ථෙරවාද බෞද්ධ කටයුතු පිළිබඳ ප්‍රසිද්ධයක් දරයි. අතුරුගිරියේ ඥාන විමල හිමියෝ දිගු කලක් එහි සිට ධර්ම ප්‍රචාරය කළහ.

ඉතාලිය, ස්විස්ටර්ලන්තය, ඩෙන්මාර්කය වැනි රටවල උගතුන් ද බුදුදහම ඉගෙනීමට උනන්දුවක් දක්වන බව පෙනේ. මෙකල බුදුදහම ව්‍යාප්තවීමට වඩා හොඳ සරු බිමක් වී ඇත්තේ ඇමරිකාවයි.

ලක්දිව ථෙරවාද බුදු දහම කෙරෙහි ඇමරිකානුන් කීප දෙනෙකුගේ අවධානය යොමු වූ අවස්ථාවක් 1870 දී උදා විය. මේ වර්ෂයේදී ලංකාවේ බෞද්ධයන් හා ක්‍රිස්තු භක්තිකයන් අතර මහා වාදයක් ඇති විය. එය හැඳින්වෙන්නේ පාණදුරාවාදය නමිනි.

පුවත්පත්වලින් පාණදුරා වාදයේ තොරතුරු කිය වූ නිව්යෝර්ක් නුවර විසූ කර්නල් ඕල්කට් තුමාට බුදුදහම පිළිබඳ තොරතුරු විමසා දැනගැනීමට අවශ්‍ය විය. 1880 මැයි 25 දින ලක්දිවට පැමිණි ඕල්කට්තුමා ගාල්ලේ ශ්‍රී විජයානන්දාරාමයේ දී පන්සිල් ගෙන බෞද්ධයෙක් විය. ප්‍රථමවරට ථෙරවාද බුදුසමය වැළඳගත් ඇමරිකානු ජාතිකයා ඕල්කට්තුමා යයි කියනු ලැබේ. එතුමා ලාංකික බෞද්ධයනට සේවය පිණිස මෙහි ම රැඳුණේය.

ඇමරිකාවට ථෙරවාද බුදුදහම විධිමත් ලෙස හඳුන්වා දුන් තැනැත්තා අනගාරික ධර්මපාලතුමාය. 1893 දී ඇමරිකාවේ පැවති ලෝක ආගමික සම්මේලනයේදී ලංකාව නියෝජනය කළේ අනගාරික ධර්මපාලතුමා ය. එතුමා ථෙරවාද බුදුසමය පිළිබඳ ව පැවැත්වූ කථාව විවිධ ආගමික

නායකයින්ගේත් සම්මේලනයට සහභාගී වූ දහස් ගණන් ජනතාවගේත් සිත් සතන් නව මගකට යොමු කිරීමට සමත් වූ බව කියනු ලැබේ. පිළිකුලට හා අනුකම්පාවට ලක් ව තිබූ පෙරදිග ආගම් ධර්මපාලතුමාගේ කථාවෙන් ගෞරවාදරයට හා බහුමානයට ලක් වූයේ යයි චිකාගෝ ජර්නල් නම් පුවත්පත වාර්තා කළේය. මෙසේ විශාල ප්‍රබෝධයක් ඇති වුවත් ථෙරවාද බුදුදහම එරට පවත්වාගෙන යාමට උද්යෝගයෙන් කටයුතු කළ පිරිස මඳ බව පෙනේ. ලෝක ආගම් සම්මේලනය ආරම්භ වන කාලය වන විටත් ඇමරිකාවේ කැලිපෝනියා ප්‍රදේශයේ ජපන් මහායාන බුදුසමය අදහන්නන් 80,000 ක් පමණ සිටියේ යයි කියනු ලැබේ. අද මේ තත්ත්වය තවත් දියුණු වී ඇත.

බටහිර රටවල ථෙරවාද බුදුදහම ප්‍රචාරය කිරීමේ කටයුතු උද්යෝගිමත් ලෙස සිදුවීම ඇරඹුණේ 1956 පැවැත්වූ සම්බුද්ධ ජයන්තියෙන් පසුවය. මේ සඳහා පෙරමුණ ගෙන කටයුතු කරන්නේ ලක්දිවින් වැඩමකොට ධර්ම ප්‍රචාර කටයුතුවල යෙදී සිටින භික්ෂූන් වහන්සේලාය.

1964 දී පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක හිමිපාණෝ ඇමරිකා එක්සත් ජනපදයට වැඩම කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1965 දී වොෂිංටන් බෞද්ධ විහාරය ආරම්භ විය. මහරගම ශාසන සේවක සමිතියේ අනුග්‍රහය පිට වජිරාරාමවාසී පූජ්‍ය විනීත හිමියෝ එහි ප්‍රථම විහාරාධිපති තනතුරට පත්වූහ. දැන් වොෂින්ටන් නගරය ප්‍රබල බෞද්ධ මධ්‍යස්ථානයකි. මෙයට එක් හේතුවක් නම් ශ්‍රී ලංකා, බුරුම, තායි, කාම්බෝජ ආදී ථෙරවාද රටවලින් පැමිණෙන තානාපතිවරුන් වොෂිංටන් නගරයේ වාසය කිරීමයි. වොෂින්ටන් හැරුනු විට ඇමරිකා එක්සත් ජනපදයේ ථෙරවාද බෞද්ධ මධ්‍යස්ථාන පිහිටි තවත් නගර කීපයක් නම් නිව්යෝර්ක්, චිකාගෝ, කොලරාදෝ, හොලිවුඩ්, මේරිලන්ඩ්, බෝස්ටන් හා ලොස්එන්ජලීස්ය.

1956 දී ආචාර්ය එච්. එන්. ද අසවේදෝ නමැත්තකු විසින් බ්‍රසීලයේ බෞද්ධ සංගමය ආරම්භ කළ බව පෙනේ. 1967 ජූනි 08 දින එහි රියෝ ද ජානෙයිරෝ නගරයේ ලියෝපෝල් හි ප්‍රථම ථෙරවාද බෞද්ධ විහාරය ඇරඹිණි. ලක්දිවින් වැඩිය තල්පිටියේ අනුරුද්ධ හිමියෝ එහි ප්‍රථම විහාරාධිපති තනතුරට පත්වූහ. වජිරාරාමවාසී පියදස්සී හිමියෝ මෙහි වැඩම කොට ටික කලක් ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරත වූහ.

1974 දී යුරෝපා බෞද්ධ සංගමය නම් සංවිධානයක් පැරිස් නගරයේ ආරම්භ කරන ලද්දේය. ජර්මනිය, ඔස්ට්‍රියාව, ප්‍රංශය, නෙදර්ලන්තය, ඉතාලිය,

බෙල්ජියම, ස්විස්ටර්ලන්තය, එංගලන්තය යන රටවලින් නියෝජිතයෝ මෙම සංවිධානයට සහභාගී වෙති.

බුදුදහම ගෝචරවන්නේ බුද්ධිමතුන්ටය. බටහිර රටවල බුදුදහම ජනප්‍රිය වී ගෙන යන්නේ බුද්ධිමතුන් අතරය. පෙරදිග රටවල පෘතුගීසි, ලන්දේසි, ප්‍රංශ, ඉංග්‍රීසි ආදී යටත් විජිත යුගවල දී ක්‍රිස්තු ධර්මය පතුරවන ලද්දේ කඩුවේ බලයෙනි. එහෙත් අද බටහිර රටවල බුදුදහම පැතිර යන්නේ ඊට ඉඳුරාම වෙනස් වූ මඟකිනි. එනම් ඊනියා භෞතික දියුණුවේ උපරිම ඵලයවූ අසහනයෙන් මිදී සහනය ලබාගැනීමට බුද්ධිමතුන් කරන ඉල්ලුමක් වශයෙනි. එම ඉල්ලුම සපිරීමට ශ්‍රී ලාංකික තරුණ භික්ෂූන් වහන්සේ රැසක් ම බටහිර රටවලට වැඩම කර සිටිති.

පැවරුම

බටහිර රටවල ථෙරවාද බුදුදහම පැතිරවීමේ පුරෝගාමීත්වය ගෙන කටයුතු කරන්නේ ශ්‍රී ලංකාවයි. 20 වන සියවසේ ලාංකිකයන්ගේ මූලිකත්වයෙන් බටහිර රටවල බුදුදහම පැතිරවීමට කටයුතු කළ අවස්ථාවන් ලේඛනගත කරන්න.

# ධම්මපදයෙන් බිඳක්

1. අසාරෙ සාරමතිනො - සාරෙ චාසාරදස්සිනො
   තෙ සාරං නාධිගච්ඡන්ති - මිච්ඡාසංකප්ප ගෝචරා

නිසරු දේ සරු ලෙසත්, සරු දේ නිසරු ලෙසත් දකින වැරදි කල්පනාවල යෙදුනු අය සරු දෙයක් නොලබත්.

(යමක වග්ග 11)

2. සාරං ච සාරතො ඤත්වා - අසාරං ච අසාරතො
   තෙ සාරං අධිගච්ඡන්ති - සම්මාසංකප්ප ගෝචරා

සරු දේ සරු දේ හැටියටත්, නිසරු දේ නිසරු දේ හැටියටත් සලකන නිවැරදි කල්පනාවල යෙදුනු අය සරු දෙයක් ම ලබත්.

(යමක වග්ග 12)

උපදේශය

බොරු හර බොරු වටිනාකම් පසුපස නොයන්න. මානව සාරධර්ම, වටිනා සමාජ සිරිත් විරිත් හඳුනා ගෙන ජීවිතයට සම්බන්ධ කර ගන්න. තමාටත් අනුන්ටත් සැපක් මිස විපතක් නොවන හොඳ සිතුවිලි ම ඇති කර ගන්න.

3. සුකරානි අසාධූනි - අත්තනො අහිතානි ච
   යං වෙ හිතං ච සාධුං ච - තං වෙ පරම දුක්කරං

තමාට අයහපතක් වන නරකදේ පහසුවෙන් කළ හැකිය. යම් දෙයක් තමාට වැඩදායක හෝ යහපත් වේ නම් එය කිරීම ඉතා අපහසුය.

(අත්ත වග්ග 7)

උපදේශය

අපහසු කාර්යය නරක දේ කිරීම නොව හොඳ දේ කිරීමය. ඒ අමාරු දේ කිරීමට හැකිතාක් උත්සාහ කරන්න.

4. අත්තානාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣිති
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤෝ විසෝධයෙ

තමා පව් කෙළේ නම් තෙමේ ම කෙලෙසෙන්නේ ය. තමා පව් නොකළේ නම් එයින් තෙමේ ම පිරිසිදු වන්නේය. පිරිසිදු බව හා අපිරිසිදු බව පවතින්නේ තම තමා කෙරෙහිම ය. එක් අයෙක් තවත් අයෙකු පිරිසිදු නොකරන්නේ ය.

(අත්ත වග්ග 9)

උපදේශය

ඔබේ අභ්‍යන්තරය පිරිසිදු වන්නේ හෝ අපිරිසිදු වන්නේ ඔබ කරන කියන සිතන දේ අනුවයි. වෙනත් කෙනෙකුට ඔබේ ආධ්‍යාත්මික පාරිශුද්ධිය ඇති කළ නොහැකිය. ඒ නිසා නරක දෙයින් වැළකී හොඳ දේ කිරීමට පුරුදු වන්න.

5. අනුපුබ්බේන මෙධාවි - ථොක ථොකං ඛණෙ ඛණෙ
කම්මාරෝ රජතස්සෙව - නිද්ධමේ මලමත්තනො

රන් කරුවා රිදී භාජනයෙහි මල ටිකින් ටික ඉවත් කරන්නා සේ නුවණැති තැනැත්තා මොහොතක් පාසා ටිකින් ටික අනුපිළිවෙලින් තමාගේ කෙලෙස් නැමැති මල ඉවත් කර ගනී.

(මලවග්ග 5)

උපදේශය

ඔබේ දුර්වලකම් සියල්ල එක්වර ම නැති කර ගැනීමට නොහැකි වනු ඇත. එහෙත් ඔබට වුවමනාව තිබේ නම් එම දුර්වලකම් පියවරින් පියවර නැති කර ගත හැකිය. ඒ සඳහා උත්සාහවන්ත වන්න.

6. අත්ථම්හි ජාතම්හි සුඛා සහායා
තුට්ඨී සුඛා යා ඉතරීතරෙන
පුඤ්ඤං සුඛං ජීවිතසංඛයම්හි
සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහානං

යම්කිසි කටයුත්තක් ඇති විටෙක (එයට උදව්වීමට) යහළුවන් සිටීම සැපයකි. තමා වෙත ඇති දෙයකින් සතුටුවීමත් සැපයකි. මැරෙන අවස්ථාවෙහි

(තමා කර ගෙන තිබෙන) පිනද සැපයකි. මේ සියල්ලට ම වඩා සියලු දුක් නැති කර ගැනීම සැපයකි.

(නාගවග්ග 12)

උපදේශය

1. දුක සැප දෙකේ දී ම ඔබ සමග සිටින හොඳ මිතුරන් ඇසුරු කරන්න.
2. ලැබුණු දෙයකින් සෑහීමට පත් වීමට පුරුදුවන්න.
3. නොබියව මරණයට මුහුණදීමට නම් හැකිතාක් හොඳ වැඩ කරන්න.
4. දුක් අඩු කර ගැනීමට නම් ආශාවන්ට වහල් නොවී බුද්ධිමත්ව කටයුතු කරන්න.

5. සුඛා මත්තෙය්‍යතා ලොකෙ
අථො පෙත්තෙය්‍යතා සුඛා
සුඛා සාමඤ්ඤතා ලොකෙ
අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා

මේ ලෝකයෙහි මවට උපස්ථාන කිරීම සැපයකි. පියාට උපස්ථාන කිරීම ද සැපයකි. භික්ෂූන් වහන්සේට සත්කාර කිරීම ද සැපයකි. බුද්ධා දී උතුමන්ට සත්කාර කිරීම ද සැපයකි.

(නාග වග්ග 13)

උපදේශය

මවුපිය උපස්ථානය හා ස්වාමීන් වහන්සේට ගරු සත්කාර කිරිමත් බුද්ධ පූජා පැවැත්වීමත් සැලකිල්ලෙන් කරන්න. එයින් ඔබට සැනසීමක් ලැබිය හැකිය.

8. සුඛං යාව ජරා සීලං - සුඛා සද්ධා පතිට්ඨිතා
සුඛො පඤ්ඤාය පටිලාභො - පාපානං අකරණං සුඛං

තමා දිරා යැම තෙක් ම සිල්වත් ව සිටීම සැපයකි. හොඳින් ශ්‍රද්ධාව පිහිටා තිබීම සැපයකි. නුවණ ලැබීම ද සැපයකි. පව් නොකිරීමද සැපයකි.

උපදේශය

1. කුඩා කල සිට ම සිල්වත් ව ජීවත්වීමට පුරුදු වන්න.
2. ශ්‍රද්ධාව දියුණු කරගන්න.
3. නුවණ වැඩෙන වැඩවල යෙදෙන්න.
4. හැම විටම පවෙන් වළකින්න.

අනෙක් අයට ද ගුණධර්ම පුහුණු කර ගැනීමට උදව් කරන්න.

භාවිතයට

1. මෙම පාඩමේ සඳහන් ගාථා කටපාඩම් කරන්න.
2. ගාථාවන්හි අදහස් ඇතුළත් වන සේ පද්‍ය පංතියක් නිර්මාණය කරන්න.
3. මෙම ගාථාවන්හි අදහස් ගැබ්වන සේ ධම්මපදයේ වටිනාකම පැහැදිලි කරමින් ලිපියක් ලියන්න.

## වසලකරන ධර්ම

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩසිටි කාලයක සිරිත් පරිදි පෙරවරුවෙහි සැවැත් නුවරට පිඩුසිහා වැඩිසේක. ගෙපිළිවෙලින් වැඩමකළ උන්වහන්සේ අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ නිවස අසලට ද වැඩියහ. එම අවස්ථාවේ බ්‍රාහ්මණයා හෝම පූජාවට සූදානම් ව සිටියේය. ගිණි දල්වා ගින්නෙහි පිළිස්සීමට අවශ්‍ය ගිතෙල් ආදි ද්‍රව්‍ය ද ලඟා කරගෙන තිබිණි. බමුණු දහම අනුව එබඳු අවස්ථාවක ශ්‍රමණයන් වහන්සේ නමකගේ පැමිණීම අශුභ කරුණක් ලෙස සැලකිණි. එබැවින් බුදුරජාණන් වහන්සේ තම නිවස අසලට වඩිනු දුටු අග්ගික භාරද්වාජ බමුණා කෝපයට පත්විය. ඒ නිසා ම ඉතා පහත් ලෙස කථා කරමින් මුඩු මහණ, වසලය, ඔහි නවතිනු'යි කෑ ගැසීය.

බමුණාගේ බැණ වැදීමෙන් නො සැලුණු බුදුරජාණන් වහන්සේ බමුණ, වසලයා කියන්නේ කවරකුදැයි කියා හෝ වසලයකු වන කරුණු මොනවාදැයි කියා හෝ නුඹ දන්නෙහි දැයි විමසූ සේක. තමා ඒ කිසිවක් නොදන්නා බව පැවසූ අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයා, වසලයාත් වසලකරණ ධර්මත් පැහැදිලි කරදෙන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. එසේ නම් බමුණ මම කියාදෙන්නම් හොඳින් අසන්න. හොඳින් මෙනෙහි කරන්නැයි වදාළ බුදුරජාණන් වහන්සේ පුද්ගලයකු වසල හෙවත් පහත් තත්ත්වයට පත්වන්නේ කුමන කරුණු නිසාදැයි පැහැදලි කළ සේක. එම දේශනාව වසල සූත්‍රය නමින් මෙන්ම අග්ගික භාරද්වාජ සූත්‍රය නමින් ද හැඳින්වේ. ඛුද්දක නිකායේ සුත්ත නිපාත නම් පෙළ පොතට ඇතුළත් වූ එම සූත්‍රය පිරිත් පොතෙහිද තිබේ. එහිදී බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

(1) කොධනො උපනාහීච - පාපමක්ඛී ච යො නරො
විපන්නදිට්ඨි මායාවී - තං ජඤ්ඤා වසලො ඉති

යම් මනුෂ්‍යයෙක් නිතර කිපෙන සුළු වූයේ ද වෛර බඳින සුළු වූයේ ද පවිටු වූයේ ද අනුන්ගේ ගුණ මකා දමන්නේ ද හොඳ නරක කර්මවලට විපාක නැත ආදීන් ඇතිකර ගත් වැරදි දෘෂ්ටිවලින් යුක්ත ද, තමන්ගේ ඇති අගුණ වසා නැති ගුණ පෙන්වන සුළු වූ මායාවෙන් යුක්ත ද ඔහු වසලයකු ලෙස දැනගත යුතුය.

(2) එකජං වා ද්විජං වාපි - යොධ පාණානි හිංසති
යස්ස පාණෙ දයා නත්ථි - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් මේ ලෝකයෙහි ඒකජ, ද්විජ යන කවර ප්‍රාණියකුට හෝ හිංසා කෙරේ ද, යමකුට ප්‍රාණීන් කෙරෙහි දයාව නැත්තේ ද ඒ තැනැත්තා වසලයකු ලෙස දැනගත යුතුය.

(3) යො හන්ති පරිරුන්ධති - ගාමානි නිගමානි ච
නිග්ගාහකො සමඤ්ඤාතො - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් ගම් නියම් ගම් විනාශ කෙරේද සෙනග ගෙනවුත් වට කෙරේ ද, ගම් පහරණා සොරකැයි ප්‍රසිද්ධ වූයේ ද ඔහු වසලයෙකු ලෙස දැනගත යුතුය.

(4) ගාමෙ වා යදිවාරඤ්ඤෙ - යං පරෙසං මමායිතං
ථෙය්‍යා අදින්නං ආදියති - තං ජඤ්ඤා වසලෙ ඉති

යමෙක් ගමක හෝ කැලයක හෝ අනුන් විසින් මගේ යයි අයත් කරගන්නා ලද නුදුන් යමක් සොර සිතින් ගනී ද ඔහු වසලයකු ලෙස දැන ගත යුතුයි.

(5) යො හවෙ ඉණමාදාය - චුජ්ජමානො පලායති
නහි තෙ ඉණමත්ථිති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් ණය ගෙන ණය හිමියා විසින් මගේ ණය දෙව යි චෝදනා කරනු ලබන්නේ මා විසින් ඔහුට ගෙවිය යුතු ණයක් නැතැයි පලා යන්නේ ද ඔහු වසලයකු ලෙස දැනගත යුතුය.

(6) යො වෙ කිඤ්චික්ඛ කම්‍යතා - පන්ථස්මිං වජතං ජනං
හන්තවා කිඤ්චික්ඛමාදෙති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් කිසිවක් පැහැර ගනු කැමැත්තේ මාර්ගයෙහි යන ජනයා තළාපෙළා කිසිවක් පැහැර ගනී ද ඔහු වසලයකු ලෙස දැන ගත යුතුය.

(7) යො අත්තහෙතු පරහෙතු - ධන හෙතු ච යො නරො
සක්ඛිපුට්ඨො මුසා බ්‍රෑති - තං ජඤ්ඤා වසලො ඉති

යම් මිනිසෙක් ඔහුගෙන් කිසියම් සාක්ෂියක් ඇසූ අවස්ථාවක තමාගේ ජීවිතය හේතු කොට හෝ ධනය නිසා හෝ බොරු කියයි නම් ඔහු වසලයකු ලෙස දැනගත යුතුය.

(8) යො ඤාතීනං සඛානංවා - දාරෙසු පති දිස්සති
සහසා සම්පියෙනවා - තං ජඤ්ඤා වසලො ඉති

යම් කෙනෙක් තම නෑයන්ගේ හෝ මිත්‍රයන්ගේ භාර්යාවන් සමඟ බලහත්කාරයෙන් හෝ එම භාර්යාවන්ගේද කැමැත්ත ඇතිව හෝ අනාචාරයෙහි යෙදෙයි නම් ඔහු වසලයකු ලෙස දැන ගත යුතුය.

(9) යො මාතරං වා පිතරංවා - ජිණ්ණකං ගත යොබ්බනං
පහු සන්තො න භරති - තං ජඤ්ඤා වසලො ඉති

යම් කෙනෙක් ආර්ථික වශයෙන් හැකියාව තිබියදී ජරාවට පත්වූ මහළු මවුපියන් පෝෂණය නොකරයි නම් ඔහු වසලයකු ලෙස දැනගත යුතුය.

(10) යො මාතරංවා පිතරංවා - භාතරං භගිනං සසුං
හන්ති රොසෙති වාචාය - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් මවුට හෝ පියාට හෝ සහෝදරයාට හෝ සහෝදරියට හෝ නැන්දනියට හෝ තලාපෙලා ද, පරුස වචනයෙන් බැණ කෝප උපදවයි ද ඔහු වසලයකු ලෙස දැනගත යුතුය.

(11) යො අත්ථං පුච්ඡතො සන්තො - අනත්ථමනුසාසති
පටිච්ඡන්නෙන මන්තෙති - තං ජඤ්ඤා වසලො ඉති

මෙලොව පරලොව දියුණුවට හේතු වූ කරුණක් ඇසූ යමෙක් අහිත වූවක් කියයි ද, තේරුම් ගැනීමට නොහැකිවන කාරණය වසා කථා කරයිද ඔහු වසලයකු ලෙස දැන ගත යුතුය.

(12) යො කත්වා පාපකං කම්මං - මා මං ජඤ්ඤා ති ඉච්ඡති
යො පටිච්ඡන්න කම්මන්තො - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් පාපකර්මයක් කර, මා පව් කළ බව කිසිවෙක් දැන නොගනීවා, යි සිතින් ප්‍රාර්ථනා කරයි ද, යමෙක් අනෙකකුට දැන ගැනීමට නොහැකිවන සේ සැඟවුණු ක්‍රියා ඇත්තේ ද ඔහු වසලයකු ලෙස දැනගත යුතුය.

(13) යො වෙ පරකුලං ගන්ත්වා - භුත්වාන සුචි භොජනං
ආගතං න පටිපූජෙති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් අනුන්ගේ ගෙයකට ගොස් ප්‍රණීත ආහාර අනුභවකොට ඒ ගෙයින් කෙනෙකු තමාගේ නිවසට පැමිණි කල්හි ආහාර පානාදියෙන් සංග්‍රහ නොකරයි නම් ඔහු වසලයකු ලෙස දැනගත යුතුය.

(14) යො බ්‍රාහ්මණං වා සමණං වා - අඤ්ඤං වාපි වණිබ්බකං
මුසා වාදෙන වඤ්චෙති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් බ්‍රාහ්මණයෙකු හෝ වෙනත් යාචකයකු හෝ බොරු කියා රවටයි ද ඔහු වසලයෙකු ලෙස දැන ගත යුතුය.

(15) යො බ්‍රාහ්මණං වා සමණං වා - භත්ත කාලෙ උපට්ඨිතෙ
රොසති වාචා නං දෙති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් ආහාර ගන්නා වේලාවෙහි පැමිණි බ්‍රාහ්මණයෙකුට හෝ ශ්‍රමණයකුට හෝ ඵරුස වචනයෙන් බණී ද ආහාර නොදෙයි ද ඔහු වසලයෙකු ලෙස දැනගත යුතුය.

(16) අසතං යොධ පබ්‍රෑති - මොහෙන පළිගුණ්ඨිතො
කිඤ්චික්ඛං නිජිගිංසානො - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් මෝහයෙන් වෙළී කිසිවක් ලබාගැනීමේ ආශාවෙන් අසත්‍ය වූ අසත්පුරුෂ වූ අදහස් ප්‍රචාරය කරයි ද ඔහු වසලයකු ලෙස දැන ගත යුතුය.

(17) යො චත්තානං සමුක්කංසෙ - පරංච මවජානති
නිහීනො සෙන මානෙන - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් තමාගේ මානයෙන් ඉතා හීන වූයේ තමා ගැන උසස් ලෙස වර්ණනා කරයි ද අනුන්ට අවමන් කරයිද ඔහු වසලයකු ලෙස දැනගත යුතුය.

(18) රොසකො කදරියොච - පාපිච්ඡො මච්ඡරී සඨො
අහිරිකො අනොත්තාපි - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් අනුන් කුපිත කරයි ද, කෑදර වෙයි ද, පහත් බලාපොරොත්තු ඇත්තේ ද, මසුරු වෙයි ද, කපටි වෙයි ද, පවට ලැජ්ජා බිය නැත්තේ ද ඔහු වසලයකු ලෙස දැනගත යුතුය.

(19) යො බුද්ධං පරිභාසති - අථ වා තස්ස සාවකං
පරිබ්බාජං ගහට්ඨංවා - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් බුදුරජාණන් වහන්සේට හෝ උන්වහන්සේගේ ශ්‍රාවක වූ පැවි ද්දකුට හෝ ගිහියකුට හෝ නින්දා කරයි ද ඔහු වසලයකු ලෙස දැනගත යුතුය.

(20) යො වෙ අනරහා සන්තො - අරහං පටිජානති
චොරො සබ්‍රහ්මකෙ ලොකෙ - එස ඛො වසලොධමො
එතෙ ඛො වසලා වුත්තා - මයා වො යෙ පකාසිතා

යමෙක් රහත් නොවූයේ මම රහතෙක්මි'යි ස්ථිරවම කියයි ද හෙතෙම බ්‍රහ්මයන් සහිත මුළු ලෝකයෙහි ම සොරෙකි, අන්තිම වසලයෙකි. මා වි සින් මෙතෙක් කියන ලද සියළු දෙන වසලයෝ වෙති.

(21) නජච්චා වසලො හොති - නජච්චා හොති බ්‍රාහ්මණො
කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො

කෙනෙක් උපතින් ම වසලයෙක් නොවෙයි. උපතින් ම බ්‍රාහ්මණයෙක් ද නොවෙයි. අපිරිසිදු ක්‍රියා නිසා වසලයෙක් වෙයි. පිරිසිදු ක්‍රියා නිසා බ්‍රාහ්මණයෙක් වෙයි.

මෙසේ දේශනා කරන ලද බුදුරජාණන් වහන්සේ සමාජයේ සම්මතය අනුව සැඩොලෙකු ලෙස හඳුන්වන ලද මාතංග නම් තැනැත්තා කීර්තියට පත් වූ ආකාරය හා ඔහු ක්ෂත්‍රිය බ්‍රාහ්මණ සැමදෙනාගේ ගෞරවයට භාජනය වූ ආකාරය ද විස්තර කළ සේක. බඹලොව ඉපදීමට උපන් ජාතිය බාධාවක් නොවූ බව ද පැහැදිලි කළ සේක. එසේ ම බමුණු කුලයේ උපන් අය විවිධ පාපක්‍රියා කොට මෙලොව ගැරහුම් ලබන අයුරු හා පරලොව දුගතිගාමී වන අයුරු පෙන්වූ උන්වහන්සේ කෙනෙකුගේ ජාතිය ඔහු දුගතියට යැමෙන් හෝ නින්දාවට භාජනය වීමෙන් හෝ නො වළක්වන බව පැහැදිලි කළ සේක. දේශනාව අවසානයේ අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයා තෙරුවන් සරණ ගිය උපාසකයකු බවට පත් විය.

වසල සූත්‍රයෙන් කියැවෙන්නේ පුද්ගලයකු සමාජයෙහි නින්දාවට පත්වන්නේ කවර කරුණු නිසා ද යන්න බව ඉහත සඳහන් ගාථාවන් ගෙන් පැහැදිලි වේ.ඔහු පහතට හෙළන දෙවියකු හෝ වෙනත් බලවේගයක් නැත. සමාජයේ සැලකිල්ලට යොමුවන කුල සංකල්පය මත ද පුද්ගලයාගේ උසස් පහත්

භේදයක් දැක්වීම සුදුසු නොවේ. ඔහු උසස් හෝ පහත් වන්නේ කරන කියන දේ අනුවය.

ඝාතනය, සොරකම, බොරුව, වංචාව, දුරාචාරය යුතුකම් ඉටු නොකිරීම, මසුරුකම, පොරොන්දු කඩ කිරීම, කුහකකම, මානය, ලැජ්ජාභය නැතිකම වැනි ලාමක ධර්ම යම් පුද්ගලයකු තුළ තිබේ නම් ඔහුගේ පරම්පරාව බ්‍රාහ්මණ වුව ද ඔහු වසලයකු මිස බ්‍රාහ්මණයෙක් නොවේ. සමාජය විසින් පහත් යයි සම්මත කරන ලද කුලයක උපන් අයකු වුවද ඉහත සඳහන් ලාමක ධර්මයන්ගෙන් වෙන්ව මෛත්‍රිය, කරුණාව, පරිත්‍යාගශීලිත්වය, ලජ්ජා භය ඇතිකම ආදී ගුණ ධර්මයන්ගෙන් යුක්ත වේ නම් ඔහු බමුණකු මිස වසලයෙක් නොවේ.

වසල සූත්‍රයේ සඳහන් වන වසලකරණ ධර්ම සමඟ තම තමාගේ ක්‍රියාකලාපයත් සසඳා බලා තම තමන් අයත් වන්නේ වසල කණ්ඩායමට ද නැතහොත් බ්‍රාහ්මණ කණ්ඩායමට දැයි තීරණය කරගත හැකිය. වසල කණ්ඩායමට අයත් වන බව පෙනෙයි නම් බ්‍රාහ්මණ කොටසට ඇතුලත් වීමට උත්සාහ දැරිය යුතුය. වසලකරණ ධර්මවලින් ඉවත් විය යුතුය.

භාවිතයට :

(1) වසලකරණ ධර්ම මොනවාදැයි අංක අනුපිළිවෙලකට ලියා දක්වන්න.

(2) වර්තමාන සමාජයේ ක්‍රියාත්මක වන වසලකරණ ධර්ම මොනවාදැයි පුවත්පත් වාර්තා ඇසුරින් හා ඔබේ අත්දැකීම් ඇසුරින් පෙන්වා දෙන්න.

(3) වසලයාගේ හැටි මැයෙන් පද්‍ය පන්තියක් නිර්මාණය කරන්න.

## II කොටස

(1) පාලි
(2) අභිධර්ම
(3) භාවනා

# පාලි භාෂාව හඳුනා ගනිමු.

පාලි භාෂාව ලක්වැසියනට ලැබුණේ බුදුදහමත් සමඟයි. දේවානම්පියතිස්ස රජ දවස මිහිඳු මහරහතන් වහන්සේ අප රටට බුදුදහම ගෙන ආහ. ඒ දඹදිව සිටයි. බුදුදහම ප්‍රචලිත වූයේ පාලි භාෂාවෙනි. එනිසා බුද්ධ ධර්මයත් සමග පාලි භාෂාවත් ව්‍යාප්ත විය. ලාංකික භික්ෂූන් වහන්සේ එම භාෂාව ප්‍රගුණ කළහ. එනිසා පාලි ශ්‍රී ලංකිකයන්ට සමීපතම භාෂාවක් බවට පත්විය. එම භාෂාවෙන් ග්‍රන්ථ සම්පාදනය විණි.

බුද්ධ ධර්මය විස්තර කිරීමට පෙළ, අටුවා, ටීකා හා ප්‍රකරණ ග්‍රන්ථ පාලියෙන් ලිවූහ. දීපවංස මහාවංස ආදි ඉතිහාස ග්‍රන්ථ ද, බාලාවතාර, කච්චායන ආදී ව්‍යාකරණ ග්‍රන්ථ ද වුත්තෝදය, සුබෝධාලංකාරය ආදී ඡන්දස් අලංකාර ග්‍රන්ථ ද භේසජ්ජමඤ්ජුසා ආදී වෛද්‍ය ග්‍රන්ථ ද රසවාහිනී, සහස්සවත්ථු ආදී සාහිත්‍ය ග්‍රන්ථ ද පාලි භාෂාවෙන් ලිවීමට සිංහලයෝ දක්ෂ වූහ පාලිය අපේ ම බසක් බවට පත් කර ගත්හ.

සිංහල භාෂාවේ පෝෂණයට හා ව්‍යාප්තියට පාලි භාෂාව මුල්වූ බව පැහැදිලිය. ආවාස - ආවාසය, ආරාම - ආරාමය, දාන - දානය යන වචන දෙස බලන විට පාලි වචන සමඟ සිංහල වචන ඉතා කිට්ටු සමීපතාවයක් පෙන්නුම් කරයි. සිංහලයේ වාක්‍ය වින්‍යාසය, ව්‍යාකරණ ආදියත් පාලියට සමාන විය. ආගමික භාෂාව වූයේ ද පාලි භාෂාවයි.

අද සමහරෙක් පාලි භාෂාව මළ බසක් ලෙස සලකති. එම මතය අර්ථ ශූන්‍ය ය. පාලිය ජීව භාෂාවකි. ව්‍යවහාර භාෂාවකි. පාලි භාෂාව තේරුම් ගැනීමට පහසුය.එය පියකරුය. සරලය. මිහිරිය. එනිසා ඉගෙනුමට ඉතා පහසුය. එහි පදමාලාව ලිහිල් ය. වියරණ ගැටළු රහිතය. සුඛනම්‍යය.

පාලි භාෂාව, ධර්මය ඉගෙනීමට, ඉතිහාසය හැදෑරීමට, සිංහල භාෂා පෝෂණයට, චරිත සංවර්ධනයට මහත් සේ උපකාරී වෙයි. එනිසා පාලි භාෂාව පිළිබඳ දැනුමක් ලබා ගැනීම බෙහෙවින් වැදගත් ය. දැන් ඒ සඳහා ඔබට අවස්ථාව උදාවී තිබේ.

දහම් පාසල් පාඨමාලා වේ පාලි භාෂාවට ද විශේෂ තැනක් හිමි වෙයි. දහම් පාසැල් සිසුන්ට පාලි භාෂා අධ්‍යයනය ආරම්භ වන්නේ 6 ශ්‍රේණියේ

සිටයි. 9 ශ්‍රේණි පොතෙන් සන්ධි, නිපාත, උපසර්ග, සමාස. ආඛ්‍යාත හා කිතක ආදී ව්‍යාකරණ පිළිබඳව දැනීමක් ලබාගත හැකිය. මෙහිදී පාඩමක් පාසා දී ඇති උපදෙස් අනුගමනය කිරීම මෙන්ම 6,7,8 ශ්‍රේණි පාඨ ග්‍රන්ථවල එන පාඩම් සහ උපදෙස් දීම ද යලි කියවා බැලීම ද මෙම ශ්‍රේණියේ පාලි පාඩම් ඵලදායී කරගැනීමට හේතුවනු ඇත.

දහම පාසැල් පාලි පාඨමාලාව පාඩම් 40කින් යුක්තය. 6,7,8 හා 9 ශ්‍රේණි සඳහා පාඩම් දහය බැගින් වෙන්වේ. යම් ශ්‍රේණියක් සඳහා අලුතින් ශිෂ්‍යයෙකු ඔබ දහම පාසැලට ඇතුලුවූයේ නම, එම ශිෂ්‍යයාට 6 ශ්‍රේණියේ සිට පාලි භාෂා පාඨමාලාව හැදෑරීමට උපදෙස් දීම අනිවාර්යය බව සලකන්න.

සෑම පාඩමක් අවසානයේ දක්වා ඇති අභ්‍යාස ප්‍රගුණ කිරීමටත් ඒ සඳහා වෙන ම අභ්‍යාස පොතක් පාවිච්චි කිරීමටත් සිසුන් පෙළඹවීම වැදගත් වේ.

උතුරාවල ධම්මරතන හිමි.

## පඨමො පාඨො

## පළමුවන පාඩම

පාඩමේ අරමුණු

- (i) 6, 7 හා 8 ශ්‍රේණිවලදී ඉගෙන ගත් පාඩම් නැවත මතකයට නගා ගැනීම
- (ii) ක්‍රියාපද/නිපාත පද/සංඛ්‍යාවාචක පද/පූර්වක්‍රියා පද/මිශ්‍ර ක්‍රියා පද පිළිබඳ දැනුම අළුත් කර ගැනීම
- (iii) ඒවා වාක්‍ය රටාවල යෙදෙන අයුරු තේරුම් ගැනීම.

### දුට්ඨ ගාමණී රාජා

දුට්ඨ ගාමිණී රාජා කාකවණ්ණතිස්ස රඤ්ඤො ජෙට්ඨ පුත්තො, තස්ස මාතා විහාර මහාදේවී, භාතා සද්ධාතිස්සො නාම, දහර කාලෙ තස්ස ජෙට්ඨස්ස ගාමණී ඉති නාමං අකංසු, කුමාරස්ස ද්වාදස වස්සික කාලෙ එකදා අත්තනො පිතා උභො කුමාරෙ ආමන්තෙත්වා දමිළෙහි සද්ධිං මා යුජ්ඣථාති වත්වා භත්ත පිණ්ඩං ගහෙත්වා අහං දමිළෙහි සද්ධිං න යුජ්ඣිස්සාමි ඉති සපථං කත්වා භුඤ්ජථාති පච්චෙකං අදාසි.

ගාමණී කුමාරො තං භත්ත පිණ්ඩං භූමියං ඛිපිත්වා සයනං ගන්ත්වා හත්ථපාදෙ සංකුචිත්වා නිපජ්ජි, කුමාරස්ස මාතා විහාර මහා දේවී තං දිස්වා සන්තිකං ගන්ත්වා කිමත්ථා එවං සයසීති පුච්ඡි, කුමාරො උත්තර දිසායං දමිළා, දක්ඛිණ පස්සෙ ගොඨ සමුද්දො කථං සුඛෙනාහං සයාමී ති ආහ. කුමාරො පන මයි වයප්පත්තෙ දමිළෙහි සද්ධිං යුජ්ඣිස්සාමීති චින්තෙසි.

අපරෙන සමයෙන අත්තනො පිතරං උපසංකමිත්වා දමිළෙහි සද්ධිං යු ජ්ඣි තුං වරං යාචි. පිතා න අදාසි. කුමාරො දුතියම්පි තතියම්පි යාචි, පිතා නාදාසියෙව, ගාමණී කුමාරො පි මම පිතා න පුරිසො. ඉත්ථී ති වත්වා ගීවාභරණාදයො ඉත්ථාලඞ්කාරෙ කාරෙත්වා පිතු සන්තිකං පෙසෙසි. තතො පිතු රාජා දණ්ඩෙන පහටො ආසිවිසො විය කුජ්ඣිත්වා ගාමණී කුමාරං ගණ්හාපෙථා ති ආණාපෙසි, සො මලය ජනපදං පලායි. තතො පට්ඨාය කුමාරො දුට්ඨගාමණී ති පඤ්ඤායි.

අථ පිතරි කාලකතෙ රොහණ නගරමාගමම රජෙජ අභිසිතෙතා අචිරෙන බලකායං සංවිධාය අනුරාධපුරෙ රජ්ජං කරොනෙතන එළාරෙන දමිළ රාජෙන සද්ධිං යුද්ධමකරි. තෙහි කතෙසු සඞගාමෙසු විජිතපුර මහා සඞගාමො අතිභීසනො අහවි. තසමිං සඞගාමභූමියං එළාරො පති. තසමිං තතො සකල ලඞකාදීපං එකච්ඡතතං කත්වා රජ්ජං කාරෙනෙතා දමිළ කචවරං ඣාපෙත්වා ලඞකා සම්බුද්ධ සාසනං ජොතයි. තථෙව ලොහ පාසාදං ච මහා - චෙතියං ච මරිචවට්ටිං ච නානා විහාරානි ච කාරාපෙසි.

දුටඨගාමණී රාජා සද්ධාසමපනෙනා මහා - වීරොති වුත්තං මහාවංසෙ.

**(පාලි රචනා - බද්දේගම විමලවංස හිමි)**

**වචන මාලා**

**නාමපද**

කාකවණණතිසෙසා - කාවන්තිස්ස

ජෙටඨපුතත - වැඩිමහල් පුතා

සපථං - දිවිරීම

ගොඨ සුමදෙදා - ගොළු මුහුද

පිතරි කාලකතෙ - පියා මළකල්හ

කතෙසු සංගාමෙසු - කළ යුද්ධ අතරින්

ගීවාභරණාදයො - ගෙලට දමන ආභරණාදිය

මහා සංගාමො - මහා යුද්ධය

දමිළ කචවරං - දමිල කසල

සදධා සමපනෙනා - ශ්‍රද්ධාව ඇති

දහර කාලෙ - ළමා කාලයෙහි

උතතර දිසායං - උතුරු දිසාවෙහි

වයපපතෙත - වයසට පැමිණි කල්හි

ආසිවිසො - සර්පයකු

**ක්‍රියාපද**

න යුජඣිසසාමි - යුද්ධ නොකරමි.

චිනෙතසි - සිතීය

පෙසෙසි - යැවීය

ආණාපෙසි- අණ කෙළේය.

මනත්වා - සිතා

**නිපාත**

සමපති - දැන්

අභ්‍යාසය - 01

(1) මෙම පාඩම සිංහලෙන් ලියන්න.
(2) දුට්ඨගාමිණීකුමාරො, කාකවණ්ණතිස්සමහාරාජා, සද්ධාතිස්සො කුමාරො, විහාරමහාදෙවි, එළාරරාජා මේ සංඥා නාම යොදා කුඩා වාක්‍ය පහක් ලියන්න.
(3) පාඩමෙහි එන ක්‍රියාපද/මිශ්‍ර ක්‍රියාපද/ පූර්ව ක්‍රියාපද තෝරා වෙන වෙන ම ලියන්න.
(4) පාඩමෙහි එන නිපාත පද/සර්වනාම පද සොයා වෙන වෙන ම ලියන්න.

## දුතියො පාඨො
## දෙවන පාඩම

**පාඩමේ අරමුණු**

(i) පාලි භාෂාවේ නාම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
(ii) ඒ නාම, විභක්තිවල වර නැගීම තේරුම් ගැනීම.
(iii) ඒ ඒ විභක්ති අනුව අර්ථ දැන ගැනීම.

(2) නාම යනු විභක්ති රහිත ශබ්ද සමූහයකි. නාම, විභක්ති ගත්විට නාමපද බවට පත්වේ. නාම, ලිඞග වශයෙන් කොටස් තුනකට බෙදේ.

(i) පුලලිඞග නාම
(ii) ඉත්ථිලිඞග නාම
(iii) නපුංසකලිඞග නාම

යම් නාමයකින් පිරිමි සතෙකු ප්‍රකාශ වේ නම් ඒ නාමය පුලලිඞගයි. නර, පුරිස, යක්ඛ, සීහ, මිග ආදිය එයට නිදසුන් වේ.

සමහර නාමපද පුරුෂාර්ථයක් ප්‍රකාශ නොකරයි. එහෙත් ඒ නාම පුරුෂාර්ථ ප්‍රකාශක නාම සේ වර නැගෙයි. රුක්ඛ, ලොක ආදි නාමත් පුලලිඞග නාම ලෙස ගැනේ. පුලලිඞග නාමයෝ අකාරන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරන්ත, හා ඕකාරන්ත යනුවෙන් සවරාන්ත කොටස්වලට බෙදෙති.

(ii) **ඉත්ථි ලිංග නාම**

යම් නාමයකින් ස්ත්‍රී භාවයක් ප්‍රකාශ වේ නම් ඒ නාම ස්ත්‍රී ලිඞ්ගයි. මාතු, දුහිතු, උපාසිකා යනු උදාහරණයයි.

සමහර නාම පද ස්ත්‍රී භාවයක් ප්‍රකාශ නොකරතත් ස්ත්‍රී ලිඞ්ගාර්ථ ප්‍රකාශක නාම සේ වරනැගේ. සද්ධා, මෙධා, චිනතා, නදී, වීණා, පඤ්ඤා යනු නිදසුන්ය.

ස්ත්‍රී ලිඞ්ග නාම ආකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත, ඕකාරාන්ත, යනුවෙන් කොටස් වේ.

(iii) **නපුංසක ලිංග නාම**

මෙහි දක්වන ලද පුල්ලිඞ්ග, ඉත්ථිලිඞ්ග යන දෙකොටසට අයත් නොවන නාම සියල්ලක් ම නපුංසක ලිඞ්ගයෝ වෙති. පුඤ්ඤ, පාප, ඵල, රූප, සොත, මන ආදිය නපුංසක ලිඞ්ග නාමයි. අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත යයි නපුංසක ලිඞ්ග සවරාන්ත වශයෙන් කොටස් වේ.

**විභක්ති**

විභක්ති යනු අර්ථවලට බෙදීමයි. යම් නාමයක් ඒ ඒ අර්ථවලට වෙන් කිරීමට උපයෝගී වන්නේ විභක්තියයි. විභක්ති නවයකි. මේ විභක්ති ඒක වචන, බහු වචන භේදයෙන් දෙයාකාරයි.

නාමයක් ඒ ඒ පඨමා, දුතියා ආදී විභක්තීන්ට බෙදා ගැනීමට උපකාරී වන්නේ ප්‍රත්‍යයයි. ප්‍රත්‍යය යනු කිසියම් අර්ථයක් ප්‍රකාශ කරන අකුරකට හෝ අකුරු කීපයකට කියන නමකි.

විභක්ති, ඒක වචන, බහු වචන හා ප්‍රත්‍යය පහත වගුවේ දක්වා ඇත.

| විභක්ති | ඒක වචන ප්‍රත්‍යය | බහු වචන ප්‍රත්‍යය |
|---|---|---|
| පඨමා | ඔ ආ | |
| ආලපන | අ,ආ ආ | |
| දුතියා | අං ඒ | |
| තතියා | එන එහි, එභි | |
| කරණ | එන එහි, එභි | |
| චතුත්ථී | ආය,අස්ස | ආනං |
| පංචමී | ආ, මහා,ස්මා | එහි, එභි |
| ඡට්ඨී | අස්ස | ආනං |
| සත්තමී | එ, මහි, ස්මිං | එසු |

වගුවේ දක්වා ඇත්තේ අකාරාන්ත පුලලිඞග නාම විභක්ති ප්‍රත්‍යයෝ වෙති. ඒ අනුව බුද්ධ ශබ්දය මෙසේ වරනැගේ.

| විභක්ති | ඒක වචන | බහු වචන |
|---|---|---|
| පඨමා | බුද්ධො | බුද්ධා |
| ආලපන | (හෙ) බුද්ධ බුද්ධා | භවනෙතා, බුද්ධා |
| දුතියා | බුද්ධං | බුද්ධෙ |
| තතියා | බුද්ධෙන | බුද්ධෙහි/බුද්ධෙභි |
| කරණ | බුද්ධෙන | බුද්ධෙහි/බුද්ධෙභි |
| චතුත්ථී | බුද්ධාය, බුද්ධස්ස | බුද්ධානං |
| පඤ්චමී | බුද්ධා,බුද්ධමහා,බුද්ධස්මා | බුද්ධෙහි/බුද්ධෙභි |
| ඡට්ඨී | බුද්ධස්ස | බුද්ධානං |
| සත්තමී | බුද්ධෙ, බුද්ධමහි, බුද්ධස්මිං | බුද්ධෙසු |

බුද්ධ ශබ්දයේ ඒ ඒ විභක්තීන්ගේ අර්ථ පිළිවෙළින් මෙසේයි.

| විභක්ති | ඒක වචන | බහු වචන |
|---|---|---|
| පඨමා | බුදුරජ තෙම | බුදුරජවරු |
| ආලපන | බුදුරදුනි | බුදුරජවරුනි |
| දුතියා | බුදුරජ | බුදුරජවරුනි |
| තතියා | බුදුරජ විසින් | බුදුරජවරුන් විසින් |
| කරණ | බුදුරජ කරණකොටගෙන | බුදුරජවරුන් කරණකොට ගෙන |
| චතුත්ථී | බුදුරජුට | බුදුරජවරුනට |
| පංචමී | බුදුරජුගෙන් | බුදුරජවරුන්ගෙන් |
| ඡට්ඨී | බුදුරජුගේ | බුදුරජවරුන්ගේ |
| සත්තමී | බුදුරජු කෙරෙහි | බුදුරජවරුන් කෙරෙහි |

පාලි භාෂාවෙහි සත්‍රී ලිඞග ප්‍රත්‍ය ප්‍රධාන වශයෙන් තුනක් දක්නට ඇත. ආ. ඊ. ඉනි යනුවෙනි.ඇතමෙක් ස්ත්‍රී ප්‍රත්‍ය ලෙස නි. ආනි. උ. ති. දක්වත්.

පිපාස + ආ - පිපාසා - පිපාසය
නද + ඊ - නදී - නදිය
භික්ඛු + ඉනි - භික්ඛුනී - භික්ෂුනිය
පරචිත්ත විදූ + නි - පරචිත්ත විදූනි - අනුන්ගේ සිත් දන්නා
මාතුල + ආනී - මාතුලානී - නැන්දනිය
රජ්ජු + උ - රජ්ජු - ලණුව
යුව + ති - යුවති - යුවතිය

යන මේවා ස්ත්‍රී ප්‍රත්‍ය සඳහා නිදසුනය. ස්ත්‍රී ලිංගික ආකාරාන්ත වනිතා ශබ්දය සියලු විභක්තිවල මෙසේ වර නැගේ.

| *විභක්ති* | *ඒකවචන* | *බහුවචන* |
|---|---|---|
| පඨමා | වනිතා වනිතා/වනිතායො | |
| ආලපන | (හෙ) වනිතා | (හොති) වනිතා/වනිතායො |
| දුතියා | වනිතං වනිතා/වනාතායො | |
| තතියා | වනිතාය වනිතාහි/වනිතාභි | |
| කරණ | වනිතාය වනිතාහි/වානිතාභි | |
| චතුත්ථි | වනිතාය වනිතානං | |
| පංචමි | වනිතාය වනිතාහි/වනිතාභි | |
| ඡට්ඨී | වනිතාය වනිතානං | |
| සත්තමි | වනිතායං, වනිතාය | වනිතාසු |

වනිතා ශබ්දයේ ඒ ඒ විභක්තීන්ගේ අර්ථ පිළිවෙලින් මෙසේ යි.

| *විභක්ති* | *ඒක වචන* | *බහු වචන* |
|---|---|---|
| පඨමා | වනිතාව වනිතාවෝ | |
| ආලපන | එම්බා වනිතාව | එම්බා වනිතාවනි |
| දුතියා | වනිතාව වනිතාවන් | |
| තතියා | වනිතාව විසින් | වනිතාවන් විසින් |
| කරණ | වනිතාව කරණකොට | වනිතාවන් කරණකොට |
| චතුත්ථී | වනිතාවට | වනිතාවන්ට |
| පංචමී | වනිතාව කෙරෙන් | වනිතාවන් කෙරෙන් |
| ඡට්ඨී | වනිතාවගේ | වනිතාවන්ගේ |
| සත්තමී | වනිතාව කෙරෙ1හි | වනිතාවන් කෙරෙහි |

නපුංසක ලිඞග අකාරාන්ත ඵල ශබ්දය සියලු විභක්තිවල මෙසේ වර නැගේ.

| විභක්ති | ඒක වචන | බහු වචන |
|---|---|---|
| පඨමා | ඵලං | ඵලෙ/ඵලානි |
| ආලපන | හෙ ඵල | හෙ ඵලෙ/ඵලානි |
| දුතියා | ඵලං | ඵලෙ/ඵලානි |
| තතියා | ඵලෙන | ඵලෙහි/ඵලෙහි |
| කරණ | ඵලෙන | ඵලෙහි/ඵලෙහි |
| චතුත්ථී | ඵලාය/ඵලස්ස | ඵලානං |
| පංචමී | ඵලෙන | ඵලෙහි/ඵලෙහි |
| ඡට්ඨී | ඵලස්ස | ඵලානං |
| සත්තමී | ඵලෙ/ඵලම්හි/ඵලස්මිං | ඵලෙසු |

ඵල ශබ්දයේ ඒ ඒ විභක්තීන්ගේ අර්ථ පිළිවෙලින් මෙසේය.

| විභක්ති | ඒක වචන | බහු වචන |
|---|---|---|
| පඨමා | ගෙඩිය | ගෙඩි |
| ආලපන | එම්බා ගෙඩිය | එම්බා ගෙඩි |
| දුතියා | ගෙඩිය | ගෙඩි |
| තතියා | ගෙඩිය විසින් | ගෙඩි විසින් |
| කරණ | ගෙඩිය කරණකොට | ගෙඩි කරණකොට |
| චතුත්ථී | ගෙඩියට | ගෙඩිවලට |
| පංචමී | ගෙඩියෙන් | ගෙඩිවලින් |
| ඡට්ඨී | ගෙඩියේ | ගෙඩිවල |
| සත්තමී | ගෙඩිය කෙරෙහි | ගෙඩි කෙරෙහි |

**අභ්‍යාසය 02**

(1) නාම යනු කවරේද ?
(2) නාම ප්‍රභේද වෙන වෙන ම විස්තර කරන්න.
(3) විභක්ති කීයද? ඒ මොනවාද?
(4) ස්ත්‍රී ලිඞග ප්‍රත්‍ය දක්වන්න.
(5) නාම තුනක් තුන් ලිඞගයෙහි සියලු විභක්තිවල වෙන වෙන ම වර නගන්න.

## තතියො පාඨො
## තුන්වන පාඩම

### පාඩමේ අරමුණු

(i) පාලි භාෂාවේ සන්ධි හඳුනා ගැනීම.
(ii) එය වාක්‍යවල යෙදෙන අයුරු තේරුම් ගැනීම.

ලියන කියන භාෂාවක වෙන් වූ පද දෙකක පූර්ව, පර වර්ණ (අකුරු) යෝග්‍ය අයුරින් එක් කිරීම සන්ධි නමින් හඳුන්වනු ලැබේ. ඒ සන්ධි කිරීම අකුරු ලොප් කිරීමෙන්, ආදේශ කිරීමෙන්, ආගම කිරීමෙන් හෝ අන්‍ය විධියකින් සිදු කිරීමට හැකිය. එසේ සන්ධි කිරීමෙන් භාෂාවකට ඇතිවන ප්‍රයෝජන රාශියකි.

(1) පහසුවෙන් උච්ඡාරණය කිරීම.

(2) ඉක්මණින් කතා කිරීමට පහසුවීම.

(3) පද්‍යකරණයේ දී ඡන්දස් රැකීම.

(4) ඉක්මණින් ලිවීමට පහසුවීම.

(5) භාෂාවේ ක්‍රමානුකූල බව හා ව්‍යක්ත බව.

(i)ලෝපය — ලෝපය යනු නොකියා හැරීමයි. නොලියා හැරීමයි. මකා දැමීම හෝ ඉවත් කරනු ලැබීමයි. සන්ධි විධියේ දී අකුරු නොකියා හැරීම හෝ නොලියා හැරීම ලෝප නම්.

(ii) ආදේශ — යම් වචනයක අකුරක් ඉවත් කොට ඒ වෙනුවට සුදුසු තවත් අකුරක් එකතු කිරීම ආදේශයයි.

(iii) ආගම — යම් වචනයක දෙපස ඇති අකුරුවලට කිසිදු වෙනසක් නොකොට ඒ අතරට ගැලපෙන අකුරක් එකතු කිරීම ආගමයි.

සිංහල භාෂාවේ සන්ධි වර්ග කීපයක් ඇත. එය ඔබ උගෙන ඇතැයි සිතමු. එසේ ම පාලි භාෂාවෙහි ද සන්ධි වර්ග කීපයක් තිබේ. ඒවා නම් -

(i) සවර සනධි
(ii) ව්‍යඤ්ජන සනධි
(iii) නිගගහීත සනධි

### (1) සවර සන්ධිය

තනිව ශබ්ද කළ හැකි අකුරුවලට ස්වර යයි කියනු ලැබේ. පාලි භාෂාවෙහි ස්වර අටකි. අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඔ යන අටයි. මේ ස්වර අට පිළිබඳ ලෝප, ආදේශ, ආගම ආදී වියරණ විධිවලින් සිදුවන සන්ධිකාර්‍ය්‍ය ස්වර සනධි නම් වේ.

**උදාහරණ**

(i) **(සවර) ලෝප සන්ධිය**

ලොක + අගෙගා (විසන්ධිය)
ලොක් + අ + අගෙගා (ස්වර ව්‍යඤ්ජන වෙන් කිරීම)
ලොක් + + අගෙගා (ස්වර ලෝපය)
ලොකගෙගා (සන්ධිය)

(ii) **(සවර) ආදේශ සන්ධිය**

යථා + උදකං
යථ් + ආ + උදකං
යථ් + ඔදකං (ආ, උ දෙකට ඕ ආදේශ වීම)
යථොදකං

(iii) **(සවර) ආගම සන්ධිය**

ඉතො + ආයති
ඉතො + න් + ආයති (න් යන්නක් ආගම වීම)
ඉතොනායති

**(2) ව්‍යඤ්ජන සන්ධිය**

පාලි හෝඩියේ ස්වර අකුරු අට හැර ඉතිරි ක, ඛ, ග, ඝ, ඞ ආදී අකුරු තිස් තුන (33) තනිව ශබ්ද කළ නොහැකි බැවින් ව්‍යඤ්ජන යයි ව්‍යවහාර කෙරේ. මේ ව්‍යඤ්ජන නිමිති කොට ආදේශ ආගම ආදී වියරණ විධිවලින් සිදුවන සන්ධිකාර්‍ය්‍ය ව්‍යඤ්ජන සන්ධි නම් වේ.

*උදාහරණ :—*

(i) **(ව්‍යඤ්ජන) ආදේශ සන්ධිය**

පර + සහස්සං
පර් + අ + සහස්සං
පර් + ඔ + සහස්සං (අ යන්නට ඔ ආදේශ වීම)
පරොසහස්සං

(ii) **(ව්‍යඤ්ජන) ආගම සන්ධිය**

සො + භික්ඛු
ස් + ඔ + භික්ඛු
ස් + භික්ඛු (ඔ ලොප් වීම)
ස් + අ + භික්ඛු(අ ආගම වීම)
සභික්ඛු (සන්ධිය)

**(3) නිග්ගහීත සන්ධිය**

පාලි භාෂාවේ නිග්ගහීතය යනුවෙන් හඳුන්වනු ලබන්නේ බින්දුවයි (0) වර්ණ මාලාවේ දී බින්දුව අ යන්න සමඟ දක්වා තිබේ. (අං) මේ නිග්ගහීතය පිළිබඳ ලෝප, ආගම ආදී වියරණ විධිවලින් සිදුවන සන්ධි කාර්‍ය්‍ය නිග්ගහීත සන්ධි නම්වේ.

*උදාහරණ :—*

(i) **(නිග්ගහීත) ලෝප සන්ධිය**

බුද්ධානං + සාසනං
බුද්ධානසාසනං (බින්දුව ලොප් වී)

(ii) **(නිග්ගහීත) ආදේශ සන්ධිය**

යං + අනිච්චං
යද් + අනිච්චං (ද යන්නක් ආදේශ වීම)
යදනිච්චං

(iii) **(නිග්ගහීත) ආගම සන්ධිය**

චක්ඛු + උදපාදි
චක්ඛුං උදපාදි (බින්දුවක් ආගම වී)
මෙහි දැක්වූ සන්ධි විධි වාක්‍යවල යෙදෙන අයුරු අවබෝධ කර ගනිමු.

(1) දායකා ථෙරස්ස චඞ්කමනට්ඨානං **කාලස්සෙව** න පස්සිංසු
(2) **තස්මාතිහ** භික්ඛවෙ එවං සික්ඛිතබ්බං
(3) **අහම්පි තත්ථෙව** ගමිස්සාමි
(4) **සබ්බෙව** මයං ධම්මං සුත්වා තං සාධුකං මනසිකරිස්සාම
(5) තතො නං සුඛමන්වෙති **ඡායාව** අනපායිනී
(6) එතං **මඞ්ගලමුත්තමං**
(7) සො භගවා ඉතිපි අරහං හොති
(8) තෙ තථාගතස්සුපට්ඨානං **ගච්ඡන්ති**

**වචන මාලාව**

| *නාම පද* | *ක්‍රියා පද* |
|---|---|
| චඞ්කමනට්ඨානං - සක්මන් කරන තැන<br>සබ්බෙව - සියල්ලෝ ම<br>අනපායිනී - අත නොහැර එන<br>අහම්පි - මම ද<br>නිපාත පද<br>ඉතිපි - මෙසේ ද | අන්වෙති - අනුව එයි<br><br>කෘදන්ත පද<br>සික්ඛිතබ්බං - හික්මිය යුතුයි |

**අභ්‍යාස 3**

(1) මුලින් ඇති පාලි වාක්‍ය සිංහලෙන් ලියන්න.

(2) පාලි භාෂාවේ සන්ධි වර්ග තුනකි. නම් කරන්න.

(3) නිග්ගහීත සන්ධිය විස්තර කරන්න.

(4) ලෝප ආදේශ ආගම වෙන වෙන ම හඳුන්වන්න.

(5) මෙම පාඩමේ ඉරි ඇඳ ඇත්තේ සන්ධි පද සඳහායි. ඒ පද විසන්ධි කොට දක්වන්න.

(6) පහත එන විසන්ධි පද සන්ධි කරන්න.

**පළමු පේළිය උදාහරණයට ගන්න.**

| *විසන්ධි පද* | *සන්ධි පද* |
|---|---|
| තත්‍ර + අයං | තත්‍රායං |
| තදා + අහං | |
| ගච්ඡාමි + ඉති | |
| සබ්බ + එව | |
| ඡායා + ඉව | |
| සො + මුනි | |
| අව + සිරො | |

# චතුත්ථො පාඨො

## හතරවන පාඩම

**පාඩමේ අරමුණු**

| | |
|---|---|
| (i) | පාලි භාෂාවේ සමාස පද පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම |
| (ii) | එම සමාස පද වාක්‍යවල යෙදෙන අයුරු තේරුම් ගැනීම. |

(අ) සමාස යනු පදයන්ගේ කෙටි කිරීමයි. එකිනෙකට සම්බන්ධ අර්ථයක් ඇති පද දෙකක් හෝ ඊට වැඩි ගණනක් එක් කොට එක පදයක් සේ ගැලපීම සමාසයි. සමාස වන පදයන්ගේ මුලින් තිබූ විභක්ති ලොප් කරනු ලැබේ. ඉන් පසු සමාස වන පද එකතුකොට එක් විභක්ත්‍යාන්ත පදයක් බවට පත් කෙරේ. ඒ සමාස පදය සාමාන්‍ය නාම පදයක් ලෙස පඨමා, දුතියා ආදී සියලු විභක්තිවල වරනැගේ.

1. පද කෙටි කිරීම,
2. පහසු උච්චාරණය,
3. වාක්‍ය අලංකාරය,
4. ඒක විභක්ති වීම යනුවෙන් සමාසයෙහි ප්‍රයෝජන කීපයකි.

පාලි භාෂාවේ සමාස හයකි.

| *සමාසය* | *සමාසය* | *සමස්* |
|---|---|---|
| 1. කම්මධාර | - විශේෂණ - විශේෂ්‍ය | - වෙසෙසුන්-වෙසස් |
| 2. දිගු | - කම්මධාර සමාසයේ | ප්‍රභෙදයකි |
| 3. තප්පුරිස | - විභක්ති | - විබත් |
| 4. බහුබ්බීහි | - අන්‍යාර්ථ | - අන්අරුත් |
| 5. ද්වන්ද - | - දකාරාර්ථ | - ද අරුත් |
| 6. අව්‍යයීභාව | - අව්‍ය | - අවිය |

## I. කම්මධාර සමාසය

විශේෂණ විශෙෂ්‍ය වශයෙන් එක් අර්ථයෙක්හි යෙදෙන සමාන විභක්ති ඇති පද දෙකක් එක් කිරීම කම්මධාර සමාස නම්. විශෙෂ්‍ය පදය මුලින් සිටීම මෙම සමාසයේ ප්‍රධාන ලක්ෂණයකි.

වීර-පුරිසෝ යනු සමාස පදයකි.

විරෝ ච සො පුරිසෝ චාති වීරපුරිසෝ - යනු සමාස විග්‍රහයයි. වීරෝ + පුරිසෝ යන තැන වීරො යන විශේෂණ පදයයි.

පුරිසො යනු විශෙෂ්‍ය පදයයි.

*උදාහරණ*

| *විශේෂණ + විශෙෂ්‍ය* | *සමාස පද* | *අර්ථ* |
|---|---|---|
| සුමෙධො + පණ්ඩිතො - | සුමෙධ පණ්ඩිතො - | සුමෙධ පණ්ඩිත තෙම |
| බුද්ධඝොෂ + ආචරියො | බුද්ධඝොසාචරියො - | බුද්ධඝොෂ ආචාර්‍ය්‍ය තෙම |
| සෙතො + හත්‍ථි - | සෙතහත්‍ථි - | සුදු ඇතා |
| රත්තං + උප්පලං - | රත්තුප්පලං - | රතු උපුල් |
| සෙතං + වත්ථං - | සෙතවත්ථං - | සුදුවත |

## II. දිගු සමාසය :-

සංඛ්‍යාවන් පූර්වකොට ඇත්තේ දිගු සමාසයි. මෙම සමාසය කම්මධාර සමාසයට ම අයත් වේ. නපුංසකලිංග ඒක වචනයෙන් සිටීම දිගු සමාසයේ විශේෂ ලක්ෂණයකි. ඇතැම්විට බහුවචනයෙන් සිටී.

*උදාහරණ*

| සංඛ්‍යා ශබ්ද + විශේෂ්‍ය | සමාසපද | අර්ථ |
|---|---|---|
| පඤ්ච + සීලානි - | පඤ්චසීලං | - පන්සිල් |
| තයො + ලොකා - | තිලොකං | - තුන්ලොව |
| සත්ත + අහානි - | සත්තාහං | - සතියක් |

## III. තප්පුරිස සමාසය :-

පඨමා ආලපන විභක්ති හැර සෙසු විභක්ති ගත් නාම පදයන් ඒ නාමපදයන්ට පසුව සිටි නාම පදය සමඟ සමාසවීම තප්පුරිස සමාසයි. තප්පුරිස යනු විභක්ති සමාසයයි.

| විභක්ති | විභක්ති පද සමඟ | සමාසපද | අර්ථ |
|---|---|---|---|
| දුතියා | ගාමං + ගතො - | ගාමගතො | ගමට ගියේ |
| තතියා | වාචාය + නිපුණො - | වාචානිපුණො | වචනයෙන් දක්ෂ වූයේ |
| චතුතථී | චීවරස්ස + දුස්සං - | චීවරදුස්සං | සිවුරට වස්ත්‍රය |
| පඤ්චමී | රාජතො + භයං - | රාජභයං | රජුගෙන් වූ භය |
| ඡට්ඨී | බුද්ධස්ස + සාවකො - | බුද්ධසාවකො | බුද්ධ ශ්‍රාවක තෙම |
| සත්තමී | ධම්මේ + රතො - | ධම්මරතො | ධර්මයෙහි ඇලුණේ |

## 4. බහුබ්බීහි සමාසය :-

සමාස වන පදවල ඇති අර්ථය හැර සමාසවූ පසු වෙනත් අර්ථයක් කියවෙන සමාසය බහුබබීහි සමාස නමින් හැඳින් වේ.

*උදාහරණ :-*

| විභක්ති | විග්‍රහ වාක්‍ය | සමාස පද |
|---|---|---|
| පඨමා | සහ පරිවාරෙන යො වත්තතෙ සො | සපරිවාරො (රාජා) |
| දුතියා | ආගතා සමණා යං සො - | ආගතසමණො (විහාරො) |
| තතියා | දිට්ඨො ධම්මො යෙන සො - | දිට්ඨධම්මො (අරියසාවකො) |
| චතුත්ථී | උපනීතං භොජනං යස්ස සො | උපනීතභොජනො (භික්ඛු) |
| පංචමි | අපෙතං විඤ්ඤාණං යස්මා, සො - | අපෙත විඤ්ඤාණො (මතකායො) |
| ඡට්ඨී | ඛීණා ආසවා යස්ස, සො - | ඛීණාසවො (අරහා) |
| සත්තමී | බහවො තාපසා යස්මිං, සො - | බහුතාපසො (අස්සමො) |

5. ද්වන්ද සමාසය :-

වෙන් වෙන් වූ අර්ථ ඇති නාමපද සමාස කිරීම ද්වන්ද සමාසයි. ච ශබ්දයෙන් පද සමාස කරන (ද යන්නෙන් සම්බන්ධකරන) බැවින් ද්වන්ද නම්, මේ අයුරින් පද දෙකක් හෝ වැඩි ගණනක් සමාස කළ හැකිය. සුදුසු පද පමණක් මෙසේ සමාස වේ.

| සමාස විග්‍රහ වාක්‍යය | සමාස පද | අර්ථ |
|---|---|---|
| නාමඤ්ච රූපඤ්ච | නාමරූපං | නාමරූප |
| හත්ථී ච ගාවො ච - | හත්ථිගවාස්ස - | ඇත්, ගව, අස් වෙළඹ |
| අස්සා ච වළවා ච | වළවං | |
| මාතා ච පිතා ච | මාතාපිතරො | මව්පියවරු |
| සුරාච අසුරාච නරාච | සුරාසුරනරො - | දෙවි - අසුර - මනුෂ්‍ය |
| උරගාච නාගච යක්ඛා ච | රගනාගයක්ඛා | උරග - නාග - යක්ෂ |

6. අව්‍යයීභාව සමාසය

අව්‍ය යනු උපසර්ග හා නිපාතය. ඒ උපසර්ග, නිපාත පදයන් මුලින් සිට පර වූ පදයන් හා සමාස වන්නේ අව්‍යයීභාවයි. මෙහි අවශ්‍ය පදය ප්‍රධාන වෙයි. සමාස වූ පසු නපුංසකලිංග වේ.

| අව්‍ය පද සමඟ | සමාස පද | අර්ථ |
|---|---|---|
| නගරස්ස + උප - | උපනගරං | උපනගරය |
| රථස්ස + අනු - | අනුරථං | රථය අනුව |
| වාතස්ස + පටි - | පටිවාතං | උඩු සුළඟ |
| ජීවස්ස + යාව - | යාවජීවං | ජීවිතාන්තය දක්වා |
| සත්ති + යථා - | යථාසත්ති | ශක්ති හැටියට |
| භත්තස්ස + පච්ඡා - | පච්ඡාභත්තං | පසුබත් කාලය |

(ආ) සමාස පද වාක්‍යවල යෙදෙන අයුරු තේරුම් ගන්න.

(i) බුද්ධඝොසාචරියො අට්ඨකථායො මාගධභාසං පරිවත්තෙසි.

(ii) ධම්මාසොක මහාරාජා බුද්ධසාසනං සොධාපෙසි

(iii) පංචවග්ගියා භික්ඛූ ධම්මචක්කප්පවත්තනසුත්තදෙසනං සුණිංසු

(iv) දානපති සම්පාදිත ධනං ච සුනිහිත ධනං ච සබ්බං අත්තනො මාතාපිතූන්නං දත්වා තෙ සමස්සාසෙත්වා නගරමෙව අගමාසි.

(v) ජිතින්ද්‍රියො කපිලවත්ථුනගරමාගන්වා අත්තනො ඤාතීනං ධම්මං දෙසෙසි.

(vi) සීලසුගන්ධො පටිවාතං වායති.

වචන මාලාව

| නාම පද | ක්‍රියා පද |
|---|---|
| අට්ඨකථායො - අටුවාකතා | පරිවත්තෙසි - පරිවර්තනය කළේය. |
| මාගධභාසං - පාලිභාෂාවට | සොධාපෙසි - ශුද්ධ කරවිය |
| දානපති - දානපති තෙමේ | අගමාසි - ගියේය |
| | වායති - හමයි |
| | සුණිංසු - ඇසූහ |
| | පාපුණි - පත්වූයේය |

සමාස පද

| | | |
|---|---|---|
| තිලොකං | - | තුන්ලොව |
| අරහත්තං | - | රහත් බවට |
| සාරිපුත්ත | - | සැරියුත් - |
| මොග්ගල්ලානා | - | මුගලන් දෙනම |
| ජිතින්ද්‍රියො | - | දිනූ ඉඳුරන් ඇති (බුදුරජ) |
| පටිවාතං | - | උඩු සුළඟට |
| මාතාපිතූනන්නං | - | මවුපියන්ට |

අභ්‍යාසය - 4

(1) 'ආ' යටතේ එන පාලි වාක්‍ය සිංහලෙන් ලියන්න.

(2) 'ආ' යටතේ එන පාලි වාක්‍යවල ඇති සමාස පද සොයා ගැලපෙන පරිදි වගු ගත කරන්න.

| සමාස පදය | තේරුම | අදාළ සමාසය |
|---|---|---|
| බුද්ධඝොසාචරියො | බුද්ධඝොෂාචාර්‍යයීතුමා | කම්මධාරය සමාසය |
| | | |
| | | |
| | | |

3. මෙම වාක්‍ය පාලියෙන් ලියන්න.

(i) සුමේධ පණ්ඩිත තෙමේ නුවරට ගියේය.

(ii) බුදුරජාණන් වහන්සේ තුන්ලොව එළිය කළහ.

(iii) බුද්ධ ශ්‍රාවකයා බුද්ධ වචනය අසා රහත්බවට පත්වූයේ ය.

(iv) සැරියුත් මුගලන් දෙනම බුදුරදුන්ගේ අගසව්වෝ වූහ.

(4) සමාස පිළිබඳ හැඳින්වීමක් කොට බහුබ්බීහි සමාසය විස්තර කරන්න.

(5) මේ සමාස පද අතුරෙන් දිගු සමාස පද තෝරා ලියන්න.

1. පඨමපුරිසො
2. වීරපුරිසො
3. තිලොකං
4. රතනලතා
5. තිදණ්ඩං
6. චතුද්දිසං
7. නාගමානවිකා
8. පඤ්චසීලං
9. මහාබලං
10. සත්තයොජනං

# පඤ්චමො පාඨො

## පස්වන පාඩම

### පාඩමේ අරමුණු

| |
|---|
| (i) පාලි භාෂාවේ තදධිත පද පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම. |
| (ii) ඒවා වාක්‍යවල යෙදෙන අයුරු තේරුම් ගැනීම. |

විශේෂ අර්ථයක් ප්‍රකාශ කිරීම සඳහා නාමයකින් පරව ප්‍රත්‍ය යොදා, සාදන පද තද්ධිත නම්. තදධිත පද අයත් වන්නේ නාම කොටසටය. සාමාන්‍ය නාමයක් මෙන් තද්ධිත නාම ද විභක්තිවල වර නැගේ. තද්ධිත ප්‍රධාන කොටස් තුනකි.

(i) සාමඤ්ඤ තද්ධිත
(ii) භාව තදධිත
(iii) අව්‍ය තදධිත යනුවෙනි.

පාලි භාෂාවේ නාම පද අතර තදධිත නාම පද ද හමුවේ. ඒ පිළිබඳ මූලික අවබෝධයක් ඇතිකර ගැනීම සඳහා විවිධ අර්ථවල යෙදෙන තදධිත ප්‍රත්‍ය කීපයක් හා පද ස්වල්පයක් දක්වනු ලැබේ.

1. සාමඤ්ඤතදධිතය

| *නාමපද + තදධිත ප්‍රත්‍ය* | *තදධිත පද* | *අර්ථය* |
|---|---|---|
| නගර + ඉක | නාගරික | නගරයෙහි වෙසෙන |
| පද + ඉක | පදික | පයින් යන්නා |
| රථ + ඉක | රථික | රථයෙන් යන්නා |
| සංඝ + ඉක | සංඝික | සංඝයාට අයත් |
| ලොක + ඉක | ලෞකික | ලෝකයට අයත් |
| මෙධා + වී | මෙධාවී | ප්‍රඥා ඇති |
| පාප + තර | පාපතර | වඩා පවිටු |
| හීන + තර | හීනතර | වඩා ලාමක වූ |
| පාප + තම | පාපතම | අතිශයින් පවිටු |
| හීන + තම | හීනතම | අතිශයින් ලාමකවූ |
| ධන + වන්තු | ධනවන්තු | ධනවත් |
| බුද්ධි + මන්තු | බුද්ධිමන්තු | නුවණැති |
| ගුණ + වන්තු | ගුණවන්තු | ගුණ ඇති |
| සුවණ්ණ + මය | සොවණ්ණමය | රනින් කරන ලද |
| පඤ්ච + ම | පඤ්චම | පස්වෙනි |

II. භාව තද්ධිතය

| නාමපද + තද්ධිත ප්‍රත්‍ය | තද්ධිත පද | අර්ථය |
|---|---|---|
| ජන + තා | ජනතා | ජනසමූහය |
| මුදු + තා | මුදුතා | මෘදුබව |
| සූර + තා | සූරතා | ශූරබව |
| ලහු + තා | ලහුතා | සැහැල්ලු බව |
| කතඤ්ඤු + තා | කතඤ්ඤුතා | කළගුණදන්නා බව |
| මනුස්ස + තත | මනුස්සත | මිනිසත් බව |
| සෙට්ඨ + තත | සෙට්ඨත්ත | ශ්‍රේෂ්ඨ බව |
| අරොග + ණ්‍ය | ආරොග්‍ය | නිරෝගි බව |
| සමණ + ණ්‍ය | සාමඤ්ඤ | ශ්‍රමණ බව |
| ගිලාන + ණ්‍ය | ගෙලඤ්ඤ | ගිලන් බව |

III. අව්‍ය තද්ධිතය

| නාමපද + තද්ධිත ප්‍රත්‍ය | තද්ධිත පද | අර්ථය |
|---|---|---|
| එක කඛත්තුං | එකකඛත්තුං | එක්වරක් |
| සත්ත කඛත්තුං | සත්තකඛත්තුං | සත්වරක් |
| දස ධා | දසධා | දස ආකාරයකට |
| සත්ත ධා | සත්තධා | හත් ආකාරයකට |
| චතු ධා | චතුධා | සතර ආකාරයකට |
| ත ද | තද | එකල්හි |
| කිං ද | කද | කවර කලෙක |
| ය ද | යද | යම්කලෙක |

(අ) විවිධ අර්ථවල යෙදෙන තද්ධිත පද වාක්‍යවල යෙදෙන අයුරු අවබෝධ කර ගන්න.

01. බහු නාගරිකා රාජගහෙ නිවසිංසු
02. රාජා සොවණ්ණමයං කරණ්ඩකං කත්වා ධාතුයො තත්ථ ඨපෙසි

03. කතඤ්ඤුතා ලොකෙ දුල්ලභා හොති.
04. සොතාපනෙනා සත්තක්ඛත්තුං උපපජ්ජති.
05. අත්තනො භොගෙ චතුධා විභජෙය්‍ය.

වචන මාලා

| නාමපද | ක්‍රියා පද |
|---|---|
| ආයස්මා - ආයුස්මත් | නිවසිංසු - විසූහ |
| මච්ඡෙරං - මසුරුබව | චුචියාසි - නැගී සිටියේය. |
| දක්ඛිණ පස්සෙන - දකුණු පසින් | පාපුණාති - පැමිණෙයි. |
| ලාභා - ලාභයෝ | දුල්ලභං හොති - දුර්ලභ වෙයි. |
| ලොකෙ - ලෝකයෙහි | විභජෙය්‍ය - බෙදිය යුතුයි. |

තද්ධිත පද

| | | |
|---|---|---|
| පදිකා | - | පයින් යන්නෝ |
| නාගරිකා | - | නුවර වැස්සෝ |
| ලොකිකං | - | ලෝකයට අයත් |
| ආරෝග්‍ය | - | නිරෝගී බව |
| මනුස්සත්තං | - | මිනිසත් බව |
| අනිච්චතං | - | අනිත්‍යභාවයට |
| ඉද්ධිමන්තානං | - | සෘද්ධිමතුන් අතුරෙන් |

අභ්‍යාස - **05**

01. 'අ' ඡේදය යටතේ එන වාක්‍ය පහ සිංහලෙන් ලියන්න.
02. මෙම පාඩමේ එන තද්ධිත පද පහක් ලියා තේරුම ලියන්න.
03. මෙම වාක්‍ය පාලියෙන් ලියන්න.
    (i) පයින් යන්නෝ මාර්ගයෙහි දකුණුපසින් යති.
    (ii) නුවර වැස්සෝ භික්ෂූන්ට දන් දෙති. බණ අසති

(iii) ලෝකයට අයත් සියල්ල අනිත්‍ය භාවයට පැමිණේ.
(iv) ලාභයෝ නිරෝගීබව පරමකොට ඇත්තාහ.
(v) මිනිසත්බව ලොකයෙහි දුර්ලභ වෙයි.

04. මෙම වාක්‍ය සිංහලෙන් ලියන්න.

(i) මහා මොග්ගල්ලානො ඉද්ධිමන්තානං අග්ගො අහොසි.
(ii) ධනවන්තා මච්ඡරං පහාය දානං දාතුං අරහන්ති.
(iii) ආයස්මා ගිරිමානන්දො සතත බොජ්ඣඞ්ග භාවෙන්වා ගෙලඤ්ඤම්හා වුට්ඨාසි.
(iv) සාමණෙරා පාතො ච වුට්ඨාය චෙතියඞ්ගණං සම්මජ්ජන්ති.
(v) කතඤ්ඤුතා ලොකෙ අතිවිය දුල්ලභාති, බුද්ධො දෙසෙසි.

05. පහත දැක්වෙන තද්ධිත පදවල තේරුම ලියන්න.

(i) මහාමොග්ගල්ලානො -
(ii) ධනවන්තා -
(iii) ගෙලඤ්ඤම්හා -
(iv) සාමණෙරා -
(v) කතඤ්ඤුතා -

# ඡට්ඨො පාඨො

## හයවන පාඩම

පාඩමේ අරමුණු

| | |
|---|---|
| (i) | පාලි භාෂාවේ කිතක පද පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම |
| (ii) | ඒවා වාක්‍යවල යෙදෙන අයුරු තේරුම් ගැනීම |

(අ) ධාතුවක් අගට ප්‍රත්‍යයක් එකතු කොට සාදා ගනු ලබන්නේ කිතක නම්. මේවා කෘදන්ත පද නමින් ද හැඳින්වේ.

කිතක ප්‍රධාන කොටස් දෙකකි.

1. කිච්ච
2. කිතක

1. කිච්ච :

කිච්ච, ප්‍රත්‍යවලට කාල විශේෂයක් නැත. කර්මකාරකයෙහි යෙදේ. තබ්බ, අනීය, ණ්‍ය, ණීය, තයා, ඉච්ච යනු එබඳු ප්‍රත්‍ය කීපයකි. මේ ප්‍රත්‍යය එකතු වී සෑදෙන කිච්ච පද කීපයක් වගුවේ දැක්වේ.

උදාහරණ

| ධාතුව + ප්‍රත්‍ය | | කෘදන්ත පද | අර්ථ |
|---|---|---|---|
| කර | + තබ්බ | කාතබ්බ | කටයුතු/කළයුතු |
| කර | + අනීය | කරණීය | කළයුතු/කටයුතු |
| යු | + ණ්‍ය | යොජ්‍ය | යෙදිය යුතු |
| කර | + ණීය | කාරිය | කටයුතු/කළයුතු |
| පද | + තයා | පතතයා | පැමිණිය යුතු |
| කර | + ඉච්ච | කිච්ච | කළයුතු/කටයුතු |

2. කිතක :

කසිතබ්බං (සීසෑ යුතුයි) ගතො (ගියේ) යනාදි කිතක පද, අවසාන ශුද්ධ ක්‍රියාවක් නො ගනී. වාක්‍යයක යෙදූ විට එම වාක්‍ය සම්පූර්ණ නො වෙයි. එම කිතක පද යෙදූ වාක්‍ය සම්පූර්ණ කිරීමට ඇතැමෙක් 'හොති' යන්න යොදති.

*උදාහරණ* :-

කසිතබ්බං හොති - සීසෑ යුතු වෙයි
ගතො හොති - ගියේ වෙයි.

එවිට සම්පූර්ණ වාක්‍ය ලැබේ. කිතක ප්‍රත්‍ය රාශියකි. විවිධ අර්ථවල ඒවා යෙදෙයි. න්ත, මාන, ප්‍රත්‍ය වර්තමාන කාල මිශ්‍ර ක්‍රියා අර්ථයෙහිත් ත, තවන්තු, තාවී, ප්‍රත්‍ය අතීත කාලයෙහිත් යෙදේ. මේ ප්‍රත්‍යය එකතු වී සෑදෙන කෘදන්ත පද කීපයක් පහත වගුවේ දැක් වේ.

*උදාහරණ* :-

| ධාතුව + ප්‍රත්‍ය | කෘදන්ත පද | අර්ථ |
|---|---|---|
| හස + න්ත | හසන්ත | සිනාසෙමින් |
| පච + න්ත | පචන්ත | පිසිමින්/උයමින් |
| කර + න්ත | කරොන්ත | කරමින් |
| දිස්ස + මාන | දිස්සමාන | දකිමින් |
| දද + මාන | දදමාන | දෙමින් |
| හස + මාන | හසමාන | සිනාසෙමින් |

අතීත කාල

| ධාතුව + ප්‍රත්‍ය | | කෘදන්ත පද | අර්ථ |
|---|---|---|---|
| භුජ් | + ත | භුත්ත | අනුභව කළ |
| මුච | + ත | මුත්ත | මිදුණු |
| භුජ් | + තවන්තු | භුත්තවා | අනුභව කරන ලද |
| මුච | + තවන්තු | මුත්තවා | මිදුණු |
| භුජ් | + තාවි | භුත්තාවි | අනුභව කරන ලද |
| මුච | + තාවි | මුත්තාවි | මිදුණු |

(ආ) කෘදන්ත පද නිපාත මෙන් ද ගැනේ. ධාතුන් කෙරෙන් තුං ප්‍රත්‍යය යොදා මේ කෘදන්ත පද සාදා ගනු ලැබේ. ට, පිණිස, සඳහා යන අර්ථ ප්‍රකාශ කෙරේ.

*උදාහරණ* :

| | |
|---|---|
| පචිතුං | පිසන්ට<br>පිසීම පිණිස<br>පිසීම සඳහා |
| ධාවිතුං | දුවන්ට<br>දිවීම පිණිස<br>දිවීම සඳහා |
| දාතුං | දෙන්ට<br>දීම පිණිස<br>දීම සඳහා |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඛාදිතුං | - | කන්ට | කත්තුං | - | කරන්ට |
| | | | ඡෙත්තුං | - | කපන්ට |
| හරිතුං | - | ගෙනයන්ට | වත්තුං | - | කියන්ට |

| | | | |
|---|---|---|---|
| සුණිතුං | - අසන්නට | නෙතුං | - ගෙනයන්ට |
| ජානිතුං | - දැනගන්ට | සොතුං | - අසන්ට |
| ජිනදිතුං | - කපන්ට | හොතුං | - වෙන්ට |
| | | පාතුං | - බොන්ට |
| ඨාතුං | - සිටින්ට | කාරයිතුං | - කරවන්ට |
| ඤාතුං | - දැනගන්ට | දෙසෙතුං | - දේශනා කරන්ට |
| කාතුං | - කරන්ට | චොරෙතුං | - සොරකම් කරන්ට |

(ඇ) කිතක පද (කෘදන්ත පද) වාක්‍යවල යෙදෙන ආකාරය මෙම පාඩමෙන් තේරුම් ගනිමු.

(i) කාලස්සෙව උට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා ...... දන්ත කට්ඨං දාතබ්බං, මුඛොදකං දාතබ්බං, ආසනං පඤ්ඤාපෙතබ්බං.

(ii) අන්ධබාලපිතරං නිස්සාය එවරූප බුද්ධං උපසංකමිත්වා කාය වෙය්‍යාවතිකං වා කාතු, දාතං වා දාතුං, ධම්මං වා සොතුං නාලත්ථං, අඤ්ඤං කත්තබ්බං නත්ථීති මනමෙව පසාදෙසි.

(iii) සචෙ යාගු හොති, භාජනං ධොවිත්වා යාගු උපනෙතබ්බා, යාගුං පීතස්ස උදකං දත්වා, භාජනං පටිග්ගහෙත්වා ...... ධොවිත්වා පටිසාමෙතබ්බං.

වචන මාලාව

නාමපද     කිතක පද

උපාහනා - පාවහන්
යාගු - කැඳ
අන්ධබාලපිතරං - මෝඩ දෙමාපියන්
කාය වෙය්‍යාවතිකං - වතාවත්
පීතස්ස - පානය කළහුට
එවරූපං - මෙබඳුවූ
දන්ත කට්ඨං - දැහැටිදඬු
මනමෙව - සිත ම
දාතුං - දීමට

දාතබ්බං - දිය යුතුයි
පඤ්ඤාපෙතබ්බං - පැනවිය යුතු
පටිසාමෙතබ්බං - තැන්පත් කළයුතුයි
කාතුං - කිරීමට
සොතුං - ඇසීමට
කත්තබ්බං - කළ යුතුයි
භාවෙතබ්බං - වැඩිය යුතුයි.
චරිතබ්බං - හැසිරිය යුතුයි
රක්ඛමානො - රකිමින්

| ක්‍රියා පද | කිතක පද |
| --- | --- |
| | දදමානො - රකිමින් |
| පසාදෙසි - පහදවා ගත්තේය | උගගණ්හිතබ්බා - උගත යුතුයි. |
| නාලත්‍ථං - නොලදිමි | ගරුකාතබ්බා - ගරු කළ යුතුයි. |

අභ්‍යාසය - 6

1. ඇ යටතේ එන පාලි වාක්‍ය සිංහලෙන් ලියන්න.
2. කිතක පද පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
3. පහත සඳහන් වාක්‍ය පාලියෙන් ලියන්න.
   (i) අප විසින් දන් දිය යුතුයි. කුසල් කළ යුතුයි. මෛත්‍රී වැඩිය යුතුයි.
   (ii) කුසල් කළ යුතුයි. බඹසරෙහි හැසිරිය යුතුයි.
   (iii) දන් දෙමින් සිල් රකිමින් ජීවත්වෙයි.
   (iv) ගමේ ළමයි බණ අසන්නට පන්සලට යති.
   (v) ශ්‍රද්ධාවෙන් පැවිදිවූවන් විසින් ධර්මය උගත යුතුයි. වැඩිමහල්ලන්ට ගරුකළ යුතුයි.
4. නිපාතමෙන් ගනු ලබන කිතක පද 10ක් ලියා, තේරුම ලියන්න.

# සත්තමො පාඨො

## හත්වන පාඩම

**පාඩමේ අරමුණු**

| |
|---|
| (i) උපසර්ග පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම. |
| (ii) ඒවා වාක්‍යවල යෙදෙන අයුරු තේරුම් ගැනීම. |

පාලි භාෂාවෙහි උපසර්ග පද විස්සකි. අති, අධි, අනු, අභි, අප, අපි, අව, ආ, උ, උප, දු, නී, නි, ප, පරා, පරි, පති, වි, සං, සු යනුයි. මේ උපසර්ග පද ක්‍රියාවන්ගේ හා නාමයන්ගේ පමණක් මුලට යෙදේ. එසේ යෙදුන විට,

(i) අර්ථය වෙනස් කරයි.
(ii) විරුද්ධාර්ථයක් ගෙන දෙයි.
(iii) එම අර්ථය ම ස්ථිර කරයි.

(i) අර්ථය වෙනස් කරයි.
ආ ගච්ඡති - එයි
අනු ගච්ඡති - අනුවයයි/පසුපසයයි
විගමන - එළියට යෑම

(ii) විරුද්ධාර්ථයක් ගෙනදෙයි
පටි සොතං - සැඩ පාරට විරුද්ධව
වියොග - වෙන්වීම
පරා ජය - පැරදීම

(iii) එම අර්ථය ම ස්ථිර කරයි.
සම්බුද්ධ - මනාසේ අවබෝධ කළ
අභිධම්ම - උතුම් ධර්මය
අථි විසෙස - ඉතා විශේෂ වූ

උපසර්ග

| | | |
|---|---|---|
| ආ | ආකඩ්ඪති | සමීපයට අදී |
| | ආසන්න | ළඟවූ |
| අති | අතිරොචති | අතිශයින් බබළයි. |
| | අති ඡත්ත | විශේෂ ඡත්‍රය |
| අධි | අධිපති | ප්‍රධානියා |
| | අධිට්ඨාන | ස්ථිර සිත |
| අනු | අනුඝරං | ගෙයක් පාසා |
| | අනුවස්සං | අවුරුද්දක් පාසා |
| අභි | අභිවාදෙති | වඳියි |
| | අභිධම්ම | විශිෂ්ට ධර්මය |
| අප | අපගච්ඡති | ඉවතට යයි |
| | අපරාධ | අපරාධය |
| අපි | ඉතිපි අරහං | මෙසේ ද සුදුසුය. |
| අව | අවහරති (ඔහරති) | ඉවතගෙන යයි |
| | අවසිට්ඨ | ඉතිරි වූ |
| උ | උක්ඛිපති | ඔසවයි |
| | උප්පන්න | උපන් |
| උප | උපක්කම | උපාය |
| | උපමාන | සමාන කිරීම |
| දු | දුග්ගන්ධ | අප්‍රිය ගඳ |
| | දුක්ඛ | දුක |
| නි | නිඛාත | සාරන ලද |
| නී | නීහරති | නෙරපයි |
| ප | පභවති | පටන් ගනී |
| | පසන්න | පැහැදුණු |
| පරා | පරාජෙති | පරදවයි |
| | පරාභව | පිරිහීම |
| පරි | පරිචරති | සේවය කරයි |
| | පරිවිසති | අනුභව කරවයි |

| | | |
|---|---|---|
| පති | පරික්ඛිපති | ප්‍රතික්ෂේප කරයි |
| | පතිරූප | සුදුසු |
| වි | විකිරති | විසුරුවයි |
| | විවිධ | නානාකාර වූ |
| සං | සංවසති | එක්ව වසයි |
| | සම්මුති | එකඟ බව |
| සු | සුගන්ධ | සුවඳ |
| | සුගති | සැප ඇති භවය |

(අ) උපසර්ග පද යෙදෙන පාලි වාක්‍ය කීපයක් අවබෝධ කර ගන්න.

(i) සචෙ භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය **උපසංකමිස්සති** හොතො සොණදණ්ඩස්ස යසො **පරිහායිස්සති**. සමණස්ස ගොතමස්ස යසො **අභිවඩ්ඪිස්සති**.

(ii) සො ගනත්වා තං හත්තං පස්ස්වහි පච්චෙක බුද්ධසතෙහි සද්ධිං **සංවිභජි**.

(iii) අථ ඛො අම්බපාලි ගණිකා භගවතො අධිවාසනං විදිත්වා **උට්ඨායාසනා** භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

වචන මාලා

| නාම පද | ක්‍රියා පද |
|---|---|
| දස්සනාය - දකින්නට | පරිහායිස්සති - පිරිහෙන්නේය. |
| අධිවාසනං - ඉවසීම | උපසංකමති - එළඹෙන්නේය. |
| රාජා අජාත සත්තු - අජාසත් රජ | අභිවඩ්ඪිස්සති - වැඩෙන්නේය. |
| | සංවිභජි - බෙදුවේය |
| පඨම සංගායනාය - ප්‍රථම සංගායනාවට | |
| | පසීදි - පැහැදුනේය |

| | |
|---|---|
| බුද්ධුප්පාදො - බුද්ධෝත්පාදය | අතිරොචති - අභිභවාසිටී |
| ලොකෙ - ලෝකයෙහි | දුල්ලභො හොති - දුර්ලභ වෙයි |
| සබ්බසත්තෙ - සියලු සත්වයින් | වායති - හමයි |
| පඤ්ඤාය - ප්‍රඥාවෙන් | පරිචරි - උපස්ථාන කළේය |
| අදින්නං වත්ථුං - නොදුන් වස්තුව | පටිපජ්ජන්ති - පිළිපදිති |
| සබ්බාසු දිසාසු - සියලු දිසාවල | කාරාපෙසි - කරවීය |

අභ්‍යාසය - 07

(1) උපසර්ග පද 20 නැවත ලියන්න.

(2) මෙම පාඩමේ 'අ' ඡේදයේ එන පාලි වාක්‍ය සිංහලෙන් ලියන්න.

(3) පහත දැක්වෙන සිංහල වාක්‍ය පාලියෙන් ලියන්න.

1. සෝපාක කුමරා බුදුරදුන් දැක පැහැදුනේ ය.
2. අජාසත් රජ ප්‍රථම සංගායනාවට මණ්ඩපයක් කරවීය.
3. සිදුහත් තවුසා මාරයා පරදවා බුදු විය.
4. බුද්ධෝත්පාදය ලෝකයෙහි දුර්ලභ ය.
5. බුදුරද ප්‍රඥාවෙන් සියලු සත්වයින් අභිභවා සිටී.

(4) පහත දැක්වෙන පාලි වාක්‍ය සිංහලෙන් ලියන්න.

1. සීලවන්තො පුරිසො අදින්නං වත්ථුං කදාචිපි න ආදියති.
2. සිස්සා ආචරියානං ඔවාදං සුත්වා සම්මා පටිපජ්ජන්ති.
3. උපාසකා ධම්මං සොතුං බුද්ධං උපසංකමිංසු
4. ආනන්ද ථෙරො යාවජීවං බුද්ධං පරිචරි
5. සීල සුගන්ධො සබ්බාසු දිසාසු වායති.

# අට්ඨමො පාඨො

## අටවන පාඩම

**පාඩමේ අරමුණු**

| |
|---|
| (i) නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම. |
| (ii) ඒවා වාක්‍යවල යෙදෙන අයුරු තේරුම් ගැනීම. |

(අ) **නාම විශේෂණ පද**

නාමයක යම් ගුණයක් හෝ විශේෂත්වයක් ප්‍රකාශ කරන පදය නාම විශේෂණයි.. මෙහි නාමපදය විශේෂ්‍යයි. ලිංගත්‍රයෙහි නාමපද සමග විශේෂණ පද යෙදේ. විශේෂණ පදය විශෙෂ්‍ය පදයාගේ ලිංගය ද විභක්තිය ද සංඛ්‍යාව ද (ඒකවචන/බහුවචන) ගනී.

| ලිංග | විශේෂණ | විශෙෂ්‍ය | අර්ථ |
|---|---|---|---|
| (i) පුල ලිඞ්ගික | සෙතො | ගොණො | සුදු ගොනා |
| (ii) ස්ත්‍රී ලිඞ්ගික | සෙතා | වනිතා | සුදු වනිතාව |
| (iii) නපුංසක ලිඞ්ගික | සෙතං | වත්ථං | සුදු වස්ත්‍රය |

යන්න තුන් ලිඟුවට උදාහරණයි. නාම විශේෂණ පද කීපයක් පහත දැක්වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| මජ්ඣිම | - මධ්‍යම | සෙත | - සුදු | පක්ක | - පැසුණු |
| නීච | - පහත් | රත්ත | - රතු | ආම | - අමු |
| උච්ච | - උස් | පීත | - කහ | මහන්ත | - මහත් |
| රස්ස | - කොට | නීල | - නිල් | ඛුද්දක | - කුඩා |
| දීඝ | - දික් | කාල | - කලු | ඛර | - කර්කශ |
| බහු | - බොහෝ | දූර | - දුර වූ | සුරූප | - මනා රූ ඇති |
| අප්පක | - අල්ප | මහල්ලක | - මහලු | විරූප | - විරූප වූ |
| සමීප | - ළං වූ | ගම්භීර | - ගැඹුරු | තනු | - තුනී වූ |
| විත්ථත | - පතළා වූ | මුදු | - මෘදු | දහර | - වයසින් අඩු |
| | | ඝන | - ඝන වූ | | |

(ආ) ක්‍රියා විශේෂණ පද

ක්‍රියා පදයක යම් විශේෂයක් ප්‍රකාශ කරන්නේ ක්‍රියා විශේෂණයි. ක්‍රියා විශේෂණ බොහෝ වශයෙන් ද්‍විතියා ඒක වචනයෙන් සිටී. එසේ වුවත් ඇතැම් නිපාත පද ද ක්‍රියා විශේෂණ වශයෙන් යෙදේ.

1. ක්‍රියා විශේෂණ පද

| | | | |
|---|---|---|---|
| සනිකං | - සෙමින් | පච්ඡතො | - පස්සෙන් |
| ඛිප්පං | - වහා | පුරතො | - ඉදිරියෙන් |
| සහසා | - වහා | පච්ඡා | - පසුව |
| අභිණ්හං | - නිතර | සාධුකං | - මනාකොට |
| විසමං | - විසමලෙස | සීඝං | - වහා |
| විසුං | - වෙන්ව | දුක්ඛං | - දුකසේ |
| සමං | - සමලෙස | එකධා | - එක් ආකාරයකින් |
| එවං | - මෙසේ | | |

(ඇ) නාම විශේෂණ පද කීපයක් පාලි වාක්‍යවල යෙදෙන අයුරු තේරුම් ගන්න.

1. මයහං මාතා සෙතානි උපපලානි ඔචිනිත්වා චෙතියං පූජෙසි
2. අනුරාධපුරෙ මහන්තං චෙතියං අත්ථි.
3. උපාසකො නීචං පීඨං ආනෙත්වා ධම්මසාලායං ඨපෙත්වා තත්ථ නිසීදි.
4. සද්ධා වනිතා සෙතං වත්ථං පාරුපිත්වා විහාරං ගනත්වා තිසරණසරණං අගමාසි.
5. බුද්ධමාමකො අනාථපිණ්ඩිකසෙට්ඨි ජෙතවනමහා විහාරං අකාසි.

(ඈ) ක්‍රියා විශේෂණ පද කීපයක් පාලි වාක්‍යවල යෙදෙන අයුරු තේරුම් ගන්න.

1. දානං දදනෙතා පුරිසො සුඛං ජීවති.
2. බුද්ධස්ස ධම්මඝොසං සුත්වා දෙවා සීඝං සමාගඤ්ඡුං
3. භගවා එවං අභාසි

4. සිද්ධත්ථ තාපසො ඡවස්සං දුක්ඛං අවසි
5. ආනන්දපෝරෝ සබ්බං කිච්චං කිප්පං නිට්ඨපෙසි.

වචන මාලා

නාම පද

| | | | | |
|---|---|---|---|---|
| ධම්මඝොසං | - ධර්ම ඝෝෂාව | අත්ථි | - | ඇත. |
| පාරුපිත්වා | - පොරවා | අවසි | - | වාසය කළේය. |
| පීඨං | - පුටුව | | | |
| ඡවස්සං | - වර්ෂ හයක් | | | |
| සුනීතො නාම | - සුනීත නැමැති | | | |

ක්‍රියා පද

අභ්‍යාසය - 08

01. නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ වෙන වෙන ම හඳුන්වන්න.
02. මෙම පාඩමේ 'ඇ' 'ඈ' යන ඡේද යටතේ එන පාලි වාක්‍ය සිංහලෙන් ලියන්න.
03. ඔබ කැමති නාම විශේෂණ පද 10ක් ලියා තේරුම ලියන්න.
04. මෙම වාක්‍යවල හිස්තැන් පහත දැක්වෙන විශේෂණ පද යොදා, පාලියෙන් ලියන්න.

1. ළමයි ............ ගෙඩි රැස් කොට අනුභව කරති.
2. සුනීත නැමැති ............ ළමයා පැවිදි විය.
3. සිටුවරයා ............ නගරයකට යාමට රියට නැංගේය.
4. නන්ද කුමරා විහාරයට ............ බුදුරදුන්ට ගියේය.
5. මා විසින් ............ අසන ලදී.

1. පක්කානි ඵලානි - ඉදුණු ගෙඩි
2. දහරෝ කුමාරෝ - වයසින් අඩු ළමයා
3. දූරං නගරං - දුර නගරයකට
4. බුද්ධස්ස පච්ඡතො - බුදුරදුන්ට පස්සෙන්
5. එවං - මෙසේ

06. මෙම පාලි වාක්‍යවල හිස්තැන් පහත දැක්වෙන නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද යොදා සම්පූර්ණ කරන්න.

1. උපාසකො ............ පුප්ඵානි බුද්ධස්ස පූජෙසි.
2. අතීතෙ කුස නාමො ............ භූපාලො අහොසි.
3. බහූ මච්ඡා ............ සමුද්දෙ වසන්ති.
4. සප්පා ............ පාණිනො භවන්ති.
5. ජනපද කල්‍යාණී ............ වනිතාති පාකටා අහොසි.

1. රත්තානි
2. විරූපො
3. ගම්භීරෙ
4. දීඝා
5. සුරූපා

07. පහත දැක්වෙන විශේෂණ විශේෂ්‍ය පදවල සිංහල තේරුම් ලියන්න.

උදාහරණ

1. රත්තානි පුප්ඵානි - රතු නෙළුම් මල්
2. විරූපො භූපාලො -
3. ගම්භීරෙ සමුද්දෙ -
4. දීඝා පාණිනො -
5. සුරූපා වනිතා -

# නවමො පාඨො

## නවවන පාඩම

### පාඩමේ අරමුණු

| |
|---|
| (i) ආඛ්‍යාත හෙවත් ක්‍රියාපද පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලබා ගැනීම<br>(ii) පඤ්චමී ආඛ්‍යාතය තේරුම් ගැනීම.<br>(iii) එය වාක්‍යවල යෙදෙන අයුරු හඳුනා ගැනීම. |

ක්‍රියා පදයක් සෑදීමට ක්‍රියා මූලයක් හෙවත් ධාතුවක් තිබිය යුතු යි. ක්‍රියා මූලය හෙවත් ධාතුව විභක්ති රහිතයි. ප්‍රත්‍යාදියෙන් තොරයි. පච, රම, දා, හස යනාදිය ක්‍රියා මූලයෝ (ධාතූහු) වෙති. ති, අන්ති, සි, ථ, මි, ම ආදී ආඛ්‍යාත ප්‍රත්‍ය ක්‍රියා මූලයකට එකතුවීමෙන් ක්‍රියා පද සෑදේ. පච යන ක්‍රියා මූලයට වර්තමාන ආඛ්‍යාත ප්‍රත්‍ය එකතු වී ඇති අයුරු වගුවේ දැක් වේ.

| *පුරුෂය* | *ක්‍රියා මූලය (ධාතුව)* | | *ආඛ්‍යාත ප්‍රත්‍ය* | *ක්‍රියාපදය* | *අර්ථය* |
|---|---|---|---|---|---|
| පඨම | පච | + | ති | පචති | පිසයි |
| | පච | + | අන්ති | පචන්ති | පිසත් |
| මජ්ඣිම | පච | + | සි | පචසි | පිසහි |
| | පච | + | ථ | පචථ | පිසව් |
| උත්තම | පච | + | මි | පචාමි | පිසමි |
| | පච | + | ම | පචාම | පිසමු |

ක්‍රියා මූලයෝ හෙවත් ධාතූහු ප්‍රධාන කොටස් දෙකකට බෙදෙති.

1. සකර්මක ධාතු
2. අකර්මක ධාතු යනුවෙනි.

i. සකර්මක ධාතු : කර්මයක් බලාපොරොත්තු වන ආඛ්‍යාත පදවල මූලයවූ ධාතුහු සකර්මක ධාතු වශයෙන් හඳුන්වනු ලැබෙති. 'පචති' පිසයි යන ක්‍රියා පදය පිසන දෙයක් බලාපොරොත්තු වේ. එනම් 'ඔදනං' (බත) යන කර්මය අපේක්ෂිතයි. එවිට 'ඔදනං පචති' බත පිසයි. යනුවෙන් සම්පූර්ණ කළ යුතු ය. 'ඔදනං' යන කර්ම පදය නොමැති විට අර්ථය අසම්පූර්ණයි.

ii. අකර්මක ධාතු : කර්මයක් බලාපොරොත්තු නොවන ධාතුහු අකර්මක ධාතු වශයෙන් හඳුන්වනු ලැබෙති. සයති නිදයි යන ක්‍රියාපදය කර්මයක් බලාපොරොත්තු නොවේ.

එහෙත් අර්ථයෙහි අඩුවක් දක්නට නොලැබේ. 'සො සයති' 'හෙතෙම නිදයි' යනුවෙන් අර්ථය සම්පූර්ණ වේ.

ක්‍රියා පදයක් වර නැඟීමේ දී ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයන්ගේ වශයෙන් කොටස් අටකි.

| | |
|---|---|
| 1. වත්තමානා | 5. පරොක්ඛා |
| 2. පඤ්චමී | 6. අජ්ජතනී |
| 3. සත්තමී | 7. භවිස්සන්ති |
| 4. හීයත්තනී | 8. කාලාතිපත්ති |

මේවා අතුරෙන් හීයත්තනී/අජ්ජතනී/පරොක්ඛා අතීත කාලයට අයත් වේ. වත්තමානා වර්තමාන කාලයට අයත් ය. භවිස්සන්ති අනාගත කාලයටත් සත්තමී/පඤ්චමී කාල නියමයක් නොමැතිවත් යෙදේ. කාලාතිපත්ති අතීත අනාගත කාල දෙකෙන් ම සිටී.

මෙම පාඩමේ දී ඔබගේ විශේෂ අවධානය යොමු වන්නේ පඤ්චමී අඛ්‍යාත විභක්ති පිළිබඳවයි. පඤ්චමී විභක්තිය අණ කිරීමෙහි ද ආශිර්වාද අර්ථයෙහිද ප්‍රාර්ථනාය කිරීමෙහි ද ගෞරව සම්ප්‍රයුක්ත ඉල්ලීමක දී ද යොදනු ලැබේ.

පඤ්චමී ආඛ්‍යාත ප්‍රත්‍ය

තු - අන්තු - හි - ථ - මි - ම - (පරස්සපද)

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨම<br>මජ්ඣිම<br>උත්තම | හවතු (වේවා)<br>හව, හවාහි (වෙහිවා)<br>හවාමි (වෙම්වා) | හවන්තු (වෙත්වා)<br>හවථ වෙව්වා<br>හවාම (වෙමුවා) |

(1) ආශිර්වාදයක් ප්‍රාර්ථනයක් කරන විට පංචමී විභක්තිය යෙදේ.
චිරං ජීවන්තු නො ඤාතී.
බොහෝ කලක් ජීවත් වෙත්වා අපගේ ඤාතිහු

(2) ගෞරව සම්ප්‍රයුක්ත ඉල්ලීමක දී පංචමී විභක්තිය යෙදේ
පවිසතු හවං නිසීදතු
එන්න ඇතුළට පින්වත හිඳගන්න.

(3) කෙනෙකුට අණ කිරීමේදී ද පංචමී විභක්තිය යෙදේ.
හෙ බාලක ඉධාගච්ඡ
ළමයෝ, මෙහෙ එන්න

ලතාය විවාහ මංගල දිවසො

සො පන ලතාය කුලධීතාය විවාහ මංගල දිවසො. ඤාතිසාලොහිතා ච සොහජ්ජා ච සන්නිපතිතා අහෙසුං තස්ස මහුස්සවස්ස දිවසෙ තෙ මොදමානා හට්ඨපහට්ඨා නිසීදිංසු. මංගලසම්මතස්මිං සුභමුහුත්තස්මිං දම්පතයො මංගල ඵලක මජ්ඣකං ආරුහිංසු. එකො වියත්තො විසාරදො අපගත යො බබනො පොයොතෙසං අඞගුලිකෙ සුත්තෙන බන්ධිත්වා රජතමයෙන භිංකාරෙන උදකං ආසිඤ්චි, සො උදකං ආකිරන්තො ඊදිසකං ආසිංසනං අකාසි.

හවතු සබ්බ මඞගලං
රක්ඛන්තු සබ්බ දෙවතා
සබ්බ බුද්ධානු භාවෙන
සදා සොත්ථි හවන්තු තෙ

## වචන මාලා

### නාමපද

ලතාය කුලධීතාය - ලතා නම් කුල දුවගේ

ඤාති සාලොහිතා - සහලේ නෑයෝ

සොහජ්ජා - හිතවත්තු

මොදමානා - සතුටු සිත් ඇත්තාහු

හට්ඨපහට්ඨා - තුටු පහටු වූවාහු

හිංකාරෙන - කෙණ්ඩියෙන්

මඞ්ගල ඵලකං - මඟුල් පෝරුව

වියත්තො - වියත්

විසාරදො - විසාරද වූ

අපගත යොබ්බනො - වයස්ගත පුද්ගලයා

සුත්තෙන - නූලකින්

රජතමය - රිදියෙන් කළ

ථොකං - ටිකක්

උත්තමං - උතුමාණෙනි

භන්තෙ - ස්වාමිනී

සතංසමාගමො - සත්පුරුෂ සමාගමයක්

ඉතො - මෙහෙන්

පරිකප්පිතං - සූදානම් කළ

අනුකම්පං උපාදාය - අනුකම්පා පිණිස

සම්ම - යහලුවේ

දම්පතයො - මනාමාල යුවල

### ක්‍රියාපද

අහෙසුං - වූහ

ආකිරි - විසුරුවා හැරියේය

භවතු - වේවා

රක්ඛන්තු - රකිත්වා

භවන්තු - වෙත්වා

වසතු - වසීවා

අධිවාසෙතු - ඉවසාවා

පතිගණ්හාතු. - පිළිගනීවා

පවිසතු - පිවිසේවා

නිසීදතු - හිඳගන්න

ආගමෙතු - ඉන්න

නික්ඛමතු - නික්මෙන්න

පිබතු - බොන්න

ඉධාගච්ඡ - මෙහි එන්න

සුඛිතාහොන්තු - සුඛිතවෙත්වා

හොතු - වේවා

(සොත්ථි) හොතු - (යහපතක්) වේවා

අභ්‍යාසය - 09

(1) මේ වාක්‍යය සිංහලෙන් ලියන්න

(i) තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.
(ii) සතං සමාගමො හොතු
(iii) ඉදං මෙ ඤාතීනං හොතු
සුඛිතා හොන්තු ඤාතයො
(iv) චිරං රක්ඛන්තු ලොක සාසනං
(v) හනන්තු තෙසං උපද්දවෙ
(vi) සොත්ථි තෙ හොතු සබ්බදා
(vii) පාතු ත්වං රතනත්තයං
(viii) දෙවො වස්සතු කාලෙන
(ix) සස්ස සම්පත්ති හොතු ච
(x) ඵීතො භවතු ලොකො ච - රාජා භවතු ධම්මිකො

(2) මේ වාක්‍ය පාලියෙන් ලියන්න.

(i) යහලුවේ බොන්න. බොන්න.
(ii) මෙහෙන් පිටත් වන්න.
(iii) පොඩ්ඩක් ඉන්න.
(iv) එන්න ඇතුළට, වාඩි වෙන්න.
(v) ඤාතීහු සුඛිත වූවෝ වෙත්වා.
(vi) සුදුසු කාලයෙහි වැස්ස වසීවා.
(vii) ළමයෝ මෙහෙ එන්න.
(viii) ස්වාමීනී සූදානම් කළ අපගේ භෝජනය ඉවසාවා.
(ix) උත්තමයාණෙනි අනුකම්පා පිණිස පිළිගනීවා.
(x) රජවුරු දැහැමි වෙත්වා

(3) 'ලතාය විවාහ මංගල දිවසො' යන පාඩම සිංහලෙන් ලියන්න.

# දසමො පාඨො

## දසවන පාඩම

### පාඩමේ අරමුණු

(i) පාලි භාෂාවේ ගාථා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
(ii) ගාථා ගායනයේ දී අක්ෂර උච්චාරණය, යතිය තැබීම, වචන වෙන් කිරීම, හඳුනා ගැනීම.
(iii) ගීතවත්ව ගයනා කිරීමට පුහුණු වීම.

පාලි භාෂාවේ ද සිංහල භාෂාවේ මෙන් පද්‍ය ඇත. ඒවා ගාථා යන නමින් හඳුන්වති. පහත සඳහන් වන්නේ මව් ගුණ පැවසෙන ගාථා පෙළකි. ගාථා ගායනා කිරීමේ දී අක්ෂර උච්චාරණය, යතිය තැබීම (නැවැත්වීම) වචන වෙන් කොට ශබ්ද කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. ගීතවත් ලෙස ගායනා කිරීමට පුහුණු වීමද අවශ්‍ය වේ. මෙම ගාථා පංතිය පූජ්‍ය යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් රචිත 'භක්ති ගීත' පොතෙන් උපුටා ගන්නා ලද්දකි.

1. මාතා බො මෙ හිතකාමා
මාතා බො මෙ සුඛකාමා
සා මෙ අත්ථං පසාසති
සුපිනෙනපි නොචානත්ථං

1. මගේ අම්මා මට හිත කැමති යි
මගේ අම්මා මට සැප කැමති යි
ඇ මගෙ වැඩිදියුණුව ම පත යි
හීනෙන්වත් අවැඩක් නො හිත යි

2. මාතා මං උප්පාදෙසි
මාරෙනපි සංගාමෙසී
අම්මා මං ආපාදෙයි
ගුරුගතං පරිමජ්ජෙසි

2. මගෙ අම්මා මා වැදුවා ය
මරු සමගත් පොර බැදුවා ය
මගේ අම්මා මා හැදුවා ය
කුණු කහල ද පිරිමැදුවා ය

3. සා මං ඛිරං පායෙසි
කුච්ජිසම්ං මං ධාරෙසි
හත්තමපි ච මං හොපේසි
ලොකං චෙ මං දසෙසයි

3. අම්මා මට කිරි පෙව්වා ය
කුසයේමත් මා දරුවා ය
ආහාරත් මට කැව්වා ය
මේ ලෝකෙම දැක් වූවා ය

4. සා මං සම්මාපොසෙති
ආදරයති, කරුණායපිති
මග්ගා මග්ගං දසෙසති
තං තං මං සික්ඛාපෙති

4. ඇ මා මැනවින් හදයි වඩයි
අදර කරයි කරුණා ද කරයි
මඟ හා නොමඟ ද පෙන්වා ලයි
ඒ ඒ දේ මට පහුණු කරයි

5. සා මං පස්සති සුපිනෙපි
පෙමයති පි ජීවිතායති
මුඛමපි චුම්බති සිසමපි
ආලිඞගති මං පීණයති

5. අම්මා මා නිදෙනුත් දකියි
ප්‍රේම කරයි පණ වැනි ද කරයි
මුහුණ සිඹියි ඔළුව ද සිඹියි
වැළඳ ගනී මා පිනවා ලයි

අභ්‍යාස - 10

01. මෙම පාඩමේ එන පාලි ගථා/සිංහල කවි ගීතවත් ලෙස ගායනා කරන්න.
02. පාළි ගාථා/සිංහල කවි කණ්ඩායම් ලෙස මාරුවෙන් මාරුවට ගායනා කරන්න.

03. පාලි ගාථා කීපයක් එකතු කරන්න. ඒවා මිහිරි ලෙස ගායනා කරන්න.

04. එම ගාථා අර්ථ තේරුම් ගෙන සිංහල කවි සකස් කරන්න.

## අභිධර්මය උගන්වන ගුරුභවතුන් සඳහා

* මෙහි අභිධර්මය පාඩම් ඉදිරිපත් කර ඇත්තේ එය ජීවිතය හා අඛණ්ඩ සම්බන්ධතාවක් ඇති විෂයයක් බව වඩාත් පැහැදිලිවන ලෙස කථාවස්තු ඇසුරිනි.

* පහළ ශ්‍රේණිවලදී කථාවස්තු ඇසුරින් පැහැදිලි කළ කරුණු නැවතත් එසේ පැහැදිලි කිරීමක් කොට නැති අතර අවශ්‍යයයි හැඟෙන තැන්වලදී පමණක් කථාවස්තු මගින් පාඩම් ඉදිරිපත් කර ඇත.

* 9 ශ්‍රේණියේ මූල් පාඩම් තුන අවසන් වනවිට ලබා ඇති චිත්ත - චෛතසික - රූප පිළිබඳ දැනුම චිත්ත වීථියක් තේරුම් ගැනීමට උදව්වන හෙයින් සිවුවන පාඩමෙහි චිත්ත වීථියක් ද චිත්ත වීථියක් තේරුම් ගත් පසු පුනර්භවය තේරුම් ගැනීම පහසුවන හෙයින් ඒ පිළිබඳ පස්වැනි පාඩමෙන් ද එය නිවන පිළිබඳ දැන ගැනීමට උපකාරවන හෙයින් අවසාන පාඩම්වලින් නිවන පිළිබඳව ද විස්තර ඉදිරිපත් කර ඇත.

* චිත්ත, චෛතසික, රූප වලින් ලෝකය (දුක) ද, නිවනින් ලෝකයෙන් (දුකින්) එතෙරවීම සිදුවන බව ද පැහැදිලි කිරීමත්, අනතුරුව අවසාන පාඩමෙන් එම කරුණු ම සතර පරමාර්ථ ධර්ම වන අයුරුත් දක්වා ඇත.

* මෙම අභිධර්ම පාඩම් අනුපිළිවෙළින් ඉගැන්වීම සුදුසු ය. අවශ්‍ය යැයි සිතෙන තැන් වල දී 6 - 7- 8 ශ්‍රේණිවල අභිධර්ම පාඩම් බැලීම සුදුසු ය.

* මෙහි ඇති සියලු අභ්‍යාසවලට පිළිතුරු සිසුන්ගේ අභ්‍යාස පොත්වල ම සැපැයීමට උපදෙස් දෙන්න.

ඇස්වත්තේ රේවත හිමි.

## 1. පාඨම

# සිතේ ගති I

### අන්‍යසමාන චෛතසික 13

සියලු ම සිත්වල යෙදෙන (සබ්බචිත්ත සාධාරණ) චෛතසික සතකි. ඒ ඒ සිත්වල සුදුසු පරිදි යෙදෙන (ප්‍රකීර්ණක) චෛතසික සයකි. මෙම කොටස් දෙකට ම අයත් චෛතසික දහතුන අන්‍යසමාන චෛතසික (අඤ්ඤසමාන චේතසික) නම් වේ.

මෙතැන් සිට සබ්බ චිත්ත සාධාරණ, ප්‍රකීර්ණක, අන්‍යසමාන යන වචන තවදුරටත් අප පැහැදිලි කර ගනිමු.

### සබ්බ චිත්ත සාධාරණ

අසූ නවයක් වූ සියලු ම සිත්වල යෙදෙන චෛතසික මෙනමින් හඳුන්වනු ලැබේ. චෛතසික සතක් මේ කොටසට අයත් වේ. සිත් අසූනවයෙහි ම අඩුවක් නැතිව මෙම චෛතසික සත ම යෙදෙයි.

### ප්‍රකීර්ණක

ප්‍රකීර්ණක නමින් චෛතසික සයක් ඇත. කාමාවචර ආදී සිත්වල මෙම චෛතසික විසිරී පවතින හෙයින් ඒවා ප්‍රකීර්ණක (පකිණ්ණක) යනුවෙන් හඳුන්වනු ලැබේ. අහේතුක සිත් දහඅටට අයත් දෙපස් වි ඤ්ඤාණ සිත් දහයෙහි ප්‍රකීර්ණක චෛතසික එකක්වත් නොයෙදේ. ඉතිරි සිත්වල යටත් පිරිසෙයින් ප්‍රකීර්ණක චෛතසික තුන බැගින් වත් යෙදේ. එසේ යෙදෙන්නේ ද එක ම චෛතසික නොවේ. මෙම චෛතසික හය ම යෙදෙන සිත් ද තිබේ.

### අන්‍යසමාන

ප්‍රධාන වශයෙන් චෛතසික 52 කොටස් තුනකට බෙදේ.

(i.) අන්‍යසමාන චෛතසික 13
(ii.) අකුසල චෛතසික 14
(iii.) ශෝභන චෛතසික 25 යනු එම කොටස් තුනයි.

අකුසල චෛතසික එකක්වත් ශෝභන චෛතසික සමග නොයෙදේ. එසේ ම ශෝභන චෛතසික එකක් වත් අකුසල චෛතසික සමග නොයෙදේ. එහෙයින් අකුසල චෛතසිකවලට ශෝභන චෛතසික අන්‍ය වෙයි. ශෝභන චෛතසිකවලට අකුසල චෛතසික අන්‍ය වෙයි. මෙසේ අන්‍ය වූ (එකිනෙකට වෙනස් වූ) අකුසල හා ශෝභන චෛතසික සමග යෙදෙන චෛතසික කොටසක් ද ඇත. ඒවා අන්‍ය වූ චෛතසික සමග සමාන ව යෙදෙන හෙයින් අන්‍යසමාන චෛතසික යනුවෙන් හඳුන්වා ඇත.

ඔබ අන්‍යසමාන චෛතසික කීපයක් 7 වැනි ශ්‍රේණියේ දී උගත්තෙයි ය. ඉතිරි චෛතසික කිහිපය අපි දැන් ඉගෙන ගනිමු.

ඵස්ස :– ඇස ආදී යම් දොරටුවකට අරමුණක් ලැබුණු විට උපදින සිතත් චෛතසිකත් එම අරමුණෙහි ගැටෙන්නාක් (හැපෙන්නාක්) මෙන් උපදින චෛතසික ය.

චේතනා :– ප්‍රධානියෙකු මෙන් චේතනාව තමාට අයත් කටයුත්තෙහි යෙදෙමින් ම සෙසු චෛතසිකයන් ද ඵස්ස ආදී කටයුතුවල යොදවමින් ක්‍රියාකරන චෛතසික ය.

ජීවිතින්ද්‍රිය :– චිත්ත චෛතසික මැරෙන්නට නොදී ජීවත්කරවන්නාක් මෙන් උපදින චෛතසික ය.

මනසිකාර :– ඉදිරිපත් වූ අරමුණට චිත්ත චෛතසික යොමු කරවන චෛතසිකය.

අධිමොක්ඛ :– චිත්ත චෛතසිකයන් ට සෙලවෙන්නට නොදී යම්කිසි අරමුණක රඳවා තබාගන්නා ස්වභාවයෙන් යුතු චෛතසික ය.

ඡන්ද :– අරමුණ පිළිගැනීමට කැමති ස්වභාවයෙන් උපදින චෛතසිකය.

පහත දක්වා ඇත්තේ අන්‍යසමාන චෛතසික ඇතුලත් වගුවකි.

| අඤ්ඤසමාන චේතසික 13 | |
|---|---|
| සබ්බචිත්ත සාධාරණ 7 | පකිණ්ණක 6 |
| 1. ඵස්ස<br>2. වේදනා<br>3. සඤ්ඤා<br>4. චේතනා<br>5. ඒකග්ගතා<br>6. ජීවිතින්ද්‍රිය<br>7. මනසිකාර | 1. විතක්ක<br>2. විචාර<br>3. අධිමොක්ඛ<br>4. විරිය<br>5. පීති<br>6. ඡන්ද |

වැදගත් කරුණු -

* සියලු ම සිත්වල නොඅඩුව යෙදෙන චෛතසික හත සබ්බ චිත්ත සාධාරණ නම් වේ.

* සුදුසු පරිදි ඒ ඒ සිත්වල විසිරී පවතින චෛතසික හය ප්‍රකීර්ණක (පකිණ්ණක) නම් වේ.

* එකිනෙකට අන්‍ය වූ අකුසල හා ශෝභන චෛතසික සමග සමාන ව යෙදෙන චෛතසික අන්‍ය සමාන නම් වේ.

* දෙපස් විඤ්ඤාණ සිත් සිහිපත් කර ගැනීම සඳහා 8 ශ්‍රේණියේ 9 වන පාඩමේ අංක 1 වගුව බලන්න.

## 2. පාඩම

# සිතේ ගති II

### අකුසල චෛතසික 14

ඔබ 8 වැනි ශ්‍රේණියේ 1, 2 පාඩම් වලින් අකුසල් සිත් දොළස උගත්තෙහිය. එම අකුසල් සිත්වල යෙදෙන චෛතසික කොටස් දෙකක් තිබේ. ඔබ මෙහි පළමුවෙනි පාඩමෙන් උගත් අන්‍යසමාන චෛතසික හා අකුසල චෛතසික යනු එම කොටස් දෙකය.

අකුසල චෛතසික සියල්ල 14 කි. එයින් හතරක් අකුසල් සිත් දොළසෙහි ම යෙදේ. එහෙයින් ඒවා අකුසලසාධාරණ චෛතසික නම් වේ. ඉතිරි චෛතසික දහය ඒ ඒ අකුසල සිත්වල සුදුසු පරිදි යෙදේ. මෙම අකුසල චෛතසික දාහතරෙන් එකොළොසක් ඔබ 7 වැනි ශ්‍රේණියේ දී ඉගෙන ගෙන ඇත. ඉතිරි අකුසල චෛතසික තුන මෙම පාඩමෙන් අපි ඉගෙන ගනිමු. ඒ සඳහා ස්වාමීන් වහන්සේ නමක් විසින් අටසිල් සමාදන් වූ දහම් පාසල් සිසු සිසුවියන් වෙනුවෙන් පවත්වන ලද කෙටි ධර්ම දේශනාව උපයෝගී කර ගනිමු.

පෙර දඹදිව පුණ්ණ හා සේනිය යනුවෙන් යහළුවන් දෙදෙනෙකු ජීවත් වුනා. පුණ්ණ යෑම - ඊම - කෑම - බීම ආදී සියලු කටයුතු කළේ ගවයකු වගේ. ඒ නිසා ඔහුගේ පිළිවෙත "ගෝව්‍රත" යනුවෙන් හඳුන්වනු ලැබුවා. සියලු කටයුතු සුනඛයකු වගේ කළ සේනියගේ පිළිවෙත "කුක්කුර ව්‍රත" යනුවෙන් හඳුන්වනු ලැබුවා. දිනක් මේ දෙදෙනා බුදුරජාණන් වහන්සේ හමුවීමට ගියා.

ගෝව්‍රත රකින පුණ්ණ, බුදුරජාණන් වහන්සේගෙන් මේ ප්‍රශ්නය ඇසුවා. ස්වාමිනි, මේ සේනිය බොහෝ කලක් ජීවත් වුනේ සුනඛයකුගේ හැසිරීම්වලට අනුව, මරණින් පසු ඔහු උපදින්නේ කොතැනකද? බොහෝ කලක් සුනඛ ව්‍රත, සුනඛ ස්වභාව, සුනඛ සිත් වැඩීමෙන් දියුණු කිරීමෙන් ජීවත්වන තැනැත්තා මරණින් පසු සුනඛයකු වී උපදින බව උන්වහන්සේ දේශනා කළා.

ඒ ඇසූ සේනිය මෙතෙක් කල තමා අනුගමනය කළේ වැරදි පිළිවෙතක්, හොඳ පිළිවෙතක් නොවෙයි යනුවෙන් සිතා කඳුළු සලමින් හැඬුව. හැඬීමෙන් පසුව සේනිය, බුදුරජාණන් වහන්සේගෙන් මේ ප්‍රශ්නය ඇසුව. 'ස්වාමීනි, මේ පුණ්ණ බොහෝකලක් ජීවත් වුනේ ගවයකුගේ හැසිරීම්වලට අනුව, මරණින් පසු ඔහු උපදින්නේ කොතැනද ද?

බොහෝ කලක් ගෝව්‍රත, ගෝ ස්වභාව, ගෝ සිත් වැඩීමෙන් දියුණු කිරීමෙන් ජීවත්වන තැනැත්තා මරණින් පසු ගවයකු වී උපදින බව උන්වහන්සේ දේශනා කළා.

ඒ ඇසූ පුණ්ණ මෙතෙක් කල් තමා අනුගමනය කළේ වැරදි පිළිවෙතක්, හොඳ පිළිවෙතක් නොවෙයි යනුවෙන් සිතා කඳුළු සලමින් හැඬුව.

මෙයින් අපට පැහැදිලි වන්නේ, තමා විසින් කරන ලද වැරදි ගැනත් නොකළ හොඳ දේ ගැනත් සිතමින් පසුතැවීමට කෙනෙකුට සිදුවන බවයි. මෙම පසුතැවීම හඳුන්වන්නේ 'කුක්කුච්ච' යන නමින්. ඒ නිසා පසුතැවීමට හෙවත් කුක්කුච්චයට හේතුවන දේ නොකර සිටීමට උත්සාහ කරන්න ඕනෑ.

හොඳ දේ කිරීමේ දී පසුබසින අවස්ථා ඇති වෙනව. අලස බව කම්බැලි බව ඇති වෙනව. එසේ වන්නේ කුසල් සිත් ඇතිවන අතරතුර අකුසල් සිත් ද ඇතිවන නිසයි. ලෝභ සිත් අටෙහි සසංඛාර සිත් හතරක් තිබෙනවා. ද්වේෂ සිත් දෙකෙහි සසංඛාර සිත් එකක් තිබෙනවා. තමාගේ හෝ අනුන්ගේ හෝ බලපෑමක්, මෙහෙයවීමක් ඇතිව උපදින සිත් සසංඛාර යනුවෙන් හඳුන්වනවා. මෙම සසංඛාර සිත් පසෙහි අසලබව ඇතිවෙනවා. ඒ නිසයි තමාගේ හෝ අනුන්ගේ හෝ බලපෑමක්, මෙහෙයවීමක් මේ සිත් ඇතිවීමට අවශ්‍ය වන්නේ. සිතේ ඇතිවන අලස බව "ථීන" යනුවෙන් හඳුන්වනවා. චෛතසිකවල ඇතිවන අලස බව "මිද්ධ" යනුවෙන් හඳුන්වනවා. මෙම ථීනය හා මිද්ධය එක් කොට ථීන - මිද්ධ යනුවෙන් නම් කර තිබෙනව. එහෙත් ඒවා වෙන් වෙන් වූ අකුසල චෛතසික දෙකක්.

අකුසල කිරීමට මෙන් ම කුසල් කිරීමටත් වීර්යය අවශ්‍ය වෙනවා. වීර්යය හෙවත් විරිය ප්‍රකීර්ණක චෛතසිකයක්. එය අකුසල් සිත්වල මෙන් ම කුසල් සිත්වල ද යෙදෙනවා. සිත උනන්දු කරවන චෛතසිකය 'විරිය' යනුවෙන් හඳුන්වනවා. අකුසල පක්ෂයෙහි යෙදෙන විරිය 'මිච්ඡා වායාම' යනුවෙන් හැඳින්වෙනවා. කුසල පක්ෂයෙහි යෙදෙන විරිය සම්මා වායාම යනුවෙන් හැඳින්වෙනවා. එය ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් එක් අංගයක්.

මා මුලින් සඳහන් කළ ගෝව්‍රත අනුව ජීවත් වූ පුණ්ණ, බුදුරජාණන් වහන්සේ විසින් කර්මය පිළිබඳව කරන ලද ධර්ම දේශනාව අසා පැහැදුනා. ඔහු ගෝව්‍රත හැරදමා තෙරුවන් සරණ ගිය උපාසකයකු බවට පත්වුනා.

කුක්කුර ව්‍රත අනුව ජීවත් වූ සේනිය, බුදු සසුනෙහි පැවිදිව උපසම්පදාවත් ලැබුවා. වැඩිකල් නොගොස් කෙලෙස් දුරු කිරීමේ වීර්යයෙන් යුතු ඔහු රහතන් වහන්සේ නමක් බවට පත් වුනා. ඒ අනුව කුක්කුච්චය, ථීනය හා මිද්ධය ද දුරුකිරීමට අප විසින් ද උත්සාහ කළ යුතුයි. වීර්යයෙන් යුතුව කටයුතු කිරීමෙන් ජීවිත සාර්ථක කර ගැනීමට පුළුවන්. අප සියළු දෙනා ද එසේ කටයුතු කරමු. දෙලොව ජය ගනිමු. ඔබ සැමට සම්මා සම්බුදු සරණයි.

මෙම ධර්ම දේශනාවෙන් ඔබ උගත් කුක්කුච්චය, ථීනය, මිද්ධය යන අකුසල චෛතසික තුනත් ඔබ 7 වැනි ශ්‍රේණියේ දී උගත් අකුසල චෛතසික එකොළොසත් පහත සඳහන් වගුවෙහි දක්වා ඇත.

| අකුසල චෛතසික 14 | | |
|---|---|---|
| අකුසල සාධාරණ | අකුසල | |
| 1. මෝහ | 1. ලෝභ | 6. මච්ඡරිය |
| 2. අහිරික | 2. දෝස | 7. කුක්කුච්ච |
| 3. අනොත්තප්ප | 3. දිට්ඨි | 8. ථීන |
| 4. උද්ධච්ච | 4. මාන | 9. මිද්ධ |
| | 5. ඉස්සා | 10. විචිකිච්ඡා |

අකුසල සිත් දොළසෙහි යෙදෙන්නේ අන්‍යසමාන චෛතසික දහතුන හා අකුසල චෛතසික දාහතරය. එහෙත් ඒ ඒ අකුසල සිත්වල චෛතසික එක සමානව නොයෙදේ. එය පැහැදිලි කිරීම සඳහා අකුසල් සිත් දෙකක යෙදෙන චෛතසික පහත සඳහන් වගුවෙහි දක්වා ඇත.

| පළමු ලෝභ සිත | | පළමු මෝහ සිත | |
|---|---|---|---|
| සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික | | උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත සිත | |
| සබ්බචිත්ත සාධාරණ | 07 | සබ්බචිත්ත සාධාරණ | 07 |
| ප්‍රකීර්ණක | 06 | ප්‍රකීර්ණක (අධිමොක්ඛ පීති, ඡන්ද හැර) | 03 |
| අකුසල සාධාරණ | 04 | අකුසල සාධාරණ | 04 |
| ලෝභ | 01 | විචිකිච්ඡා | 01 |
| දිට්ඨි | 01 | | |
| එකතුව | 19 | එකතුව | 15 |

වැදගත් කරුණු :-

* අකුසල් සිත් දොළොසෙහි පමණක් යෙදෙන චෛතසික අකුසල චෛතසික නම් වේ.

* එයින් හතරක් අකුසල් සිත් දොළසෙහි ම අඩු නැතිව යෙදෙයි. එහෙයින් ඒවා සබ්බාකුසල සාධාරණ නම් වේ.

* ඉතිරි අකුසල චෛතසික 10 ඒ ඒ සිත්වල සුදුසු පරිදි යෙදේ.

  උදා : ලෝභ සිත්වල ලෝභය යෙදේ. දෝසය නොයෙදේ.

  දෝස සිත්වල දෝසය යෙදේ. ලෝභය නොයෙදේ.

* කුක්කුච්ච චෛතසිකය ඇති වන්නේ ද්වේෂ සිත් දෙකෙහි පමණි. එය ද පසුතැවීමක් ඇතිවිට පමණක් යෙදේ. නියත වශයෙන් නොයෙදෙන එබඳු චෛතසික අනියත යෝගී නම් වේ.

අභ්‍යාස :

එක් එක් ප්‍රකාශයට අයත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) දෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිතෙහි දිට්ඨි චෛතසිකය යෙදී ඇත්තේ එම සිත

i. සෝමනස්ස සහගත හෙයිනි.

ii. දිට්ඨිගත සම්පයුත්ත හෙයිනි.

iii. අසංඛාරික හෙයිනි.

(2) අනියත යෝගී චෛතසික දෙකක් වන ථීන මිද්ධය සසංඛාරික අකුසල් සිත් පසෙහි යෙදෙන්නේ.

i. තමාගේ හෝ අනුන්ගේ මෙහෙයවීමක් ඇතිව ඒ සිත් උපදින හෙයිනි.

ii. තමාගේ හෝ අනුන්ගේ මෙහෙයවීමක් නැතිව ඒ සිත් උපදින හෙයිනි.

iii. ථීන හා මිද්ධ අකුසල චෛතසික හෙයිනි.

(3) අනියත යෝගී චෛතසිකයක් වන කුක්කුච්ච ය යෙදෙන්නේ.

i. උපෙක්ඛාසහගත විචිකිච්ඡා සම්පයුත්ත සිතෙහි ය.

ii. දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංඛාරික සිතෙහි ය.

iii. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිතෙහි ය.

# 3. පාඩම

## සිතේ ගති III

### ශෝභන චෛතසික 25

සිතේ යෙදෙන යහපත් ගති හෙවත් ශෝභන චෛතසික කීපයක් ඔබ 7 වැනි ශ්‍රේණියේ දී උගත්තෙහි ය. ඉතිරි ශෝභන චෛතසික මෙම පාඩමෙන් ඉගෙන ගනිමු. පළමුවෙන් ම පාළි වචන කීපයක සිංහල අදහස දැන ගනිමු. එයින් ශෝභන චෛතසික තේරුම් ගැනීම පහසුවෙනු ඇත.

අංක 1

| සිංහල | පාළි |
|---|---|
| මැදහත් බව | තත්‍ර මජ්ඣත්ත - තා |
| සංසිඳීම | පස්සද්ධි |
| සැහැල්ලු - බව | ලහු - තා |
| මොලොක් - බව | මුදු - තා |
| කටයුත්තට සුදුසු - බව | කම්මඤ්ඤ - තා |
| ප්‍රගුණ - බව | පාගුඤ්ඤ - තා |
| ඇද නැති - බව | උජ්ජුක - තා |
| චෛතසිකවල සංසිඳීම | කාය පස්සද්ධි |
| සිතෙහි සංසිඳීම | චිත්ත පස්සද්ධි |

අංක I වගුවෙහි ඇති සිංහල තේරුම්වලට අනුව අංක II වගුවෙහි මැද තීරුවෙහි ඇති චෛතසික තේරුම් ගන්න.

අංක II

| ශෝභන චෛතසික 25 (සිතේ යහපත් ගති) | | |
|---|---|---|
| සද්ධා<br>සති<br>හිරි<br>ඔත්තප්ප<br>අලෝභ<br>අදෝස | තත්‍ර මජ්ඣත්තතා<br>කාය පස්සද්ධි<br>චිත්ත පස්සද්ධි<br>කාය ලහුතා<br>චිත්ත ලහුතා<br>කාය මුදුතා<br>චිත්ත මුදුතා<br>කාය කම්මඤ්ඤතා<br>චිත්ත කම්මඤ්ඤතා<br>කාය පාගුඤ්ඤතා<br>චිත්ත පාගුඤ්ඤතා<br>කාය උජ්ජුකතා<br>චිත්ත උජ්ජුකතා | විරති චෛතසික 3<br>පස්සද්ධි<br>සම්මා කම්මන්ත<br>සම්මා ආජීව<br><br>අප්පමඤ්ඤා චේතසික 2<br>කරුණා<br>මුදිතා<br><br>ප්‍රඥා චෛතසිකය<br>පඤ්ඤා |

වැදගත් කරුණු :-

* අරමුණක් ලැබුණුවිට උපදින සිතෙහි යෙදෙන චෛතසිකයන් එම අරමුණෙහි මැදහත්ව පවත්වන චෛතසිකය තත්‍ර මජ්ඣත්තතා නම් වේ.

* චෛතසිකවල සංසිඳීම කාය පස්සද්ධි නම් වේ. සිතේ සංසිඳීම චිත්ත පස්සද්ධි නම් වේ.

අභ්‍යාස :

(1) සිතේ සැහැල්ලු බව චිත්ත ලහුතා නම් චෛතසිකයේ සැහැල්ලු බව .................................... ලහුතා නම් වේ.

(2) චෛතසිකයේ ප්‍රගුණ බව කාය පාගුඤ්ඤතා නම් සිතේ ප්‍රගුණ බව ............................ පාගුඤ්ඤතා නම් වේ.

(3) අකුසල් සිත් දොළස හා අහේතුක සිත් .................. යන සිත් තිහේ ශෝභන චෛතසික නොයෙදේ.

# 4. පාඩම

## සිත් වැල් (චිත්ත වීථි)

### චක්ඛුද්වාරික චිත්ත වීථියක්

චක්ඛු ආදි ඉන්ද්‍රියයකට රූප ආදී අරමුණක් ලැබුණු විට ලෝභ, දෝස ආදී සිත් පහළ වෙයි. ලැබුණු රූප අරමුණට අනුව උපන්නේ ලෝභ සිතක් යයි සිතමු. මෙම ලෝභ සිතට මුලින් හා අගින් ලෝභ සිත සම්බන්ධව තවත් සිත් කීපයක් ම උපදී. මෙසේ උපදින සිත් සමූහය හඳුන්වන්නේ සිත් වැලක් හෙවත් චිත්ත වීථියක් යනුවෙනි. චිත්ත වීථියක් පිළිබඳ ඉගෙනීමේ දී එක ම අරමුණක් ගෙන උපදින සිත ක්‍රියාකරන ආකාරය අනුව විවිධ නම්වලින් හැඳින්වෙන බව පැහැදිලි කර ගැනීම ද වැදගත් වෙයි. උදාහරණයක් මගින් මෙය පැහැදිලි කර ගනිමු.

මට්ටකුණ්ඩලී මරණාසන්න අවස්ථාවේ දී බුදුසිරුර දුටුවේ ය. ඔහුගේ මරණාසන්න සිතට අරමුණ වූයේ බුදු සිරුර ය. බුදුසිරුර අරමුණු කරමින් මේ ජීවිතයේ අවසන් වරට ඔහුට ඇති වූ සිතට චුති සිත යයි කියමු. චුති සිත නැතිවීමත් සමග ම ඔහු මරණයට පත් වී දෙව්ලොව උපන්නේ ය. උපතේ දී ඇතිවන පළමුවන සිත මේ භවයත්, ඒ භවයත් සන්ධි කරමින් (ගලපමින්) උපදින හෙයින් එයට ප්‍රතිසන්ධි සිත යයි කියමු. ප්‍රතිසන්ධි සිතට අරමුණු වූයේ ද බුදු සිරුරම ය. ප්‍රතිසන්ධි සිත නැතිවීමත් සමග ම බුදුසිරුර අරමුණු කරමින් ඔහුට තවත් සිතක් පහළ විය. එම සිත ඔහු ලැබූ භවය දිගින් දිගට පවත්වා ගැනීමට හේතුවක්, අංගයක් විය. එහෙයින් එයට භවංග සිත යයි කියමු.

බුදු සිරුර අරමුණු කරමින් ම අවස්ථා තුනක දී කටයුතු තුනක් සිදු කරමින් උපන් සිත චුති - ප්‍රතිසන්ධි - භවංග යන නම් ලබා ඇති අයුරු දැන් ඔබට පැහැදිලි වන්නට ඇත. ඒ ඒ අරමුණු ගෙන සියලුදෙනාට ම චුති, ප්‍රතිසන්ධි, භවංග සිත් උපදී. සිත්වැල් ඉගෙනීමේ දී මේ වචන ඔබට ප්‍රයෝජනවත් වනු ඇත. දැන් අප ඇසට ප්‍රිය රූප අරමුණක් හමු වූ විට සිත් වැලක් උපදින අයුරු විමසා බලමු.

ඇස නමැති දොරටුවට රූප අරමුණක් ලැබී උපදින සිත්වැල චක්ඛුද්වාරික චිත්ත වීථිය නම් වෙයි.

මෙම සිත් වැලෙහි මුලින් ම භවංග සිත් තුනක් උපදී. පළමු සිත නම් කරන්නේ භවංග යනුවෙනි. ඇසට රූප අරමුණක් ලැබී ඇති හෙයින් භවංග සිත සෙලවෙයි. චලනය වෙයි. චලනය වන හෙයින් එම සිත භවංග චලන යනුවෙන් හඳුන්වා ඇත. තෙවනුව උපදින භවංග සිත තවත් සිතකට ඉඩ දෙමින් නැති වී යයි. එහෙයින් එය භවංග උපච්ඡේද නම් වෙයි.

ඉන්පසු අරමුණ ලැබුණේ දොරටු පහෙන් කුමන දොරටුවකින්දැයි විමසා බලන්නාක් මෙන් සිතක් උපදී. එය උපෙක්ඛා සහගත පංචද්වාරාවජ්ජන සිතය. කුසල කර්මයක විපාකයක් වශයෙන් ප්‍රිය රූප අරමුණක් ලැබී ඇති හෙයින් ඊළඟට උපදින්නේ කුසල අහේතුක උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණ සිත ය. අනතුරුව එම අරමුණ පිළිගැනීම් වශයෙන් උපකේඛා සහගත සම්පටිච්ඡන සිත උපදී. ඉන්පසු පිළිගත් අරමුණ තීරණය කිරීම් වශයෙන් උපෙක්ඛා සහගත සන්තීරණ සිත උපදී. තවදුරටත් අරමුණ තීරණය කිරීම් වශයෙන් අහේතුක කිරිය සිතක් වන උපෙක්ඛා සහගත මනෝද්වාරාවජ්ජන සිත උපදී. මේ අවස්ථාවේ දී එම සිත නම්කර ඇත්තේ වොත්ථපන යනුවෙනි.

ලැබී ඇති රූප අරමුණු පිළිබඳ සතුටුදායක තීරණයක් කර ඇති හෙයින් රූප අරමුණු කෙරෙහි ආසාවක් (ලෝභයක්) හෝ තරහක් (ද්වේෂයක්) ඇතිකර ගැනීමට සිතට දැන් හැකියාව තිබේ. ලැබී ඇත්තේ ප්‍රිය රූප අරමුණක් හෙයින් මෙම අවස්ථාවේ දී ලෝභ සිත් අටෙන් පළමුවන ලෝභ සිත උපන්නේ යයි සිතමු. එනම් සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත ය. මෙම ලෝභ සිත එක දිගට ම සත්වරක් උපදී. මෙසේ උපදින සිත් හඳුන්වා ඇත්තේ 'ජවන් සිත්' යන නමිනි.

සිතක් හටගන්නේ චෛතසික සමග ය. සියලු ම සිත්වල යෙදෙන චෛතසික හතෙන් චේතනා චෛතසිකය ද එකකි. ලෝභ සිතෙහි ලෝභ චෛතසිකය ද යෙදේ. එය අකුසල චෛතසිකයකි. එහෙයින් රූපය දැකීමෙන් ඇති වූ ලෝභ සිත නිසා අකුසල කර්මයක් සිදුවිය.

මෙහි කර්මය යනුවෙන් අදහස් කරන්නේ සිතෙහි යෙදුනු චේතනා චෛතසිකය යි. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" (මහණෙනි, චේතනාව කර්මය යි මම කියමි.) යනුවෙන් බුදුරජාණන් වහන්සේ නිබ්බේධ පරියාය සූත්‍රයෙහි (අංගුත්තර නිකාය) ඒ බව දේශනා කර තිබේ.

අකුසල කර්මයක් උපදවමින් ජවන් සිත් හත ඇති වී නැති වී යාමක් සමඟ නැවතත් උපෙක්ඛා සහගත සන්තීරණ සිත දෙවරක් උපදී. මේ අවස්ථාවෙහි එම සිත හඳුන්වන්නේ තදාරම්මණ යන නමිනි. තදාරම්මණ සිත් දෙක නැති වී ගිය පසු සිතට කුමන හෝ අරමුණක් ලැබෙන තුරු භවංග සිත ම උපදී.

මෙතෙක් විස්තර සහිතව ඔබ උගත් සිත්වැල නම් වශයෙන් පහත වගුවෙහි සඳහන් වෙයි.

| චක්ඛුද්වාරික චිත්ත වීථියක් (ඇස් දොරට අයත් සිත් වැලක්) | | |
|---|---|---|
| 1. භවංග | | විපාක |
| 2. භවංග චලන | | සිත් |
| 3. භවංග උපච්ඡේද | | |
| 4. පංචද්වාරාවජ්ජන | උපෙක්ඛාසහගත පංචද්වාරාජ්ජන සිත | කිරිය සිත |
| 5. චක්ඛු විඤ්ඤාණ | උපෙක්ඛාසහගත චක්ඛු විඤ්ඤාණසිත | විපාක සිත |
| 6. සම්පටිච්ඡන | උපෙක්ඛාසහගත සම්පටිච්ඡන සිත | - එම - |
| 7. සන්තීරණ | උපෙක්ඛාසහගත සන්තීරණ සිත | - එම - |
| 8. වොත්ථපන | උපෙක්ඛාසහගත මනෝද්වාරාවජ්ජන සිත | කිරිය සිත |
| 9. ජවන | සෝමනස්ස සහගත | |
| 10. ජවන | දිට්ඨිගත සම්පයුත්ත | |
| 11. ජවන | අසංඛාරික සිත | අකුසල් |
| 12. ජවන | | සිත |
| 13. ජවන | | |
| 14. ජවන | | |
| 15. ජවන | (පළමුවන ලෝභ සිත) | |
| 16. තදාරම්මණ | | |
| 17. තදාරම්මණ | උපෙක්ඛා සහගත සන්තීරණ සිත | විපාක සිත් |

වගුවෙන් දැක්වුනු චිත්තවීථිය එක් පේළියකින් ද දැක්විය හැකිය. වගුවෙහි ඇති සිත් දාහතෙහි කිසියම් අකුරක් මුලට යොදා ගැනීම මෙහිදී කරනු ලැබේ. පහත දක්වා ඇත්තේ එම චිත්ත වීථියයි.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| හ | ල | ජේ | ප | ච | සං | තී | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

කුසල්, අකුසල් කර්ම රැස්වන්නේ චිත්ත වීථියක ඇති ජවන් සිත්වලින් පමණි, චිත්ත වීථියක ඇති ඉතිරි සිත් අහේතුක කිරිය සිත් හා අහේතුක අකුසල විපාක සිත් හෝ අහේතුක කුසල විපාක සිත් ය.

මෙහි දැක්වූ චිත්ත වීථියෙහි ජවන් සිත් හතක් ඇති බව ඔබට පැහැදිලි ය. එයින් පළමුවැනි ජවන් සිතේ කර්ම ශක්තිය මෙලොව දී විපාක දෙයි. එහෙයින් එය 'දිට්ඨධම්ම වේදනීය කර්ම' නමින් හඳුන්වා ඇත. මෙලොවදී විපාක නොදුනහොත් අහෝසි කර්මයක් වෙයි.

සත්වන ජවන් සිතේ කර්ම ශක්තිය ඊළඟ (දෙවන) භවයෙහි දී විපාක දෙයි. එහෙයින් එය 'උපපජ්ජවේදනීය කර්ම' නමින් හඳුන්වා ඇත. දෙවන භවයෙහි විපාක නොදුනහොත් අහෝසි කර්මයක් වෙයි.

මැද ජවන් සිත් පහේ කර්ම ශක්තිය තුන්වන භවයෙහි සිට ඉදිරියට කර්ම ශක්තිය ඇතිතාක් සසරෙහි දී විපාක දෙයි. එසේ විපාක නොදුනහොත් අහෝසි කර්මයක් වෙයි. කිසිම අහෝසි කර්මයක් නැවත විපාක නොදේ.

වැදගත් කරුණු :-

* ඇස නිසා උපදින සිත් වැල් 'චක්ඛුද්වාරික චිත්ත වීථි' නම් වේ.
* දිව නිසා උපදින සිත් වැල් 'ජිව්හාද්වාරික චිත්ත වීථි' නම් වේ.

* විශාල ම සිත් වැලක සිත් 17 ක් උපදී.

* චිත්ත වීථියෙහි මුල් භවංග සිත් තුන චිත්ත වීථියට අයත් නැත. එහෙත් චිත්ත වීථියක ආරම්භය පැහැදිලි වීම සඳහා සාමාන්‍යයෙන් චිත්තවීථියට අයත් සේ දක්වා ඇත.

* චිත්ත වීථියක ජවන් සිත් හැර ඉතිරි සිත්, අහේතුක සිත් (අහේතුක කිරිය සිත් අහේතුක අකුසල විපාක සිත්, අහේතුක කුසල විපාක සිත්) වලට අයත් වෙයි.

* කුසල හෝ අකුසල කර්ම රැස් වන්නේ ජවන් සිත් ඇතිවන අවස්ථාවේදී ය.

* රහතන් වහන්සේලා ට ජවන් සිත් වශයෙන් කිරිය සිත් ම උපදී, කුසල, අකුසල සිත් නුපදී.

* මෙහි දැක්වූ චිත්ත වීථියට වෙනස් වූ චිත්ත වීථි ද තිබේ.

* සිත් උපදින්නේ ඉතාමත් වේගයෙනි. ඒ සඳහා උපමාවක් දැක්වීම ද අපහසු බව බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබේ.

අභ්‍යාස :

1. කර්මය යනු කුමක් ද ?

2. දී ඇති උදාහරණය සැලකිල්ලට ගනිමින් හිස්තැන් පුරවන්න.

   උදා:- ඇස නිසා උපදින්නේ චක්ඛුද්වාරික චිත්ත වීථිය යි.

   I. කණ නිසා ........................................................ චිත්ත වීථිය යි.
   II. නාසය නිසා ........................................................
   III. දිව නිසා ........................................................
   IV. කය නිසා ........................................................
   V. මනස නිසා ........................................................

## 5. පාඩම

# පුනර්භවය

දිනක් බුදුරජාණන් වහන්සේ හා ආනන්ද තෙරුන් වහන්සේ අතර පුනර්භවය පිළිබඳ ධර්ම සාකච්ඡාවක් ඇති විය. අංගුත්තර නිකායේ තික නිපාතයෙහි සඳහන් වන එම ධර්ම සාකච්ඡාවෙන් කොටසක් පහත දක්වා ඇත.

'ස්වාමීනි, භවය සිදුවන්නේ කෙසේද ?'

'ආනන්ද, කාම ලෝකයෙහි විපාක දෙන කර්මයක් නැති නම් කාම ලෝකයෙහි ඉපදීමක් සිදුවෙයි ද?'

'නැති ස්වාමීනි'

'ආනන්ද, කර්මය කෙතකි. විඤ්ඤාණය (සිත) බීජය කි. තණ්හාව ජලයකි. අවිද්‍යාවෙන් හා තණ්හාවෙන් යුක්ත වූ සත්ත්වයන්ගේ සිත් මරණින් මතු කාම භවයෙහි හට ගන්නව.' මේ අන්දමට මතු මත්තෙහි පුනර්භවයෙහි පැවැත්ම සිදුවෙනවා.

රූප ලෝකයෙහි හා අරූප ලෝකයෙහි පුනර්භවය සිදුවන ආකාරයත් මෙම සාකච්ඡාවෙහි දී බුදුරජාණන් වහන්සේ පැහැදිලි කළහ. කුසල අකුසල කර්ම ඇතිවීම කර්ම භවයයි. ඒ අනුව යම් තැනක ඉපදීම උත්පත්ති භවයයි. සිත අවිද්‍යාවෙන් හා තණ්හාවෙන් යුක්තතාක් කල් කර්ම රැස්වෙයි. අවිද්‍යාවෙන් හා තණ්හාවෙන් යුක්ත සිතක් ඇති තාක් කල් ඉපදීම සිදුවෙයි. මෙම කර්මභවය හා උත්පත්ති භවය නැවත නැවත සසිදුවීම පුනර්භවයයි. (පුන+භව = පුනබ්භව)

කාමලෝකයට අයත් සතර අපායෙහි (කාම දුගතියෙහි) ඉපදීමට අකුසල කර්ම හේතුවෙයි. මිනිස් ලොව හා සදෙව්ලොව (කාම සුගතියෙහි) ඉපදීමට හා රූප, අරූප ලෝකවල ඉපදීමට කුසල කර්ම හේතුවෙයි. කාම ලෝකයෙහි උපදින ආකාරයත්, රූප අරූප ලෝකවල

උපදින ආකාරයත් අභිධර්මයෙහි වෙන් වෙන් ව දක්වා තිබේ. අප උපත ලබා ඇත්තේ කාම ලෝකයෙහි ය. එහෙයින් කාම ලෝකයෙහි පුනර්භවය සිදුවන ආකාරය අභිධර්මයට අනුව මෙතැන් සිට විමසා බලමු.

මව්කුසක මුලින් ම හටගන්නා සිත ප්‍රතිසන්ධි සිතයි. ඉන්පසු භවංග සිත් ඇති වේ. අනතුරුව චිත්ත වීථි ඇතිවෙයි. සෑම චිත්ත වීථි දෙකක් අතර ම භවංග සිත ඇති වේ. ප්‍රතිසන්ධි සිත හා භවංග සිත චිත්ත වීථිවලට අයත් නොවේ. එහෙයින් වීථිමුක්ත සිත් යනුවෙන් ඒවා හඳුන්වා ඇත.

උපතේ පටන් මරණය තෙක් ම වීථිමුක්ත භවංග සිත හා චිත්ත වීථි දිගින් දිගට ම ඉපදී - පැවතී - නැති වී යයි. යම් දිනක පුද්ගලයා මරණයට ආසන්න වෙයි. මරණාසන්න වූ පුද්ගලයාට මේ ජීවිතයේදී අවසන් වරට ඇතිවන චිත්ත වීථිය හඳුන්වන්නේ මරණාසන්න චිත්ත වීථිය යනුවෙනි. ඔබ සිව්වැනි පාඩමෙන් උගත් පරිදි ජවන් සිත් හතක් මරණාසන්න චිත්ත වීථියෙහි ඇති නොවේ. එහි ඇති වන්නේ ජවන් සිත් පහකි. ඉන් පසුව තදාරම්මණ සිත් හා භවංග සිත ඇති වේ. එම භවංග සිත ඉපදී පැවතී නැති වී යාමත් සමග මේ ජීවිතයේ අවසාන සිත උපදී. එයට චුති සිත යයි නාම කර ඇත. එය ද වීථි මුක්ත සිතකි. චුති සිත ඉපදී - පැවතී - නැතිවී යාමත් සමග මරණය වෙයි.

අවිද්‍යාවෙන් හා තණ්හාවෙන් යුත් චුති සිතට අරමුණු වන්නේ කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්තකි. මෙම කර්ම, කර්ම නිමිති, ගති නිමිති මරණයට දින කීපයකට කලින් සිට වුව ද ඇතිවිය හැකිය. කෙසේ හෝ මරණාසන්න චිත්ත වීථිය නැති වී ගිය පසු භවංග සිත ඉපදී පැවතී නැතිවී යයි. ඉන්පසු කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්තක් අරමුණු කරමින් චුති සිත උපදී. ඒ චුති සිත කුසල සිතක් හෝ අකුසල සිතක් වියහැකි ය. අවිද්‍යාවෙන් හා තණ්හාවෙන් යුත් චුති සිත ඉපදී - පැවතී - නැති වී යාමත් සමග එහි ඇති කර්ම ශක්තියට අනුව කාම ලෝකයට අයත් මිනිස් ලොව මව් කුසක හෝ තිරිසන් සතෙකුගේ කුසක හෝ සුදුසු තැනක හෝ නව සිතක් පහළ වෙයි. එයට ප්‍රතිසන්ධි සිත යයි කියනු ලැබේ. චුති සිතෙන් පසු ප්‍රතිසන්ධි සිතක පහළ වීම පුනර්භවයයි.

අප මහ බෝසතාණන් වහන්සේ තුසිත දෙව්ලොවින් චුත වී මහාමායා දේවියගේ කුස පිළිසිඳ ගත්හ. මව්කුසින් බිහි වූ උන්වහන්සේ පියවර සතක් ඉදිරියට ගමන් කොට,

'මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි.
මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි.
මේ මගේ අන්තිම ජාතිය යි.
දැන් පුනර්භවයක් නැත

යනුවෙන් පැවසූහ. අවිද්‍යාවෙන් හා තණ්හාවෙන් යුතු බෝසතාණන් වහන්සේගේ සිත තුසීත දෙව්ලොවින් චුත වූ පසු මහාමායා දේවියගේ කුසෙහි පිළිසිඳ ගැනීම පුනර්භවයයි.

උන්වහන්සේ බුදුබවට පත්ව අවිද්‍යාව තණ්හාව ප්‍රහීන කළහ. එහෙයින් මල්ල රජදරුවන්ගේ සල් උයනෙහි වැඩ සිට පිරිනිවන් පා වදාළ උන්වහන්සේගේ චුති සිත ද අවිද්‍යා තණ්හාවන්ගෙන් තොරය. එහෙයින් නැවත ඉපදීමක් නැත. පුනර්භවයක් නැත. සිදුහත් බෝසතාණන් වහන්සේ මහාමායා දේවියගේ කුසින් බිහි වී සත් පියවරක් ගමන්කොට දැන් පුනර්භවයක් නැත. (නත්ථිදානි පුනබ්භවෝ) යනුවෙන් පැවසුවේ එහෙයිනි.

වැදගත් කරුණු :-

* අවිද්‍යා තණ්හාවෙන් යුක් සිත කුසල, අකුසල කර්ම රැස්කරයි.

* එම කර්ම අනුව නැවත නැවත ඉපදීම පුනර්භවයයි.

* කරන ලද කුසල අකුසල සියල්ල කර්ම නම් වේ.

* කුසල කර්ම සිදුකිරීමට උපකාර වූ මල්, පහන් ආදියත් අකුසල කර්ම සිදුකිරීමට උපකාර වූ ආයුධ ආදියත් කර්ම නිමිති නම් වේ.

* මරණින් පසු උපදින තැන ට ගති යන නම යෙදේ. කුසල කර්මයකට අනුව දෙව්ලොව උපදින්නේ නම් දෙව් විමන් ආදිය ද මිනිස් ලොව උපදින්නේ නම් මව් කුස ආදිය ද පෙනේ. අකුසල

කර්මයකට අනුව අපායෙහි උපදින සත්වයන්ට ගිනිදැල් ආදිය ද පෙනේ. උපදින තැන්හි ඇති එම නිමිතිවලට 'ගති නිමිති' යැයි කියනු ලැබේ.

* රහතන් වහන්සේලාගේ චුති සිතට කර්ම - කර්ම නිමිති - ගති නිමිති අරමුණු නොවේ.

* බුදු - පසේ බුදු - රහත් උතුමන් වහන්සේලාට පුනර්භවයක් නැත.

* අනිත් සියලු දෙනාට පුනර්භවයක් ඇත.

අභ්‍යාස :

1. පුනර්භවය ඔප්පු කළහැකි කරුණු කීපයක් සොයා එක්රැස් කරන්න.

උදා :– i. පෙර භවය පවසන පුද්ගලයාගේ කථා
ii. පුද්ගලයන් සතු විශේෂ හැකියාවන් ආදිය

පුහුණුවට :

බුද්ධෝහං බෝධයිස්සාමි
මුත්තෝහං මෝචයේ පරේ
තිණ්ණෝහං තාරයිස්සාමි
සංසාරෝඝා මහබ්භයා

කළෙමි අවබෝධ කරවන්නෙමි එලෙස
මිදුනෙමි මුදා ගන්නෙමි ලෝසත විගස
තරණය කළෙමි, කරවන්නෙමි දන එලෙ ස
මහබිය සසර දියදහරින් සැඩ පරුස

6. පාඩම

## නිවන I

**මම සිහිල් වූයෙමි, නිවුනෙමි.**

ඒ වෙසක් පුන් පොහෝ දින පෙරදිග අහසෙහි පුන්සඳ උදාවෙමින් තිබිණි. සිදුහත් බෝසතාණන් ගයා හිස ඇසතු බෝරුක මුල වැඩ හිඳිති. සරාසැකි කප් සුවහසක් පිරූ දසපෙරුම් දම් උන්වහන්සේගේ උදාර හැඟුම් ඉටු කරන්නට සැදී පැහැදී සිටියි. සොමි රැසින් මුළු ගයා හිස සිසිල් කළ පුන්සඳ කෙමෙන් කෙමෙන් අවරදිග අහසෙයි සැඟවෙන්නට විය.

සඳරැසින් හා බෝ-පතින් ලැබූ සිසිලට රමණීය වන පෙතින් හමා ආ මඳ පවනත් එක්ව බෝසතුන්ගේ සිරුරෙහි වෙහෙස නිවීමෙහි නිරත විය. මොහඳුරෙහි නිදිගත් ලෝසතුන්ගේ නුවණැස අවදිකරන බුද්ධ දිවාකරයාණන්ගේ උදාවක අරුණළු මේයැයි කියන්නාක් මෙන් පෙරදිග ගුවන් ගැබ, හිරු උදාවේ අරුණළු දිස්වන්නට විය. මේ උතුම් මොහොතෙහි අප මහ බෝසතාණන් වහන්සේ තම සිතැ කෙලෙස් ගිනි නිවා දමමින් සිසිල් වූහ. නිවුනාහ.

මෙසේ කෙලෙස් ගිනි නිවා බුදුබවට පත් උන්වහන්සේ එම සිසිල හා නිවීම ලැබ ගන්නා මග ලෝ සතුනට හෙළි කළහ. ඒ මග කුමක්දැයි මෙතැන් සිට විමසා බලමු.

නිවන් ලබන මග "අරි අටඟි මග" ය. සෝත යනු ද එයට ම නමකි. අරි අටඟි මග නම් වූ සෝතයට පැමිණි පුද්ගලයා සෝතාපන්න නම් වේ. යමෙකු මේ සෝතයට පැමිණියේ නම් ඔහුගේ සසර දුක් ගිනි, භව සතකට සීමා වෙයි. කාමලෝකයෙහි අටවෙනි භවයක් ඔහුට නැත. සසර දුක් ගිනිවලින් එතර වීමට නොදී පුද්ගලයා සසර ට බැඳ තබන බැමි (බන්ධන - සංයෝජන) තුනක් සෝතාපන්න පුද්ගලයා සිඳ දමා ඇත. පහත දැක්වෙන්නේ ඒ එකිනෙක බැමි පිළිබඳ විස්තරයකි.

සක්කාය දිට්ඨි

ඔබ මෙතෙක් උගත් චිත්ත - චෛතසික හා රූප වෙත ඔබේ අවධානය දැන් යොමු කරන්න. එවිට පඨවි ආදී රූප 28 රූපස්කන්ධය යි.

සුඛ - දුක්ඛ - උපෙක්ඛා ආදි වේදනා රාශිය වේදනාස්කන්ධයයි.
රූප සඤ්ඤා ආදී සඤ්ඤා රාශිය සංඥා ස්කන්ධයයි.
කුසල් - අකුසල් (චෛතසික) රාශිය සංස්කාර ස්කන්ධයයි.
සිත් 89 විඤ්ඤාණස්කන්ධය යි ඔබේ මතකයට නැගෙනු ඇත.

මෙහි සඳහන් සකන්ධයන් සතුව ඇත්තේ ඉපදී - පැවතී - නැතිවීමේ ලක්ෂණය යි.

එහෙයින් පංචස්කන්ධය නිත්‍ය නොවේ. අනිත්‍යය, රූපයක ආයුෂ, සිත් 17කින් යුත් සිත් වැලක් පවතින කාලයට සමානය. සිත් 17 ක් ඉපදී - පැවතී - නැති වී යනවිට එක් රූපයක් ඉපදී - පැවතී - නැති වී යයි. ඒ අනුව සියලු ම රූප හෙවත් රූපස්කන්ධය අනිත්‍ය ය.

අප විඳින සැප - දුක් ආදී වේදනාවන් ද ස්ථිරව නොපවතී. ඒ අනුව සියලු වේදනා හෙවත් වේදනා ස්කන්ධය අනිත්‍යය.

රූප සඤ්ඤා ආදිය ද ස්ථිරව පවතින ඒවා නොවේ. ඒ අනුව සියලු සංඥා හෙවත් සංඥා ස්කන්ධය අනිත්‍ය ය.

වේදනා සඤ්ඤා දෙක හැර ඉතිරි චෛතසික 50 අයත් වන්නේ සංස්කාර ස්කන්ධයට ය. මේ චෛතසික ද සිත සමග ඉපදී පැවතී - නැති වී යයි. ඒ අනුව සියලු සංස්කාර හෙවත් සංස්කාර ස්කන්ධය ද අනිත්‍යය.

සිත් ද ඉතා වේගයෙන් ඇති ව පැවතී නැතිවන සුළුය. සිත් උපදින වේගය උපමාවකින් පවා දැක්වීම පහසු නොවන බව බුදුරජාණන් වහන්සේ වදාළහ. ඒ අනුව සියලු සිත් හෙවත් විඤ්ඤාණස්කන්ධය ද අනිත්‍යය. වේදනා - සඤ්ඤා - සංඛාර යන කොටස් තුනට අයත් වන්නේ

චෛතසික ම හෙයින් එම ස්කන්ධ තුන ද සිත සමග ඉපදී - පැවතී - නැති වී යයි. මුළු ලෝකය ම පංචස්කන්ධයට ඇතුළත් ය. එයින් බැහැර කිසිවක් නැත. එහෙයින් ස්ථිර - නිත්‍ය දෙයක් නැත. අනිත්‍ය දේ දුකකි. යමක් ස්ථිර නම් නිත්‍ය නම් එයට 'ආත්ම' යන වචනය යෙදේ. ලෝකයේ ස්ථිර නිත්‍ය දෙයක් නැති හෙයින් ආත්මයක් ද නැත.

පංචස්කන්ධයට සක්කාය යන වචනය යෙදේ. මෙම සක්කාය ස්ථිරය, නිත්‍යය, එහෙයින් එය ආත්මයකි යනුවෙන් දැකීම සක්කාය දිට්ඨි ය යි. සෝවාන් වූ පුද්ගලයාගේ මේ සක්කාය දිට්ඨිය නමැති සංයෝජනය නැත.

## විචිකිච්ඡා

කරුණු අටක් පිළිබඳ ඇතිවන සැකය විචිකිච්ඡාවයි. එම කරුණු නම් වශයෙන් මෙසේ ය:-

බුදුගුණ සත්‍යදැයි සැක කිරීම.
දහම් ගුණ සත්‍යදැයි සැක කිරීම.
සඟගුණ සත්‍යදැයි සැක කිරීම.
සීල - සමාධි - ප්‍රඥා යන ශික්ෂාව ගැන සැක කිරීම.
පෙරභවය ගැන සැක කිරීම.
අනාගත භවය ගැන සැක කිරීම.
පෙර හා අනාගත භව ගැන සැක කිරීම.
පටිච්ච සමුපාදය ගැන සැක කිරීම.

සෝතාපන්න වූ පුද්ගලයාට වේ විචිකිච්ඡා සංයෝජනය ද නැත.

## සීලබ්බත පරාමාස

නිවන් දැකීමට අරි අටඟි මග හැර වෙනත් සීලයක්, ව්‍රතයක් ඇතැයි සිත ඒ අනුව කටයුතු කිරීම සීලබ්බත පරාමාස යයි. මෙහි 2 වන පාඩමෙහි සඳහන් කළ පූර්ණ, ගෝව්‍රත හා ගෝ සිල් ද සේනිය, කුක්කුර ව්‍රත හා කුක්කුර සිල් ද අනුගමනය කළ බව ඔබට මතක ඇත. එසේ ම ඔවුන් බුදුරදුන් හමු වූ පසු එම පිළිවෙත් වැරදි බව පිළිගෙන ඒවා අත්හළ බව ද ඔබට මතක ඇත. සෝතාපන්න පුද්ගලයා තුළ මේ සීලබ්බත පරාමාස සංයෝජනය ද නැත.

සෝතාපන්න පුද්ගලයා එම තත්ත්වයට පත්වීමත් සමඟ සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සංයෝජන තුන නැවත කිසි කලෙකත් නූපදින පරිදි දුරුවී යයි.

එසේ ම සතර අපායෙහි ඉපදීම ගෙන දෙන රාග - දෝස - මෝහයන් ද දුරු කරයි.

මෙසේ සෝතාපන්න පුද්ගලයා සතර අපා දුක්ගිනි සඳහට ම නිවා සිසිල් වෙයි. කාම ලෝකයෙහි භව ගමන උපරිම වශයෙන් සත්වරකට සීමා කිරීමෙන් ජාති - ජරා - මරණ දුක්ගිනි බොහෝ සේ නිවා සිසිල් වෙයි. සෝතාපන්න (සෝවාන්) පුද්ගලයාගේ මේ නිවී සිසිල්වීම කෙලෙස් ගිනි නිවීමේ පළමු පියවර ය.

වැදගත් කරුණු :-

* සෝත යනු අරී අටඟි මගට නමකි.
* මෙම සෝතයට පැමිණීම සෝතාපත්ති නම් වේ.
* සෝතයට පැමිණි පුද්ගලයා සෝතාපන්න නම් වේ.
* සෝතාපන්න (සෝවාන්) පුද්ගලයාගේ සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත - පරාමාස යන සංයෝජන තුන සම්පූර්ණයෙන් ම දුරු වී ඇත.
* පෘථග්ජන තත්ත්වයෙන් ආර්ය තත්ත්වයට පත්වන්නේ සෝවාන් වීමෙනි.
* සෝවාන් වීමෙන් පළමුවරට නිවීම සිදුවෙයි.

අභ්‍යාස :

සාමාන්‍ය පුද්ගලයාට වඩා සෝවාන් පුද්ගලයාගේ වෙනස පැහැදිලි කරමින් ලිපියක් ලියන්න.

7. පාඩම

# නිවන II, III

**මම සිහිල් වූයෙමි. නිවුනෙමි.**

සෝවාන් වූ ආර්ය ශ්‍රාවකයා **නවදුර්වත් සසර දුක් දුරුකරමින්** කෙලෙස් ගිනි නිවමින් **අර්අටඟි මඟෙහි ඉදිරියට ම ගමන්** කරයි. මෙම ගමනේ දී කාමරාග, **පටිඝ යන** සසර බැමි දෙක සෑහෙන දුරකට දුරු කිරීමෙන් සකදාගාමී ආර්ය ශ්‍රාවකයකු බවට පත්වෙයි.

රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන පංචකාම වස්තූන්ට ඇතිවන ඇල්ම, රාගය කාමරාගය යි. කැමති දෑ නොලැබීමේදීත්, අකමැති දෑ ලැබීමේදීත් සිතෙහි ගැටීමක් ද්වේෂයක් උපදී. එය පටිඝය යි. සකදාගාමී වීමෙන් මෙම සංයෝජන දෙක තුනී වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සකදාගාමී ආර්ය ශ්‍රාවකයා කාමලෝකයට අයත් මිනිස් ලොව නැවත උපදින්නේ එක්වරක් පමණි. 'එක්වරක් (මිනිස් ලොව ඉපදීමට) පැමිණෙයි'. යන අදහස සකදාගාමී යන්නෙහි ඇත. (සකිං + ආගාමී = සකදාගාමී)

සතර අපාය, මිනිස්ලොව හා සදෙව්ලොව යනුවෙන් ලෝක එකොළොසක් කාම ලෝකයට අයත් ය. සෝවාන් වීමෙන් සතර අපායෙන් මිදුනු ආර්ය ශ්‍රාවකයා මිනිස් ලොව ඉපදීම ද එක් වරකට සීමා කරන සකදාගාමී තත්ත්වයට පැමිණීමෙන් සසර ගමන තවදුරටත් කෙටිකර ගැනීමට සමත් වෙයි. මෙය කෙලෙස් ගිනි නිවීමේ දෙවන පියවරයි.

සකදාගාමී වීමෙන් දෙවන වරට නිවී සැනසුණු තැනැත්තා ඉතිරිව ඇති කාමරාගය හා පටිඝය සම්පූර්ණයෙන් දුරුකිරීමට සමත් වෙයි. කාම ලෝකයෙහි ඉපදීමට අවශ්‍ය කාමරාගපටිඝ සම්පූර්ණයෙන් දුරුකිරීමත් සමග නැවත කාමලෝකයෙහි ඉපදීමේ ශක්තිය ද සම්පූර්ණයෙන් දුරුවෙයි. එහෙයින් කාමරාග පටිඝ යන සංයෝජන දුරුකළ ආර්ය ශ්‍රාවකයා අනාගාමී යනුවෙන් හඳුන්වා ඇත. අනාගාමී යන්නෙහි උත්පත්ති වශයෙන් කාමලෝකයට නොපැමිණෙයි. යන අදහස ඇත. (න+ආගාමී=අනාගාමී) මෙසේ තෙවන පියවරෙහි දී ලබන නිවී සිසිල් වීම යනු කාම ලෝකයෙන් මිදීමයි.

වැදගත් කරුණු :-

* සතර අපාය, මිනිස් ලොව සදෙව් ලොව යන එකොළොස කාම ලෝකයට අයත් ය.

* උත්පත්ති වශයෙන් මිනිස් ලොවට එක් වරක් පැමිණෙන්නේ සකදාගාමී ආර්ය ශ්‍රාවකයා ය.

* උත්පත්ති වශයෙන් මිනිස් ලෝවට හා දෙව්ලෝ සයට එක්වරක්වත් නො පැමිණෙන්නේ අනාගාමී ආර්ය ශ්‍රාවකයා ය.

* රූපාවචර බ්‍රහ්මලෝක හා අරූපාවචර බ්‍රහ්මලෝකවලට වඩා පහළ කොටසට හෙවත් පහත් තත්ත්වයකට කාම ලෝකය අයත් වෙයි. කාමලෝකයට 'ඔරම්භාග' යන වචනය යෙදෙන්නේ එහෙයිනි.

* කාම ලෝකයෙහි හෙවත් ඔරම්භාගයෙහි ඉපදීමට අවශ්‍ය සසර බැමි සහ 'ඔරම්භාගිය සංයෝජන' නම් වේ.

* සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ යනු එම 'ඔරම්භාගිය සංයෝජන' පස ය.

* සෝවාන්, සකදාගාමී, අනාගාමී යන අවස්ථා තුනට පැමිණි ආර්ය ශ්‍රාවකයා මෙම සංයෝජන පහ දුරුකර ඇත.

අභ්‍යාස :

පහත සඳහන් ගාථාව හා එහි අර්ථය කියවා අසා ඇති ප්‍රශ්නවලට ඔබේ අභ්‍යාස පොතෙහි පිළිතුරු සපයන්න.

දිට්ඨිං ච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේ ති.

සක්කාය දිට්ඨියට නොපැමිණ සිල්වත් ය.
සම්මා දිට්ඨි නම් වූ දර්ශනයෙන් යුතු සෝවාන් පුද්ගලයා.
පංචකාමයන්හි ඇල්ම දුරුකොට අනාගාමී ව
නැවත මව්කුස පිළිසිඳ ගැනීමකට නොපැමිණේ යි.

නිවැරදි පිළිතුර සොයන්න

(1) ගාථාවේ මුල් පේළි දෙකින් කියවෙන්නේ

i. සෝවාන් පුද්ගලයා ය.
ii. සකදාගාමී පුද්ගලයා ය.

(2) කාමේසු විනෙය්‍ය ගේධං (පංචකාමයන්හි ඇල්ම දුරුකොට) යන්නෙන් අදහස් කරන්නේ.

i. සෝවාන් වීම ය.
ii. අනාගාමී වීම ය.

(3) ගාථාවේ තෙවෙනි සිව්වෙනි පේළි දෙකින් කියවෙන්නේ

i. සෝවාන් වූ පුද්ගලයාගේ ලක්ෂණය.
ii. සකදාගාමී වූ පුද්ගලයාගේ ලක්ෂණය.
iii. අනාගාමී වූ පුද්ගලයාගේ ලක්ෂණය.

(4) මව්කුසක පිළිසිඳ ගැනීමක් ඇත්තේ

i. මිනිස් ලොවෙහි ය.
ii. දෙව් ලොවෙහි ය.
iii. බඹ ලොවෙහි ය.

පුහුණුවට :

ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්ත චිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණ බීජා අවිරුළ්හි ච් ඡන්දා
නිබ්බන්ති ධීරා යථායං පදීපෝ
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

පෙර කම් ගෙවී, නව කම් ඇති නොවන ලෙස
නැත බව ඇල්ම, ඇත ගෙවූ කම් බීජ රැස
පඩිවරු නිවෙති නිවෙනා මේ පහන ලෙස
වේවා සහ ගුණයෙන් සත්හට සුව පහස

8. පාඩම

# නිවන IV

**මම සිහිල් වුයෙමි, නිවුනෙමි.**

අනාගාමී වීමත් සමඟ පුද්ගලයා කාමලෝකයෙන් එතෙර වෙයි. සම්පූර්ණ ලෝකයෙන් එතෙර වීම පිණිස ඔහු අරිඅටඟි මගෙහි අවසාන පියවරට පැමිණිය යුතුය. යම් හෙයකින් අනාගාමි පුද්ගලයා මේ මිනිස් ලොව දී රහත් නොවී මියගියහොත් රූපාවචර බ්‍රහ්ම ලොකයක උපදී. මිනිස් ලොව සිටින අනාගාමි පුද්ගලයා හෝ මියගොස් බඹලොව උපන් අනාගාමි පුද්ගලයා හෝ රහත්වීම සඳහා ඉතිරි සංයෝජන පහ දුරුකළ යුතු ය. රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යනු එම සංයෝජනයන් ය. ඒවාට උද්ධම්භාගිය සංයෝජන යයි කියනු ලැබේ.

යම් දිනක අනාගාමි වූ ආර්ය ශ්‍රාවකයා මෙම උද්ධම්භාගිය සංයොජන පස සම්පූර්ණයෙන් දුරුකොට කෙලෙස් ගිනි නිවීමේ සිවුවෙනි අවස්ථාවට පැමිණි සම්පූර්ණයෙන් ම සිසිල් වෙයි. නිවෙයි. සම්පූර්න නිවීමට පත් ආර්ය ශ්‍රාවකයා හඳුන්වන්නේ රහතන් වහන්සේ යනුවෙනි. පසේ බුදුරජාණන් වහන්සේලාත් සම්මා සම්බුදු රජාණන් වහන්සේලාත් සම්පූර්ණයෙන් කෙලෙස් ගිනි නිවා සිසිල් වූ නිවුණු උතුමෝ වෙති.

අප ගෞතම බුදුරජාණන් වහන්සේ ද ගයාහිස බෝ මැඩ දී කෙලෙස් ගිනි නිවා සිසිල් වූහ. නිවුනහ. බෝ මැඩ අසල සත්සති ගතකොට පළමු දම්දෙසීම පිණිස බරණැස ඉසිපතන නම් වූ මිගදායට වැඩම කරන බුදුරජාණන් වහන්සේට අතර මගදී උපක නම් ආජීවකයකු හමු විය. උපක ආජීවකයා බුදුරජාණන් වහන්සේ දැක උන්වහන්සේගෙන් මෙසේ ඇසීය.

ඔබ වහන්සේගේ ඉඳුරන් ඉතාමත් පැහැපත් ය.
සිරුරෙහි පැහැය පිරිසිදු ය, නිර්මලය.
ඔබ වහන්සේ කවරකු උදෙසා පැවිදි වූ සේක් ද ?
ඔබ වහන්සේගේ ගුරුවරයා කව්ද ?
කවරෙකුගේ ධර්මයට ඔබවහන්සේ කැමතිවන සේක් ද?

උපක ආජීවකයාගේ මේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන බුදුරජාණන් වහන්සේ

අහං හි අරහා ලෝකේ
අහං සත්ථා අනුත්තරෝ
ඒකෝම්හි සම්මා සම්බුද්ධෝ
සීති භූතෝස්මි නිබ්බුතෝ

යනුවෙන් ද වදාළහ. පහත දක්වා ඇත්තේ එයි අර්ථය යි.

මම ලෝකයෙහි රහත් වෙමි.
මම උසස් ම ගුරුවරයා වෙමි.
මම ම සම්මා සම්බුද්ධ වෙමි.
මම සියලු කෙලෙස් ගිනි නිවා සිසිල් වූයෙමි. නිවුනෙමි.

වැදගත් කරුණු :-

* රූප ලෝක, අරූපලෝක කොටසට 'උද්ධංභාග' යන නම යෙදේ.

* උද්ධම්භාගයට අයත් සංයෝජන උද්ධම්භාගිය සංයෝජන නම් වේ.

* උද්ධංභාගිය සංයෝජන නැති කිරීමෙන් රූප ලෝක - අරූප ලෝක වලින් ද එතෙරව සම්පූර්ණ ලෝකයෙන් එතෙර වෙයි. ලෝකෝත්තර වෙයි.

අභ්‍යාස :

පහත සඳහන් වගුව ඔබේ අභ්‍යාස පොතෙහි සටහන් කර සුදුසු වචනවලින් හිස්තැන් පුරවන්න.

| ඕරම්භාගිය (කාමලෝකයට අයත්) සංයෝජන 5 | | | |
|---|---|---|---|
| 1. .............<br>2. විචිකිච්ඡා<br>3. ............. | සම්පූර්ණයෙන් නැති කිරීමෙන් | සෝවාන් බවට පත්ව | නරක, තිරිසන්, පෙත, අසුර යන සතර අපායෙන් සම්පූර්ණයෙන් මිදෙයි. කාම භවය සත්වරකට සීමාකරයි. |
| 4. .............<br>5. ............. | තුනී කිරීමෙන් | ............... බවට පත්ව | ............................ ලොව ඉපදීම එක්වරකට සීමා කරයි. |
| | ..................... නැති කිරීමෙන් | ............... බවට පත්ව | මිනිස් ලොව හා සදෙව් ලොව ඉපදීමෙන් මිදෙයි. |
| උද්ධම්භාගිය (රූප-අරූප ලෝකවලට අයත්) සංයෝජන 5 | | | |
| 6. .............<br>7. .............<br>8. මාන<br>9. .............<br>10. ............. | ..................... නැති කිරීමෙන් | ............... බවට පත්ව | රූප ලෝකයෙන් හා අරූප ලෝකයෙන් ද මිදී ලෝකෝත්තර වෙයි. |

රාගාදි කෙලෙස් ගිනි නිවමින් පුද්ගලයා නිවී සැනසෙන අයුරු මෙම වගුවෙන් ඔබට පැහැදිලි වනු ඇත.

## 9. පාඩම

## නිබ්බාන ධාතු දෙක

උපතින් තිස්පස් වැනි වියෙහි දී සිදුහත් බෝසතාණෝ ගයා හිස බෝ-රුක් මුල දී සියලු කෙලෙස් ගිනි නිවා බුදුබවට පත්ව පිරිනිවන් පා වදාළහ. මෙසේ බුදුරජාණන් වහන්සේ පුරා සතළිස් පස් වරසක් දෙව් - මිනිසුන් සහිත ලෝකයාට ද පිරිනිවෙන මග හෙළිකළහ.

උපතින් අසූවැනි වියෙහි දී මල්ල රජදරුවන්ගේ සල් උයනෙහි සල් ගස් දෙකක් අතර පැන වූ අසුනෙහි සැතපෙන ඉරියව්වෙන් උන්වහන්සේ වැඩ හුන්හ. එසේ වැඩ සිට පංචස්කන්ධය නිසා ඇති වූ රෝගා දී දුක්වලින් ද මිදෙමින් පිරිනිවන් පා වදාළහ.

බුදුරජාණන් වහන්සේ අවස්ථා දෙකක දී පිරිනිවන් පා වාදළ බව ඉහත දැක්වූ කරුණු අනුව ඔබට පැහැදිලි වන්නට ඇත. මේ දෙයාකාර පිරිනිවීම පිළිබඳව තවදුරටත් අපි විමසා බලමු.

පළමු පිරිනිවීම සිදුවූයේ බෝරුක් මුල දී ය. සිදුහත් බෝසතාණන් වහන්සේගේ සිතෙහි පැවති අවිජ්ජා තණ්හා හෙවත් දස සංයෝජන සම්පූර්ණයෙන් ඉවත්වීමයි එහිදී සිදු වූයේ.

අවිජ්ජා - තණ්හා නැති වූ පසු ද පෙර පැවති පරිද්දෙන් පංචස්කන්ධය තවත් හතළිස් පස් වසරක් ඉදිරියට පැවතුණි.

රූප - වේදනා - සඤ්ඤා - සංඛාර - විඤ්ඤාණ යනු පංචස්කන්ධය බව ඔබ කලින් ඉගෙනගෙන ඇත. උපාදි යනුවෙන් පංචස්කන්ධයට තවත් නමක් ඇත. සේය යනු ඉතිරිය යි. පංචස්කන්ධය ඉතිරිවීමට සඋපාදිසේස යයි කියනු ලැබේ. මේ අනුව ජීවත්ව සිටිය දී අවිජ්ජා - තණ්හා නැතිකොට ලබන නිවීම, නිවන සඋපාදිසේස නිබ්බාන ධාතු නම් වේ.

බුද්ධත්වයෙන් පසු වැඩසිටි සතළිස් පස්වසර තුළ රෝගාබාධ ආදියෙන් උන්වහන්සේ කායික දුක් වින්දහ. එසේ ම දන් වැළඳීම්, සැතපීම් ආදියෙන් කායික සැප ද වින්දහ.

මල්ල රජවරුන්ගේ සල් උයනෙහි දී බුදුරජාණන් වහන්සේ දෙවන වරට පිරිනිවන් පා වදාළහ.

මෙම පිරිනිවීමෙන් උන්වහන්සේ එතෙක් ඉතිරිව තිබූ පංචස්කන්ධ දුකින් ද නිදහස් වූහ. නැවත පංචස්කන්ධය හටගැනීමක් සඳහා අවශ්‍ය තණ්හාව ද නැත. එහෙයින් පුනර්භවය ද නැත. මෙසේ පංචස්කන්ධය ඉතිරි නොකොට හෙවත් නැවත නොහටගන්නා පරිදි පිරිනිවන් පෑමට නඋපාදිසේස නිබ්බාන ධාතු යයි කියනු ලැබේ. එය අනුපාදිසේස නිබ්බාන ධාතු නම් වේ.

මෙම නිබ්බාන ධාතු දෙක බුදු - පසේබුදු - රහත් සියලුදෙනා වහන්සේට ම අයත් වෙයි.

වැදගත් කරුණු :-

* සඋපාදිසේස, අනුපාදිසේස යනුවෙන් නිබ්බාන ධාතු දෙකකි.
* මෙය නිවන් දෙකක් නොව නිවනේ අවස්ථා දෙකකි.
* උපාදි යනු පංචස්කන්ධයට නමකි.

අභ්‍යාස :

ඔබේ අභ්‍යාස පොතෙහි ලියා සුදුසු වචනවලින් හිස්තැන් පුරවන්න.

1. ක්ලේශ පරිනිර්වාණය යනු ................................... නිබ්බාන ධාතුවයි.
2. ස්කන්ධ පරිනිර්වාණය යනු ............................... නිබ්බාන ධාතුවයි.

පුහුණුවට :

තත්ථ වුත්තාභිධම්මත්ථා - චතුධා පරමත්ථතෝ
චිත්තං චේතසිකං රූපං - නිබ්බාන මිති සබ්බථා
පරමත් දහම් සතරකි අබිදම්හි එන
සිත සහ සිතේගති වෙයි රූප ද නිවන

# 10. පාඩම

## සතර පරමාර්ථ ධර්ම

### ලෝකය හා ඉන් මිදීම

ඉර - හඳ - තාරකා නැත. දිවා රෑ නැත යන මේ අදහස උපතින් ම අන්ධ පුද්ගලයකු ඔබ සමග පැවසූහ යි සිතන්න. එහෙත් දෙනෙත් පෙනෙන ඔබ අන්ධ පුද්ගලයාගේ කියමන පිළිගන්නෙහි ද? නැත. ලොව ඇති සියල්ල දැකීමට අපේ දෙනෙත් වුව ද ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා ප්‍රඥා නමැති ඇස අවශ්‍යයි. බුදු - පසේබුදු - රහත් උතුමෝ මේ ප්‍රඥා ඇස ලබා ගතිති. ධම්මචක්කප්පවත්වන සූත්‍රයේ දී චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි යනාදී වශයෙන් බුදුරජාණන් වහන්සේ වදාළේ ද උන්වහන්සේ ලෝකය හා ඉන් මිදීම පිළිබඳ පූර්ණ දැනීම ලබාගත් බවත්, ඉන් මිදුනු බවත් ය.

තුන් ලෝකයෙන් එතෙර වූ බුදුරජාණන් වහන්සේ ලෝකය, ඉන් මිදීම හා එයට මග, පුරා සතළිස් පස් වසරක් තිස්සේ දේශනා කළහ. මෙම දේශනාවන් සම්මුති දේශනා හා පරමාර්ථ දේශනා යනුවෙන් දෙකොටසකට බෙදා දැක්විය හැකිය.

### සම්මුති දේශනා

ලෝකයේ ජීවත්වන පුද්ගලයින් තම අදහස් පහසුවෙන් හුවමාරු කර ගැනීම සඳහා ජීවී - අජීවී වස්තුවලට යම් යම් නාම පද යොදාගනු ලැබේ. මනුෂ්‍ය, දේව, තිරිසන් යනාදි වචන ජීවීන් වෙනුවෙන් භාවිත කෙරේ. ඒ ඒ ජීවීන් වෙන් වෙන් ව හඳුනා ගැනීම පිණිස බිම්බිසාර, ශක්‍රයා, ඇතා යනාදි වචන ද භාවිත කෙරේ. අජීවී වස්තූන් සඳහා ගස්, ගල්, පර්වත ආදී වචන යොදාගන්නා අතර ඒවා තවදුරටත් හඳුනා ගැනීම පිණිස කොස්ගස, කලුගල්, සමනොල කන්ද යනාදිය යොදා ගැනේ. මෙසේ ලෝකවාසීන් විසින් සම්මත කරගන්නා ලද වචන ඇසුරින් කරනු ලබන දේශනා සම්මුති දේශනා නම් වේ.

## පරමාර්ථ දේශනා

සම්මුති දේශනාවේදී යොදාගනු ලබන දෙවි - මිනිස් - ගස් ගල් යානාදී වචන ව්‍යවහාරයක් පරමාර්ථ දේශනාවෙහි දී යොදා ගැනීමක් නැත. ජීවී - අජීවී සියලු දෙයෙහි යථාර්ථ වශයෙන් ඇති දේ පමණක් එහි දී භාවිත කෙරේ. ජීවී, අජීවී සියලු දෙයෙහි ඇති කොටස් පොදුවේ ගත් කල එහි ඇත්තේ ස්කන්ධ ධාතු ආයතනයන්ය. රූප - වේදනා - සඤ්ඤා - සංඛාර - විඤ්ඤාණ යනු පංචස්කන්ධයයි. අජීවී වස්තුවල විඤ්ඤාණය නැත. පඨවි ධාතු, ආපෝ ධාතු, චක්ඛු ධාතු, සෝත ධාතු ආදිය ධාතු කොටස් ය. චක්ඛු ආයතන, සෝත ආයතන, රූප ආයතන, සද්ද ආයතන ආදිය ආයතන කොටස් ය. මෙම ස්කන්ධ - ධාතු - ආයතන යන වචන භාවිත කරමින් සාමාන්‍යයෙන් ලෝකවාසීහු අදහස් හුවමාරු කර ගැනීමක් නොකරති. එහෙයින් ස්කන්ධ – ධාතු ආයතන වශයෙන් ලෝක ව්‍යවහාරය ඉක්මවා කර ඇති දේශනා පරමාර්ථ දේශනා නම් වේ.

ලෝකෝත්තර වූ නිර්වාණය පිළිබඳ සාමාන්‍ය ජනතාවට තේරුම් ගැනීමේ පහසුව පිණිස ලෝක ව්‍යවහාරයෙහි ඇති වචන බුදුරජාණන් වහන්සේ විසින් භාවිත කර ඇති අයුරු ඇතැම් සූත්‍ර දේශනාවලින් පැහැදිලි වෙයි.

ස්කන්ධ යන වචනය මුල්කරගත් කල්හි ලෝකයෙහි ඇති ජීවී අජීවී සියල්ල පංචස්කන්ධයට ඇතුලත් බවත් නිවන එයින් බැහැර වූ දෙයක් බවත් මේ වනවිට ඔබට පැහැදිලි වන්නට ඇත.

අභිධර්මයෙහි දී පංචස්කන්ධයත් නිවනත් කොටස් සතරකට බෙදා දක්වා තිබේ. ඒ එක් එක් කොටසකට 'අර්ථ' යන නම ද යොදා ඇත. සසරින් එතර වීමට මේ අර්ථ පිළිබඳ දැනීම මිස වෙනත් දැනීමක් අවශ්‍ය නොවේ. එහෙයින් එම 'අර්ථ' ශ්‍රේෂ්ඨය, උතුම් ය. 'පරම' යන වචනයෙහි ශ්‍රේෂ්ඨ, උතුම් යන අදහස තිබේ. මේ නිසා එම 'අර්ථ' පරමාර්ථ (පරම+අර්ථ) යනුවෙන් හඳුන්වා තිබේ. පරමාර්ථ සතරක් ම ඇති හෙයින් ඒවා සතර පරමාර්ථ යනුවෙන් නම් කොට තිබේ.

පහත සඳහන් වගුව ඔබට පැහැදිලි කරන්නේ පංචස්කන්ධය හා නිවන පරමාර්ථ සතරට බෙදී යන ආකාරය යි.

| පංචස්කන්ධය හා නිවන | පරමාර්ථ සතර |
|---|---|
| 1. රූපස්කන්ධය | 1. රූප පරමාර්ථය |
| 2. වේදනා ස්කන්ධය<br>3. සංඥා ස්කන්ධය<br>4. සංස්කාර ස්කන්ධය | 2. චෛතසික පරමාර්ථය |
| 5. විඥාන ස්කන්ධය | 3. චිත්ත පරමාර්ථය |
| 6. නිවන | 4. නිර්වාණ පරමාර්ථය |

අභිධර්මයෙහි සතර පරමාර්ථ නම් කර ඇති පිළිවෙළ මෙසේ ය.

(1) චිත්ත පරමාර්ථය
(2) චෛතසික පරමාර්ථය
(3) රූප පරමාර්ථය
(4) නිර්වාණ පරමාර්ථය

දැන් අපි පරමාර්ථ සතරට අයත් එක් එක් ලක්ෂණ හා ඒවාට ඇතුළත් වන කොටස් පිළිබඳ ඉගෙන ගනිමු.

### (1) චිත්ත පරමාර්ථය

අරමුණු දැන ගැනීම සිතේ ලක්ෂණය යි. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන යන දොරටු සයට ලැබෙන රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම යන අරමුණු දැන ගැනීමට සිතට හැකියාව ඇත. අරමුණු දැන ගැනීමේ ලක්ෂණයෙන් සිත එකක් ම වේ. චෛතසික නැතිව සිතක් නූපදී. සිතේ යෙදෙන එම චෛතසිකවල විවිධත්වය අනුව සාමාන්‍යයෙන් සිත් 89 ක් තිබේ.

### (2) චෛතසික පරමාර්ථය

වෙනස් නොවන ලක්ෂණ සතරක් චෛතසික සතුව තිබේ. ඒවා නම් වශයෙන් මෙසේය

(I) සිත සමග ඉපදීම
(II) සිත සමග නැතිවීම.
(III) සිත ගන්නා අරමුණ ම ගැනීම.
(IV) සිත උපදින (චක්ඛු ආදි) වස්තුව ඇසුරෙහි ම ඉපදීම.

සබ්බ චිත්ත සාධාරණ චෛතසික 07, ප්‍රකීර්ණක චෛතසික 06, ශෝභන චෛතසික 25 යනුවෙන් චෛතසික 52 ක් තිබේ. 'මනෝ පුබ්බංගමා ධම්මා' යන්නෙහි අදහස 'ධර්මයෝ මනස (සිත) පෙරටු කොට ඇත්තාහ' යනුයි. මෙහි ධම්ම යනු චෛතසිකයන් ය.

(3) රූප පරමාර්ථය

ශීත - උෂ්ණ ආදී විවිධ හේතූන් නිසා වෙනස් වීමට පත්වන දේවල් රූප නම් වේ. සංඛ්‍යා වශයෙන් මහා භූත රූප 4 ක් ද, උපාදාය රූප 24 ක් ද ඇත.

(4) නිර්වාණ පරමාර්ථය

නිවන උසස් ම සුවයයි. එම සුවය චක්ඛු ආදි ඉන්ද්‍රිය මගින් විඳිය හැකි සුවයක් නොවේ. විඳින සැප හෙවත් 'වේදයිත සුඛය' අනිත්‍ය ය. වෙනස්වන සුළු ය. නොවිඳින සැපත හෙවත් 'අවේදයිත සුඛය' හේතුවකින් නූපන් හෙයින් අනිත්‍ය නොවේ. නොවිඳින එකම සැපත නිවන ය. එහෙයින් එය අවේදයිත සුඛය යි.

ස උපාදිසේස, අනුපාදිසේස යනුවෙන් නිබ්බාන ධාතු දෙකක් ඇත.

වැදගත් කරුණු -

* නුවණැසින් යුත් උතුමන්ගේ කියමන් විමසා පිළිගැනීම නුවණැත්තන්ගේ ලක්ෂණයකි.

* අප නොදන්නා බොහෝ දේ නුවණැත්තෝ දනිති.

* බුද්ධ දේශනාව සම්මුති හා පරමාර්ථ යනුවෙන් දෙකොටසකි.

* ලෝකයට අයත් සියල්ල පංචස්කන්ධයට අයත් ය. ඉන් බැහැර කිසිවක් ලොව නැත.

* ලෝකයට අයත් නොවූයේ නිවන පමණි.

* පංචස්කන්ධය හා නිවන පරමාර්ථ සතරකට බෙදේ. ඒවා චිත්ත - චෛතසික - රූප - නිර්වාණ යනුවෙන් නාම් කර තිබේ.

අභ්‍යාස :

පහත සඳහන් වගුව ඔබේ අභ්‍යාස පොතෙහි සටහන් කොට නිසි ලෙස හිස්තැන් පුරවන්න.

| සතර පරමාර්ථ | එහි ලක්ෂණ | අයත් කොටස් |
|---|---|---|
| 1. චිත්ත | I. ............................<br>............................<br>............................ | කාමරවර සිත් 54<br>............................<br>............................<br>............................ |
| 2. ............... | I. ............................<br>II. ............................<br>III. ............................<br>IV. ............................ | අන්‍යසමාන චෛතසික 13<br>............................<br>............................ |
| 3. ............... | I. ............................ | මහාභූත රූප 04 .......... 24 |
| 4. ............... | I. ආවේදයිත බව<br>(නොවිඳින බව) | ...................... නිබ්බාන ධාතු<br>...................... නිබ්බාන ධාත |

# භාවනා උගන්වන ගුරුවරුන් සඳහා

මේ වනවිට 6, 7 ශ්‍රේණි වලදී සතර කමටහන් (චතුරාරක්ඛා)වලට අයත් බුද්ධානුස්සති භාවනාව හා මෛත්‍රී භාවනාවත් 8 ශ්‍රේණියේදී අශුභ භාවනාව හා මරණානුස්සති භාවනාවත් පුහුණු වීම අවසන් කොට ඇත. 9 ශ්‍රේණිය සඳහා ආනාපානසති භාවනාව පුහුණු කරවීම ගුරුවරයාගේ වගකීමකි.

හිඳගෙන සිටීමේ හා සිටගෙන සිටීමේ ඉරියව් 6,7,8 ශ්‍රේණිවලදී මෙන් අනුගමනය කිරීමට සිසුන්ට මග පෙන්වන්න. භාවනා පැහැදිලි කරමින් ඉදිරිපත් කොට ඇති එක් එක් පාඩමක් සඳහා කාලච්ඡේද එකක් ප්‍රමාණවත් නොවන විට ඊළඟ සතියෙහි තවත් කාලච්ඡේදයක් යොදා ගැනීමට ඔබට නිදහස ඇත. පාඩම් පැහැදිලි කරන කාලච්ඡේද වලදී භාවනා පුහුණුවට සිසුන් යෙදවිය යුතු නැත.

පාසලේ දී දහම් පාසලේ දී පමණක් නොව අන් කුමන තැනක දී වුවත් ශිෂ්‍යයාගේ ඉගෙනීම සාර්ථක කර ගැනීමට සංවරවීම මහෝපකාරී වේ. භාවනා පුහුණු වීමෙන් සිත හා සිරුර සංවර කර ගැනීම අතිශයින් වැදගත් වන බව සිසුන්ට අවබෝධ වීම අතිශයින් ම වැදගත් ය.

දහම් දැනුමින් හා භාවනාවෙන් ලැබෙන සංවර බවත්, විවිධ විෂයයන් හැදෑරීමෙන් ලැබෙන නැණවත් බවත්, සමබර දිවියකට පදනම වේ. ගුණ - නුවණින් සමබර දිවියක් ගත කරන තැනැත්තා ම රට - දැය සමයට වැඩදායි කෙනෙකු වන බව සිසුන්ගේ අවධානයට සැලකිල්ලෙන් යොමු කරන්න.

භාවනා පුහුණුව හැකිතාක් සාර්ථක අන්දමින් ඉටුකර ගැනීමට ඔබ මග පෙන්විය යුතු අතර භාවනා ඉරියව් නියම කිරීමේ දී දහම් පාසලේ පහසුකම් හා පරිසරය පිළිබඳ සලකා කටයුතු කිරීමේ නිදහස ද ඔබ සතුව ඇත.

ඇස්වත්තේ රේවත හිමි.

# ආනාපානා සති භාවනාව

## 1. පාඨම

**අපි සිහියෙන් ගණින් කරමු.**

යම් මොහොතක අපි මෙලොවට බිහි වුනෙමු. යම් මොහොතක අපි මරණයට පත් වන්නෙමු. මේ අතරතුර ගෙවී ගිය සෑම මොහොතක ම අප ආශ්වාස ප්‍රශ්වාස කිරීම සිදු කර ඇත. ඉදිරියට ද එසේ ම සිදුවෙයි. මේ මොහොතෙහි දී ද එසේ සිදු වෙමින් පවතී. ආශ්වාසයට හෙවත් හුස්ම ගැනීමට පාලි භාෂාවෙහි යෙදෙන්නේ ආන යන නමයි. ප්‍රශ්වාසයට හෙවත් හුස්ම හෙළීමට පාලි භාෂාවෙහි යෙදෙන්නේ අපාන යන නමයි. ආන+අපාන යන වචන දෙක එක් වූ විට ආනාපාන යන වචනය සෑදෙයි. කොපමණ ආශ්වාස ප්‍රශ්වාස කළත් ඒ පිළිබඳ අප අවධානය යොමු කරන්නේ නැහැ. එහෙත් ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ පහසුව ඇති කරන රෝගයකින් පෙළෙන විට හෝ එබඳු වෙනත් අවස්ථාවක දී හෝ ඒ ගැන අපේ අවධානය යොමු වෙනවා. එහෙයින් දැන් අපට ඇත්තේ සිහියෙන් තොරව කෙරෙන ආශ්වාස - ප්‍රශ්වාසයකි, ආනාපානයකි. එහෙත් කල්පනාවෙන් සිහියෙන් කරන විට එය හඳුන්වන්නේ ආනාපාන සති යනුවෙනුයි. ආනාපාන සතිය නිතර පුරුදු වීම භාවිත කිරීම ආනාපානසති භාවනාවයි.

දැන් අපේ අවධානය ගණිතය දෙසට යොමු කරමු. එකේ සිට දහය තෙක් ඇති ඉලක්කම් ගණන් කිරීම ඉතා පහසුවෙන් ඔබට කළ හැකි ය. හුදු ඉලක්කම් පමණක් ගණන් නොකර හුස්ම ගැනීම හා හෙළීම (ආනාපාන) ගණන් කිරීමෙන් සිත තැන්පත් කර ගැනීමට පුළුවන් වෙනවා. එය කරන ආකාරය මෙතැන් සිට පැහැදිලි කර ගනිමු.

හුස්ම ගැනීම හා හෙළීම එක ම කාල පරතරයකට අනුව සිදුවන්නේ නැත. ගන්නා ලද හුස්ම ආපසු හෙළීමට ගත වන කාලයට වඩා හුස්මක් හෙළා නැවත ගැනීමට ගතවන කාලය වැඩි ය. මෙය වඩාත් පැහැදිලි ලෙස මෙසේ දැක්විය හැකි ය.

ආශ්වාස - ප්‍රශ්වාස අතර කාලය අඩු ය.

ප්‍රශ්වාස - ආශ්වාස අතර කාලය වැඩි ය.

ගණන් කිරීම ආරම්භයේ දී හුස්මක් ගන්නා විට එකයි යනුවෙන් පටන් ගන්න ඕනෑ. හුස්ම හෙළන විට දෙකයි යනුවෙන් ගණන් කරන්න ඕනෑ. නැවතත් හුස්ම ගන්නා විට තුනයි යනුවෙන් ද හුස්ම හෙළන විට හතරයි යනුවෙන් ද ගණන් කරන්න ඕනෑ. ඊළඟ හුස්ම ගන්නා විට පහයි යනුවෙන් ගණන් කරන්න ඕනෑ. මෙසේ පළමු වටය එකේ සිට පහ තෙක් ගණන් කරන්න ඕනෑ.

දෙවන් වටයි එකේ සිට හයට ද තෙවන වටය එකේ සිට හතට ද, සිවුවන වටය එකේ සිට අටට ද, පස්වෙනි වටය එකේ සිට නවයට ද, හයවෙනි වටය එකේ සිට දහයට ද ගණන් කරන්න ඕනෑ. මෙසේ මුල් අදියර අවස්ථා හයකින් නිම වූ පසු නැවතත් ඒ අයුරින් ම දෙවන අදියර ද ගණන් කරන්න ඕනෑ.

ගණන් කිරීමේ ක්‍රමය තවදුරටත් පැහැදිලි කර ගැනීමට පහත සඳහන් වගුව ඔබට උපකාර වෙයි.

| | |
|---|---|
| පළමු අදියර | 1-2-3-4-5-<br>1-2-3-4-5-6<br>1-2-3-4-5-6-7<br>1-2-3-4-5-6-7-8<br>1-2-3-4-5-6-7-8-9<br>1-2-3-4-5-6-7-8-9-10 |
| දෙවන අදියර<br><br><br>ගණන් කරීම | 1-2-3-4-5<br>1-2-3-4-5-6<br>1-2-3-4-5-6-7<br>1-2-3-4-5-6-7-8<br>1-2-3-4-5-6-7-8-9<br>1-2-3-4-5-6-7-8-9-10 |

තෙවන අදියරේ සිට දිගට ම මේ පිළිවෙළ ම අනුගමනය කරන්න.

ආශ්වාස ප්‍රශ්වාස ගණන් කිරීමේ දී ඔබ දැනගත යුතු තවත් දෙයක් ඇත.

එනම් ආශ්වාස ප්‍රශ්වාස වාතය හැපෙන්නේ කොතැන ද යන්න දැන ගැනීමයි. ඔබ දැන්, හෙළන හුස්මක් වෙත අවධානය යොමු කරන්න. එවිට කිසියම් තැනක වාතය හැපෙන බව ඔබට දැනෙයි. සමහර විට එම ස්ථානය නාසය අග විය හැකි ය. නැතිනම් උඩුතොළ මුදුනෙහි විය හැකි ය. මේ දෙතැනින් කුමන තැනක ආශ්වාස - ප්‍රශ්වාස වාතය හැපෙන්නේ දැයි තීරණය කළ යුත්තේ තනි තනි ව ඔබ විසින් ම ය.

ආශ්වාස ප්‍රශ්වාස වාතය හැපෙන තැන දැනගත් ඔබ ඊළඟට කළ යුත්තේ එම ස්ථානයෙහි ඔබේ කල්පනාව, අවධානය, සිහිය තබා ගැනීමයි. එම ස්ථානයෙහි සිහිය තබා ගෙන එතැන හැපෙමින් හුස්ම ඇතුල්වන විට එකයි යනුවෙන් ගණන් කරන්න. ආපසු හුස්ම හෙළන තුරු ම එම සංඛ්‍යාව සිහි කරන්න. එම ස්ථානයෙහි හැපෙමින් හුස්ම පිට වන විට දෙකයි යනුවෙන් ගණන් කරන්න. නැවත හුස්ම ගන්නා තුරු එම සංඛ්‍යාව සිහි කරන්න. වගුවෙහි දක්වා ඇති ආකාරයට ගණන් කළ යුත්තේ එසේ ය. එහෙත් කිසි විටක ආශ්වාස ප්‍රශ්වාස උවමනාවෙන් නොගැනීමට ඔබ වග බලා ගත යුතු ය.

ඊළඟට මෙම භාවනාව සඳහා සුදුසු ඉරියව් පිළිබඳව ද ඔබ දැනගත යුතු ව ඇත. විශේෂයෙන් වාඩි වී සිටීමේ ඉරියව්ව ආනාපාන සති භාවනාව සඳහා යොදා ගැනීම සුදුසු යි. පිරිමි ළමුන් හා ගැහැණු ළමුන් වාඩි වන ආකාරය එක සමාන නොවෙයි. පිරිමි ළමුන් එරමිනිය ගොතා ගෙන (බද්ධ පරියංකයෙන්) වාඩි විය යුතු ය. එරමිණිය ගොතා ගැනීමේ දී පළමු ව නමා ගත යුත්තේ වම් පාදය යි. දකුණු පාදය නැවිය යුත්තේ දෙවනුවයි. ගැහැණු ළමුන් දෙදණ නමා නැමුණු කොටස් දෙක සිරුරෙහි එක් පැත්තකට සිටින සේ වාඩි විය යුතු ය. එය අර්ධ පරියංකයයි. කිසිවකට හෝ කිසිවකුට හේත්තු නොවන්න.

දෙපිරිස ම කොන්ද කෙළින් තබා ගන්න. හිස ද කෙළින් තබා ගත යුතු ය. වම් අතෙහි ඇඟිලි මත දකුණු පිටි අත්ල තබා ගත යුතු ය. එවිට වම් අත්ල මත දකුණු අතෙහි ඇඟිලි තැන්පත් වෙයි. දෙනෙත් පියා ගැනීම වඩාත් සුදුසු යි.

**ආනාපානාසති භාවනාවේ පළමු පියවර**
**(පළමු පාසල් වාරය සඳහා)**

1. නිසි ලෙස වඩි වන්න. දෙනෙත් පියා ගන්න.
2. දෙ අත් එක්කොට නෙළුම් කැකුලක හැඩය ඇති වන සේ නළල මත තබා ගන්න.
3. "මම සතුන් නොමරමි
   නුදුන් කිසිවක් නොගනිමි.
   දුසිරිතෙන් දුරු වෙමි.
   බොරු බසින් රහමෙරින් වලකිමි."

   යනුවෙන් පන්සිල් සමාදන් ව සිල්වතකු වන්න.

4. නමස්කාර පාඨය පංතියට පමණක් ඇසෙන සේ සාමූහිකව තුන් වරක් කියන්න.
5. ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට මම නමස්කාර කරමි. යන වැකිය ඔබට පමණක් ඇසෙන් සේ ඉතාම සෙමින් තුන් වරක් කියන්න.
6. දෙ අත් පහත දමා නිසි ලෙස තබා ගන්න.
7. ඔබට අදාල පරිදි නාසයේ අග හෝ උඩු තොළ මුදුනෙහි සිහිය තබා ගන්න.
8. ස්වභාවික ව සිදු වන ආශ්වාස ප්‍රශ්වාස වාතය ඇතුල් වන විට පිට වන විට ගණන් කිරීම ආරම්භ කරන්න. කාලය නිමවන තුරු දිගටම ගණන් කිරීම කරන්න.

විනාඩි 07 ක් මේ ආකාරයට ආනාපාන සති භාවනාවේ පළමු පියවර ක්‍රියාත්මක කරන්න. කාලය අවසන් වූ විට ඔබේ ගුරුතුමා හෝ ගුරුතුමිය ඒ බව දැනුම් දෙනු ඇත. ඉන් පසු දෙනෙත් විසා

ගෙන ම දෙ අත් නළල මත තබා බුදුගුණ සිහි කොට ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමි' යි තෙවරක් සිතන්න. ඉන්පසු නැගිටින්න.

අනතුරු ව පහත සඳහන් ප්‍රශ්නවලට සිහියෙන් යුතු ව සිතා බලා පිළිතුරු සොයන්න. කිසිවකුට පිළිතුරු කිව යුතු නැත. දිනපතා ඔබේ භාවනා දියුණුව මැන බැලීම සඳහා එම පිළිතුරු සටහන් කරන්න. ඒ සඳහා ආදර්ශ සටහනක් ප්‍රශ්න අවසානයේ දක්වා ඇත.

ප්‍රශ්න

1. නොසෙල් වී හිස හා කොන්ද නොනමා සම්පූර්ණ කාලය ගත කිරීමට මට හැකි වීද ?

   (ඔව් - නැත)

2. නාසය අග හෝ උඩුතොල මුදුනෙහි හෝ ආශ්වාස ප්‍රශ්වාස වාතය හැපෙන තැන කාලය අවසන් වනතුරු සිහිය තබා ගැනීමට මට හැකි වීද?

   (ඔව් - නැත)

3. වැරදීමකින් තොර ව ආශ්වාසා ප්‍රශ්වාස ගණන් කිරීමට මට හැකි වීද

   (ඔව් - නැත)

මේ ආදර්ශ සටහන ඔබේ අභ්‍යාස පොතෙහි සටහන් කර ගන්න. ඔව් යන පිළිතුරට '1' ලකුණත් නැත කියන පිළිතුර යටින් '0' ලකුණක් යොදන්න.

| ආනාපාන සති භාවනාව - පළමු පියවර | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රශ්න | සතිපතා පිළිවෙළින් පිළිතුර | | | | | | | | | | | | | | |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
| 1. ප්‍රශ්නයට | | | | | | | | | | | | | | | |
| 2. ප්‍රශ්නයට | | | | | | | | | | | | | | | |
| 3. ප්‍රශ්නයට | | | | | | | | | | | | | | | |

## 2. පාඨම

# දඹ ගසක් යට සිදු වූ අසිරිය

එදා වප් මඟුල් උත්සව දිනයකි. කිඹුල්වත් පුර අලංකාර කෙරුණි. බොහෝ දෙනා රජ මාළිගාවට රැස් වූහ. පිරිස් සහිතව සුදෝවුන් රජතුමා සිදුහත් පුතු ද රැගෙන සීසාන තැනට පිටත් විය. සීසාන තැන අසල මනා ව වැඩුණු දඹ ගසකි. එම ගස යට සිදුහත් කුමරුගේ නිදන ආසනය පැනවිණි. රජතුමා කුමරු වෙනුවෙන් උඩුවියනක් බන්දවා වටතිර ද ඇද්දවී ය. කිරි මව්වරුන් කුමරුගේ රැකවරණයට යෙදවී ය.

මෙසේ සුදොවුන් රජතුමා තම පුත් කුමරුගේ පහසුව හා රැකවරණය පිණිස කටයුතු යොදවා සීසාන පිරිසත් සමඟ නික්මුණේය. රන් නඟුල අතට ගත් රජතුමා සීසෑම ඇරඹී ය. ඇමතිවරු රිදී නඟුල්වලින් ද, ගොවීහු අනිත් නඟුල්වලින් ද සීසෑහ. රජතුමා ඇතුළු පිරිසගේ සීසෑම කිරිමව්වරුන්ගේ නෙත් සිත් ඇද ගැනීමට තරම් සමත් විය. කුමරුගේ රැකවලෙහි නියුතු කිරිමව්වරු වටතිරවලින් බැහැර ව කෙත දෙසට පියවර නැඟූ හ.

සුව පහසු සයනයෙහි දිගා වී සිටි සිදුහත් කුමරු වටපිට බැලී ය. නෙත ගැටෙන කිසිවෙක් වටතිර තුළ නොවූ හ. අවට පරිසරය ද නිසලය. නිහඬය. සිරිමහ බෝසම්දුන් සෙවනෙහි බුදු බවට පත්වීමේ පෙරනිමිති කියාපාන්නාක් මෙන් මුහුකුරා ගිය බෝසත් කුමරුගේ සිත භාවනාවට නැඹුරු විය. වයසින් ළදරුවකු වුව ද බුද්ධියෙන් මුහුකුරා ගිය බෝසත් සිදුහත් කුමරු ලද අවසරයෙන් වහා නැඟී සිටියේ ය. එරමිණිය ගොතා අසුනෙහි වාඩි විය. හුස්ම ගැනීම හා හෙළීම (ආනාපාන) කෙරෙහි සිත යොමු කළේ ය. ආශ්වාස ප්‍රශ්වාස අරමුණෙන් සිත බැහැර නොවී ය. එම අරමුණෙහි ම සිත සමාධි ගත විය.

කුමරුගේ සිතෙන් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච-කුක්කුච්ච, විචිකිච්ඡා යන නීවරණ බැහැර විය. විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා සහිත ප්‍රථම ධ්‍යානය පහළ විය. දැන කුමරු දඹ ගස යට පැන වූ අසුන මත ප්‍රථමධ්‍යාන සුවයෙන් කල් ගෙවමින් සිටියි.

කිරි මව්වරුන්ට කුමරු ගැන සිහි විය. ඔවුහු වහ වහා ආපසු ගියහ. වටකිර තුළට ඇතුළු වූහ. කුමරු භාවනානුයෝගීව සිටිනු දැක පුදුමයටත්, සතුටටත් පත් වූහ. ඔවුහු රජතුමාට ද කුමරු පිළිබඳ තොරතුරු දැන්වූහ. පුත්‍ර ස්නේහයෙන් වහ වහා එතැනට පැමිණි රජතුමා පුත් කුමරුගේ විලාසය දැක අතිශයින් සතුටට පත් විය. 'පුතණුවනි, මේ මගේ දෙවන වැඳීමයි' පවසමින් පුංචි සිදුහත් කුමරුට පිය රජතුමා දෙවන වරට වැඳීය.

පසු කලෙක මහබිනික්මන් කළ සිදුහත් බෝසතාණන් සයවසක් ඉමහත් වෙහෙසක් දරා සිරි මහබෝ සෙවනේ දී කුඩා කල දඹ රුක් සෙවනේ දී පුරුදු වූ ආනාපානා සති භාවනාව වැඩීම තුළින් බුදුබවට පත්වූහ.

ආනාපාන සති භාවනාව බුදුබව ලැබීමට පවා මග පෙන්වන උසස් ම භාවනාවක් බව මේ අනුව ඔබට පැහැදිලි වන්නට ඇත. අප පුරුදු වෙමින් සිටින්නේ ද ඒ උතුම් භාවනාවයි. ඉගෙනීම සඳහා පමණක් නොව ජීවිතයේ සැම කටයුත්තක් ම සාර්ථක ව කර ගැනීමට භාවනාව නිරතුරුව ම ඔබට පිහිට වනු ඇත. විශේෂයෙන් හෘද රෝග වලක්වා ගැනීමට හා සුව කර ගැනීමට මෙම භාවනාව උපකාර වේ. එහෙයින් අපි ආනාපාන සති භවනාවේ දෙවන පියවර පියවර දෙවන පාසල් වාරයේ මුල සිට වර්ෂ අවසානය තෙක් පුරුදු වෙමු.

මෙහි දී ද නිසි පරිදි වාඩිවීම අවශ්‍ය වෙනවා. ඉන් පසු ආශ්වාස, ප්‍රශ්වාස වාතය හැපෙන තැන සිහිය තබා ගන්න ඕනෑ. ඇතැම් විට ආශ්වාස, ප්‍රශ්වාස සඳහා ගත වෙන කාලය කෙටියි. ඒවා කෙටි ආශ්වාස ප්‍රශ්වාස හැටියට සැලකෙනවා. කෙටි ආශ්වාස, ප්‍රශ්වාස සැහෙන ප්‍රමාණයක් ගත් විට තරමක් දිග ආශ්වාසයක් ගැනීමට සිදු වෙනවා. එහි ප්‍රශ්වාසය ද එතරම් ම දිගින් යුක්ත ය. ඒවා දිග ආශ්වාස ප්‍රශ්වාස ලෙස සැලකෙනවා. ඔබ කළ යුත්තේ කෙටි ආශ්වාසයක දී හා කෙටි ප්‍රශ්වාසයක දී ඒ කෙටි බව දැන ගැනීමයි. දිග ආශ්වාසයක දී හා දිග ප්‍රශ්වාසයක දී ඒ දිග බව ද දැනගන්න ඕනෑ.

ආශ්වාස ප්‍රශ්වාස වාතය හැපෙන තැන සිහියේ තබා ගෙන ආශ්වාස ප්‍රශ්වාසවල කෙටි බව හෝ දිගු බව නිවැරදි ව සිහි කරන්න ඕනෑ. වඩාත් පැහැදිලි වීම සඳහා ආශ්වාස ප්‍රශ්වාස සිහි කරන ආකාරය පහත දක්වා ඇත.

1. දිග හුස්මක් ගන්නා විට 'දිග හුස්මක් ගනිමි' යි දැන ගන්න.
2. දිග හුස්මක් හෙළන විට 'දිග හුස්මක් හෙළමි' යි දැන ගන්න.
3. කෙටි හුස්මක් ගන්නා විට 'කෙටි හුස්මක් ගනිමි' යි දැන ගන්න.
4. කෙටි හුස්මක් හෙළන විට 'කෙටි හුස්මක් හෙළමි' යි දැන ගන්න.

හැම විට ම ආශ්වාස ප්‍රශ්වාස අරමුණෙහි ම සිත රඳවා තැබීමට උත්සාහ කරන්න. ඔබට ජයග්‍රහණය ලැබිය හැකිය.

ආනාපාන සති භාවනාවේ දෙවන පියවර
(දෙවන හා තෙවන පාසල් වාර සඳහා)

1. නිසි ලෙස වාඩි වෙන්න.
2. දෙ අත් එක්කොට තෙළුම් කැකුලක හැඩය ඇති වන සේ නළල මත තබා ගන්න.
3. මම සතුන් නො මරමි
   නුදුන් කිසිවක් නො ගනිමි
   දුසිරිතෙන් දුරු වෙමි
   බොරු බසින් රහමෙරින් වළකිමි.

යනුවෙන් පන්සිල් සමාදන් ව සිල්වතකු වන්න.

4. නමස්කාර පාඨය පංතියට පමණක් ඇසෙන සේ සාමූහික ව තුන්වරක් කියන්න.
5. ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට මම නමස්කාර කරමි. යන වැකිය ඔබට පමණක් ඇසෙන සේ ඉතා ම සෙමින් තුන්වරක් කියන්න.

6. දෙ අත් පහතට දමා නිසි ලෙස තබා ගන්න.

7. ඔබට අදාළ පරිදි නාසයේ අග හෝ උඩුතොල මුදුනෙහි හෝ සිහිය තබා ගන්න.

8. ස්වභාවික ව සිදු වන ආශ්වාස ප්‍රශ්වාස වාතය ඇතුල් වන විට හා පිට වන විට ඒවායෙහි දිග හා කෙටි බව සිහි කරන්න. කාලය නිම වන තුරු දිගට ම එසේ කරන්න.

විනාඩි 07 ක් මේ ආකාරයට ආනාපාන සති භාවනාවේ දෙවන පියවර ක්‍රියාත්මක කරන්න. කාලය අවසන් වූ විට ඔබේ ගුරුතුමා හෝ ගුරුතුමිය ඒ බව දැනුම් දෙනු ඇත. ඉන් පසු දෙනෙත් වසා ගෙන ම දෙඅත් නළල මත තබා ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමි යි තෙවරක් සිතන්න. ඉන් පසු නැගිටින්න. අනතුරුව පහත සඳහන් ප්‍රශ්නවලට සිහියෙන් යුතුව ම සිතා බලා පිළිතුරු සොයන්න. කිසිවකුට පිළිතුරු කිවයුතු නැත. දිනපතා ඔබේ භාවනා දියුණුව මැන බැලීම සඳහා එම පිළිතුරු සටහන් කරන්න. ඒ සඳහා පළමු වාරයේ සකස් කර ගත් පරිදි සටහනක් ඔබේ අභ්‍යාස පොතෙහි සකස් කර ගන්න.

ප්‍රශ්න

1. නොසෙල් වී හිස හා කොන්ද නොනමා සම්පූර්ණ කාලය ගත කිරීමට මට හැකි වීද ?

   (ඔව් - නැත)

2. නාසය අග හෝ උඩුතොල මුදුනෙහි හෝ ආශ්වාස ප්‍රශ්වාස වාතය හැපෙන තැන සිහිය තබා ගැනීමට සම්පූර්ණ කාලය තුළ මට හැකි වීද?

   (ඔව් - නැත)

3. සම්පූර්ණ කාලය තුළ ආශ්වාස, ප්‍රශ්වාස දිග හා කෙටි බව සිහි කිරීමට මට හැකි වීද ?

   (ඔව් - නැත)

**දහම් පාසල් සිසුන් සඳහා**

**නොමිලයේ**

**බෙදදීම පිණිසයි.**

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ
මුද්‍රණය කරවා පළ කරන ලදී.